විශ්වසනීයත්වයේ පුනිවූර්තිය

ලංකා බැංකුව | වාර්ෂික වාර්තාව 2018

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

ජාතියේ මහා පහන් ටැඹ

දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකික සලකුණ බවට පත්වෙමින්
ගනුදෙනුකාර කේන්ද්‍රීය නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන
ජාතියේ බැංකුකරුවා වීම.

මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත
ළඟා කරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත්,
නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම්
උත්පාදනය කරලීම.

ආයතනික වටිනාකම් ප්‍රකාශය

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වීමේ අපගේ දැක්ම කරා යන
ගමනේදී පහත දැක්වෙන පංචවිධ වූ මූලික හරයන් මත බැංකුව ක්‍රියාත්මක වෙයි.

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම.
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම.
- ඉතා උසස් තත්ත්වයේ ආචාර ධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක ස්ථාපනය සඳහා කැපවීම.
- නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම.

විශ්වසනීයත්වයේ ප්‍රතිමූර්තිය

79 වසරක අභිමානවත් උරුමයක් සමඟින් ලංකා බැංකුව ශ්‍රී ලාංකීය හද ගැස්මේ රිද්මය බවට පත්ව ඇත්තේ වසර ගණනාවක් පුරා ක්‍රමිකව ගොඩනගා ගත් විශ්වාසය සහ තහවුරුව මතයි. ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ නොමැකෙන මං සලකුණු සනිටුහන් කරමින් ලංකා බැංකුව අංක එකේ බැංකුව බවට පත්වෙමින් ක්ෂේත්‍රයේ ඉහලම ස්ථානයේ වැජඹේ.

පුද්ගලික ගනුදෙනුකරුවන්ගේ සිට කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සුවිසල් ව්‍යාපාර දක්වා සෑම පරාසයකම පැතිරුණු සමස්ත ශ්‍රී ලාංකීය ජනසමාජයේ මූල්‍ය අවශ්‍යතා අප ආවරණය කරන්නෙමු. ජාතියේ මූල්‍ය අභිප්‍රායන් ඉටු කිරීමට අප නිබඳ අත්වැල සපයන්නේ සමස්ත ජනසමාජයත්, ආර්ථිකයත් බල ගැන්වීම සඳහා ශක්තිය සපයමින් සැබවින්ම ජාතියේ බැංකුකරුවා වෙමින්ය.

අනාගතය සඳහා අපගේ සේවාවන් ගලපමින්, නව්‍ය වුත්, ඩිජිටල් ප්‍රවේශයට අනුගත වූත් බැංකුකරණ අත්දැකීම් සමඟ නවමු මුහුණුවරකින් ගනුදෙනුකරුවන් වෙත අප පිය නගන්නේ ද සැමදා පවතින විශ්වාසය එලෙසම සුරකිමින්, යහපත් ආයතනික පුරවැසියෙකු ලෙස අපගේ සමාජ මෙහෙවර තවදුරටත් තහවුරු කරමින්ය.

සැබවින්ම මේ සැම විදහා පාන්නේ **ලංකා බැංකුව සැබවින්ම විශ්වාසනීයත්වයේ ප්‍රතිමූර්තිය බවයි**.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

පටුන

''ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය ලෙසින් අභිමානවත් ලෙස වැජඹෙමින්, දිවයින සිසාරා තම සේවා පිය සටහන් තබමින් ලංකා බැංකුව ශ්‍රී ලාංකීය ජනසමාජය වෙතත්, ආර්ථිකය වෙතත් වැඩිමනත්ම දායකත්වයක් එක් කරන ආයතනයකි.''

සභාපතිතුමාගේ පණිවිඩය • 10

''ලංකා බැංකුව තම නොසැලෙන වෙළඳපොළ නායකත්වය තවදුරටත් සනාථ කරමින් රු. ට්‍රිලියන දෙකක වත්කම් ප්‍රමාණයක් සනිටුහන් කරමින් අංක එකේ සන්නාම නාමය සමඟින් නොමැකෙන සලකුණක් තබා ඇති බව මම මහත් අභිමානයෙන් යුතුව සටහන් තබමි.''

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය • 14

ලංකා බැංකුව වාර්ෂික වාර්තාව - 2018 • **4**
කාර්යසාධන විශ්ලේෂණය 2018 • **6**
2018 වසරේ විශේෂාංග • **9**
සභාපතිතුමාගේ පණිවිඩය • **10**
මහා කලමණාකරතුමගේ සමාලෝචනය • **14**
ලංකා බැංකුවේ දළ විශ්ලේෂණය • **20**
සේවා මධ්‍යස්ථාන ව්‍යාප්තිය • **22**
සමූහයේ ව්‍යුහය • **23**
අධ්‍යක්ෂ මණ්ඩලය • **24**
ආයතනික කළමනාකාරීත්වය • **28**
විධායක කළමනාකාරීත්වය • **40**
වටිනාකම් ජනනය කිරීම • **48**
පාර්ශ්වකරුවන් සහ සම්බන්ධවීම • **50**
ක්‍රමෝපාය වාර්තාව • **52**
තිරසාරත්වය පිළිබඳ වාර්තාව • **58**
ආර්ථිකමය දායකත්වය • **63**

වටිනාකම් තහවුරු කරගනිමින්

ආයතනික යහපාලනය • **70**
අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා • **89**
විගණන කමිටු වාර්තාව • **89**
වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව • **93**
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව • **96**
නාමයෝජනා සහ ආයතනික යහපාලනය
පිළිබඳ කමිටු වාර්තාව • **98**
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ
කමිටු වාර්තාව • **100**
අවදානම් කළමනාකරණය • **102**

ව්‍යාපාර අංශ හරහා ක්‍රමෝපායන් මෙහෙය වීම

ආර්ථික හා කර්මාන්ත වටපිටාව පිළිබඳ දළ විශ්ලේෂණය • **120**
ශාඛා බැංකුකරණය • **126**
ආයතනික හා අක්වෙරළ බැංකුකරණය • **131**
ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ
විදේශීය මෙහෙයුම් අංශය • **134**

ප්‍රාග්ධන සම්පත් තුළින් වටිනාකම් ජනිත කිරීම

මූල්‍ය ප්‍රාග්ධනය • **137**
නිෂ්පාදිත ප්‍රාග්ධනය • **142**
මානව ප්‍රාග්ධනය • **147**
බුද්ධිමය ප්‍රාග්ධනය • **156**
සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය • **160**
ස්වාභාවික ප්‍රාග්ධනය • **171**

මූල්‍ය වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව • **179**
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම • **185**
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව • **188**
ස්වාධීන සහතිකවීමේ වාර්තාව • **190**
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම • **191**
විගණකාධිපතිගේ වාර්තාව • **192**
ලාභ හෝ අලාභ ප්‍රකාශනය • **196**
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය • **197**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය • **198**
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය • **200**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය • **204**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් • **206**

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා • **394**
2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා • **401**
කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා • **428**
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා • **430**
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය • **434**
පැවරුම් මිල සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහතිකය • **448**

අතිරේක තොරතුරු

අපේ ඉතිහාසයේ මං සළකුණු • **450**
GRI දර්ශකය • **452**
ස්වාධීන සහතික වාර්තාව • **457**
ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ඇ.ඩො.) • **459**
විස්තීරණ ආදායම් ප්‍රකාශනය (ඇ.ඩො.) • **460**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඇ.ඩො.) • **461**
කාර්තුමය විශ්ලේෂණය • **462**
කොටස් හා ණයකර තොරතුරු • **465**
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය - බැංකුව • **467**
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් • **469**
විදේශ රටවල නියෝජිත බැංකු - රටවල් පදනම මත • **472**
විනිමය හුවමාරු සමාගම් - රටවල් පදනම මත • **478**
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය • **480**
ආයතනික සහ විදේශීය කාර්යාල • **485**
සංස්ථාපිත තොරතුරු • **487**

ලංකා බැංකුව

වාර්ෂික වාර්තාව - 2018

අපගේ සමෝධානික වාර්තාවට සාදරයෙන් පිළිගනිමු

අපගේ පාර්ශ්වකරුවන්ට ලබාදෙන මූලිකම ප්‍රකාශනය ලෙස, මෙම සමෝධානික වාර්ෂික වාර්තාවේ අරමුණ වන්නේ අපගේ පාර්ශ්වකරුවන්ගේ විකිනෙකට ගැටෙන්නා වූ අවශ්‍යතා කළමනාකරණය කරමින් කෙටි, මධ්‍යම සහ දීර්ඝ කාලීන ප්‍රතිලාභ ජනිත කරන ආකාරය පිළිබඳ සමබර සහ පරිපූර්ණ ඇගයීමක් ලබා දීමයි. මෙම වාර්තාව අපගේ ව්‍යාපාර ආකෘතිය, මෙහෙයුම් ක්ෂේත්‍රය, මූල්‍ය උපාය, ආයතනික යහපාලනය, අවදානම් කළමනාකරණය, තිරසාරත්වය සඳහා කැපවීම සහ පූර්ණ විශ්ලේෂණයක් මඟින් නිර්ණය කර ඇති අපගේ ප්‍රමාණාත්මක මාතෘකා සම්බන්ධව තොරතුරු සපයයි.

විෂය පථය සහ මායිම්

2018 ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් මස 31 දින දක්වා ලංකා බැංකුවේ (මෙහි 'ලංකා බැංකුව' යනුවෙන් හැඳින්වෙන) සහ එහි පරිපාලිත සමාගම් වල (එක්ව 'සමූහය' යනුවෙන් හැඳින්වෙන) සිදුවූ දේශීය, විදේශීය සහ අක්වෙරළ මෙහෙයුම් මෙම වාර්තාව මඟින් ආවරණය කරනු ලබයි. මෙම වාර්තාවේ පිටු අංක 196 සිට 392 දක්වා මූල්‍ය තොරතුරු සමූහයේ ඒකාබද්ධ මූල්‍ය වාර්තා වන අතර සමූහය තුළ බැංකුවට ප්‍රමුඛතාවය ලබා දී ඇති බැවින් මූල්‍යමය නොවන තොරතුරු බැංකුවට පමණක් සීමා වේ. වාර්ෂික වාර්තාකරණ චක්‍රයක් අප විසින් පිළිපදින අතර, මෙම වාර්තාව 2017 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ පූර්ව වාර්ෂික වාර්තාව පදනම් කර ගනු ලබයි. පෙර සපයන ලද වාර්තාවේ මූල්‍ය නොවන තොරතුරු සඳහා කිසිදු ප්‍රමාණාත්මක ගැලපීමක් සිදුවී නොමැත. සමෝධානික වාර්තාකරණ රාමුව මඟින් නියම කර ඇති ප්‍රාග්ධන වර්ග හය පදනම් කරගෙන මෙම වාර්තාව සකස් කර ඇත.

ප්‍රමිති සහ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන් විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම වාර්තාව අන්තර්ජාතික සමෝධානික වාර්තාකරණ කවුන්සිලයේ සමෝධානික වාර්තාකරණ රාමුව තුළ නිර්දේශිත සමෝධානික වාර්තාවේ මූලධර්ම අනුගමනය කරනු ලබයි. තිරසාර වාර්තාකරණය සඳහා අප විසින් ගෝලීය වාර්තාකරණ මූලධර්ම විසින් ප්‍රකාශයට පත් කරන ලද ගෝලීය වාර්තාකරණ මූලාරම්භක ප්‍රමිති වල 'මූලික' නිර්ණායක පිළිගෙන ඇති අතර පරිසර සහ සමාජීය පාලනය පිළිබඳ වාර්තා, කොළඹ කොටස් හුවමාරුව මඟින් ලබා දී ඇති මාර්ග උපදේශන ද අනුගමනය කර ඇත. ආයතනික යහපාලන අනාවරණයන්, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ සංශෝධන, 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන, ඉන් පසුව සංශෝධන සහ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මඟින් නිකුත් කරන ලද සංශෝධිත ආයතනික යහපාලනය පිළිබඳව මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය මත පදනම් වේ.

වාර්තා ශීර්ෂ මෙම වැඩිදියුණු ශීර්ෂ

- **සංශෝධිත ආයතනික යහපාලනය පිළිබඳව මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය**
- **ගෝලීය වාර්තාකරණ මූලාරම්භක විසින් නිර්දේශිත ප්‍රමාණාත්මක මාතෘකා ආවරණය වන කරුණු වලින් ඔබ්බට ගිය විෂය ක්ෂේත්‍රය සහ කර්මාන්ත විශේෂිත මාතෘකා ඇතුලත් කිරීම**
- **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නව ආකෘතිය අනුගමනය කරන ලදී**
- **ආර්ථිකයට බැංකුව මඟින් දක්වන දායකත්වය පිළිබඳ විශේෂිත පරිච්ඡේදයක්**
- **පරිශීලනය පහසු කරලීමට නව වර්තාකරණ ව්‍යුහයක් අනුගමනය කිරීම**
- **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 සමඟ අනුකූල වීම**

බාහිර සහතිකය



සම්බන්ධතාවය සහ සංසන්දනය

සම්බන්ධතාවය පෙන්වීම සඳහා සංචාලන සහ සලකුණු සහ දැන්වීම් වාර්තාවේ භාවිතා කර ඇත.

විශ්වසනීයත්වය

ප්‍රමාණාත්මක කරුණු වාර්තා කිරීමේදී, වසර තුළ බැංකුවේ වටිනාකම් තහවුරු කිරීමට බලපෑ සාධනීය මෙන්ම ඍණාත්මක කරුණු ද වාර්තා කර ඇත.

අදාළත්වය සහ ප්‍රමාණාත්මකභාවය

අපගේ පාර්ශ්වකරුවන්ට වැදගත් වන තොරතුරු නියෝජනය කරන අපගේ ප්‍රමාණාත්මක මාතෘකා මෙම වාර්තාව තුළ ඇතුලත් කර ඇත.

උපායමාර්ගික අවධානය

වසර තුළදී ත්‍රිවිධාකාරයේ කාර්යසාධනය ළඟා කර ගැනීම සඳහා අනුගමනය කරන ලද උපායමාර්ග, 2019 සඳහා උපායමාර්ග සහ ඉන් ඔබ්බට ඇති උපායමාර්ගයන් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

සංචාලන සලකුණු



වාර්තා කිරීමේ මායිම



අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන්, මෙහෙයුම් පරිසරය, අවදානම් සහ අවස්ථාවන්

ප්‍රතිචාර

අප වාර්තාකරණයේ කියවීම හා අදාලත්වය නිරතුරුව ඉහළ නැංවීම සඳහා අපි කැපවී සිටින අතර අප ඔබගේ යෝජනා සහ අදහස් පිළිගනු ලැබේ. එමනිසා අපගේ වාර්ෂික වාර්තාව පිලිබඳ ඔබගේ ප්‍රතිචාර අප බලාපොරොත්තු වෙමු. ඔබගේ ප්‍රතිචාර පහත විද්‍යුත් ලිපිනයට යොමු කරන්න

dgmfp@boc.lk

කාර්යසාධන විශ්ලේෂණය 2018

මූල්‍ය කාර්යසාධනයේ විශේෂාංග

මූල්‍ය ප්‍රාග්ධනය

	බැංකුව			සමූහය		
	2018	2017	වෙනස %	2018	2017	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	221,131	189,211	16.9	229,462	197,013	16.5
ශුද්ධ පොළී ආදායම	65,558	58,356	12.3	68,689	61,490	11.7
මූල්‍ය සේවා සඳහා බදු ගෙවීමට පෙර ලාභය	41,480	37,592	10.3	42,246	38,195	10.6
බදු පෙර ලාභය	31,892	30,343	5.1	32,437	30,816	5.3
බදු පසු ලාභය	19,479	21,312	(8.6)	19,515	21,487	(9.2)
රජයට දායකත්වය	24,158	28,524	(15.3)	24,583	28,923	(15.0)
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	2,268,154	1,951,804	16.2	2,312,923	1,999,410	15.7
දළ ණය සහ අත්තිකාරම්	1,510,534	1,219,914	23.8	1,544,357	1,252,363	23.3
හානිකරන ප්‍රතිපාදන වලට පසු ශුද්ධ ණය සහ අත්තිකාරම්	1,429,107	1,163,161	22.9	1,460,619	1,194,294	22.3
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	1,765,026	1,546,832	14.1	1,783,975	1,566,376	13.9
මුළු වගකීම්	2,146,712	1,840,649	16.6	2,180,782	1,877,084	16.2
මුළු ස්කන්ධය	121,442	111,155	9.3	132,141	122,326	8.0
කොටස් පිලිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	1,045	1,857	(43.7)	1,048	1,870	(44.0)
කොටසක ශුද්ධ වත්කම්	6,072	7,410	(18.1)	6,574	8,093	(18.8)
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	1.5	1.7	(0.2)	1.5	1.7	(0.2)
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය	16.8	20.9	(4.1)	15.3	19.0	(3.7)
පොළී ආන්තිකය	3.1	3.2	(0.1)	3.2	3.3	(0.1)
ආදායමට පිරිවැය	38.1	38.4	(0.3)	40.4	40.5	(0.1)
තැන්පතු වලට ණය අනුපාතය	85.6	78.9	6.7	86.6	80.0	6.6
ස්කන්ධය මත ණය	41.0	41.5	(0.5)	-	-	-
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය සහ අත්තිකාරම් වල ප්‍රතිශතයක්	5.4	4.7	0.7	5.4	4.6	0.8
ව්‍යවස්ථාපිත අනුපාත (%) ලෙස						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාවය 20%)	24.5	27.2	(2.7)	-	-	-
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාවය 2018 - 90%, 2017 - 80%)	143.5	141.5	2.0	-	-	-
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාවය 2018 - 90%, 2017 - 80%)	115.0	105.0	10.0	-	-	-
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය 2018 - 7.375%, 2017 - 6.250%)	10.3	10.8	(0.5)	10.4	10.9	(0.5)
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය 2018 - 8.875%, 2017 - 7.750%)	10.3	10.8	(0.5)	10.4	10.9	(0.5)
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය 2018 - 12.875%, 2017 - 11.750%)	14.6	14.6	-	14.6	14.5	0.1

මූල්‍ය නොවන කාර්යසාධනයේ විශ්ලේෂාංග

ආර්ථික කාර්යසාධනයේ විශ්ලේෂාංග

		2018	2017	වෙනස (%)
රජය සඳහා ජනනය කල වටිනාකම්	රු. මිලියන	24,158	28,524	(15.3)
සෘජු නව රැකියා උත්පාදනය	ගණන	1,622	534	203.7
ඉලක්ක වෙළඳපොළ ප්‍රතිශතය	%	62.5	59.8	2.7
බස්නාහිර පලාතෙන් පිටත ශාඛා	ගණන	442	443	(0.2)
මාර්ග සංවර්ධනයන් සඳහා වසර තුළ මූල්‍යනය	රු. මිලියන	31,696	1,464	(2,065.0)
පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා මූල්‍යනය	රු. මිලියන	3,600	640	462.5
විදේශීය මුදල් ප්‍රේෂණ	රු. මිලියන	580,133	449,170	29.2

සමාජ කාර්යසාධනයේ විශ්ලේෂාංග

මානව ප්‍රාග්ධනය

		2018	2017	වෙනස (%)
මුළු සේවක සංඛ්‍යාව	ගණන	8,724	7,587	15.0
නව සේවක බඳවා ගැනීම්	ගණන	1,622	534	203.7
ස්ත්‍රී නියෝජන අනුපාතය	%	60	57	3.0
සේවය හැරයාමේ ප්‍රතිශතය	%	0.9	0.3	0.6
සේවකයන්ට සිදු කල සම්පූර්ණ ගෙවීම්	රු. මිලියන	18,875	16,996	11.1
සේවක උසස් වීම්	ගණන	174	1,831	(90.4)
සේවක පුහුණුව සඳහා ආයෝජනය	රු. මිලියන	338	322	5.0
මුළු පුහුණු පැය ගණන	පුහුණු වැඩසටහන් පැය	11,768	11,884	(1.0)
එක් සේවකයෙකු විසින් ජනිත කල ආදායම	රු. මිලියන	25.3	24.9	1.6
එක් සේවකයෙකු විසින් ජනිත කල ශුද්ධ ලාභය	රු. මිලියන	2.2	2.8	(21.4)
වෘත්තීමය ආයතන වල සාමාජිකත්වය දරන සේවකයන්	ගණන	371	292	27.1

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

		2018	2017	වෙනස (%)
මුළු පාරිභෝගිකයන් ගණන	මිලියන ගණන	13.4	12.8	4.7
ගනුදෙනුකරුවන්ට ගෙවනු ලැබූ පොළී	රු. මිලියන	112,056	92,229	21.5
පාරිභෝගික සබඳතා මධ්‍යස්ථාන	ගණන	1,721	1,589	8.3
සැපයුම්කරුවන් සඳහා කල ගෙවීම්	රු. මිලියන	6,670	5,179	28.8
දේශීය සැපයුම්කරුවන් සඳහා වියදම් කිරීම	%	95.1	91.6	3.5
ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය	රු. මිලියන	108	127	(15.0)
පුහුණු කරන ලද විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් අවසන් කල සිසුන් ගණන	ගණන	2,752	1,870	47.2
විදේශීය රටවල නියෝජිත බැංකු සමඟ පැවති සබඳතා	ගණන	859	859	-

කාර්යසාධන විශ්ලේෂණය 2018

බුද්ධිමය ප්‍රාග්ධනය

		2018	2017	වෙනස (%)
සන්නාම වටිනාකම	රු. මිලියන	42,874	40,600	5.6
සේවක අත්දැකීම් (ව්‍යංගික දැනුම)	අවුරුදු	81,627	81,841	(0.3)
ආයතනික කළමනාකරණ අත්දැකීම්	අවුරුදු	519	566	(8.3)

නිෂ්පාදිත ප්‍රාග්ධනය

		2018	2017	වෙනස (%)
ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය	රු. මිලියන	1,964	1,693	16.0
ශාඛා පරිවර්තනය සහ ප්‍රගමනය කිරීම සඳහා ප්‍රාග්ධනය වියදම්	රු. මිලියන	1,518	1,455	4.3

පාරිසරික කාර්යසාධනයේ විශේෂාංග

ස්වාභාවික ප්‍රාග්ධනය

		2018	2017	වෙනස (%)
හරිතාගාර වායු විමෝචන කාණ්ඩ 1 (කාබන්ඩයොක්සයිඩ් ඒකක)	ටොන්	2,902	දත්ත නොමැත	-
හරිතාගාර වායු විමෝචන කාණ්ඩ 2 (කාබන්ඩයොක්සයිඩ් ඒකක)	ටොන්	10,354	දත්ත නොමැත	-
සූර්ය බලශක්ති උත්පාදනය	කිලෝවොට් පැය	885,238	492,230	79.8
ඉන්ධන භාවිතය	ලීටර	732,101	440,180	66.3
විදුලි පරිභෝජනය	මෙගාවොට් පැය	21,135	22,325	(5.3)
ජල පරිභෝජනය	ඝන මීටර්	501,229	489,560	2.4
සූර්ය බලශක්ති සඳහා ආයෝජනය	රු. මිලියන	146	71	105.6
පාරිසරික සහ සමාජ කළමනාකරණ පද්ධතිය යටතේ පිරික්සූ ණය සංඛ්‍යාව	ගණන	508	දත්ත නොමැත	-

2018 වසරේ විශේෂාංග

පාරිභෝගිකයන්ට නොනවතින ඩිජිටල් සේවා අත්දැකීමක් ලබා දීම සඳහා ලංකා බැංකුව සිය ප්‍රථම ඩිජි මධ්‍යස්ථානය මහනුවර නගරයේ ආරම්භ කරන ලදී

ස්වයංක්‍රීය මුදල් ගැනුම් යන්ත්‍ර, තැන්පතු යන්ත්‍ර සහ මුදල් චක්‍රීකරණ යන්ත්‍ර දහසේ කඩඉම පසු කරන ලදී

ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (NFC) සක්‍රීය කාඩ්පත් හඳුන්වාදීම

මාස්ටර්කාඩ් ඉන්ටර්නැෂනල් සමඟ එක්ව ලංකා බැංකුව 'ඔබේ ගමනේ ප්‍රධානියා' යන තේමාව යටතේ ගෝලීය මාස්ටර්කාඩ් පතක් සහ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයින් සඳහා අනුප්‍රාප්තික ගෝලීය මාස්ටර් කාඩ්පතක් හඳුන්වා දෙන ලදී

'iSeries Power 8' සර්වර් යන්ත්‍ර මඟින් ප්‍රධාන බැංකු පද්ධතිය යාවත්කාලීන කිරීම

තොරතුරු ආරක්ෂාව සඳහා ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත් විය

ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් එකක දායකත්වයක් ලබා දුන් ප්‍රථම රාජ්‍ය බැංකුව බවට පත්වීම

'ඉමේජ් මාස්ටර්' ආමුඛ නිශ්කාෂණ සඳහා දෘශ්‍ය චරිත කියවුම් (OCR) පදනම් කරගත් නවීන තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වා දීම

සභාපතිතුමාගේ පණිවිඩය

"ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය ලෙසින් අභිමානවත් ලෙස වැජඹෙමින්, දිවයින සිසාරා තම සේවා පිය සටහන් තබමින් ලංකා බැංකුව ශ්‍රී ලාංකීය ජනසමාජය වෙතත්, ආර්ථිකය වෙතත් වැඩිමනත්ම දායකත්වයක් එක් කරන ආයතනයකි."

හිතවත් පාර්ශ්වකරුවනි,

තම වෙළඳපොළ නායකත්වය තවදුරටත් තහවුරු කරමින්, රටේ ආර්ථිකය සංවර්ධනයට උරදෙමින් ලංකා බැංකුව තවත් අභිමානවත් වසරක් සාර්ථකව සනිටුහන් කර ඇත. අසීරු වෙළඳපොළ සහ මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ වුවද බැංකුව තම පාර්ශ්වකාරභවතුන් වෙත තම වගකීම නොපිරිහෙලා සපුරාලමින් 2018 වසර සඳහා 5% ක වර්ධනයක් සමඟ රු. බිලියන 31.9 ක බදු පෙර ලාභයක් වාර්තා ගත කොට ඇත. විවිධ වූ අභියෝගාත්මක බාධක හමුවේ වුවද සිය මෙහෙයුම් කටයුතු උපරිම ලෙස පවත්වා ගනිමින් ආර්ථික, සමාජීය සහ පාරිසරික යන අංශ ත්‍රිත්වයෙන්ම බැංකුව සිය කාර්යසාධනයන් මනාව පිලිඹිඹු කර ඇති අතර, බැංකුවේ වර්තමාන සභාපතිවරයා වශයෙන් මම මෙම ප්‍රතිඵල ඇතුලත් 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ සැම වෙත පිලිගන්වනු ලබන්නේ ඉමහත් වූ අභිමානයකිනි.

ජාතියේ බැංකුකරු

ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය ලෙසින් අභිමානවත් ලෙස වැජඹෙමින් දිවයින සිසාරා තම සේවා පිය සටහන් තබමින් ලංකා බැංකුව ශ්‍රී ලාංකීය ජනසමාජය වෙතත් ආර්ථිකය වෙතත් වැඩිමනත්ම දායකත්වයක් එක් කරන ආයතනයකි. පූර්ණ වශයෙන් රාජ්‍ය හිමිකාරත්වය ඇති බැංකුවක් වශයෙන් ලංකා බැංකුව සිය අරමුණු හුදු ලාභ ඉපයීමේ පරමාර්ථයම පමණක් මූලික කොටගෙන කේන්ද්‍රගත කර නොමැති අතර ආර්ථිකමය සහ සමාජීය වගකීම් ද තම අරමුණු වෙත මුහුකර ඇත. දශක අටක් වැනි දිගු කාල පරාසයක් තුළ අප විසින් රජයේත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේත්, පුද්ගල ජනජීවිතයේත් ආර්ථික-සමාජීය සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලබාදී ඇත. බැංකුවේ ක්‍රමෝපාය සැලසුම් රජයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සමඟ දිශාගත කර ඇති අතර 2018 වසර සඳහා වූ ක්‍රමෝපාය සැලසුම් විශේෂයෙන්ම තනි පුද්ගල ව්‍යවසාය බල ගැන්වීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, ජාතික වශයෙන් වැදගත් කමක් ඇති යටිතල පහසුකම් නැංවීමේ ව්‍යාපෘති ණය සහ දිවයින සිසාරා මූල්‍ය ඇතුලත්කරණ කටයුතු දිරිමත් කිරීම යන අංශ කෙරෙහි වැඩි බරතැබීමක් සහිතව දියත් කරන ලදී. ලංකා බැංකුව මාලදිවයින, ඉන්දියාව, සීෂෙල්ස් රාජ්‍ය යන රටවල පිහිටුවා ඇති ශාඛා බැංකු ද චික්සත් රාජධානියේ පරිපාලිත සමාගම ද 800 කට වඩා වැඩි නියෝජිත බැංකු ජාලයද හරහා ශ්‍රී ලාංකීය ජනතාවගේ අන්තර්ජාතික මූල්‍ය ගනුදෙනු කටයුතු සඳහා ඉමහත් සේවාවක් සපයයි. අපගේ නිම්වළලු පුළුල් කරනු වස් ආසියාතික කලාපයේ අපගේ තවත් පියසටහනක් තබමින් 2018 වසරේදී මාලදිවයිනේ අපගේ දෙවන බැංකු ශාඛාවද විවෘත කරන ලදී.

අපගේ මෙහෙයුම් පථය

ගෝලීය ආර්ථිකයේ මෙන්ම දේශීය ආර්ථිකයේ ද පැවති විවිධ වෙනස්වීම් සහ හැලහැප්පීම් මත ව්‍යාපාරික කටයුතු කිරීමට සිදුවූයේ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළය. දේශීය සහ ගෝලීය වශයෙන් ආවේණික වූ විවිධ සාධක මත මන්දගාමී ගෝලීය ආර්ථික වර්ධන තත්ත්වයක් පැවති අතර එය 3.5% ක අගයක පැවතියේ පෙර වසරේ තත්ත්වයම විදහා දක්වමින්ය.

ඇමරිකා චික්සත් ජනපදය සහ එහි වෙළඳ පාර්ශ්වකරුවන් අතර වර්ධනය වෙමින් පවතින ව්‍යාපාරික ගැටළු සහ දියුණු ආර්ථිකයන් හි පැවති දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ගෝලීය ආර්ථිකයේ පසුබැස්මට හේතු සාධක විය. මෙම තත්ත්වයන් හමුවේ 2019 සහ 2020 සඳහා වන ගෝලීය ආර්ථික වර්ධන වේගයන්හි පුරෝකථනයන් ද 3.5% සහ 3.6% දක්වා පහත හෙළන ලදී.

ශ්‍රී ලංකාව තුළ ද මන්දගාමී ආර්ථික වර්ධනයක් පිළිඹිඹු වූ අතර ආයෝජක සහ පාරිභෝගික ප්‍රජාවගේ පසුගාමී ක්‍රියාකාරකම් සහ රටේ පැවති අඩු ද්‍රවශීලතා මට්ටම ද මීට හේතු පාදක විය. 2018 වසර සඳහා වූ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 3.2% ක් ලෙස වාර්තා වූ අතර මීට දායකත්වය සපයන ලද්දේ 4.7% ක් වූ සේවා අංශයේ වර්ධනය සහ 4.8% ක් වූ කෘෂිකාර්මික අංශයේ වර්ධනයයි. මේ අතර කාර්මික අංශයේ වර්ධනය 0.9% ක් වූ ඉතා අඩු අගයක් ගැනුණි. නියාමන අංශය විසින් 2018 වසරේ මුල් භාගයේ දී වඩාත් විස්තීරණ මූල්‍ය ප්‍රතිපත්තීන් අනුගමනය කල අතර, ගෝලීය මූල්‍ය තත්ත්වයන්ගේ දෘඩතාවත් සමඟම වසරේ අගභාගයේ දී අනුගමනය කල ප්‍රතිපත්ති මත ක්‍රමයෙන් වෙළඳපොළ පොළී අනුපාත ඉහළට නැගුනි.

මේ අතරම 19% ක් වැනි වූ සීඝ්‍ර අගයකින් වසර තුළදී රුපියලේ අගය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර මෙය රටේ ආර්ථික තත්ත්වය කෙරේ දැඩි බලපෑමක් ඇති කරන ලදී.

ඉහත දැක්වූ වසර තුළ පැවති රටේ ආර්ථික හැසිරීම් බැංකු ක්ෂේත්‍රය තුළ ද උච්චාවචනයන් ඇති කිරීමට හේතු පාදක වූ අතර ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රතිඵලයන් ජනනය කිරීමට මුල්විය. කෙසේ වෙතත් මන්දගාමී ආර්ථික වර්ධනය සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති ගැටළුකාරී තත්ත්වයන් මත අක්‍රීය ණය ප්‍රතිශතය කෙරේ යම් බලපෑමක් ඇති වුවද, දළ ණය සහ අත්තිකාරම් 20% කින් වර්ධනය කර ගැනීමට බැංකු ක්ෂේත්‍රය සමත්විය. දළ අක්‍රීය ණය 64% කින් ඉහළ ගියේ සමස්ථ අක්‍රීය ණය අනුපාතය පෙර වසරේ පැවති 2.5% ක අගයේ සිට 3.4% දක්වා ඉහළ නංවමිනි. සමස්ථයක් වශයෙන් ක්ෂේත්‍රයේ බදු පසු වාර්තා ගත ලාභය රු. බිලියන 125.9 ක් ලෙස සනිටුහන් කෙරුනේ පෙර වසර සහ සසඳන විට 9% ක පසුබැසීමක් සමඟිනි.

2018 වසරේ සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක (SLFRS) 9 ට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයන් ඉදිරිපත් කිරීමට බැංකු ක්ෂේත්‍රයම උත්සුක වූ අතර ඊට අනුරූපීව තොරතුරු පද්ධති, අක්‍රීය ණය සඳහා වූ හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීම්, ණය

සභාපතිතුමාගේ පණිවිඩය

“තරඟකාරීත්වයට නොබියව මුහුණ දෙමින් කේෂ්ත්‍රයේ අංක එකේ බැංකුව ලෙස වැජඹීමට ප්‍රමුඛ සාධකය වනුයේ ගනුදෙනුකරුවන් වෙත අප විසින් විශිෂ්ට වූ සේවාවක් සැපයීමය.”

විශ්ලේෂණයන් සහ ඇගයීම් ආදී කටයුතු වල අවශ්‍ය වෙනස් කිරීම් සහ වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී. මෙම නව ප්‍රමිතය අනුගමනය කිරීමත් සමඟම කේෂ්ත්‍රයේ අක්‍රීය ණය සඳහා වූ හානිකරණ වෙන්කිරීම් වල ඉහළයාමක් සිදුවිය. තවද, බාසල් III ප්‍රතිපත්ති මාලාවට පූර්ණවශයෙන් අනුගත වීමට සූදානම් වීමක් ලෙස විවිධ ක්‍රමෝපායන් මඟින් ප්‍රාග්ධනය උත්ප්‍රේරණය කර ගැනීමට සියළුම පාර්ශ්ව බැංකු කටයුතු කරන ලදී. මේ සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ මෙන්ම ණය වෙළඳපොළ වෙත පිවිසීමට බැංකු කටයුතු කරන ලද අතර කේෂ්ත්‍රයේ කාර්යඵලයන් කෙරේ සෘණාත්මක බලපෑමක් ඇති කරමින් රජය මඟින් පනවන ලද ණය ආපසුගෙවීමේ බද්ද වැනි නව බදු වර්ග අභ්‍යන්තරව උපයාගත් ප්‍රාග්ධනය අනියෝගයට ලක්කරන ලදී.

ක්‍රමෝපායන් සහ කාර්යසාධනය

බැංකුවේ කාර්යසාධානය රටේ ආර්ථික සංවර්ධනය සහ දිශානතිය මත රදාපවතී. 2018 වසර සඳහා අපගේ ක්‍රියා සැලසුම් 2018-2020 සඳහා වන බැංකුවේ ආයතනික සැලැස්ම මත ක්‍රියාවට නංවන ලද්දේ අපගේ සේවාවන් සහ සන්නාමයන් නව මුහුණුවරකින් සහස්‍රවර්ෂයේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවනට ගලපමිනි. ගනුදෙනුකරු කේන්ද්‍රීය කරගත් සේවා සැපයුම කෙරෙහි අපගේ දැඩි අවධානය වසර තුළදී යොමු කල අතර රටේ සෑම සේවා සැපයුම් ඒකකයකින්ම එක හා සමාන උසස් පාරිභෝගික අත්දැකීමක් ලබාදීම ඉලක්ක ගත කරමින් මානව සම්පත සතු හැකියාවන් සුමට කිරීම සඳහා විශාල වශයෙන් ආයෝජනය කරන ලදී. අපගේ සෑම පුහුණු වැඩසටහනකදීම පාරිභෝගිකයා අපවෙත ආසක්තව තබා ගැනීමේ වටිනාකම සහ ඒ සඳහා බැංකුව විසින් සැපයිය යුත්තේ කෙබඳු පාරිභෝගික සේවාවක්ද යන්න පිළිබඳව සේවක මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කෙරුණි. මෙම වසර තුළදී අප ඩිජිටල්කරණය මත පදනම් වූ නව්‍ය තාක්ෂණික සේවා සැපයුම්, ණය තත්ත්වයේ ගුණාත්මකත්වය සහ මානව සම්පතෙහි ශක්‍යතාව ඉහළ නැංවීම ආදිය කෙරෙහිද ප්‍රමුඛත්වයක් දෙමින් කටයුතු කල ද මාගේ අදහස වනුයේ මේ සැම අතරම තරඟකාරීත්වයට නොබියව මුහුණ දෙමින් කේෂ්ත්‍රයේ අංක එකේ බැංකුව ලෙස වැජඹීමට මුඛ්‍ය සාධකය වනුයේ ගනුදෙනුකරුවන් වෙත අප විසින් විශිෂ්ට වූ සේවාවක් සැපයීමය. එබැවින් පාරිභෝගික කේන්ද්‍රීයකරණය අපගේ සියලු ආයතනික ක්‍රමෝපායන්හි අංක එක බවට පත්වූ අතර එය ඉදිරියටත් එසේම වනු ඇත.

ණය සහ අත්තිකාරම් සැපයීම සම්බන්ධයෙන් වන අපගේ ක්‍රමෝපායන් ව්‍යවසායකත්ව බලගැන්වීම් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් නඟා සිටුවීම සඳහා විශේෂිත අවධානය දෙමින් පෙළගැස්විනි. ශ්‍රී ලාංකික සුළු පරිමාණ ව්‍යාපාර සහ නැගී එන ව්‍යවසායකත්වයන් සංවර්ධනය කිරීමට එම අංශ වෙත දිරි දීමක් වශයෙන් රජයේ විශේෂිත වැඩ පිළිවෙලක් යටතේ ක්‍රියාත්මක ‘එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා’ ණය යෝජනා ක්‍රමය වෙත බැංකුව සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික අංශය රටේ ව්‍යවසායකයන්ගෙන් 75% ක පමණ ප්‍රමාණයක් ආවරණය කරන අතර, රටේ ආර්ථික සංවර්ධනයේ නියමු යාන්ත්‍රණය ලෙස මෙම අංශය හැඳින්විය හැකිය. මේසා වැදගත්කමක් දක්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම සඳහා වන රජයේ වෑයමට උරදෙනු වස් ලංකා බැංකුව විශාල අත්තිකාරම් ප්‍රමාණයක් මුදාහැර ඇති අතර එමඟින් දේශීය ව්‍යාපාර අන්තර්ජාතික තලය දක්වා පුළුල් කිරීමට සෘජු දායකත්වයක් සැපයීමට අදහස් කෙරේ.

මෙම ණය යෝජනා ක්‍රමයේදී ලංකා බැංකුවේ සක්‍රීය දායකත්වය විදහා දක්වමින් ‘එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා’ යටතේ සම්පාදිත මුළු ණය ප්‍රමාණයයෙන් 40% ක ප්‍රමාණයක් ලංකා බැංකුව විසින් සම්පාදනය කර ඇති බව සාඩම්බරයෙන් සටහන් තබනු කැමැත්තෙමි. 2018 වසර අවසාන වන විටදී ණය පහසුකම් 10,500 ඔස්සේ රු. බිලියන 13.6 ක මුදල් ප්‍රමාණයක් සපයා ඇත්තේ මෙම ණය යෝජනා ක්‍රම 16 න් 11 ක්ම යටතේ ණය මුදල් සපයමිනි. මෙම ණය යෝජනා ක්‍රම අතරින් සමහරක් ‘හරිත ණය’ යෝජනා ක්‍රමයන් වන අතර එමඟින් හරිත තාක්ෂණ ක්‍රමවේදයන් සහ පාරිසරි හිතකාමී ව්‍යාපාර ප්‍රවර්ධනය අපේක්ෂා කෙරේ. තවද ‘රිවි බල සවි’, ‘ඇරඹුම’ වැනි වැඩි වටිනාකමින් යුතු ණය යෝජනා ක්‍රම සඳහාද ලංකා බැංකුව මූල්‍ය දායකත්වයක් සපයා ඇත. ‘ඇරඹුම’ ණය යෝජනා ක්‍රමය මඟින් රටේ තරුණ ප්‍රජාව අතර ව්‍යවසායකත්ව හැකියාව වර්ධනය කර මූල්‍යමය ශක්තිමත් භාවයක් ඇති කිරීම තුළින් අසමතුලිතතා සමනය කර ප්‍රබෝධමත් තාරුණ්‍යයක් කරා මංපෙත් විවර කරදීමට බැංකුව තම දායකත්වය සපයයි.

බැංකුවේ මූල්‍යමය කාර්යඵලයන් පිළිබඳ සලකා බැලීමේදී 2018 වසර තුළදී ණය කළඹේ 24% ක වර්ධනයක් සමඟ බදු පෙර ලාභය 5% කින් වර්ධනය කර ගැනීමට බැංකුව සමත්ව ඇත. ණය කළඹේ සක්‍රීයත්වයයේ පසුබැස්මක් පෙන් වූවද, හානිකරණ ප්‍රතිපාදන වෙන්කිරීමේ වර්ධනය කේෂ්ත්‍රයේ සමස්ථය සමඟ සැසඳීමේදී ධනාත්මක තත්ත්වයක පවත්වා ගැනීමට බැංකුවට හැකියාව ලැබුනේ උපායශීලීවූත්, දූර්දර්ශීවූත් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රමවේදයන් සහ පෘථුල ණය හැසිරවීමේ පිළිවෙත් බැංකුව සතුවීම නිසාවෙනි. 2018 වසර අවසාන වන විටදී ද ණය සහ අත්තිකාරම් වලින් 22% ක සහ තැන්පතු වලින් 24% ක වෙළඳපොළ කොටසක් පවත්වා ගනිමින්, තම දීර්ඝ කාලීන වෙළඳපොළ නායකත්වය ස්ථිර කර ගැනීමට බැංකුව සමත්විය. තවදුරටත් අංක එකේ බැංකුව ලෙස තම ස්ථාවරය තහවුරු කර ගනිමින් ලංකා බැංකුව 2018 වසරේදී රු. ට්‍රිලියන දෙකක වත්කම් ප්‍රමාණයක් වාර්තා කලේ තවත් මං සලකුණක් තම දිගු ගමනට එක් කරවමිනි.

අපගේ සියලු සාර්ථකත්වයන් සහ තෘප්තිමත් ගනුදෙනුකාර සේවාවන් සැපයීමේ පසු පස සිටින මූලිකම සම්පත වනුයේ බැංකුව සතු මානව සම්පතයි. මෙම මානව සම්පත තව තවත් පුළුල් කරනු වස් වසර තුළදී විවිධ වූ ක්‍රියාමාර්ගික දියත් කරන ලදී. අභියෝගාත්මක සහ විවිධාංගික කාර්යාවලියන් ඔස්සේ පැතිර පවතින වැඩ පරිසරයක් තුළ තම වෘත්තීය මෙන්ම පෞරුෂ සංවර්ධනය තුළින් උපරිම ඵල නෙලාගැනීමට උත්සුක කරනු වස් අප සේවක මණ්ඩල නිති දිරිමත් කරනු ලැබේ. ඒ ඔස්සේ විවිධවූත් උචිතවූත් පුහුණු වැඩසටහන් දේශීයව සහ විදේශීයව සපයනු ලැබේ. වසර තුළ දී ඉදිරි වසර තුනක කාලපරිච්ඡේදය සඳහා වන සාමූහික ගිවිසුම සාර්ථකව සාකච්ඡාවට බඳුන් කර ගිවිසුම් ගත කර අවසන් කරන ලද්දේ සියළුම සේවක හවතුන් වෙත වැඩිමනත් ප්‍රතිලාභයන් සහතික කරමින්ය.

ආයතනික යහපාලනය

බැංකුවේ යහපාලන ක්‍රියාවලිය පාදක වී ඇත්තේ නෛතික සහ අනුකූලතා වීම් නිසි අයුරින් ඉටුවන බව වගබලා ගැනීම උදෙසාය. මෙහිදී ක්ෂේත්‍රයේ පවතින සියලු ප්‍රශස්තම සම්මතයන්, නීති රෙගුලාසි ආදිය සැලකිල්ලට ගනිමින් ඉහළම ආයතනික යහපාලනයක් සහ ආචාර ධර්මයන් පවත්වාගෙන යාමට මුල්තැන දී කටයුතු කෙරේ. සමාලෝචනයට භාජනය කෙරෙන වසර තුළදී 23 වන වතාවක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වූ අතර 2019 පෙබරවාරි මාසයේදී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කෙරුනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිය යුතු අවධානයක් 2019-2021 යන ඉදිරිකාල පරාසය සඳහා ක්‍රමෝපායන් සකස් කිරීම, තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණය සහ ණය කළඹේ ගුණාත්මකභාවය රැක ගැනීම උදෙසා යොමු කරන ලදී. බැංකුවේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ කටයුතු වැඩිමනක් ශක්තිමත් සහ පුළුල් කරලීමේ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම ඉටු කරලීම ඉලක්ක කර ගනිමින් 2018 වසර තුළදී විශේෂිත වූ තොරතුරු සන්නිවේදන තාක්ෂණික කමිටුවක් නව අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් වශයෙන් පිහිටුවන ලදී. තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය, අල්ලස් විරෝධී සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තීන් හඳුන්වා දුන් අතර අනෙකුත් ප්‍රතිපත්ති සහ අදාළ විෂය රාමුවන් සමාලෝචනය කරන ලදී.

තිරසාරකත්වය සඳහා අපගේ කැපවීම

මූල්‍යමය මෙන්ම සාමාජීය යන දෙයාකාර අරමුණුම පෙරදැරිව කටයුතු කරන ආයතනයක් වශයෙන් තිරසාර ප්‍රතිපත්ති අපගේ මෙහෙයුම් කටයුතු සමඟ අනුගත කර ඇත. වසර තුළදී තව තවත් අපගේ තිරසාර ප්‍රතිපත්තිය තුළට තිරසාර සංවර්ධන ඉලක්ක (SGDs) තුළ අන්තර්ගත අරමුණු ඇතුලත් කිරීමට කටයුතු කල අතර සියළුම සේවක මණ්ඩලය හරහා තිරසාර අරමුණු කේන්ද්‍ර කරගත් විවිධ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවරයන් ආරම්භ කර ඇත්තේ රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණු වෙත සෘජු දායකත්වය සපයමිනි.

ඉහත සනිටුහන් තබන අතරම මම ඉතාමත් නිහතමානී අභිමානයකින් ප්‍රකාශ කර සිටින්නේ වාණිජ මණ්ඩලය මඟින් පිරිනමන තිරසාර සම්මාන උළෙලේදී උසස්ම ආයතන 10 අතරට පැමිණීමට ලංකා බැංකුවට හැකිවූ බවයි. මෙම අනගිභවනීය අවස්ථාව ලද චිකම රාජ්‍ය ආයතනය වූයේ ද ලංකා බැංකුවයි. පාර්ශ්වකරුවන් වෙත අගය ජනනය කිරීම වාර්තාකරණයේ දී සමෝධනික වාර්තාකරණ රාමුව සහ GRI තිරසාර මූලධර්ම අනුගමනය කිරීම තුළින් ද අපගේ තිරසාර වටිනාකම් ජනනය කිරීම උදෙසා කැපවීම විදහා දක්වයි. අපගේ ආයතනික වාර්තාකරණයේ විශිෂ්ටත්වය විදහා දක්වමින් 2017 වසර සඳහා වන වාර්ෂික වාර්තාව 2018 වසරේ පැවති දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (SAFA) විශිෂ්ට ලෙසම ඉදිරිපත් කරන ලැබූ වාර්තාවන් අතර ඇගයීමට ලක්විය. තවදුරටත් එම වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලබන වාර්ෂික වාර්තා ඇගයීම සඳහා වන සම්මාන උළෙලේ දී දෙවන වරටත් රාජ්‍ය අංශයේ ආයතන අතරින් රන් සම්මානය දිනා ගැනීමට සමත්විය.

පෙර දැක්ම

ශ්‍රී ලංකාවේ ඉදිරිය සඳහා අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් රාශියකි. ව්‍යවසායකත්ව සංවර්ධනය මූලික කරගත් ප්‍රතිපත්ති රාමුව, යලි ආරම්භ කෙරුනු විශාල යටිතල පහසුකම් සහිත ව්‍යාපෘති, සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් සහ ස්ථාපිත කරන ලද සාර්ව ආර්ථික මූලධර්මයන් මතින් ගොඩනැඟුනු ඉදිරි ආර්ථික දර්ශණය රටේ මූල්‍ය ක්ෂේත්‍රය වෙත සංවර්ධනයේ දොරටු විවර කරනු ඇතැයි අපේක්ෂා කල හැකිය. ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවා සැපයුම, රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වල සංවර්ධනයට උරදීම සහ තාක්ෂණික සහ ඩිජිටල්කරණය මඟින් මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීම ආදීවූ ක්‍රමෝපායන් ආයතනික සැලැස්මේ අන්තර්ගත පරිදිම ඉදිරියට ක්‍රියාවට නැගෙනු ඇත.

ස්තූතිපූර්වක ඇගයීම

සාර්ථක 2019 වසරක් සඳහා පෙරමඟ දකිමින් සිටින අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත මාගේ කෘතඥතාවය පලකරනුයේ ඔවුන්ගේ පෘථුල උපායමාර්ගික දැක්ම සහ නිබඳව සපයන ලද සහයෝගය වෙනුවෙන්ය. බැංකුවේ ක්‍රමෝපායන් සහ උපායමාර්ගයන් නිසියාකාරව ක්‍රියාත්මක කර අත්පත් කරගත් සාර්ථක ප්‍රතිඵල උදෙසා බැංකුවේ මහා කළමනාකාර මහතා වන සෙනරත් බණ්ඩාර මහතා ඇතුළු ආයතනික සහ විධායක කළමනාකාරීත්වයටත්, සියළුම ලංකා බැංකු සේවකභවතුන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය හිමිවේ. අපගේ චිකම කොටස්හිමිකරු වන ශ්‍රී ලංකා රජය අපගේ ශක්තිය වන අතර දක්වන ලද සියළුම සහයෝගයන් සහ මඟපෙන්වීම් සඳහා ගරු මුදල් අමාත්‍යවරයා සහ ගරු රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඇතුළු කාර්ය මණ්ඩල වෙත මාගේ ගෞරවපූර්වක ස්තූතිය පුද කරනු කැමැත්තෙමි. මාගේ ඇගයීම සහ ස්තූතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ නිලධාරී මණ්ඩලයට ද රජයේ විගණකාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද පිරිනමන්නේ සියලු අවස්ථාවලදී බැංකුවේ කටයුතු මනාව පවත්වාගෙන යාම උදෙසා පිරිනමන ලද සහයෝගය උදෙසාය. අපගේ ගනුදෙනුකාරභවතුන් අප සිදුකරනු ලබන සියලු කටයුතු වල හරය වේ, ඔවුන් විසින් මේසා දිගු කාලයක් පුරා බැංකුව වෙත තබන ලද අඛණ්ඩ විශ්වාසය උදෙසා මාගේ හද පිරි ප්‍රණාමය පුදකරමි. තවද අපගේ සියළුම සැපයුම්කරුවන් වෙතද, වෘත්තීය සම්තිවෙතද, අප සහ සම්බන්ධිත සියලු ප්‍රජා කොටස් වෙතද ඔවුන්ගේ නිබඳ සහයෝගය වෙනුවෙන් තුති පුද කරනු කැමැත්තෙමි. බැංකුව විසින් මෙතෙක් යම්තාක් වූ සාර්ථකත්වයක් ලබා ඇත්නම් ඒ සියලු මූල්‍ය සහ සාමාජීය සාර්ථකත්වයන් ඉහතකී සැමගේ දායකත්වයේ ප්‍රතිඵලයක් බව ගෞරවයෙන් සිහිපත් කරමි.

ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති

2019 මාර්තු 19 දින
කොළඹදී ය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

“ලංකා බැංකුව තම නොසැලෙන වෙළඳපොළ නායකත්වය තවදුරටත් සනාථ කරමින් රු. ට්‍රිලියන දෙකක වත්කම් ප්‍රමාණයක් සනිටුහන් කරමින් අංක එකේ සන්නාම නාමය සමඟින් නොමැකෙන සලකුණක් තබා ඇති බව මම මහත් අභිමානයෙන් යුතුව සටහන් තබමි.”

හිතවත් පාර්ශ්වකරුවනි,

ලංකා බැංකුව සිය සාර්ථකත්වයේ ප්‍රතිඵල සියලු පාර්ශ්වකරුවන් වෙත ලඟා කරදෙමින් විවිධ අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කරමින් තවත් සාර්ථක වසරක් නිමා කරන්නේ බැංකුවේ ශක්තිමත් පැවැත්ම විඳහා දක්වමින්ය. එබැවින් 2018 වසරේ සමාලෝචනය මා ඉදිරිපත් කරන්නේ ඉතාමත් අභිමානයකින් යුතුවය. 2018 වසර තුළදී සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීම උදෙසා අප විසින් ඉතා සුපරික්ෂාකාරීව සකස් කර නිරන්තර ඇගයීමට ලක්කරමින් අනුගමනය කරන ලද ක්‍රමෝපයන් ද ඉදිරි කාලය උදෙසා අපේක්ෂිත අපගේ දැක්ම ද මාගේ මෙම සමාලෝචනය තුළට අන්තර්ගත කර ඇත. මෙම වසර තුළදී ලංකා බැංකුව තම නොසැලෙන වෙළඳපොළ නායකත්වය තවදුරටත් සනාථ කරමින් රු. ට්‍රිලියන දෙකක වත්කම් ප්‍රමාණයක් සනිටුහන් කරමින් අංක එකේ සන්නාම නාමය සමඟින් නොමැකෙන සලකුණක් තබා ඇත්තේ දේශීය සහ විදේශීය සම්මාන 22 කට භාජනය වෙමින්ය. මෙම සම්මානයන් හා කාර්යඵලයන් අභියෝගාත්මක සහ විචල්‍ය ව්‍යාපාරික පරිසරය තුළ එම අභියෝගවලට උචිතම ක්‍රමෝපය තෝරා ගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ බැංකුව සතු හැකියාව විඳහා දක්වයි.

සාකල්‍ය ක්‍රමෝපායන්

අපගේ 2018 වසර සඳහා වන ක්‍රමෝපායන්, 2018 - 2020 සඳහා වන ආයතනික සැලැස්ම මත ගොඩනැඟුනු අතර, එය බැංකුව ඉදිරි අනාගතය සඳහා ප්‍රති නිර්මාණය සහ දිශාගත කිරීමේ තේමාව මත පදනම් විය. මෙම සැලැස්ම ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූ අංශ නවයක් මත ගොඩනගන ලදී. ගනුදෙනුකාර කේන්ද්‍රීයකරණය, භූගෝලීය විහිදීම වර්ධනය, තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව, මානව සම්පත් වර්ධනය යන අංශ මූලික කොටගත් උපායමාර්ගයන් හරහා නියාමන තලයට අනුගත වෙමින් තරඟකාරීව අනාගත අභියෝගවලට මුහුණ දීම මූලික කොටගෙන මෙම සැලැසුම සකස් කර ඇත. 2018 වසර තුළදී අපගේ අවධානය මූලික වශයෙන් පහත පරිදි දිශාගත විය;

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සංවර්ධන ණය:** රජයේ ජාතික සංවර්ධන වැඩපිළිවෙලේ චික් අංගයක් වන ව්‍යවසායකත්ව නඟාසිටුවීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම යන රාජ්‍ය ප්‍රතිපත්තිය සමඟ අනුගත වෙමින් බැංකුවද ''එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා''ණය යෝජනා ක්‍රමයන් වෙත තම නොමඳ දායකත්වය සපයා ඇත. මෙමඟින් සමාජ ආර්ථික සංවර්ධනයට දායකත්වය සපයනවා සමඟම අපගේ ණය කළඹ වර්ධනය කර ගනිමින් නව ගනුදෙනුකාර කණ්ඩායම් සමඟ සම්බන්ධවීමට අවස්ථාව ලැබී ඇත. එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයේ ප්‍රමුඛතම ණය සපයන්නා බවට පත්වෙමින් රු. බිලියන 13.6 ක ණය මුදල් ප්‍රමාණයක් 10,507 ක ණය පහසුකම් හරහා 2018 වසර තුළදී අප බැංකුව විසින් සපයා ඇත.

- **ඩිජිටල්කරණය:** බැංකුව සිය ගනුදෙනුකරුවන් වෙත සම්බන්ධ වන ක්‍රියාවලියන් පෙර නොවූ විරූ අන්දමින් වෙනසකට භාජනය කරමින් ඩිජිටල් තාක්ෂණය ආශ්‍රයෙන් මූල්‍ය සේවා සැපයුම් ක්ෂේත්‍රයේ පෙරළියක් සිදු කර ඇත. ගනුදෙනුකාර භවතුන්ගේ පවතින විවිධාංගිකරණය, ඩිජිටල්කරණය තුළින් සේවා සැපයීමේදී ලංකා බැංකුව මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වේ. කෙසේ වෙතත්, අපගේ ස්වයංක්‍රීය බැංකුකරණ සේවා සැපයුම් කටයුතු මූලික කොටගත් ක්‍රියාවලියන් ගනුදෙනුකාර පහසුව උදෙසා ඩිජිටල්කරණයට නිරතුරුව ලක්වේ.

  2018 වසර තුළදී බැංකුවේ මාර්ගගත බැංකුකරණ පහසුකම් සහ ‘B යෙදුම’ සමඟ සුහුරු බැංකුකරණ පහසුකම්, වැඩිමනත් දියුණු කල අතර ‘BOC ඩිජි’ මධ්‍යස්ථාන සහ මුදල් චක්‍රීයකරණ යන්ත්‍ර සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය පුළුල් කිරීමද සිදු කෙරුනි.

- **ණය කළඹේ ගුණාත්මකභාවය තහවුරු කිරීම** සාර්ව ආර්ථිකයේ පැවති මන්දගාමී තත්ත්වය ණය ආපසු ගෙවීම් මත අහිතකර බලපෑමක් ඇති කල අතර, එය සියළුම බැංකුවල ණය කළඹේ ගුණාත්මකභාවය කෙරෙහිද බලපාන ලදී. බැංකුවේ ණය ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම ණය අයකර ගැනීම සහ අධීක්ෂණය සඳහා වැඩි සේවක පිරිසක් යෙදවීම ආදී ක්‍රියාමාර්ග මඟින් අක්‍රීය ණය මඟින් බැංකුවේ කාර්යසාධනයට එල්ල වූ අහිතකර බලපෑම යම්තාක් දුරකට සමනය කර ගැනීමට හැකිවූ අතර, දළ අක්‍රීය ණය අනුපාතය 3.6% ක මට්ටමේ රඳවා ගැනීමට හැකි විය.

- **ගනුදෙනුකාර කේන්ද්‍රීයකරණය:** තෘප්තිමත් ගනුදෙනුකරුවා බැංකුව සතුව පවතින වැදගත්ම සම්පත බවට අප තරයේම පිළිගන්නා අතර, ගනුදෙනුකරු කේන්ද්‍රීය කරගත් පරිසරයක් ගොඩනැගීමට අපි නිරතුරුව විවිධ ක්‍රියාපිලිවෙත් අනුගමනය කරන්නෙමු. වර්තමාන ගනුදෙනුකරුවන් ඉතාමත් ඉහළ අවබෝධයකින් සහ විවිධ අවශ්‍යතා වලින් සමන්විත වන බැවින් ගනුදෙනුකරු කේන්ද්‍රීයව අප සියලු කටයුතු මෙහෙයවීම තරඟකාරීත්වයට මුහුණදීමට ඇති ප්‍රධානතම උපායමාර්ගයයි. බැංකුකරණ කටයුතු කෙරෙහි පහසුවෙන් යොමුවීමට හැකිවීම, සහ තම මුදලට සරිලන සේවාවක් ලැබීම ගනුදෙනුකරුවන්ගේ ප්‍රධාන බලාපොරොත්තු වන අතර, එම අභිලාශයන් ඉටුවන පරිදි අපගේ උපායමාර්ගික සැලසුම් දියත් කිරීමට අපි වගබලා ගන්නෙමු.

- **මානව සම්පත් සක්‍යතාවය වර්ධනය කිරීම:** 2018 වසර තුළදී, 1,600 ක පමණ තරුණ පිරිසක් බැංකුවේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කරගනිමින් මානව සම්පත ශක්තිමත් කරන ලදී. මේ සමඟ සේවක මණ්ඩල සාමාන්‍ය වයස් ප්‍රමාණය අවුරුදු 32 දක්වා අඩුවිය. අපගේ සේවක මණ්ඩලය විවිධ දැනුම, කුසලතා හා අදහස් වලින් සමන්විත වේ. මානව සම්පත් සංවර්ධනය තුළින් ඕනෑම අභියෝගයකට මුහුණදිය හැකි නිපුණතාවයෙන් හෙබි කණ්ඩායමක් බිහි කරලීම බැංකුවේ උපායමාර්ගය වේ. නවක කාර්ය මණ්ඩලය බැංකු වැඩ පරිසරයට හුරුකරවීම සඳහා මූලික පුහුණුවක් සපයන ලදී. 2018 වසර තුළදී සේවක පුහුණු වැඩකටයුතු සඳහා රු. මිලියන 338 ක මුදලක් වැය කරන ලදී.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

"අපගේ සන්නාම සහ බැඳුනු විශ්වසනීයත්වය සහ ශක්තිය, අපගේ තරඟකාරීත්වයේ කඩඉම් පසුකරමින් ඵලදායීවූත් දීර්ඝකාලීනවූත් ගනුදෙනුකාර සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට දායකවී ඇත."

- **තිරසාරකත්වය:** ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය වශයෙන් මෙන්ම, රටේ වඩාත්ම බලපෑමක් කල හැකි ආයතනයක් ලෙස රටේ සමාජ, ආර්ථික සහ පාරිසරික ගැටළු විසඳීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක (SGDs) සාර්ථක කර ගැනීම සඳහා වන රජයේ ප්‍රතිපත්ති සඳහා අප නිරතුරුව සහයෝගය ලබාදේ. වසර තුළදී බැංකුවේ තිරසාර ප්‍රතිපත්ති සහ දැක්ම පුළුල් කිරීමටත්, ස්ථාවර කිරීමටත්, විවිධ ක්‍රියාමාර්ග දියත් කරන ලදී.

සමාජ-ආර්ථික කැපවීම.

බැංකුව සතුව පවතින 62% ක පමණ වන ගනුදෙනුකාර ප්‍රතිශතය, රට පුරා විසිර පවතින ශාඛා ජාලය, විශාලතම තැන්පතු සහ ණය කළඹ බැංකුව විසින් සමාජ-ආර්ථිකමය වශයෙන් සිදුකල හැකි බලපෑමට සාක්ෂි සපයයි. රජය සතු ආයතනයක් ලෙස සහ දේශීය වශයෙන් වැදගත් වන බැංකුවක් ලෙස අපගේ අරමුණු හුදු මූල්‍යමය ප්‍රතිඵලයන් වෙතම පමණක් කේන්ද්‍රගත නොවන අතර මූලික සමාජ-ආර්ථිකමය අභිලාෂයන් ඉටුකරමින් අපගේ සියලු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් ජනනය කරලීම තෙක් අපගේ අරමුණු පුළුල් වේ. මේ අනුව ජනතාව, පරිසරය සහ ප්‍රතිලාභ යන ත්‍රිත්වය අංශයන් වෙතම අවධානය යොමුවූ චින්තනයකින් පෝෂිතව අපගේ සියලු සැලසුම්, මෙහෙයුම් කටයුතු සහ තීරණ ගැනීම් සිදු කරනු ලැබේ.

ජනතාව

වටිනාකම් ජනිත කරලීමේ අපගේ ක්‍රියාවලිය 8,724 ක පිරිසකින් සමන්විත වූ අපගේ සේවක පිරිස මත ගොඩනැගී ඇති අතර, ඔවුන් සතු මහත් වූ කැපවීමත්, අත්දැකීම් සහ පළපුරුද්දත්, වෘත්තීමය දැනුමත් අපගේ ක්‍රමෝපයන් ක්‍රියාවට නංවන ප්‍රධාන මෙවලම වේ. බැංකුවටම ආවේනික වූ ක්‍රියා පිළිවෙත්, නිරන්තරයෙන් මානව සම්පත් සංවර්ධනයට යොමුවූ ක්‍රමෝපායන්, උද්යෝගිමත් වැඩ පරිසරයත්, ඉහළ මට්ටමේ පවතින සේවක සහසම්බන්ධතා ක්‍රියාවලියත්, රටේ ප්‍රශස්තම සේවායෝජකයින් අතර වැජඹීමට ලංකා බැංකුවට ඉඩ සලසා ඇත. 2018 වසර තුළදී අපගේ සේවාදායකයින් වෙත ජනිත කල අගය 11% ක වර්ධනයක් සමඟ රු. බිලියන 18.9 ක් වූ අතර 93% කට වැඩි සේවක ප්‍රතිශතයක් පුහුණු වැඩසටහන් වෙත සහභාගී කරවන ලදී.

විවිධ පරාසරයන් තුළ විසිර පවතින තැන්පතු, ණය සැපයුම් සහ ගනුදෙනුකරණය මූලික කරගත් සේවා සැපයුම් මත දිවයින පුරා විසිර පවතින මිලියන 13 ක් වූ පුළුල් ගනුදෙනුකාර පදනමකට අප ප්‍රවේශ වේ. අපගේ නාමය සමඟ ගොඩනැගී ඇති විශ්වසනීයත්වය සහ තිරතාවය අර්ථාන්විතවූත්, ශක්තිමත් වූත් ගනුදෙනුකාර සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමේ මූලිකාංගයන් වන අතර අපේ ප්‍රධාන තරඟකාරීත්ව සවිය ද එයම වේ. මෑත කාලීනව අප විසින් අනුගමනය කළ ඩිජිටල්කරණ පරිවර්තන ක්‍රමවේදයන් රටේ යෞවන ප්‍රජාව මූලික කොටගත් අතර එමඟින් ඔවුන්ගේ සේවා අවශ්‍යතා ඍජුවම සපයමින් ඔවුන් වෙත තවදුරටත් ලඟාවීමට වගබලා ගන්නා ලදී.

ග්‍රාමීය පරිසරය දක්වාම විසිර පවතින අපගේ පුළුල් සේවා සැපයුම් ජාලය ප්‍රයෝජනයට ගනිමින් අඩු ආදයම් සහිත ප්‍රජාව ආර්ථික බලගැන්වීමේ සහ මූල්‍ය ඇතුලත්කරණය වර්ධනය කිරීමේ රජයේ වැඩ පිළිවෙලට බැංකුව විසින් නිබඳ දායකත්වය සපයා ඇත්තේ ඔවුන්ට දැරිය හැකි මට්ටමේ ණය පහසුකම් සැපයීමේ ක්‍රමවේදයන් මඟිනි. ලංකා බැංකුවට ආවේනික වූ ක්ෂුද්‍ර ණය සැපයුම් ක්‍රමයක් වන ''බී ඕ සී මිතුරු'' ණය ක්‍රමය, ණය පහසුකම් සපයා ගැනීමට අපහසු අඩු ආදයම් ලාභී ව්‍යවසායකත්ව කණ්ඩායම් පෝෂණය කිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන අතර වසර තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් වෙත රු. බිලියන 64.4 ක් සපයා ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදන ගනුදෙනුකරුවන් ගණන 496,000 ක් ඉක්මවයි. විශේෂිත සංවර්ධන අවශ්‍යතා ඉලක්ක කරගත් ණය යෝජනා ක්‍රම 50 කට වැඩි ප්‍රමාණයක් බැංකුව විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

ප්‍රතිලාභයන්

බැංකුව 2018 වසර තුළදී ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පෙන්වූ අතර රු. බිලියන 31.9 ක බදු පෙර ලාභයක් වාර්තා කලේ 5% ක වර්ධනයක් සමඟ විවිධ වූ ආර්ථික සහ ක්ෂේත්‍රයට ආවේනික වූ අභියෝග හමුවේය. ගෝලීය ආර්ථිකයේ සිදුවූ දේශපාලනික තත්ත්වයන්, දේශීය ආර්ථිකයේ පැවති ගැටළුකාරී තත්ත්වයන්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පසු බැස්මත්, අහිතකර කාලගුණික තත්ත්වයන්, 2018 වසරේ මෙහෙයුම් පරිසරය වෙත බලපෑම් ඇති කරන ලදී. මෙම අභියෝග හමුවේ උවද ණය කළඹේ වර්ධනය 24% ක් වූ අතර ආයතනික ණය සහ ශාඛා මට්ටමේ ණය සැපයීම් මීට දායකවිය. ඉහළ යන පොළී අනුපාත තත්ත්වයක් පැවතියද වසර තුළදී බැංකුව සිය ණය පොළී අනුපාතයන් ගනුදෙනුකරුවන් වෙත පීඩනයක් ඇති නොවන මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කල අතර මේ හේතුවෙන් බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය පෙර වසරේ පැවති 3.2% සිට 3.1% දක්වා අඩු විය.

සමස්ත බැංකු ක්ෂේත්‍රයම ණය කළඹේ ගුණාත්මකභාවය පිළිබඳව අර්බුදයකට මුහුණ පෑවේ ආර්ථිකයේ පැවති ගැටළු සහිත තත්ත්වයත්, ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ණය අර්බුදයත්, මන්දගාමී කෘෂිකාර්මික ක්ෂේත්‍රයත් හේතුවෙනි. බැංකුව විසින් අනුගමනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ ශක්තිමත් වැඩ පිළිවෙල සහ නිරන්තර අධීක්ෂණය මඟින් මෙම අහිතකර බලපෑම් මත ණය කළඹේ ගුණාත්මකභාවය කෙරේ ඇතිවූ පීඩනය යම් තරමක් දුරට අවම කර ගැනීමට බැංකුවට හැකිවිය. දළ අක්‍රීය ණය අනුපාතය පෙර වසරේ පැවති 2.8% සිට 3.6% දක්වා මෙම වසර අවසාන වන විටදී ඉහළ ගියේය. ණය කළඹේ ගුණාත්මකභාවය මත සහ නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණය ප්‍රමිත 09 අනුව වන ණය හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීම මත වසර සඳහා වෙන් කරන ලද ණය හානිකරණ ප්‍රතිපාදන 48% කින් ඉහළ ගියේය. බැංකු ක්ෂේත්‍රයේම ණය හානිකරණ උදෙසා ප්‍රතිපාදන වෙන් කිරීමේ වර්ධනය 104% ක් විය.

බැංකුවේ මුළු මෙහෙයුම් වියදම 19% කින් ඉහළ ගිය අතර ආදායමට වියදම් අනුපාතය 38% ක් වූයේ ක්ෂේත්‍රයේ හොඳම අගයන් අතරට එක්වෙමින්ය. කෙසේ නමුත් වසර තුළදී මූල්‍ය සේවා මත වන බදු රු. බිලියන 9.6 ක් බැංකුව වාර්තා කලේ 32% ක වර්ධනයක් සමඟය. ආදායම් බදු වියදම රු. බිලියන 12.4 ක් වූ අතර එහි වාර්ෂික වර්ධනය 38% ක් විය. ආදායම් බදු පනත යටතේ හඳුන්වාදුන් ණය ආපසු ගෙවීමේ බද්ද සහ පෙර පැවති බදු සහන කිහිපයක් ඉවත් කිරීම නිසා බදු වියදම ඉහළ ගිය අතර බදු පසු ලාභය 9% කින් පහළ යාමට මෙය හේතු විය.

වසර තුළ දී රජයට ලාභාංශ වශයෙන් රු. බිලියන 4.8 ක් බැංකුව විසින් ගෙවන ලදී. බදු ගෙවීම් සමඟ මෙම ලාභාංශ ගෙවීම් ද එකට සලකා බැලීමේදී වසර තුළදී බැංකුව විසින් රජයට සැපයූ දායකත්වය රු. බිලියන 24.2 කි.

බැංකුව සිය සියලු නියාමන ප්‍රතිශතයන් නියමිත අනුකූලතා මට්ටම් වලට ඉහළින් පවත්වා ගැනීමට සමත් වූ අතර, බාසල් III අනුකූලතාවයන් සහ නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 යේ අවශ්‍යතාවයන් නියමිත පරිදි අනුගමනය කර ඇත.

පරිසරය

මූල්‍ය ආයතනයක් වශයෙන් පරිසරය වෙත සෘජුවම අපගේ ක්‍රියාකාරකම් මතින් ඇති වන බලපෑම සීමා සහිත වේ. ඒ කෙසේ වුවත් අපගේ ක්‍රියාකාරකම් මතින් පරිසරය කෙරෙහි වන අහිතකර බලපෑම උපරිම වශයෙන් අවම කර, ණය ලබාදීමේ ක්‍රමවේදයන් සහ මෙහෙයුම් කටයුතු පරිසර හිතකාමී අයුරින් හැඩ ගැස්වීම මඟින් අප අපගේ පාරිසරික වගකීම ඉටු කරයි. සවිස්තරාත්මක පාරිසරික සහ සාමාජීය බලපෑම විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කර ඇති අතර ණය ලබාදීමේදී මෙය උපයෝගී කර ගනිමින් ණය මුදල් භාවිතයේදී සිදුවිය හැකි පාරිසරික බලපෑමද ණය විශ්ලේෂණයේ දී සැලකිල්ලට ගනී. හරිත ණය ව්‍යාපෘති වෙත බැංකුව ක්‍රියාකාරීව දායකත්වය සපයන අතර, සූර්ය බලශක්ති ව්‍යාපෘති, අපද්‍රව්‍ය මඟින් බලශක්ති උත්පාදනය, සුළං බලයෙන් විදුලි ජනනය වැනි ව්‍යාපෘති මේ අතර වේ. අපගේ ශාඛා පද්ධතියෙන් ශාඛා 27 ක් සූර්ය බලයෙන් විදුලිය සපයා ගන්නා අතර ජාතික විදුලි සැපයුම් ජාලයට මෙගා වොට් එකක ධාරිතාවයක් ද සපයනු ලැබේ.

ලාභදායීත්වය සහ ස්ථාවරත්වය අතර තුලනය

නව බාසල් III ප්‍රමිත සහ නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 ක්‍රියාත්මක වීමත් සමඟම බැංකු ක්ෂේත්‍රයේ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍යතාවයද වර්ධනය විය. රාජ්‍ය අයිතිය ඇති ආයතනයක් වශයෙන් කොටස් වෙළඳපොළ හරහා ප්‍රාග්ධනය රැස්කර ගැනීමට ඇති අවහිරතාවය, ලංකා බැංකුවේ අභියෝගාත්මක තත්ත්වය තවදුරටත් තීව්‍ර කරන ලදී. වසර තුළදී රජය විසින් සපයන ලද රු. බිලියන 5 ක් වූ ප්‍රාග්ධන ප්‍රමාණය බැංකුව මත බලපෑ පීඩනය ලිහිල් කර ගැනීමට ඉවහල් වූ අතර ඉදිරි වර්ධන වේගය ප්‍රාග්ධන අනුකූලතා සමඟ තුලනය කරමින් පවත්වා ගැනීමට අපට සිදුවී ඇත. නව ගිණුම්කරණ ප්‍රමිත (SLFRS 09) මඟින් බැංකු ක්ෂේත්‍රයේ ණය හානිකරණය උදෙසා කටයුතු කරන ආකාරය ආකල්පමය වශයෙන් සිටම වෙනසකට ලක් කල අතර එයට අනුගත වීමටද යම්තාක් වෙහෙසක් ගෙන කටයුතු කිරීමට සිදුවී ඇත.

ඉදිරි දැක්ම

බැංකුවේ 80 වන සංවත්සරය අභිමුවේ අපි සිටින්නෙමු. 2019 වසර එබැවින් විවිධ වූ කටයුතු ක්‍රියාවට නංවන වසරක් වනු ඇත. ඒ සමඟම අපගේ ආර්ථික, පාරිසරික සහ සාමාජීය වගකීම් ද රාශියක් ක්‍රියාවට නංවනු ඇත. සාර්ව-ආර්ථිකයේද පිබිදීමක් බලාපොරොත්තු වන්නේ මධ්‍ය කාලීන හා දිගු කාලීන දර්ශණයකින් හෙබි මූල්‍ය හා සංවර්ධන ප්‍රතිපත්ති, නිසි පරිදි පාලිත තෙල් මිල සහ යහපත් කාලගුණික වටපිටාව මතය.

අපගේ ක්‍රමෝපායන් ගොඩනැගෙන්නේ ආර්ථිකයේ පවතින අවස්ථාවලින් උපරිම ඵල නෙලා ගනිමින් ජාතික ප්‍රතිපත්ති මත අනුගත වෙමින්ය. ශ්‍රී ලංකාවේ අංක එකේ මූල්‍ය ආයතනය ලෙස ස්ථාවරත්වය රැකගැනීමට උපායශීලීව කටයුතු කිරීමේ දී, ගනුදෙනුකරු කේන්ද්‍රීයවීම, මානව සම්පත සංවර්ධනය කිරීම, සන්නාමකරණය, ණය කළඹේ ගුණත්වය ඉහළ නැංවීම ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන අංශවේ.

ස්තූතිය

සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සපයන ලද දැක්ම සහ මඟපෙන්වීම මම ඉතාම අගය කොට සලකමි, කෘතඥ වෙමි. මෙතරම් කැපවීමකින් බැංකුව දියුණුව කරා රැගෙන යාමට කටයුතු කරන ආයතනික සහ විධායක කළමනාකාරිත්වය සහ සේවක මණ්ඩලය සමඟ කටුයුතු කිරීමට ලැබීම ගැන අභිමානයට පත්වන අතරම මෙම වාර්ෂික වාර්තාවේ ඇතුලත් සියලු කාර්යඵලයන් උදෙසා දක්වන ලද දායකත්වයට ප්‍රණාමය පුදකරමි. වෘත්තීය සමිති සාමාජිකත්වය සහ විශ්‍රාමික සේවක භවතුන්ගේ සහයද අගයමි. අපගේ වටිනාම සම්පත වන ගනුදෙනුකාර භවතුන් අප බැංකුව වෙත තැබූ විශ්වාසය මම හදපිරි සතුටින් අගයමි. තවද, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ එම අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයටත්, ගරු රාජ්‍ය ව්‍යවසාය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ එම අමාත්‍යංශයේ කාර්ය මණ්ඩලයටත් අප හට දක්වන ලද නිරන්තර සහයෝගය උදෙසා ස්තූති පූර්වක වෙමි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය උදෙසා දක්වන ලද නිරන්තර මඟපෙන්වීම් උදෙසා මාගේ ප්‍රශංසානාත්මක ස්තූතිය පිරිනමමි. තවද මෙම වාර්තාව ඇතුළුව මූල්‍ය වාර්තාවන් නියමිත පරිදි ඉදිරිපත් කරලීම සඳහා දැක්වූ සහයෝගය උදෙසා විගණකාධිපතිතුමා ඇතුළු ඔහුගේ කාර්යමණ්ඩලයටද ගෞරවනීය ස්තූතිය පුද කරමි.



සෙනරත් බණ්ඩාර
මහා කළමනාකාරතුමා

2019 මාර්තු 19
කොළඹදී



ඩිජිටල්කරණයත් සමඟ ඉදිරියට යන වර්තමාන බැංකු සේවාවේ වර්ධනය හා ඒකාග්‍ර වීමේදී තාක්ෂණ භාවිතය අප ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සමඟ ගැලපීමට අප සමත්වී තිබේ.

වත්මන් තාරුණ්‍යයේ ඩිජිටල් තාක්ෂණය සමඟ මුසුවූ ජීවනරටාවට සරිලන පරිදි ගනුදෙනුකාර සේවා අත්දැකීම් ලබාදීමට අපි සැමවිටම කටයුතු කරන්නෙමු.

DEPOSIT
Cheque Deposit

ලංකා බැංකුවේ දළ විශ්ලේෂණය

ලාංකීය බැංකු ක්ෂේත්‍රය තුළ අභියෝගයට ලක් නොවූ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස ලංකා බැංකුව, ශ්‍රී ලාංකීය සමාජයට ආර්ථික හා සමාජීය වශයෙන් විශාල බලපෑමක් සිදුකල හැකි ආයතනයක් වේ. බැංකු ක්ෂේත්‍රයේ වත්කම් හා තැන්පතු වෙළඳපොළ කොටසින් පිලිවෙලින් 22% ක් හා 24% ක් නියෝජනය කරමින් හා සෘජු සේවා සැපයුම් මධ්‍යස්ථාන 1,721 ක් සහිතව ක්ෂේත්‍රයේ පුළුල්ම සේවා ජාලයක් සහිත බැංකුව ලෙස ලංකා බැංකුව, 62% ක පාරිභෝගික ව්‍යාප්තියකට හිමිකම් කියනු ලැබේ. පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත බැංකුවක් ලෙස, ලංකා බැංකුව සෑම විටම ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා තම දායකත්වය සපයමින් හා සාමාන්‍ය පුරවැසියන්, ව්‍යාපාරිකයන් සහ රජය ආදී වූ අපගේ ගනුදෙනුකරුවන්ගේ දියුණුවේ සහකරු ලෙසද දශක අටක් පුරා බැංකුව අඛණ්ඩව කටයුතු කරමින් සිටී. විදේශීය ශාඛා තුනක්, විදේශීය පරිපාලිත සමාගමක් සහ විදේශීය රටවල් 170 ක් පුර පැතිර ඇති නියෝජිත බැංකු 758 ක් හා නියෝජිත ආයතන 101 කින් බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් ජාලය සමන්විත වේ. ගනුදෙනුකරුවන් මිලියන 13.4 ක් සඳහා සේවය සපයන 8,724 ක් වූ සේවක ප්‍රජාවක් මඟින් ලංකා බැංකුව බලගන්වනු ලැබේ.

ලංකා බැංකු සමූහය පරිපාලිත සමාගම් 10 ක් සහ ආශ්‍රිත සමාගම් හතරකින් සමන්විත වේ. මූල්‍ය සේවා, දේපල කළමනාකරණ සේවා සහ ජල විදුලි උත්පාදනය වැනි විවිධාකාර මෙහෙයුම් පරාසයක පරිපාලිත සමාගම් නිරත වේ. සමූහය තුළ සමූහයේ විශාලතම ආයතනය වන්නේ බැංකුවයි. එය ඒකාබද්ධ වත්කම්වලින් 98% කට වගකියනු ලැබේ. පද්ධතිමය වශයෙන් වැදගත් වූ රාජ්‍ය මූල්‍ය ආයතනයක් ලෙස, බැංකුවේ ක්‍රියාකාරිත්වය හුදු මූල්‍ය සේවා සපයන අතරමැදියෙකුට වඩා ගිය වගකීමක් ඇත. අඩු ආදායම්ලාභීන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමත්, මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමත්, ජාතික සංවර්ධන ව්‍යාපෘති වලදී රජයේ හවුල්කරුවෙකු ලෙසත්, මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගැනීමත්, මහජනතාවගේ අවශ්‍යතා සඳහා කැපවීමත් ලංකා බැංකුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ලංකා බැංකුව දේශීය මෙන්ම විදේශීයව පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වලින් ණය ශ්‍රේණි ගතකිරීම් ලබාගෙන ඇති අතර, ණය ශ්‍රේණි ගත කිරීම් සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට මේ වසර තුළද හැකිවී ඇත.

වෙළඳපොළ තත්ත්වය

වත්කම්, ණය සහ අත්තිකාරම්, තැන්පතු හා ලාභය අනුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය.

රු. ට්‍රිලියන
2.3 ක
වත්කම්

රු. ට්‍රිලියන
1.8 ක
තැන්පතු

මූල්‍ය ස්ථාවරත්වය

AA+(lka)
ස්ථාවර

ෆිච් රේටින්ග්ස් ලංකා ශ්‍රේණිගත කිරීම

AAA ස්ථාවර

ICRA ලංකා ලිමිටඩ් ශ්‍රේණිගත කිරීම

සංඛ්‍යා වලින් ඔබ්බට

රු. බිලියන
24.2 ක

රජයට ජනිත කල වටිනාකම (ලාභාංශ + බදු)

තිරසාර ව්‍යාපාරයක්

රු. මිලියන
338.0 ක

පුහුණු කිරීම් හා සංවර්ධනය සඳහා ආයෝජනය



● බැංකුව ● අනෙකුත් බැංකු

1. වත්කම් **22%**
2. තැන්පතු **24%**
3. දළ ණය සහ අත්තිකාරම් **22%**
4. බදු ගෙවීමට පෙර ලාභය **17%**

ශ්‍රී ලංකාවේ අංක

1

වෙළඳ නාමය

බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් සහ අන්තර් සන්නාම නාමාවලියේ ශ්‍රේණිගත කිරීම්

මිලියන 13.4 ක

ගනුදෙනුකරුවන්

(ජනගහනයෙන් 62%)

1,721

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සෘජු)

B2 ස්ථාවර

මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස් ශ්‍රේණිගත කිරීම

B ස්ථාවර

ෆිච් රේටින්ග්ස් ශ්‍රේණිගත කිරීම

වසර ගණනාවක් පුරාවට පැහැදිලි විගණන මතයක්

10.3%

පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය

14.6%

මුළු ප්‍රාග්ධනය

1.5%

වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය

රු. බිලියන

64.4 ක්

සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ ණය ප්‍රදානයන්

රු. බිලියන

139.3 ක්

යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය ලබා දීම

රු. බිලියන

551.5 ක්

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

27

සූර්ය බලශක්තිය සඳහා යොමු වූ ශාඛා

රු. මිලියන

3,600.0 ක

පුනර්ජනනීය බලශක්තිය සඳහා ණය ප්‍රදානයන්

මිලියන 7 ක්

ඩිජිටල් මුලපිරීම් හේතුවෙන් ඉතිරි වූ A4 කඩදාසි ප්‍රමාණය

රු. මිලියන

107.9 ක

ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය

ලංකා බැංකුවේ දළ විශ්ලේෂණය

සේවා මධ්‍යස්ථාන ව්‍යාප්තිය



ආයතනික හා විදේශීය සේවා මධ්‍යස්ථාන

ආයතනික ශාඛා	05	14	17	03
ප්‍රමුඛ බැංකු සේවා	1	-	1	-
විදේශීය ශාඛා	3	-	4	-
අක්වෙරළ බැංකු ශාඛා	1	-	-	-
ජංගම ඒකකය	-	-	1	-

මුළු පාරිභෝගික සේවා මධ්‍යස්ථාන

ශාඛා	577
සීමිත සේවා සැපයුම් ශාඛා	52
ජංගම ශාඛා	06
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	776
මුදල් තැන්පත් යන්ත්‍ර / මුදල් චක්‍රීකරණ යන්ත්‍ර	281
ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන	14
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන	15

සමූහයේ ව්‍යුහය



* මෙහෙයුම් කටයුතු වල නිරත නොවේ

අධ්‍යක්ෂ මණ්ඩලය

1. **රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතීඥ** - සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
2. **කේ ඒ විමලෙන්තිරාජා මහතා** - නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ
3. **කුමාර් මායාදුන්නේ මහතා** - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
4. **පී ඒ ෂාෆ්ටර් මහතා** - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
5. **ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය** - ලේකම් - ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

රොනල්ඩ් සී පෙරේරා මහතා
ජනාධිපති නීතිඥ - සභාපති,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය:

12 පෙබරවාරි 2019 (14 පෙබරවාරි 2019 වැඩ භාරගන්නා ලදී)

කුසලතා හා අත්දැකීම්:

පෙරේරා මහතා ප්‍රාථමික අධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂයෙන් සිවිල් හා අපරාධ නඩු කටයුතු, වාණිජ කෙටුම්පත්, ප්‍රවාහන කොන්ත්‍රාත් සහ ගිවිසුම් සම්බන්ධ පුළුල් පළපුරුද්දක් ඇති නීතිඥවරයෙකි. ඔහු වාණිජ නීති, බැංකු නීති, කාර්මික නීති, තහනම් නියෝග, අපහාස නඩු, මැතිවරණ පෙත්සම්, සිවිල් අභියාචනා, සංශෝධනය කිරීමේ අයදුම්පත්, නීති ආඥා සහ මූලික අයිතිවාසිකම් නඩු සම්බන්ධ විශේෂඥයකු ද වේ. එමෙන්ම ඔහු විවිධ වාණිජ බේරුම්කරණ කටයුතු සඳහා ද දායකත්වය සපයා ඇත.

පෙරේරා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති උපාධිය සහ එක්සත් රාජධානියේ නොර්තම්බ්‍රියා විශ්වවිද්‍යාලයෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබාගෙන ඇත.

වෙනත් පත්වීම්:

හොටෙල්ස් කලම්බු සමාගමෙහි වැඩබලන සභාපති

කලින් දැරූ ප්‍රධාන තනතුරු:

ලංකා බැංකුවේ, ලංකා බැංකුව (යූ.කේ.) සමාගමෙහි, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී හි සභාපති සහ අධ්‍යක්ෂවරයකු, සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම සහ සී/ස මිරේකා හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලය

කේ ඒ විමලෙන්තිරාජා මහතා
නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය:
12 පෙබරවාරි 2019

කුසලතා හා අත්දැකීම්:
රාජ්‍ය සේවයේ වසර 24ක පළපුරුද්දක් ඇති විමලෙන්තිරාජා මහතා නිතිඥවරයකුද වේ. ඔහු යාපනය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය ද පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා දර්ශණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද මොරටුව විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතීවේදී උපාධියද ලබා ඇත. එමෙන්ම ඔහු සංවර්ධන අධ්‍යයන සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද මානව සම්පත් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.

වෙනත් පත්වීම්:
මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා ජාතික වෙළඳ සම්මේලන කණ්ඩායමේ සාමාජික සහ සාර්ක් සංවර්ධන අරමුදලේ නේවාසික අධ්‍යක්ෂ. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල වල මහා භාණ්ඩාගාරය නියෝජනය කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු:
ලංකා බැංකුවේ නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂට විකල්ප අධ්‍යක්ෂ, වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, පරිපාලන ප්‍රතිසංස්කරණ හාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය පාරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරී, චීනයේ බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍යාංශ උපදේශක.

කුමාර් මායාදුන්නේ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය:
21 පෙබරවාරි 2019

කුසලතා හා අත්දැකීම්:
මායාදුන්නේ මහතා උපායමාර්ගික, භාණ්ඩාගාර, මෙහෙයුම්, පුද්ගලික බැංකු කටයුතු, අනුකූලතා, ජාත්‍යන්තර මෙහෙයුම් සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය යන විවිධ අංශ ආවරණය වූ වසර 45 කට අධික අත්දැකීම් සමුදායකින් සපිරි විශ්‍රාමලත් බැංකුනිලධාරියෙකි. නිදහස් ආර්ථිකය හඳුන්වා දුන් මුල් අවධියේදී විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් ස්ථාපනය කිරීම සඳහා ඔහු විශාල දායකත්වයක් දැක්වූ අතර කොළඹ කොටස් වෙළඳපොළ මෙහෙයුම් සඳහා විදේශ ගනුදෙනුකරුවන්ට භාරකාර සේවා හඳුන්වා දීම සඳහා විශාල වශයෙන් දායක විය. මෑතදී ඝණ සංවර්ධන බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ලෙස ඔහු ජාත්‍යන්තර මූල්‍ය සමායතනයේ ව්‍යාපෘතියක් හරහා ඔවුන්ගේ පරිවර්තන ක්‍රියාවලිය සඳහා නායකත්වය ලබා දුනි.

එක්සත් රාජධානියේ ඇෂ්රිජ් බිස්නස් ස්කූල් හි ආදී සිසුවකු වන මායාදුන්නේ මහතා බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු වන අතර ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ විදේශ මෙහෙයුම් කටයුතු සම්බන්ධ පුහුණුවීම් හා සම්බන්ධවී ඇත.

වෙනත් පත්වීම්:
බැංකු උපදේශක

කලින් දැරූ ප්‍රධාන තනතුරු:
ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ, මහජන බැංකුවේ, නේෂන් ට්‍රස්ට් බැංකුවේ සහ ඝණ සංවර්ධන බැංකුවේ ජ්‍යේෂ්ඨ තනතුරු රැසක් දරා ඇත.
එමෙන්ම ඔහු අර්නස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරිවරුන්ගේ බැංකු කටයුතු පිළිබඳ උපදේශක ලෙස ද ඉන්ද්‍රා ෆයිනෑන්ස් ලිමිටඩ් හි ස්වාධීන අධ්‍යක්ෂවරයකු ලෙස ද සේවය කර ඇත.

පී ඒ ෂාෆ්ටර් මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

<u>අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය:</u>

26 පෙබරවාරි 2019

<u>කුසලතා හා අත්දැකීම්:</u>

ෂාෆ්ටර් මහතා එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ අධි සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානියේ රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 25 කට වැඩි පලපුරුද්දක් සතු වේ. එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් සරසවියේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපධියක් සහ එක්සත් රාජධානියේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධිදාරියෙකි.

<u>වෙනත් පත්වීම්:</u>

ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී හි සභාපති, ජනශක්ති පී එල් සී, ඔරියන්ට් ෆයිනෑන්ස් පී එල් සී (පෙර බාට්ලිට් ෆයිනෑන්ස් පී එල් සී) ඩුනාමීස් කැපිටල් හෝල්ඩිංස් පී එල් සී සහ ෆස්ට් කැපිටල් හෝල්ඩිංස් පී එල් සී හි අධ්‍යක්ෂක ධූරයන්.

<u>කලින් දැරූ ප්‍රධාන තනතුරු:</u>

සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පී එල් සී, කැන්ර්ච් ෆයිනෑන්ස් පී එල් සී සහ ඇක්ලන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රොකර්ස් හි අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු දරා ඇත. එමෙන්ම ඔහු ජනශක්ති රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂක/ සාමාන්‍යාධිකාරී විශයෙන් ද ජනශක්ති රක්ෂණ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ හිටපු සභාපතිවරයකු ද වේ.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
(ලේකම් - ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

විස්තර පිටු අංක 33 හි දක්වා ඇත.

ආයතනික කළමනාකාරීත්වය

අසුන්ගෙන (වමේ සිට දකුණට)
ගයා ජයසිංහ මහත්මිය, සෙනරත් බණ්ඩාර මහතා (මහා කළමනාකරු), ඩබ් පී රසල් ෆොන්සේකා මහතා, ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

සිටගෙන (වමේ සිට දකුණට)
එම් ජේ පී සල්ගාදු මහතා, ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා, ඩබ් එන් පී සුරවිමල මහතා, පී එම් ලියනගේ මහතා, සී අමරසිංහ මහතා, ඩී එම් එල් බී දසනායක මහතා, කේ ඊ ඩී සුමනසිරි මහතා, එම් එම් ලක්ෂමන් පෙරේරා මහතා, ආර් එම් ඩී විපුල ජයබාහු මහතා, ඊ එම් ජයරත්න මහතා, ඩබ් අයි හෙට්ටිහේවා මහත්මිය, ඩී පී කේ ගුණසේකර මහතා, ඩී එන් එල් ප්‍රනාන්දු මහතා

ආයතනික කළමනාකාරීත්වය

සෙනරත් බණ්ඩාර මහතා
මහා කළමනාකරු

2018 පෙබරවාරි මස 22 වන දින මහා කළමනාකරු ලෙස පත්විය.

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2012 මාර්තු මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම, සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසර්ස් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, ලංකා බැංකුව (යූ.කේ.) සමාගම, සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම.

කුසලතා හා අත්දැකීම්:

වෘත්තීය බැංකුකරුවකු වන බණ්ඩාර මහතා වසර 29 කට වඩා විවිධ ක්ෂේත්‍ර තුළ දේශීය හා ජාත්‍යන්තර බැංකු කටයුතු සම්බන්ධව බැංකුකරණ අත්දැකීම් ලත් අයෙකි. කැළණිය විශ්වවිද්‍යාලයේ දෙවන පන්ති ඉහළ සාමාර්ථයක් සහිත භෞතික විද්‍යා උපාධිධාරියකු වන බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරන අතර එම ආයතනයේන්ම පශ්චාත් විධායක ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත. එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල මඟින් පවත්වන ලද උසස් කළමනාකරණ පාඨමාලාව ඔහු විසින් සාර්ථකව සම්පූර්ණ කර ඇති අතර එහි ආදී සිසුවන් ගේ සංගමයේ සාමාජිකයෙකි.

ආයතනික කළමනාකාරීත්වයේ දරණ ලද තනතුරු:
නියෝජ්‍ය මහා කළමනාකරු
(නිමවුම් හා බැංකුකරණ සංවර්ධන) - 2013 ජනවාරි මස සිට 2016 ජූලි මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු
(විකුණුම් හා හැසිරවීම්) - 2016 ජූලි මස සිට 2018 පෙබරවාරි මස 21 දින දක්වා

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:

බණ්ඩාර මහතා වර්තමානයේ ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය ආයතනයේ (APRACA) සභාපතිවරයා වශයෙන් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) පාලක කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු වෘත්තීය බැංකුකරුවන්ගේ ප්‍රමුඛතම ආයතනය වන, ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ පසුගිය වර්ෂයේ සභාපති ලෙසද කටයුතු කර ඇත.

වෘත්තීය මං සලකුණු:

1990 වසරේ බැංකු සේවයට එක් වූ බණ්ඩාර මහතා තම වෘත්තීය ජීවිතයේ දී දේශීය හා විදේශීය වශයෙන් විශේෂයෙන්ම තොරතුරු පද්ධති, ආයෝජන, භාණ්ඩාගාර කළමනාකරණය, ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම් සහ ආයතනික බැංකුකරණය යන අංශයන්ගේ විවිධ අත්දැකීම් සමුදායක් සහිතව ඉහළ තලයකට පැමිණ සිටී. ඔහු සහකාර මහා කළමනාකරු (විදේශීය ශාඛා) තනතුර දරන සමයේ එක්සත් රාජධානියෙහි ලන්ඩන් ශාඛාව පරිපාලිතයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේ දී මූලිකත්වය ගෙන කටයුතු කළේ ය. ඉන් පසුව 2011 වසරේදී ලංකා බැංකුව (එක්සත් රාජධානි) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත්වීමට ප්‍රථම සහකාර මහා කළමනාකරු (ජාත්‍යන්තර මෙහෙයුම්) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සම්බන්ධතා) යන තනතුරු හොබවන ලදී.

බණ්ඩාර මහතා තාක්ෂණය පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති කිහිපයකට නායකත්වය සපයා ඇති අතර, 2013/14 කාලපරිච්ඡේදය තුළ මූලික බැංකු පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියට හා 2014/15 කාලපරිච්ඡේදය තුළ බොස්ටන් කන්සල්ටන් කණ්ඩායම සමඟ එක්ව දියත් කරන ලද බැංකු නව්‍යකරණ ක්‍රියාවලියට නායකත්වය සපයන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය හා ආයෝජන කළමනාකරණ අංශයන්ට සම්පත් දායකයෙකු ද වේ.

ඩබ් පී රසල් ෆොන්සේකා මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2012 මාර්තු මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී, සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම, සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම, සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම, සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා (පෞද්ගලික) සමාගම.

කුසලතා හා අත්දැකීම්:

වසර 29 කට අධික කාලයක් දේශීය හා ජාත්‍යන්තර බැංකු කටයුතු සම්බන්ධව විශාල අත්දැකීම් ප්‍රමාණයක් ඇති ෆොන්සේකා මහතා මූල්‍ය කළමනාකරණය, ආයතනික හා සැලසුම්කරණය, අයවැය පාලන ක්‍රම, ආයෝජන සහ භාණ්ඩාගාර කළමනාකරණය, ශාඛා බැංකු කටයුතු සහ ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු සම්බන්ධව විශේෂඥ දැනුමක් ඇති අයෙකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන ඔහු ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබාගෙන ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකට ද හිමිකම් කියන අතර එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල මඟින් පවත්වන ලද උසස් කළමනාකරණ පාඨමාලාව ඔහු විසින් සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරන අතර චික්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසලේ ආදී සිසුවන් ගේ සංගමයේ සාමාජිකයෙකු ද වේ.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු:

නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්) - 2012 මාර්තු මස සිට 2013 මැයි මස දක්වා/ 2015 අප්‍රේල් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු) - 2013 මැයි මස සිට 2015 අප්‍රේල් මස දක්වා

වැඩබලන ප්‍රධාන මූල්‍ය නිලධාරී 2014 ජූලි මස සිට 2016 මාර්තු මස දක්වා

ප්‍රධාන මූල්‍ය නිලධාරී 2016 මාර්තු මස සිට මේ දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන) - 2017 පෙබරවාරි සිට 2018 මාර්තු දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) - 2018 මාර්තු මස සිට

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:
ෆොන්සේකා මහතා සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමේ විකල්ප අධ්‍යක්ෂ ධුරයද 2012 නොවැම්බර් මස සිට එම සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් වන විගණන කමිටුවෙහි සභාපති තනතුරද හොබවයි. ඔහු මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී හි විගණන කමිටුවෙහි සභාපති තනතුරද හොබවයි.

වෘත්තීය මං සලකුණු:
1990 දී කළමනාකරණ අභ්‍යාසලාභීයකු ලෙස ශාඛා බැංකුකරණයෙන් බැංකු ජීවිතය ඇරඹූ ෆොන්සේකා මහතා බැංකුවේ සියලුම අංශයන්හි පුළුල් අත්දැකීම් සමුදායකින් පරිපූර්ණය. තවද, ඔහු ලංකා බැංකු ලන්ඩන් ශාඛාවෙහි සේවය කර ඇති අතර, එහිදී භාණ්ඩාගාර කටයුතු සහ ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු යන අංශයන්හි විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

ෆොන්සේකා මහතාට මූල්‍ය සහ සැලසුම් අංශය පැවරීමත් සමඟ මූල්‍ය සහ සැලසුම්කරණ මෙහෙයුම් නව මාවතකට යොමුකිරීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කල අතර බදුකරණය සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කිරීමෙන් බදුකරණය සඳහා ජාලගත ක්‍රමවේදයක් හඳුන්වා දීම හා එමඟින් ශාඛා පද්ධතිය අධීක්ෂණය කිරීම ප්‍රමුඛවේ. විවිධ දේශීය සහ අන්තර්ජාතික සම්මානයන්ට ප්‍රාප්තවෙමින් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව තරඟකාරී ප්‍රමිතියකට ගෙන ඒමට මූල්‍ය අංශට ඔහු මඟපෙන්වීම සහ උපදේශකත්වය ලබා දුනී.

ෆොන්සේකා මහතා ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) ලෙස කටයුතු කරමින් බැංකුවේ ආයතනික සැලසුම් සකස් කිරීමේදී හා දියත් කිරීමේදී සහ බැංකුවේ අරමුදල් නඩත්තු කිරීමේ හා පාලනය කිරීමේදී ඒ සඳහා ඔහු සතු සුවිශේෂී දැනුමෙන් දායකත්වය සපයන අතර ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු අංශයේ කටයුතු අධීක්ෂණය කරමින් ගනුදෙනුකරුවන් සමඟ ද මනා සබඳතාවයක් පවත්වාගෙන යයි.

ඩී පී කේ ගුණසේකර මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2013 පෙබරවාරි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:

සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසර්ස් (පෞද්ගලික) සමාගම

කුසලතා හා අත්දැකීම්:
ගුණසේකර මහතා වසර 39 කට අධික කාලයක් බැංකුවේ විවිධ ව්‍යාපාර මෙහෙයුම් තුළ බැංකුකරණ අත්දැකීම් ලත් අයෙකි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වන ඔහු ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවද සම්පූර්ණ කර ඇත.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු:

නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු) - 2013 පෙබරවාරි මස සිට මැයි මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) - 2013 මැයි මස සිට 2018 මාර්තු මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන) - 2018 මාර්තු සිට

ආයතනික කළමනාකාරීත්වය

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:
ගුණසේකර මහතා සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කල අතර ශ්‍රී ලංකා බණ්ඩ තෙල් නීතිගත සංස්ථාවේ කැබිනට් මණ්ඩලය පත්කරන ලද විශේෂ ප්‍රසම්පාදන කමිටුවේ සමාපිකයකුද වේ.

වෘත්තීය මං සලකුණු:
1980 වසරේදී බැංකුවට බැඳී තම වෘත්තීය ජීවිතය ශාඛා බැංකුකරණයෙන් අරඹා ශාඛා ජාලයෙහි පුළුල් අත්දැකීම් සමුදායක් ලබා ගත් ගුණසේකර මහතා මධ්‍යම මුදල් ඒකකයේ සහ ගිණුම් අංශයේද සේවය කර ඇත. ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩාගාර අංශයට බැඳීමෙන් හා ඉන්දියාවේ චෙන්නායි ශාඛාවේ සේවය කිරීම තුළින් භාණ්ඩාගාර හා මූල්‍ය වෙළඳපොළ මෙහෙයුම් පිළිබඳ මනා දැනුමක් හා අත්දැකීම් සමුදායක් ලබා ගන්නා ලදී. ලංකා බැංකුවේ ප්‍රාපනික අංශයේ (Dealing Room) තනතුරු සියල්ලම පාහේ ඔහු විසින් දරා ඇත. ඔහු 2008 සිට 2010 දක්වා චෙන්නායි ශාඛාවේ නියෝජ්‍ය කළමනාකරු වශයෙන් සේවය කර ඇත. එමෙන්ම ගුණසේකර මහතා ලංකා බැංකු භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර අංශයේ කළමනාකරු/ ජ්‍යේෂ්ඨ ප්‍රාපනිකයා (Senior Dealer) වශයෙන් කටයුතු කර ඇත.

ඔහු සී බෑන්ක් සිකියුරිටීස් සමාගමෙහි ප්‍රථම ප්‍රධාන ප්‍රාපනිකයා ලෙස සේවය කර ඇති අතර ලංකා බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ මධ්‍යම කාර්යාලය පිහිටුවීමේ පුරෝගාමියෙකු ද වේ. ගුණසේකර මහතා ආයතනික කළමනාකාරීත්වයට පත්වීමට පෙර සහකාර මහා කළමනාකරු (විදේශීය ශාඛා) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සබඳතා) යන තනතුරු ද දරන ලදී.

කේ ඊ ඩී සුමනසිරි මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2013 මැයි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම, සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම

කුසලතා හා අත්දැකීම්:
සුමනසිරි මහතා වසර 29 ක් පුරා ශාඛා බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍යනය, ආයතනික මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධනය වැනි විවිධ අංශයන්ගේ මනා අත්දැකීම් රැසක් ලබාගෙන ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) ගෞරව උපාධිධරයෙකු ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වේ. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ව්‍යාපාර නායකයන් සඳහා වූ උසස් කළමනාකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ කළමනාකරණ පාඨමාලාව සහ ඉහළ කළමනාකාරීත්වය සඳහා වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාව සහ චික්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල මඟින් පවත්වන ලද නායකත්ව පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ආයතනික කළමනාකාරීත්වයේ දරණ ලද තනතුරු:

නියෝජ්‍ය මහා කළමනාකරු - (අයකරගැනීම්) 2013 මැයි මස සිට 2014 අප්‍රේල් මස දක්වා සහ 2015 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු - (මානව සම්පත්) 2014 අප්‍රේල් මස සිට 2015 පෙබරවාරි මස දක්වා සහ 2016 දෙසැම්බර් මස සිට මේ දක්වා

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:

සුමනසිරි මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

වෘත්තීය මං සලකුණු:
1990 දී සිය බැංකු ජීවිතය ඇරඹූ සුමනසිරි මහතා ශාඛා ජාලය තුළ සිය සේවය සපයන අතරතුර ප්‍රධාන තනතුරු කිහිපයක්ම දරන ලදී. කළමනාකරු (පුහුණු කිරීම්) වශයෙන් ඔහු බැංකුවේ පුහුණුකිරීමේ ආයතනයේ පීඨ සාමාජිකත්වය දරමින් කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සහ දැනුම වර්ධනය උදෙසා නිරතුරුව සිය දායකත්වය සැපයුවේය. ආයතනික කළමනාකාරීත්වයට පත්වීමට පෙර සුමනසිරි මහතා සහකාර මහා කළමනාකරු (උතුරු පළාත) ලෙස කටයුතු කරන අතරතුර උතුරු පළාතේ නැවත පදිංචි වූ ජනතාවගේ, ජීවන තත්ත්වය උසස් කරලීමට සහ උතුරු පළාතේ ආර්ථිකය නැවත නගාසිටුවීම උදෙසා සුවිසල් කාර්යභාරයක් බැංකුව වෙනුවෙන් ඉටු කළේය.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ලේකම් ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2010 ඔක්තොම්බර් මස

කුසලතා හා අත්දැකීම්:
වසර 23 කට වඩා බැංකු සේවයේ අත්දැකීම් ඇති සිරිවර්ධන මහත්මිය සමාගම් ලේඛන කටයුතු සහ ආයතනික යහපාලනය සම්බන්ධව විශේෂ නිපුණතාවයක් දක්වයි.

වෘත්තියෙන් නීතිඥවරියක් වන ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය ද එම විශ්වවිද්‍යාලයෙහිම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය විශිෂ්ඨ සාමාර්ථයක් සහිතව හිමි කර ගෙන ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:
සී/ස සීබෑන්ක් හොල්ඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම යන සමාගම් වල සමාගම් ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු:

1996 ජනවාරි මස දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සහකාර ලේකම් වශයෙන් බැංකු සේවයට එක් වූ සිරිවර්ධන මහත්මිය ලංකා බැංකුවේ/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස 2005 නොවැම්බර් මස දී පත් කරන ලදී.

ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වශයෙන් ඉටු කරන කටයුතු වලට අමතරව ඇය සියලුම අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ලේකම් ධූරය හොබවයි. එමෙන්ම ආයතනික යහපාලන නීති රීති වලට අනුකූලව බැංකුව කටයුතු කරන්නේද යන්න ඇය විසින් නිරතුරුව සොයා බැලේ.

බැංකු සේවයට එක්වන්නට පෙර වෘත්තීය නීතිවේදිනියක වශයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කටයුතු කළ ඇය පුද්ගලික අංශයේ සමාගම් කිහිපයකම මූලික කොටස් නිකුතූන්, සමාගම් ඒකාබද්ධ කිරීම් සහ නෛතික හා මානව සම්පත් කටයුතු ඇතුළුව ලේකම් කටයුතු හැසිරවීම සිදු කොට ඇත.

තවද, ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාණිජ හා කර්මාන්ත නීතිය සම්බන්ධයෙන් බාහිර කථිකාචාර්යවරියක ලෙස ද කටයුතු කර ඇත.

ඩී එන් එල් ප්‍රනාන්දු මහතා
ප්‍රධාන අවදානම් නිලධාරී

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2015 දෙසැම්බර් මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්:

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, විකල්ප අධ්‍යක්ෂක ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී

කුසලතා හා අත්දැකීම්:

ප්‍රනාන්දු මහතා බැංකුවේ සියලුම අංශයන් පුරා විහිදුනු වසර 33 ක අත්දැකීම් වලින් පරිපූර්ණ වෘත්තීය බැංකුකරුවකු වේ.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ විද්‍යාවේදී උපාධිධාරියෙකු වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

වෘත්තීය මං සලකුණු:

වෘත්තීය ජීවිතයේ මුල් භාගයේදී ඔහු මධ්‍යම හා ඌව පළාත් වල ශාඛාවන්හි විවිධ තනතුරු දරමින් කටයුතු කළ අතර, පසුව ප්‍රධාන කාර්යාලයේ අයකර ගැනීමේ අංශයේ සහ නිමැවුම් හා සංවර්ධන බැංකු අංශයේ සේවය කළේය. මෙම කාලය තුළදී නව නිමැවුම් හා සේවා කිහිපයක්ම හඳුන්වාදෙන ලදී. ඔහු 1995 දී ලන්ඩන් ශාඛාවේ වසරක පුහුණුවක් ලැබූ අතර, පාකිස්තානයේ කරච්චි නුවර පිහිටි ශාඛාවේ වසර තුනක් සේවය කරමින් විදේශීය අත්දැකීම් ලබාගන්නා ලදී.

තවද, ප්‍රධාන අවදානම් නිලධාරී තනතුරට පත්වීමට පෙර ප්‍රනාන්දු මහතා වසර හතරක් පුරා බැංකුවේ විශාලතම පළාත වන බස්නාහිර පළාත දකුණ හාර සහකාර මහා කළමනාකරු ලෙස සිය දායත්වය ලබාදුන්නේය. එමෙන්ම ඔහු ලංකා බැංකුව (චික්සත් රාජධානිය) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස වසර තුනක් කටයුතු කළේය.

ප්‍රධාන අවදානම් නිලධාරී ලෙස බැංකුවේ අවදානම් කළමනාකරණ සංස්කෘතිය වෙනස් මඟකට පරිවර්තනය කිරීම, එහි විෂය පථය පුළුල් කිරීම සහ බැංකුවේ අවදානම් ආකෘති විවිධ වාර්තා කිරීම් මට්ටම් වලදී වැඩි දියුණු කිරීම ආදිය ඔහුගේ උපකාරය මත සිදුවිය.

ආයතනික කළමනාකාරීත්වය

එම් එම් ලක්ෂමන් පෙරේරා මහතා
ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2013 අගෝස්තු මස

කුසලතා හා අත්දැකීම්:

බැංකු ක්ෂේත්‍රයේ වසර 33 කට වඩා පළපුරුද්දක් ඇති පෙරේරා මහතා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයෙන් විවිධ තනතුරු හොබවමින් අත්දැකීම් රාශියක් ලබා ගත් අයෙකි.

පෙරේරා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා උපාධිධරයකු වන අතර, ඔහු එම විශ්වවිද්‍යාලයෙන්ම පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියද හිමි කර ගෙන ඇත. තවද, ඔහු ශ්‍රී ලංකාවේ පරිගණක සංගමයේ අධි සාමාජිකත්වය දරණ අතර බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජිකත්වය ද උසුලයි.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:

ඔහු බැංකුවල CIO සංගමයේ සභාපතීත්වයත් FINCSIRT හි මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වයත් දරන ලදී.

වෘත්තීය මං සලකුණු:

පෙරේරා මහතා 1986 වසරේ දී පද්ධති විශ්ලේෂණ නිලධාරියකු ලෙස ලංකා බැංකුවේ සේවයට බැඳුණි. මූලික බැංකු යෙදවුම් පද්ධති වලට සම්බන්ධ වීමෙන් ඔහුගේ බැංකු වෘත්තිය ආරම්භ කරන ලද අතර, බහුකාර්ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති වලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීමෙන් පලපුරුද්ද වඩාත් තීව්‍ර කර ගන්නා ලදී. ආයතනික කළමනාකාරීත්වයට පත්වීමට පෙර ඔහු තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ (යෙදවුම් පද්ධති) ලෙස සේවය කර ඇත.

1996-1997 අතර කාල පරාසය තුළ ඔහු දකුණු අප්‍රිකාවේ ස්ටෑන්ඩර්ඩ් බැංකුවෙහි ද සේවය කර ඇත.

ගයා ජයසිංහ මහත්මිය
ප්‍රධාන නීති නිලධාරී

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2016 ජූනි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:

සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසර්ස් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම

කුසලතා සහ අත්දැකීම්:
ජයසිංහ මහත්මියට වසර 35 කට අධික කාලයක් නීති ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති අතර, වසර 32 කට අධික කාලයක් ලංකා බැංකුවේ අත්දැකීම් ලබා ඇත. ඇය වෘත්තියෙන් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක වේ. එමෙන්ම ඇය අන්තර්ජාතික වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් - නීතිවේදී ඩිප්ලෝමාවක් හිමි කර ගෙන ඇත. ඇය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මෙන්ම ආයතනික නීතිඥ සංගමයේ ද සාමාජිකත්වය උසුලයි.

ඇය සතුව, ණය ගනුදෙනු ලේඛනගත කිරීම සහ බැංකු නීතිය පිළිබඳව පුළුල් දැනීමක් තිබේ. ආසියානු පැසිෆික් කලාපයේ යූරෝ මනී ට්‍රේනින් ආයතනය මඟින් පවත්වන ලද සංකීර්ණ ණය ගනුදෙනු සඳහා වන ලියකියවිලි, ඇපකර පිළිබඳ නීතිය සහ සිංගප්පූරුවේ සහ හොංකොං හි ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා වන ණයවර ලිපි පිළිබඳ ජාත්‍යන්තර පුහුණුවක් ඇය සතුය.

වෘත්තීය මං සලකුණු:

ජයසිංහ මහත්මිය, සහකාර නීති නිලධාරිනියක ලෙස 1986 ජූලි මස දී ලංකා බැංකුවට සම්බන්ධවී ඇයගේ බැංකු වෘත්තිය ලංකා බැංකුවේ නීති අංශයෙන් අරඹා ඇත. ලංකා බැංකුවේ පළාත් නීති ඒකක කිහිපයක සේවය කරමින් ණය සහ අයකරගැනීම්, බැංකු නීතිය හා වාණිජ ගනුදෙනු සඳහා අදාළ සියලු ආකාරයේ නීති රීති පිළිබඳ පුළුල් දැනුම් සම්භාරයක් ලබා ඇත.

වසර 2005 සිට 2012 දක්වා ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනියක ලෙස ආයතනික ශාඛාව සඳහා සුවිශේෂී දායකත්වයක් සපයන ලදී. එහි දී ඇය ඒකාබද්ධ ණය පහසුකම්, නැව් හා සම්බන්ධ උකස් සහ වෙළඳ මූල්‍ය කටයුතු සඳහා බලපවත්වන නීති රීති පිළිබඳ පුළුල් පරිචයක් ලැබීය. ප්‍රධාන නීති නිලධාරී ලෙස පත්වීම ලැබීමට පෙර ඇය 2012 සිට 2016 දක්වා ණය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී ලෙස සේවය කර ඇත.

ජයසිංහ මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කිරීම් ආයතනයේ වෙළඳ හා බැංකු නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක ලෙසද සේවය කරයි.

සී අමරසිංහ මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(විකුණුම් හා හැසිරවීම්)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2016 ජූලි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:

සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගමේ, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගමේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

කුසලතා සහ අත්දැකීම්:

අමරසිංහ මහතා ශාඛා බැංකු කටයුතු, ආයතනික, අක්වෙරළ බැංකු කටයුතු හා විකුණුම් හා හැසිරවීම් කටයුතු ආදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳව වසර 29 කට වැඩි අත්දැකීම් සම්භාරයක් ඇති වෘත්තීය බැංකුකරුවෙකි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ද, එම විශ්වවිද්‍යාලයෙන්ම ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි කර ගෙන ඇත. එමෙන් ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ද වේ.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු:

නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා බැංකු කටයුතු කලාප II) - 2016 ජූලි මස සිට 2018 මාර්තු මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු
(විකුණුම් හා හැසිරවීම්) - 2018 මාර්තු මස සිට

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:
අමරසිංහ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන අතර ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි. එමෙන්ම ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ උප සභාපති ලෙසද කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු:

අමරසිංහ මහතා 1990 වර්ෂයේ දී කළමනාකරණ අභ්‍යාසලාභියකු ලෙස සිය බැංකු ජීවිතය ශාඛා බැංකුකරණයෙන් ආරම්භ කළ අතර, පසුව ආයතනික හා අක්වෙරළ බැංකු අංශය හා සම්බන්ධ වී එම ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් හා අත්දැකීම් ලබා ගන්නා ලදී. එමෙන්ම ආයතනික හා අක්වෙරළ බැංකු අංශයේ ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය සඳහා සැලකිය යුතු කාලයක් ඔහු විසින් විශේෂ දායකත්වයක් සපයන ලදී.

ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට පෙර අමරසිංහ මහතා සහකාර මහා කළමනාකරු (අක්වෙරළ බැංකු කටයුතු) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සබඳතා) ලෙස කටයුතු කරන අතර තුරදී එම අංශ වල ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමේදී සුවිශේෂී දායකත්වයක් දැක්වීය.

අමරසිංහ මහතා නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්) ලෙස කටයුතු කරන අතරතුර දී වර්තමානයේ බැංකුවේ සිදුකෙරෙන ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා ඩිජිටල් බැංකුකරණය සහ තාක්ෂණය පිළිබඳ ඔහු සතු සුවිශේෂී දැනුම සහ අත්දැකීම මඟින් බැංකුවට සුවිශේෂී දායකත්වයක් දක්වයි.

එම් ජේ පී සල්ගාදු මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු - (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2016 ජූලි මස

කුසලතා සහ අත්දැකීම්:
සල්ගාදු මහතා ශාඛා බැංකු කටයුතු, පළාත් විකුණුම් කළමනාකරණය සහ නිමැවුම් හා සංවර්ධන බැංකුකරණය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිතව වසර 29 කට අධික කාලයක් ලංකා බැංකුවේ අත්දැකීම් ලබා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ගෙන ඇති අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික සහතික පත හිමි කරගෙන ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු:
සල්ගාදු මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයද නියෝජනය කරයි.

වෘත්තීය මං සලකුණු:

සල්ගාදු මහතා වසර 1990 ජනවාරි මස දී කළමනාකරණ අභ්‍යාසලාභියකු ලෙස ලංකා බැංකුවේ ශාඛා බැංකු කටයුතු හරහා තම බැංකු වෘත්තීය ආරම්භ කළ අතර ඔහු පසුව ප්‍රධාන පෙළේ තනතුරු කිහිපයක් හොබවමින් දේශීය බැංකු කටයුතු සහ ණය කාඩ්පත් මෙහෙයුම් පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත.

සල්ගාදු මහතා ආයතනික කලමනාකාරිත්වයට පත්වීමට පෙර, සහකාර මහා කළමනාකරු (පළාත් විකුණුම් කළමනාකරණ) ලෙස බැංකුවේ ISSP මෙහෙයුම් ඒකකය ස්ථාපිත කිරීම සඳහාත්, විශේෂ ව්‍යාපෘති, බී ඕ සී ඇමතුම් ඒකකය, ප්‍රමුඛතා බැංකුකරණ ඒකකය සහ බී ඕ සී සහතික කිරීමේ දෙපාර්තමේන්තුව යන අංශ ඔහුගේ අධීක්ෂණයට අයත් විය. එමෙන්ම ඔහු ලංකා බැංකුවේ "වෙනස" ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සාමාජිකයකු ද වේ.

නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන) ලෙස සේවය කරන අතර තුරදීම අයතනික පරිවර්තන ඒකකයේ ද මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කල අතර සල්ගාදු මහතා වර්තමානයේ ඉලෙක්ට්‍රොනික බැංකු ඒකකයේ, මධ්‍යම පසුපෙළ කාර්යාලයේ, නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ ඒකකයේ කටයුතු ද අධීක්ෂණය කරන අතර උසස් තාක්ෂණයෙන් හෙබි නව නිපැයුම් හා සේවා තුළින් අප ගනුදෙනුකරුවන් වෙත නවීනතම බැංකුකරණ අත්දැකීම් ලබා දීමට නොමඳව සිය දායකත්වය ලබා දෙයි. ඩිජිටල්කරණය පෙරදැරිව ඉදිරියට ගමන්කරන බැංකුවට බී ඕ සී ඩිජී සහ කියෝස් යන්ත්‍ර හඳුන්වා දීමට ඔහු මූලිකත්වය ගෙන කටයුතු කළ අතර එමඟින් බැංකුවට සිය මෙහෙයුම් නවමානයක් කරා ප්‍රවර්ධනය කිරීමට හැකි විය.

ආයතනික කළමනාකාරීත්වය

ආර් එම් ඩී විපුල ජයබාහු මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2016 නොවැම්බර් මස

සමූහ සමාගම් වල සභාපති ධුරයන්:

සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්:
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, විකල්ප අධ්‍යක්ෂ සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම

කුසලතා සහ අත්දැකීම්:
බැංකුවේ මූල්‍ය, ආයතනික හා උපායමාර්ගික සැලසුම් සහ විවිධ ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳ වසර 29 කට වඩා වැඩි බැංකුකරණ අත්දැකීම් ජයබාහු මහතා සතුය.

ඔහු කැළණිය සරසවියේ ව්‍යාපාරවේදී (විශේෂ) උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ද ලබා ඇත. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියාවේ දකුණු කුවින්ස්ලන්ඩ් සරසවියෙන් මූල්‍ය කටයුතු පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත. එමෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවක් ද ඔහු සාර්ථකව සම්පූර්ණ කර ඇත.

වෘත්තීය මං සලකුණු:
වර්ෂ 1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ලංකා බැංකුවට එක් වූ ඔහු ග්‍රාමීය බැංකු කටයුතු සහ ශාඛා බැංකු කටයුතු හරහා තම බැංකු වෘත්තීය ආරම්භ කර ඇත. අනතුරුව මූල්‍ය හා සැලසුම් අංශට සම්බන්ධ වීමට පෙර බැංකුවේ සජීවී ජාලගත මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය (ICBS) හඳුන්වාදීමේ ව්‍යාපෘතියේ ඔහු සේවය කර ඇත.

ලංකා බැංකුවේ සජීවී ජාලගත මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය (ICBS), නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ගිණුම්කරණ ව්‍යාපෘතිය, බැංකුවේ මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, හුවමාරු මිල පද්ධතියේ සහ වෙනත් පරිගණක පද්ධති ආදී හඳුන්වාදීමේ ව්‍යාපෘතිවල දී සේවය ලබා දී ඇති අතර සිය කණ්ඩායම් සාමාජිකයින්හට මඟ පෙන්වමින් සිය දැනුම සහ අත්දැකීම් ඔවුන්ට ලබා දී ඇත. ඔහු මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ විවිධ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයකු ලෙස සිය දායකත්වය ලබා දුනි.

වර්තමානයේ ඔහු මධ්‍යම මුදල් දෙපාර්තමේන්තුවේ, මධ්‍යම ගිණුම්කරන සහ බදු අංශයේ, මූල්‍ය ගිණුම්කරන ඒකකයේ, ප්‍රධාන ලෙජර් සමතුලන ඒකකයේ, කළමනාකරණ තොරතුරු පද්ධති ඒකකයේ, භාණ්ඩාගාර පසුපෙල කාර්යාලයේ, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සහ තිරසාරත්ව සුරැකුම් අංශවල කටයුතු අධීක්ෂණය කරයි. ඔහු බැංකුවේ විවිධ කළමනාකරණ කමිටුවල සාමාජිකයකු වන අතර බැංකුවේ අක්‍රීය ණය අත්තිකාරම් කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.

ජයබාහු මහතා ආයතනික සැලසුම් කීපයක්ද සමස්ත බැංකුවම ආවරණය වන පරිදි කාර්යසාධන සමාලෝචනයන් මෙන්ම බැංකුවේ වාර්ෂික වාර්තාව සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර සම්මාන රාශියක් ලබා ගැනීම සඳහා මූල්‍ය අංශයට මඟ පෙන්වීම සහ නායකත්වය දැක්වීය.

ඩී එම් එල් බී දසනායක මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා බැංකු කටයුතු කලාප I සහ II)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2016 දෙසැම්බර් මස දී

කුසලතා සහ අත්දැකීම්:
දසනායක මහතා වසර 35 කට අධික සේවා කාලයක් සහිතව දේශීය මෙන්ම විදේශීය බැංකු ශාඛාවල සේවය කරමින් ශාඛා බැංකු කටයුතු, ආයතනික මූල්‍ය කටයුතු සහ ජාත්‍යන්තර මෙහෙයුම් පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත.

දසනායක මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති කලා උපාධියක් (ආර්ථික විද්‍යා විශේෂ) ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳව පශ්චාත් ඩිප්ලෝමාවක් ද, ඉන්දියාවේ මහත්මා ගාන්ධි විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියක්ද ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

ආයතනික කළමනාකාරීත්වයේ දරණ ලද තනතුරු:
නේවාසික කළමනාකරු - (මාලේ ශාඛාව) 2016 දෙසැම්බර් මස සිට 2017 පෙබරවාරි දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු - (ශාඛා බැංකු කටයුතු කලාප I) 2017 පෙබරවාරි මස සිට 2018 මාර්තු දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු - (ශාඛා බැංකු කටයුතු කලාප I සහ II) 2018 මාර්තු මස සිට මේ දක්වා

වෘත්තීය මං සලකුණු:

1982 වර්ෂයේදී තම බැංකු වෘත්තිය ආරම්භ කරමින් සියලු අංශයන් පිළිබඳව පූර්ණ අත්දැකීමක් ලබා ඇති දසනායක මහතා වසර 9 කට අධික කාලයක් විදේශ ශාඛාවල ආයතනික බැංකුකරණය සහ විදේශ මෙහෙයුම් පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇත. ආයතනික අංශයේ සබඳතා නිළධාරියෙකු, සබඳතා කළමනාකරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර පසුව ඔහු එම අංශයේම සහකාර මහා කළමනාකරු (ආයතනික ණය) ලෙස පත් විය. ඔහු විසින් වර්ෂ 2000 සිට 2003 කාලය තුළදී ලංකා බැංකුවේ පරිපාලිත සමාගමක් වන ලංකා බැංකුව (එක්සත් රාජධානිය) ලන්ඩන් ශාඛාවේ වෙළඳ මූල්‍ය කටයුතු භාර ප්‍රධානී ලෙස කටයුතු කර ඇත.

2016 ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට ප්‍රථමව දසනායක මහතා විසින් මාලේ ශාඛාවේ නේවාසික කළමනාකරු ලෙස සේවය ලබා දෙන ලදී.

ඩබ් අයි හෙට්ටිහේවා මහත්මිය
නියෝජ්‍ය මහා කළමනාකාරිණී
(උපකාරක සේවා)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2018 අගෝස්තු මස දී

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්:

විකල්ප අධ්‍යක්ෂ සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම

කුසලතා සහ අත්දැකීම්:

බැංකුවේ විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්ගේ සහ කළමනාකරණ කටයුතු පිළිබඳ වසර 35 කට අධික අත්දැකීම් සහිත හෙට්ටිහේවා මහත්මිය ශාඛා ජාලයේ මෙන්ම ශාඛා බැංකුකරණ හා ආයතනික බැංකුකරණය පිළිබඳ වසර 28 කට වඩා වැඩි සුවිශේෂී පළපුරුද්දක් සහ අත්දැකීම් සම්භාරයක් ලබා ගත් තැනැත්තියකි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායනික විද්‍යාව පිළිබඳ (විශේෂ) උපාධිධාරිණියක වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිධාරිණියක ද වේ. හෙට්ටිහේවා මහත්මිය නීතිඥ සංගමයේ සමාජිකාවක් ද වේ. එමෙන්ම ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රීත සාමාජිකයෙකු ද වේ.

වෘත්තීය මං සලකුණු:

1983 දී කළමනාකාර අභ්‍යාසලාභීයකු ලෙස ලංකා බැංකුවට බැඳුණු ඇය ශාඛා බැංකුකරණයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භකර ඒ හරහා ශාඛා බැංකුකරණය පිළිබඳ සුවිශාල අත්දැකීම් සම්භාරයක් ලබා ගෙන ඇත.

ක්‍රමයෙන් සිය වෘත්තීය දිවි මඟේ ඉහළටම ගමන් කල හෙට්ටිහේවා මහත්මිය බැංකුවේ ප්‍රධාන පෙලේ විවිධ තනතුරු රැසක් දරමින් ද මෙට්‍රොපොලිටන් ශාඛාවේ සහකාර මහා කළමනාකාරිත්වය දරමින් ආයතනික බැංකුකරණ අංශයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන ලදී.

ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට ප්‍රථමව හෙට්ටිහේවා මහත්මිය සහකාර මහා කළමනාකාරිණී (මෙට්‍රොපොලිටන් ශාඛාව), සහකාර මහා කළමනාකාරිණී (පරිපාලන සේවා) සහ සහකාර මහා කළමනාකාරිණී (දකුණු පළාත) ලෙස කටයුතු කරන ලදී.

ඊ එම් ජයරත්න මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් - පළාත්)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2018 අගෝස්තු මස දී

කුසලතා සහ අත්දැකීම්:

ලංකා බැංකුවේ වසර 36 කට වැඩි අද්විතීය වෘත්තීය අත්දැකීම් සම්භාරයක් ලබා ඇති ජයරත්න මහතා දේශීය හා ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු පිළිබඳ සුවිශේෂී දැනුමක් සහ අත්විතීය අත්දැකීම් සම්භාරයක් බැංකුවේ විවිධ ක්ෂේත්‍රයන් හරහා ලබා ගත් තැනැත්තෙකි.

ජයරත්න මහතා, වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රීත සාමාජිකයෙකු ද වේ.

වෘත්තීය මං සලකුණු:

ප්‍රථම වරට ලංකා බැංකුවේ ශාඛා ජාලය හරහා 1982 දී සිය බැංකු වෘත්තීය ජීවිතය ඇරඹූ ජයරත්න මහතා එමඟින් ශාඛා බැංකුකරණය පිළිබඳව විශාල අත්දැකීම් ප්‍රමාණයක් ලබා ගත් අතර පසු කාලීනව දේශීය හා ජාත්‍යන්තරව බැංකුවේ විවිධ තනතුරු හා එකිනෙකට වෙනස් වූ රාජකාරි මට්ටම් යටතේ කටයුතු කළේය. ලංකා බැංකුවේ මාලේ ශාඛාවේ ජ්‍යේෂ්ඨ ණය කළමනාකරු ලෙස අඛණ්ඩව වසර තුනක් කටයුතු කරමින් ණය ලබාදීම සමබන්ධ ඔහු සතු සුවිශේෂී දැනුම සහ අත්දැකීම් තම කාර්ය මණ්ඩය අතර හුවමාරුකර ගනිමින් ද ඔවුන්ට මඟ පෙන්වමින්ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය.

ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට ප්‍රථමව ජයරත්න මහතා සහකාර මහා කළමනාකාරු (වයඹ පළාත) සහ සහකාර මහා කළමනාකාරු (පළාත් විකුණුම් කළමනාකරණය) ලෙස වසර 2014 සිට 2018 අගෝස්තු මස දක්වා ලංකා බැංකුවේ විධායක කළමනාකාරිත්වය නියෝජනය කළේය.

ආයතනික කළමනාකාරීත්වය

ඩබ් එන් පී සුරවිමල මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම් - ආයතනික)

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2018 අගෝස්තු මස දී

කුසලතා සහ අත්දැකීම්:

ලංකා බැංකුවේ වසර 27 කට වැඩි සුවිශේෂී වෘත්තීය ජීවිතයකට හා දේශීය හා ජාත්‍යන්තර බැංකු ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන සුරවිමල මහතා වාණිජ බැංකුකරණයේ දී විවිධාකාර වූ බැංකුකරණ පසුබිම් යටතේ ඇති වන්නා වූ බැංකුකරණ අභියෝගයන්ට මුහුණදීමේ සුවිශේෂී හැකියාවකින් ද යුක්ත වේ.

සුරවිමල මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනවේදී විශේෂ උපාධියද බැංකු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියද ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ලද ඉහළ කළමනාකාරීත්වය සඳහා වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවක් ද සම්පූර්ණ කොට ඇත.

වෘත්තීය මං සලකුණු:

1991 දී කළමනාකරණ අභ්‍යාසලාභියකු ලෙස ලංකා බැංකුවට බැඳුණු සුරවිමල මහතා ශාඛා බැංකුකරණ, ආයතනික බැංකුකරණ, අක්වෙරළ බැංකුකරණ සහ අයකර ගැනීම ආදී විවිධාකාර අංශයන්හි සිය රාජකාරී කටයුතු සිදුකර ඇත.

සුරවිමල මහතා 2014 සිට 2017 දක්වා චෙන්නායි ශාඛාවේ නේවාසික කළමනාකරු ලෙස පත්වීමෙන් පසු ඔහු සතු පුද්ගල කළමනාකරණය සහ ක්ෂේත්‍රය පිළිබඳ ඇති හසල දැනුම හරහා චෙන්නායි ශාඛාවේ කාර්යඵලයන් විශිෂ්ඨ තත්ත්වය කරා ඉහළ නැංවීමට සුවිශේෂී දායකත්වයක් දැක්වීය. එමෙන්ම ඔහු චෙන්නායිහි ඉන්දු-ආසියා-ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ 2015/ 2017 කාලසීමාවේ විධායක කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කළේය.

සුරවිමල මහතා නියෝජ්‍ය මහා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ලෙස පත්වීමට පෙර සහකාර මහා කළමනාකරු (අක්වෙරළ බැංකුකරණ) ලෙස සුවිශේෂී දායකත්වයක් දැක්වීය. බැංකුවේ ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගෙන යාම උදෙසා සුරවිමල මහතා නියෝජ්‍ය මහා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ලෙස බැංකුවේ අක්‍රීය ණය කළමනාකරණය සඳහා විවිධ පුරෝගාමී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කල අතර ඒවා බැංකුවේ සුභසිද්ධිය උදෙසා මෙන්ම බැංකුවේ අනාගත අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීමට උපකාරී වනු ඇත.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා
ප්‍රධාන අලෙවිකරණ නිලධාරී

ආයතනික කළමනාකාරීත්වයට පත්වීම:
2012 සැප්තැම්බර් මසදී

කුසලතා සහ අත්දැකීම්:

ආචාර්ය ලියනගේ මහතා නොයෙකුත් ආයතන වල අලෙවිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධව සිය දායකත්වය ලබා දෙමින් 1989 වසරේ සිට වසර 29 කට අධික කාලයක් ශ්‍රී ලාංකීය මූල්‍ය සේවා කර්මාන්තයේ සහ වේගවත්ව අලෙවි වන පාරිභෝගික භාණ්ඩ (FMCG) ක්ෂේත්‍රයේ, විද්‍යුත් උපකරණ සහ කෘෂිකාර්මික අංශයේ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා වෘත්තීයමය වශයෙන් සහ අධ්‍යාපනික වශයෙන් අලෙවිකරණය, කළමනාකරණය සහ මූල්‍ය යන විෂය පථයන් තුනකින් සුදුසුකම් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරී අධ්‍යයන පීඨයේ ආචාර්ය උපාධිධාරියකු වේ. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. තවද, ලියනගේ මහතා චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වේ. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියානු සහතිකපත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ සංගමයේ (ICMA) සාමාජිකත්වය ද දරයි.

ආචාර්ය ලියනගේ මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම වරලත් අලෙවිකරුවන්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වන අතර, ඔහු 1997 වසරේ සිට වරලත් අලෙවිකරුවකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (FSLIM) අධි සාමාජිකත්වය උසුලයි. ඔහු 1995 වසරේ සිට චික්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු ලෙස

සහ 2017 වසරේ සිට ඕස්ට්‍රේලියාවේ සහතිකලත් ගණකාධිවරුන්ගේ ආයතනයේ (CMA) සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු 2009 වසරේදී සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයෙන් (NUS) පවත්වනු ලැබූ උපායමාර්ගික කළමනාකරණ විධායක වැඩසටහන ද ඇතුව විවිධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

වෘත්තීය මං සලකුණු:

ලංකා බැංකුවට එක්වීමට ප්‍රථම ආචාර්ය ලියනගේ මහතා ජාතික සංවර්ධන බැංකුවෙහි සහකාර උප සභාපති (ප්‍රධාන අලෙවිකරණ) ලෙස සේවය කර ඇත. එමෙන්ම ඔහු බහුජාතික සහ දේශීය සමාගම් වල නිමැවුම් ධාරිතාව/ සන්නම් කළමනාකරු සහ අලෙවිකරණ කළමනාකරු යන ජ්‍යේෂ්ඨ තනතුරු උසුලා ඇත. ඔහුගේ අලෙවිකරණ වෘත්තිය පුරා ප්‍රමුඛ දේශීය හා අන්තර්ජාතික සන්නම්/ නිමැවුම් ගොඩනැංවීමට ඔහු සමත්වී ඇත.

ආචාර්ය ලියනගේ මහතා ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගමය (OPA) විසින් සංවිධානය කරන ලද Pinacle Award 2016 සම්මාන උළෙලේදී අලෙවිකරණය සඳහා වන ජාතික ගෞරව (APEX) සම්මානයෙන් පිදුම් ලැබීය. ආචාර්ය ලියනගේ වර්ෂ 2015 දී ඉන්දියාවේ මුම්බායිහිදී පැවැත්වූ ලෝක අලෙවිකරණ සම්මේලනයේදී බලවත්ම අලෙවිකරණ නියමුවන්ගේ ලැයිස්තුවෙන් ගෞරවයට පාත්‍ර විය. එමෙන්ම ඔහු මලයාසියාවේ පැවැත්වූ 2013 ගෝල්ඩන් ග්ලෝබ් ටයිගර් සම්මාන උළෙලෙහි දී "දක්ෂතම ප්‍රධාන අලෙවිකරණ නිලධාරීන් 50" යන සම්මානයෙන් පිදුම් ලැබූ අතර, ඇමරිකා චික්සත් ජනපදයේ හවායි හි පිහිටි "ඇමරිකා චික්සත් ජනපදය" "ජපානය කළමනාකරණ විද්‍යායතනය" (JAIHS) මඟින් පැවැත්වූ ගෝලීය කළමනාකරුවන් සඳහා වන අන්තර් සංස්කෘතික අධ්‍යාපන වැඩසටහන සඳහා තේරී පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා ද වේ. ඔහුගේ විෂය, ජාත්‍යන්තර අවබෝධය සහ කීර්තිනාමය වෙනුවෙන් ලබාදෙන ලද විභව දායකත්වය ඇගයීම උදෙසා 1996 දී ජපානයේ ෆුජිට්සු පදනම විසින් ඉහත වැඩසටහන නිම කිරීම සඳහා ඔහුට පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

පී එම් ලියනගේ මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම:
2014 දෙසැම්බර් මස

කුසලතා හා අත්දැකීම්:

ලියනගේ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර, වරලත් ගණකාධිකාරී සුදුසුකම ලබා ගැනීමෙන් පසු වසර 19 ක අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන අයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා ඇති අතර, ඇමරිකාවේ තොරතුරු පද්ධති විගණන හා පාලන සංගමයේ (ISACA) සහතිකලත් තොරතුරු පද්ධති විගණකයන්ගේ (CISA) සාමාජිකයෙකුද වේ.

වෘත්තීය මං සලකුණු:

ලංකා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් වීමට ප්‍රථම ඔහු සී/ස කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ පෑන් ඒෂියා බැංකුවේ එම තනතුරම දරා ඇත. ලියනගේ මහතා 2006 සිට 2008 කාලපරිච්ඡේදයේ දී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක ලෙස සහකාර මහා කළමනාකාර ශ්‍රේණියේ කටයුතු කර ඇත.

ඔහු සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමේ මූල්‍ය හා පරිපාලන කළමනාකරු ලෙසත්, ආර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ සුදුසුකම් ලත් සහායකයෙකු ලෙසත් කටයුතු කර ඇත.

විධායක කළමනාකාරීත්වය

01

02

03

04

05

06

07

08

01. **ජී ඒ ජයශාන්ත** - සහකාර මහා කළමනාකරු - අක්වෙරළ බැංකුකරණය
02. **ඒ ද එස් පින්නදූවගේ** - සහකාර මහා කළමනාකරු - අනුකූලතා
03. **කේ ටී ඒ ඊ ද සිල්වා** - සහකාර මහා කළමනාකරු - විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය
04. **ඩී එස් මුතුකුඩආරච්චි** - නේවාසික කළමනාකරු - චෙන්නායි ශාඛාව
05. **බී නන්දකුමාර්** - සහකාර මහා කළමනාකරු - උපකාරක සේවා
06. **වයි ඒ ජයතිලක** - සහකාර මහා කළමනාකරු - මධ්‍යම පළාත
07. **ඒ ආර් එෆ් ජෝන් පුල්ලෙ** - සහකාර මහා කළමනාකරු - අවදානම් කළමනාකරණය
08. **ජී ආර් ද සිල්වා** - සහකාර මහා කළමනාකරු - විමර්ශන

09. **එච් එම් එම් බී හේරත්** - සහකාර මහා කළමනාකරු - සබරගමුව පළාත
10. **ඩබ් බී පී රත්නායක** - සහකාර මහා කළමනාකාරිණී - ආයතනික ණය
11. **ජේ සී ඒ කුරුඳුකුඹුර** - සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (මෙහෙයුම්/තාක්ෂණ සහය)
12. **එම් ඩී ඒ කරුණාරත්න** - සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (සැපයුම් හැසිරවීම)
13. **එච් එම් සී එම් මල්දෙනි** - සහකාර අධ්‍යක්ෂිකා - තොරතුරු තාක්ෂණ (යෙදවුම් පද්ධති)
14. **ඩී එම් කේ එස් දිසානායක** - සහකාර මහා කළමනාකරු - නැගෙනහිර පළාත
15. **එම් එච් එස් මාලා** - සහකාර මහා කළමනාකාරිණී - සංවර්ධන බැංකු කටයුතු
16. **එම් ජේ ප්‍රභාහරන්** - සහකාර මහා කළමනාකරු - උතුරු පළාත

විධායක කළමනාකාරිත්වය

17

18

19

20

21

22

23

24

17. **එච් පී කේ සිල්වා** - සහකාර මහා කළමනාකරු - බස්නාහිර පළාත - උතුර
18. **ඒ එම් ආර් ඩී සුබසිංහ** - සහකාර මහා කළමනාකාරිණී - පිටකොටුව ශාඛාව
19. **පී පී එම් විජේසේකර** - සහකාර මහා කළමනාකාරිණී - අලෙවිකරණ
20. **බී කේ ගුරුසිංහ** - නේවාසික කළමනාකරු - මාලේ ශාඛාව
21. **ඒ ඩී එස් ඉන්ද්‍රානි** - සහකාර මහා කළමනාකාරිණී - පුහුණු කිරීම් සහ සංවර්ධන
22. **එම් පී රුවන් කුමාර** - සහකාර මහා කළමනාකරු - අයවැය ක්‍රමෝපාය සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති
23. **ඩබ් රංජිත්** - සහකාර මහා කළමනාකරු - උතුරු මැද පළාත
24. **ඒ ජී සිරිනිමල්** - සහකාර මහා කළමනාකරු - ඌව පළාත

25. **එස් ටී කේ හේවගේ -** නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී - ආපසු අයකර ගැනීම්
26. **එම් ඩී සී නිලන්ත -** ප්‍රධාන විධායක නිලධාරී - ලංකා බැංකුව (යූ කේ) සමාගම
27. **එල් ජේ දිසානායක -** නේවාසික කළමනාකරු - සීෂෙල්ස් ශාඛාව
28. **කේ ජී සී දිපාල් -** සහකාර මහා කළමනාකරු - තොරතුරු පද්ධති විගණන
29. **ජේ ඥානසම්බන්ධන් -** සහකාර මහා කළමනාකාරිණී - ආයෝජන මෙහෙයුම්
30. **පී එන් ගෝමස් -** සහකාර මහා කළමනාකාරිණී - විශ්‍රාම නඩත්තු අංශය
31. **ටී පෙරේරා -** සහකාර මහා කළමනාකාරිණී - ශාඛා ණය - කලාප I
32. **එල් ඒ ආර් සෙනෙවිරත්න -** සහකාර මහා කළමනාකරු - ණය, පළාත් සහ ශාඛා විගණන

විධායක කළමනාකාරිත්වය

33. **ආර් එම් එම් විරසේකර** - සහකාර මහා කළමනාකාරිණී - මෙට්‍රොපොලිටන් ශාඛාව
34. **ආර් එම් කේ එස් එම් රත්නායක** - නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී - ණය
35. **එම් එම් ආර් පී ප්‍රනාන්දු** - සහකාර මහා කළමනාකාරිණී - වෙළෙඳ සේවා
36. **එම් ටී කරුණාරත්න** - සහකාර මහා කළමනාකාරිණී - ආපසු අයකර ගැනීම් - ආයතනික
37. **කේ පී මල්ලිකා** - සහකාර මහා කළමනාකාරිණී - භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය
38. **අයි එස් එන් පෙරේරා** - සහකාර මහා කළමනාකරු - බස්නාහිර පළාත දකුණ
39. **එම් ආර් එන් රෝහණ කුමාර** - සහකාර මහා කළමනාකරු - ආපසු අයකර ගැනීම් - පළාත්
40. **කේ ඒ පී කේ සමරකෝන්** - සහකාර මහා කළමනාකරු - විදේශීය ශාඛා

41. **එස් පී සී කේ ප්‍රනාන්දු** - සහකාර මහා කළමනාකාරිණී - ආයතනික සබඳතා
42. **ආර් එම් එන් ජීවන්ත** - සහකාර මහා කළමනාකරු - භාණ්ඩාගාර
43. **පී ඩී එස් ලියනගේ** - සහකාර මහා කළමනාකරු - වයඹ පළාත
44. **සීනා රුවයිස්** - සහකාර මහා කළමනාකාරිණී - නිමැවුම් සංවර්ධන කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ
45. **එස් ශිවන්ජන්** - සහකාර මහා කළමනාකරු - ජාත්‍යන්තර කටයුතු
46. **කේ ඒ ඩී විජේවර්ධන** - සහකාර මහා කළමනාකරු - මානව සම්පත් මෙහෙයුම්
47. **ජී කේ ජී එම් බණ්ඩාර** - සහකාර මහා කළමනාකරු - පරිපාලන සේවා
48. **ඩී ආර් සී එස් උදයකුමාරි** - සහකාර මහා කළමනාකාරිණී - දකුණු පළාත

ඉදිරිය නිර්මාණ කරන්නේත්,
තීරණය කරන්නේත් අපගේ අනාගත පරපුරයි.
තමා තුළ ගැබ්ව ඇති අසීමිත ශක්තිය, උද්‍යෝගය සහ උනන්දුව
උකහා ගැනීම අරභයා අනාගත පරපුර බලගැන්වීම සඳහා විවිධ
වූ මුලාරම්භයන් රැසක් හඳුන්වා දෙමින් අපගේ අනාගත පරපුර
පෝෂණය කරමින්, ඔවුන්ට නිවැරදි මාර්ගය
පෙන්වීම සඳහා අප සෑම විටම කැපවී සිටින්නෙමු.

ශ්‍රී ලාංකීය ජාතිය නව මානයක් කරා රැගෙන යාම සඳහා අවශ්‍ය වන ජවය සහ ඒ සඳහා වූ සියළු මුලාරම්භයන් අප සතු වන බව අපි දැඩිව විශ්වාස කරන්නෙමු.

වටිනාකම් ජනනය කිරීම

වටිනාකම් ජනනය කිරීමේ ආකෘතිය

ප්‍රාග්ධන යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය

කොටස් හිමියන්ගේ අරමුදල: **රු. බිලියන 121.4**
පාරිභෝගික තැන්පතු: **රු. ට්‍රිලියන 1.8**
ණය ගැනීම්: **රු. බිලියන 350.0**

පිටු අංක 137

නිෂ්පාදිත ප්‍රාග්ධනය

පාරිභෝගික සබඳතා මධ්‍යස්ථාන: **1,721**
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ: **රු. බිලියන 24.2**
ඩිජිටල් යටිතල පහසුකම්: **රු. බිලියන 2.0**

පිටු අංක 142

මානව ප්‍රාග්ධනය

සේවක සංඛ්‍යාව: **8,724**
ස්ත්‍රී නියෝජන අනුපාතය: **60%**
වසර 10 ට වැඩි සේවක අත්දැකීම් ඇති සේවකයන් ගණන: **2,860**

පිටු අංක 147

බුද්ධිමය ප්‍රාග්ධනය

ලංකා බැංකු සන්නාමය: **රු. බිලියන 42.9**
ව්‍යංගික දැනුම
(පද්ධති සහ ක්‍රියාවලි)

පිටු අංක 156

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

පාරිභෝගිකයින් **මිලියන 13.4**
ගැඹුරු ප්‍රජා සම්බන්ධතා
ව්‍යාපාර හවුල්කරුවන්
(විදේශීය රටවල නියෝජිත සම්බන්ධතා මධ්‍යස්ථාන 850)

පිටු අංක 160

ස්වාභාවික ප්‍රාග්ධනය

විදුලි පරිභෝජනය: **මෙ. වොට් 21,134.6**
ජල පරිභෝජනය: **ඝණ මීටර තත්. 501,229.3**
ඉන්ධන පරිභෝජනය: **ලීටර 732,101.1**

පිටු අංක 171

වටිනාකම් ජනනය කිරීමේ ක්‍රියාකාරකම්

ශාඛා බැංකුකරණය
පිටු අංක 126

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය
පිටු අංක 131

මෙහෙයුම් තලයේ ප්‍රවනතා
(පිටු අංක 52)



අවදානම් කළමනාකරණය *(පිටු අංක 102)*

වටිනාකම් ජනනය කිරීමේ ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් පිටු අංක 134

සමූහයේ ක්‍රියාකාරිත්වය පිටු අංක 141

පාර්ශ්වකරුවන්ගේ සැලකිලිමත්බව *(පිටු අංක 50)*



ආයතනික යහපාලනය *(පිටු අංක 71)*

නිමැවුම්

ආදායමෙන් සියයට (%)

ශුද්ධ පොළී ආදායම
29.6%

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම
3.8%

වෙනත් ආදායම්
6.8%

හානිකරණ ප්‍රතිපාදන
6.8%

මෙහෙයුම් වියදම්
14.7%

බදු
10%

වර්ෂය සඳහා ශුද්ධ ලාභය
8.8%

ප්‍රතිඵල

මූල්‍ය ප්‍රාග්ධනයේ කොටස් හිමියන් සහ සැපයුම්කරුවන්

ලාභාංශ: **රු. බිලියන 4.8**
බදු දායකත්වය: **රු. බිලියන 19.3**
ණය සඳහා ගෙවූ පොළිය: **රු. බිලියන 7.1**

පිටු අංක 137

පාරිභෝගිකයන්

දළ ණය ලබාදීම් : **රු. ට්‍රිලියන 1.5**
තැන්පතුකරුවන්ට ගෙවූ පොළිය: **රු. බිලියන 112.1**
නව නිෂ්පාදන හඳුන්වාදීම්: **03**
නව පාරිභෝගික ස්පර්ශක ස්ථාන **132** මඟින් වැඩිදියුණු කල සේවා සැපයීම
පාරිභෝගික දැනුවත් කිරීම් සඳහා ආයෝජන : **රු. මිලියන 21.9**

පිටු අංක 137 සහ 160

සේවකයන්

සේවකයන් සඳහා මුළු ගෙවීම් : **රු. බිලියන 18.9**
පුහුණු කිරීම් සඳහා ආයෝජනය: **රු. මිලියන 338.0**
සේවක උසස්වීම් : **174**
සේවක රඳවා ගැනීමේ අනුපාතය : **98%**

පිටු අංක 147

ව්‍යාපාර සහයකයන්

සැපයුම්කරුවන් සඳහා ජනනය කරන ලද අගය : **රු. බිලියන 6.7**

පිටු අංක 167

ප්‍රජාව

ප්‍රජා සංවර්ධනය සඳහා ආයෝජනය: **රු. මිලියන 30.4**
ප්‍රජාව වෙත චකිතු කරන ලද ආර්ථික වටිනාකම: **රු. මිලියන 16,433**

පිටු අංක 67 සහ 160

පාරිසරික බලපෑම්

කඩදාසි භාවිතය අඩු කිරීම **මිලියන 7 A4 පිටු**
කාබන් පියසටහන: **ටොන් 13,255.6 (කාබන්ඩයොක්සයිඩ්)**

පිටු අංක171

පාර්ශ්වකරුවන් සහ සම්බන්ධවීම

බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, ගැඹුර සහ පුළුල් බව සැලකිල්ලට ගනිමින්, එහි සැලකිය යුතු කොටස්කරුවන්ගේ විවිධාකාර අපේක්ෂාවන් හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වේ. බැංකුවේ තීරණ මඟින් වඩාත් බලපෑමට ලක්වන පාර්ශ්වකරුවන් බැංකුව හඳුනාගන්නා අතර ඔවුන් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරයි. පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීම විවිධ වූ ක්‍රමවේදයන් ඔස්සේ සිදුකරනු ලබන අතර, එසේ සපයා ගත් ප්‍රතිචාරයන්, තොරතුරු අපගේ ආයතනික ක්‍රමෝපායන් සැලසුම් කිරීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.



	සේවකයින්	ගනුදෙනුකරුවන්
කඩුරුන්ද යන බිම	ලංකා බැංකු කණ්ඩායම දිවයින පුරා විසිරී සිටින සේවකයින් 8,724 දෙනෙකුගෙන් යුක්ත වන අතර සාමාන්‍ය සේවා කාලය වසර නවයකට වඩා වැඩි වේ.	දිවයින පුරා විසිරී සිටින මිලියන 13.4 කට අධික ගනුදෙනුකරුවන් වෙත බැංකුව සිය සේවාවන් සපයයි.
සම්බන්ධවීමේ ක්‍රියාපිළිවෙත්	• සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වන සමීක්ෂණ. (කාලානුරූපීව) • වෘත්තීය සමිති සමඟ සම්බන්ධතාවයන් (නිතරම) • විවෘත දොර සංස්කෘතිය (අඛණ්ඩව) • විවිධ මට්ටමේ කාර්ය මණ්ඩල රැස්වීම් (නිරන්තරයෙන්) • දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණය (අඛණ්ඩව) • රැකියා ජීවිත සමතුලිත මූල පිරිමි • කාර්යසාධන කළමනාකරණ පද්ධතිය (PMS) (වසරට දෙවරක්) • විසිල් බ්ලෝවර් ප්‍රතිපත්තිය	• ශාඛා කළමනාකරුවන් සහ සම්බන්ධතා කළමනාකරුවන් හරහා කටයුතු කිරීම (අඛණ්ඩව) • පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ. (කාලානුරූපීව) • පාරිභෝගික ක්ෂණික ඇමතුම් අංකය 1975 (365*24) • අලෙවිකරණ, ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය (නිරන්තරයෙන්) • මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් (නිරන්තරයෙන්)
අවධානයට ලක්කළ අංශ	• වෘත්තීය සහ නිපුණතා සංවර්ධනය සඳහා වූ අවස්ථාවන් • සාමූහිකව කටයුතු කිරීමේ නිදහස • වැටුප් සහ උසස්වීම් පිළිබඳ කරුණු විමසා බැලීමේදී සමානාත්මතාවය මුල් කර ගැනීම • කාර්යසාධනයට-නැඹුරු ආයතනික සංස්කෘතිය • ආරක්ෂිත වැඩ පරිසරයක් • විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ	• ගනුදෙනු පහසු කිරීම/පහසුව • ප්‍රවේශය • ගනුදෙනුකාර සේවා සහ සේවා තත්ත්ව • මූල්‍ය පහසුකම් සැලසීම • පාරදෘෂ්‍ය මිල ගණන් • සවිස්තරාත්මක සන්නිවේදනය
අපගේ ප්‍රතිචාරය	මානව සම්පත සංවර්ධනය කිරීම බැංකුවේ ආයතනික සැලැස්මෙහි (2018-2020) ප්‍රධාන අංශයක් වන අතර වසර සඳහා අපගේ සේවක අගයන් කේන්ද්‍රගත වූයේ තාක්ෂණික නිපුණතා සහ මෘදු කුසලතා වර්ධනය කිරීමේ අවස්ථාවන් සැපයීම සඳහාය.	සේවා සැපයුම් මාර්ග, නව්‍ය නිෂ්පාදන සහ සුපිරි පාරිභෝගික සේවා සැපයීම මූලික කොටගෙන පාරිභෝගිකයන්ගේ අත්දැකීම් ඉහළ නැංවීම සඳහා බැංකුව උපායමාර්ගික සැලැස්මක් දියත් කර ඇත.
ක්‍රමෝපායික වැදගත්කම	මානව සම්පත සංවර්ධනය වැඩි විස්තර සඳහා *153 පිටුව*	පාරිභෝගික කේන්ද්‍රීයකරණය, උපායමාර්ගික බහුවිධ සේවා සැපයුම්, ඩිජිටල්කරණය වැඩි විස්තර සඳහා පිටු 160 සිට 166

රජය සහ නියාමකයින්	ආයෝජකයින්	ව්‍යාපාරික සහයකයින්	ප්‍රජාව
ශ්‍රී ලංකා රජය බැංකුවෙහි එකම කොටස්කරු වන අතර ප්‍රධානතම නියාමකයා වන්නේ මහ බැංකුවයි.	අපගේ ණයකර වල ආයෝජනය කරන පාර්ශ්ව බැංකුවේ ප්‍රධාන ආයෝජකයින්ය.	පුළුල් ව්‍යාපාරික සහයක/සැපයුම් ජාලය මඟින් අපගේ වටිනාකම් ජනනය කරලීමේ මෙහෙයුම් ක්‍රියාවලියට නොමඳව සහය ලබාදේ.	දිවයින පුරා ප්‍රජාව සමඟ අර්ථවත් සබඳතා පෝෂණය කිරීම සඳහා බැංකුවේ පුළුල් භූගෝලීය ආවරණයක් සහිත සේවා සැපයුම් ජාලය මඟින් ඉඩ ලබා දී ඇත.
• කාර්යසාධන සහ අනුකූලතාවය සම්බන්ධිත කරුණු පිලිබඳ රැස්වීම් (කාලාන්තරව) • වාර්ෂික වාර්තාව (වාර්ෂිකව) • නියාමන හා අනුකූලතා වාර්තාකරණය (කාලාන්තරව) • කර්මාන්ත සංසඳ හා රැස්වීම් (නිරන්තරයෙන්) • මූල්‍ය ප්‍රකාශන (කාර්තුමය)	• මහාපරිමාණ ආයෝජකයින් සමඟ සම්මුඛ රැස්වීම් (කාලාන්තරව) • ආයෝජක ඉදිරිපත් කිරීම් සහ මාර්ගෝපදේශනයන් ලබාදීම (කාලාන්තරව) • වෙළඳපොළ අතරමැදියන් හරහා කටයුතු කිරීම • කොළඹ කොටස් වෙළඳපොළ රෙගුලාසි අනුව අනුකූලතා වාර්තාකරණය (කාර්තුමය)	• ලිඛිත සන්නිවේදනය (නිරන්තරයෙන්) • රැස්වීම (නිරන්තරයෙන්) • ටෙන්ඩර් ක්‍රියාවලිය (කාලාන්තරව) • ත්‍රෛමාසික ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා	• ශාඛා හරහා කටයුතු කිරීම (අඛණ්ඩව) • ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් හා අනුග්‍රාහකත්වය (නිරන්තරයෙන්) • මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය වැඩසටහන් (නිරන්තරයෙන්)
• මූල්‍ය ක්ෂේත්‍රය තුළ විශ්වාසය පවත්වා ගැනීම • ශ්‍රී ලංකා රජයෙහි අරමුදල් අවශ්‍යතා සපුරාලීම • බැංකු ක්‍රමෝපායන් ජාතික සංවර්ධන න්‍යායට අනුගත කිරීම • ශක්තිමත් පාලනයක් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් • මූල්‍ය සම්බන්ධතා පහසුකම් සැලසීම	• අනුමාන කර ඇති අවදානම් සමඟ ප්‍රතිලාභ සමානුපාතික කිරීම • නියමයන් හා කොන්දේසි වල පැහැදිලි බව • බැංකුවේ කාර්යසාධනය හා දෘෂ්ටිය පිලිබඳ විනිවිද හා කාලීන වාර්තා කිරීම	• ගනුදෙනු සහ විනිවිද පෙනෙන මිලකරණය, නියමයන් සහ කොන්දේසි • නියමිත පරිදි ගෙවීම් • සුරක්ෂිත හා අඛණ්ඩව පවතින ඉල්ලුම	• ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය • වගකිව යුතු ව්‍යාපාරික භාවිතයන් • මූල්‍ය ඇතුලත් කිරීම හා බලගැන්වීම • රැකියා උත්පාදනය
ශ්‍රී ලංකා රජයෙහි ආර්ථික සංවර්ධන න්‍යාය පත්‍රයේ එක ප්‍රධාන පහසුකම් සපයන්නෙකු වන්නේ බැංකුවයි. එමෙන්ම අපගේ ක්‍රමෝපායික අභිලාෂයන් ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සමඟ අනුකූලනය වී ඇත.	කාර්යසාධනය, නව මුහුණුවර ඇති අවදානම් සහ ඉදිරි දැක්ම පිළිබඳව සමබර, විනිවිද පෙනෙන හා අඛණ්ඩ සන්නිවේදනයක් අපගේ ආයෝජකයින් සමඟ පවත්වා ගෙන යාම.	පැහැදිලිව නිර්වචනය කර ඇති ප්‍රතිපත්ති රාමුව සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි සියලුම ව්‍යාපාරික සහායකයින් හට සාධාරණව සැලකීම සහ අනෝන්‍යය වශයෙන් ප්‍රතිලාභ ලබාදෙන සබඳතා සහතික කිරීම.	අප ක්‍රියාත්මක වන ප්‍රජාවන් සමඟ දිගුකාලීන සබඳතා වර්ධනය කර ඇති අතර ප්‍රජා සංවර්ධනය සඳහා දායක වන ක්‍රමෝපායන් හා අර්ථවත් ප්‍රවේශයක් අනුගමනය කරයි.
යහපාලනය හා තිරසරබව, ආර්ථික දායකත්වය *වැඩි විස්තර සඳහා පිටු 64 සිට 67 දක්වා සහ 71 සිට 88 දක්වා*	යහපාලනය හා තිරසරබව *වැඩි විස්තර සඳහා පිටු 71 සිට 88 දක්වා සහ 58 සිට 62 දක්වා*	ව්‍යාපාර සහායකයින් *වැඩි විස්තර සඳහා 167 පිටුව*	*සමාජීය සහ මානව සම්බන්දතා ප්‍රාග්ධනය* *වැඩි විස්තර සඳහා පිටු 160 සිට 170 දක්වා*

ක්‍රමෝපාය වාර්තාව

වෙළඳපොළ අවස්ථා හා අවදානම්

ආර්ථික ප්‍රවනතා

වසර 2018 දී ආර්ථික වර්ධනයේ අඩුවීමක් තිබියදී වුවද, විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය, උද්දමනය අඩු කිරීම හා විනිමය අනුපාතික කළමනාකරණය මඟින් සාර්ව ආර්ථිකයේ වර්ධනයක් සිදු වී ඇත.



තාක්ෂණය

මූල්‍ය සේවා ඩිජිටල්කරණය පුළුල් කිරීමේ කාර්යය පාරිභෝගිකයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වයන්, පාරිභෝගික පහසුව සහ සේවා සැපයුම් ප්‍රවේශය පිලිබඳ පාරිභෝගික අපේක්ෂාවන් වැඩි දියුණු කර ඇත. ඩිජිටල්කරණය පෙර නොවූ විරූ තලයකට පරිණාමය වී ඇති අතර මධ්‍යම හා දිගුකාලීනව තවදුරටත් වැඩිදියුණු කිරීමට ඉඩ ප්‍රස්ථා ඇත.



මූලාශ්‍රය: ගෙවීම් විවරණිකාව, ශ්‍රී ලංකා මහ බැංකුව

පාරිභෝගික අපේක්ෂාවන්

පුද්ගල බද්ධ සේවා සැපයුම, ක්ෂණිකව ළඟාවීමේ පහසුව සහ සරල බව යන අංග මූලික කොටගෙන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් අද දින සීඝ්‍රයෙන් වෙනසකට භාජනය වෙමින් පවතී. ඩිජිටල්කරණයේ පුළුල් භාවිතය හේතුවෙන් සන්නාම නාමය මත ගනුදෙනුකරුවන් රඳා පැවතීමේ ප්‍රවනතාවය අභියෝගයට ලක්ව ඇති අතර ඩිජිටල්කරණයට අනුගතවීමට පසුගාමී මූල්‍ය ආයතන අවදානම් තත්ත්වයකට මුහුණ දී ඇත.



මූලාශ්‍රය : PWC,2017

නියාමනයන්

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව උත්සාහ දැරීම මත ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන රාමුවෙහි දැඩි පදනමක් දක්නට ඇත. 2018 හි නියාමන වෙනස්කම් අතර ලීසිං පහසුකම් ඇප අනුපාත මත සීමා කිරීම් සහ වාහන ආනයනය මත ඉහළ මුදල් ආන්තිකන් පැනවීම ඇතුලත් වේ. මීට අමතරව, බාසල් III මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 මූල්‍ය උපකරණ

අනුගමනය කිරීම මඟින් බැංකුවල ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

තිරසාර පැතිකඩයන්

අසමානතාවයන්, භූගෝලීය ආතතීන් සහ දේශපාලන දර්ශන පුළුල්ව වෙනස්කිරීම හේතුවෙන් ලොව පුරා සැලකිය යුතු සමාජ ආර්ථික අභියෝගයන් ඇති වී තිබේ. දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන්ද දැකිය හැකි දේශගුණික විපර්යාසයන් නිසා පාරිසරික අවදානම් උද්ගතවී තිබේ. මෙම පසුබිම මත මූල්‍ය ආයතන සහ බැංකු මූල්‍යමය පහසුකම් සැපයීම

සඳහා මූලික කාර්යභාරයක් ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අවස්ථාවන්	අවදානම්	2019 සඳහා උපායමාර්ගික දැක්ම
• ආර්ථික ඵලදායීතාව ඉහළ නැංවීම කෙරෙහි ප්‍රතිපත්ති අවධාරණය කිරීම • ආයෝජන අවස්ථා උදෙසා අන්තර්ජාතික සංසඳ සමඟ සම්බන්ධතා වැඩි දියුණු කිරීම	• ප්‍රතිපත්ති විෂමතාවයන් • රුපියලේ අවප්‍රමාණය වීම රටේ මූල්‍ය වගකීම්/ ණය කෙරෙහි බලපෑම	සාර්ව ආර්ථික බලපෑම් කෙටිකාලීනව පැවතිය හැකි වුවද, රටේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට වැඩි ණය ලබා දීම තුළින් විශේෂයෙන්ම එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය මඟින් ණය ලබාදීම තුළින් ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කිරීමට බැංකුව කටයුතු කරනු ඇත.
• අනාගත ගනුදෙනුකරුවන් ඩිජිටල් නාලිකා වෙත වැඩි අවධානයක් යොමු කෙරේ • මෙහෙයවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් • ග්‍රාමීය ප්‍රජාව තුළ ඩිජිටල් බැංකු කටයුතු පුරුදු කිරීම.	• සයිබර් ආරක්ෂණය සහ තොරතුරු තාක්ෂණ අවදානම • ඩිජිටල් යුගයේ දත්ත රහසිගත භාවය ආරක්ෂා කිරීම • තොරතුරු තාක්ෂණ හැකියාව සහ අඛන්ඩතාවය • විකුණුම්කරු සහ තෙවන පාර්ශ්ව අවදානම	තවදුරටත් අපගේ ඩිජිටල් සේවා සැපයුම් පාරිභෝගික පහසුව සහ නව යුගයේ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම කේන්ද්‍රකොටගෙන උපායමාර්ගිකව දියත් කරනු ඇත.
• පුද්ගලාරෝපිත සේවා සඳහා ඉල්ලුම් කෙරෙන පාරිභෝගිකයන්ගේ වැඩි වීම. • ඩිජිටල් සේවා බලාපොරොත්තු වන පාරිභෝගිකයින්ගේ වැඩි වීමක්	• නව තරඟකරුවන් සහ ෆින්ටෙක් සංවිධාන විසින් සිදු වන තාක්ෂණික බාධා කිරීම් • තරඟකාරී තීව්‍රතාවය වැඩි වීම • සීඝ්‍රයෙන් වෙනස්වන පාරිභෝගික අපේක්ෂාවන් හේතුවෙන් සන්නාම වෙළඳ නාම පක්ෂපාතීත්වය අඩු වීම	බැංකුවේ ඩිජිටල්කරණ වැඩපිලිවෙල තවදුරටත් ශක්තිමත් කරගනිමින් පාරිභෝගිකයින් කේන්ද්‍ර කරගත් සේවාවන් සැපයීම.
• ප්‍රාග්ධන තත්ත්වය හා ණය ගුණත්වය ශක්තිමත් කිරීම • පාරිභෝගිකයින්, කර්මාන්ත හා අනෙකුත් පාර්ශ්වකරුවන්ට යහපත් බලපෑම	• අනුකූලතා පිරිවැය වැඩි වීම • නියාමනයන් හි සංකීර්ණාත්වය ඉහළයාම • වර්ධන අපේක්ෂාවන් ප්‍රාග්ධන අවශ්‍යතා අතර අසමබරතාවන්	බාසල් III හි අවම ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අපගේ වර්ධන අපේක්ෂාවන් සමාන කිරීම 2019 දී කළමනාකාරිත්වයේ ප්‍රධාන අරමුණක් බවට පත්වනුයේ ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට බැංකුව සතුව ඇති විවිධ සීමා මායිම් නිසාවෙන්ය.
• හරිත ව්‍යාපාරයන්, බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණය පිළිබඳ වැඩි වශයෙන් සැලකිලිමත් වේ • සියලුදෙනා සඳහා මූල්‍ය පහසුකම් සංවර්ධනයට රජය ප්‍රමුඛත්වය ලබා දෙයි	• කෘෂිකාර්මික අංශයේ ණය ලබාගැනීම සඳහා දේශගුණික විපර්යාස වල බලපෑම් • ලාභදායීත්වය මත කෙටිකාලීන බලපෑම්	තිරසාර කරුණු සැලකිල්ලට ගනිමින් ආයතනික උපක්‍රම මත සම්පත් පරිභෝජනය අවම කිරීම. ආයතනික සමාජ වගකීම් ව්‍යුහයද ගෝලීය තිරසාර ඉලක්ක සමඟ පුළුල්ව අනුගතකර ඇත. සමාජ හා පාරිසරික පිරික්සුම් නිර්නායකයන් අනුගමනය කරමින් හරිත ණය ලබාදීම තුළින් තිරසාරත්වය ස්ථිර කිරීම. අපගේ පුළුල් සේවා සැපයුම් ජාලය හරහා මූල්‍ය ඇතුලත්කරණය පහසු කිරීම.

ක්‍රමෝපාය වාර්තාව

ප්‍රමාණාත්මක ගැටළු

මෙම ඒකාබද්ධ වාර්තාව බැංකුවේ කටයුතු පිළිබඳව ප්‍රමාණාත්මකව වැදගත් මාතෘකා ඔස්සේ ගොඩනැගී තිබේ. එය බැංකුවට සහ එහි පාර්ශ්වකරුවනට වඩාත්ම අදාල වන කරුණු නියෝජනය කරනු ලබයි. පහත දැක්වෙන මාතෘකාවන් සවිස්තරාත්මකව ප්‍රමාණාත්මක තක්සේරුවක් අනුගමනය කිරීමෙන් අනතුරුව මෙහෙයුම් ක්ෂේත්‍රයේ, කොටස්කරුවන්ගේ සැලකිල්ල හා ක්‍රමෝපායික වටිනාකම් ප්‍රමුඛතාවයන් පිලිබඳ සලකා බලනු ලැබේ. මේවා අපගේ ආයතනික සැලසුම් ක්‍රියාවලිය, කළමනාකරණ මූලිකත්වයන් සහ ආයතනික වාර්තාකරණයේ දිශානතිය තීරණය කරයි. අපගේ වාර්තාවේ අදාලත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම වසරේදී ගෝලීය වාර්තාකරණ උපදේශක (G.R.I) විසින් නිර්දේශ කරනු ලබන කර්මාන්ත හා බැංකු විශේෂිත සාධක ඇතුලත්කර අපගේ ප්‍රමාණාත්මක මාතෘකා විෂය පථය පුළුල් කර ඇත.

G.R.I දර්ශක ඉක්මවා ප්‍රමාණාත්මක මාතෘකා විෂය පථය පුළුල් කිරීම

ප්‍රමාණාත්මකතාවය නිර්ණය කිරීම



ප්‍රමාණාත්මකතා සිතියම



පාර්ශ්වකරුවන් කණ්ඩායම	අදාල ප්‍රමාණාත්මක අංගය	GRI දර්ශකය	කොළඹ කොටස් හුවමාරුවේ ESG මාර්ගෝපදේශය
සේවක මණ්ඩලය	1. දක්ෂතා කළමනාකරණය 2. කාර්මික සාමය සහ ශ්‍රම කළමනාකරණ සම්බන්ධතා 3. විවිධත්වය සහ සමාන අවස්ථා	**GRI 401 :** රැකියා **GRI 402 :** කම්කරු/ කළමනාකරණ සම්බන්ධතා **GRI 403 :** වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව **GRI 404 :** පුහුණුව සහ අධ්‍යාපනය **GRI 505 :** විවිධත්වය සහ සමාන අවස්ථා **GRI 407 :** සංගෘහිත නිදහස සහ සාමුහික කේවල් කිරීම	රැකියා පුහුණුව සහ අධ්‍යාපනය වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව ශ්‍රම බලකාය විවිධත්වය සහ සමාන සැලකීම
පාරිභෝගිකයන්	4. පාරිභෝගික අත්දැකීම් 5. ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂාව 6. වගකීම් සහගත පරිචය	**GRI 417:** අලෙවිකරණ සහ නාමකරණය **GRI 418:** පාරිභෝගික පෞද්ගලිකත්වය	
ආණ්ඩුව /නියාමකයින්	7. මූල්‍යමය ක්‍රියාකාරිත්වය 8. සමාජ ආර්ථික දායකත්වය. 9. මූල්‍යය ඇතුලත් කිරීම. 10. යහපාලනය සහ අනුකූලතාවය	**GRI 201 :** ආර්ථික කාර්යය සාධනය **GRI 202 :** වෙළඳපොළ පැවැත්ම **GRI 413 :** ප්‍රාදේශීය ප්‍රජාවන් **GRI 203 :** වක්‍ර ආර්ථික බලපෑම් **GRI 419 :** සමාජ ආර්ථික අනුකූලතාවය **GRI 307 :** පරිසර අනුකූලතාවය	අනුකූලතාවය
ව්‍යාපාර හවුල්කරුවන්	11. වගකීම් සහගත ප්‍රසම්පාදනය 12. අල්ලස් සහ දුෂණ විරෝධී 13. කම්කරු අයිතීන් (බාහිර සේවා/ කොන්ත්‍රාත් පදනම)	**GRI 204 :** ප්‍රසම්පාදන පරිචයන් **GRI 205 :** දුෂණ විරෝධී **GRI 406 :** වෙනස්කම් නොකරන **GRI 408 :** ළමා ශ්‍රමය **GRI 409 :** බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය	
වෙනත් සාධක	14. ඩිජිටල්කරණය සහ තාක්ෂණය 15. පාරිසරික පියසටහන් 16. සන්නාම කීර්තිය	**GRI 302:** බලශක්තිය **GRI 305:** විමෝචනය	බල ශක්ති තීව්‍රතාවය

- *ප්‍රමාණාත්මක අංශ පිළිබඳව අදාල GRI අනාවරණය සඳහා පිටු 451 සිට 456 දක්වා බලන්න.*

ක්‍රමෝපාය වාර්තාව

අපගේ උපායමාර්ග (2018 - 2020)

තාක්ෂණයේ නොවූ විරූ වෙනස්කම්, පාරිභෝගික සංකීර්ණත්වය, තරඟකාරී තීව්‍රතාවය සහ නියාමන අවශ්‍යතාවයන් ශක්තිමත් ක්‍රමෝපායන් අනුගමනය කිරීම වෙත නිරන්තරයෙන් බැංකුව යොමු කරයි. ලංකා බැංකුව විසින් ක්‍රමෝපායික සැකසීමක් සඳහා ක්‍රමානුකූල හා පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කරන අතර, වසර තුනක කාල පරිච්ඡේදයක් ආවරණය කරන අපගේ ආයතනික සැලැස්ම, අපගේ අපේක්ෂා මුදුන් පත් කර ගැනීම සඳහා මූලෝපායික ප්‍රමුඛතාවන් හා ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කරයි. මෙහෙයුම් පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගෙන එයට අදාළ හා ප්‍රායෝගික යථාර්ථයක් බවට අපගේ ක්‍රමෝපායන් සරිලන බවට වග බලා ගැනීම සඳහා නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

2018 - 2020 සඳහා ආයතනික සැලැස්ම කේන්ද්‍රගත වූයේ "බැංකුව ඉදිරි අනාගතය සඳහා ප්‍රතිනිර්මාණය සහ දිශාගත කිරීම" යන තේමාව යටතේය. 2018 දී සිය ක්‍රමෝපායික ප්‍රමුඛතාවයන්ට අනුව බැංකුවේ කාර්යසාධනය පිළිබඳ ඉහළ මට්ටමේ සමාලෝචනයක් පහත කොටස මඟින් සපයනු ලැබේ.

පාරිභෝගික සේවා හා තාත්විකත්වය

අපගේ රට පුරා විසිර පවත්නා සේවා ජාලය මඟින් සියළුම ගනුදෙනුකරුවන් වෙත එක සමාන වූ කාර්යක්ෂම බැංකුකරණ අත්දැකීම් ලබාදීම සඳහා සේවා සැපයුම් ප්‍රමිති හා ගුණත්ව මට්ටම් වැඩි දියුණු කරලීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

2018 දී ප්‍රගතිය

- සේවා මට්ටම් වල අඩුපාඩු හඳුනාගැනීම සඳහා සංසන්දනාත්මක සේවා මට්ටම් හා සබැඳි පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම.
- ස්මාර්ට් කලාප සහ අනෙකුත් ඩිජිටල් නිෂ්පාදන ස්ථාපිත කිරීමෙන් ඩිජිටල්කරණ සේවා සැපයුම ශක්තිමත් කිරීම.

පිටුව 165

ණය ගුණාත්මකභාවය සහ ණය සංස්කෘතිය වැඩි දියුණු කිරීම

සියලුම ව්‍යාපාර වල තත්ත්ව කලමනාකරණ ආරක්ෂා කරන අතරතුර පාරිභෝගික සබඳතා පවත්වාගෙන යාම අවධාරණය කර ඇත. සාර්ව ආර්ථික තත්ත්වයන් දුර්වල වීම සහ ශ්‍රී. ලං. මූ. වා. ප්‍ර. 09 හි අවශ්‍යතා මත 2018 දී ණය ගුණත්වය පවත්වා ගැනීම අතිශයින්ම වැදගත් විය.

- ණය ඇගයීම සම්බන්ධව නිපුණතා සහ දැනුම වැඩි දියුණු කිරීම.
- ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් වැඩි දියුණු කිරීම.
- නැවත අයකර ගැනීමේ ක්‍රියාවලිය දිවයින පුරා දියත් කිරීම.

පිටුව 109

ගෝලීය ප්‍රවේශය පුළුල් කිරීම

බැංකුව විසින් ගනුදෙනුකරුවන්ගේ ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා නව්‍ය ව්‍යාපාරික ආකෘති, වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලි සහ බහු නාලිකා බෙදා හැරීමේ උපායමාර්ග ඇරඹීමට අදහස් කරයි.

- ලංකා බැංකුවේ ඩිජි මධ්‍යස්ථාන ඇතුළු ඩිජිටල් නිෂ්පාදන කිහිපයක් හඳුන්වාදීම.
- ස්මාර්ට් කලාප ජාලය පුළුල් කිරීම.
- අන්තර්ජාල බැංකුකරණ පහසුකම් වැඩි දියුණු කිරීම හා නැවත ස්ථාපිත කිරීම.
- ජංගම බැංකු රථ සංඛ්‍යාව පුළුල් කිරීම.
- වෙස්ටන් යුනියන් සහ තවත් මුදල් නියෝජිතයන් සමඟ සම්බන්ධ වීම.

පිටුව 142

තාක්ෂණය හා සයිබර් ආරක්ෂණය

මූල්‍ය සේවා පිළිබඳ ඩිජිටල් විප්ලවය පාරිභෝගිකයින්ගේ අත්දැකීම් පරිණාමනය කිරීම හා අභ්‍යන්තර ක්‍රියාවලින් වර්ධනය කිරීම සඳහා අවස්ථා රාශියක් උදා කර ඇත. ලංකා බැංකුව සිය තරුණ ගනුදෙනුකරුවන්ගේ සංකීර්ණ අවශ්‍යතා සඳහා සේවය කිරීම මෙන්ම සයිබර් සහ තොරතුරු තාක්ෂණ අවදානම් විධිමත්ව කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

- ස්වයං සේවා නාලිකා පුළුල් කිරීම.
- අන්තර්ජාලය හරහා ණය ඉල්ලුම් කිරීමේ පහසුකම් ඇති කිරීම.
- ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- සයිබර් ආරක්ෂක රාමුව ශක්තිමත් කිරීම.

පිටුව 164

2018 දී ප්‍රගතිය

ක්‍රියාවලි කාර්යක්ෂමකරණය හා නවෝත්පාදනය

පද්ධති සහ ක්‍රියාවලි අවහිරතා හඳුනා ගැනීම සහ විසඳුම් ලබා දීම තුළින් කාර්යක්ෂමතාව හා චලදායිතාවය වැඩි දියුණු කිරීම. බැංකුවේ තුන් අවුරුදු ක්‍රමෝපාය සැලැස්මේ එක් ප්‍රධාන අංගයකි.

- ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) හරහා ප්‍රධාන කාර්ය ප්‍රවාහයන් ස්වයංක්‍රියකරණය කිරීම.
- සියලුම පළාත් සන්නිවේදන කටයුතු සඳහා විඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය අනුගමනය කිරීම.
- ස්වයංක්‍රීය පාරිභෝගික පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය.

පිටුව 145

මානව සංවර්ධනය

මානව සංවර්ධනය කෙරෙහි අපගේ අවධානය යොමු වන්නේ විවිධාංගීකරණයෙන් යුක්ත හා දක්ෂ බැංකුකරුවන් සංචිතයක් විසින් නිවැරදි ආකල්ප සහ නිවැරදි නිපුනතා සහිතව අනාගත බැංකුකරණයට මුහුණ දීම උදෙසායි. එබැවින්, අපගේ මානව සංවර්ධන වැඩසටහන් ප්‍රධාන අංශ හයක් පිළිබඳව අවධානය යොමු කර සකස් කර ඇත.

- අධ්‍යාපනය
- පුහුණුව (වර්තමාන රැකියා කාර්ය භාරය, පෞද්ගලික සංවර්ධනය, සේවා ඉදිරිපත් කිරීම සහ බෙදා හැරීම)
- බහු මාධ්‍ය නිරාවරණය
- විශේෂීකරණය සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය
- ආකල්ප, හඳුන්වාදීම් සහ ආයතනික සංස්කෘතිය
- ආධාරක යටිතල පහසුකම්

- පුහුණු වැඩ සටහන් 11,768 ක් ලබා දීම.
- ප්‍රධාන කළමනාකරණ පුද්ගලින් (KMPs) සඳහා PIM සමඟ හවුල්කාරිත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- සේවකයින්ගෙන් 97.7% කාර්යසාධන ප්‍රතිචාර PMs හරහා ලබා දීම.

පිටුව 153

තිරසාර ව්‍යාපාර

වසර තුළ අපගේ තිරසාර සංවර්ධන වැඩසටහන් සමාජයේ සියලු අංශයන් ඔස්සේ ව්‍යාප්ත වන අතර අපගේ සියලු උපායමාර්ගයන් අපගේ පාරිසරික හා සමාජීය කාර්යසාධනය වැඩි දියුණු කිරීම තුළින් ප්‍රශස්ත ලාභ උපදවා ගැනීමට යොමු කෙරේ.

- ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය හා සංශෝධනය කිරීම.
- සංවර්ධන බැංකු කටයුතු සඳහා වන පාරිසරික හා සමාජ පරීක්ෂණ නිර්නායකයන් ක්‍රියාත්මක කිරීම
- ශාඛා 27 ක් සූර්ය බලශක්ති වෙත පරිවර්තනය කරන ලදී.
- ISO 14064-1 අනුකූලව GHG ඇගයීමේ වැඩසටහන ආරම්භ කරන ලදි.

පිටුව 60

යහපාලනය සහ ආචාර ධර්ම

ගෝලීය ප්‍රශස්ථ ක්‍රමවේදයන් සමඟ ගැලපෙන පරිදි බැංකුවේ පරිපාලන ක්‍රියාමාර්ගයන් අඛණ්ඩව අනුගත කර ගෙන යාමට බැංකුව කටයුතු කරයි.

- ප්‍රතිපත්ති රාමුව සමාලෝචනය හා සංශෝධනය කිරීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව - ICT කමිටුව (තාක්ෂණ කමිටුව)
- නියාමකයින් විසින් පනවන ලද නව රෙගුලාසි වලට අනුකූල වීම

පිටුව 71

වෙළෙඳනාම සංවර්ධනය

ශ්‍රී ලංකාවේ අංක 01 වෙළෙඳනාමය ලෙස අඛණ්ඩව ශ්‍රේණිගත වී ඇති අතර, BoC සන්නාමනාමය තරඟකාරී ශක්තිමත් ප්‍රධාන ප්‍රභවයක් වන අතර අද්විතීය කොටස්කරුවන්ගේ යෝජනා, ඉල්ක්කගත අලෙවිකරණය සහ නව්‍ය දීමනා හරහා වෙළෙඳනාමය තවදුරටත් අගයමින් අපි ඉදිරියට ගෙන යනු ඇත.

- පිළිගත් අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාකාරී සැලැස්ම විධිමත් කර ඇත.
- පාරිභෝගික සේවා ක්‍රියාකරකම් රාශියක්.

පිටුව 157

තිරසාරත්වය පිළිබඳ වාර්තාව

තිරසාරකත්ව ප්‍රවේශය

මෑත වර්ෂවල දී, ලංකා බැංකුව සිය තිරසාරකත්වය පිළිබඳ ප්‍රතිපත්තිය විධිමත් කිරීම් හා තිරසාර ප්‍රතිපත්ති ආයතනික සැලැස්ම සමඟ ඒකාබද්ධ කර තිරසාර භාවය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමට උත්සාහ කර ඇත. බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) වලට අනුකූලව ආයතනික සමාජ වගකීම ඉටු කරලීම සඳහා ව්‍යාපෘති තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් මඟින් ප්‍රධාන ව්‍යාපාරික කටයුතු හරහා හෝ බැංකුව විසින් සිදුකරනු ලබන සමාජ සත්කාරක සේවාවන් හරහා තිරසාර ඉලක්ක සියල්ලම පාහේ ආවරණය කෙරෙන බවට කටයුතු යොදා ඇත.

තිරසාර ව්‍යාපාර සඳහා කළමනාකරණ ප්‍රවේශය.

ආයතනික වටිනාකම්	පාර්ශ්වකරුවන්ගේ මැදිහත් වීම	බලපෑම, අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගැනීම	ප්‍රතිපත්ති ආවරණය	මෙහෙයවීම හා පාලනය	කළමනාකරණය සහ අනාවරණය කිරීම
මහජනතාව/ ප්‍රජාව වෙත සේවා සැපයීමේදි බැංකුවේ මෙහෙයුම් පිලිවෙත	බැංකුවේ පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කරන ආකාරය	බැංකුව මුහුණ දී ඇති අවදානම් සහ අවස්ථා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය	වගවීම් සඳහා බැංකුවේ කැපවීම ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය	යහපාලනය හා කළමනාකරණ වගවීම	කාර්යසාධන කළමනාකරණය සහ පාර්ශ්වකරුවන්ට තොරතුරු
• ආයතනික වටිනාකම් හඳුනාගැනීම. • වටිනාකම් සන්නිවේදනය කිරීම. • තිරසාර උපායමාර්ග.	• පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම. • පාර්ශ්වකරුවන් සමඟ අනෝන්‍යය සම්බන්ධතා පැවත්වීම. • ප්‍රතිචාර ඇගයීම. • ප්‍රතිචාර දැක්වීම.	• බලපෑම් හඳුනා ගැනීම. • අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගැනීම. • අවදානම් සහ අවස්ථා ඇගයීම. • අධීක්ෂණය සහ සමාලෝචනය.	• තිරසාර ප්‍රතිපත්තිය (ආර්ථික, සමාජීය, පාරිසරික). • මානව සම්පත් ප්‍රතිපත්තිය. • සන්නිවේදන ප්‍රතිපත්තිය.	• **අභ්‍යන්තර** 1. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත සහ පාලන ප්‍රතිපත්ති 2. තිරසාර යහපාලන ක්‍රියාවලිය • **බාහිර** 1. නියාමකයින් විසින් නිකුත් කරන ලද පාලන රෙගුලාසි 2. වෙනත් බාහිර ප්‍රඥප්ති	• තිරසාර කාර්යසාධනය මැනීම. • වාර්තා කිරීම සඳහා ගෝලීය සම්මතයන්. • බාහිර සහතිකය.

තිරසාර, වගවීම සහ වගකීම් සහිත ව්‍යාපාර මෙහෙයුම්

ලංකා බැංකුවේ තිරසාර ව්‍යාපාර සඳහා කළමනාකරණ ප්‍රවේශය, සංස්ථාපිත වටිනාකම්, පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය, බලපෑම් හඳුනා ගැනීම, අවදානම් සහ අවස්ථාවන්, ප්‍රතිපත්ති ආවරණ, කළමනාකරණ සහ පාලනය, කළමනාකරණය සහ අනාවරණ වලින් සමන්විත වේ.

ආයතනික වටිනාකම් යොමු වන්නේ මහජනතාව/ ප්‍රජාව වෙත ලබාදෙන සේවාවන් පිළිබඳ බැංකුව සතු ක්‍රියාකාරී දර්ශනයයි. පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීමේ ක්‍රමවේදය මඟින් සිය මෙහෙයුම් පරිසරය තුළ බැංකුව සිය පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කරන ආකාරය තීරණය කරයි. බැංකුව විසින් මුහුණ දී ඇති අවදානම් සහ උදා වී ඇති ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමටත් ඒවා විශ්ලේෂණය කර අවදානම අවම කර ගැනීමත් ඉතා වැදගත් කාර්යයකි. ආයතනික පුරවැසියෙකු ලෙස වගවීම ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවේ කැපවීම තහවුරු කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිපත්තිමය ආවරණයන් මඟින් සපයයි. සිය පාර්ශ්වකරුවන්ට යහපාලනය සහ කළමනාකරණ වගවීම පවත්වාගෙන යාමට කළමනාකරණය සහ පාලනය මඟ පාදයි. කළමනාකරණය හා අනාවරණය කිරීම පාර්ශ්වකරුවන්ට කාර්යසාධනය සහ තොරතුරුවල විනිවිදභාවය තහවුරු කරයි. ලංකා බැංකුවේ මෙහෙයුම් පරිසරය තුළ තිරසාර, වගකිව යුතු සහ වගකීම් සහිත ව්‍යාපාරයක් ක්‍රියාවට නැංවෙන බව තිරසාර, ප්‍රවේශය තුළින් පැහැදිලිවම පිළිබිඹු වේ.

තිරසාර කමිටුව

බැංකුවේ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් නියෝජනය කරන මහා කළමනාකාරතුමා ප්‍රධානත්වයෙන් යුතු විශේෂිත වූ කමිටුවත් බැංකුවේ තිරසාර උපායමාර්ගය මෙහෙයවීම් සඳහා වගකීම් දරයි. වර්ෂය තුළදී, ප්‍රධාන අවදානම් නිලධාරිතුමා සහ නියෝජ්‍ය මහා කළමනාකරු - ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු ඇතුලත් කරමින් කමිටුවේ නියෝජනය පුළුල් කරන ලදී. කමිටුව කාර්තුමය වශයෙන් රැස්වන අතර ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. තිරසාර කමිටුව විසින් අනුමත කරන ලද ව්‍යාපෘති, ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරණ විශේෂිත තිරසාර ඒකකයක් පිහිටුවා ඇත. වසර තුළදී, මානව සම්පත පුළුල් කරමින් තිරසාර ඒකකය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

පූර්වාරක්ෂක මූලධර්මය

පාරිසරික සහ සමාජයීය නිර්ණායකයන්ට නිසි අවධානයක් යොමු කරමින් සිය උපායමාර්ගික ව්‍යාපාරික තීරණ ගැනීමට බැංකුව ප්‍රවේශමීකාරී ප්‍රවේශයක් ගනු ලබයි. නව ව්‍යාපාර/ ආයෝජනය සඳහා ආයෝජනය කිරීමට පෙර විභව පාරිසරික හා සමාජයීය අවදානම, ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියන් මඟින් ඇගයීමට ලක් කෙරේ.

2018 දී ප්‍රගතිය

වසර තුළදී දියත් කරන ලද ප්‍රධාන තිරසාර ක්‍රියාමාර්ග පහත දැක්වේ. මෙම වාර්තාවේ පසුකාලීන කොටස් හි විස්තරාත්මක තොරතුරු අදාළ පරිච්ඡේදවල දක්වා ඇත.

- පරිසර හිතකාමී, සමාජීය සහ ආර්ථික වශයෙන් තිරසාර වන බවට දක්වන කැපවීම ස්ථාපිත කිරීමට සේවක මණ්ඩලය වෙතින් තිරසාර ප්‍රතිඥාවක් ලබා ගැනීම.
- සංවර්ධන බැංකුකරණ කටයුතු සඳහා පාරිසරික හා සමාජීය කළමනාකරණ ක්‍රමවේදයක් (ESMS) ක්‍රියාත්මක කිරීම.
- ආයතනික සමාජ වගකීම් ඇගයුම් ආදර්ශනය යලි විශ්ලේෂණය.
- පළාත් විසින් ආරම්භ කරන ලද නව ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති අටකි.
- හරිතාගාර වායු තක්සේරු ක්‍රියාවලිය සඳහා ශාඛා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම.



මෙම පොරොන්දුව ගෞරවයට පාත්‍ර කිරීම සඳහා ඔබගේ රට වැසියන්ට, විශේෂයෙන්ම දරුවන්ට ආදර්ශමත් වන්න.

තිරසාරත්වය පිළිබඳ වාර්තාව

SUSTAINABLE DEVELOPMENT GOALS

තිරසාර සංවර්ධන අරමුණු සඳහා අපගේ කැපවීම

තිරසාර සංවර්ධන අරමුණු විසින් සංවර්ධන ප්‍රමුඛතා, දරිද්‍රතාව පිටුදැකීම, ලෝකය සුරක්ෂිත කිරීම හා සෞභාග්‍ය ළඟා කරලීම ආදී වූ ගෝලීය ප්‍රයත්නයන් පිළිබඳව විශ්වීය එකඟතාවයන් සපයනු ලැබේ. අරමුණු 17 ක්, ඉලක්ක 169 ක් සහ දර්ශක 244 මඟින් අද ලෝකය මුහුණ දුන් තිරණාත්මක ආර්ථික, සමාජ හා පාරසරික ගැටළු විසඳීම සඳහා ස්ථාපිත මිණුම් දඬු හා අරමුණු සපයයි. ශ්‍රී ලංකාවේ විශාලතම හා වඩාත්ම බලගතු බැංකුව ලෙස අප විශ්වාස කරනුයේ තිරසාර සංවර්ධනයේ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල දායකත්වයක් අපට ලබා දිය හැකි බවයි.

	ශ්‍රී ලංකාවේ පසුබිම		අපගේ දායකත්වය
1 දරිද්‍රතාවයෙන් තොර වීම	දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහනය **3.8%**	සමාජ ආරක්ෂණ පද්ධති මඟින් ආවරණය වන ජනගහනය **34%**	ලංකා බැංකුවේ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය "මිතුරු" විසින් සාමාන්‍ය පොළී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශයක් නොමැති බිම් මට්ටම් වල ජනතාව බල ගැන්වීම අරමුණු කර ඇත. • **BOC මිතුරු සමාජ යටතේ අරමුදල්: රු. මිලියන 189.0** • **නව කණ්ඩායම් පිහිටුවීම්: 209**
2 කුසගින්න නැතුවන් කිරීම	ජනගහනයේ ආහාර අනාරක්ෂිතතා ව්‍යාප්තිය **9.2%**	වර්ධන අඩුපාඩු සහිත වයස අවු 5 ට අඩු ළමයින්ගේ ප්‍රතිශතය **17.3%**	කෘෂිකාර්මික අංශය ඉලක්ක කර ගනිමින් "රන් අස්වනු" සහ "ගොවි නවෝදා" වැනි ණය යෝජනා ක්‍රම තුළින් රටේ ආහාර සුරක්ෂිතතාව සඳහා ලංකා බැංකුව දායක වේ. • කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයේ සැලකිය යුතු ණය ප්‍රදානය: රු. බිලියන 97.7 • 2018 වර්ෂය තුළදී බැංකුව විසින් ලබා දුන් රන් අස්වනු සහ ගොවි නවෝදා ණය ප්‍රමාණය: 1,840 • වී අලෙවි මණ්ඩලය සඳහා ලබා දුන් පහසුකම්.
3 නීරෝගී බව සහ යහපැවැත්ම	මාතෘ මරණ අනුපාතිකය **26.8** උප්පත්ති 100,000 කින්	මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය **13.4** ජනගහනයෙන් 100,000 කින්	• සෞඛ්‍ය සඳහා ආයතනික සමාජීය වගකීම් යටතේ ආයෝජනය රු. මිලියන 3. • අපගේ සේවකයන් සඳහා පුළුල් වෛද්‍ය ආධාර ක්‍රමයක්.
4 ගුණාත්මක අධ්‍යාපනය	සංවිධානාත්මක ඉගෙනීම තුළ සහභාගිත්ව අනුපාතය **97.7%**	තොරතුරු සන්නිවේදන තාක්ෂණ හැකියාව සහිත තරුණයින් සහ වැඩිහිටියන් සංඛ්‍යාව **27.6%**	පුහුණුව සඳහා අවස්ථාව ලබා දීම අපගේ සේවක ප්‍රජාව තුළ වටිනාකම ජනිත කිරීමේ ප්‍රධාන කොටසකි. තවද, අප විසින් අධ්‍යාපනික අරමුණු සහිත සමාජ සත්කාර වැඩසටහන් ගණනාවක් පවත්වාගෙන යනු ලබයි. • සේවකයන් පුහුණු කිරීම් සඳහා අයෝජනය රු. මිලියන 338.0 • බැංකුව විසින් පිරිනමන ලද 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සංඛ්‍යාව: 2,000 • බැංකුව විසින් ප්‍රදානය කළ 18+ උසස් පෙළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව: 562 • අධ්‍යාපනය සඳහා ආයතනික සමාජීය වගකීම් ඔස්සේ සිදුකරන ලද ආයෝජන: රු. මිලියන 89.2
5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය	කළමනාකාරිත්වය තුළ කාන්තා නියෝජනය **28%**	අවුරුදු 18 ට අඩු විවාහක කාන්තාවන් ගණන **9.8%**	අපි සැමට සමාන අවස්ථා සහිත සේවා යෝජකයකු වන අතර ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගෙන තෝරා ගැනීමේදී වෙනස්කම් කිරීම්, දීමනා හෝ උසස් වීම් තිරණය කිරීම් සිදු නොකරයි. • කළමනාකරණ ශ්‍රේණියේ කාන්තා නියෝජනය: 58% සමස්ථ: 60% • මාතෘ නිවාඩු ලැබීමෙන් පසු සේවයට වාර්තා කරන ලද සංඛ්‍යාව: 358

	ශ්‍රී ලංකා පසුබිම	අපගේ දායකත්වය
6 පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව	ආරක්ෂිතව කළමනාකරණය කල ජල පද්ධති භාවිතා කරන ජනගහනය **81%**	ජනතාවට පිරිසිදු පානීය ජලය සම්පාදනය කරන ජාතික ජල සම්පාදන, හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සහ මහවැලි අධිකාරියේ ව්‍යාපෘති සඳහා මූලික ණය ප්‍රදානය කරන්නා ලෙස ලංකා බැංකුව ක්‍රියා කරයි. • වසර තුළ ජල ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය: රු. බිලියන 4.7 • ජල ව්‍යාපෘති සඳහා ආයතනික සමාජීය වගකීම් අරමුදල් යෙදවීම: රු. මිලියන 4
7 දැරිය හැකි පිවිතුරු බලශක්තිය	විදුලිය ලබා ගැනීම සඳහා ප්‍රවේශයක් සහිත ජනගහනය **87%**	කුඩා ජල විදුලි, සූර්ය සහ සුළං විදුලි ව්‍යාපෘති ආදී පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ගණනාවක් සඳහා, අප විසින් අරමුදල් සම්පාදනය කරනු ලබයි. දැනට බැංකුව තුළ ක්‍රියාත්මක වෙමින් පවතින සූර්ය බලශක්ති ව්‍යාපෘති හේතුවෙන් ජාතික විදුලි බල පද්ධතියට මෙගාවොට් 1 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් ජනනය කිරීමට අපට හැකිවී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ පොසිල ඉන්ධන භාවිතය අඩුවී ඇත. • පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වලට අරමුදල් සැපයීම: රු. බිලියන 3.6 • සූර්ය බලශක්තියට පරිවර්ථනය කරන ලද ශාඛා: 27 • ජාතික විදුලි බල පද්ධතියට දායකත්වය: මෙගා වොට් 1
8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය	විරැකියා අනුපාතය **4.6%**	සාධාරණ හා හිතකාමී වැඩ පරිසරයක සේවකයින්ට නිපුණතා සංවර්ධනය කිරීම සඳහා ආකර්ෂණීය දිමනා සහ අවස්ථාවන් අපි ලබා දී ඇත. • සේවකයන් සඳහා මුළු ගෙවීම: රු. බිලියන 18.9 • උසස් වීම්: 174 • නව බඳවා ගැනීම: 1,622
9 කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්	සෑම විටම ප්‍රවාහන පහසුකම් සහිත මාර්ගවල සිට කිලෝ මීටර් 2 ක් ඇතුලත ජීවත්වන ග්‍රාමීය ජනගහනය **95.6%** සුළු පරිමාණ කර්මාන්ත වල වැකතු කල අගය **27%**	වඩා ගුණාත්මක ප්‍රවාහන පහසුකම් සහ වටිනා යටිතල පහසුකම් ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා රජයෙහි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සපයන ප්‍රධාන බැංකුවයි. • යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට ණය ලබාදීම: රු. බිලියන 139.3
10 අඩු අසමානතාවයන්	සමාජ ස්ථරයේ පහළම 40% හි ගෘහස්ථ වියදම් වර්ධන වේගය **7.8%** මධ්‍යස්ථ ආදායමට වඩා 50% ක් ආදායම අඩු ජනගහනය **13.5%**	අඩු පහසුකම් සහිත සහ අවදානයට යොමු නොවන ජන කොටස් වල මූල්‍ය ඇතුලත්කරණය සහ ඔවුන් නඟා සිටුවීම සඳහා විශේෂිත වූ ණය ප්‍රවාහයන් බැංකුව විසින් සම්පාදනය කර ඇත. • තරුණ ප්‍රජාව සඳහා ලබා දී ඇති ණය ප්‍රදානයන්: රු. මිලියන 193.0 • ජ්‍යේෂ්ඨ පුරවැසි තැන්පතු: රු. බිලියන 207.7 • අඩු පහසුකම් සහිත ප්‍රදේශ වල ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන: 112
11 තිරසර නගර සහ ප්‍රජාවන්	මුඩුක්කු හෝ ඉතා අවම පහසුකම් සහිත නිවාස වල ජීවත් වන ජනතාව **0.8%**	නාගරික ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය/ නිවාස ව්‍යාපෘති සඳහා බැංකුව විසින් එහි ආයතනික ඒකකයන් මඟින් අරමුදල් ලබාදෙයි. • නිවාස සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය දීම්: රු. බිලියන 338.8 • කැළි කසල මඟින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය: රු. බිලියන 2

තිරසාරත්වය පිළිබඳ වාර්තාව

තිරසාර සංවර්ධන අරමුණු සඳහා අපගේ කැපවීම

	ශ්‍රී ලංකාවේ පසුබිම		අපගේ දායකත්වය
12 වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය	ජාතික මට්ටමින් එක්රැස් නොකල තොරතුරු		කඩදාසි පරිභෝජනය අඩු කිරීම, ජලය හා බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා සමස්ථ බැංකුව විසින් සංවිධානාත්මක උත්සහයක් අනුගමනය කර ඇත. • ඩිජිටල් මුලපිරීම් ඔස්සේ ඉතිරි වූ කඩදාසි: A4 කඩදාසි මිලියන 7 කි • බලශක්ති උත්පාදනය තුළින් අඩුවූ හරිතාගාර වායු විමෝචනය ටොන් 756.8 ක් (CO_2 සමාන) • ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වගකීමෙන් යුතුව බැහැර කිරීම
13 දේශගුණික ක්‍රියාකාරකම්	ජාතික දත්ත නොමැත		බැංකුව විසින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ණය ලබාදීම තුළින් රටේ කාබන් පියසටහන් අඩු කිරීම සඳහා දායක වේ. බැංකුවේ කාබන් පියසටහන් අඩු කිරීම සඳහා දැනටම ප්‍රයත්නයන් සිදුකර ඇත. • පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වලට ණය ලබා දීම: රු. බිලියන 3.6
14 ජලය තුළ ජීවය	ජාතික දත්ත නොමැත		හරිත පාසිකුඩා සමාජ සත්කාරක ව්‍යාපෘතිය සමුද්‍ර පරිසර ආරක්ෂක අධිකාරිය සමඟ ඒකාබද්ධව ආරම්භ කරන ලදී.
15 ගොඩබිම මත ජීවය	ජාතික දත්ත නොමැත		• දකුණු පළාතේ ක්‍රියාත්මක වන හරිත ජාල ව්‍යාපෘතිය • කළු ගඟ අවට ගංවතුර අවම කිරීම සඳහා කුඹුක් අරණ ව්‍යාපෘතිය නිවුන් සහෝදර ගස් ව්‍යාපෘතිය - එක් එක් නව උපත් සඳහා ගසක් ලබා දීම වයඹ පළාත තුළ ආරම්භ කරන ලදී • මෙම ව්‍යාපෘති යටතේ රෝපණය කළ ගස් සංඛ්‍යාව 12,634 කි
16 සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන	මිනිමරුම් සංඛ්‍යාව ජනගහනයේ 100,000 කට **2.5**	භෞතික/ මානසික හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට යටත් ජනගහනය ජනගහනයෙන් **62.6**	පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතනයක් ලෙස මහජන යහපත සුරැකීම හා මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය පවත්වාගෙන යාම සඳහා අපට වගකීමක් ඇත. බැංකු මෙහෙයුම් සිදුකරනු ලබන්නේ ශක්තිමත් පාලන හා අවදානම් කළමනාකරණ රාමුවක් තුළ නියාමන අනුකූලතාවයන් හා ගෝලීය යහ පුරුදු භාවිතයන්ට අනුකූල වීම මඟිනි. ප්‍රතිපත්ති: විසිල් බ්ලෝවින් ප්‍රතිපත්තිය, දූෂණ සහ අල්ලස් පිටුදැකීමේ ප්‍රතිපත්ති
17 තිරසර සංවර්ධනය සඳහා හවුල්කරණයන්	ජාතික දත්ත නොමැත		බොහෝ රජයේ ආයතන සමඟ ගැඹුරු සම්බන්ධතා අපි වර්ධනය කර තිබෙන අතර අරමුදල් සැපයුම්කරුවන් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ ද පොදු අරමුණු සහ අනෝන්‍ය වටිනාකම් නිර්මාණය කිරීම සඳහා අපි සමීපව වැඩකරයි. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ශ්‍රී ලංකා පෙළ විවිධත්ව සංගමය, ලංකා වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා රජය මින් කිහිපයකි.

ආර්ථිකමය දායකත්වය

ජාතියේ බැංකුකරු වශයෙන්, ලංකා බැංකුවේ වර්ධන ක්‍රමෝපායන්, ශ්‍රී ලංකා සංවර්ධන න්‍යාය පත්‍රයේ ක්‍රමෝපායන්, සමඟ ඉතා සමීපව බැඳී ඇති අතර බැංකුව රටේ සමාජ ආර්ථික සංවර්ධනයෙහි වර්ධන සහකරු ද වේ.



ආර්ථිකමය දායකත්වය

අපගේ වෙළඳපොළ තත්ත්වය



ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ විශාලතම වත්කම් පදනම, තැන්පතු පදනම සහ ණය හා අත්තිකාරම් හි වෙළඳපොළ නායකත්වය සහ රටේ විශාලතම ලාභ උත්පාදක තනි ආයතනය ලෙස අවිවාදාත්මකව සිය අනසක පතුරවා ඇත.

රාජ්‍ය ආදායමට සැලකිය යුතු දායකත්වයක්

ආදායම මත බදු, මූල්‍ය වටිනාකම් එකතු කිරීම මත බදු, ජාතිය ගොඩනැංවීමේ බදු, ණය ආපසු ගෙවීමේ බදු (DRL) මෙන්ම ලාභාංශ ගෙවීම් මගින් බැංකුව රටේ ජාතික ආදායමට විශාල දායකත්වයක් සපයන්නකු වේ. 2018 වර්ෂයේදී රජයට දක්වන ලද දායකත්වය රු. බිලියන 24.2 කි.

රජයට දක්වන ලද දායකත්වය



මහා පරිමාණයේ ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය දෙන්නා ලෙස

ශ්‍රී ලංකා රජයට ප්‍රධාන ණය දෙන්නකු ලෙස රජය යටතේ පවතින දිගු කලීන ප්‍රතිගෙවුම් කාලයක් සහිත මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා දිගින් දිගටම අප අපගේ මූල්‍ය දායකත්වය සපයනු ලබයි.

මාර්ග සංවර්ධනය සඳහා
රු. බිලියන 31.7 ක්

විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා
රු. බිලියන 3.6 ක්

ජල උත්පාදන ව්‍යාපෘති සඳහා
රු. බිලියන 4.7 ක්

ව්‍යවසායකත්ව සංවර්ධනය

බැංකුව ක්ෂුද්‍ර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ප්‍රධාන ණය යෝජනා ක්‍රම 20 ක් හරහා සිය දායකත්වය සපයන මූල්‍ය ආයතනයක් වේ. 2018 ලංකා බැංකුව රු. බිලියන 64.4 ණය ප්‍රමාණයක් ක්ෂුද්‍ර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ප්‍රදානය කොට ඇත. උතුරු හා නැගෙනහිර පළාත් සඳහා ණය ප්‍රදානය රු. මිලියන 5,268.1 කි.

වර්ෂය තුළ දී නව කුඩා හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම සඳහා දායකත්වය

- **ඇරඹුම**
- **හරිත ණය**
- **කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සබඳතා**

රු. බිලියන 13.6 ක් චෙන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය හරහා උපයෝජනය කොට ඇත.

රු. මිලියන 189.0 BoC මිතුරු හරහා ක්ෂුද්‍ර ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා උපයෝජනය කොට ඇත.

මූල්‍ය ඇතුලත්කරණය ප්‍රවර්ධනය කිරීම

ලංකා බැංකුව බොහෝ විට ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපනය වන ප්‍රථම බැංකුව ලෙස පෙරමුණගෙන කටයුතු කරන අතර ඒ හරහා රට පුරා මූල්‍ය සබඳතා මෙහෙයවීමට කටයුතු සලස්වයි. 2018 දෙසැම්බර් මස අවසාන වන විට ශ්‍රී ලංකාව තුළ සෘජු ගනුදෙනුකාර සබඳතා මධ්‍යස්ථාන 1,721 දක්වා තම ජාලය ව්‍යාප්ත කොට සිය මෙහෙයුම් කටයුතු සිදුකරයි.

ශාඛා 577 **බස්නාහිර පළාතේන් පිටත පිහිටි ශාඛා 442**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක මධ්‍යස්ථාන 15 **පාසැල් ඉතුරුම් ඒකක 1,373**

ආර්ථිකමය දායකත්වය

රජයේ සුරැකුම්පත් වල ආයෝජන

රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුව රජයේ සුරැකුම්පත් වල ආයෝජන සිදුකරයි. 2018 රු. බිලියන 551.5 ක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇති අතර එය මුළු වත්කම් වලින් 24% කි.

රජයේ සුරැකුම්පත් වල ආයෝජන



ශ්‍රී ලාංකික ජාත්‍යන්තර බැංකුව

ශ්‍රී ලංකාවේ ප්‍රථම දේශීය ජාත්‍යන්තර බැංකුව ලෙස අප ස්ථාපනය වෙමින් අපගේ මෙහෙයුම් මධ්‍යස්ථාන කලාපීය ආර්ථිකයන් දක්වා ව්‍යාප්ත වෙමින් ද අපගේ ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කරමින් සහ ගෝලීය ව්‍යාපාරික ප්‍රජාවන්ගේ ප්‍රමුඛතම මූල්‍ය සහකරු ලෙස පත් වී ඇත.

ජාත්‍යන්තර ශාඛා 03

නියෝජිත සබඳතා 859

රු. බිලියන 580.1 ක ප්‍රේෂණ සඳහා පහසුකම් සැපයීම

ඇ. ඩො. මිලියන 1,714.8 ජාත්‍යන්තර වෙළඳපොළින් ණය ලෙස ලබා ගැනීම

එකතු කළ අගය මත වාර්තාව

බැංකුවේ අගය එක් කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරයෙහි විශ්ලේෂණය පහතින් දැක්වේ

	2018	2017	වෙනස
	රු. මිලියන	රු. මිලියන	%
එකතු කළ අගය			
බැංකු සේවා කටයුතු සැපයීමෙන් ලද ආදායම	217,238	185,427	17
සේවා සැපයීම් පිරිවැය	(125,760)	(102,502)	23
බැංකු සේවා තුළින් එකතු කළ අගය	**91,478**	**82,925**	**10**
බැංකු සේවා නොවන ආදායම	3,894	3,784	3
ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණය	(15,041)	(9,341)	61
අගය එකතු කිරීම	**80,331**	**77,368**	**4**
අගය විසර්ජනය			
සේවකයන්ට			
වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ	18,875	16,996	11
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	4,846	12,346	(61)
ආදායම් බදු	9,724	8,929	9
මූල්‍ය සේවා සඳහා බදු	9,588	7,249	32
	24,158	28,524	(15)
ප්‍රජාව වෙත			
සමාජ වගකීම් ව්‍යාපෘති	108	128	(16)
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම් උදෙසා පොළිය	12,512	15,714	(20)
නිකුත් කළ ණයකර සඳහා පොළිය	5,154	5,014	3
	17,667	20,728	(15)
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	14,632	8,966	63
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	2,200	1,925	14
විලම්බිත බදු	2,690	101	2,556
	19,523	10,992	78
	80,331	**77,368**	**4**

එකතු කළ ආර්ථික අගය

එකතු කළ ආර්ථික අගය මඟින් ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. සංසන්දනාත්මක අවදානමේදී කොටස්හිමියන්ගේ අවම ප්‍රතිලාභය ඉක්ම වූ හෝ අඩු වූ ඉපැයුම් අගය සඳහා ඇස්තමේන්තුවක් මෙමඟින් ලබා දේ.

	2018	2017	වෙනස
	රු. මිලියන	රු. මිලියන	%
ආයෝජිත ප්‍රාග්ධනය			
කොටස්හිමියන්ගේ අරමුදලේ සාමාන්‍ය	116,299	102,002	14
එකතු කළා: ණය අලාභයන් සහ හානිකරණයන් සඳහා ප්‍රතිපාදනයන්හි එකතුව	81,852	57,179	43
	198,150	**159,181**	**24**
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ			
බදු පසු ලාභය	19,479	21,312	(9)
එකතු කළා: ණය අලාභයන් සඳහා ප්‍රතිපාදන සහ අනෙකුත් අලාභයන්	15,041	9,341	61
අඩු කළා: ණය කපාහැරීම්	(35)	(1,181)	(97)
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	34,485	29,472	17
ආයෝජිත ප්‍රාග්ධනයෙහි ආවස්ථික පිරිවැය*	(18,052)	(16,003)	13
එකතු කළ ආර්ථික අගය	**16,433**	**13,469**	**22**

*මාස 12 බර තැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය මත පදනම්ව ගණනය කරයි 2018 - 9.11% (2017 - 10.05%).

ගනුදෙනුකාර කේන්ද්‍රීයභාවය අපගේ සේවා වපසරිය තුළ මූලික හරය වේ. පුද්ගලානුබද්ධ වූ සේවා අපටම අනන්‍ය වූ විශේෂිත අංගයකි.

අපගේ ගනුදෙනුකාර සබඳතා නිරතුරුවම නවීකරණය කරමින්, සෑම විටම ගනුදෙනුකරුවන් සඳහා අනන්‍ය වූ බැංකු සේවා අත්දැකීමක් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය වූ නව දැනුම සහ උද්‍යෝගය සමඟින් අප කණ්ඩායම ඒ සඳහා නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.

ලේඛාධිකරණ

තහවුරු කරගනිමින්

ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය

සභාපතිතුමාගේ පණිවිඩය

ශක්තිමත් යහපාලන භාවිතයන් උපායමාර්ගික අභිලාෂයන් ඉටු කර ගැනීම ශක්තිමත් කරන අතර, අපගේ පාරිභෝගිකයින්, සේවා නියුක්තිකයින්, කොටස්කරුවන් සහ රටේ ආර්ථිකය සඳහා දිගු කාලීන අගයන් නිර්මාණය කිරීමෙහිලා මූලික භූමිකාවන් ඉටු කරනු ලැබේ. එම නිසා බැංකුවේ සෑම පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලියකටම යහපාලන මූලධර්ම අනුගත කර ඇති බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සම්පූර්ණයෙන්ම කැපවී ඇත.

විවිධත්වයෙන් යුතු දක්ෂතාවයන්, දෘෂ්ටිකෝණයන් හා කර්මාන්තය පිළිබඳ පළපුරුද්දකින් සම්මිශ්‍ර වූ අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත නව අධ්‍යක්ෂ මණ්ඩලයක් 2019 පෙබරවාරි මස පත්කරන ලදී. (පිටු 25 සිට 27 හි ඇති අධ්‍යක්ෂ මණ්ඩල විස්තර බලන්න) අධ්‍යක්ෂ මණ්ඩලය අබණ්ඩව රැස්වන අතර, 2018 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 23 ක් පවත්වා ඇත. උපායමාර්ග සම්පාදනය, තොරතුරු තාක්ෂණය හා සයිබර් ආරක්ෂණය, අවදානම් කළමනාකරණය හා ණය කළඹෙහි ගුණාත්මකතාවය සංරක්ෂණය කිරීම අවධානය යොමු කළ ප්‍රධාන අංශ වලට ඇතුළත් වේ. බැංකුව තුළ තාක්ෂණය හා ඩිජිටල්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ එහි වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමේ අරමුණින් වසර තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකමිටුව ස්ථාපිත කරන ලදී. නව යහපාලන භාවිතාවන්, මෙහෙයුම් ක්ෂේත්‍රයේ හා නියාමන පරිසරය තුළ සිදුවූ වෙනස්කම් නිසි සැලකිල්ලට ගනිමින් ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ප්‍රතිශෝධනය කරන ලදී.

දේශපාලන ක්ෂේත්‍රය තුළ ඇතිවූ වෙනස්කම් සමඟ නව පත්වීම් කරන තෙක් අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැතිව පවා බැංකුවට සුමට ලෙස ක්‍රියා කිරීමට හැකිවූයේ බැංකුව තුළ අනුමත ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සමඟ ස්ථාපනය කරන ලද ස්ථාවර යහපාලන භාවිතාවන් නිසාය. බැංකු කළමනාකරණයට එහි මෙහෙයුම් කෙරෙහි අවම ඍණාත්මක බලපෑම් ඇතිව ක්‍රියා කිරීමට මෙමඟින් මඟපෙන්වා ඇත.

යහපාලන භාවිතයට ඇති අපගේ ප්‍රවේශය සහ අධ්‍යක්ෂක මණ්ඩලය වැඩකටයුතු කරගෙන යන්නේ කෙසේද යන්න මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ බැංකු පනතේ 2007 අංක 11 දරණ උපදේශ යටතේ ආයතනික යහපාලන උපදෙස් සමඟ අනුකූල වීමේ තත්ත්වයන්ද මෙමඟින් පිළිඹිබු කෙරේ. 2017 දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ යහපත් භාවිතා සඳහා වන සංශෝධිත සංග්‍රහය ස්වේච්ඡාවෙන්ම බැංකුවද අනුගමනය කර ඇත.

අධ්‍යක්ෂවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් හා සේවක මණ්ඩලය සඳහා වෙනමම ආචාර ධර්ම සංග්‍රහයක් තිබෙන අතර වාර්ෂිකව ඒවා සමඟ අනුකූල වීමේ තහවුරු ලබාගැනේ. තවද, ලංකා බැංකුවේ ප්‍රධාන කළමනාකාරණ පුද්ගලයන් (KMP) විසින් බැංකු ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් කොන්දේසි කිසියම් හෝ ලෙස ප්‍රමාණාත්මකව කඩ කර ඇති බවක් මාගේ දැනීමේ හැටියට වාර්තා නොවී ඇති බවට සහතික වෙමි.

රොනල්ඩ් සී පෙරේරා, ජනාධිපති නීතීඥ
සභාපති

2019 අප්‍රේල් 3 දින දීය.

2018 වසරේ වැදගත් කරුණු

- අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම්
- බැංකුවේ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සහ තොරතුරු තාක්ෂණ පිළිවෙත් අධීක්ෂණය සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් වන තොරතුරු හා තාක්ෂණික උපකමිටුවක් පිහිටුවීම
- අල්ලස් සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
- 2019 - 2021 ඉදිරි වසර තුනක කාලය සඳහා ආයතනික සැලැස්ම විමර්ශණයට ලක්කර සමාලෝචනය කිරීම

ආයතනික යහපාලනය

යහපාලන රාමුව

බැංකුවේ විස්තීර්ණ යහපාලන රාමුව ශක්තිමත් යහපාලන භාවිතාවන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රමවේදයන් නියම කරන අතර, සංවිධානය පුරා උපායමාර්ගික තීරණ ගැනීම සඳහා පැහැදිලි උපදෙස් ලබාදෙනු ලැබේ. බැංකු කර්මාන්තයේ ප්‍රමුඛතාව මුළු පද්ධතියට බලපෑම් කිරීමේ වැදගත්කම සහ රාජ්‍ය හිමිකාරිත්වය සැළකිල්ලට ගැනීමේදී, බැංකුවේ විවිධ පාර්ශ්වකරුවන් ඇතුළු කණ්ඩායම්වල බලාපොරොත්තු කළමනාකරණය කිරීම සඳහා වූ දිගු කාලීන හා කෙටි කාලීන ක්‍රමෝපායන් සහිතව යහපාලන රාමුව නිර්මාණය කර ඇත. හුදු අනුකූල වීමෙන් එහා යන ලද වඩා විශිෂ්ට විනිවිද භාවය, වගකීම, ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ ක්‍රියාකාරී නායකත්වය සඳහා මග පෙන්වන ශක්තියක් ලෙස ආයතනික යහපාලනය සැලකිය හැකි බව බැංකුව අදහස් කරයි. බැංකුවේ යහපාලන රාමුව පදනම් වී ඇති ප්‍රධාන බාහිර හා අභ්‍යන්තර මෙහෙයුම් පථය මේ සමඟ ඉදිරිපත් කර ඇත.

යහපාලන ව්‍යූහය

බහුවිධ මට්ටම්වල යහපාලන කමිටු, විශේෂිත භූමිකා, වගකීම් සහ පැහැදිලි වාර්තාකරණය රාමු මඟින් නිශ්චිත ලෙස අර්ථ ගන්වා ඇති යහපාලන ව්‍යූහය, වගවීම හා නිසි පැවැත්ම සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළම පාලන ව්‍යූහය ලෙස සහ බැංකුවේ ආයතනික යහපාලනයේ භාරකරු වශයෙන් කටයුතු කරයි. මහා කළමනාකාරතුමන්ගේ නායකත්වයෙන් යුතු කළමනාකරණ කණ්ඩායමකට බැංකුවේ විදිනෙදා කළමනාකරණය පිළිබඳ බලය පවරා තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපකමිටු පහකට විශේෂිත වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති අතර, මූලෝපාය සකස් කිරීම, ප්‍රතිපත්ති රාමු සම්පාදනය හා මාර්ගෝපදේශ සහ ඉදිරි අනාගතයේ සැලසුම් සහිත න්‍යාය පත්‍රයේ අංග ඇතුලත්වූ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන්වූ කරුණු කෙරෙහි සෑහෙන කාලයක් හා එසේ කැපකිරීමට හැකිවන ලෙස, ඉඩ ලබාදීම මෙයින් අදහස් වේ.

(බැංකුවේ යහපාලන ව්‍යූහය සඳහා 73 වන පිටුව බලන්න)

සමාගම් ලේකම්

ජානකී සේනානායක සිරිවර්ධන මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ ලංකා බැංකුවේ ලේකම්, නීතීඥවරියක වන අතර, ඇය 2005 වසරේදී මෙම තනතුරට පත් කරන ලදී. ඇයගේ අත්දැකීම්/ සුදුසුකම් බැංකු පනතට හා අදාළ සංශෝධන සමඟ අනුකූල වේ. සියලුම අධ්‍යක්ෂකවරුන්ට ලේකම්තුමියගේ සහය ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමට හැකිවන අතර, ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට එහි වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් වූ මගපෙන්වීම ලබාදීමත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා කර්මාන්තය තුළ ඇති මනා පරිචයන්ට අනුකූලව සියලුම අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කරන බවටත් සහතික කෙරේ. නව මනා පරිචයන්, නියාමන වෙනස්වීම් සහ පාර්ශ්වකරුවන්ගේ යහපත සම්බන්ධයෙන් වූ බැංකුවේ යහපාලන රාමුව ලේකම් විසින් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

නියාමන රෙගුලාසි

බාහිර

- 1938 අංක 53 දරණ ලංකා බැංකු ප්‍රඥප්තිය (''ප්‍රඥප්තිය'' ලෙස සඳහන් කෙරේ) සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන
- බලපත්‍ර ලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියාමනයන්
- රජය විසින් නිකුත් කළ බැංකුවට අදාල වන්නාවූ චක්‍රලේඛ
- ශ්‍රී ලංකා කොටස් වෙළඳපොළේ අඛණ්ඩව ලැයිස්තු ගත කිරීමේ අවශ්‍යතාවයන්
- 2017 දෙසැම්බර් මස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය

අභ්‍යන්තර

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- උපකමිටු ප්‍රඥප්තිය
- ආචාර ධර්ම සංග්‍රහය
- විස්තීර්ණ ප්‍රතිපත්ති හා පටිපාටීන්
- පරිපාලිත කළමනාකරණ ප්‍රඥප්තිය
- පාරිභෝගික ප්‍රඥප්තිය

පාලන ව්‍යූහය



අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු

සෑම උපකමිටුවක්ම මෙහෙයවනු ලබන්නේ කමිටු ප්‍රඥප්තීන්හි සටහන්ව ඇති පරිදි නිශ්චිතව අර්ථගන්වා ඇති ක්‍රියා පටිපාටීන් මෙහෙවර පිළිපදිමිනි. කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා වූ වගකීම කමිටු සභාපතිවරුන් වෙත පැවරේ. අදාල කටයුතු සම්බන්ධයෙන් ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා වාර්තා කිරීම කරනු ලැබේ. කමිටුවල සංයුතිය නිගමනය කරනවිට එහි සාමාජිකයින්ගේ දක්ෂතා, කර්මාන්තය පිළිබඳ විශේෂඥතාවය සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සැලකිල්ලට යොමුවේ.

විධායක කමිටු

මහා කළමනාකරුගේ නායකත්වයෙන් යුතු ආයතනික කළමනාකරණ කණ්ඩායමකට විදිනෙදා මෙහෙයුම් සම්බන්ධ කළමනාකරණය පවරා තිබේ. විශේෂිත වගකීම් හා නිශ්චිත ලෙස අර්ථ ගන්වා ඇති මෙහෙවර වලට අනුකූලව වෙන් වෙන් වශයෙන් වූ විධායක මට්ටමේ කමිටු ස්ථාපිත කර තිබේ.

ආයතනික යහපාලනය

උප කමිටු හා විධායක කමිටු	මෙහෙවර
අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු	
විගණන කමිටුව	අභ්‍යන්තර පාලනක්‍රම, අභ්‍යන්තර හා බාහිර විගණන ඇතුලත් වූ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	ණය, වෙළඳපොළ, මෙහෙයුම්, ද්‍රවශීලතා, සයිබර්/ තොරතුරු තාක්ෂණය සහ උපායමාර්ගික අවදානම් ඇතුළත් අවදානම් කළමනාකරණය සම්බන්ධිත සියලුම ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම හා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව සහ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාව සහතික වීම.
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	පාරිශ්‍රමික ප්‍රතිපත්තිය නිගමනය කිරීම, මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ (KMP) අරමුණු හා කාර්යසාධනය සැකසීම සහ ඇගැයීම බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය නිගමනය කිරීම සහ වගකීම අධීක්ෂණය කිරීම.
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පුද්ගලයින් තේරීමේ/ පත් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ගේ යෝග්‍යතාව ඇගැයීම, ආචාර ධර්ම සංයුතිය සමාලෝචනය කිරීම හා ආයතනික යහපාලන භාවිතා වැඩි දියුණු කිරීම.
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු	තොරතුරු තාක්ෂණය සම්බන්ධිත නිෂ්පාදන හා සේවා ප්‍රතිපත්ති භාවිත සහ යටිතල පහසුකම් පරීක්ෂා කිරීම සඳහා වූ බැංකුවේ ක්‍රියා පිලිවෙල අධීක්ෂණය කිරීම.
විධායක කමිටු	
වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)	අරමුදල් සපයාගැනීමේ උපායමාර්ගය, ද්‍රවශීලතා කළමනාකරණය, වත්කම් නොගැලපීම් මෙන්ම වෙළඳපොළ අවදානම් අනාවරණය, ද්‍රවශීලතා අවදානම් සහ පොළී අනුපාත අවදානම් කළමනාකරණය මූලික අරමුණු වශයෙන් සමාලෝචනය කිරීම හා බැංකුවේ විවිධ මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම.
ශාඛා අංශ ණය කමිටුව	ඉහළ ශුද්ධ වත්කම් ඇති පාරිභෝගිකයින්ගේ ණය ඉල්ලීම් ඉටු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම මඟින් පාරිභෝගිකයින්ට ගුණාත්මක හා ඉක්මන් සේවයක් ලබා දීම, ණය පරිපාලනය අනුකූලනය කිරීම හා ණය අවදානම් අවම කිරීම.
ව්‍යාපාරික අවිච්චින්නතා සම්බන්ධීකරණ කමිටුව (BCCC)	බැංකුවේ ව්‍යාපාරික අවිච්චින්නතා කළමනාකරණ (BCCC) ක්‍රියාවලියට අදාළ සියලු කරුණු කළමනාකරණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
ව්‍යාපාරික අවිච්චින්නතා ක්‍රියාත්මක කිරීම් කමිටුව (BCIC)	බැංකුවේ ව්‍යාපාරික අවිච්චින්නතා ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
ව්‍යාපාරික අවිච්චින්නතා කළමනාකරණ විකල්ප කමිටුව (BCMAC)	යම් කිසි ආපදාවක් සිදුවුවාට පසු ඉක්මණින්ම වෙනත් ව්‍යාපාරික අවිච්චින්නතා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන තෙක් තාවකාලිකව සේවය සපයනු ලැබේ.
ව්‍යාජ චෙක්පත් හා වංචා පිළිබඳ කටයුතු කිරීමේ කමිටුව.	ශේෂයන් අයකර ගැනීමේ ඇති සියලුම හැකියාවන් සළකා බැලීමෙන් පසුව ව්‍යාජ ලෙස සකස් කළ චෙක්පත් සහ වංචා නිසා ඇතිවූ අයකර ගත නොහැකි ශේෂයන් කපා හැරීම සඳහා අදාළ බලධාරීන්ට අවශ්‍ය නිර්දේශ ලබා දීම.
ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව (CISC)	තොරතුරු ආරක්ෂණ මුල්පිරීම් සඳහා උපදෙස් හා සහයෝගය ලබාදේ. තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (ISP) තුළ විශේෂිතව සඳහන් කර ඇති ක්‍රියාවලිය හා ක්‍රියා පටිපාටීන් භාවිතය සහතික කිරීම කමිටුවෙන් අපේක්ෂා කෙරෙන අතර, තොරතුරු ආරක්ෂණ සැලසුම් සමාලෝචනය කිරීමත්, සංශෝධන කිරීමත්, ආරක්ෂණ උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම සහ බැංකුවේ තොරතුරු ආරක්ෂණය තහවුරු කිරීම.
ආයතනික කළමනාකරණ කමිටුව	බැංකුව තුළ ඇති ඉහළම මට්ටමේ කළමනාකරණ කමිටුව වන්නේ ආයතනික කළමනාකරණ කමිටුවයි. බැංකුවේ අනෙකුත් කළමනාකරණ කමිටුවල විෂය පථයට අයත් නොවන වැදගත් තීරණ ගැනීම කමිටුවේ සමස්ථ අරමුණ වන අතර උපායමාර්ග සම්පාදනය කිරීමේ හා අනුගතවීම් අධීක්ෂණය කිරීමේ අරමුණින් බැංකුවේ සමස්ත කාර්යසාධනය නිරතුරුව ඇගයීම කමිටුව විසින් සිදු කරයි.
ආයතනික උපායමාර්ග සමාලෝචන කමිටුව	සැළසුම් කිරීමේ ක්‍රියාවලිය, අනුකූල කිරීම, බැංකුවේ ආයතනික උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ කිරීමේදී කළමනාකාරිත්වයට සහාය වීම කමිටුවේ අරමුණ වේ.
ණය කමිටුව	ණය පහසුකම් ප්‍රදානය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා පටිපාටීන් සම්පාදනය, සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීමත් සියලු ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වනබව සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම සිදුකරයි. කළමනාකාරිත්වය විසින් එහි විමධ්‍යගත බලතල සීමා යටතේ ඉදිරිපත් කරනු ලබන ණය යෝජනා අනුමත කිරීමට/ ප්‍රතික්ෂේප කිරීමට හෝ අවහිර කිරීමට හෝ අදාළ වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට කමිටුවට බලය ඇත. බැංකුව මැනවින් විවිධාංගීකරණය කළ යහපත් ණය කළඹක් රඳවාගෙන සිටින බව තහවුරු කිරීමට ණය කළඹ නිරාවරණ සහ සංකේන්ද්‍රන අවදානම අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමද කමිටුව කරනු ලැබේ. අක්‍රීය ණය පිළිබඳව ප්‍රමාණවත් පිළියම් යොදවන බවට කමිටුව තවදුරටත් අධීක්ෂණය කරයි.

උප කමිටු හා විධායක කමිටු	මෙහෙවර
විධායක කමිටු	
ආපදා තක්සේරු සහ ප්‍රතිසංස්කරණ කමිටුව (DARC)	බැංකු දේපළ වලට වූ අලාභහානී තක්සේරු කිරීම හා ප්‍රතිසංස්කරණය.
මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව (HRPC)	මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධිත ප්‍රතිපත්ති හා පටිපාටීන් සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම මෙන්ම අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමද කමිටුව කරනු ලැබේ. පත් කිරීම්, උසස් කිරීම්, ප්‍රදානයන් සහ වන්දි, කාර්මික සම්බන්ධතා සහ සේවය අවසන් කිරීම ආදී මානව සම්පත් ක්‍රියා සම්බන්ධයෙන් වූ යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටද/ නිර්දේශ ඉදරිපත් කිරීමටද කමිටුවට බලය තිබේ.
අක්‍රිය වත්කම් කමිටුව	ලංකා බැංකු ප්‍රඥප්තිය, ණය අයකර ගැනීමේ පනත සහ කාර්යාලීය උපදෙස් චක්‍රලේඛ වල සඳහන්ව ඇති නීති රීති අනුව බැංකුවට පවරා ගැණුනු දේපළ බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් කළමනාකරණයට සහාය වීම හා අධීක්ෂණය කිරීම
අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මක ක්‍රියාවලි මෙහෙයුම් කමිටුව	මෙම කමිටුව බැංකුව පුරා ස්ථාවර අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය සංවර්ධනය කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් සඳහා වූ වගකීම දරනු ලබන ප්‍රධාන කළමනාකරණ කමිටුව වන අතර, නියාමන අනුකූලතාවයට අමතරව අවදානම් තක්සේරු කිරීම, ගණනය කිරීම හා අධීක්ෂණය කිරීම කරනු ලැබේ.
ආයෝජන කමිටුව	පරිපාලිතයන්හි ප්‍රාග්ධන ආයෝජනය හා රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන හැර බැංකුවේ ආයෝජන ක්‍රියාකාරකම් හා බැඳුනු ව්‍යවස්ථාපිත යුතුකම් හා අධීක්ෂණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම කමිටුවේ මූලික අරමුණ වේ. ප්‍රමාණාත්මක මට්ටමින් ප්‍රතිලාභ ලබාදීම පවත්වාගෙන යන අතර, ප්‍රධාන වශයෙන් සමස්ථ ආයෝජන වල සුරක්ෂිතතාව සහතික කිරීමද කමිටුවෙන් අදහස් වේ.
රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා වූ කමිටුව.	ව්‍යවස්ථාපිත යුතුකම් ඉටු කිරීමෙහිලා කළමනාකරණයට සහාය වීම කමිටුවේ මූලික අරමුණ වන අතර, රජයේ සුරැකුම්පත්වල ආයෝජන කටයුතු සම්බන්ධයෙන් වූ අධීක්ෂණ වගකීම එයට පැවරේ.
තොරතුරු තාක්ෂණ නියමු කමිටුව	වාර්ෂික තොරතුරු තාක්ෂණ සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම, මූලපිරීම් ක්‍රියාත්මක කිරීම, කණ්ඩායම් ගොඩනංවා පිළිවෙත් හා ප්‍රගතිය අධීක්ෂණයට සහාය වීම. කමිටුව තොරතුරු තාක්ෂණ මෙහෙයුම් වලට අදාල ප්‍රතිපත්ති සමාලෝචනය කරන අතර, ස්වාධීන පිළිගත් ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කෙරේ. තවදුරටත් කමිටුව තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන්වල ප්‍රගතිය අධීක්ෂණය කරමින් හා පාලනය කරමින් ව්‍යාපෘති සම්බන්ධයෙන් අවශ්‍ය සහය හා අනෙකුත් සහය ලබාදෙනු ලැබේ.
අලෙවිකරණ කමිටුව	සුදුසු අලෙවිකරණ උපායමාර්ග සැලසුම් කිරීම සම්බන්ධයෙන් බැංකුවට උපායමාර්ගික උපදෙස් ලබාදීම. බැංකුව සහ එහි නිෂ්පාදන සේවා ස්ථානගත කිරීම, බැංකුවේ ආදායම උපරිම කිරීම සඳහා වෙළඳපොළේ ඇති අවස්ථාවන් හඳුනා ගැනීම, ඉතා උසස් නව්‍යකරණයන් සඳහා සාකච්ඡා පැවැත්වීම/ නව අලෙවිකරණ සංකල්ප, ආයතනික සමාජීය වගකීම පිළිබඳ වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ ආයතනික ප්‍රතිරූපය ගොඩනැංවීම සඳහා ඵලදායී සන්නිවේදන වේදිකාවක් නිර්මාණය කිරීම.
අක්‍රිය වත්කම් සමාලෝචන කමිටුව (NPAC)	අක්‍රිය වත්කම් පිළිබඳ කලින් කල සමාලෝචනය කරමින් බැංකුවේ අක්‍රිය වත්කම් අවම කිරීම සඳහා කළමනාකරණයට සහායවීම හා කමිටුවේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හෝ පවතින අක්‍රිය වත්කම් නැවත අයකර ගැනීම කඩිනම් කිරීම සඳහා සුදුසු නිර්දේශ කිරීම කමිටුවේ අරමුණ වේ.
මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව	බැංකුවේ මුළු මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්ය සඳහා වූ ප්‍රධාන කමිටුව මෙය වේ. ජ්‍යේෂ්ඨ කළමනාකරණයේ වගකීම වන්නේ අවදානම් කළමනාකරණ වැඩ සටහන් බල ගැන්වීම බව කමිටුවේ අදහස වේ. අවදානම් අවම කර ගන්නා අතර, බැංකුව සඳහා ඉහළම මෙහෙයුම් ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ අදහසින් මෙහෙයුම් අතර පවතිනා අවදානම් කළමණාකරණ ගැටළු විසඳමින් අවම අවදානම් මට්ටමක් පවත්වා ගැනීම් අරමුණ වේ .
ප්‍රතිලාභ හා ඇගයීම් ප්‍රතිපත්ති කමිටුව (RRPC)	අපේක්ෂිත මට්ටමින් එහා ගිය ආයතනයේ ඵලදායිතාව ඉහළ නැංවීම හා ආයතනයේ අභිවෘතිය සඳහා දායක වූ සේවා නියුක්තිකයන්ට පිළිගැනීමක් ලබා දීම සහ එවැනි සේවා නියුක්තිකයන්/ කණ්ඩායම් සඳහා ඔවුන්ගේ දායකවීම මනාසේ අගය කිරීම/ ප්‍රදානයන් ලබාදීම.
ශිෂ්‍යත්ව වැඩසටහන් තෝරා ගැනීමේ කමිටුව (සමාලෝචන කමිටුව)	බැංකුවට අවශ්‍ය හා උචිත විදේශීය පුහුණු වැඩ සටහන් තෝරා ගැනීම කමිටුවේ සමස්ථ අරමුණ වේ.
ශිෂ්‍යත්ව කමිටුව	උචිත විදේශීය පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ, වැඩ මුළු තේරීම සහ ඒ සඳහා උචිත සහභාගි වන්නන් යෝජනා කිරීම කමිටුවේ සමස්ථ අරමුණ වේ.
තිරසර පැවැත්ම පිළිබඳ කමිටුව	ව්‍යාපාරික තීරණ, ක්‍රියා පිළිවෙත් සහ මුල පිරීම් වලට තිරසාර පැවැත්ම පිළිබඳ සංකල්ප ඒකාබද්ධ කිරීමට සහාය වීම මඟින් ව්‍යාපාර කටයුතු පාරිසරික වශයෙන් වගකිවයුතු, සමාජීය වශයෙන් සාධාරණ, ආර්ථික වශයෙන් ස්ථාවරව මෙහෙයවීම මඟින් වගකිවයුතු ආයතනික පුරවැසියෙකු බවට පත්වීම, පාර්ශ්වකරුවන්ට වටිනාකම් ජනනය කිරීම සඳහා ආයතනය මඟින් තිරසාර මූලධර්ම ඇගැයීම, සංවර්ධනය, උසස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම කමිටුවේ අදහසයි.
තාක්ෂණික හා මෙහෙයුම් කමිටුව (TOC)	මෙහෙයුම් කටයුතු අඩපණ වීම මඟින් පැන නඟින පාඩු අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සහාය වීම.

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට විධායක නොවන අධ්‍යක්ෂවරුන් හය දෙනෙක් සිටිය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය බැංකු ප්‍රඥප්තිය හා එහි සංශෝධන වල ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියාමනයන්හි සඳහන්ව ඇති නිර්ණායක මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලයක ස්වාධීනත්වය තක්සේරු කරනු ලැබේ. රාජ්‍ය බැංකු අයත් වන අදාල අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන අතර, මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු වශයෙන් නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට අයෙකු පත් කෙරේ. අදාළ ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වය පෙන්නූ අය අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කරන අතර විවිධ දෘෂ්ඨිකෝණයන් ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන් සතු දැනුම කළමනාකාරිත්වයට ලබාදේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ඵලදායීත්වය ඉහළ නැංවීමෙන් හිතකර බලතුලනයක් මින් සහතික කෙරේ.

වර්තමානයේ අධ්‍යක්ෂවරුන් හතර දෙනෙක් පත් කර ඇති අතර, ඔවුන්ගේ වැඩි විස්තර පිටු 25 සිට 27 දක්වා ලබා දී ඇත. ඉතිරි අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියාවලිය දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් සමඟ තවමත් සිදුවෙමින් පවතී.

නිපුණතා හා ප්‍රවීණතාවය

පළපුරුද්ද හා දක්ෂතාවය අනුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ වේ. ඔවුන්ගේ අත්දැකීම් සහ දක්ෂතා සාමූහික ලෙස ගත් කළ ඵලදායි ලෙස වගකීම් ඉටු කිරීමට හැකියාව ලබාදෙන සමතුලිත වූ අත්දැකීම් වලින් හෙබි තීරණ ගැනීමේ පරිසරයක් ලබා දීම සඳහා උපකාරී වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ප්‍රමාණවත් මූල්‍ය නිපුණතාවයක් තිබේ. 2018 වර්ෂය තුළ වෘත්තීය ගණකාධිකාරී ආයතන වල සාමාජිකත්වයන් ඉසිලූ අධ්‍යක්ෂවරුන් විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ වෘත්තීය පළපුරුදුකම් වලින් මූල්‍ය කටයුතු පිළිබඳ නිපුනණත්වයක් තිබේ. ඔවුන්ගේ සවිස්තරාත්මක තොරතුරු පිටු 25 සිට 27 දක්වා දක්වා ඇත. 2018 වසරේ අධ්‍යක්ෂවරුන්ට පිළිබඳ විස්තර පිටු 79 සිට 85 දක්වා ඇතුලත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් වූ වගකීම් හා බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පැහැදිලිව සඳහන් කර ඇත. බැංකුවේ ඉදිරි ක්‍රමෝපායන් සැලසුම් කිරීම, ස්ථාවර යහපාලනයක් ස්ථාපිත කිරීම, අවදානම් කළමනාකරණය, නියාමන අනුකූලතාව, බැංකුවේ කීර්තිය ආරක්ෂා කිරීම සහතික කිරීම, බැංකුවේ මූල්‍ය කාර්යසාධනය හා තත්ත්වයන් පිළිබඳ තුලිත හා සාධාරණ තක්සේරුවක් ඉදිරිපත් කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙවරට ඇතුළත් වේ. උපායමාර්ගික අභිලාෂයන් මුදුන්පත් කර ගනිමින් හා වටිනාකම් ජනිත කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය අඛණ්ඩව සමාලෝචනය කිරීමත්, සංශෝධනය කිරීමත් කරනු ලැබේ.

සභාපතිතුමාගේ/ මහා කළමනාකරුගේ කාර්යභාරය

ප්‍රධාන විධායක නිලධාරීගේ (ලංකා බැංකුව තුළ මහා කළමනාකරු වශයෙන් සඳහන් කෙරේ) කාර්යභාරයන්, සභාපතිගේ කාර්යභාරයන් ගෙන් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත්තේ අධිකාරිය හා බලය පිළිබඳ සුදුසු සමතුලනයන් සහතික කිරීම සඳහායි. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පැහැදිලිව සඳහන් කර ඇති පරිදි සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වන මහා කළමනාකරු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් දරන්නේ නැත. සභාපතිගේ හා මහා කළමනාකරුගේ ප්‍රධාන කාර්යභාරය/ වගකීම් පහත දක්වා ඇත.



පත්වීම් සහ ඉවත්වයාම්

රජය සතු බැංකුවක් වශයෙන්, අධ්‍යක්ෂකවරුන් පත් කරනු ලබන්නේ රාජ්‍ය බැංකු කටයුතු භාරව සිටින අමාත්‍යවරයා විසින්ය. යෝග්‍යතාව හා සුදුසුකම් සඳහා අවශ්‍ය නිර්නායක සපුරන්නේ නම් ශ්‍රී ලංකා මහ බැංකුව එම පත්වීම් අනුමත කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන් ඉල්ලා අස්වීම් හා ඉවත් කිරීම් එම අමාත්‍යවරයාට දැනුම් දෙනු ලබන අතර ශ්‍රී ලංකා මහ බැංකුව හා කොළඹ කොටස් හුවමාරුවටද අධ්‍යක්ෂ මණ්ඩල වෙනස්වීම් නියමාකාර ලෙස දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මූලාරම්භය

ලංකා බැංකු පඥප්තිය, පාලන ව්‍යුහය, ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවයන්, අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු ප්‍රඥප්ති මෙන්ම අනෙකුත් අදාළ නීති ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති ඇතුළත් බැංකුවේ පාලනයට අදාල සියලුම තොරතුරු අධ්‍යක්ෂකවරුන් පත් කළ විගම ලබා දෙනු ලැබේ. තවද, බැංකුවේ ඉතිහාසය, ව්‍යාපාරික මාදිලිය, ආයතනයේ ව්‍යුහය, ව්‍යාපාරේ සුවිශේෂීතා සහ උපකාරක සේවා ආදී තොරතුරු පිළිබඳව විස්තර මහා කළමනාකරු විසින් සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් කරනු ලැබේ. බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් ප්‍රයෝගිකව දැනුවත් කිරීම සඳහා තනි තනිව රැස්වීම් හා දෙපාර්තමේන්තු අධීක්ෂණ පවත්වනු ලැබේ

තොරතුරු වලට ප්‍රවේශ වීම

කාර්යක්ෂමව ඔවුන්ගේ වගකීම් ඉටුකිරීම සඳහා සියලුම තොරතුරු සහ සහාය අධ්‍යක්ෂකවරුන්ට ලබාදෙනු ලැබේ. ස්වාධීන වෘත්තිය උපදෙස් ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථා වලදී ඒ සඳහා අධ්‍යක්ෂකවරුන්ට බැංකුවේ වියදමින් බාහිර වෘත්තීය සේවා ලබා ගැනීමටද අවස්ථාව ලබාදී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා යොමු කිරීමට විශේෂ විද්‍යුත් යෙදුම් පද්ධතියක් භාවිතා කරනු ලබන අතර අධ්‍යක්ෂකවරුන්ට රැස්වීම් සඳහා සූදානම් වීම පිණිස ප්‍රමාණවත් කාලයක් ලබාදීම සඳහා මෙම පද්ධතිය හරහා අදාළ තොරතුරු බෙදා හරිනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල තීරණ ගැනීම් සඳහා පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය ඕනෑම සම්පතක් ලබාදීමට කළමනාකරණ කණ්ඩායම සෑම විටම සූදානමින් සිටී.

2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු වූ කරුණු

ප්‍රතිපත්ති රාමු

- හඳුන්වාදුන් නව ප්‍රතිපත්ති
  - (1) ලාභාංශ ප්‍රතිපත්තිය.
  - (2) අල්ලස් සහ දූෂණ වලට විරෙහි ප්‍රතිපත්තිය
- සමාලෝචනය කළ හා යාවත්කාලීන කළ
  - (1) "විසිල් බ්ලෝවින්" ප්‍රතිපත්තිය
  - (2) අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශ වීමේ ප්‍රතිපත්තිය
  - (3) වත්කම් හා වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (4) අලෙවි ප්‍රතිපත්තිය
  - (5) ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ
  - (6) සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

තාක්ෂණය

- දත්ත මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකමිටුවක් ස්ථාපනය කිරීම

නියාමන යාවත් කාලීන කිරීම්

- කාර්යසාධනය හා මූල්‍ය ස්ථාවරත්වය සම්බන්ධව මූල්‍ය වාර්තා
- උපකමිටු වල නිර්දේශ හා විශේෂිත කරුණු ඉදිරිපත් කිරීම
- පරිපාලිත සමාගම් වල කාර්යසාධනය සමාලෝචනය කිරීම
- අනුකූලතා වාර්තා



උපායමාර්ග

- 2019 - 2021 සඳහා වූ බැංකුවේ ආයතනික සැලැස්ම සම්බන්ධයෙන් යෙදවුම් ලබා දීම සඳහා උපායමාර්ගික සැලසුම් කිරීමේ සැසිය (ආයතනයෙන් පරිභාහිර ස්ථානයක දී

අවදානම් කළමනාකරණය

- අවදානම් අභිරුචිය අනුමත කිරීම
- අවදානම් කළමනාකරණ රාමුව සමාලෝචනය කිරීම හා අනුමත කිරීම
- සයිබර් ආරක්ෂණය
- ණය වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම් හා බාසල් (III) නියාමනයන්ට අනුකූලවීම
- ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කිරීම
- දත්ත පුවරුව සමඟ අවදානම් වාර්තා

මූල්‍ය කරුණු

- 2019 වසර සඳහා වූ අයවැය
- 2018 වසර තුළ කාර්යසාධනය සමාලෝචනය
- ලාභාංශ අනුමත කිරීම්
- අරමුදල් සම්පාදනය හා ද්‍රවශීලතා සැලසුම්
- ප්‍රාග්ධන තත්ත්වය

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු

අධ්‍යක්ෂ මණ්ඩලය මාසයකට දෙවරක් පමණ රැස් වන අතර 2018 වසර තුළ 23 වතාවක් රැස්වීම් කැඳවන ලදී. රැස්වීම් න්‍යාය පත්‍ර, තොරතුරු බෙදාහැරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මෙහෙයවීම් හා වාර්තා පවත්වාගෙන යාම සිදු කරමින් සියලුම පටිපාටීන් අනුගමනය කරන බවට ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සහතික වේ. ආයතනික සැලසුම් කිරීම්, අවදානම් කළමනාකරණය, අනුකූල වීම හා යහපාලන කරුණු වැනි බැංකුවට අවදානම් සහිත ලෙස බලපාන කරුණු සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කිරීම් සහතික කිරීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

වසරේ ආරම්භය

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා උපකම්ටු රැස්වීම් සඳහා දින දර්ශන සකස් කර වාර්ෂික දින දර්ශනයක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලැබේ.

න්‍යාය පත්‍රය

- සභාපති විසින් පැවරූ බලය යටතේ, ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් න්‍යාය පත්‍රය සකස් කරයි.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡා කිරීම් සඳහා න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට නිදහස තිබේ.
- අවශ්‍ය වන පරිදි අභ්‍යන්තර/ බාහිර සංවර්ධනයන්ගෙන් පැන නඟින කරුණු න්‍යාය පත්‍රයට එකතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සම්පාදනය හා බෙදා හැරීම්

- අවම වශයෙන් රැස්වීමට දින හතකට පෙර සකස් කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාර්ගයක් හරහා අධ්‍යක්ෂවරුන්ට යවනු ලැබේ. සාකච්ඡා කිරීමට නියමිත කරුණු සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය වේ නම් අමතර පැහැදිලි කර ගැනීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම මෙයින් සහතික කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

- කාර්යසාධන යාවත්කාලීන කිරීම්, අනුකූලතා වාර්තා සහ උපකම්ටු වල නිර්දේශ වැනි නිශ්චිත ප්‍රමිතිගත කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට තිබේ.
- අවශ්‍ය වේ නම් අමතර පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ට ආරාධනය කරනු ලැබේ.

පශ්චාත් රැස්වීම්

- රැස්වීමේ දින සිට දින දහයක් තුළ, ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වාර්තා සකස් කර ආරක්ෂිත විද්‍යුත් මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අතර බෙදා දෙනු ලැබේ.
- රැස්වීම් පැවැත්වූ දිනට පසු දින, රැස්වීම් වාර්තාවේ කෙටුම්පත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායමට යවනු ලැබේ.
- ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී වාර්තා ස්ථිර කරනු ලැබේ.
- තවමත් ඉටු නොවූ කරුණු සම්බන්ධයෙන් පසු විපරම් කරනු ලැබේ.

2018 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය

දක්ෂතාවලින් හෙබි හා ගැඹුරු තීක්ෂණ බුද්ධියකින් යුතු අධ්‍යක්ෂ මණ්ඩලය, මෙහෙයුම් වටපිටාව තුළ මතුව එන අවදානම් හා අවස්ථා වලදී කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීම සඳහා බැංකුවට ශක්තිය ලබා දෙයි.

අධ්‍යක්ෂකයාගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
රොනල්ඩ් සී පෙරේරා මහතා **ජනාධිපති නීතිඥ** **සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ**	2015 ජනවාරි 28 - 2018 නොවැම්බර් 18 (2019 පෙබරවාරි 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදී)	• නීතිවේදී උපාධිය කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව • අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය (LLM) නෝර්තම්බ්‍රියා විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය • නීතිඥ (ජනාධිපති නීතිඥ)	1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ලංකා බැංකුව, සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම, සී/ස මිරේකා හෝම්ස් (පෞද්ගලික) සමාගම හා මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී හි සභාපති ලෙස සේවය කර ඇත. 2. අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ මෙන්ම ප්‍රාථමික අධිකරණයේදී පුළුල් අත්දැකීම් ඇති නීතිඥවරයෙකි. 3. සිවිල් හා අපරාධ නඩු කටයුතු මෙහෙයවීම්, වාණිජ හා ප්‍රවාහන කොන්ත්‍රාත් හා ගිවිසුම් කෙටුම්පත් කිරීම හා වාණිජ බේරුම් කිරීම පිළිබඳ පුළුල් අත්දැකීම් ඇත. 4. වාණිජ නීතිය, බැංකු නීතිය, කාර්මික නීතිය, අපහාස නඩු, තහනම් නියෝග, මැතිවරණ පෙත්සම්, සිවිල් අභියාචනා, සංශෝධනය ඉල්ලීම්, රිට් ආඥා ඉල්ලීම් සහ මූලික අයිතිවාසිකම් නඩු පිළිබඳ විශේෂඥතාවය.	1. සභාපති ලංකා බැංකුව (යූ.කේ.) සමාගම. 2. වැඩබලන සභාපති හොටෙල්ස් කලම්බු (1963) සමාගම.	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව. 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව.
එස් ආර් ආටිගල මහතා ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ	2016 අප්‍රේල් 27- 2018 නොවැම්බර් 25	• ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - වෝර්වික් විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය • භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.	1. අධ්‍යක්ෂ හා වැඩබලන සභාපති, ජාතික ඉතිරිකිරීමේ බැංකුව. 2. අධ්‍යක්ෂවරයෙකු ලෙස ලංකා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගමේ සේවය කර ඇත. 3. මුදල් අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 4. වාර්ෂික අයවැය සම්පාදනය සඳහා දායකත්වය හා චීනය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සඳහා වූ තාක්ෂණික කණ්ඩායම් සඳහා නායකත්වය 5. සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව (දැනට නියෝජ්‍ය අධිපති) 6. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් - මුදල් අමාත්‍යාංශය	1. කොමිෂන් සාමාජික ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.	1. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව. 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව. 3. සාමාජික, අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව.

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
රනෙල් ටී විජේසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2015 පෙබරවාරි 9 - 2018 ජූලි 31	• ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පිට්ස්බර්ග් විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය. • රාජ්‍යය හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විශ්ව විද්‍යාල උපාධි පාසලෙන් බහුජාතික සමාගම් සහ දේශපාලන අවදානම් පිළිබඳ අධ්‍යයනය කර ඇත. • ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික.	1. ස්වාධීන ජාත්‍යන්තර කළමනාකරණ උපදේශක, වසර 36 කට වැඩි පළපුරුද්ද සමඟ. 2. පසුගිය දශක දෙකහමාරකට වැඩි කාලයක් ශ්‍රී ලංකා රජය සඳහා උපදේශක භූමිකාව. 3. ආසියානු සංවර්ධන බැංකුව වැනි බහු පාර්ශ්වීය සංවර්ධන හවුල් කරුවන් වෙනුවෙන් විදේශීය රාජ්‍යයන්හි රාජ්‍ය අංශයන් සඳහා උපදේශක සේවා 4. අධ්‍යක්ෂ, ව්‍යාපාර සංවර්ධනය ජෝන් කීල්ස් හෝල්ඩින්ස් සමූහ ව්‍යාපාරය. 5. අධ්‍යක්ෂ, ජෝන් කීල්ස් හොටෙල්හි (පී එල් සී) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සභාපති 6. අධ්‍යක්ෂ, හොටෙල්ස් කලම්බු (1963) සමාගම. 7. කළමනාකරු, ඩෙලොයිට්, බහමාස්. 8. ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස්, වරලත් ගණකාධිකාරීවරුන්, ශ්‍රී ලංකා ආයතනයේ හවුල්කාරිත්වය සහ ප්‍රධානී, උපදේශක සහ මූල්‍ය උපදේශන සේවා. 9. සභාපති, සී/ස ආයෝජන අරමුදල් කළමනාකරණ (පුද්ගලික) සමාගම 10. අධ්‍යක්ෂ, ලංකා වෙන්චර්ස් ලිමිටඩ්. 11. කොමිෂන් සාමාජික, ශ්‍රී ලංකා සුරැකුම් පත් විනිමය කොමිෂන් සභාව. 12. සභාපති, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අධීක්ෂණ හා උපදේශන කමිටුව. 13. සාමාජික, පාලන කමිටුව, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය. 14. සාමාජික, කළමනාකරණ මණ්ඩලය, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය. 15. උපදේශක, "සාර්ක්" වාණිජ හා කර්මාන්ත මණ්ඩලය. 16. සාමාජික, ප්‍රධාන කමිටුව, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, . 17. උපදේශක, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සමුළුව. 18. හිටපු සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය. 19. හිටපු සභාපති ආසියානු ශාන්තිකර ගණකාධිකාරීවරුන්ගේ (23) වන ජාතික සම්මේලනය. 20. සාමාජික, පළමු පාර්ශෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ වූ පාර්ශෝගික සබඳතා පිළිබඳ කවුන්සිලය. 21. සමාජික, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් අධීක්ෂණය කිරීමේ මණ්ඩලය.	1. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සාමාජික (වර්තමානයේ එහි සභාපති) 2. අධ්‍යක්ෂ, කොලඳෙණිය හයිඩ්‍රෝපවර් (පෞද්ගලික) සමාගම	1. සභාපති, අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
එච් පී අජිත් ගුණවර්ධන මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.	2015 නොවැම්බර් 6- 2018 ජූලි 20	• ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව • වරලත් මූල්‍ය විශ්ලේෂක දෙවන අදියර	1. අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, ජනශක්ති සිකියුරිටීස් සමාගම 2. අධ්‍යක්ෂ, ක්ෂාට්‍රියා හෝල්ඩින්ග්ස් (පී එල් සී) 3. අධ්‍යක්ෂ, ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් (පී එල් සී) 4. අධ්‍යක්ෂ, කෙල්සී හෝම්ස් (පී එල් සී) 5. අධ්‍යක්ෂ, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී 6. අධ්‍යක්ෂ, කොත්මලේ හෝල්ඩින්ග්ස් (පී එල් සී) 7. සහකාර මහා කළමනාකරු, සෙලින්කෝ ශ්‍රීරාම් රක්ෂණ සමාගම 8. විධායක/ සහකාර මහා කළමනාකරු, සෙලින්කෝ ශ්‍රීරාම් කැපිටල් මැනේජ්මන්ට් සර්විස් සමාගම 9. විධායක, බාට්ලිට් ස්ටොක් බ්‍රෝකර්ස් සමාගම 10. විධායක, සෙලින්කෝ ට්‍රේඩින් කම්පැනි ලිමිටඩ්	1. අධ්‍යක්ෂ ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 3. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා හා ආයතනික යහපාලන කමිටුව
සමන්ත රාජපක්ෂ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2017 ජූලි 25 - 2018 නොවැම්බර් 25	• ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය • චක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය, සාමාජික ලන්ඩන් • ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය • චක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ අධි සාමාජිකත්වය	1. ජ්‍යේෂ්ඨ මාණ්ඩලික ගණකාධිකාරී/ උපදේශක, අර්නස්ට් ඇන්ඩ් යන්ග්, වරලත් ගණකාධිකාරිවරුන් කොළඹ, ශ්‍රී ලංකාව. 2. අධ්‍යක්ෂ/ සාමාන්‍යාධිකාරී, සී/ස ඉන්ෆොමැටික්ස් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම, කොළඹ, ශ්‍රී ලංකාව. 3. අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, සී එෆ් වෙන්චර් ෆන්ඩ් සමාගම, කොළඹ, ශ්‍රී ලංකාව. 4. අධ්‍යක්ෂ සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි, පී එල් සී, කොළඹ, ශ්‍රී ලංකාව. 5. ජ්‍යේෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු, ග්ලෝබල් ඒටී ඇන්ඩ් ටී, නිව් ජර්සි, ඇමරිකා එක්සත් ජනපදය. 6. මූල්‍ය හා ව්‍යාපාර සංවර්ධන පිළිබඳ සමූහ අධ්‍යක්ෂක, ක්ෂාට්‍රියා හෝල්ඩින්ග්ස් පී එල් සී 7. අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, සොෆ්ටලොජික් කොමියුනිකේෂන් සර්විසර්ස් (පෞද්ගලික) සමාගම	1. සභාපති/අධ්‍යක්ෂ, කිට්රා හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම 2. අධ්‍යක්ෂ/ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පී එල් සී 3. අධ්‍යක්ෂ/ ආසිරි සර්ජිකල් හොස්පිට්ල්ස් පී එල් සී 4. අධ්‍යක්ෂ/රැකුවෙන් ගෘප් ඔෆ් හොටෙල්ස් 5. අධ්‍යක්ෂ/ ආචරි ස්කූල් (පෞද්ගලික) සමාගම,	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල, අවදානම් කළමනාකරණ කමිටුව 2. සාමාජික, (2017 අගෝස්තු 11 සිට 2018 ජූලි 26 දක්වා) සහ ඉන්පසුව සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල වීගණන කමිටුව (2018 ජූලි 26 - 2018 නොවැම්බර් 25) දක්වා

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
සමන්ත රාජපක්ෂ මහතා පිළිබඳ විස්තර තවදුරටත්			8. අධ්‍යක්ෂ, සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පී එල් සී, ව්‍යාපාර සංවර්ධන 9. සභාපති, සොෆ්ටලොජික් ක්‍රෙඩිට් පී එල් සී, 10. අධ්‍යක්ෂ, සොෆ්ටලොජික් ෆිනෑන්ස් පී එල් සී, 11. අධ්‍යක්ෂ, සෙන්ට්‍රල් හොස්පිටල්ස් පී එල් සී, 12. අධ්‍යක්ෂ, සොෆ්ටලොජික් කැපිටල් පී එල් සී, 13. සමූහ කළමනාකරණ අධ්‍යක්ෂ, ඇසෝසියේටඩ් මෝටර් වේස් (පෞද්ගලික) සමාගම. ඒ එම් ඩබ්ලිව් 14. අධ්‍යක්ෂ ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසින් සහ ෆිනෑන්ස් පී එල් සී, ඇසෝසියේටඩ් ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් සමාගම, ඇසෝසියේට් ඔටෝවෙස් (පෞද්ගලික) සමාගම, ඇසෝසියේටඩ් මෝටර් (ලංකා) (පෞද්ගලික) සමාගම, ඇසෝසියේටඩ් ග්ලෝබල් ට්‍රේඩින්ග් (පෞද්ගලික) සමාගම, ඇසෝසියේටඩ් රබර් ඉන්ඩස්ට්‍රීස් සමාගම, ඇසෝසියේටඩ් යුනිවර්සල් (පෞද්ගලික) සමාගම සහ අල්ෆුටෙයිම් ලොජිස්ටික්ස් (පෞද්ගලික) සමාගම.	6. අධ්‍යක්ෂ, ජාතික ආධුනික හා කාර්මික පුහුණු අධිකාරිය	
මොහාන් විජේසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2017 නොවැම්බර් 24-2018 ජූලි 02	• ජාත්‍යන්තර නෛතික සහයෝගිතා පිළිබඳ පශ්චාත් උපාධිය, වීර්ජ් විශ්වවිද්‍යාලය, බ්‍රසල්ස් • එංගලන්තයේ සහ වේල්ස් ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර්. • ඕස්ට්‍රේලියාවේ කැපිටල් ටෙරිටරි ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර් හා අධිනීතිඥ • ඕස්ට්‍රේලියානු ඉහළ උසාවියේ අධිනීතිඥ • ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ	1. අධ්‍යක්ෂක, මහජන බැංකුව. 2. සමූහ පිරිස් කළමනාකරු, මහරාජා සමාගම් සමූහය. 3. සහකාර අධ්‍යක්ෂක, ඕස්ට්‍රේලියා විශ්‍රාම පාරිතෝෂික කොමිසම. 4. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ හා අධ්‍යාපන ආයතනය. 5. විධායක අධ්‍යක්ෂ, ජාතික ලොතරැයි මණ්ඩලය.	1. සාමාන්‍යාධිකාරී, ලීගල් කලම්බු ඉන්ටනැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම 2. අධ්‍යක්ෂ, මගනැඟුම උපදේශක හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (පෞද්ගලික) සමාගම. 3. අධ්‍යක්ෂ, ඉන්ටර්ඕෂන් සර්විසස් සමාගම. 4. ජ්‍යෙෂ්ඨ විදේශීය උපදේශක සී/ස චයිනා මර්චන්ට්ස් පෝට්ස් හෝල්ඩින්ග්ස් සමාගම.	

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
2018 නොවැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම සමඟ					
නිල් ඒ උමගිලිය මහතා සභාපති, ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ,	2018 නොවැම්බර් 19 - 2018 දෙසැම්බර් 20	• අධි සාමාජික වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය, එක්සත් රාජධානිය. • සාමාජික, කළමනාකරණ ආයතනය බ්‍රිතාන්‍ය	1. අධ්‍යක්ෂක, සළුසල සමාගම, 2. අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, 3. අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA). 4. සාමාජික, ශ්‍රී ලංකා මහා බැංකුවේ මූල්‍ය මණ්ඩලය. 5. සාමාජික, ටෙක්ස්ටයිල් කෝටා මණ්ඩලය, 6. පාලක මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය.	1. අධ්‍යක්ෂ, ඩයාල් ටෙක්ස්ටයිල්, ඉන්ඩස්ට්‍රීස් (පෞද්ගලික) සමාගම. 2. අධ්‍යක්ෂ, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල 3. සාමාජික, ශ්‍රී ලංකා ජර්මන් බිස්නස් කවුන්සිලය.	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව 2. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව.
විශාඛා අමරසේකර මිය, ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂිකා	2018 නොවැම්බර් 26- 2019 පෙබරවාරි 27	• ආර්ථික විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, ලන්ඩන් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය. • සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වැන්ඩර්බිල්ට් විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය. • එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජික • වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී	1. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති මහා භාණ්ඩාගාරයට අයත් විෂය ඒකක වල මූල්‍ය ණය කළමනාකරණය, ප්‍රාග්ධන වෙළඳපොළ හා රජයට අයත් ව්‍යවසාය වල 2002 සිට පහත තනතුරු දරා ඇත. අ . අධ්‍යක්ෂ, බාහිර සම්පත් දෙපාර්තමේන්තුව. ආ. අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, ඇ. සහකාර අධ්‍යක්ෂ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව. ඈ. සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව. 2. අධ්‍යක්ෂ, ලංකා විදුලිබල මණ්ඩලය. 3. අධ්‍යක්ෂ, ලංකා බණිජතෙල් සංස්ථාව. 4. අධ්‍යක්ෂ, මහජන බැංකුව	1. අධ්‍යක්ෂ, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මහා භාණ්ඩාගාරයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුව.	1. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව. 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව. 3. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව. 4. සභාපතිනිය, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව.

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
පී ලලිත් පී විතාන මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2018 නොවැම්බර් 26-2018 දෙසැම්බර් 20	• ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. • ශාස්ත්‍රපති (ගෞරව) උපාධිය, මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලය, මෙට්‍රොපොලිටන්, එක්සත් රාජධානිය • අඩි සාමාජික, වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනය, (එක්සත් රාජධානිය) • අඩි සාමාජික ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය • ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ ව්‍යාපෘති කළමනාකරණ වෘත්තිකයෙකි,	1. බ්‍රැන්ඩික්ස් ගෘප්, අර්නස්ට් ඇන්ඩ් යන්ග්, ඇම්ස්ටඩෑම් රොටර්ඩෑම් (අම්රෝ) බැංකුව, අයිබීඑම් වර්ල්ඩ් ට්‍රේඩ් කෝපරේෂන්, කාසන් කම්බර්බැච් පී එල් සී, එම්ජේඑෆ් ගෘප්, ඇමරිකා එක්සත් ජනපදයේ. යමහා කෝපරේෂන් සහ ශ්‍රී ලංකා ගුවන් සමාගම ඇතුලු බොහෝ ආයතනවල ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරුවල අවුරුදු 25 කට වඩා පළපුරුද්ද. 2. අධ්‍යක්ෂ, ලංකා බැංකුව 3. අධ්‍යක්ෂ, දංකොටුව පෝසිලේන් පී එල් සී. 4. අධ්‍යක්ෂ, මර්චන්ඩ් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී 5. අධ්‍යක්ෂ, සීලීස් ලිමිටඩ් 6. අධ්‍යක්ෂ, සෙලාන් බෑන්ක් පී එල් සී, 7. කොමසාරිස්, විදුලි සංදේශ නියාමන කොමිසම 8. සම- සභාපති ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය කමිටුව 9. උප සභාපති, ව්‍යාපෘති කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා ශාඛාව.	1. ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්, 2. සාමාජික, ඇගලුම් වෙළඳ භාණ්ඩ හා කළමනාකාර පාසල සඳහා වූ උපදේශක මණ්ඩලය, කැලිෆෝනියා ප්‍රාන්ත පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය, පොමෝනා, ඇමරිකා එක්සත් ජනපදය.	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව. 2. සාමාජික,අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව.
ඒ වී කේ මාධවී හේරත් මිය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂිකා	2018 නොවැම්බර් 26-2018 දෙසැම්බර් 20	• ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. • ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය.	1. සභාපතිනිය, කදුරට සංවර්ධන බැංකුව 2. විධායක අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.	1. ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය පිළිබඳ ජ්‍යේෂ්ඨ කතිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.	1. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව.
එච් ඉසුරු බාලපටබැදි මහතා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2018 නොවැම්බර් 26-2018 දෙසැම්බර් 20	• නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (එල් එල් එම්) පීටර්ස්බර්ග් නීති විශ්වවිද්‍යාලය, පීටර්ස්බර්ග් පෙනිසිල්වේනියා., ඇමරිකා එක්සත් ජනපදය. • ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ	1. රජයේ නීතිඥ, ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුව. 2. රාජ්‍ය තාන්ත්‍රික සහ චාන්සලර් උසාවියේ ප්‍රධානී, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, නෙදර්ලන්තය 3. අධ්‍යක්ෂ, සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4. අධ්‍යක්ෂ, සෙලාන් බැන්ක් පී එල් සී 5. අධ්‍යක්ෂ, බිලූඩයමන්ඩ්ස් ජුවලරි වර්ල්ඩ් වයිඩ් පී එල් සී		1. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව. 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව 3. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

අධ්‍යක්ෂකගේ නම	පත්වූ දිනය හා ඉවත් වූ දිනය	සුදුසුකම්	පළපුරුද්ද	ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ධූරය හෙබවූ අවසාන දිනය වන විට අධ්‍යක්ෂධූර දැරූ අනෙකුත් ආයතන වල නම්	ඔවුන් සේවය කර ඇති ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු
පී හර්ෂ විජේවර්ධන මහතා, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	2018 නොවැම්බර් 26- 2018 දෙසැම්බර් 20	• ජීව රසායන විද්‍යාව සහ රසායන විද්‍යාව (මූලික) හා ගණිතය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, මියාමි විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය • බ්‍රිතාන්‍ය පරිගණක සංගමය, වෘත්තීය අධි සාමාජික (FBCS).	1. රජයේ තොරතුරු හා සන්නිවේදන ව්‍යාපෘති වලට සම්බන්ධ වී ඇති අතර, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ තොරතුරු දෙපාර්තමේන්තුව වැනි ආයතනවල රාජ්‍ය පරිගණක ජාල පද්ධති සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත. 2. කොළඹ විශ්වවිද්‍යාලයේ මෘදුකාංග සංවර්ධන ඒකකය (SDU) පිහිටුවීම පිළිබඳ මූලික වී ඇත. 3. උපත්, විවාහ, මරණ සහතික නිකුත් කිරීමේ පද්ධතිය හා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ගෘහ මූලික ලැයිස්තු සෑදීම ඇතුළු සමහර ප්‍රධාන ජාතික මට්ටමේ මෘදුකාංග ව්‍යාපෘති සඳහා වගකීම දරයි. 4. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපදේශක 5. අධ්‍යක්ෂක, ලංකා රජයේ යටිතල පහසුකම් හුවමාරුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය. (ICTA) 6. අන්තර්ජාල සමාජයේ ශ්‍රී ලංකා ශාඛාවේ ආරම්භක සභාපති, 7. ICANN සිංහල ප්‍රවේනි මණ්ඩලයේ සම සභාපති. 8. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී/ ප්‍රධාන තාක්ෂණ නිලධාරී, තීක්ෂණ (කොලඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලට අනුබද්ධ සමාගමකි) 9. උපදේශක/ මෘදුකාංග සංවර්ධන ඒකකයේ ප්‍රධානී, කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක පාසල	1. අධ්‍යක්ෂක, ලංකා වසම් නාම ලියාපදිංචි ආයතනය 2. අධ්‍යක්ෂක සී/ස ඇම්සොෆ්ට් ටෙක්නොලොජිස් (පෞද්ගලික) සමාගම	1. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව 2. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව. 3. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 4. සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

(2019 පෙබරවාරි මස නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලද අතර ඔවුන්ගේ විස්තරයන් පිටු 25 සිට 27 දක්වා පළ කර ඇත.)

ආයතනික යහපාලනය

අධ්‍යක්ෂ මණ්ඩල දින දර්ශනය සහ පැමිණීම

කාර්තුව 1	කාර්තුව 2	කාර්තුව 3	කාර්තුව 4
2018 ජනවාරි 05	2018 අප්‍රේල් 02	2018 ජූලි 09	2018 ඔක්තෝබර් 04
2018 ජනවාරි 05 (විශේෂ)	2018 අප්‍රේල් 17	2018 ජූලි 13	2018 ඔක්තෝබර් 17
2018 ජනවාරි 19	2018 මැයි 02	2018 ජූලි 26	2018 නොවැම්බර් 27
2018 පෙබරවාරි 07	2018 ජූනි 06	2018 අගෝස්තු 10	2018 දෙසැම්බර් 06
2018 පෙබරවාරි 15	2018 ජූනි 29	2018 අගෝස්තු 23	
2018 පෙබරවාරි 20		2018 සැප්තැම්බර් 07	
2018 මාර්තු 08		2018 සැප්තැම්බර් 19	

අධ්‍යක්ෂකගේ නම	අධ්‍යක්ෂ මණ්ඩලය	විගණන කමිටුව	මනවසම්පත් හා පාරිශ්‍රමික කමිටුව	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව
රොනල්ඩ් සී පෙරේරා මහතා, ජනාධිපති නීතිඥ - සභාපති (2018 නොවැම්බර් 18 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත. 2019 පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදී.)	19/21	නැත	1/1	නැත	2/2	නැත
එස් ආර් ආටිගල මහතා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 25 දින ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ වරයෙකු ලෙස කටයුතු කිරීම අවසන් කරන ලදී.)	19/21	7/9	0/1	5/6	0/2	නැත
රනෙල් ටී විජේසිංහ මහතා අධ්‍යක්ෂ, (2018 ජූලි 31 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත.)	14/14	6/6	නැත	නැත	නැත	නැත
එච් පී අජිත් ගුණවර්ධන මහතා අධ්‍යක්ෂ, (2018 ජූලි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත.)	13/14	නැත	1/1	5/5	2/2	නැත
සමන්ත රාජපක්ෂ මහතා අධ්‍යක්ෂ, (2018 නොවැම්බර් 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂක වරයෙකු වශයෙන් කටයුතු කිරීම අවසන් කරන ලදී.)	20/21	9/9	නැත	6/6	නැත	නැත
මොහාන් විජේසිංහ මහතා අධ්‍යක්ෂ, (2018 ජූලි 02 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත.)	12/12	නැත	නැත	නැත	නැත	නැත
කේ ඒ විමලේන්ත්‍රාජා මහතා, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වෙනුවට පත්වූ විකල්ප අධ්‍යක්ෂ, (2018 නොවම්බර් 25 දින සිට - ක්‍රියාත්මක වන පරිදි විකල්ප අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම අවසන් කර ඇත) (2019 පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ ලෙස නැවත පත්කරනු ලදී.)	-	1/1	-	1/1	-	නැත
නීල් ඒ උමගිලිය මහතා සභාපති, (2018 නොවැම්බර් 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කළ අතර, 2018 දෙසැම්බර් 20 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය.)	2/2	නැත	නැත	නැත	නැත	නැත
විශාඛා අමරසේකර මිය, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂිකා, (2018 නොවැම්බර් 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලද අතර, 2019 පෙබරවාරි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂිකා ලෙස කටයුතු කිරීම අවසන් කරන ලදී.)	2/2	1/1	නැත	නැත	නැත	නැත
ජී ලලිත් ජී විතාන මහතා අධ්‍යක්ෂ,*	2/2	1/1	නැත	නැත	නැත	1/1
එච් ඉසුරු බාලපටබැදි මහතා අධ්‍යක්ෂ,*	2/2	නැත	නැත	නැත	නැත	1/1
ඒ වී කේ මාධවී හේරත් මිය අධ්‍යක්ෂ.*	1/2	1/1	නැත	නැත	නැත	නැත
ජී හර්ෂ විජේවර්ධන මහතා අධ්‍යක්ෂ.*	2/2	1/1	නැත	නැත	නැත	1/1
මුළු රැස්වීම් ගණන	23	10	1	6	2	1

*2018 නොවැම්බර් 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු දෙනා පත්කරන ලද අතර, 2018 දෙසැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යක්ෂමතාවය වාර්ෂිකව ස්වයං ඇගයීමක් මඟින් තක්සේරු කරන අතර එහි නිර්ණායක සැලසුම් කර ඇත්තේ නියාමන අවශ්‍යතාවයට අනුකූලවය. සෑම අධ්‍යක්ෂවරකුගෙ විසින්ම කාර්යසාධන ඇගයුම් පත්‍රිකාවක් සම්පූර්ණ කළයුතු අතර ඊට පසුව ලැබෙන ප්‍රතිචාර එකතු කොට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. උපකමිටු ද මීට සමාන ඇගයීමක් කර ගෙන යනු ලැබේ.

2018 නොවැම්බර් මාසය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට කළ වෙනස්කම් හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා හැර 2018 දෙසැම්බර් අවසානයට පෙර විසේ පත්කරන ලද අධ්‍යක්ෂවරු ද ඉල්ලා අස්වීම නිසා 2018 අවසන් වූ වසර සඳහා වාර්ෂික ඇගයීම් නොකරන ලදී. මෙම ඇගයීම් කරගෙන යාමේ ක්‍රියාවලිය අනාගතයේදී අඛණ්ඩව කරගෙන යනු ඇත.

මහා කළමනාකරුගේ ඇගයුම

මහා කළමනාකරුගේ හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ (KMP) කාර්යසාධනය, වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීම් කරනු ලබයි. ඇගයීම් සඳහා ආයතනික සැලැස්මේ සඳහන් කර ඇති පරිදි මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක පදනම් කරගනි. මේ කර්තව්‍යයේදී නාමයෝජනා හා ආයතනික යහපාලනය පිළිබඳ අනුකමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ බලාපොරොත්තුවල පැහැදිලිතාවය සහතික කරමින් වර්ෂය ආරම්භයේදී මහා කළමනාකරු/ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ නිර්ණායක වලට එකඟ වෙති. ඇගයීමට ලක්වනු ලබන්නාගෙන් ලැබෙන ප්‍රතිචාර මෙන්ම මෙහෙයුම් වටපිටාව තුළ ඇති ගතිකත්වය ඇගයීම් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

අධ්‍යක්ෂ හා විධායක පාරිශ්‍රමික

ප්‍රවේශය හා ප්‍රතිපත්තිය

අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා බැංකුවේ පාරිශ්‍රමික දර්ශනය එහි පාර්ශ්වකරුවන් කෙරෙහි දක්වන පුළුල් කැපකිරීම් වලින් පිළිබිඹු වන අතර දිගුකාලීන පදනමක් මත තිරසාර කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට උත්සාහ දරයි. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍ර ලේඛන හා ලිපි වල දැක්වෙන විස්තර ප්‍රඥප්ති හා ආඥා පනත හා එහි සංශෝධන වලින් දක්වා ඇති විස්තර වලින් පිළිබිඹු වන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මඟින් අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය නිගමනය කරනු ලැබේ. ඔහුගේ/ ඇයගේ පාරිශ්‍රමිකය නිගමනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් සම්බන්ධ නොවේ.

ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය අනුව මහා කළමනාකරුගේ හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ පාරිශ්‍රමික පදනම් වේ. මෙම ප්‍රතිපත්තිය අරමුණු කර ගනු ලබන්නේ කාර්යසාධනයෙන් දිවෙන වැඩ සංස්කෘතියක් පෝෂණය කිරීම උදෙසාය. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, මහා කළමනාකරුගේ හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන අතර ඒ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය ඒවා අනුමත කර අදාළ අමාත්‍යවරයාගේ අනුමැතියට යවන අතර ප්‍රඥප්තිය හා එහි සංශෝධන වල නියෝග වලට අනුකූලව අමාත්‍යවරයා අවසාන අනුමැතිය ලබාදේ. මහා කළමනාකරුගේ හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ පාරිශ්‍රමික සෑම අවුරුදු තුනකට වරක් සමාලෝචනය කරනු ඇත.

පාරිශ්‍රමික ව්‍යුහය

සුදුසු හා සාධාරණ පාරිශ්‍රමික පිරිනැමීම සඳහා ලංකා බැංකුවේ පාරිශ්‍රමික ව්‍යුහය සැලසුම් කර ඇත. භූමිකා හා වගකීම් මත පදනම් වෙමින් ස්ථාවර හා විචල්‍ය දීමනා අතර ඉතාම යෝග්‍ය සංකලනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා නිසි අවධානය යොමු කරනු ඇත. බැංකුවේ පාරිශ්‍රමික වල ප්‍රධාන අංග පහතින් දක්වා ඇත.

විචල්‍ය පාරිශ්‍රමික
දිරිගැන්වීමේ ප්‍රසාද දීමනා

ස්ථාවර පාරිශ්‍රමික

මූලික වැටුප් සහ අනිකුත් ස්ථාවර සංරචක නිගමනය කරනු ලබන්නේ කාර්ය භාරය හා සේවා නියුක්තික ශ්‍රේණිය අනුවයි.

අනෙකුත් මූල්‍ය නොවන ප්‍රතිලාභ

පශ්චාත් රැකියා ප්‍රතිලාභ

විශේෂ යෝජනා ක්‍රම යටතේ ණය

ණය කාඩ්පත්.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා පිටු 236 සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ වල පාරිශ්‍රමික සම්බන්ධයෙන් පිටු 426 කරුණාකර බලන්න.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පිටු අංක 96 සිට 97 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා යටතේ ඇතුලත් කර ඇත.

ආයතනික යහපාලනය

අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය

ඵලදායී අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති මඟින් බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඉහළම වගකීම් දරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූල වන බව සහතික කරන අතර බැංකුවේ ජාතික කාර්ය භාරය, සම්බන්ධිත වැදගත්කම හා පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සලකා බලන කළ ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සැලසුම් කර ඇත්තේ උපරිම අවදානම් ඇගයුම් තුලිතයක් සාක්ෂාත් කර ගැනීම සඳහාය. බැංකුවේ අවදානම් පැතිකඩ හා අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කිරීම තුළ බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් හා අවදානම් අවම කිරීමේ උපයමාර්ගවල ප්‍රමාණාත්මකතාවය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අබණ්ඩව තක්සේරු කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සහ විගණන කමිටුව මඟින් පිළිවෙලින් එහි අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය ලබාදෙනු ලැබේ. කමිටු දෙකෙහිම විෂය පථය අදාළ කමිටු ප්‍රඥප්ති වල පැහැදිලිව සඳහන් කර ඇත.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා විගණන කමිටු වාර්තා සඳහා පිළිවෙලින් පිටු අංක 89 සිට 95 දක්වා බලන්න

ආචාර ධර්ම සංග්‍රහය

බැංකුවේ ආචාර ධර්ම පද්ධතිය සභාපති ගේ නායකත්වයෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන අතර ඔවුන් අධ්‍යක්ෂවරුන්ගේ ආචාර ධර්ම සංග්‍රහයට බැඳී සිටින අතර චක්සත් භාවය, විනිවිදභාවය හා දූෂණයට වෙරෙහි වීම මූලික කරුණුවේ. පුද්ගලික බැඳීම් ගැටුම් නොමැතිව බැංකුවේ පාලනය තුළ සිට ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් කැපවෙන අතර ආචාර ධර්ම නියෝග සමඟ ඔවුන්ගේ අනුකූලත්වය වාර්ෂිකව තහවුරු කිරීමක් ඉදිරිපත් කරති. අධ්‍යක්ෂකවරුන් වාර්ෂිකව වත්කම් හා බැරකම් ප්‍රකාශ අදාල අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

සේවා නියුක්තික ආචාර ධර්ම සංග්‍රහයෙන් සියලුම සේවා නියුක්තිකයින් බැඳී සිටින අතර අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න හා අවංකත්වය, විනිවිදභාවය හා අල්ලස් හා දූෂණයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම සම්බන්ද කරුණුද ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. අනුකූලතාවය පිළිබඳ වාර්ෂික තහවුරු කිරීමක් සේවා නියුක්ති කරුවන්ගෙන් ලබාගනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා හා ආයතනික යහපාලනය කමිටුව මෙම ආචාර ධර්ම සංග්‍රහය අබණ්ඩව සමාලෝචනය කරයි.

විසිල් බ්ලෝවින්

සැක සහිත සොරකම්/ වංචා දූෂණ බැංකුවේ වත්කම් අවභාවිතය හෝ ආචාර සම්පන්න නොවන හෝ නීත්‍යානුකූල නොවේ යැයි සලකනු ලබන වෙනත් ඕනෑම ක්‍රියාවකට අදාල පැමිණිලි වාර්තා කිරීම් සඳහා සේවා නියුක්තිකයින් හෝ සේවා නියුක්තිකයින් නොවන අයවලුන් අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර ඇති විසිල් බ්ලෝවින් ප්‍රතිපත්ති මඟින් ධෛර්යමත් කෙරේ. ප්‍රධාන විගණන නිලධාරී විසින් ලැබෙන පැමිණිලි පරීක්ෂා කරන අතර නියෝජ්‍ය මහ කළමණාකාර ශ්‍රේණියේ හා ඊට ඉහළ සේවා නියුක්තිකයන්ට විරුද්ධව කරන ලද පැමිණිලි විගණන කමිටුවේ සභාපති වෙත ඉදිරිපත් කල යුතුවේ.

දූෂණයට එරෙහිව

ගෞරවනීය හා ආචාරශීලී අන්දමින් එහි සියලුම මෙහෙයුම් සිදුකිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. අල්ලස් හා දූෂණයට නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශයක් බැංකුව අනුගමනය කරන අතර අල්ලස් වලට විරුද්ධව ඵලදායී ලෙස තම මෙහෙයුම් කටයුතු කිරීම බල ගැන්වීමට සෑම විටම ක්‍රියා කරයි. සියලුම ව්‍යාපාරික ගනුදෙනු හා සම්බන්ධතා සාධාරණව, අවංකව හා වෘත්තීය මට්ටම්න් යුතුව ක්‍රියාවට නැංවීමට බැංකුව කැපවේ. තම මෙහෙයුම් කටයුතු කරනු ලබන සියලුම බල ප්‍රදේශවල අල්ලස් හා දූෂණයට විරුද්ධව අදාළ නීති සමඟ බැංකුව අනුගත වේ.

පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය

විවෘත හා තිරසාර සම්බන්ධතා පෝෂණය කරමින් අභ්‍යන්තර හා බාහිර පාර්ශ්කරුවන් සමඟ ඵලදායී හා අදාළ සන්නිවේදනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය මඟ පෙන්වීම ලබාදේ. නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව විසින් ප්‍රතිපත්තිය සමාලෝචනය කරනු ලැබේ. එහි පාර්ශ්වකරුවන් සමඟ බැංකුව සන්නිවේදන පවත්වාගෙන යන ආකාරය කෙටියෙන් පහත දක්වා ඇත.

කොටස්කරු: බැංකුවේ එකම කොටස්කරු වන්නේ ශ්‍රී ලංකා රජය වන අතර මුදල් අමාත්‍යාංශයෙන් පත් කරන, නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්ථිර නියෝජිතයකු මඟින් අබණ්ඩ සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලැබේ. අදාල අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තාව ඉදිරිපත් කෙරේ.

සේවා නියුක්තිකයින්: වෘත්තීය සංගම් සමඟ තිබෙන සම්බන්ධතා, විවිධ මට්ටම්වල කාර්ය මණ්ඩල රැස්වීම්, වලදී දුක්ගැනවිලි මෙහෙයවීමේ යාන්ත්‍රණය සහ වසර පුරා යෙදෙන සංස්කෘතික විනෝදාස්වාදය හා ක්‍රීඩා උත්සව මඟින් විවිධ කටයුතු සඳහා සහභාගි වීමට පහසුකම් සලසන අතර සියලුම සේවා නියුක්තිකයින් සඳහා ඕනෑම විටෙක ගැටළු විසඳා ගැනීමට විවෘත පහසුකම් සැලසීමේ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යයි.

පාරිභෝගිකයින්: පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණය අබණ්ඩ පදනමක් මත මෙහෙයවන අතර කළමනාකරුවන් හා සබඳතා නිලධාරීන් හරහා සහ විවිධ මුහුණුවරකින් යුතු ඩිජිටල් තාක්ෂණික ක්‍රම හරහා පාරිභෝගිකයින් සමඟ ඵලදායී සබඳතා නිරතුරුව පවත්වාගෙන යනු ලැබේ.

පරිපාලිත සමාගම් හා සම්බන්ධව, යහපාලනය

බැංකුවේ සෘජු හා වක්‍ර පරිපාලිතයන්හී වෙනස් නොවන දැඩි යහපාලන භාවිතා බැංකුවේ පරිපාලිත කළමනාකරණ ප්‍රඥප්තිය මඟින් සහතික කෙරේ. ඇතිවිය හැකි සෘජු පරිපාලිතයන්ගෙන් පැන නඟින අවදානම් ඇගයීම හා වරද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කරනු පිණිස මව් ආයතනයට අබණ්ඩව කාර්යසාධන යාවත්කාලීන කිරීම හා අවදානම් මට්ටම් පිළිබඳ තොරතුරු වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. නියත ලෙස අර්ථ දැක්වූ පරාමිතීන් තුළ අවදානම් පැතිකඩයන් පවත්වාගෙන යන බව සහතික කරමින් කාලීන පදනමක් මත පරිපාලිත අවදානම් කළමනාකරණ උපායමාර්ග ලැයිස්තුව, අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් සමාලෝචනය කෙරේ. පරිපාලිතයන්ගේ අනුකූලතාවය ලංකා බැංකුවේ අනුකූලතා නිලධාරී අධීක්ෂණය කරයි. මව් ආයතනයේ යහපත ආරක්ෂා වන බව සහතික කිරීම සඳහා බැංකුවේ නියෝජිතයකු ලෙස සාමාන්‍යයෙන් අවම වශයෙන් එක් අයෙකුවත් පරිපාලිත අධ්‍යක්ෂ මණ්ඩලවල තනතුර හොබවයි.

2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගය වූ බැංකුවේ අනුකූලතාවය පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු අංක 401 සිට 427 දක්වා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ 2017 ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලතා දැක්වීම පිටු අංක 394 සිට 400 දක්වා බලන්න.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර අනුගමනය කරනු ලබන විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් කරුණු මත විගණන කමිටුවේ විෂය ක්ෂේත්‍රය සකස් කර ඇත.

2018 වසර තුළ අවසන් වරට සමාලෝචනය කරන ලද විගණන කමිටුවේ ප්‍රඥප්තිය විගණන කමිටුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ නව වර්ධනයන් සලකා බලනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝගවල අවශ්‍යතා ඊට අයත් ක්‍රියාමාර්ග වල විෂය පථය ආවරණය සම්බන්ධයෙන් ද කමිටුව සහතික කරයි.

ප්‍රධානතම අවධානය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ ස්වාධීන හා විෂයානුබද්ධ සමාලෝචනයක් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂක මණ්ඩලයට සිය කාර්යයන් ඉටු කරලීම සඳහා සහාය දැක්වීම කෙරෙහි විගණන කමිටුව මූලිකව සිය අවධානය යොමු කර ඇත.

වාර්තාකරණ ක්‍රියාමාර්ග

විගණන කමිටු රැස්වීම වල වාර්තා සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කෙරේ. එහිදී සියලු ප්‍රධාන කරුණු, ගන්නා ලද ක්‍රියාමාර්ග, අත්පත් කර ගත් හෝ අත්පත් කරගැනීමට ඇති ප්‍රතිඵල සහ පසුවිපරම් ක්‍රියාමාර්ග පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ලබා ගැනීම සිදු කෙරේ.

සංයුතිය

2018 වසර තුළ

සමාලෝචනයට යටත් වසර අතරතුර පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂකවරුන්ගෙන් විගණන කමිටුව සමන්විත විය.

- **රනෙල් ටී විජේසිංහ මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  (2018 ජූලි 31 දින ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඔහු ඉල්ලා අස්වීම තෙක්)

- **එස් ආර් ආටිගල මහතා**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ

- **සමන්ත රාජපක්ෂ මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2018 ජූලි 31 දින විජේසිංහ මහතාගේ ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම නිසා කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

- **සමන්ත රාජපක්ෂ මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  (2018 නොවැම්බර් 25 දින ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඔහු ඉල්ලා අස්වීම තෙක්)

- **එස් ආර් ආටිගල මහතා**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

  (මුදල් අමාත්‍යාංශයේ ඉහළ තනතුරක ඔහු වැඩ භාර ගැනීමත් සමඟ 2018 නොවැම්බර් 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ සේවය අවසන් කරන තෙක්)

  2018 නොවැම්බර් මස සිදුවූ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම නිසා කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- **පී ලලිත් පී විතාන මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

- **විශාඛා අමරසේකර මිය**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂිකා

- **ඒ වී කේ මාධවී හේරත් මිය**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂිකා

- **ජී හර්ෂ විජේවර්ධන මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

විතාන මහතා, හේරත් මිය සහ විජයවර්ධන මහතා 2018 නොවැම්බර් 25 දින ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වූ අතර 2019 පෙබරවාරි 27 සිට ක්‍රියාත්මක වන පරිදි අලුතින් නිල බලයෙන් අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමත් සමඟ අමරසේකර මිය අධ්‍යක්ෂවරියක ලෙස සේවය අවසන් කරන ලදී.

කමිටුවේ සාමාජිකයන්ට අවශ්‍ය මූල්‍ය නිපුණත්වය, පළපුරුද්ද ප්‍රවීණත්වය හා පසුබිම මෙන්ම කමිටුවේ සාමාජිකයන්ට අවශ්‍ය ස්වාධීනතාවය පිළිබඳව යෝග්‍ය මට්ටම පැවතින.

පිටු 79 සිට 85 දක්වා ඇති ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාව යටතේ 2018 වර්ෂය තුළ විගණන කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ලබා දී ඇත.

2019 වසර තුළ

රජයේ ඇති වූ වෙනස්වීම් සමඟ 2019 පෙබරවාරි මස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත වෙනස් කරන ලද අතර වාර්තා කරන අවස්ථාව වන විට ඇබෑර්තු පිරවීමට අපේක්ෂා කරනු ඇත. අන්තර්කාලීනව නැවත සාමාජිකයන් විගණන කමිටුවට ඇතුළත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ .

කුමාර් මායාදුන්නේ මහතා
සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කේ ඒ විමලේන්තිරාජා මහතා
සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

පී ඒ ෂාෆ්ටර් මහතා
සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පිටු 26 සිට 27 දක්වා ඉහත සාමාජිකයන්ගේ විස්තර දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටුවේ ලේකම්

ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක මෙන්ම නියෝජ්‍ය මහ කළමනාකාරි තනතුරද දරණ අතර කමිටුවේ ලේකම් ලෙසද ක්‍රියා කරයි.

කමිටු රැස්වීම්

සමාලෝචනයට යටත් වූ වසර අතරතුර කමිටුව දස වතාවක් රැස්විය. රැස්වීම් වල වාර ගණන සහ කාලසීමාව, කමිටුවට එහි වගකීම් ඵලදායීව ඉටු කිරීමට හැකියාව ලබා දී තිබේ. කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පිටු අංක 86 යේ ඇති වගුවේ දක්වා ඇත.

කමිටුවේ ගණ පූරණය දෙකකි.

2018.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා ලංකා බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම් විගණකාධිපති විසින් මෙහෙයවන ලද අතර වසර පුරා පූර්ණ කාලීන පදනමක් මත බැංකුවේ සේවය කරන විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ කමිටුව නිරතුරුවම සන්නිවේදනය පවත්වා ගෙනයනු ලැබේ.

අඛණ්ඩ රැස්වීම් වලට අමතරව අවශ්‍යතාවය පැන නැඟුන විට විගණකාධිපතිගේ නියෝජිතයින් සමඟ (බැංකුවේ බාහිර විගණක) කමිටුව සන්නිවේදනය කටයුතු කරන ලදී

රැස්වීම් වලට සහභාගි වීම

අඛණ්ඩ පදනමක් මත සෑම විගණන කමිටු රැස්වීම්කටම පහත සඳහන් කළමනාකරණ පිරිස සහභාගි විය.

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අවදානම් නිලධාරී
- අනුකූලතා නිලධාරී
- සහකාර මහා කළමනාකරු (පළාත්/ ශාඛා සහ ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශන)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- සහකාර මහ කළමනාකරු (අවදානම් කළමනාකරණ)
- අභ්‍යන්තර විගණක
- තොරතුරු තාක්ෂණ අවදානම් නිලධාරී
- විගණකාධිපතිගේ නියෝජිතයන් (බැංකුවේ බාහිර විගණක)

ආරාධනයෙන් පමණක් සහභාගී වූ කළමනාකරණ සාමාජිකයන් පහත සඳහන් පරිදි වේ.

- මහා කළමනාකරු
- ප්‍රධාන මූල්‍ය නිලධාරී
- නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)

අවශ්‍ය වන පරිදි පැහැදිලි කරගැනීම් කිරීම පිණිස වසර අතරතුර විවිධ කාලවල විගණන කමිටු රැස්වීම් වලට අංශ ප්‍රධානීන්ට ආරාධනය කර තිබුණි.

2018 වසර තුළ ඉටු කළ කටයුතු

මූල්‍ය වාර්තාකරණය

- බැංකුවේ, කාර්තුමය, හා වාර්ෂික විගණනය නොකළ/ කළ මූල්‍ය ප්‍රකාශන සුපරීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් පනවන ලද අවශ්‍යතා හා අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති හා අනුරූප වන පරිදි පිළියෙළ කොට හා ප්‍රසිද්ධ කොට තිබෙන බව තහවුරු කරනු පිණිස මෙම ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.
- කාර්තුමය මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට කලින්, බැංකුවේ සමස්ථ කාර්යසාධනය පිළිබඳව හා අයවැය, වාර්ෂික උපායමාර්ගික සැලසුම්, බැංකු කර්මාන්තය හා තරඟකාරී වාතාවරණය සම්බන්ධයෙන් ව්‍යාපාරික ඒකකවල කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනයක් කර තිබේ.
- බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන්යෙන් වැදගත් තීන්දු, ඇස්තමේන්තු, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ සමාලෝචනය කර තිබේ.
- 2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ මූල්‍ය උපකරණ වන ශ්‍රී. ලං. මු. ව. ප්‍ර. 9 ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලදී. බැංකුවේ ශ්‍රී. ලං. මු. ව. ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක ලෙස ක්‍රියාකළ අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම සමඟ කමිටුව සාකච්ඡා කර සංක්‍රාන්ති ක්‍රියාවලිය සමීපව අධීක්ෂණය කරන ලදී. ශ්‍රී. ලං. මු. ව. ප්‍ර. 9 යටතේ හානිකරණ වෙන්කිරීම් වල නිවැරදිභාවය හා එයින් බැංකුවට ඇතිවන බලපෑම කමිටුව සමාලෝචනය කරන ලදී.

නියාමන අනුකූලතාවය

- අනිවාර්ය බැංකුකරණ කටයුතු හා අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමඟ වූ අනුකූලතාවය සමාලෝචනය කරන ලදී.
- නියාමකයින් විසින් පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්ගෙන් හඳුනාගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ප්‍රාග්ධන ප්‍රවර්ධන සැලැස්ම සහ එහි ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කරන ලදී.
- සම්බන්ධිත පාර්ශ්වකරුවන්ගේ ගනුදෙනු පිළිබඳ වාර්තාව සලකා බලන ලදී.
- බාසල් III ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ තත්ත්වය සමාලෝචනය කරන ලදී.
- රාජ්‍ය/ පෞද්ගලික අංශ වලට විවිධ ආර්ථික අංශ හා අනු අංශ වලට සහ ණය ගන්නන්ට ලබාදී ඇති ණය නිරාවරණයන් අධ්‍යයනය කර අවදානම් අවම කිරීම සහ ලිහිල් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සලකා බැලීම සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් එහි අඛණ්ඩව විගණන කොටසක් වශයෙන් අනිවාර්ය නීතිමය හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවල අනුකූලතාවය පරීක්ෂා කරන බව සහතික කරන ලදී.

අභ්‍යන්තර පාලනය

- 2018 වසර සඳහා යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර පාලන අනුකෘතිය මඟින් 2007 අංක 11 දරණ බැංකු පනතේ නියෝග වල 3 (8) (ii)(ආ) කොටසට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මකතාවය සහ සඵලත්වය සමාලෝචනය කරන ලදී.
- විශේෂිත සිද්ධි හා කරුණු මත අවශ්‍ය කෙරේනම් හා අඛණ්ඩ පදනමකින් පදනම් සාධක විශ්ලේෂණය සිදු කෙරුණු අතර, පද්ධති, පිළිවෙත් හා අභ්‍යන්තර පාලන විධි වල අවශ්‍ය ගොනු කිරීම් සිදු කරන ලදී.
- ණය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීම් අධීක්ෂණය හා විමර්ශනය ශක්තිමත් කරන ලද අතර, සිදුවිය හැකි ණය අලාභ වලක්වා ගැනීමට පෙර ප්‍රතිකර්ම යෙදීම පිණිස ක්‍රියාමාර්ග සම්පාදනය කරන ලදී.
- ශාඛා ජාලයේ කාර්ය මණ්ඩලය සඳහා ගුණාත්මක ණය පරිපාලනයක් සහතික කිරීම පිණිස නිපුනතා ඉහළ නැංවීමේ වැඩ පිළිවෙල සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලෙස මානව සම්පත් දෙපාර්තමේන්තුවට මග පෙන්වීම හා සහාය වීම අඛණ්ඩව කරන ලදී.

අභ්‍යන්තර පාලනය සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය හා ඒ පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව පිටු 188 සිට 190 දක්වා ඉදිරිපත් කර ඇත. ඒ අනුව බැංකුවේ ශේෂයන් හා වත්කම් සුරක්ෂිත බව ද මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති මූල්‍ය තත්ත්වය හා ප්‍රතිඵල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට ද පැහැදිලි තහවුරුවක් ලබා දීමට හැකි බව කමිටුවේ නිගමනය වේ.

අභ්‍යන්තර විගණන

- අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග වල ස්වාධීනතාවය, වාස්තවිකත්වය සහ කාර්යසාධනය සේම දෙපාර්තමේන්තු සම්පත් ප්‍රමාණවත්ද යන කරුණු පිළිබඳව විශේෂිත අවධානය යොමු කොට සමාලෝචනය කරන ලදී.
- පළාත්/ ශාඛා සහ ණය විගණනය
- තොරතුරු පද්ධති විගණනය
- මූලස්ථානය, පරිපාලිතයන් හා විදේශීය ශාඛා විගණනය
- විමර්ශන
- ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මෙහෙවර, වැඩ විෂයපථය, වගකිවයුතු බව, වගකීම් හා අධිකාරී බලය පිළිබඳ අර්ථ දක්වා ඇති අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය ස්වාධීන විගණන ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇති හැකියාව සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම සහ සැලසුම ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය වසර පුරාම සමාලෝචනය කරන ලදී.
- විදේශීය ශාඛාවල අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.
- 2018 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන කාර්ය සංග්‍රහය සමාලෝචනය කරන ලදී.
- කාලීන වරද නිවැරදි කරන ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයා ගැනීම් සහ ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී.
- ආයතනික සැලැස්ම හා නියමිත කාල රාමුව සමඟ මූලස්ථාන ඒකකවල අභ්‍යන්තර විගණන වාර්තා වල හඳුනාගත් කරුණු නිවැරදි කිරීම් සඳහා වූ පසු විපරම් පරීක්ෂාවෙන් කියවා බලන ලදී.
- චෙන්නායි ශාඛාවේ නව විගණකගේ පත්වීම නිර්දේශ කරන ලදී.
- 2018/2019 සඳහා චෙන්නායි ශාඛාව සඳහා වූ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තිය සම්මත කිරීම නිර්දේශ කරන ලදී.

ලංකා බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් විගණනය හා අධීක්ෂණය

- පරිපාලිත අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තියට අනුකූලව පරිපාලිත වල කරගෙන යන ලද විගණන සමාලෝචනය කරන ලද අතර මේ මඟින් බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල වගකිවයුතු බව හා අධීක්ෂණ ඉහළ නංවා තිබේ.
- පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල කාර්යසාධනය සමාලෝචනය කරන ලදී.

බාහිර විගණනය

බැංකුවේ බාහිර විගණන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ කමිටුවේ කාර්යභාරය පහත පරිදි වේ.

- රටේ ව්‍යවස්ථාව අනුව බාහිර විගණනය කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. ඵලදායී ලෙස හා ස්වාධීනව බාහිර විගණන කටයුතු කරගෙන යන බවටත් විගණන ප්‍රවේශය හා ක්‍රියා පිළිවෙත අනුව විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ අඛණ්ඩව සම්බන්ධතාවක් පවත්වාගෙන යන බවටත් කමිටුව සහතික වේ
- විගණකාධිපති විසින් පත්කරන ලද 2017 මුදල් වර්ෂය සඳහා විගණන කටයුතු කළ වරලත් ගණකාධිකාරීවරුන් වන KPMG විගණන සමාගමේ කලින් සේවය කළ විගණකයින් සමඟ සමාලෝචනයට යටත් වසර තුළ කමිටුව සංවෘත රැස්වීම් පවත්වා තිබේ. 2018 විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නියෝජිතයන් සඳහා සංවෘත රැස්වීමක්ද කමිටුව විසින් ලබා දී ඇත.
- 2017 මූල්‍ය වර්ෂය සඳහා විගණනයට අදාළව විගණකාධිපති විසින් පත්කළ විගණකවරුන් වන වරලත් ගණකාධිකාරීන්ද KPMG විගණන සමාගම විසින් හඳුනා ගන්නා ලද විගණන කරුණු සම්බන්ධයෙන් සමාලෝචනය කර පසු විපරම් කරන ලදී.
- 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ ගිණුම් කළමනාකරණ ලිපිය, ඊට සැපයූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර මත විගණකාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව සමාලෝචනය කොට, නියම කළ ආයතනික සැලැස්ම සමඟ අදාළ කරුණු නිවැරදි කිරීමටත්, ගන්නා නිවැරදි කිරීම පිළිබඳ ප්‍රගතිය පිළිබඳව පසු විපරම් කරනු ලැබීය.
- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විගණන වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය වේ යැයි සිතන ලද කරුණු සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

විගණන කමිටු වාර්තාව

- විගණකාධිපතිගේ නියෝජිතයන් සමඟ විගණනයෙන් පැන නගින සියලු අදාළ කරුණු සාකච්ඡා කරන ලදී.

යහපාලනය

කමිටුව පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය සහිතව බැංකුව තුළ ආයතනික යහපාලන පරිචය ස්ථිර කර ඇත්තේ කෙසේද යන්න සමාලෝචනය කර තිබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ අභ්‍යන්තර යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියාමනයන් යටතේ 3(8) (ii)(ජී), ඡේදය අනුව ලංකා බැංකුවේ හඳුනාගත් කරුණු පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව.

පැමිණිලි සඳහා පටිපාටිය - 'විසිල් බ්ලෝවින්' ප්‍රතිපත්තිය

පැමිණිලි භාර ගැනීම, රඳවා ගැනීම හා පිළියම් යෙදීම සඳහා දිගු කලක් තිස්සේ ස්ථාපිත 'විසිල් බ්ලෝවින්' ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. මෙම පැමිණිලි ගිණුම්කරණය, අභ්‍යන්තර පාලන දුර්වලතා, අල්ලස් සහ/ හෝ කොමිස් ගැනීම්, ව්‍යාජ ලේඛන සැකසීම, මුදල් විශුද්ධිකරණය, අභ්‍යන්තර තොරතුරු, ගනුදෙනු, සොරකම් හා වංචා බැංකුවේ වත්කම් අවභාවිතය, ව්‍යාජ තොරතුරු හෝ අවනියෝජනය හෝ ආචාර ධර්ම විරෝධී, නීති විරෝධී හෝ ආයතනික යහපාලනය භාරකාරත්වය, ප්‍රතිපත්ති හා ගැටෙන, බැංකුවේ මූල්‍ය හා කීර්තිනාමයට හානි කරන වෙනත් ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් යටත් වසර තුළ මෙම ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.

ප්‍රධාන අභ්‍යන්තර විගණක පැමිණිලි පිළිබඳ සුපරීක්ෂක ලෙස කටයුතු කරන අතර නියෝජ්‍ය කළමනාකාර ශ්‍රේණිය හා ඉන් ඉහළ ශ්‍රේණීන්හි කාර්ය මණ්ඩල සාමාජිකයන්ට එරෙහි පැමිණිලි අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටු සභාපතිවරයා වෙත යොමු කෙරේ.

කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඕනෑම නීත්‍යානුකූල ගැටලුවක් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට පොලඹවන අතර ඔවුනට නිර්නාමිකව හෝ සිය අනන්‍යතාව හෙළි නොකරන බවට ඉල්ලීමක් සහිතව ඉදිරිපත් කළ හැක. ගනුදෙනුකරුවන් හා පොදු මහජනතාවට සිය පැමිණිලි නිර්නාමිකව හා රහසිගතව පැමිණිලි සුපරීක්ෂක වෙත යොමුකළ හැකිය. ඔහු මෙම පැමිණිලි පිළිබඳව විමර්ශනය කොට ප්‍රතිපත්තියෙන් සඳහන් කාල සීමාව ඇතුළත ඒ පිළිබඳව විගණන කමිටුව වෙත අවශ්‍ය පරිදි වාර්තා කළ යුතුය.

කමිටු ඇගයීම

කමිටුවේ සඵලතාවය පිළිබඳ ඇගයීමක් වාර්ෂිකව කරන අතර ඒ පිළිබඳ ප්‍රතිඵල අධ්‍යක්ෂක මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. කෙසේ වෙතත් රටේ පැවැති නිතර වෙනස් වන දේශපාලන වාතාවරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 වසර පසු භාගයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ඇතිවූ වෙනස්කම් හේතුවෙන් විගණන කමිටුව සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර නැත. නව කමිටුව ප්‍රතිපත්තියක් ලෙස කාර්යසාධනය ඇගයීමට ලක්කරනු ලැබේ.

2018 වසර තුළ විගණන කමිටුවේ ක්‍රියාකළ සභාපතිවරයා සහ එහි සාමාජිකයින් විසින් ඉටුකළ වටිනා සේවය නව කමිටුව අගය කරයි.

මෙම වාර්තාවේ ආවරණය වූ කාල පරිච්ඡේදය අතරතුර (එනම් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ) කමිටුවේ වර්තමානයේ සේවය කරන සාමාජිකයන්ගෙන් කිසිවෙක් කමිටුවට සහභාගි නොවූ බවට වූ කරුණා කෙරෙහි කමිටුව අවධානය යොමු කෙරේ. වාර්තාව, එමනිසා ලේඛන මත පදනම් වන අතර එහි සත්‍යථාවය කෙබඳු දැයි පරීක්ෂා කර සැකයෙන් තොරව තහවුරු කරන ලදී.

මෙම වාර්තාව නිවැරදි හා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බව කමිටුවේ විශ්වාසයි.

කුමාර් මායාදුන්නේ
සභාපති
විගණන කමිටුව

2019 අප්‍රේල් 3 දින
කොළඹදීය.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියළුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම් ඉටු කරන්නට සහාය වීමයි. මේ පිළිබඳව කටයුතු කරද්දී කමිටුව ණය වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනය කරන්නේ උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු අනුසාරයෙනි.

ඉහත කරුණුවලට අමතරව කමිටුවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය මඟින් හඳුනාගෙන ඇති පහත සඳහන් අංග සමාලෝචනය සහ/හෝ නිර්දේශ පිළිබඳ වගකීමද පැවරී ඇත.

- අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය හා බැඳුණු ප්‍රතිපත්ති වැඩසටහන් හා කළමනාකරණ ප්‍රඥප්ති.
- අවදානම් සීමා හා ප්‍රධාන අවදානම් නිලධාරී විසින් නිර්දේශ කරන පරිදි ණය වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හෝ වෙනත් අවදානම් අභිරුචීන් ස්ථාපිත කෙරෙන ප්‍රතිපත්ති.
- ණය කමිටුව හා වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වැනි කළමනාකාරිත්ව මට්ටමේ සියලුම කමිටු වලට විශේෂිත අවදානම් පිළිබඳ අවධානය යොමු කරන්නට හා කමිටුව විසින් දක්වා ඇති ප්‍රචාරාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත මෙම අවදානම් කළමනාකරණයට ඇති ප්‍රමාණාත්මකතාවය හා සාඵල්‍යතාව .
- බැංකුවේ අවදානම් පැතිකඩ මෙන්ම ප්‍රවර්ධන වෙළෙඳපොළ හා නියාමන අවදානම් හා එබඳු අවදානම් හඳුනා ගැනීම/ මිණුම්කරණය/ අධීක්ෂණය හා පාලනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අවදානම් කළමනාකරණ වාර්තා.
- බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමන/ සුපරීක්ෂණ අවශ්‍යතාවය පදනම මත කමිටුව විසින් තීරණය කළ විචක්ෂණශීලී මට්ටම්වලට ඉහළින් වන විශේෂිත අවදානම වේ නම් එහි අනිසි ප්‍රතිඵල අවම කිරීමට පිළියම් යෙදීම.
- විශේෂිත අවදානම් හඳුනාගැනීමට අපොහොසත් වීම පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව උචිත පියවර ගැනීම සහ බැංකු කටයුතු සුපරීක්ෂක අධ්‍යක්ෂක හෝ වෙන යම් අයෙකු විසින් දුන් නියෝග ප්‍රකාර නිවැරදි කිරීමේ ක්‍රියා ක්‍රියාමාර්ග ගැනීම.
- ණය වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා අනුකූලතා අවදානම් හඳුනාගැනීම මිනුම්කරණය අධීක්ෂණය හා ලිහිල් කරන ක්‍රියාවලිය තුළ ප්‍රමාණාත්මකතාවය හා සඵලතාවය.

සංයුතිය හා ඝණ පූරණය

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ කමිටු සාමාජිකයින් පහත දැක්වේ.

- **සමන්ත රාජපක්ෂ මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 නොවැම්බර් 25 දින තෙක් කමිටුවේ සේවය කරන ලදි.
- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 ජූලි 20 දින තෙක් කමිටුවේ සේවය කරන ලදී.
- **එස් ආර් ආටිගල මහතා**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ 2018 නොවැම්බර් 25 දින තෙක් කමිටුවේ සේවය කරන ලදී.

2018 නොවැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීමත් සමඟ පහත සාමාජිකයන්ගෙන් කමිටුව සමන්විත විය.

- **නීල් ඒ උමගිලිය මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන
  අධ්‍යක්ෂ 2018 නොවැම්බර් 27 දින සිට 2018 දෙසැම්බර් 20 දක්වා.
- **විශාකා අමරසේකර මිය**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂිකා 2018 නොවැම්බර් 27 සිට 2019 පෙබරවාරි 27 දක්වා.
- **ඒ වී කේ මාධවී හේරත් මිය**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන
  අධ්‍යක්ෂිකා 2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා.
- **පී හර්ෂ විජයවර්ධන මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා.

2018 වසර තුළ මෙම කමිටුවේ සාමාජිකයන් වූ අධ්‍යක්ෂවරුන්ගේ සංක්ෂිප්ත විස්තරයන් පිටු 79 සිට 85 දක්වා ඇත.

2019 වසර සඳහා නව කමිටුව

2019 පෙබරවාරි මාසය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම අනුව:

- **කුමාර් මායාදුන්නේ මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
- **කේ ඒ විමලේන්තිරාජා මහතා**
  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ 2019 මාර්තු 19 සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.
- **පී ඒ ෂාෆ්ටර් මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

පිටු 26 සිට 27 දක්වා නව සාමාජිකයන්ගේ සංක්ෂිප්ත විස්තර දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ ස්ථිර කළමනාකරණ නියෝජිතයින්

- **ඩී එම් ගුණසේකර මහතා**
  මහා කළමනාකරු
  2018 පෙබරවාරි 21 තෙක් කමිටුවේ සේවය කරන ලදී.
- **සෙනරත් බණ්ඩාර මහතා**
  මහා කළමනාකරු
  2018 පෙබරවාරි 22 සිට කමිටුවේ සේවය කරනු ලැබේ.
- **ඩී එන් එල් ප්‍රනාන්දු මහතා**
  ප්‍රධාන අවදානම් නිලධාරී

කමිටුවේ ඝණ පූර්ණය සාමාජිකයන් දෙදෙනෙකි.

ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය කමිටුවේ ලේකම්තුමිය වශයෙන් ක්‍රියා කරයි. රැස්වීම් වලට සහභාගි වන ලෙස ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක සඳහා ආරාධනා කරනු ලැබේ. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට රැස්වීම් වලට ආරාධනය කරනු ලබන්නේ කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය වන විටයි.

රැස්වීම් හා ක්‍රියාකාරකම්

සමාලෝචනයට ලක් වූ වසර තුළ කමිටුව හය වතාවක් රැස්විය. මේ සෑම රැස්වීම්කදී කමිටු සාමාජිකයින්ගේ පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු 86 ඇති වගුව තුළ විදහා පෙන්වයි.

සමාලෝචනයන්ට බඳුන් වූ වසර තුළ කමිටුව ගන්නා ලද ක්‍රියාමාර්ග පහත පරිදි සාරාංශ ගත කොට ඇත.

- බැංකුවේ අවදානම් පැතිකඩ තක්සේරුව සඳහා පාදක වන පහත දැක්වෙන ප්‍රතිපත්ති සමාලෝචනය සහ/ හෝ නිර්දේශ කරන ලදී .
  - අ. ආතති පිරික්සුම් ප්‍රතිපත්තිය
  - ආ. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය .
  - ඇ. සීෂෙල්ස් - ශාඛාව හා ශ්‍රී ලංකා මෙහෙයුම් සඳහා මුදල් විශුද්ධිකරණය (ML) හා ත්‍රස්තවාදය සඳහා මුදල් සම්පාදනය පිටුදැකීම (CFT) පිළිබඳ ප්‍රතිපත්තිය.
  - ඈ. අල්ලස් හා දූෂණයට එරෙහි ප්‍රතිපත්තිය.
  - ඉ. සමූහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය.
  - ඊ. චෙන්නායි ශාඛාවේ ණය ප්‍රතිපත්ති අත්පොත.
  - උ. 2018 වසර සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මක තක්සේරු පිළිවෙත්.
  - ඌ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය.
  - ඔ. ව්‍යාපාර අඛන්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම - 2017.
  - ඕ. මාලදිවයින ශාඛාව හා ශ්‍රී ලංකා මෙහෙයුම් සඳහා අනුකූලතා ප්‍රතිපත්ති.
  - ඛ. 2017 - 2018 තුළ චෙන්නායි ශාඛාව සඳහා සයිබර් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා සයිබර් ආරක්ෂක ප්‍රතිපත්තිය.
  - ඒ. තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය.
- බැංකුවේ අවදානම් මාසික පදනමකින් බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් තක්සේරු කර සාරාංශගත වාර්තා කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කමිටුව එම වාර්තා සමාලෝචනය කොට ඒ පිළිබඳ විශේෂිත නිර්දේශ සමඟ කමිටු රැස්වීම් වාර්තා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
- 2018 වසර සඳහා අවදානම් අභිරුචිය සහ සීමා පැනවීම ස්ථාපිත කෙරුණි.
- සීමා ඉක්මවා පැතිර ගිය ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් අධීක්ෂණය කොට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කෙරුණි.
- නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාවය ප්‍රමාණය තක්සේරු කිරීම පිණිස අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කළ විස්තීර්ණ අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලදී.
- පරිපාලිතයන්ට අවදානම් ක්‍රියා ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට සහාය දක්වමින් පරිපාලිත අවදානම් කළමනාකරණ දර්ශක පුවරු සමාලෝචනය කරන ලදී. තවදුරටත් අවදානම් කළමනාකරණ අංශයෙන් කණ්ඩායමක් ඔවුන්ගේ අවදානම් හා සම්බන්ධ කරුණු වලට සහය වීම පිණිස පත්කර තිබේ.
- ශාඛා පද්ධතිය, තීරණාත්මක ව්‍යාපාරික අංශ හා උපකාරක සේවා අංශ තුළ ප්‍රධාන අවදානම් දර්ශක අධීක්ෂණය කරන ලදී.
- ව්‍යාපාරික අඛන්ඩතා සැලැස්ම (BCP) අධීක්ෂණය කර පෙරහුරු පවත්වන ලදී.
- කාර්තුමය පදනමකින් ආතති පිරික්සුම් ප්‍රතිඵල සමාලෝචනය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ අවදානම හා ඒ හා බැඳුණු සයිබර් ආරක්ෂාව කෙරෙහි විශේෂ අවධානයක් යොමුකොට බැංකුව සයිබර් ආක්‍රමණ වලින් සුරක්ෂිත කරනු වස් විවිධ ක්‍රියාමාර්ග (බැංකුවේ තොරතුරු ආරක්ෂණ ජාල යටිතල පහසුකම්, ව්‍යවසාය ගොඩනැගීමේ පද්ධතිය ආදිය) පසුවිපරම් සඳහා මුල් පිරිම් කරන ලදී.
- ඉස්ලාම් බැංකුකරණ ඒකකය සඳහා දැනට පවතින මෙහෙයුම් පටිපාටිය නැවත සාකච්ඡා කර විස්තීරණ මෙහෙයුම් අත්පොතක් සම්පාදනය කරන ලදී.
- නව තුන්වැනි පාර්ශ්ව අවදානම් තක්සේරු ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම අධීක්ෂණය කරන ලදී.
- තොරතුරු තාක්ෂණ අවදානම් හා බැඳුනු කරුනු කළමනාකරණය කිරීම පිණිස නව ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙක් පත් කිරීම නිර්දේශ කර වය ඉටු කරන ලදී.
- මූලස්ථානයේ දත්ත මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ යෝජනාව සමාලෝචනය කරන ලදී.
- ප්‍රධාන බැංකුකරණ පද්ධතියේ ප්‍රයෝජනයට නොගත් මොඩියුල හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරන ලදී.

- මුදල් විශුද්ධිකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඉන් පැන නඟින කරුනු විසඳීම අධීක්ෂණය කරන ලදි.

- සේවා නියුක්තිකයන්ගේ මිත්‍යාචාර හේතුවෙන් ඇතිවෙන අවදානම් සඳහා රක්ෂණ ආවරණ බැංකුවේ මීළඟ රක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචනයේදී ඇතුළත් කිරීම සමාලෝචනය කරන ලදී.

- වරලත් ගණකාධිකාරිවරුන් වන ප්‍රයිස් වෝටර් හවුස්කූපර්ස් ආයතනය තොරතුරු ආරක්ෂණ සමාලෝචනය කරගෙන යාමේදී හඳුනාගත් කරුණු සමාලෝචනය කරන ලදී.

- දත්ත හානි වැළැක්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කරන ලදී.

- ආයතනික හා මධ්‍ය ආයතනික ණයකරුවන් මැනීම පිණිස බැංකුවේ ආයතනික අංශය හා ශාඛා ජාල පරිශීලකයින් විසින් භාවිතා කරන දැනට පවතින ණයකරු මැනීමේ ආකෘතීන් වල ප්‍රගතිය සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

- වත්කම් හා වගකීම් කළමනාකරණ (AML) මොඩියුලය ස්වයංක්‍රියකරණයේ ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

- නීත්‍යානුකූල බලයක් නැතිව තාවකාලික බැංකු අයිරා සැලසීම වැලැක්වීම සඳහා ණය කමිටුව විසින් අනුමත කළ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවේ යොදවන ලදී.

- ව්‍යවසායක පුළුල් වංචා කළමනාකරණ මෘදුකාංගය ප්‍රසම්පාදන ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

- යෝජිත සියලු දෙයින් අංග සම්පූර්ණ ආපදා ප්‍රතිසාධනය කිරීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පසු විපරම් කරන ලදී.

- මූල්‍ය නොවන පරිපාලිතයින් සඳහා වූ පිරික්සුම් ලැයිස්තු වල අනුකූලතාවය සම්පූර්ණ කරන ලදී.

- විවිධ්‍ය තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණ වාර්තාවන්හි ප්‍රගතිය සමාලෝචනය සහ අවදානම් තත්ත්වයන් අවශෝෂණය කිරීම සඳහා පද්ධතිවල හැකියාව පිළිබඳ සිදුකරන ලද පරීක්ෂණ වල ප්‍රතිඵල විශ්ලේෂණය කරන ලදී.

- බැංකුවේ ඩිජිටල් පද්ධතීන්හි අඩුපාඩු පිළිබඳ හැදෑරීමක් සිදුකර එම පද්ධති වැඩිදියුණු කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කරන ලදී.

- බැංකුවේ තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය සහ තොරතුරු තාක්ෂණ ගිවිසුම් සමාලෝචනය කිරීම සහ/ හෝ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- බැංකුවේ ණය වර්ගීකරණ දර්ශකය/ පූරකය ආරම්භ කරන ලදී.

කමිටුව සිය කමිටු රැස්වීම් වාර්තා නිර්දේශය සහිතව ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළේය. කමිටුවේ සෑම කමිටු රැස්වීම් වාර්තාවක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සහතික කර සම්මත කර ගන්නා ලද අතර, කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. අඛණ්ඩ පදනමක් මත නොවිසඳුණු කරුනු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

සමාප්තිය

බැංකුව මුහුණ දෙනු ලබන විවිධ අවදානම් කමිටුව අඛණ්ඩව සමාලෝචනය කරන අතර අවදානම් අභිරුචිය නිර්ණය කිරීම, ආවරණය, මූල්‍ය අවදානම් මැනීම සඳහා නවීන ක්‍රමවේදයන් භාවිතය, අභ්‍යන්තර ප්‍රවීණතාව වර්ධනය සහ අවදානම් නිර්දේශ වාර්තා කිරීම, අවදානම් අනාවරණ සන්නිවේදනය කිරීම මෙන්ම ආතති පිරික්සුම් ප්‍රතිඵල, අනාගතයේ සිදුවිය හැකි දේ පිළිබඳව විශ්ලේෂණය, දත්ත විශ්ලේෂණය සහ අනෙකුත් බැංකු වල තත්ත්වයන් විශ්ලේෂණය කරමින් ශක්තිමත් අවදානම් පාලන රාමුවක් ගොඩනැගීම සඳහා සෑම උත්සාහයක්ම දරයි.

තාක්ෂණ අභිවර්ධනයන් සමඟ අවදානම් වැළැක්වීමේ උපාය සාර්ව ආර්ථික කම්පන මෙන්ම නිතර වෙනස් වන තත්ත්වය නිසා අවදානමට නිරාවරණය වීමේ හැකියාව ඉහළ යාම සහ බැංකු වංචා, සයිබර් අපරාධ විශාල තර්ජනයක් වීමට පටන් ගැනීම නිසා විමසිලිමත් වීමටත් යෝග්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීමටත් අවශ්‍ය බව කමිටුවේ අවබෝධයයි.

2018 වසර තුළ ඔවුන් විසින් දැක්වූ වටිනා දායකත්වය වෙනුවෙන් කමිටුවේ සාමාජිකයන්ට ස්තුති කිරීමට කමිටුව කැමැත්තෙමි.

2018 දෙසැම්බර් 31 අවසන් වසර තුළ එනම් මෙම වාර්තාවෙන් ආවරණය වන කාල පරිච්ඡේදය තුළ, කමිටුවේ වර්තමානයේ සේවය කරන කිසිම සාමාජිකයෙක් සහභාගි වූයේ නැති බවට වූ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබේ. වාර්තාව එම නිසා ලේඛන මත පදනම් වන අතර එම ලේඛන සැක දුරුකිරීම සඳහා සත්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව තහවුරු කරනු ලැබේ. මෙම වාර්තාව නිවැරදි හා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බවට වර්තමාන කමිටුවේ විශ්වාසයයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්

කුමාර් මායාදුන්නේ
සභාපති
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2019 අප්‍රේල් 3 දින
කොළඹදීය.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්ය භාරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකාව තුළ ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ බැංකු පනත යටතේ නිකුත්කර ඇති 2007 අංක 11 දරණ නියාමනයන් මත කමිටුවේ ප්‍රධාන වගකීම මූලික වශයෙන් පදනම් වී ඇත.

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) සම්බන්ධයෙන් වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිගමනය කිරීම.
- මහා කළමනාකරු (GM) හා KMP සඳහා අරමුණු හා ඉලක්ක නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක කාල පදනමක් මත කාර්යසාධනය ඇගයීම හා කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනිකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලයට අදාල කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධාන ව්‍යුහය නිශ්චය කිරීම.

සංයුතිය හා ගණ පූරණය

සමාලෝචනයට බඳුන්වූ වසර තුළ කමිටු සාමාජිකත්වය පහත දැක්වෙන පරිදි වේ.

- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  (2018 ජූලි 20 දින ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඔහු ඉල්ලා අස් වන තෙක්)
- **රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතීඥ,**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  (2015 පෙබරවාරි 27 සිට 2018 නොවැම්බර් 18 දක්වා)
- **එස් ආර් ආටිගල මහතා**
  සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ (2016 මැයි 11 සිට 2018 නොවැම්බර් 18 දක්වා)

2018 නොවැම්බර් මාසය තුළ සිදුවූ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම් නිසා කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

- **නීල් ඒ උමගිලිය මහතා**
  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **විශාකා අමරසේකර මිය**
  සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂිකා
- **එච් ඉසුරු බාල බාලපටබැඳි මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

2018 දෙසැම්බර් 20 දින ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙන් නීල් ඒ උමගිලිය සහ ඉසුරු බාලපටබැඳි මහතුන් ඉල්ලා අස් වූ අතර 2019 පෙබරවාරි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශාකා අමරසේකර මියගේ සේවය අවසන් කරන ලදී.

2018 වසර තුළ සාමාජිකයින් වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර මෙම වාර්තාවේ පිටු 79 සිට 85 දක්වා ලබා දී ඇත.

2019 වසර සඳහා වූ නව කමිටුව

2019 පෙබරවාරි මාසය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම නිසා 2019 මාර්තු 19 සිට ක්‍රියාත්මක වන පරිදි මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට පහත සඳහන් අධ්‍යක්ෂවරුන් පත් කරන ලදී.

- **කේ ඒ විමලේන්තිරාජා මහතා**
  සභාපති/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
- **කුමාර් මායාදුන්නේ මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **පී ඒ ෂාෆ්ටර් මහතා**
  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

පිටු 25 සිට 27 දක්වා ඉහත සාමාජිකයන්ගේ විස්තර දක්වා ඇත.

මහා කළමනාකරුට අදාළ කරුණු සම්බන්ධයෙන්යෙන් සාකච්ඡා කරන විට හැර අනෙක් සියලුම රැස්වීම් වලට මහ කළමනාකරු සහභාගී වේ. නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) හා කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට රැස්වීම් වලට සහභාගි වීමට ආරාධනය කරනු ලබන්නේ කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය වන විටයි. ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය කමිටුවේ ලේකම්තුමිය ලෙස ක්‍රියා කරයි.

රැස්වීම් හා ක්‍රියාකාරකම්

කමිටුවේ ප්‍රඥප්තියට අනුකූලව නීතියෙන් හෝ අදාළ රීති හා රෙගුලාසි වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ඕනෑම විටෙක කරන ඉල්ලීමක් මත සහ/ හෝ කමිටුවේ සභාපති අවශ්‍යයැයි සිතන විට මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව රැස් කළ හැකි ය. කමිටුවේ අඩු සාමාජික සංඛ්‍යාවක් සිටීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 වසර තුළ සිදුවූ ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් සමාලෝචනයට බඳුන් වූ වසර තුළ කමිටුව විකම වතාවක් පමණක් රැස් විය. පිටු අංක 86 හි රැස්වීමට සහභාගි වූ සාමාජිකයින් සංඛ්‍යාව ලබා දී ඇත. කමිටු රැස්වීම්වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සභාගත කර ස්ථිර කර ඇති අතර කමිටුව විසින් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනු ලැබේ. තවමත් නොවිසඳුණු කරුණු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2007 අංක 11 දරණ කලින් සඳහන් බැංකු පනත යටතේ නියාමනයන් අනුව, අධ්‍යක්ෂවරුන්ට අදාල පාරිශ්‍රමික ප්‍රතිපත්තිය කමිටුව විසින් නිගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ලංකා බැංකුව සම්බන්ධයෙන්, බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් අනුව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික නිගමනය කරනු ලැබේ. 1938 අංක 53 දරණ ලංකා බැංකු ප්‍රඥප්තියේ නියෝග හා එහි සංශෝධන ද මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබේ. ඉහත කරුණු මත පදනම්ව සුදුසු ලෙස සකස් කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුවට තිබෙන අතර රජය විසින් නව රෙගුලාසි නිකුත් කරන විට ඒවා සමාලෝචනය කරනු ලැබේ. වාර්ෂික පදනමකින් වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂවරුන්ට ලබාදෙන පාරිශ්‍රමික වල විස්තර අනාවරණය කර ඇත .

මහා කළමනාකරුගේ හා නියෝජ්‍ය මහා කළමනාකරුවන්ගේ (DGM's) සඳහා වූ අරමුණු හා ඉලක්ක ආයතනික සැලැස්මේ හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර ඇත. නියෝජ්‍ය මහා කළමනාකරුවන් මාර්ගයෙන් ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි වගකීමත් මහා කළමනාකරුවෙත පැවරේ. ආයතනික සැලැස්ම අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව අදාළ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් සහකාර මහා කළමනාකරුවන් වෙත ඉලක්ක ලබාදී තිබේ.

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් කමිටුව සිදුකර තිබේ.

- ආයතනික සැලැස්මට අනුකූලව වසර ආරම්භයේ දී සියලු ඉලක්ක මත පදනම්ව මහා කළමනාකාරු ඇතුළු ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ (KMP) 2017 න් අවසන් වූ වසර සඳහා කාර්යසාධන ඇගයීම. සහකාර මහා කළමනාකරුවන්ගේ කාර්යසාධනය ඔවුන්ගේ ප්‍රධානීන් වන නියෝජ්‍ය මහා කළමනාකරුවන් මඟින් ඇගයුමට ලක් කෙරේ.

- කමිටුවේ ප්‍රඥප්තිය අනුව 2017 වසර සඳහා එහි වාර්ෂික කාර්යසාධනය කමිටුව ඇගැයුමට ලක් කරන ලදී

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් හා එහි ප්‍රතිඵලයක් ලෙස කමිටුවේද සාමාජිකයන්ගේ සංඛ්‍යාව අඩුවීම නිසා වසර තුළ සිදුවූ කමිටුවේ සංයුතිය සම්බන්ධව සිදු වූ වෙනස්කම් හේතුවෙන් පහත ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෘජුවම භාරගන්නා ලදි.

- ලංකා බැංකු ප්‍රඥප්තියේ නියෝග වලට අනුව බැංකුව භාරව ඇති අමාත්‍යාංශයේ අනුමැතිය සමඟ වසර තුනකට වරක් සංශෝධනය කරනු ලබන ප්‍රධාන කළමනාකාරණ පුද්ගලයින්ගේ (KMP) වැටුප් 2018 - 2020 කාල සීමාව සඳහා සංශෝධනය කරන ලදී.

- ආයතනික සැලැස්මට අනුකූලව වසර ආරම්භයේ දී නියම කල ඉලක්ක වලට එදිරිව ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ මැදි වසර කාර්යසාධනය සමාලෝචනය කිරීම.

සමාප්තිය

කමිටුව එහි කලින් සිටි සාමාජිකයන්ගේ සේවය අගය කිරීම වාර්තා කිරීමට කැමැත්තෙන් සිටී.

කමිටුව ඒ යටතේ වන සියලුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම් සඳහා වගකීම් ගැනීම අඛණ්ඩව කරගෙන යනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයට එහි අධීක්ෂණ වගකීම් මානව සම්පත් හා පරිශ්‍රමික ප්‍රඥප්තියේ සම්බන්ධවීමේ නියාමනයන් අනුව ඉටු කිරීමට සහාය වීම නොකඩවා සිදුවනු ඇති අතර මානව සම්පත් කළමනාකරණය තුළ විශිෂ්ඨ පිළිවෙත් යොදා ගැනීම ධෛර්යමත් කෙරේ.

කමිටුවේ දැනට සේවය කරන කිසිම සාමාජිකයෙක් මෙම වාර්තාව මඟින් ආවරණය වන කාල පරිච්ඡේදය තුළ, එනම් 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර තුළ, සහභාගි වී නිබුණේ නැත. වාර්තාව එම නිසා පදනම් වී ඇත්තේ ලේඛන මත වන අතර එහි සත්‍යතාව නිවැරදි දැයි පරීක්ෂා කර සැකයෙන් තොරව තහවුරුකර තිබේ. මෙම වාර්තාව නිවැරදි හා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බවට වර්තමාන කමිටුවේ විශ්වාසයයි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්,

කේ ඒ විමලේන්තිරාජා
සභාපති
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2019 අප්‍රේල් 3 දින
කොළඹදීය.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

නාමයෝජනා සහ ආයතනික යහපාලනය පිළිබඳ කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්ය භාරය

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවට ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන කරුනු සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත.

- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම තෝරාගැනීම/පත්කිරීම පිළිබඳ පටිපාටීන් ක්‍රියාත්මක කිරීම.
- මහා කළමනාකාර තනතුර හා ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා පත්කිරීම/ උසස් කිරීම් වෙනුවෙන් සුදුසුකම් පළපුරුද්ද හා ප්‍රධාන යෝග්‍යයතා නිර්ණායක සැකසීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරනු ලැබූ ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියම යටතේ අංක 3 (3) දරණ නියමයන් සඳහන් නිර්ණායක වල නිශ්චිතව දක්වා ඇති පරිදි අදාල තනතුරු දැරීමට මහා කළමනාකාරවරයා සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් යෝග්‍ය සහ සුදුසු බව සහතික කිරීම.
- ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම සඳහා අනුප්‍රාප්තික වැඩ පිළිවෙළ සහ අතිරේක/නව ප්‍රවීණතා අවශ්‍යතාවයන් පිළිබඳව විටින් විට සලකා බැලීම හා නිර්දේශ කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වල සඵලතාවය වාර්ෂිකව ඇගයීම් උදෙසා කාලානුරූපව ක්‍රමෝපාය නිශ්චය කොට ක්‍රියාත්මක කිරීම හා වාර්ෂික කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සඳහා සහාය වීම.
- බැංකු ආචාර ධර්ම සංග්‍රහය සමාලෝචනය කිරීම.
- ආයතනික යහපාලන ප්‍රතිපත්ති හා අනුකූල වීමේ මට්ටම නිශ්චය කිරීම.

කමිටුවේ සංයුතිය

සමාලෝචනයට බඳුන්වූ වසර තුළ කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වේ.

- **රොනල්ඩ් සී පෙරේරා මහතා**
  ජනාධිපති නීතීඥ

  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  2018 නොවැම්බර් 18 තෙක් කමිටුවේ සේවය කරන ලදී.

- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  2018 ජූලි 20 දින තෙක් කමිටුවේ සේවය කරන ලදී.

- **එස් ආර් ආටිගල මහතා**

  සාමාජික/ ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

  2018 නොවැම්බර් 25 තෙක් කමිටුවේ සේවය කරන ලදී.

2018 නොවැම්බර් මස තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීමත් සමඟ.

- **විශාඛා අමරසේකර මහත්මිය**

  සභාපතිනිය/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂිකා

  2018 නොවැම්බර් 27 සිට 2019 පෙබරවාරි 27 තෙක්

- **එච් ඉසුරු බාලපටබැදි මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා

- **ජී හර්ෂ විජයවර්ධන මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා

2018 වසර තුළ කමිටුවේ සාමාජිකයින් වූ අධ්‍යක්ෂවරුන්ගේ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 79 සිට 85 දක්වා ලබා දී ඇත.

2019 වසර සඳහා නව කමිටුව

2019 පෙබරවාරි මාසය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම නිසා

- **රොනල්ඩ් සී පෙරේරා මහතා**
  ජනාධිපති නීතීඥ

  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

- **කේ ඒ විමලේන්තිරාජා මහතා**

  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ

  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

- **පී ඒ ෂාෆ්ටර් මහතා**

  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

නව සාමාජිකයින්ගේ පිළිබඳ විස්තර පිටු 25 සිට 27 දක්වා ලබා දී ඇත.

මහා කළමනාකරු රැස්වීම් වලට සහභාගි වනු ලබන්නේ ආරාධනා කිරීමෙනි. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට රැස්වීම් වලට ආරාධනය කරනු ලබන්නේ ඔවුන්ගේ පැමිණීම කමිටුවට අවශ්‍ය කරන විටයි. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය කමිටුවේද ලේකම්තුමිය ලෙස ක්‍රියා කරයි.

රැස්වීම්

සමාලෝචනයට බඳුන්වූ වසර තුළ කමිටුව දෙවරක් රැස්විය. මෙම සෑම රැස්වීම්කදීම කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ වාර්තාවේ 86 වන පිටුවේ ඇති වගුව තුළ ලබා දී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටු රැස්වීම් වල සියලුම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සභාගත කොට සම්මත කෙරෙන අතර කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඒ ආකාරයෙන් ලබා ගනු ලැබේ. නොවිසඳුණු කරුණු පිළිබඳවත් ක්‍රමානුකූල පසුවිපරම් කටයුතු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත්කිරීම්

ඉහතින් සඳහන් කළ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියමයන්ට අනුව, නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව නව අධ්‍යක්ෂවරුන් තේරීමේ/ පත් කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවත් ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කල එහි පූර්ණ හිමිකරු ශ්‍රී ලංකා රජය වන බැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම බැංකු අංශය හාර ඇමති විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන අනුව සිදුකරනු ලබයි. එමනිසා අධ්‍යක්ෂවරුන් පත් කිරීමට නාම යෝජනා හා ආයතනික යහපාලන කමිටුව සම්බන්ධ නොවේ.

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්

- පහත දෑ සමාලෝචනය කර නිර්දේශ කරන ලදී

    - ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රවේශය පිළිබඳ ප්‍රතිපත්තිය.

    - ආයතනික කළමනාකාරිත්ව හා විධායක කළමනාකාරිත්ව සඳහා අනුප්‍රාප්තික සැලැස්ම.

- නිලධාරීන් කළමනාකාරිත්ව කණ්ඩායමට පත්කළ හෝ උසස් කළ විට ඔවුන් එම තනතුරු දැරීමට නිසි හා යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කිරීම.

- කලින් වසර සඳහා කමිටුවේ කාර්යසාධන ඇගයීමට ලක් කරන ලදී

සමාප්තිය

කමිටුව ලංකා බැංකුව තුළ ප්‍රශස්ත යහපාලන පරිචයන් පවත්වාගෙන යාමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

2018 වසර තුළ කමිටුවේ සාමාජිකයින් වශයෙන් ක්‍රියාකළ අධ්‍යක්ෂවරුන්ට කමිටුවේ ස්තුතිය හිමිවේ.

මෙම වාර්තාවෙන් අනාවරණය වන කාල පරිච්ඡේදය තුළ (එනම් 2018. 01.01. දින සිට 2018 .11. 18 දක්වා අධ්‍යක්ෂ/ සභාපති ලෙස සේවය කළ රොනල්ඩ් සී පෙරේරා මහතා) කමිටුවේ වර්තමානයේ සේවය කරන සාමාජිකයින් ගෙන් වැක් අයෙක් පමණක් සහභාගී විය. වාර්තාව එමනිසා ලේඛන මත පදනම් වී ඇති අතර එහි සත්‍යතාවය නිවැරදිද යන්න පරීක්ෂා කර සැකයෙන් තොරව තහවුරු කරන ලදී. වාර්තාව නිවැරදි හා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බවට වර්තමාන කමිටුවේ විශ්වාසයයි.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්

රොනල්ඩ් සී පෙරේරා
සභාපති
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

2019 අප්‍රේල් 3 දින
කොළඹදීය.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්යභාරය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) කමිටුව ප්‍රධාන වශයෙන් පහත දෑ සඳහා වගකීම දරනු ලැබේ.

- බැංකුවේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ සම්පාදන හා සේවා අධීක්ෂණය කිරීම ඒවා තක්සේරු කරන ආකාරය හා කළමනාකරණය කරන ආකාරය ඇගයීමට ලක් කිරීම, තාක්ෂණික සේවා සහ යෙදවුම් කෙරෙහි බලපාන මිනුම් දඬු හා ප්‍රධාන ක්‍රියාකාරී අනාවරණයන් සමාලෝචනය කිරීම.
- දැනට පවතින හා අනාගත තොරතුරු තාක්ෂණික සේවා සහ යෙදවුම් සුමට හා බාධාවකින් තොරව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය ප්‍රතිපත්ති හා පටිපාටීන් යොදා තිබේද යන්න සහතික කිරීම.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ නිරාවරණ කළමනාකරණය කිරීම් සඳහා සංචරණ හා තුලන අධීක්ෂණය කිරීම හා ඇගැයීම.
- තොරතුරු හා සන්නිවේදන උපකරණ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වන වීහි අවසාන අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට කරන නිර්දේශ සමාලෝචනය කිරීම.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ සේවා හා යටිතල පහසුකම් බැංකුවේ තොරතුරු තාක්ෂණ මාර්ගෝපදේශ සමඟ බැඳී තිබේ ද යන්න සහතික කිරීම.
- ව්‍යවසායක තොරතුරු තාක්ෂණ දෘෂ්ටි කෝණයකින් බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ග හා සැලසුම් පිළිබඳ විවේචනාත්මක තක්සේරුවක් ලබාදීම.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ නිෂ්පාදන හා සේවා ප්‍රධාන ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා සමඟ ගැලපී තිබේ ද යන්න සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- බැංකුවේ ආපදා ප්‍රතිකර්මීය පහසුකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සමාලෝචනය කර නිර්දේශ කිරීම.
- සියලුම තොරතුරු තාක්ෂණ ආරක්ෂණය සම්බන්ධයෙන් වූ උපායමාර්ග හා ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කොට නිර්දේශ කිරීම.

කමිටුවේ සංයුතිය

කමිටුවේ ප්‍රථම සාමාජිකයන් පහත පරිදි වේ.

- **ජී හර්ෂ විජයවර්ධන මහතා**

  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා

- **ජී ලලින් ජී විතාන මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා

- **එච් ඉසුරු බාලපටබැඳි මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2018 නොවැම්බර් 27 සිට 2018 දෙසැම්බර් 20 දක්වා

මෙම කමිටුවේ සාමාජිකයන් වූ අධ්‍යක්ෂවරුන් ගේ කෙටි විස්තර මෙම වාර්තාවේ පිටු 79 සිට 85 දක්වා ලබා දී ඇත.

2019 වසර සඳහා නව කමිටුව

2019 පෙබරවාරි මස අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත් කිරීම නිසා

- **ජී ඒ ෂාෆ්ටර් මහතා**

  සභාපති/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

- **කුමාර් මායාදුන්නේ මහතා**

  සාමාජික/ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී,

- **කේ ඒ විමලේන්තිරාජා මහතා**

  සාමාජික/ විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ
  2019 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි.

පිටු 25 සිට 27 දක්වා නව සාමාජිකයින්ගේ විස්තර ලබා දී ඇත.

මහා කළමනාකරු, තොරතුරු තාක්ෂණ ප්‍රධානී, නියෝජ්‍ය මහ කළමනාකරු (නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන) සහ ප්‍රධාන අවදානම් නිලධාරී ආරාධනයෙන් රැස්වීමට සහභාගී වේ. කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය කරන විට කාර්ය මණ්ඩලය අනෙකුත් සාමාජිකයින්ට රැස්වීමට සහභාගී වන ලෙස ආරාධනය කරනු ඇත. ලේකම් ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

රැස්වීම්

2018 ජූලි 09 දින මෙම කමිටුව ස්ථාපිත කිරීමට තීරණය ගන්නා ලදී. කෙසේ වුවත්, 2018 නොවැම්බර් 27 දින කමිටුවට සාමාජිකයින් පත් කරන ලද අතර සමාලෝචනයට බඳුන් වූ වසර තුළ එක් වරක් රැස්විය. මේ රැස්වීමේදී සාමාජිකයන්ගේ පැමිණීම මෙම වාර්තාවේ 86 වන පිටුවේ ඇති වගුව තුළ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී කමිටු රැස්වීම් වල වාර්තා සභාගත කොට සම්මත කරන ලද අතර කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මෙසේ ලබා ගනු ලැබේ. අඛණ්ඩ පදනමක් මත නොවිසඳුණු කාරණා සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ ඉටු කළ ක්‍රියාකාරකම්.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටු ප්‍රඥප්තියේ ප්‍රමාණාත්මකතාවය සමාලෝචනය කරන ලද අතර වෙනස්කම් ද නිර්දේශ කරන ලදී.

- 2019 - 2021 සඳහා වූ ආයතනික සැලැස්ම මත පදනම් වූ කාල සීමා දක්වා ඇති ක්‍රියාකාරී සැලැස්ම සමඟ 2019 - 2021 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ තොරතුරු තාක්ෂණ අංශය සඳහා උපායමාර්ගික සැලැස්ම පිහිටුවමින් බැංකුවේ තොරතුරු තාක්ෂණ සැලැස්ම සඳහා වූ කාල සීමා සමාලෝචනය කරන ලදී.

සමාප්තිය

වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ ඵලදායකත්වය හා වර්ධන කාර්ය භාරය පිළිගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව ස්ථාපිත කරන ලදී. කමිටුව එහි කාර්ය භාරය ක්‍රමයෙන් විකාශනයට ලක්වන බව පිළිගන්නා අතර තාක්ෂණික උපායමාර්ග සම්පාදනය කිරීමටත්, බැංකුව තුළ ඵලදායී හා ආරක්ෂිත තාක්ෂණය භාවිතා කිරීම සහතික කිරීමටත්, බැංකුවේ තාක්ෂණික සංවර්ධනය සඳහා වූ උපදෙස් සම්බන්ධයෙන් ඇගැයීමටත් උපදෙස් ලබාදීමටත් බැංකුවේ මූල්‍ය හා නියාමන බැඳීම් සපුරා දීමට තාක්ෂණය, ප්‍රතිපත්ති හා පටිපාටීන් නිර්දේශ කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීමටත් කමිටුවේ සේවය ලබාදේ.

2018 වසර තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුවේ සේවය කළ සාමාජිකයින් සඳහා ප්‍රශංසාවක් සටහන් කරනු කැමැත්තෙමු.

කමිටුවේ දැනට සේවය කරන කිසිම සාමාජිකයෙක් මෙම වාර්තාව මඟින් ආවරණය වන කාල පරිච්ඡේදය තුළ, එනම් 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර තුළ, සහභාගි වී තිබුණේ නැත. වාර්තාව එමනිසා පදනම් වී ඇත්තේ ලේඛන මත වන අතර එහි සත්‍යතාව නිවැරදි දැයි පරීක්ෂා කර සැකයෙන් තොරව තහවුරු කර තිබේ. මෙම වාර්තාව නිවැරදි හා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලින් තොර බවට වර්තමාන කමිටුවේ විශ්වාසයයි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව වෙනුවෙන්



ප්‍රකාශ් ඒ ෂාෆ්ටර්
සභාපති
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව

2019 අප්‍රේල් 3 දින
කොළඹදීය.

අවදානම් කළමනාකරණය

මෙම බැංකුව, ආර්ථික චක්‍රයන් හා අභ්‍යන්තර මෙන්ම බාහිර අභියෝග තුළදී ප්‍රත්‍යාස්ථ වීමේ අරමුණ ඇතිව, අවදානම් හා ආදායම කළමනාකරණය සම්බන්ධයෙන් සාකල්‍ය හා ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරයි. ලංකා බැංකුවේ පරිපූර්ණ අවදානම් කළමනාකරණ රාමුව බැංකුව සිසාරා ඒකීය ලෙස අවදානම් කළමනාකරණය සහතික කරන නිරවුල්ව නිර්වචනය කළ තන්ත්‍රණ ව්‍යූහයන්ගෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ප්‍රතිපත්ති රාමුවලින් හා සවිඥානක අවදානම් සංස්කෘතියකින් සමන්විත වෙයි.

විශේෂතා 2018

සමස්ත බැංකු අවදානමේදී වටිණාකම



ද්‍රවශීල වත්කම් අනුපාතය



තෝලන අනුපාතය



අරමුදල් සපයාගැනීමේ සංයුතිය



14.6%

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය

මතුවෙමින් ඇති අවදානම්

පද්ධතීය වශයෙන් වැදගත් බැංකුවක් ලෙස ලංකා බැංකුව විහි අවදානම් ප්‍රතිරූපය මත බලපෑමක් ඇති කරන බාහිර පීඩනයන් සංකලනයකට මුහුණ දෙයි. අපි අපගේ අවිනිශ්චිතතාව සංතරණය කිරීම හා සවිඥානකව අවදානම් දැරීම බලගැන්වීම සඳහා අපගේ අවදානම් භූදර්ශනය ස්ථාවර ලෙස නිරීක්ෂණයට ලක් කිරීම මඟින් මෙම මතුවන අවදානම් හඳුනා ගැනීමට හා ඒවාට අභික්‍රියාකාරී ලෙස ප්‍රතිචාර දැක්වීමට පරිශ්‍රම දරමු. මෙම අවදානම්වල සංශ්ලිප්තයක් පහත දක්වා ඇති අතර එය මෙම වාර්තාවේ 52 වැනි පිටුවෙහි වෙළඳපොළ ඉඩප්‍රස්ථා හා අවදානම් පරිච්ඡේදය සමඟ බද්ධ කොට කියැවිය යුතු වේ. පහත ඉදිරිපත් කර ඇති අවදානම් වනාහි පෙර නොවූ විරූ තාක්ෂණ ප්‍රගමණයන්, ගනුදෙනුකාර ඉල්ලුම් ජනසංයුතික වෙනස්කම් මෙන්ම සාමාජීය හා පාරිසරික අභියෝග යන මේවා හමුවේ ඇති අවිනිශ්චිත බවින් වැඩි වන මෙහෙයුම් පරිසරය වෙතින් පැන නඟින ඒවාය.

බැංකුවේ ව්‍යාපාර ආකෘතිය හා අභ්‍යන්තර කාරක සාධක වෙතින් එන සාම්ප්‍රදායික අවදානම් මෙම වාර්තාවේ පසු කොටස් තුළ විස්තරාත්මකව සාකච්ඡා කෙරෙනු ඇත.

තොරතුරු තාක්ෂණවේද හා සයිබර් අවදානම්

ගනුදෙනුකාර අපේක්ෂාවන්ට හා තරඟකාරීත්වයට අනුකූල දෘඪ හා සුරක්ෂිත තාක්ෂණය අත්කරගෙන පවත්වා ගෙන යාමට අසමත් වීමෙන් පැනනඟින අවදානම් වේ. සයිබර් ප්‍රහාරවලින් හෝ පද්ධති, ජාල හෝ දත්ත සමුදායන් තුළට කඩා වැදීමෙන් සයිබර් අවදානම් මතු වන අතර විහි ප්‍රතිඵල ලෙස ගනුදෙනුකාර දත්ත අහිමි වීම, මෙහෙයුම් කඩාකප්පල් වීම හෝ කීර්තිනාමයට හානි වීම සිදු වේ.

හානි අවම කිරීමේ සාධක

- ශක්තිමත් තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හා නිරවුල්ව නිර්වචනය කළ වගකීම් ඇතුළත් ශක්තිමත් තොරතුරු තාක්ෂණ තන්ත්‍රණය
- නිරන්තරයෙන් සිදුකරන අවදානමට නිරාවරණය වූ තොරතුරු තාක්ෂණ පද්ධති පිළිබඳ තක්සේරු කිරීම්
- අබණ්ඩ දෘඩාංග හා මෘදුකාංග උත්ශ්‍රේණිගත කිරීමේ ආයෝජන
- ස්වාධීන පාර්ශ්ව විසින් තොරතුරු තාක්ෂණ විගණන

පුද්ගල බද්ධ

සංවිධානයට ගැලපෙන දක්ෂයින් අත්කර ගැනීමේ හා තබා ගැනීමේ දුෂ්කරතා සහ සේවකයාට ගනුදෙනුකාර අපේක්ෂා ඉටු කිරීමට හා බැංකුවේ උපායමාර්ගය මෙහෙයවීමට නොහැකිකම වෙතින් පැන නඟින අවදානම්.

හානි අවම කිරීමේ සාධක

- නිපුණතා හා ප්‍රවීණතා සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජන
- ජ්‍යේෂ්ඨ මගපෙන්වීම හා දැනුම බෙදාහදා ගැනීම දිරිගන්වන සංවිධාන සංස්කෘතිය
- සේවක දායකත්වයන් අගය කරනු පිණිස පිළිගැනීමට ලක් කිරීමේ වැඩසටහන්

තොරතුරු අවදානම්

සාවද්‍ය දත්ත හා ගනුදෙනුකාර තොරතුරු සුරැකීමට නොහැකිකම හේතුවෙන් මෙහෙයුම් කඩාකප්පල් වීම් හෝ කීර්තියට හානි වීම්

හානි අවම කිරීමේ සාධක

- ශක්තිමත් තොරතුරු තාක්ෂණ පාලන විධි රාමුව
- තොරතුරු ආරක්ෂාව පිළිබඳ අබණ්ඩ සේවක පුහුණුව

අවදානම් කළමනාකරණය

වෙනස් වන ගනුදෙනුකාර අපේක්ෂාවන්

තාක්ෂණයේ නොසිතූ විරූ දියුණුවත් සමඟ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් විපරිණාමනය වී ඇති අතර ඔවුහු සිය අවශ්‍යතාවන්ට ගැලපෙන සේවා යෙදවුම් හරහා ක්ෂණික විසඳුම් ඉල්ලීම වැඩි වී ඇත. මෙම ගතික බලයන්ට සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් තරඟකාරී තත්ත්වය, විශේෂයෙන්ම තරුණ/ සහශ්‍රක ගනුදෙනුකාර පදනම අහිමි වීමට මගපෑදිය හැකිය.

හානි අවම කිරීමේ සාධක

- ස්වයං සේවා හා බහු-චාහිනී ආකෘතිය මෙහෙයවන ඩිජිටල් උපායමාර්ගය
- තරුණ ගනුදෙනුකාර කාණ්ඩය ඉලක්ක කරන නව්‍ය විසඳුම්
- ඩිජිටල්කරණය කේන්ද්‍ර කර ගත් සන්නිවේදන උපායමාර්ග



තරඟකාර පීඩනයන්

වඩා කුඩා වඩා සුචල්‍ය තරඟකරුවන් වඩා වේගයෙන් වෙළඳපොළ වෙනස්වීම් වැළඳගැනීමේ දක්ෂ වෙති.

සුනම්‍ය, වේගවත් හා පහසු විසඳුම් පිරිනමන මූල්‍යතාක්ෂණ සමාගම් වැනි සාම්ප්‍රදායික නොවන ක්‍රියාකාරකයින් වෙතින් තරඟය උත්සන්න වීමෙන් බැංකුවේ තරඟකාරී වාසිය සෝදාපාළු විය හැක.

හානි අවම කිරීමේ සාධක

- විශ්වාසය, ස්ථාවරත්වය, රාජ්‍ය හිමිකාරිත්වය හා තහවුරු කළ කාර්ය වාර්තාව මත පදනම් වූ සුවිශේෂී තරඟකාරී වාසිය
- වැඩි දියුණු කළ ගනුදෙනුකාර පහසුව හා පහසුවෙන් පිවිසිය හැකි වූ ඩිජිටල්කරණ උපායමාර්ගය

රාජ්‍ය ප්‍රතිපත්තිය

බදු ක්‍රමයෙහි වෙනස් වීම්, ආනයන සීමාවන්, මුදල් ප්‍රතිපත්ති ප්‍රතිශෝධන සහ සහන ණය යෝජනාක්‍රම වැනි රාජ්‍ය ප්‍රතිපත්ති වල බලපෑම් බැංකුවෙහි මෙහෙයුම් මත හා එහි අවදානම් කෙෂ්ත්‍රය මත සෘජු බලපෑමක් ඇති කරයි.

හානි අවම කිරීමේ සාධක

- ජාත්‍යන්තර විශිෂ්ටතම පිළිවෙත් සමඟ උසස්ම ප්‍රමිතියේ බැංකුකරණ පිළිවෙත
- ප්‍රත්‍යාබල පරීක්ෂාවන් හා සිද්ධිරූපන විශ්ලේෂණ හරහා යථාරූපී සිදුවීම් හඳුනා ගැනීම

අවදානම් කළමනාකරණ රාමුව



අවදානම් කළමනාකරණ පාලන ව්‍යූහය

බැංකුවේ අවදානම් පාලන ව්‍යූහය අවදානම් හඳුනා ගැනීම, මිනීම, කළමනාකරණය, නිරීක්ෂණය හා වාර්තා කිරීම සඳහා වූ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල මෙන්ම විධායක මට්ටමේ අවදානම්-ආශ්‍රිත පාලන කමිටුවල කාර්ය පැවරුම් සංවිධානය සිසාරා සියලුම ප්‍රභේදවල අවදානම් පිළිබඳව වගවීම සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල හා විධායක කර්තව්‍යයන් ගෙන් සමන්විත අවදානම් පාලන ව්‍යූහය ප්‍රස්ථාරිකව පහත දැක්වේ:



අධ්‍යක්ෂ මණ්ඩලය

අවදානම්-ආදායම් ගතිකයන් උචිත ලෙස සමබර කර ගන්නා ආකාරයකින් බැංකුවෙහි අවදානම් කළමනාකරණය කෙරෙන බවට වගබලා ගැනීම පිළිබඳව අවසන් වගකීම දරන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. මෙම රාජකාරි ඉටු කිරීමෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් අභිරුචිය නිර්ණය කිරීම, අවදානම් කළමනාකරණ රාමුව සැකසීම, අවදානම් වලට ඒකාකාරී ලෙස පිළියම් යෙදෙන බව තහවුරු කරන ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සැකසීම සහ නිර්වචනය කළ අවදානම් අභිරුචියට සාපේක්ෂව අවදානම් ව්‍යාප්තිය ස්ථාවර ලෙස නිරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විගණන කමිටුව හා මෑතදී පත්කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව (ICTC) යන මේවා අධ්‍යක්ෂ මණ්ඩලයට සිය අවදානම් ආශ්‍රිත වගකීම් ඉටුකිරීමෙහිලා සහාය වෙති.

අවදානම් කළමනාකරණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත ඒවාද ඇතුළු අවදානම් කළමනාකරණයේ සියලුම පැතිකඩ සම්බන්ධයෙන් වූ අධීක්ෂණ වගකීම් ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වෙයි.

- අවදානම් කළමනාකරණය ආශ්‍රිත ප්‍රතිපත්ති, වැඩසටහන් හා කමිටු ප්‍රඥප්ති සමාලෝචනය කිරීම
- අවදානම් සීමා නියම කිරීම සහ සියලු මුඛ්‍ය අවදානම් නිරාවරණයන් සඳහා අවදානම් අභිරුචිය නිර්ණය කිරීම
- අවදානම් ආශ්‍රිත කළමනාකරණ මට්ටමේ කමිටුවල සඵලදායිත්වය සමාලෝචනය කිරීම
- අවදානම් හඳුනා ගැනීමේ, මැනීමේ, නිරීක්ෂණය කිරීමේ හා හානි අවම කිරීමේ සඵලදායිත්වය හා සප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම
- අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව අගැයීමේ ක්‍රියාවලියට (ICAAP) අනුකූලව බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව නිර්ණය කිරීම
- දුබලතා හඳුනා ගෙන අවදානම් හානි අවම කිරීමට යෝජනා කරනු පිණිස කාලීනව ආතති පරීක්ෂාව සමාලෝචනය කිරීම
- බැංකුවේ ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම (BCP) සමාලෝචනය කිරීම

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD)

මෙම අංශයෙහි ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ප්‍රධානත්වය දරන අතර ආදායම් උත්පාදනය කරන උපායමාර්ගික ව්‍යාපාර ඒකක කෙරෙන් ස්වාධීන අංශයකි. එය ස්වාධීන අවදානම් තක්සේරු සිදුකරන අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සිය කාර්යය ඉටු කිරීමට සහය වෙයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයෙහි වගකීම්වලට පහත ඒවාද ඇතුළත්ය:

- ආතති සිද්ධිරූපනයන් මාලාවක් භාවිතා කරමින් ප්‍රාග්ධනය හා ඉපැයීම් මත බලපෑම මනිනු පිණිස නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදුකිරීම
- පරිපූර්ණ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලියක් පිළියෙළ කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිශ්චිත මුඛ්‍ය අවදානම් දර්ශක, අවදානම් පරාසය හා සීමාවන් ඇතුළත් කරමින් අවදානම් අභිරුචිය සකස් කිරීම
- පළමු ආරක්ෂක වළල්ල විසින් අවදානම් හඳුනා ගැනීම, නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සඳහා උපකාර කිරීම
- අවදානම් හානි අවමකාරක හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම
- ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලැස්ම සඵලදායී ලෙස ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම
- බැංකුවේ නව සේවා හා යෙදවුම් ක්‍රියාවලි පිළිබඳ අවදානම් තක්සේරු සිදුකිරීම
- අභ්‍යන්තර නියැලවීම, සන්නිවේදනය හා පුහුණු වැඩසටහන් හරහා බැංකුව තුළ අවදානම් පිළිබඳව දැනුවත් හා සවිඥානක සංස්කෘතියක් පෝෂණය කිරීම

ප්‍රතිපත්ති රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත පරිපූර්ණ ප්‍රතිපත්ති කුලකය මඟින් සංවිධානයේ සියලු මට්ටම් සිසාරා නියත හා ක්‍රමානුකූල ආකාරයකට අවදානම් හඳුනා ගැනීම, මැනීම, හානි අවම කිරීම හා වාර්තා කිරීම සිදුකෙරෙන බවට වගබලා ගනී. ප්‍රතිපත්ති නිතිපතා සමාලෝචනය හා ප්‍රතිශෝධනය කිරීම සිදු කෙරෙනුයේ මතුවන අවදානම් ආමන්ත්‍රණයෙහිලා කර්මාන්තයේ විශිෂ්ටතම පිළිවෙත් හා අදාළත්වය සහතික වන පරිද්දෙනි. මෙම වර්ෂය තුළ බැංකුව කවර හෝ ස්වරූපයක අල්ලස වැළැක්වීම හා පිටුදැකීම පිණිස වූ මාර්ගෝපදේශ නිරවුල්ව දක්වමින් අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. පිහිටුවා ඇති අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්තිද දක්වා ඇත.



ත්‍රිත්ව ආරක්ෂක මාර්ග ආකෘතිය

මෙම බැංකුව ගෝලීය පිළිගැනීම ඇති ත්‍රිත්ව ආරක්ෂක මාර්ග ආකෘතිය අනුගමනය කරන අතර එය වගකීම් බෙදීයාම නිරවුල්ව දක්වමින් අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිළිබඳව වගවීම හා විනිවිදභාවය සහතික කරයි. මෙම ආකෘතිය කාර්යභාර වෙන්කිරීම හරහා විශේෂිකෘත කුසලතා පෝෂණය කිරීමටද ඉඩසලසයි.

1st පළමු ආරක්ෂක වළල්ල

ව්‍යාපාරික ඒකක මඟින් අවදානම් හිමිකාරිත්වය

- අවදානම් ගැනීම හා අවදානම් හිමිකාරිත්වය
- අවදානම් එදිනෙදා කළමනාකරණය කිරීම
- අවදානම් ප්‍රතිපත්ති අනුකූලව ක්‍රියා කිරීම
- අභ්‍යන්තර පාලනවිධි හා අවදානම් ප්‍රතිචාර ව්‍යාවහාරයේ යෙදීම

2nd දෙවන ආරක්ෂක වළල්ල

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානම් කළමනාකරණය

- අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කිරීම
- මාර්ගෝපදේශකත්වය සැපයීම
- නිරීක්ෂණය, වාර්තා කිරීම හා අවදානම් පාලනය
- පළමු ආරක්ෂක වළල්ල (ව්‍යාපාරික ඒකක) අවදානම් හිමිකාරිත්වය දරන බවට වගබලා ගැනීම

3rd තුන්වන ආරක්ෂක වළල්ල

විගණන කාර්යය මඟින් සහතික වීම

- පළමු හා දෙවන ආරක්ෂක වළලුවල සඵලදායිත්වය පිළිබඳව ස්වාධීන හා වාස්තවික සහතිකයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීම

අවදානම් සංස්කෘතිය

මෙම බැංකුව අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය හා උත්සන්නය සම්බන්ධයෙන් සියලුම සේවකයින් වගකියන අවදානම් දැනුවත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. ව්‍යාපාරික කටයුතු නිවැරදිව කිරීම කෙරෙහි අවධාරණයක් සහිතව බැංකුවේ චර්යාධර්ම සංග්‍රහය අනුව වූ චර්යාවක් ප්‍රදර්ශනය කිරීම සේවකයින්ගෙන් අපේක්ෂා කෙරේ. ත්‍රිත්ව ආරක්ෂක මාර්ග ආකෘතිය ද අවදානම් ආශ්‍රිත වගකීම් නිරවුල්ව වෙන් කර දීම හරහා ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ව්‍යාප්ත කිරීම සඳහා පහසුකම් සලස්වා ඇත. නීතිපතා පුහුණු වැඩසටහන්, වැරදිකරුවන් හෙළිකිරීම ආශ්‍රිත කාර්යපටිපාටි පිළිබඳව දැනුවත් කිරීම හා සේවක මැදිහත් වීම් හරහා බැංකුවේ සාරධර්ම හා චර්යාධර්ම ප්‍රතිසවිගැන්වීම මඟින්ද අවදානම් සංස්කෘතියක් පෝෂණය වීම සිදුවී ඇත.

ප්‍රත්‍යාබල පරීක්ෂාව

සාර්ව ආර්ථික ප්‍රවණතා හා වෙනත් ස්පෘශ්‍ය සිදුවීම් කෙරෙහි බැංකු අවදානම් ව්‍යාප්තිය දක්වන සංවේදීතාව ඇගයීම සඳහා ප්‍රත්‍යාබල පරීක්ෂාව භාවිතා කෙරේ.

එය ව්‍යාපාරික ක්‍රියාවලි කීපයක් - එනම් සංස්ථායික සැලසුම්කරණය, ප්‍රාග්ධන ක්‍රමසම්පාදනය හා කළමනාකරණය, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, සීමාවන් වෙනස් කිරීම හා නිරාවරණයන් ප්‍රතිශෝධනය කිරීම වැනි අවදානම් හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග සහ අවදානම් ආශ්‍රිත වාදවිෂයන් පිළිබඳව පාර්ශ්වකාර සන්නිවේදනයට උපකාර කිරීම සඳහා උපකාරී වෙයි. මණ්ඩලය අනුමත කළ ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තියට අනුකූලව නිති ප්‍රත්‍යාබල පරීක්ෂාව සිදුකෙරෙන අතර ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව හා ලාභ ඉපැයීමේ හැකියාව මත විභව්‍ය බලපෑම් පිළිබඳව තක්සේරු කෙරේ.

අවදානම් වාර්තාකරණය

නිතිපතා අවදානම් වාර්තාකරණය බැංකුවෙහි අවදානම් කළමනාකරණ රාමුවෙහි අන්තර්ගත කොටසක් වන අතර බලපෑමක් ඇති මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් අභික්‍රියාකාරී ලෙස සන්නිවේදනය කරනු පිණිස කැප වූ කණ්ඩායම් ස්ථානගතව සිටිති. නිර්වචනය කළ අවදානම් අභිරුචියට සාපේක්ෂව නිත්‍ය පදනම්න් අවදානම් නිරාවරණයන් හා අවදානම් ව්‍යාප්තිය වාර්තා කෙරෙනුයේ සේවා හා යෙදවුම්, භූගෝලීය කලාප හා ව්‍යාපාරික ඒකක වැනි විවිධ මට්ටම් හරහා වර්ගීකරණයෙන් යුක්තවය. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මාසික පදනම්න් හා අවශ්‍ය පරිදි හා අවස්ථාවේදී මාසික පදනම්න් වූ අවදානම් දර්ශක පුවරුවක්ද ඇතුළත් පරිපූර්ණ අවදානම් වාර්තාවක් ලබා ගනී.

2018 අවදානම් ව්‍යාප්තිය

අවදානම් අභිරුචිය

බැංකුව සිය උපායමාර්ගික න්‍යායපත්‍රය හඹායාමෙහිලා ගැනීමට කැමති අවදානමේ ප්‍රමාණය අවදානම් අභිරුචිය මඟින් පිළිබිඹු කෙරෙන අතර එය ප්‍රකාශ කෙරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචි ප්‍රකාශයක ස්වරූපයෙන්ය. අවදානම් අභිරුචි ප්‍රකාශය සකස් කිරීමෙහිලා බැංකුවේ සංස්ථායික සැලැස්ම හා අවදානම හා ආදායම අතර රිසි සමතුලිතතාව කෙරෙහි නිසි සැලකිල්ල යොමු කෙරේ. මෙම ප්‍රකාශයට සාමාන්‍යයෙන් නිරවද්‍යකාරක කළමනාකරණ ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික කරන අවදානම් හඳුනාගන්නා ක්‍රමවේද හා ඉඩහරින සහන සීමාවන් ඇතුළත්ය. අවදානම් අභිරුචි ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික පදනම්න් හෝ අවශ්‍ය ලෙස හා අවශ්‍ය විට සමාලෝචනය කෙරේ.

අවදානම් කළමනාකරණය

අවදානම් සමූහය

බැංකුවේ මුඛ්‍ය අවදානම් නිරාවරණයන් පහත රූපසටහන තුළ සාරාංශ කෙරේ:



ණය අවදානම

ණය අවදානම නිර්වචනය කෙරෙනුයේ ණය ගනුදෙනුවක ප්‍රතිපාර්ශ්වය වකඟ වූ නියමයන් අනුකූලව සිය වගකීම්භාරයන් සපුරාලීමට අසමත් වීම නිසා පැනනඟින විභව්‍ය අවදානම් ලෙසය.

ණය අවදානම පැහැර හැරීමේ අවදානමක සහ ප්‍රතිපාර්ශ්වයන් භූගෝලීය කලාප හෝ කර්මාන්ත ක්ෂේත්‍ර ඔස්සේ සංකේන්ද්‍රනය වීමක ස්වරූපය ගත හැකිය.

බරතැබූ වත්කම්වලින් 91% ක් වූ ණය අවදානම මෙම බැංකුවෙහි මුඛ්‍ය අවදානම් නිරාවරණයන්ගෙන් වකකි. බැංකු ශේෂ පත්‍රයේ පිලිබිඹු වන සෘජු ණයදීමේ ක්‍රියාකාරකම්වලට අතිරේකව, මූල්‍ය ඇපකර, ණයවර ලිපි හා නිකුත් කරනු ලබන ප්‍රතිග්‍රහණ වැනි ශේෂ පත්‍රයෙන් බැහැර ගනුදෙනු ණය අවදානම් වෙත මගපාදයි.

බරතැබූ වත්කම්වලින් 91% ක් වූ ණය අවදානම මෙම බැංකුවෙහි මුඛ්‍ය අවදානම් නිරාවරණයන්ගෙන් වකකි. බැංකු ශේෂ පත්‍රයේ පිලිබිඹු වන සෘජු ණයදීමේ ක්‍රියාකාරකම්වලට අතිරේකව, මූල්‍ය වගකීම් සහතික, ණයවර ලිපි හා නිකුත් කරනු ලබන ප්‍රතිග්‍රහණ වැනි ශේෂ පත්‍රයෙන් බැහැර ගනුදෙනු ණය අවදානම් වෙත මගපාදයි.

ණය අවදානම පාලනය

බැංකුවේ ණය අවදානම් කළමනාකරණය එහි ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය අනුව පාලනය කෙරෙන අතර තනිපුද්ගල වගකීම හා සාමූහික අධීක්ෂණය මත දැඩිව යැපේ. මෙම ප්‍රතිපත්තිය නිරවුල්ව ණය අවදානම් ගැනීම පිළිබඳව මුලධර්ම නියම කරන අතර සංවිධානය සිසාරා ණය අවදානම් පිළිබඳව නිති හඳුනා ගැනීම, කළමනාකරණය හා වාර්තා කිරීම සඳහා වූ රාමුව නිර්වචනය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය මට්ටමේදී සාමාන්‍යාධිකාරී ප්‍රධානත්වය දරන ණය කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා කළමනාකරණය කරනු ලැබේ. ණය කමිටුවේ වගකීම්වලට ණය අවදානම් රුචි සීමාවන් සැකසීම, සමාලෝචනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, බලය පැවරූ සීමාවන් දක්වා ණය අනුමත කිරීම, බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නියාමන පිළිපැදීම සහතික වීම, සහ අවදානම් සංකේන්ද්‍රණයන් නිරීක්ෂණය ඇතුළත් වේ. ණය අවදානම් කළමනාකරණය සඳහා වූ ප්‍රාථමික වගකීම ව්‍යාපාරික ඒකක වෙත පවතින අතර ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ ණය අවදානම් ඒකකයේ ස්වාධීන සමාලෝචනයේ උපකාරය ඒවාට ලැබේ.

ණය අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුවේ මුඛ්‍ය සංරචක මෙහි ඉදිරිපත් කෙරේ:

ප්‍රතිපත්ති රාමුව

බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති රාමුව අවදානම් ශ්‍රේණිකරණය, ණය කළඹ කළමනාකරණය හා ණය සමාලෝචනය ආදිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ප්‍රතිපත්ති කුලකයකින් සමන්විත වෙයි. මුඛ්‍ය අංශයන්ට රාජකාරි වෙන් කිරීම, පරිපූර්ණ ණය ඇගැයීම් යාන්ත්‍රණ, පවරන ලද අධිකාරිබල සීමාවන් හා විචක්ෂණ සීමාවන් ඇතුළත්ය. වෙළඳපොළ තත්ත්වයන්ට හා පරිනාමණය වන විශිෂ්ටතම පිළිවෙත්වලට අදාළ වීම සහතික වනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකෙරේ.



රාජකාරි වෙන් කිරීම

ඇගයීම් මාර්ගෝපදේශ සවිලදායීව හා වාස්තවිකව ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගැනීමට ඉඩ සලසමින්, මුදල් සැපයීමට පෙර ඇගයීම හා අනුමැතියට පසු නිරීක්ෂණය සඳහා වගකීම නිරවුල්ව වෙන් කරනු ලැබේ. අළුත් ණය, පවතින ණය දීර්ඝ කිරීම සහ පවතින ණය පහසුකම්වල සැලකිය යුතු වෙනස්කම් අදාළ අනුයෝජිත බලධාරීන්ගේ අනුමැතියට යටත්ය. ඒ අතර යම් පිවිසුම් මට්ටමකට ඉහළ පහසුකම් ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ස්වාධීන ලෙස සමාලෝචනය කෙරේ.

ඇප වත්කම් කළමනාකරණය

විභව්‍ය ණය ගෙවීම් පැහැර හැරීම මගහැරවීමේ ද්විතියික මගක් වශයෙන් ඇපයක් ලබා ගන්නා අතර එය මුදල්, රන්, දේපළ, ස්ථාවර වත්කම්, ණයවර ලිපි, ණයගැතියෝ හා අයවිය යුතු දේ වැනි දෙන පහසුකමට ප්‍රමාණවත් ආවරණයක් සහතික කරනු පිණිස ඇපය නිති තක්සේරු කෙරේ. මූල්‍ය නොවන ඇප ස්වාධීන තුන්වන පාර්ශ්ව ලවා තක්සේරු කෙරේ.

ණය ශ්‍රේණිකරණයන්

සංස්ථායික නිරාවරණ ඇගයීමේදී හා පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීමේදී ගනුදෙනුව හා ණයගැනුම්කරු සඳහා විශේෂිත සාධක භාවිතා කරන අවදානම් ශ්‍රේණිකරණ ආකෘති භාවිතා කෙරේ. ණයගැනුම්කාර අවදානම් ශ්‍රේණිකරණ පද්ධතිය විසින් පාදක ණය ගුණාත්මකතාව මත යැපෙමින් සියලු සක්‍රීය සංස්ථායික ණය ශ්‍රේණි 8 කට වර්ගීකරණය කරයි. ශාඛා ණය ඇගයීමේදී ගනුදෙනුකරුට ගැලපෙන ලෙස සැකසූ ණය ලකුණු දීමේ පත්‍රිකා භාවිතා කෙරේ. අපි බාසල් II යටතේ වූ අභ්‍යන්තර අවදානම් ශ්‍රේණිකරණය ක්‍රියාත්මක කිරීම කරා ප්‍රගතිය ලබමින් සිටිමු.

වගකීමෙන් යුතු ණය දීමේ සංස්කෘතිය

ණය ඇගයීම පිළිබඳව අඛණ්ඩ පුහුණු වැඩසටහන්, වැඩමුළු හා වෙබ් පාදක ඉගෙනුම් මොඩියුල මෙන්ම ප්‍රගුණ කරවීමේ හා දැනුම බෙදාදීමේ සංස්කෘතිය මඟින් අවදානම් දැනුවත් හා වගකීමෙන් යුතු ණයදීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම උදෙසා දායකත්වය ලැබී තිබේ. වසර තුළ අපි පුහුණු කිරීම් මාලාවක් හරහා මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ ණය ඇගයීම් නිපුණතා දියුණු කිරීම කෙරෙහි යොමු වී ඇත.

ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ණය-පූර්ව අනුමැතිය

- ව්‍යුහගත ණය ඇගයීම් යාන්ත්‍රණ හා නිර්වචනය කළ ණය නිර්ණායක
- බහුවිධ අනුමත කිරීමේ අධිකාරිබල මට්ටම්
- අවදානම් ශ්‍රේණිකරණ හා ලකුණුදීමේ පද්ධති
- සංකේන්ද්‍රණ අවදානම සඳහා විචක්ෂණීය සීමා
- ප්‍රධාන අවදානම් නිලධාරී විසින් ස්වාධීන සමාලෝචනය

පශ්චාත් ණය නිරීක්ෂණය

- දෘඩතර ණය සමාලෝචන යාන්ත්‍රණය
- ණය කළඹ ඇගයීම
- තෝරාගත් නිරාවරණයන් සමාලෝචනය
- සැලකිලිමත් විය යුතු ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම
- ප්‍රත්‍යාබල පරීක්ෂා හා සිද්ධිරූපණ විශ්ලේෂණ

අවදානම් නිරීක්ෂණය හා වාර්තා කිරීම

ප්‍රතිපත්ති රාමුව/ ආකෘති සංවර්ධනය හා වලංගු කිරීම

ණය අවදානම් පාලනය

ප්‍රමුඛ ක්ෂේත්‍ර/ 2018 තුළ සංවර්ධනය

- කර්මාන්තයට විශේෂිත සංවර්ධිත ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ
- කර්මාන්තයේ විශිෂ්ට පිළිවෙත හා පිබිද එන වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු කරනු පිණිස ශාඛා ණය දීම සඳහා තෝරාගත් හා වර්ධිත ණය ලකුණු පත්‍ර
- ණය ගුණාත්මකතා තහවුරු වීකකයේ පුළුල් කරන ලද විෂයපථය
- ශ්‍රේණිකරණය පාදක කරගත් ණයදීම ක්‍රියාත්මක කිරීම
- අවදානම් පාදක මිලකරණය හඳුන්වා දීම
- අපගේ මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ ණය ඇගයීම් කුසලතා ශක්තිමත් කිරීමේ අරමුණින් කළ පුහුණු වැඩසටහන් හා වැඩමුළු
- සියලු ණය ආශ්‍රිත කාර්යපටිපාටි අත්පොත් සඳහා වෙබ් පෝටලය සංවර්ධනය කිරීම

ණය අවදානම් සමාලෝචනය කිරීම 2018

ගෙවීම් පැහැර හැරීමේ අවදානම්

වර්ෂය තුළ උග්‍රවෙමින් පැවති ආර්ථික තත්ත්වයන් හේතුවෙන් කළඹ ගුණාත්මකතාව මත කර්මාන්ත ව්‍යාප්ත බලපෑමක් ඇති කළ අතර කර්මාන්තය සිසාරා හානිකරන ප්‍රතිපාදන වැඩිවීමක් ඇති වුණි. බැංකුවේ ණය හා අත්තිකාරම් 24% කින් වර්ධනය වූ අතර වර්ෂය තුළ හානිකරන ප්‍රතිපාදන අයකිරීම් 48% කින් වැඩි විය. කර්මාන්ත ණය ගුණාත්මකතාවෙහි දුර්වල වන ප්‍රවණතාව හඳුනා ගනිමින් බැංකුව මෙහි දක්වා ඇති පරිදි අක්‍රීය ණය පිවිසීම අඩාල කිරීමේ ක්ෂණික හා දීර්ඝකාලීන ක්‍රියාමාර්ග ගත්තේය. බැංකුව ණය වයස්ගත වීම් විශ්ලේෂණය හා සංචලනයන් නිරීක්ෂණය මත අඛණ්ඩ අවධානය යොමු කරන අතරම යම් කර්මාන්ත, ගනුදෙනුකරුවන් හා බණ්ඩ වෙත ණයදීමේදී සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් යොදා ගෙන ඇත.

අවදානම් කළමනාකරණය

අවදානම් ශ්‍රේණිකරණය අනුව වර්ගිකරණය කළ ණය කළඹ



ණය කලඹ ගුණාත්මකතාව සුරැකීම

කෙටි කාලීන: දිප ව්‍යාප්ත අයකර ගැනීමේ පරිශ්‍රම

සමාලෝචිත හා තර කරන ලද අවදානම් අභිරුචිය

දීර්ඝ කාලීන: ශක්තිමත් කරන ලද ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා ප්‍රතිරක්ෂණ ප්‍රමිති

ණය ඇගයීම පිළිබඳ පුහුණුව හරහා වැඩි දියුණු කළ ණය සංස්කෘතිය.

සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම පැනනගින්නේ ප්‍රතිපාර්ශ්වයක්/ කණ්ඩායමක්, ක්ෂේත්‍රයක්, නිෂ්පාදනයක් හෝ කලාපයක් වෙත ඉහළ ණයදීම් නිරාවරණය මඟිනි. සංකේන්ද්‍රණ අවදානම මැනීමේදී හර්ෆින්ඩාල් හර්ශ්මන් දර්ශකය භාවිතා කෙරේ. ස්වාධීන වී්කාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, ණය කමිටුව හා වී්කාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව නම, භූගෝලීය, ක්ෂේත්‍ර හා නිෂ්පාදන වැනි අවදානම් රුචි ප්‍රකාශයන් තුළ නිර්වචනයව ඇති නිරාවරණය සීමාවන්ට සාපේක්ෂව මෙම අවදානම් නීති නිරීක්ෂණය කරයි. මෙම සීමාවන් මෙහෙයුම් ක්ෂේත්‍රය තුළ මතුවන ප්‍රවණතාවන්ට ඇති අදාළත්වය තහවුරු කරනු පිණිස නිතිපතා සමාලෝචනය හා නවීකරණය කෙරේ.

නාම සංකේන්ද්‍රණය: යම් විශේෂිත කේවළ ණය ගැනුම්කරුවන් වෙත විශාල නිරාවරණයන් නාම සංකේන්ද්‍රණ අවදානම මතු කරන අතර එය කේවළ ණය ගැනුම්කාර සීමාව හා හර්ෆින්ඩාල් හර්ශ්මන් දර්ශකය භාවිතයෙන් නිරීක්ෂණය කෙරේ. පෞද්ගලික අංශ ණයදීම් ක්‍රියාකාරකම් තුළ සැලකිය යුතු නාම සංකේන්ද්‍රණ අවදානමක් නොමැත.

ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සමඟ උපායමාර්ගිකව දිශාගතව ඇති රාජ්‍ය බැංකුවක් වශයෙන් ලංකා බැංකුව, රජය හා රාජ්‍ය සතු ව්‍යාපාරවලට ප්‍රමුඛ ණයදෙන ආයතනයකි. කෙසේවුවද, මෙම පහසුකම් සඳහා රාජ්‍ය මහා භාණ්ඩාගාරයේ වගකීම් සහතිකය ඇති බැවින් වී්වා සාමාන්‍යයෙන් සැලකිය යුතු ණය අවදානමකට බැංකුව පත් නොකරයි.

නිෂ්පාදන සංකේන්ද්‍රණය

නිෂ්පාදන නිරාවරණ අංශයෙන් බැංකුව මනා සේ විවිධාංගීකෘත ණය කළඹක් පවත්වා ගෙන යයි. විශාලතම නිරාවරණයන් වන්නේ පිළිවෙලින් අත්තිකාරම්වලින් 21% ක් වූ වාර ණය, අයිරා හා පුද්ගලික ණයයි.

නිෂ්පාදන අනුව සංකේන්ද්‍රණය



ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය

ලංකා බැංකුවේ සමස්ත වත්කම් නිරාවරණය පිළිබඳ කර්මාන්ත වර්ගීකරණයද එහි රාජ්‍ය ණය වෙත නැඹුරුව පිළිබිඹු කරන අතර සමස්ත ණය කළඹෙන් 35% ක් ස්වෛර්ී හා සෘජු රාජ්‍ය නිරාවරණයයි. ණය අවදානම් රහිත මෙම අංශය හැරුණු විට, 2018 වර්ෂයේදී නිවාස, ඉදිකිරීම් හා යටිතල පහසුකම් 15% ක්ද, පරිභෝජන 15% ක්ද, වාණිජ වෙළඳ ණය 9% ක්ද විය. වර්ෂය තුළ සියලුම නිරාවරණයන් අවදානම් රුචි සීමාවන් ඇතුළත පවත්වා ගෙන යන ලදී.

ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය



ඇප සුරැකුම් නිරාවරණය

2018 දී බැංකුවේ ණයදීම් වලින් 62% ක් ඇප සුරැකුම් මඟින් සුරක්ෂිත වූ අතර සුරැකුම් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්/ වගකීම් සහතික හා දේපළ විය.

ඇප සුරැකුම් නිරාවරණය



දේශසීමා හරහා නිරාවරණය

ගනුදෙනුකරුවන් වෙතින් ගෙවීම් ලබා ගැනීමට බැංකුවට ඇති හැකියාව සීමා කරමින් විදෙස් රාජ්‍ය ගන්නා ක්‍රියාමාර්ග මඟින් දේශසීමා හරහා අවදානම් පැනනගී. ලංකා බැංකුවේ දේශසීමා හරහා නිරාවරණය වීම ඉන්දියාව, මාලදිවයින, සීෂේල්ස් හා චික්සත් රාජධානිය තුළ සිදුවන මෙහෙයුම් වලින් පැනනගින අතර එය 2018 දෙසැම්බර් අග වන විට 5% ක්ව පැවතුණි. සියලු එතෙර ශාඛා පූර්ව නිර්ණිත ණය සීමාවන් සහිතව ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිති නිරීක්ෂණය කෙරේ.

වෙළඳපොළ අවදානම

පොළී අනුපාතික, විදේශ විනිමය අනුපාතික, කොටස් මිල හා භාණ්ඩ මිල වැනි වෙළඳපොළ විචල්‍යයන්හි අහිතකර සංචලනයන් හේතුවෙන් ඇති වන මූල්‍ය උපකරණ කළඹක ඉපැයීම්, වෙළඳපොළ හෝ අනාගත මුදල් ප්‍රවාහයන් යනාදියෙහි ඇති වන විපර්යාසයන් වෙතින් පැනනඟින විභව්‍ය අලාභයන් ලෙස වෙළඳපොළ අවදානම නිර්වචනය කළ හැකිය.

මෙම බැංකුව වෙළඳපොළ අවදානම් වර්ග තුනකට නිරාවරණය වේ:

- බැංකුවේ වෙළඳ පොතින් හා වෙළඳ නොවන පොතින් පැනනඟින පොළී අනුපාතික අවදානම
- විදෙස් ගනුදෙනුවලින් පැනනඟින විදේශ විනිමය අවදානම
- ස්කන්ධ මිල ගණන් වල වෙනස් වීමෙන් පැනනඟින ස්කන්ධ අවදානම්

වෙළඳපොළ අවදානම නිරාවරණය

බැංකුවේ ප්‍රධාන වෙළඳපොළ අවදානම් නිරාවරණය එහි වෙළඳ හා බැංකුකරණ පොත්වල පොළී අනුපාතික අවදානම වෙතින් පැනනඟින අතර එය සාමූහිකව සමස්ත වත්කම්වලින් 90% කි. වර්ෂය තුළ සමස්ත විදේශ විනිමය නිරාවරණය හා රන් තත්ත්වය ප්‍රාග්ධන අරමුදල් වල කොටසක් ලෙස 0.02% ක්ව පැවති බැවින් විදේශ විනිමය අවදානම් නිරාවරණය අල්ප විය. ස්කන්ධ වෙළඳ කළඹ ශේෂ පත්‍රයෙන් 0.2% ක් පමණක් වූ බැවින් ස්කන්ධ අවදානම වෙත බැංකුවේ නිරාවරණය සීමිත විය.

වෙළඳපොළ අවදානම් පාලනය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව බැංකුවේ වෙළඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මෙන්ම වෙළඳපොළ අවදානම ආශ්‍රිත වෙනත් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබාදීම සඳහා වගකියයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව බැංකුවේ වෙළඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මෙන්ම වෙළඳපොළ අවදානම ආශ්‍රිත වෙනත් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබාදීම සඳහා වගකියයි. විධායක මට්ටමේදී, වෙළඳපොළ අවදානම නිර්වචනය කළ අවදානම් අහිරුවිය ඇතුළත පවතින බවට වගබලා ගනු පිණිස වෙළඳපොළ අවදානම කළමනාකරණය කිරීමේ රාමුව ක්‍රියාත්මක කිරීම හා පරිණත වීමේ නොගැලපීම්, අත්තිකාරම් හා තැන්පතු නිරීක්ෂණය කිරීමේ වගකීම, වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව වෙත පැවරේ.

භාණ්ඩාගාර මැදි කාර්යාලය, මහා භාණ්ඩාගාර ඒකකය කෙරෙන් ස්වායත්තව ක්‍රියාත්මක වෙමින් සැලකිය යුතු වෙළඳපොළ අවදානමට සාමාන්‍යයෙන් භාජනය විය හැකි භාණ්ඩාගාර ගනුදෙනු නිරීක්ෂණය කරයි. මැදි කාර්යාලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මැදි කාර්යාල මෙහෙයුම් කාර්ය සංග්‍රහය අනුව ක්‍රියා කරයි.

වෙළඳපොළ අවදානම් කළමනාකරණය කරා ප්‍රවේශය

බැංකුවේ වෙළඳපොළ අවදානම් කළමනාකරණ රාමුව පහත ඒවා මත රැඳී ඇත:

පරිපූර්ණ ප්‍රතිපත්ති රාමුව

සර්වවාදී වෙළඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අතිරේකව, බැංකුවේ වෙළඳපොළ අවදානම් කළමනාකරණය පාලනය කිරීම බැංකුවේ වත්කම් හා බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය, විදේශ විනිමය ප්‍රතිපත්තිය හා මැදි කාර්යාල මෙහෙයුම් කාර්ය සංග්‍රහය මඟින්ද කෙරේ. මෙම ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සාමූහිකව භාණ්ඩාගාර මෙහෙයුම් මත අවදානම් සීමාකරණ පිවිසුම් සීමාවන් නියම කරමින් හා වෙළඳපොළ ගතිකයන් වෙතින් පැනනඟින විභව්‍ය බලපෑම් කළමනාකරණය කරමින්, සඵලදායී ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් නිරීක්ෂණය සඳහා මඟපෙන්වයි. මතු වන වෙළඳපොළ අවදානම් හමුවේ ප්‍රතිපත්ති නිතිපතා සමාලෝචනය හා යාවත්කාලීන කෙරේ.

අවදානම් සීමා

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙළඳපොළ අවදානමට මුල්වීය හැකි භාණ්ඩාගාර හා ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් මාලාවක් සඳහා අවදානම් සීමාවන් නිර්වචනය කරයි. මේවාට විදේශ විනිමය විවෘත තත්ත්ව සීමා, ප්‍රතිපාර්ශ්ව සීමා, අලාභ නැවතුම් සීමා හා අලෙවිකරණ සීමා ඇතුළත්ය. මෙම සීමාවන්ට නිරන්තරයෙන් නිරීක්ෂණය කෙරෙන අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. මෙම සීමාවන් වෙළඳපොළ ගතිකයන් ඔස්සේ වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් නිතිපතා සමාලෝචනය හා ප්‍රතිශෝධනය කෙරේ.

අවදානම් කළමනාකරණය

අවදානම නිරීක්ෂණය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය බැංකුවේ ණය දීමේ හා අරමුදල් සම්පාදන උපායමාර්ගවලට සාපේක්ෂව කල්පිරීමේ නොගැලපීම්, පොළී ආන්තික හා අරමුදල් අවශ්‍යතා ස්ථාවර ලෙස නිරීක්ෂණය කරයි. අවදානම් අගය (VaR), පාදක දශමය සඳහා මිල වටිණාකම (PVBP), කාල පරතර විශ්ලේෂණය, ප්‍රත්‍යාබල පරීක්ෂාව හා සංවේදීතා විශ්ලේෂණය වැනි මෙවලම් බැංකුවේ ශේෂ පත්‍රයේ පොළී අනුපාතික අවදානම නිරීක්ෂණය සඳහා භාවිතා කෙරේ. විදේශ විනිමය අවදානම නිරීක්ෂණය කරන්නේ අවදානම් අගය සීමාවන් හා ශුද්ධ විවෘත ස්ථාවරයන් හරහාය.

වෙළඳපොළ අවදානම් සමාලෝචනය 2018

පොළී අනුපාතික අවදානම

පොළී අනුපාතික අවදානම (IRR) වෙත බැංකුවේ නිරාවරණය පැහැනගින්නේ නිරතුරුව පොළී අනුපාතික ද්‍රවශීලතා හා ණය ව්‍යාප්තිය තුළ උච්ඡාවචනය වන විහි ණය කළඹ, වෙළඳ සුරැකුම් හා තැන්පතු බැරකම් වෙතිනි.

පොළී අනුපාතික අවදානම් කළමනාකරණය

පොළී අනුපාතික අවදානම කළමනාකරණය කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති රාමුවක් ඇති අතර ඒවා නිරවුල්ව විචක්ෂණීය සීමාවන්, පොළී අනුපාතික පරතර හා අවදානමේදී වටිනාකම නියම කරයි. බැංකුවේ වත්කම් හා බැරකම් කල්පිරීම් අතර නෛසර්ගික නොගැලපීම හමුවේ, කාල පරතරය හා පොළී අනුපාතික අවදානමට සමස්ත නිරාවරණය තක්සේරු කරනු පිණිස ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය කල්පිරීම් කාල පරාසයන් අනුව නිරීක්ෂණය කරයි. බැංකුකරණ හා වෙළඳ පොත්වල පොළී අනුපාතික අවදානම් නිරාවරණයන් පිළිබඳ නිතිපතා ප්‍රත්‍යාබල පරීක්ෂාව මඟින් අපට බැංකුවේ ලාභ ඉපැයිය හැකි බව හා ප්‍රාග්ධනය තත්ත්වය පිළිබඳව වෙනස්වන ආර්ථික දර්ශකයන්ට විභව්‍ය බලපෑම පිළිබඳව නිති දැනුවත්ව සිටින බවට සහතික කෙරේ.

එමෙන්ම බැංකුව විදේශ විනිමය අවදානමට පාත්‍ර කළඹ පිළිබඳව අවදානමේදී වටිනාකම ගණනය කිරීම් හා ප්‍රත්‍යාබල පරීක්ෂාවන් සිදුකරයි.

ප්‍රමුඛ ක්ෂේත්‍ර/ 2018 තුළ සංවර්ධනය

- වෙළඳපොළ අවදානම් දර්ශකවල විෂය පථය පුළුල් කිරීම හරහා නිරීක්ෂණය ශක්තිමත් කිරීම
- සීමා නිරීක්ෂණ යාන්ත්‍රණ වඩා යහපත් කිරීම
- වඩා පුළුල් විචල්‍යතා පරාසයන් ඇතුළත් කළ හැකි වනු පිණිස ප්‍රත්‍යාබල පරීක්ෂා යාන්ත්‍රණයේ විෂය පථය පුළුල් කිරීම
- දෛනික හා මාසික අවදානම් වාර්තා තුළ වාර්තාකරණ සංරචක වඩා යහපත් කිරීම

PVBP **භාණ්ඩාගාර බිල්පත්**



PVBP **භාණ්ඩාගාර බැඳුම්කර**



වත්කම් හා බැරකම් පිළිබඳව සංවේදීතා විශ්ලේෂණය



විවෘත තත්ත්වය



ස්කන්ධ අවදානම

ස්කන්ධ අවදානම වනාහි බැංකුව දරන ස්කන්ධ ආයෝජනයන්හි මිල උච්ඡාවචනයන් වෙතින් පැනනගින අවදානමයි. ලංකා බැංකුවේ ස්කන්ධ නිරාවරණය එහි වෙළඳ කළඹ වෙතින් පැනනඟින අතර උපායමාර්ගික ආයෝජන එයට අයත් නොවේ. ස්කන්ධ අවදානම වෙත බැංකුවේ නිරාවරණය සාපේක්ෂ වශයෙන් සීමාසහිත වන්නේ 2018 දෙසැම්බර් අග වන විට ස්කන්ධ කොටස් බැංකුවේ මුළු වත්කම්වලින් 0.3% ක් පමණක් වන නිසාය.

ස්කන්ධ අවදානම කළමනාකරණය කිරීම

විධායක මට්ටමේදී බැංකුවේ ආයෝජන අවදානම් බැංකුවේ නිර්වචනය කළ අවදානම් අභිරුචිය ඔස්සේ වන බවට සහතික වීමේ වගකීම ආයෝජන කමිටුවට පැවරේ. ඒ අතර, පුළුල් සාර්ව ආර්ථික තත්ත්වයන්ද ඇතුළු, විභව්‍ය ලෙස කොටස් වෙළඳපොළ මිලගණන්වලට බලපෑමක් කළ හැකි ප්‍රවණතා ආයෝජන කමිටුව විසින් නිති නිරීක්ෂණය කෙරේ.

භාණ්ඩාගාර බිල්පත් අවදානමේදී වටිනාකම



ස්කන්ධ අවදානමේදී වටිනාකම



රන් අවදානමේදී වටිනාකම



වත්කම් හා බැරකම්වල කල්පිරීම් විශ්ලේෂණය



අවදානම් කළමනාකරණය

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම වනාහි බැංකුවේ ගිවිසුම් වගකීම්භාරයන් ඇති වන පරිදි හා අවස්ථාවේදී සපුරාලීමට නොහැකි වීම නිසා ඉපැයීම් සහ/ හෝ ප්‍රාග්ධනය මත විභව්‍ය අලාභයයි.

බැංකුවේ තැන්පතු බැරකම්වල කෙටිකාලීන කල්පිරීම් හා ණයදීම් කළඹෙහි දීර්ඝ-කාලීන කල්පිරීම් හමුවේ බැංකු නොඅනුමානවම ද්‍රවශීලතා අවදානමට පාත්‍ර වන අතර බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සුරකිනු පිණිස ඒවා කළමනාකරණය කිරීම තීරණාත්මක ලෙස වැදගත් වේ.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව බැංකුවේ ගිවිසුම් මත වගකීම් සපුරාලනු පිණිස ප්‍රමාණවත් ද්‍රවශීලතා අවරෝධකයක් පවත්වා ගෙන යාම පිළිබඳව නිරවුල් මාර්ගෝපදේශනය සපයයි. වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය අධීක්ෂණය සම්බන්ධයෙන් වගකීම දරන අතර, නියාමන අවශ්‍යතාවන් හා අභ්‍යන්තර ඉලක්ක සමඟ අනුකූල වන බවට වගබලා ගනු පිණිස බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව නිරීක්ෂණය කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිති වාර්තා කිරීම මඟින් ද්‍රවශීලතා දර්ශක අවදානම් අභිරුචිය තුළ නිර්වචනය කර ඇති පරාමිතීන් ඇතුළත පවත්වා ගැනෙන බවට සහතික කෙරේ.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කරා වූ ප්‍රවේශය

ප්‍රතිපත්ති රාමුව

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා වත්කම් බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය සංවිධානය සිසාරා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳව මාර්ගෝපදේශනය සපයයි. එමෙන්ම මෙම ප්‍රතිපත්ති මඟින් ද්‍රවශීලතා දර්ශක අස්වසන මට්ටම්වලින් පවත්වා ගෙන යන බව තහවුරු කරනු පිණිස මැනීම් ක්‍රම, ප්‍රත්‍යාබල පරීක්ෂා ක්‍රමවේද, අහඹු අවස්ථා අරමුදල් සැලසුම් හා හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග නිරවුල්ව නිර්වචනය කෙරේ.

ද්‍රවශීලතා මිනුම

ද්‍රවශීලතා අවදානම ඇගයීමේදී බැංකුව ප්‍රවාහ මෙන්ම අරමුදල් ප්‍රවේශ යොදා ගනී. ප්‍රවාහ ප්‍රවේශය යටතේ බැංකුව වත්කම් හා බැරකම් කල්පිරීම පදනම් කර ගෙන විවිධ කාල තීර තුළ ලැබෙන හා ගෙවිය යුතු අතර නොගැලපීම විශ්ලේෂණය කිරීම හරහා ද්‍රවශීලතා අවදානම මනියි. අරමුදල් ප්‍රවේශය යටතේ භාවිතා කෙරෙන මැනීම් වන්නේ ද්‍රවශීල වත්කම් අනුපාතිකය, ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය, ශුද්ධ ස්ථාවර අරමුදල් සම්පාදන අනුපාතිකය සහ තැන්පතු වෙත ණය දක්වන අනුපාතිකය ඇතුළු මුඛ්‍ය දර්ශක/ අනුපාත කට්ටලයකි.

අහඹු අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්ම

අහඹු අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්ම (CFP) ස්ථානගතව ඇත්තේ ද්‍රවශීලතා පීඩනයකදී ජනතා විශ්වාසය හා කොටස් හිමිකාරිත්වය සුරකිනු පිණිසය. මෙම සැලැස්ම අදාළ බලධාරීන්ට විශේෂිත වගකීම් පවරමින් ප්‍රේරක දර්ශක හා ක්‍රියාමාර්ග සැලසුම් නිර්වචනය කරයි.

ද්‍රවශීලතා අවදානම් සමාලෝචනය 2018

බැංකුව මෙම වර්ෂය තුළ අවදානම් අභිරුචි ප්‍රකාශය තුළ නිර්වචනය කර ඇති සීමාවන් ඇතුළත වන හා අදාළ සියලු නියාමන අවශ්‍යතා පිලිපදින දර්ශකද සහිත සුවපහසු ද්‍රවශීලතා අවරෝධකයක් පවත්වා ගෙන ගියේය. ද්‍රවශීලතා තත්ත්වයට බැංකුවේ විවිධාංගීකෘත අරමුදල් කළඹද උරදෙන අතර එය වෙළඳපොළ තත්ත්වයන් හා ද්‍රවශීලතා අවශ්‍යතා මත රඳා පවතිමින් මූලාශ්‍ර ගණනාවකින් සම්පාදනය කර ගැනීමට බැංකුවට ඉඩ සලසයි. බැංකුවේ අරමුදල් කළඹෙන් 78% කටම තැන්පතු වගකියන අතර එයට අමතරව ණයගැනීම් 16% ක් හා කොටස්හිමිකාර අරමුදල් 6% ක් ඇත. ඒ අතර අරමුදල් සඳහා ඇති බැඳියා රහිත සුරැකුම් ප්‍රමාණය 2018 දෙසැම්බර් අග වන විට රු. මිලියන 211,723 ක් විය.

බැඳියා රහිත සුරැකුම්



ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය



	2018 මාර්තු 31	2018 ජූනි 30	2018 සැප්. 30	2018 දෙසැ. 31
ණය තැන්පතු අනුපාතය	75.0%	76.5%	80.5%	83.3%
ව්‍යාවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය	30.44%	26.13%	23.79%	24.47%
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	140.41%	138.29%	127.37%	128.68%
ද්‍රවශීල ආවරණ අනුපාතය	102.04%	113.48%	99.77%	114.99%

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අසමත් අභ්‍යන්තර ක්‍රියාවලීන්, පුද්ගලයින් හා පද්ධති හෝ බාහිර සිදුවීම් මඟින් ඇති කෙරෙන අලාභයයි. එයට නෛතික අවදානම ඇතුළත් වන නමුදු උපායමාර්ගික හා කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ.

මෙහෙයුම් අවදානම බැංකුවේ ව්‍යාපාරික මෙන්ම උපකාරක ඒකක වලින් මතුවිය හැකි අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු, නිෂ්පාදන හා ක්‍රියාවලි තුළදී නොවැළැක්විය හැකි සංරචකයකි.



මෙහෙයුම් අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ආධාර ඇතිව බැංකුවේ මෙහෙයුම් අවදානම නිරාවරණයන් කළමනාකරණය කිරීම හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවේ ශක්තිමත් බව සහතික කිරීම සඳහා අධීක්ෂණ වගකීම දරයි. විධායක මට්ටමකින්, මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC) සහ වංචා අවදානම් කළමනාකරණ කමිටුව (FRMC) ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයද සමඟින් එම රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වගකියයි. මෙහෙයුම් අවදානමෙහි සර්ව ව්‍යාප්ත ස්වභාවය හේතුවෙන් එය හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම සංවිධාන-ව්‍යාප්ත වගකීමක් බවට පත් වෙයි. පළමු ආරක්ෂක වළල්ල වන ශාඛා හා ව්‍යාපාරික ඒකක අවදානම් ආරම්භ වන ස්ථානයේදී ඒවා හඳුනා ගැනීම සඳහා වගකීම දරයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (දෙවන ආරක්ෂක වළල්ල) අදාළ රාමුව ක්‍රියාත්මක කිරීම හා නිර්වචනය කළ අභිරුචියට සාපේක්ෂව අවදානම් කාර්යසාධනය සඳහා වගකියයි. ඒ අතර විගණනය හා නීතිරීති පිළිපැදීම මඟින්, ස්ථාපිතව ඇති මෙහෙයුම් අවදානම කළමනාකරණ ක්‍රියාවලීන්හි සඵලදායිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සහතිකයක් ලැබේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ කෙරෙහි ප්‍රවේශය

ප්‍රතිපත්ති රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, හානි අවම කිරීම හා නිරීක්ෂණය පිළිබඳව නිරවුල් මගපෙන්වීම ලබා දෙයි. එයට අමතරව, වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ද බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ අරමුණුවලට උරදෙයි. විමෙන්ම මෙම ප්‍රතිපත්ති රාමුවෙන් බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ, විධායක කමිටුවල, කළමනාකරණ කණ්ඩායම්වල හා අවදානම් හිමිකරුවන්ගේ යුතුකම් හා වගකීම් ද නිර්වචනය කරයි.

අවදානම් කළමනාකරණය

අවදානම් හඳුනා ගැනීම හා මැනීම

මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම පළමු ආරක්ෂක වළල්ලේදී සිදුකෙරෙනුයේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් සියලු මූඛ්‍ය ව්‍යාපාරික ඒකක වෙත පනවනු ලබන අවදානම් හා පාලන ස්වයං-තක්සේරු (RCSA) හරහාය. මූඛ්‍ය අවදානම් දර්ශක, අභ්‍යන්තර අලාභ දත්ත හා මූල හේතුකාරක විශ්ලේෂණය වැනි මෙවලම්ද සංවිධානය සිසාරා මෙහෙයුම් අවදානම වෙත ඇති නිරාවරණය ඇගයීම පිණිස භාවිතා කෙරේ. මෙම සොයාගැනීම් හඳුනා ගන්නා ලද හිඳැස් සඳහා කාර්ය සැලසුම් සකසනු පිණිස යෙදවුම් බවට පත්වන අතර ඒවා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව වෙතද අවසානයේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද වාර්තා කෙරේ.

අවදානම් හානි අවම කිරීම

පහත අවදානම් හානි අවම කිරීමේ මෙවලම් බලපෑමේ තදබල බව හෝ ඇති වීමේ සම්භාවිතාව අඩු වන බවට සහතික කරයි:

(1) හඳුනා ගත් මෙහෙයුම් අඩුපාඩුකම් විසඳීමේ ප්‍රතිනිර්මාණ ක්‍රියාවලි

(2) මතු වන මෙහෙයුම් හානිපාත්‍රතාවයන් පිළිබඳව අදාල ව්‍යාපාරික හා උපකාරක ඒකක අවදිමත් කිරීම

(3) බැංකුවේ අවදානම් අභිරුචියට උචිත නැති අවදානම් මගහරින ලෙස දිරිගැන්වීම

(4) ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම්: සියලුම තීරණාත්මක ව්‍යාපාරික ඒකක හා උපකාරක ක්‍රියාකාරිත්වයන් සඳහා ව්‍යාපාරික අවිච්ඡින්නතා සැලසුම් සංවර්ධනය කර ඇත. ඒවායේ සඵලදායිත්වය සහතික වනු පිණිස නිතිපතා පරීක්ෂා කරනු ලැබේ.

(5) කොළඹ නගර සීමාවෙන් පිටත පිහිටුවා ඇති ආපදා ප්‍රතිසාධනය කිරීමේ මධ්‍යස්ථානය

(6) ඉතා තදබල පාලනය කළ නොහැකි අවදානම් තුනී කර ගැනීමට රක්ෂණ ආවරණ ලබා ගැනීම

වාර්තාකරණය හා නිරීක්ෂණය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙහෙයුම් අවදානම් සිදුවීම්/ අලාභ හා පාලන අසාමාර්ථතා පිළිබඳව නිතිපතා යාවත්කාලීන වාර්තා සපයයි. මෙහෙයුම් අලාභ හා ආසන්න තත්ත්වය පිළිබඳ දත්ත සමුදායක්ද පවත්වා ගෙන යනු ලබන අතර එමඟින් ප්‍රවණතා හා මූල හේතුකාරක හඳුනා ගැනේ. ඒ අතර ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය අභික්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරමින් සෑහෙන මෙහෙයුම් අවදානම් නිරාවරණ සිදුවීමකදී සියලු සේවකයින් වෙත කාලෝචිත උගත් පාඩම් ප්‍රචලිත කරමින් සිටී.

2018 වර්ෂයේ ප්‍රධාන අවධාන / සංවර්ධන ක්ෂේත්‍ර

- බැංකුවේ මුදල් කළමනාකරණ පද්ධතිය සුමට ලෙස ධාරාගත කරන ලදී.
- බැංකුවේ රක්ෂණ ඔප්පුව යළි සලකා බලා අවදානම් පැවරීමේ උපායමාර්ගය වඩා යහපත් කරන ලදී.
- ස්විෆ්ට් මෙහෙයුම්වල ආරක්ෂාව ශක්තිමත් කොට විද්‍යුත් ගෙවීම් තුලින යාන්ත්‍රණය ධාරාගත කරන ලදී.
- සේවක සංවර්ධනයෙහි ආයෝජනය කිරීමෙන් තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය ශක්තිමත් කරන ලදී.
- ආපදාවලින් පසු ප්‍රකෘතියට පත්වීමේ හැකියාව ශක්තිමත් කරන ලදී.

මෙහෙයුම් අවදානම් සමාලෝචනය 2018

බැංකුවේ මෙහෙයුම් අලාභයන් අඛණ්ඩව නිර්වචනය කළ අභ්‍යන්තර සීමාවන්ට පහළින් පැවතුණි. මූල හේතුකාරක විශ්ලේෂණය හරහා දුබලතා හඳුනා ගෙන ඇති අතර වර්ෂය තුළ අඩුපාඩුකම් ආමන්ත්‍රණය කරනු පිණිස උචිත උපායමාර්ග යොදවා තිබේ. අනුගාමී වර්ෂ දෙකක් සඳහා මෙහෙයුම් අලාභයන් මේ සමඟ දක්වා ඇත.

අලාභ දත්ත විශ්ලේෂණය



තාක්ෂණ අවදානම

තාක්ෂණ අවදානම යනු බැංකුව ඇතුළත තොරතුරු තාක්ෂණය පිළිබඳව හිමිකාරිත්වය, ක්‍රියාකාරිත්වය, සම්බන්ධ කර ගැනීම හා යෙදවීම ආශ්‍රිත අවදානමයි. මෙයට තවත් දේ අතර තොරතුරු තාක්ෂණ පද්ධතිවල ඇණහිටීම්, සයිබර් ප්‍රහාර, තාක්ෂණ යල්පැනීම්, තරඟකාරීන්ට පසුගාමී වීම හේතුවෙන් තරඟකාරී තත්ත්වය අවකරණය වීම සහ ව්‍යාපාරික පරිමාවන්ට උපකාරී වීමට යටිතල පහසුකම් අප්‍රමාණවත් වීම ඇතුළත්ය.

තාක්ෂණය මැතකාලීන බැංකු ක්ෂේත්‍ර මෙහෙයුම් හා ව්‍යාපාරික ආකෘති පරිවර්තනයට ලක් කර ඇති අතර ආයතනවල මෙහෙයුම් කාර්යක්ෂමතා ධාවනය කරවීමට, ගනුදෙනුකරුවන්ගේ තොරතුරු හැසිරවීමට හා ගනුදෙනුකාර අඟය ප්‍රස්තුතයන් ශක්තිමත් කිරීමට බෙහෙවින් තාක්ෂණය මත යැපේ. ලංකා බැංකුවෙහි ඩිජිටල්කරණය කෙරෙහි උපායමාර්ගික අවධානය හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මත අඛණ්ඩ ආයෝජනය හේතුවෙන් තාක්ෂණ අවදානම් මුඛ්‍ය නිරාවරණයක් ලෙස ඉස්මතුව තිබේ. සඵලදායී තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණයේ අතිශය වැදගත්කම හඳුනා ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය සිය තොරතුරු තාක්ෂණ උපායමාර්ගය සඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික වනු පිණිස වර්ෂය තුළ ඒ සඳහාම කැප වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව (ICTC) පිහිටුවිය.

තාක්ෂණ අවදානම් සමාලෝචනය 2018

- ප්‍රධාන තොරතුරු සුරක්ෂිතතා නිලධාරී (CISO) නමැති තනතුර ඇති කරන ලදී.
- ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම දියත් කරන ලදී.
- දුබලතා තක්සේරු සිදුකරන ලදී.
- ISO 27001 ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය අරඹන ලදී.
- ජාල සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම.
- පද්ධතියේ භාවිතයට ඇති බව දියුණු කිරීම හා තීරණාත්මක පද්ධතිවල ක්‍රියාත්මක නොවීපවතින කාලය අඩු කිරීම.

නෛතික අවදානම

නෛතික අවදානම් වනාහි නියාමනීය/ ව්‍යවස්ථාපිත විධිවිධාන නොපිළිපැදීම, නඩුකර හේතුවෙන් ඇති වන අවිනිශ්චිතතාව හෝ බැංකුවට අදාළ වන නීතිරීති හෝ රෙගුලාසිවල ව්‍යවහාරය හෝ අර්ථනිරූපනය පිළිබඳව අවිනිශ්චිතතාව හේතුවෙන් පැනනඟින විභව්‍ය ඉපැයීම් අලාභයන් හා කීර්තිනාමය පළුදු වීම්ය.

නීති අවදානම් නිරාවරණයන් හැකිතාක් හීන කරන බවට වගබලා ගන්නා පරිපූර්ණ ප්‍රතිපත්ති, ප්‍රමිති හා අභ්‍යන්තර කාර්යපටිපාටි කුලකයකින් බැංකුවේ මෙහෙයුම් සඳහා මාර්ගෝපදේශනය ලැබේ. බැංකුවේ පිළිපැදීම් හා නෛතික කාර්යයන් මඟින් සියලු නෛතික ලෙස බන්ධනීය ගිවිසුම් සමාලෝචනය කර අනුමත කෙරෙන බවට වගබලාගනු පිණිස නිරවුල්ව නිර්වචනය කරන ලද ක්‍රියාවලීන් ස්ථානගතව තිබේ. බැංකුවේ නෛතික අවදානම් ඇගයීම පිණිස ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් කාලීන තක්සේරු සිදු කෙරේ.

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම වනාහි ව්‍යවහාරික නීති, රෙගුලාසි, චර්යාධර්ම සංග්‍රහ සහ යහපත් පරිචය පිළිබඳව ප්‍රමිති නොපිළිපැදීම (අනුකූල නොවීම) හේතුවෙන් බැංකුවේ ඉපැයීම් අහිමි වීම සහ/ හෝ බැංකුවේ කීර්තිනාමය මත බලපෑමක් ඇති වීමේ අවදානමයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වගකියන අනුකූලතා නිලධාරිවරයකුගේ ප්‍රධානත්වයෙන් යුතු අනුකූලතා ඒකකය බැංකුව සියලුම අදාළ බාහිර රෙගුලාසි හා අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූල වන බවට වගබලා ගනියි. ඒ අතරම, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අනුකූලතා ප්‍රතිපත්තියක් ඇති අතර එමඟින් බැංකුවේ අනුකූලතා අවදානම් ක්‍රමානුකූල හා සාකල්‍ය ආකාරයකින් හඳුනා ගන්නා, නිරීක්ෂණය කරන හා කළමනාකරණය කරන ආකාරය දැක්වේ.

අනුකූලතා ක්‍රියාකාරිත්වයේ මුඛ්‍ය වගකීම්:

- නියාමනීය භූදර්ශයේ වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට උපදෙස් දීම සහ එම වෙනස්කම් ක්‍රියාත්මක කිරීම නිර්දේශ ලබා දීම
- අනුකූලතාව පිළිබඳව සේවක දැනුවත්භාවය නැංවීම
- නව නිෂ්පාදන, ව්‍යාපාරික පිළිවෙත් සහ/හෝ සබඳතා තුළ අනුකූලතා අවදානම් තිබේදැයි තක්සේරු කර බැලීම
- අනුකූලතාව පිළිබඳ සියලු කාරණා සම්බන්ධයෙන් නියාමන අධිකාරිය සමඟ සම්බන්ධව සිටීම

මෙම වර්ෂය තුළ මාර්ගෝපදේශයන්ට සහ/හෝ යම් සාමාජීය පාරිසරික රෙගුලාසිවලට අදාළව සැලකිය යුතු මට්ටමේ අනුගත නොවීම් නොමැත.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු බැංකුවේ අනාගත ව්‍යාපාරික සැලසුම්වල තිබිය හැකි දෝෂ සහ උපායමාර්ග අප්‍රමාණවත් වීමේ හැකියාවන් තිබීම නිසා පැනනඟින විභව්‍ය අලාභයන්ය. මෙම බැංකුව ආයතනික හා විධායක කළමනාකාරිත්වයේ අදහස් මත පදනම්ව, වර්ෂ තුනකට අදාල වන ආයතනික සැලැස්මක්ද සහිතව උපායමාර්ග සකස් කිරීම උදෙසා ක්‍රමානුකූල හා පූර්ණ ප්‍රවේශයක් යොදා ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකරණ කණ්ඩායම සමඟ දීර්ඝ සාකච්ඡාවලින් අනතුරුව ආයතනික සැලැස්ම අනුමත කරයි. අරමුණු හා ක්‍රියාමාර්ග සැලසුම් සියලු ව්‍යාපාරික ඒකකයන්ට හා ශාඛාවන්ට ප්‍රවාහය කෙරෙන අතර සැලැස්ම ක්‍රියාත්මක කිරීම නිශ්චිත ඉලක්කවලට සාපේක්ෂව නිරීක්ෂණය කෙරේ. බැංකුවේ කැපවුණු පර්යේෂණ දෙපාර්තමේන්තුව ආර්ථික හා දේශපාලනික ප්‍රවණතා, ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිපෝෂණ සහ කර්මාන්ත ස්වරූපය පිළිබඳව නිති දැනුවත් කරයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මෙම වාර්තා පදනම් කර ගෙන උපායමාර්ගික අවදානම තක්සේරු කොට ප්‍රතිවල අදාළ ව්‍යාපාරික ඒකක වෙත දන්වයි. බැංකුවේ උපායමාර්ගික අවදානම මැනීමට හා නිරීක්ෂණය කිරීමට පරිපූර්ණ ලකුණු සටහනක් භාවිතා කෙරෙන අතර එය වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය තුළට ඇතුළත් කෙරේ.

කීර්තිනාම අවදානම

බැංකුව පිළිබඳව ඍණාත්මක සංජානනය හා විශ්වාසය ගිලිහීම මඟින් කීර්තිනාම අවදානම් පැනනඟින අතර එය ඉපැයීම්වලට, වත්කම්වලට, ප්‍රාග්ධන තත්ත්වයට සහ/ හෝ සන්නාම වටිනාකමට අහිතකර ලෙස බලපායි.

- මූල්‍ය ආයතනයක් ලෙස මහජන විශ්වාසය ඉතා වැදගත් බැවින් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය කීර්තිනාම අවදානම ආශ්‍රිත සිදුවීම් අඛණ්ඩව නිරීක්ෂණය හා කළමනාකරණය කරයි. බැංකුව සිය කීර්තිනාම අවදානම අවම මට්ටමක තබා ගන්නා අතර එය පහත ඒවායින් පැහැදිලි වේ. ලංකා බැංකු සන්නාමයේ ශක්තිය: ලංකා බැංකුව මෙරට අංක 1 ලෙස දේශීය හා ජාත්‍යන්තර ස්වාධීන සන්නාම ශ්‍රේණිකරණ ආයතන විසින් ස්ථාවර ලෙස ශ්‍රේණිගත කර තිබේ.
- විශ්වාසය හා ස්ථාවරත්වය යන සන්නාම ලක්ෂණ
- දශක අටකට ආසන්න වාර්තාගත මෙහෙවර
- විවිධ සම්මාන හා ප්‍රශංසා ගණනාවක්

බැංකුවේ කීර්තිනාම අවදානම මැනීමට හා නිරීක්ෂණය කිරීමට පරිපූර්ණ ලකුණු සටහනක් භාවිතා කෙරෙන අතර එය වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය තුළ ඇතුළත් කෙරේ.

අවදානම් කළමනාකරණය

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය බැංකුවට සිය උපායමාර්ගික න්‍යායපත්‍රය ඉටුකිරීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබෙන බවට වගබලා ගනිමින් සිය අවදානම් ව්‍යාප්තිය මත පදනම්ව සිය ප්‍රාග්ධන අවශ්‍යතාව තක්සේරු කිරීමට ඉඩසලසයි. ස්ථම්භ II අවශ්‍යතාවන් සමඟ දිශාගත වෙමින් බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය එහි ණය සම්බන්ධ මුඛ්‍ය අවදානම්, වෙළඳපොළ, මෙහෙයුම්, ද්‍රවශීලතා, හා බැංකු ගනුදෙනු පොතෙහි පොළී අනුපාතික අවදානම, කීර්තිනාම, අනුකූලතා හා උපායමාර්ගික අවදානම සැලකිල්ලට ගනී. සාමාන්‍යාධිකාරී ප්‍රධානත්වය දරන අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලි නියමු කමිටුව මෙම වැදගත් අවදානම් හඳුනා ගැනීම සඳහා මෙන්ම ප්‍රත්‍යාබල පරීක්ෂා සිද්ධිරූපණ නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද වගකීම දරයි.

ප්‍රත්‍යාබල පරීක්ෂාව ස්ථම්භ II (අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලය) තුළ වැදගත් සංරචකයක් වන අතර විචල්‍යයන් මාලාවක් කෙරෙහි බැංකුවේ අවදානම් ව්‍යාප්තියේ සංවේදීතාව පෙන්වා දෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රත්‍යාබල පරීක්ෂා ප්‍රතිපත්තිය ඔස්සේ ප්‍රත්‍යාබල පරීක්ෂාව නිතිපතා හා සඵලදායී ලෙස සිදු කෙරෙන බවට වගබලා ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. ප්‍රාග්ධනය ප්‍රතිපාදනය පිළිබඳව මගපෙන්වීමට අමතරව ප්‍රත්‍යාබල පරීක්ෂාවන් අවදානම් හඳුනාගන්නා ක්‍රමවේදයන් හා ඉඩහැරීම් සීමාවන් පිහිටුවීම සහ අහඹු අවස්ථා සැලසුම් සකස් කිරීම සඳහා පහසුකම් සලස්වයි. මෙම වර්ෂය තුළ, අපි අභියෝගාත්මක සාර්ව ආර්ථික පෙරමුණ සැලකිල්ලට ගෙන අපගේ ප්‍රත්‍යාබල පරීක්ෂාව තවදුරටත් ශක්තිමත් කළ අතර ඒ අනුව, නව ප්‍රත්‍යාබල සිද්ධිරූපණ හා ප්‍රත්‍යාබල සීමාවන් ද හඳුන්වා දෙන ලදී.

ප්‍රාග්ධන තත්ත්වය

2018 වර්ෂයේ ලක් රජය විසින් දෙන ලද රු. බිලියන 5.0 ක ප්‍රදානය බැංකුවේ ශේෂ පත්‍රය තවදුරටත් ශක්තිමත් කළ අතර 2018 දෙසැම්බර් අග වන විට කොටස් ප්‍රාග්ධනය රු. බිලියන 25.0 බවට පත්විය. මෑත වර්ෂයන්හි ප්‍රධාන කොටස්හිමියා විසින් නිතර ස්කන්ධ ප්‍රදානයන් සිදු කිරීමෙන් බැංකුවේ ප්‍රාග්ධන පදනම බාසල් III යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වැඩි ප්‍රාග්ධන අවශ්‍යතාව අනුකූලව බැංකුවේ ප්‍රාග්ධන පදනම ශක්තිමත් විය. බැංකු පනතේ 2016 අංක 1 දරන විධානය මඟින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතා හඳුන්වා දෙනු ලැබූ අතර 2019 ජනවාරි වන විට ක්‍රියාත්මක කරනු පිණිස අවම ප්‍රාග්ධන අනුපාතික ක්‍රම ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා කාල වකවානු ලබා දෙන ලදී. පහත දැක්වෙන වගුවෙන් ප්‍රදර්ශනය වන පරිදි බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලීමේ මාර්ගයට පිවිස තිබේ.

	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාව 2019 ජනවාරි	ලංකා බැංකුව 2018 දෙසැම්බර් අග වන විට
ස්ථරය 1 අවම ප්‍රාග්ධන අවශ්‍යතාව	10%	10.31%
සමස්ත ප්‍රාග්ධන අවශ්‍යතාව	14%	14.58%



ව්‍යාපාර අංශය

හරහා ක්‍රමෝපායන් මෙහය වීම

ආර්ථිකය හා කර්මාන්ත වටපිටාව පිළිබඳ දළ විශ්ලේෂණය

මෙහෙයුම් සමාලෝචනය

ආර්ථික හා කර්මාන්ත වටපිටාව පිළිබඳ දළ විශ්ලේෂණය

ආර්ථික වටපිටාව පිළිබඳ සමාලෝචනය

ගෝලීය ආර්ථිකය

වර්ෂ 2018 තුළදී ගෝලීය ආර්ථික වර්ධනය 3.5% (2017: 3.8%) වාර්තා කරනු ඇති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අනුමාන කර ඇත. වසරේ දෙවන භාගය තුළ ආර්ථික ක්‍රියාකාරකම්හි පසුබෑමක් පෙන්නුම් කළ අතරම රටවල් සහ කලාප අතර ආර්ථික වර්ධනය සමතුලිත ආකාරයට බෙදී යාමක්ද මෙම වසර තුළ පෙන්නුම් නොකරන ලදී. දියුණු ආර්ථිකයන් සහිත රටවල් කිපයකම ආර්ථික වර්ධන වේගය මධ්‍යස්ථ අගයක් ගන්නා ලද අතර ගෝලීය වෙළඳාම හේතු කොටගෙන ඇතිවන වෙළඳපොළ පීඩනය, ප්‍රතිපත්ති වල පැවති අවිනිශ්චිතතා සහ අහිතකර ආර්ථික තත්ත්වයන් මේ සඳහා හේතු පාදක වී ඇත. කෙසේ වුවත් නැගී එන ආර්ථිකයන්හි මේ වසරේ ආර්ථික වර්ධනය පසුගිය වසර හා සාපේක්ෂව වෙනස් නොවී පැවතුනි.

- **යුරෝපා කලාපය** - මන්දගාමී අපනයන වර්ධනය
- **එක්සත් රාජධානිය** - දේශගුණික විපර්යාස නිසා ඇතිවූ අහිතකර තත්ත්වයන් හා යුරෝපා කලාපයෙන් ඉවත්වීම මත බැඳුණු අවිනිශ්චිතතාවයන්
- **ඇමරිකා එක්සත් ජනපදය** - සැලකිය යුතු ආර්ථික උත්තේජක හේතු කොට ගෙන ඇතිවූ ශක්තිමත් ආර්ථික වර්ධන වේගයක්
- **ඉන්දියාව** - දේශීය ඉල්ලුම් හේතු කොට ගෙන ඇති වූ ආර්ථික වර්ධනයක්
- **චීනය** - ආර්ථික ක්‍රියාකාරකම්හි මධ්‍යස්ථ වේගයක් වාර්තා වුවද, ශක්තිමත් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගෙන ඇත
- **බොරතෙල් අපනයන කරන ආර්ථිකයන්** - බොරතෙල් හි මිල ඉහළ යෑම හේතු කොට ගෙන ඇතිවූ ආර්ථික වර්ධනය
- **ලතින් ඇමරිකාව** - ආර්ථිකයේ මන්දගාමී පිබිදීමක

ඇමරිකා එක්සත් ජනපදය විසින් සියලු රටවල් වෙත පමණක් බල පැවැත්වෙන පරිදි සහ තෝරාගත් වෙළඳපොළ රටවල් සඳහා බල පැවැත්වෙන පරිදි හඳුන්වාදුන් තීරුබදු හේතුවෙන් හා එම රටවල් විසින් ඇමරිකා එක්සත් ජනපදය වෙතද එවැනිම ක්‍රියා ඔස්සේ ප්‍රතික්‍රියා දැක්වීම ඔස්සේ ගෝලීය වෙළඳාම කෙරේ ඇතිවූ පීඩනය හේතුවෙන් ආනයන අපනයන වෙළඳාමේ වර්ධනය මන්දගාමී ස්වරූපයක් ගන්නා ලදි. චීනය හා පවතින පුළුල් වෙළඳ හිඟය සමතුලිත කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය විසින් ඇ. ඩොලර් බිලියන 250 ක් වටිනා ආනයන බදු මේවන විටත් බලපවත්වා ඇති අතර තවත් ඇ. ඩොලර් බිලියන 267 ක ආනයන බදු බලපැවැත්වීම සඳහා වන ක්‍රියාවලිය මේ වනවිටත් සාකච්ඡා මට්ටමේ පවති. මේ සඳහා ප්‍රතික්‍රියා වශයෙන් චීනයද ඇමරිකා එක්සත් ජනපදයෙන් සිදු කරන ආනයන සඳහා ඇ. ඩොලර් බිලියන 110 ක් වටිනා ආනයනික බදු පනවා ඇත. අභ්‍යන්තරික කලහකාරී තත්ත්වයන්, භූගෝලීය හා දේශපාලනික අවිනිශ්චිතතාවන් සහ සර්ව ආර්ථික බිඳවැටීම් ආදී සෘණාත්මක තත්ත්වයන්, බලපෑ රටවල් හැරුණු කොට අන් සියලු බොරතෙල් අපනයන රටවල් බොරතෙල් මිල වැඩිවීම හේතුකොට ගෙන ඉහළ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කරන ලදි. ගෝලීය මූල්‍ය තත්ත්වයන්හි ඇතිවූ පසුබෑම් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදය සහ සෙසු රටවල් අතර ඇතිවූ ආර්ථික වර්ධනයේ වෙනස ඇමරිකානු ඩොලරයේ ඉහළයාම කෙරේ හේතුවිය. එමෙන්ම ඇමරිකානු එක්සත් රාජධානියේ පොළී අනුපාත ඉහළ යාමට සමගාමීව දියුණු වෙමින් පවතින රටවල ප්‍රාග්ධන ප්‍රවාහයන් නැවතත් ඇමරිකානු එක්සත් ජනපදය කෙරේ ඇදීයාම හේතු කොට ගෙන එම රටවල මුදල් ඒකක වල අවප්‍රමාණය වීමක් වාර්තා විය.

ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයෙහි සැලකිය යුතු අඩුවීමක් වසර තුළ වාර්තා වූ අතරම ආයෝජන වල සිදුවූ ප්‍රසාරණය 2017 වසරට සාපේක්ෂව 2018 හා 2019 වසරවල අඩුවීමක් පෙන්නුම් කරනු ඇත. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉහළයන තරඟකාරිත්වය සහ ප්‍රතිපත්තින්හි විචල්‍ය ස්වභාවයන් ගෝලීය ආර්ථිකයේ වර්ධනය කෙරෙහි මෙන්ම ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනය කෙරෙහිද බලපෑම් කරනු ඇත. මේ හේතු කොට ගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත අපේක්ෂිත ආර්ථික වර්ධන වේගයන් 2019 වර්ෂය සඳහා 3.5% ක් සහ 2020 වර්ෂය සඳහා 3.6% ක් ලෙස පහත දමන ලදි.

ගෝලීය දළ දේශීය නිෂ්පාදනය වර්ධනය



	දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය 2018
දියුණු ආර්ථිකයන්	2.3%
නැගී එන ආර්ථිකයන් සහ දියුණු වෙමින් පවතින ආර්ථිකයන්	4.6%

IMF





ගෝලීය ආර්ථික විශ්ලේෂණය (2019 ජනවාරි) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

ශ්‍රී ලංකාවේ ආර්ථිකය

දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය





ස්වෛර් ශ්‍රේණිගත කිරීම් වල පහළ යාම

ගෝලීය තත්ත්වයන් වල වෙනස් වීම, ඉහළයන තෙල් මිල, ආයෝජකයන්ගේ පසුබෑම, පාරිභෝගික චර්යාවන් වෙනස් වීම සහ වසර අග තුළ ඇතිවූ දේශපාලනික අස්ථාවරත්වය ආදි සියලු සාධකවල ඒකාබද්ධ බලපෑම හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2018 වසර තුළ අභියෝගාත්මක විය. ඒ අනුව වසර තුළ ද. දේ. නිෂ්පාදනය 3.2% ක අගයක් ගත් අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ 4.8% ක් හා සේවා අංශයේ 4.7% ක වර්ධනයක් වාර්තා විය. නමුත් කාර්මික අංශයේ වර්ධනය 0.9% ක් දක්වා පහළ ගිය අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවූ පසුබැස්ම මේ සඳහා හේතු විය.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රතිපත්ති වඩාත් ශක්තිමත් කිරීම සඳහා පසුගිය වසර දෙක තුළදී රජය විසින් බදු ප්‍රතිසංස්කරණ රැසක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව නව දේශීය ආදායම් පනත 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පුළුල් සංශෝධන සහිතව ක්‍රියාත්මක කරන ලද අතර ඒ ඔස්සේ සෘජු බදු අය කරගැනීම්හි පුළුල් වීමක් අපේක්ෂා කරන ලදී. ලෝක තෙල් මිල ඉහළයෑම හමුවේ 2017 වර්ෂය තුළදී රජයේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇති වූ අතර, මෙයට විසඳුමක් ලෙස තෙල් සඳහා ගෝලීය තෙල් මිල දර්ශකයන් හා අනුගතවීම සළකා බලන ලද අතර, ඒ සඳහා උපායමාර්ගික මිල නියම කිරීමේ ක්‍රමයක් 2018 මැයි මස සිට හඳුන්වා දෙන ලදී.

රජයේ මූල්‍ය ප්‍රතිපත්තීන්හි ප්‍රතිසංස්කරණ වල ධණාත්මක සහ සෘණාත්මක යන දෙයාකාරයේම බලපෑම් ඇති වී ඇත. ඇස්තමේන්තු ආදායම ඒ ආකාරයෙන්ම නොලැබී යාම හේතු කොට ගෙන ඇස්තමේන්තු අයවැය ඉලක්ක සපුරා ගැනීම 2018 වසරේදී දුෂ්කර වී ඇත. කෙසේ නමුත් 2018 වසරේ දී පිට පිට දෙවැනි වරටත් පොළී මත වියදම් හැරුණු කොට ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා කිරීම බලාපොරොත්තු වන අතර එසේ වුවහොත් එය 1955 වසරෙන් පසුව එවැන්නක් වාර්තා කරන තුන්වන අවස්ථාව වනු ඇත.

මූල්‍ය සේවා අංශය - 2018

ද. දේ. නිෂ්පාදනය සඳහා දායකත්වය	මෙම අංශයේ වර්ධනය
7.3%	11.8%

ද. දේ. නිෂ්පාදනයේ සංයුතිය - 2018



ආර්ථික හා කර්මාන්ත වටපිටාව පිළිබඳ දළ විශ්ලේෂණය

මුළු ආදායම සහ රජයේ වියදම



බදු ආදායම් සංයුතිය



උද්දමනය - 2018



මූල්‍ය ප්‍රතිපත්ති

පසුගිය වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අභියෝග සහිත ගෝලීය සහ දේශීය පරිසරයක් තුළ තම මූල්‍ය ප්‍රතිපත්තිය සුමට ලෙස දිශාගත කරන ලදි. මධ්‍යයට වඩා අඩු වර්ධනයක් සහ පාලනය කල හැකි අගයකට පත්වූ උද්දමනය, 2015 වසරේ සිට 2018 අප්‍රේල් මාසය දක්වාම බලපවත්වන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්තින්හි වෙනසක් අපේක්ෂා කරන ලද අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොළී අනුපාතවල ඉහළ සීමාව පහළ දමන ලදී. දේශීය මුදල් වෙළඳපොළ තුළ රුපියලේ ද්‍රවශීලතාවයේ අඩු අගයක් කාලයක් පුරා වාර්තාවීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සියලු වාණිජ බැංකුවල රුපියල් තැන්පතු සඳහා බළපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතතය 6% දක්වා, 2018 නොවැම්බර් මසදී, ඒකක 150 කින් පහළ දමන ලදි. එයට සමගාමීව ප්‍රාථමික පොළී අනුපාතය 8% දක්වා ඒකක 75 කින් ඉහළ දමන ලද අතර එමඟින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමීම හේතු කොට ගෙන සිදුවන ආර්ථික බලපෑම සමතුලිත කරන ලදී. මෙම පෙර විපරම් ක්‍රියාවලිය අනුගමනය කිරීම මඟින් උද්ධමනය තනි මධ්‍යන අගයක පවත්වා ගැනීම අපේක්ෂා කරන අතරම උද්ධමනය අපේක්ෂිත අගයක් තුළ පවත්වා ගැනීම මඟින් ආර්ථිකය තම උපරිම ක්‍රියාකාරී මට්ටම කරා මධ්‍ය කාලීනව ළඟාවීම අපේක්ෂා කෙරේ.

විනිමය අනුපාත

වසර තුළදී රුපියල 16.4% ක ප්‍රමාණයකින් (2017- 2.8%) විශාල ලෙස අවප්‍රමාණය වූ අතර විශේෂයෙන් වසරේ අවසාන භාගය තුළ සිෂ්ඨ ලෙස අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරන ලදී. 2018 දෙසැම්බර් 31 වන දින ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලයේ අගය වාර්තා වූයේ ශ්‍රී ලංකා රුපියල් 182.75 ක් ලෙසය. දිගින් දිගටම ක්‍රියාත්මක් වූ ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම හා ඒ සමගාමීව සිදුවූ ඇමරිකානු එක්සත් ජනපද පොළී අනුපාත ඉහළ දැමීම හා ඇමරිකානු ඩොලරයේ ශක්තිමත් වීම හේතු කොටගෙන ප්‍රාග්ධන මුදල් ප්‍රවාහ රටින් පිටතට ගලායෑම ඉහළ ගිය අතර මෙමඟින් ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමට විශාල පීඩනයක් ඇති විය. වෙළඳ හිඟය තවදුරටත් ප්‍රසාරණය වීම හේතුවෙන් ශ්‍රී ලංකානු රුපියලට දැඩි පීඩනයක් ඇතිවිය. උච්චාවචනයන් පාලනය කිරීම හැරුණු කොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශාල ලෙස රුපියලේ අගය ඉල්ලුම සහ සැපයුම මත තීරණය වීමට ඉඩ හරින ලදී.

විදේශීය අංශය

අපනයන අංශයේ වර්ධනයක් වසර තුළ පෙන්නුම් කරනු ලැබුවද අපේක්ෂිත අගයට වඩා වැඩි ප්‍රමාණයෙන් සිදුවූ ආනයන හේතු කොට ගෙන වෙළඳ හිඟය වසර තුළදී තවත් පුළුල් විය. 2018 සැප්තැම්බර් මාසය වන විට වෙළඳ හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් 11.9% (2017 - දළ දේශීය නිෂ්පාදනයෙන් 11%) ක් විය. ජී. ස්. ජී. පලස් (GSP+) සහනය නැවත ස්ථාපනය වීම, භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, විදේශීය වෙළඳාම සඳහා හිතකර වෙළඳ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අනුගමනය කරන ලද නම්‍යශීලී විදේශ විනිමය ප්‍රතිපත්තිය හේතුවෙන් වසර තුළ 4.7% ක අපනයන වර්ධනයක් ජනවාරි සහ නොවැම්බර් දක්වා වාර්තා විය. මෙම කාල පරාසය තුළදී වාර්තා වූ ආනයන වියදම 6% කින් ඉහළ ගිය අතර ඒ සඳහා මූලිකව හේතු සාධක ලෙස බොර තෙල්, වාහන හා රෙදි පිළි ආනයනයේදී සිදුවූ ප්‍රමාණාත්මක මෙන්ම මිල ගණන්හි ඉහළ යාමද දැක්විය හැක.

ගෝලීය ආර්ථික තත්ත්වයන් හට බලපැවැත් වූ දැඩි ප්‍රතිපත්තීන් හා ඇමරිකානු ඩොලරයේ ඉහළ යාම හේතුවෙන් විදේශ විනිමය ගෙවීම් ඉහළ ගිය අතර එමඟින් ගෙවීම් තුලිතය වෙත දැඩි පීඩනයක් ඇතිවිය.

කෙසේ වෙතත් සංචාරක කර්මාන්තය සහ විදේශීය ණය ලැබීම් හේතුවෙන් මෙම තත්ත්වය යම් තරමක් සමනය විය. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ විදේශීය ණය ප්‍රමාණය තවදුරටත් ඉහළ අගයක පවතින අතර මෙම බහුතර ණය වාරික ගෙවීම් 2019 වසරේ සිට ආරම්භ වීමත් සමඟ මෙම තත්ත්වය වඩ වඩාත් බරපතලව දැනෙනු ඇත. 2019 වසර තුළදී ජාත්‍යන්තර ස්වේරීත්ව බැඳුම්කර කීපයක් කල්පිරීම සහ ඒකාබද්ධ ණය පහසුකම් කීපයකද ගෙවීම සිදුකිරීමට ශ්‍රී ලංකා රජය වගකීමට බැඳී ඇත. සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත 2018 මාර්තු මස බලාත්මක වීමත් සමඟ එම පනත මඟින් මැදි කාලීන විදේශීය වාරික පියවීම කළමනාකරණය සඳහා භාවිතා කරනු ඇත. පාර්ලිමේන්තුවට අනුමත වාර්ෂික ණය සීමාව ඉක්මවා ණය ලබා ගැනීම සඳහා මෙම පනත මඟින් අවස්ථාව සැලසේ. මෙලෙස ලබාගත් අරමුදල් පසුව ඇතිවන ණය වාරික ගෙවීම සඳහා වෙන්කළ හැකි අතර එමඟින් ප්‍රතිමූල්‍ය ණය හා බැඳි අවදානම පහළ ගොස් ඇත.

අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය



ඉදිරි දැක්ම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ශක්තිමත් කර ස්ථාපනය කිරීම සඳහා රජය විසින් නොකඩවා ක්‍රියාමාර්ග ගන්නා ලද අතර රජයේ ආදායම වැඩි කිරීම සඳහා සැලසුම් හඳුන්වාදීම, වියදම් පරිපාලනය සහ ණය කළමනාකරණය ආදී ලෙස ගන්නා ලද සමහර ක්‍රියාමාර්ග හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ පුර්ණ වර්ධනයක් මධ්‍ය කාලීනව සිදු වූ අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද නම්‍යශීලි උද්ධමන ඉලක්කණය සඳහා මෙය අත්‍යවශ්‍ය වේ. ප්‍රසාරණය වූ වෙළඳ ශේෂය 2018 වසරේදී විදේශීය ජංගම ගිණුමේ අහිතකර කාර්යසාධනය සඳහා හේතු විය. ඇ. එක්සත් ජනපද ඩොලරයේ අගය ශක්තිවීම හේතුවෙන් ආනයන වියදම අවම කිරීම සඳහා හඳුන්වා දෙනු ලැබූ ක්‍රියාමාර්ග තුළින් 2019 වසර තුළ විදේශීය ජංගම ගිණුමෙහි වර්ධනයක් අපේක්ෂා කෙරේ. පුද්ගලික අංශය හා ඒකාග්‍රවෙමින් සහ අනුරූප වන ලෙසින් පුද්ගලික අංශය හා එක්ව රජය විසින් ක්‍රියාවට නංවන ලද වර්ධනය සඳහා වූ උපායමාර්ග මධ්‍ය කාලීන ආර්ථික වර්ධනයක් සඳහා හේතුවන ඇති බව අප විශ්වාසයයි. දැඩි මූල්‍ය, රාජ්‍ය මූල්‍ය සහ විදේශීය ප්‍රතිපත්තීන් සහ ඒ ඔස්සේ හීන වූ ආර්ථික ක්‍රම සාධනය සහිත පරිසරයකදී පුද්ගලික අංශය මුල්වූ ආර්ථිකයේ ඵලදායිතාවය ඉහළයාම ඉලක්ක කරගත් විචක්ෂණ, ස්ථාවර සහ දීර්ඝ කාලීන ප්‍රතිඵල සහිත වූ ප්‍රතිපත්ති සම්පාදනය අත්‍යවශ්‍ය වේ.

ආර්ථික හා කර්මාන්ත වටපිටාව පිළිබඳ දළ විශ්ලේෂණය

බැංකු කෙෂ්ත්‍රයේ දළ විශ්ලේෂණය

2018 වසර තුළ බැංකු කෙෂ්ත්‍රයට මිශ්‍ර ප්‍රතිඵල සහිත වසරක් විය. ණය කළඹේ වර්ධනය වසරේ බොහෝ මාස තුළදී සාධනීය මට්ටමක පැවති අතර, පොළී අනුපාත වල සිදුවූ ඉහළ යාම හේතුවෙන් පොළී ආන්තිකය පුළුල් විය. කෙසේ නමුත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්හි අංක 9 හඳුන්වාදීම සහ සාර්ව ආර්ථික සාධකයන්හි සිදුවූ පසුබෑම් හේතුවෙන් ණය හානිකරණයේ විශාල වර්ධනයක් වාර්තා වීම ආංශික ලාභදායීත්වයට බලපා ඇත.

වර්ධනය: බැංකු කෙෂ්ත්‍රයේ මූල්‍ය වත්කම් 2018 වසරේදී 15% ක වර්ධනයක් වාර්තා කල අතර, ණය සඳහා වසරේ මුල් භාගය තුළ ඇතිවූ ඉල්ලුම හේතුවෙන් 20% ක වර්ධනයක් වාර්තා කල ණය කළඹ මේ සඳහා මූලිකවම බලපා ඇත. කෙසේ වෙතත් ආනයනය සඳහා පැනවූ රෙගුලාසි, ඉදිකිරීම් කෙෂ්ත්‍රයේ ඇතිවූ පසුබෑම සහ වසර අගභාගයේ ඇතිවූ දේශපාලනික අස්ථාවරභාවය ආදි වූ සාර්ව විචක්ෂණ දර්ශක හේතුවෙන් ණය ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමී තත්ත්වයකට පත්විය. ණය කළඹේ වර්ධනය සඳහා මූලික ලෙස හේතු වුයේ අයිරා පහසුකම්ය. කාලීන ණය, උකස් ණය සහ කල්බදු පහසුකම් ද මේ සඳහා යම් තරමක් හේතු විය. ආයෝජන සහ මුදල් සහ මුදල් හා සමාන දෑ 5% සහ 4% ක් ලෙස අනුපිළිවෙලින් වර්ධනයක් වාර්තා කල අතරම බැංකු කෙෂ්ත්‍රයේ වත්කම් මූලික වශයෙන් ණය සහ අත්තිකාරම් වලින් සමන්විතව ඇති අතර එහි ප්‍රතිශතය සමස්ථ වත්කම් වලින් 64% ක් ලෙස 2018 දෙසැම්බර් 31 වන දිනට වාර්තා විය (පසුගිය වසර: 62%).

බැංකු කෙෂ්ත්‍රයේ කාර්යසාධනය: පැවති ණය කළඹේ ප්‍රසාරණය සහ ඉහළ පොළී අනුපාත හේතුවෙන් වසර තුළ පොළී ආදායම 14% කින් ඉහළ ගිය අතර ශුද්ධ පොළී අනුපාතයේ ප්‍රසාරණයක් පෙන්නුම් කරමින් ශුද්ධ පොළී අදායම 16% කින් ඉහළ යන ලදී. කෙෂ්ත්‍රයේ අදායමට පිරිවැය අනුපාතය 45.2% ක සිට 48.5% ක් දක්වා වසර තුළ ඉහළ ගිය අතර, ඉහළ ගිය සේවක මණ්ඩල වියදම් හේතුවෙන්, මෙහෙයුම් වියදම් 24% කින් ඉහළ යන ලදී. හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්හි අංක 9 සහ කෙෂ්ත්‍රයේ පුරා පුළුල් ලෙස පැතිරී ගිය වත්කම් වල ගුණාත්මකභාවයේ පිරිහීම හේතුවෙන් ණය හානිකරණය වසර තුළ 104% කින් ඉහළ ගිය අතර, ඒ ඔස්සේ සමස්ථ කෙෂ්ත්‍රයේ ලාභයටද බලපෑම් ඇතිවිය. මේ හේතුවෙන් කෙෂ්ත්‍රයේ බදු පෙර ලාභය පසුගිය වසරට සාපේක්ෂව වර්ධනයක් නොපෙන්වූ තරම් වන අතර එය රු. බිලියන 194.7 ක් ලෙස වාර්තා විය. කෙෂ්ත්‍රය මත පැනවූ ආයතනික බදු 23% කින් වැඩිවීම මත බදු පසු ලාභය 9% කින් අඩුවීමක් වාර්තා කරණ ලදී. 2018 දෙසැම්බර් මස වන විට ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය සහ වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය අනුපිළිවෙලින් 13.2% (17.6% සිට) සහ 1.8% ක (2.0% සිට) අඩුවීමක් වාර්තා කරන ලදී.

බැංකු කෙෂ්ත්‍රයේ වර්ධනය



ණය කළඹේ ගුණාත්මකභාවයෙහි ප්‍රවණතාව



වත්කම්හි ගුණාත්මකභාවය: කෙෂ්ත්‍රය පුරා පැතිරී ගිය ණය සහ අත්තිකාරම්හි ගුණාත්මකභාවයෙහි පිරිහීම හේතුකොට ගෙන අක්‍රීය ණය 64% කින් ඉහළ ගිය අතර, අක්‍රීය ණය අනුපාතය 2.5% සිට 3.4% දක්වා ඉහළ යන ලදී. ණය අනුමත කිරීමේදී දැඩි ලෙස සුපරික්ෂාකාරී වීමත්, ණය නැවත අයකර ගැනීමේ සහ වාරික ගෙවීමේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම වැනි ක්‍රියාකාරකම් බොහෝ බැංකු මෙම තත්ත්වය පාලනය සඳහා ක්‍රියාවට නංවන ලදී. ණය හානිකරණ ආවරණය 2017 වසරේ තිබූ 69.9% ක සිට 57.4% දක්වා 2018 වසර අවසානය වන විට අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

ස්කන්ධය සහ අරමුදල්: පැවති ඉහළ පොළී ප්‍රතිශත හේතුවෙන් වසර තුළ පාරිභෝගික තැන්පතු 15% කින් ඉහළ ගිය අතර, තැන්පතු ප්‍රධානම අරමුදල් සපයාගැනීමේ මාර්ගය විය. ණය සහ අත්තිකාරම්, කෙෂ්ත්‍රයේ සමස්ත වත්කම්හි 64% ක් නිරූපණය කරන ලදී. බැංකු විසින් බාසල් III රෙගුලාසි හා අනුගත වීම වස්, වසර තුළ ඒ හා සමානුපාතික වන ණයකර වෙළඳපොළට නිකුත් කරන ලද අතර, මෙවැනි හේතු මත කෙෂ්ත්‍රයේ බැංකු මඟින් ලබාගත් ණය 10% කින් ඉහළ යන ලදී. පොදු ස්කන්ධයෙහි ප්‍රාග්ධනය සහ මුළු ප්‍රාග්ධන අනුපාත අනුපිළිවෙලින් 12% ක් සහ 15.1% ක් ලෙස 2018 දෙසැම්බර් 31 වන දිනට වාර්තා වන ලදී. කෙසේ වෙතත් පැවති වෙළඳපොළ තත්ත්වයන් සහ ඉහළ බදු වගකීම් හේතු කොට ගෙන බාසල් III රෙගුලාසි හා අනුගත වනු වස්, අරමුදල් ඉහළ නැංවීම අභියෝගාත්මක විය.

මෙහෙයුම් සමාලෝචනය

බැංකුවේ මෙහෙයුම් ප්‍රධාන ලෙස ව්‍යාපාරික අංශ තුනක් යටතේ ගොනු කල හැක. ඉදිරි පරිච්ඡේදයන් තුළින් සාකච්ඡා කරනුයේ මෙම එක් එක් අංශ මඟින් වසර තුළ ක්‍රියාවට නංවන ලද උපායමාර්ග සහ එම එක් එක් අංශ වල දළ විශ්ලේෂණය හා වසර තුළ එම අංශයන්හි කාර්යසාධනය සඳහා බලපෑ සාධක ආදියයි.

ව්‍යාපාරික අංශ



ශාඛා බැංකුකරණය

කාර්යසාධන තොරතුරු 2018

රු. මිලියන	2018	2017	වෙනස (වාර්ෂික)
ශුද්ධ පොළී ආදායම	37,158	28,650	30%
මෙහෙයුම් ආදායම	44,472	36,075	23%
ණය හානිකරණ ප්‍රතිපාදන	6,134	1,831	235%
මෙහෙයුම් ලාභය	16,486	15,415	7%
මුළු වත්කම්	690,007	632,146	9%
මුළු වගකීම්	653,062	596,145	10%

මෙහෙයුම් ආදායම සඳහා දායකත්වය



වත්කම් සඳහා දායකත්වය



ප්‍රාග්ධන වටිනාකම් නිමැවුම් ක්‍රියාවලිය



ශාඛා බැංකුකරණය හරහා ලංකා බැංකුව විසින් ඒක පුද්ගල ගනුදෙනුකරුවන්, නව ව්‍යවසායකයන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ආදී වූ පුළුල් ලෙස විවිධාංගිකරණයක් සහිත තම ගනුදෙනුකරුවන් වෙත විවිධ වූ ආයෝජන අවස්ථා, ණය සහ අත්තිකාරම් සහ එදිනෙදා බැංකු කටයුතු අවශ්‍ය සේවා ආදී වූ සේවා රැසක් ලබා දෙයි. සුවිශේෂී වූ ගනුදෙනුකාර සේවාවත්, පුළුල්ව පැතිරුණු ශාඛා ජාලයක් සහ දැරිය හැකි මුදලකට ලබා දෙන විශාල විවිධාංගිකරණයක් සහිත සේවා පහසුකම් කළඹ ආදිය, ශාඛා බැංකුකරණය තුළ අප ලබා ඇති තරඟකාරිත්වය අතර ප්‍රමුඛතාව සඳහා හේතු වී ඇත.

මෙහෙයුම් පරිසරය

පහත සාධක හේතුවෙන් මෙහෙයුම් පරිසරය විවිධ වූ අභියෝග ශාඛා බැංකුකරණය සඳහා එල්ල කරන ලදී;

- මන්දගාමී සර්ව ආර්ථික වර්ධනය සහ ආයෝජකයන් විසින් අනුගමනය කරන ලද වඩා සුපරික්ෂාකාරී ආයෝජන සම්බන්ධ තීරණ ගැනීම්
- වසරේ අවසාන කාර්තුව තුළ ඇති වූ දේශපාලනික අස්ථාවරභාවය
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පසුබැස්ම
- රජය විසින් ආනයනය සඳහා පනවන ලද සීමාකිරීම්
- ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ණයගැතිභාවයේ වර්ධනය
- කාලගුණයේ අහිතකර තත්ත්වයන්

මෙහෙයුම් පරිසරය පිලිබඳ වැඩි විස්තර පිටු අංක 120 සිට 125 දක්වා සටහන් කොට ඇත.

උපායමාර්ග සහ කාර්යසාධනය

මෙහෙයුම් පරිසරය තුළ අභියෝග හමුවේ වුවද වසර තුළ ශාඛා බැංකුකරණය විසින් තම වර්ධන වේගය සහ ලාභය ඉහළින් පවත්වා ගනිමින් ඉහළ කාර්යසාධනයක් වාර්තා කරන ලදී. ශුද්ධ පොළී ආදායම 30% කින් වර්ධනය වූ අතර, 13% ක වර්ධනයක් වාර්තා කරන ලද ණය කළඹේ වර්ධනය මේ සඳහා මූලිකව හේතු වන ලදී. ණය කළඹේ වර්ධනය සඳහා මූලිකවම බලපාන ලද්දේ යෝජනා ක්‍රම යටතේ වූ ණය, අයිරා පහසුකම් සහ උකස් ණය වේ. කෙසේ වෙතත් දැඩි ලෙස පිරහීමට ලක් වුන ණය කළඹේ ගුණාත්මකභාවය හේතුවෙන් ණය හානිකරණය සඳහා වූ ප්‍රතිපාදන රු. බිලියන 6.1 ක් දක්වා වසරක් තුළ තුන් ගුණයකින් ඉහළ යන ලදී. එම නිසා වසර තුළ ශාඛා බැංකුකරණයේ වර්ධනය 7% ක් පමණක් වූ අතර එය රු. බිලියන 16.5 ක් විය.

ශාඛා බැංකුකරණයේ කාර්යසාධනය



සේවා කළඹ

ණය සහ අත්තිකාරම්	ආයෝජන අවස්ථා	විදුලිනෙදා බැංකු සේවා
පුද්ගල ණය	විශ්‍රාමික ප්‍රතිලාභ යෝජනා ක්‍රම	ජංගම ගිණුම්
නිවාස ණය	කාලීන තැන්පතු	ණය කාඩ්පත්
ව්‍යාපාර ණය	ජ්‍යේෂ්ඨ පුරවැසි ගිණුම්	හර කාඩ්පත්
සංවර්ධන ණය	ළමා ඉතුරුම් ගිණුම්	ATM කාඩ්පත්,
ක්ෂුද්‍ර මූල්‍ය ණය	තාරුණ්‍ය සඳහා වූ ඉතුරුම් ගිණුම්	අන්තර්ජාල බැංකුකරණය
උකස් ණය	කාන්තාවන් සඳහා වූ ඉතුරුම් ගිණුම්	ජංගම බැංකුකරණය
කල්බදු පහසුකම්		සංචාරක කාඩ්පත්

ණය සහ අත්තිකාරම්

මෙම අංශයේ ණය කළඹ මූලිකවම සමන්විත වනුයේ පුද්ගලික ණය, නිවාස ණය, ව්‍යාපාර ණය/සංවර්ධන ණය, කල්බදු පහසුකම්, අයිරා පහසුකම් සහ උකස් ණය වේ. කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වසර තුළදී වැඩි අවධානයක් යොමු කරන ලද අතර, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය මඟින් බැංකුවට නව ගනුදෙනුකරුවන් පිරිසක්ද එක් විය. ලංකා බැංකුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රු. බිලියන 13.6 ක ණය ප්‍රතිලාභ වසර තුළ නිකුත් කරන ලද අතර එය මෙම ණය යෝජනා ක්‍රමය යටතේ බැංකු අංශය විසින් නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් 45% ක් පමණ වේ. ඉහළ ගිය රත්රන් මිල ගණන් හමුවේ, වසර තුළ උකස් ණය ඉහළ ගිය අතර එහි වර්ධනය 12.5% ක් විය. නිවාස සහ පුද්ගල ණය අනුපිළිවෙලින් 17% හා 18.4% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

ණය කළඹේ සංයුතිය



ණය කළඹේ ගුණාත්මකභාවය

ණය කළඹේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම වසර තුළ අභියෝගාත්මක වූ අතර දුර්වල වූ සාර්ව ආර්ථික දර්ශක, ඉදිකිරීම් කර්මාන්තයෙහි ඇති වූ පීඩාකාරී තත්ත්වයන් සහ උතුරු සහ නැගෙනහිර පළාත් හි ඇති වූ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන්, ක්ෂේත්‍රය පුරාම අක්‍රීය ණය ඉහළ ගොස් ඇත. අක්‍රීය ණය කළඹේ ඉහළ යාම පාලනය සඳහා ක්ෂේත්‍රය විසින් ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්නා ලද අතරම අක්‍රීය ණය අංශයට මාරු වූ ණය අයකරගැනීම සඳහා ද විවිධ වූ වාරික අයකර ගැනීමේ සහ විපරම් කිරීමේ ක්‍රියාවලින් ද ක්‍රියාවට නංවන ලදී. මෙලෙස ක්‍රියාවට නංවන ලද සමහර ක්‍රියාමාර්ග වනුයේ;

- ණය අයකරගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීම සඳහා ස්වයංක්‍රීය වැඩ ප්‍රවාහයන් හදුන්වා දීම
- ප්‍රධාන කාර්යසාධක දර්ශක අතරට ණය අයකර ගැනීමේ කාර්යක්ෂමතාවය ඇතුලත් කිරීම
- අක්‍රීය ණය පිලිබඳ කාර්යභාර නිලධාරීන් දැනුවත් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම
- නව සේවක මණ්ඩලය සඳහා ණය අයකරගැනීම පිළිබඳව පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම

මෙවැනි ක්‍රියාමාර්ග හේතුවෙන්, ශාඛා බැංකුකරණ අංශයට දිගින් දිගටම දුර්වල වෙමින් තිබූ ණය කළඹේ ගුණාත්මකභාවය යම් තරමකට පාලනය කර ගත හැකි වූ අතර, අක්‍රීය ණය අනුපාතය 2017 වසරේ 3.2% සමඟ සන්සන්දනය කිරීමේදී 3.8%ක් ලෙස 2018 වසරේදී වාර්තා විය.

තැන්පතු මිශ්‍රය



තැන්පතු

මුළු තැන්පතු වලින් 68% ක තැන්පතු ප්‍රමාණයක් රඳවා ගනිමින් ශාඛා බැංකුකරණ අංශය බැංකුවේ තැන්පතු රැස් කරන ප්‍රධාන අංශය ලෙස ක්‍රියා කරයි. රට පුර විහිදුනු, තරඟකරුවන්ට සම කල නොහැකි ශාඛා ජාලය, ගනුදෙනුකරුවන් විසින් අප කෙරේ තබා ඇති විශ්වාසය සහ අප සන්නාමය හා බැඳී ඇති ස්ථාවරත්වය සහ ඩිජිටල් බැංකුකරණය හරහා ගනුදෙනුකරුවන්ට ලැබී ඇති පහසුව ආදී සාධක හේතුවෙන් අපට මෙලෙස ඉහළ තැන්පතු ප්‍රමාණයක් රැස් කිරීමට හැකි වී ඇත. පැවති ඉහළ පොළී ප්‍රතිශතය හමුවේ පසුගිය වසර තුළ ශාඛා බැංකුකරණය සතු තැන්පතු ප්‍රමාණය රු. ට්‍රිලියන 1.2 ක් දක්වා දක්වා 14% ක වර්ධනයක් පෙන්වන ලදී. වසර තුළ සිදුකරන ලද නිර්මාණශීලී තැන්පතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්, ජංගම ශාඛා සහ රට පුරා ස්ථාපිත මුදල් චක්‍රීකරණ යන්ත්‍ර ආදිය තැන්පතු වර්ධනය සඳහා හේතු විය. කෙසේ වෙතත් පැවති ඉහළ පොළී අනුපාත හේතුවෙන් වසර තුළ ජංගම සහ ඉතිරි කිරීමේ ගිණුම් අනුපාතය 44%ක් දක්වා තව දුරටත් අවප්‍රමාණය වන ලදී.

ශාඛා බැංකුකරණය

ඉතිරි කිරීමේ පරිසරයක් ගොඩනැඟීම

ලංකා බැංකුව විසින් රට පුරා පවත්වාගෙන යනු ලබන පාසල් ඉතිරි කිරීමේ සංසඳ මඟින්, බැංකුවට තම ජාලය ව්‍යාප්ත කර ගැනීමට හැකි වී ඇති අතරම, අනාගත පරපුරේ දරුවන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීමට හැකි වී ඇත. 2018 වසර අවසාන දිනට බැංකුව විසින් ක්‍රියාත්මක කරන පාසල් ජංගම තැන්පතු ඒකක 628 ක් දිවයින පුරා ක්‍රියාත්මක කරන අතර, පාසල් ඉතිරි කිරීමේ සංසඳ 1,373 ක පළාත් ව්‍යාප්තිය මේ සමඟ දක්වා ඇත.

වසර තුළ විවිධ වූ තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් පැවැත්වීම තුළින් අපගේ ඉතිරි කිරීම් සහ ජංගම තැන්පතු අනුපාතය ඉහළ නංවා ගැනීමට හැකි විය;

- පෙර පාසල් සහ පළමු වසර සඳහා පාසල් වලට ඇතුල් වන සිසුන් සඳහා සිදු කරන ලද තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන්
- 'ලිට්ල් පිකාසෝ' චිත්‍ර තරඟය සහ සමගාමීව සිදුකරන ලද ළමා ඉතිරි කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන
- ලෝක කාන්තා දිනය හා සමගාමීව සිදු කරන ලද තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන
- සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද මුල් කරගෙන සිදු කරන ලද ළමා ඉතිරි කිරීම් ගිණුම් විවෘත කිරීමේ වැඩසටහන
- උපදින සැමට ගිණුමක් වැඩසටහන

පාසල් ඉතිරි කිරීමේ සංසඳ වල පළාත් ව්‍යාප්තිය



එදිනෙදා බැංකු කටයුතු සඳහා සපයා ඇති සේවා

බැංකුවේ ඩිජිටල් ක්‍රියාන්විතයට සමගාමීව බැංකුව විසින් හර කාඩ්පත් හා බැර කාඩ්පත් භාවිතය නොනවත්වා ප්‍රවර්ධනය කරමින් සිටී. වසර තුළ බැංකුව විසින් නව හර කාඩ්පත් 852,401 ක් නිකුත් කර ඇති අතර ඒ සමඟ 2018 වසර අවසානය වන විට පැවති මුළු හර කාඩ්පත් ගණන මිලියන 4.5 ක් දක්වා ඉහළ යන ලදී. ඒ අතර බැංකුව මඟින් නිකුත් කර ඇති සක්‍රීය ණය කාඩ්පත් සහ හර කාඩ්පත් සංඛ්‍යාව 9% සහ 15% ක් ලෙස වසර තුළ අනුපිළිවෙලින් ඉහළ යන ලදී. හර කාඩ්පත් හරහා සිදුකරන ලද ගනුදෙනු වල වටිනාකම වසර තුළ රු. බිලියන 65 ක් දක්වා 3% කින් ඉහළ ගිය අතර ණය කාඩ්පත් මඟින් සිදුකරන ගනුදෙනු වල වටිනාකම් රු. බිලියන 10.4 ක් දක්වා වසර තුළ 5% කින් ඉහළ යන ලදී. ඩිජිටල් බැංකු ප්‍රවාහ සඳහා හුරු වීමේ ප්‍රතිශතය 65.5% ක් වූ අතර 2020 වසර අවසානය වන විට ඒම ප්‍රතිශතය 90% දක්වා ඉහළ අගයකට ගෙන ඒම අප විසින් අපේක්ෂා කෙරේ. මුදල් රහිත ගනුදෙනු බැංකුවේ මුළු ගනුදෙනුවලට 4.6% ක ප්‍රතිශතයක් ලෙස දැක් විය හැකි අතර, තවදුරටත් ඩිජිටල් බැංකු ප්‍රවාහ ඉහළ දැමීම බැංකුවේ අභිප්‍රායවේ.

හර කාඩ්පත් ගනුදෙනු වල වර්ධනය



ණය කාඩ්පත් ගනුදෙනු වල වර්ධනය



සංවර්ධන ණය

සමාජ සංවර්ධනය සඳහා වැදගත් ප්‍රවේශයක් ලෙස මෙන්ම අනාගතයේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවකු ලෙසද කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ලංකා බැංකුව විවිධ වූ යෝජනා ක්‍රම යටතේ වූ ණය වර්ග රැසක් හරහා ආර්ථිකයේ වඩාත් වැදගත් ක්ෂේත්‍ර රැසක් සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ණය ලබා දීමේ ප්‍රධාන පාර්ශ්වකරුවකු ලෙස ක්‍රියා කරන අතර, ගනුදෙනුකරුවන්ට දැරිය හැකි පොළී ප්‍රතිශතයන්ට ණය ප්‍රදානය කරනු ලබයි. 2018 වසර අවසානය වනවිට බැංකුවේ කුඩා හා මධ්‍ය පරිමාණ ණය කලඹ (ක්ෂුද්‍ර මූල්‍යනයද ඇතුළුව) රු. බිලියන 64.4 ක් වූ අතර, කුඩා හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් 550,000ක් පමණ සිටී. රාජ්‍ය බැංකුවක් ලෙස වසර තුළ අප විසින් කුසලතා සපිරි නව ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සඳහා හඳුන්වා දෙන ලද "චෙන්ටප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීයව දායක වන ලදී. වසර 2018 තුළ, මෙම ව්‍යාපෘතිය හරහා බැංකුව විසින් රු. බිලියන 13.6 ක මුළු වටිනාකමකින් යුක්තව ණය පහසුකම් 10,507 ක් 2018 දෙසැම්බර් 31 වන දින වන විට ප්‍රදානය කර ඇත.

සංවර්ධන ණය කළඹ



"එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය

ණය ප්‍රදානයන් 10,507ක

2018 වසර අවසානයේ ශේෂය
රු. බිලියන 13.6ක්

එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා යටතේ වැඩිම ණය ප්‍රදානයන් සිදුකළ බැංකුව

1% කට වඩා අඩු අක්‍රීය ණය අනුපාතය

ක්ෂුද්‍ර මූල්‍යනය

ලංකා බැංකුව මඟින් සිදුකරන ක්ෂුද්‍ර මූල්‍යයන්ගේ අරමුණ වනුයේ දැරිය හැකි පොළී ප්‍රතිශතයන්ට සමාජයේ පහළ ස්ථරයන්හි සිටින ණය සඳහා අවස්ථා දුර්ලභ ස්වකීය ජනයා සඳහා ණය ප්‍රදානයන් මඟින් ව්‍යාපාරික මෙන්ම සමාජීය තිරසාරකත්වයක් ලඟාකර ගැනීම වේ. මිතුරු ක්ෂුද්‍ර මූල්‍යයන ව්‍යාපෘතිය තුළින් මිතුරු කණ්ඩායම් සහ සමිති සඳහා ණය ලබාදෙන අතර මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ දුෂ්කර පලාත්වල ව්‍යවසායන් වර්ධනය හා නගා සිටුවීම වේ. 2018 වසරේ අවසානය වනවිට බැංකු ක්ෂුද්‍ර මූල්‍ය ණය කලඹේ ශේෂය රු. බිලියන 8.7 ක් වූ අතර 496,000 කට අධික ණය ප්‍රදානයන් ගණනක් සිදුකර තිබුණි. නව ගනුදෙනුකරුවන් අතර මූල්‍ය විනය දියුණුකරනු වස් බැංකුව විසින් මූල්‍ය ණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්ද ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් සම්බන්ධ කරගෙන සිදුකර ඇත.



ශාඛා බැංකුකරණය

කුඩා හා මධ්‍යම පරිමාණ අංශය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය ඉලක්ක කර ගනිමින් වසර තුළ නව ණය වර්ග තුනක් හඳුන්වාදෙන ලදී.

ඇරඹුම	ග්‍රීන් ලෝන්	කුඩා පරිමාණයේ කෘෂි ව්‍යාපාර සහයෝගිතාවයන්
නව උපාධිධාරීන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට ප්‍රතිපාදන සැලසීම	දිරාපත් වන ද්‍රව්‍ය යොදා ගනිමින් විවිධ වූ ඇසුරුම් මළු සහ ඇසිරුම් උපකරණ නිෂ්පාදනය සහ සංචාරක නිවාස හිමිකරුවන් සඳහා ලබාදෙන ණය	කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීම් සහ කෘෂිකාර්මික ව්‍යාපෘති වල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පහසුකම්

ඉදිරි දැක්ම

සංවර්ධන ණය සහ උකස් ණය පිළිබඳව අවධානය යොමුකරමින් ශාඛා බැංකුකරණය ඉදිරි වසර තුළ නව වර්ධනය පිළිබඳ සැලසුම් සකස්කර ඇත. ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශයේ විශාල අවස්ථා රැසක් ඇති අතර එම අංශය තුළින් ව්‍යවසායකයන් බිහිවීමටද එලෙසම විශාල අවකාශයක් අති බව අප විශ්වාස කරන්නෙමු. එම නිසා මෙම අංශය කෙරේ වඩ වඩාත් ණය ප්‍රදානයන් යොමු වනු ඇත. ණය කළඹේ ගුණාත්මක්භාවය ආරක්ෂා කර ගැනීම ද ඉදිරි වසර තුළ ප්‍රමුඛතාවයක් හිමි වනු ඇති අතර 2018 වසර තුළදී අක්‍රීය ණය අනුපාතය පහළ හෙලීම සහ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරණු පිණිස අප විසින් හඳුන්වා දුන් ක්‍රියාවලින් කෙරේ අප තවදුරටත් අවධානය යොමු කරනු ඇත. කෙටි කාලීන අභියෝග පෙනෙන්නට තිබුනද මධ්‍ය කාලීන සහ දිගු කාලීනව වඩා යහපත් ඉදිරි දැක්මක් අපට අපේක්ෂා කළ හැකි අතර ශාඛා බැංකුකරණ අංශය රටේ ආර්ථික සෞභාග්‍යයත්වය ඉලක්ක කර ගනිමින් අංශයේ උපායමාර්ග රජයේ සංවර්ධන ඉලක්ක හා අනුරූපී වෙමින් පවත්වා ගනු ඇත.

ආයතනික හා අක්වෙරළ බැංකුකරණය

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය කාර්යසාධනය 2018

රු. මිලියන	2018	2017	වෙනස (වාර්ෂික)
ශුද්ධ පොළී ආදායම	17,327	19,819	(13%)
මෙහෙයුම් ආදායම	25,426	22,871	11%
ණය හානිකරණ ප්‍රතිපාදන	8,231	7,781	6%
මෙහෙයුම් වියදම්	5,219	4,110	20%
මෙහෙයුම් ලාභය	11,975	10,980	9%
මුළු වත්කම්	833,652	601,742	39%
මුළු වගකීම්	789,016	567,473	39%

මෙහෙයුම් ආදායම සඳහා අංශයේ දායකත්වය



මුළු වත්කම් සඳහා දායකත්වය





රටේ ආර්ථික වර්ධනය සඳහා සුවිශේෂී වූ දායකත්වයක් සපයමින් ආයතනික අංශය ආයතනික ගනුදෙනුකරුවන් රජය, රාජ්‍ය ව්‍යවසාය සහ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා කෙටි කාලීන, මධ්‍යම කාලීන සහ දිගු කාලීන ණය ප්‍රදානයන් සිදුකරනු ලබයි. තරඟකාරී ව්‍යාපාර පරිසරයන් තුළ තරඟකාරිත්වය තුළ ඉදිරියෙන්ම සිටුනු වස් ආකර්ශණීය පොළී අනුපාත සමඟින් පෞද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම හා සුවිශේෂී ගනුදෙනුකාර සේවාවන් සැලැසීම මෙම වසර තුළ ප්‍රමුඛතාව ලැබූ ක්‍රියාකාරකම් වේ.

මෙහෙයුම් පරිසරය

වසරේ බොහෝ මාසවල සාර්ව ආර්ථික සාධක අභියෝගාත්මක ලෙස පැවතුනි.

- පහත වැටුණ ආයෝජකයන්ගේ විශ්වාසය
- වසරේ පළමු මාස නවය තුළ දළ විදේශීය වත්කම් ඉහළ යාම
- රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් පාරිභෝජනය පහළ යාම සහ ඉහළ පොළී ප්‍රතිශත නිසා පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රදානයන් හි මධ්‍යස්ථ වර්ධනයක් පමණක් පෙන්වීම
- අක්‍රීය ණය අනුපාත ඉහළ යාම
- නව බදු රෙගුලාසි

(මෙහෙයුම් පරිසරය පිළිබඳ තවත් පැහැදිලි කිරීම් සඳහා පිටු අංක 120 සිට 125 දක්වා බලන්න)

උපායමාර්ග සහ කාර්යසාධනය

නව ගනුදෙනුකරුවන් ලඟාකර ගැනීම, ඒකාබද්ධ ණය පහසුකම් ලබාදීම පුළුල් කිරීම සහ ගනුදෙනුකාර සේවාව ඉහළ තලයකට ගෙන වීම ආදි කාරණා හේතු කොට ගෙන වසර තුළ ආයතනික අංශයේ ණය සහ අත්තිකාරම් හි 35%ක වර්ධනයක් වාර්තා කරන ලදී. වසර තුළදී අංශය විසින් වෙළඳපොළ කොටස ඉහළ නංවා ගැනීම වස් ප්‍රමාණාත්මක වර්ධනයක් අපේක්ෂා කළ අතර එම නිසා තරඟකාරී පොළී අනුපාත ලබා දෙමින් නව ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගත් අතර, ඒ හේතු කොට ගෙන ශුද්ධ පොළී ආන්තිකය පහළ ගිය අතර, ශුද්ධ පොළී ආදායම 13% කින් පහළ යන ලදී. එමෙන්ම ණය ලබාදීමට වඩා සුදුසු ගනුදෙනුකරුවන් දිනා ගැනීමට හැකිවීම තුළින් ආයතනික අංශයට වසර තුළ ණය හානිකරන ප්‍රතිපාදන 6% කින් පහළට ගෙන වීමට හැකිවිය. සමස්ථයක් ලෙස අංශයේ මෙහෙයුම් ලාභය වසර තුළ රු. බිලියන 11.8 කට පමණක් සීමා විය. කෙසේවෙතත්, ණය කලඹේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරමින් අංශයේ මුළු වත්කම් වසර තුළ 39% කින් වර්ධනය විය.

ආයතනික හා අක්වෙරළ බැංකුකරණය

ආයතනික බැංකුකරණය

වසර තුළ පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම්හි 23% ක වර්ධනයක් සමඟින්, පෞද්ගලික අංශය තුළ තම පැවැත්ම ඉහළ නංවා ගැනීමට බැංකුව වසර තුළ සමත් වූ අතර එමඟින් අංශයේ වර්ධනය තව දුරටත් වැඩිදියුණු කර ගනිමින් සිටී. පැහැදිලි ණය ගෙවීමේ ශක්‍යතාවක් සහිත පෞද්ගලික අංශයේ නව ගනුදෙනුකරුවන් රැසක් තරඟකාරී පොළී අනුපාත සමඟින් බැංකුවට එක් කර ගැනීම තුළින් අංශයේ අවදානම සහ ප්‍රතිලාභ අතර සමතුලිතය පවත්වා ගැනීමට හැකි වූ අතර, ණය ගෙවීම පිළිබඳ හානි නොවූ ඉතිහාසයක් සහිත ගනුදෙනුකරුවන් ආකර්ශණය කර ගැනීම මඟින් ණය කලඹේ ගුණාත්මකභාව ඉහළ නංවා ගැනීමට හැකිවිය. ගනුදෙනුකාර සබඳතා තව දුරටත් වර්ධනය සහ ගනුදෙනුකාර සේවාවේ ගුණාත්මකභාවයේ වර්ධනය යන අංශ කෙරේ පසුගිය වසර තුළ වැඩි අවධානයක් යොමු කරන ලදී. ගනුදෙනුකරුවන් සඳහා සුහද හමු පැවැත්වීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් නිසි අකාරයෙන් ක්‍රියාත්මක නොවන ව්‍යාපාර සඳහා පිටුවහලක් වීම ආදී වූ කරුණු මුල් කරගෙන ගනුදෙනුකරුවන්ට සුවිශේෂී වූ වටිනා සේවාවන් සැපයීමත්, ගනුදෙනුකරුවන් හා ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් හැකි විය.

ශ්‍රී ලංකා රජය සඳහා ණය ප්‍රදානයන් සිදුකරන බැංකු අතරින් ලංකා බැංකුව ප්‍රමුඛස්ථානයක් ගනී. ශ්‍රී ලංකා රජයට සහ රාජ්‍ය ව්‍යවසාය සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය අංශයේ මුළු ණය කලඹේන් 60% ක් වූ අතර එහි වාර්ෂික වර්ධනය 45% ක් විය.

ව්‍යාපෘති සඳහා ණය ප්‍රදානයන්

පසුගිය වසර කිහිපය පුරාවටම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විවිධ වූ ව්‍යාපෘති සඳහා ණය ලබා දීම මඟින් ලංකා බැංකුව රටේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායකත්වය සපයා ඇත. වසර තුළ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කිහිපයකටත්, අපද්‍රව්‍ය මඟින් විදුලිය නිපදවන ව්‍යාපෘති සහ මාලදිවයින් රාජ්‍යයේ හෝටල් ව්‍යාපෘති කිහිපයකටත් බැංකුව විසින් ණය ප්‍රදානයන් සිදු කර ඇත. එමෙන්ම ජලාප්‍රවාහන මණ්ඩලයේ ව්‍යාපෘති කිහිපයකටත්, අධිවේගී මාර්ග ගොඩනැගීම සඳහාත්, වරාය සංවර්ධන ව්‍යාපෘති සඳහාද රජය සඳහා බැංකුව විසින් ණය ලබා දී ඇත.

ආයතනික අංශයේ කාර්යසාධනය



ආයතනික අංශයේ ණය කළඹේ මිශ්‍රය



ආයතනික අංශයේ රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා ලබා දී ඇති ණය



වෙළඳ මූල්‍යකරණ අංශය

වෙළඳ මූල්‍යකරණ අංශය, අපනයන සහ ආනයන ප්‍රවර්ධනය සඳහා විවිධ වූ සේවා රැසක් ක්‍රියාත්මක කරන අතර, රජය, පෞද්ගලික අංශයේ ආයතනික ගනුදෙනුකරුවන් සහ කර්මාන්ත මණ්ඩල ආදිය සඳහා උපදේශනයන්ද සපයනු ලැබේ. මෙම අංශය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යනු ලැබේ. මේ ඔස්සේ නව අපනයනකරුවන් සහ අපනයන වෙළඳපොළ හඳුනාගැනීමත්, ඒ ඔස්සේ එම එක් එක් අපනයන වෙළඳපොළ සඳහා බලපැවැත්වෙන බැංකු ගනුදෙනු හා අදාල නීති රෙගුලාසි හා ක්‍රියාදාමයන් පිළිබඳ නව අපනයනකරුවන් දැනුවත් කිරීම සිදු කරනු ලැබේ. ශාඛා ජාලයේ සේවක මණ්ඩලය සඳහා වෙළඳ මූල්‍ය කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීමත්, අපනයන සංවර්ධන මණ්ඩලය හා සම්බන්ධ වෙමින් අපනයනකරුවන් සඳහා වෙළඳ මූල්‍යන ක්‍රියාවලි පිළිබඳ වැඩසටහන් පැවැත්වීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. වසර තුළ වෙළඳ මූල්‍යකරණ අංශය මඟින් ලබාදී ඇති ණය රු. බිලියන 54.3 ක් දක්වා 18% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

ඉතා පුළුල් නියෝජිත ජාලයක් සහ ප්‍රබල සන්නාම පිළිගැනීමක් සහිතව ක්‍රියාත්මක වන වෙළඳ මූල්‍යකරණ අංශය බැංකුවේ ඉතා ස්ථාවර සහ ශක්තිමත් පැවැත්මක් සහිත අංශයක් වේ.

අක්වෙරළ බැංකු අංශය

වසර තුළ, තවත් වාණිජ බැංකු හා එක්ව බැංකුව විසින් ඉන්දියාව හා සිංගප්පුරුව ආදී රටවල විවිධ ව්‍යාපෘති සඳහා ණය ලබාදීම ඔස්සේ ඒකාබද්ධ ණය සඳහා තම නිරාවරණය ඉහළ නංවා ඇත. මාලදිවයින් රාජ්‍යයේ හෝටල් ව්‍යාපෘතියක් සඳහා ඇ. ඩො. මිලියන 22.0 ක ඒකාබද්ධ ණය පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ ප්‍රමුඛ බැංකුකරු ලෙස කටයුතු කරන ලද්දේ ද ලංකා බැංකුව වේ. මෙම අංශය මඟින් අපනයන අංශය සඳහා රු. බිලියන 10.3 ක් හා ශ්‍රී ලංකා රජය සඳහා රු. බිලියන 27.0 ක ණය පහසුකම් සපයා ඇත.

වෙළඳ මූල්‍යකරණ අංශය සතු ආදායම්හි මිශ්‍රය



ඉදිරි දැක්ම

ව්‍යාපෘති සඳහාම විශේෂිත වූ ඒකකයන් සමඟින් ව්‍යාපෘති ණය ලබා දීම ඉදිරි වසර තුළ අපගේ ප්‍රධාන ඉලක්කයන් වනු ඇත. රාජ්‍ය අංශය සඳහා ණය පහසුකම් සපයන අතරම රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නිරාවරණය අතර සමතුලිතයක් පවත්වාගනු වස්, පෞද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් හා පවතින සම්බන්ධතාවන් වර්ධනය කර ගැනීම සහ එමඟින් ආයතනික අංශය තුළ පෞද්ගලික අංශයේ සඳහා වන නිරාවරණය ඉහළ නංවා ගැනීම තවදුරටත් අපේක්ෂා කෙරේ. ඒකාබද්ධ ණය ප්‍රදානය කිරීම් තුළ ලංකා බැංකුව ලබා ඇති ප්‍රගතිය හේතු කොට ගෙන ඒකාබද්ධ ණය අරමුදල් සැපයීමේදී ප්‍රමුඛ බැංකුකරු ලෙස හෝ පාර්ශ්වකාර බැංකුකරුවෙකු ලෙස සහභාගී වීම සඳහා ලංකා බැංකුවට ඉදිරියේදී විශාල අවස්ථා ප්‍රමාණයක් ලැබෙනු ඇත. ඩිජිටල් බැංකු කටයුතු ඔස්සේ ණයවර ලිපි අන්තර්ජාල බැංකුකරණය හරහා නිකුත් කිරීම ආදී වූ ගනුදෙනුකරුවන් සඳහා අඟය එකතු කිරීමේ ක්‍රියාවලි ඔස්සේ තම සේවාවන් පුළුල් කිරීම හා කුඩා එහෙත් නව වෙළඳපොළ අවකාශයන් කෙරේ අවධානය යොමු කිරීම ආදිය වෙළඳ මූල්‍ය අංශයේ ඉදිරි උපායමාර්ග වේ.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් අංශය

කාර්යසාධන සංක්ෂිප්තය 2018

රු. මිලියන	2018	2017	වෙනස (වාර්ෂික)
ශුද්ධ පොළී ආදායම	10,914	9,657	13%
මෙහෙයුම් ආදායම	18,077	14,340	26%
මෙහෙයුම් වියදම්	4,953	4,216	17%
මෙහෙයුම් ලාභය	12,737	10,424	22%
මුළු වත්කම්	643,024	621,866	3%
මුළු වගකීම්	608,595	586,451	4%

මෙහෙයුම් ආදායම සඳහා දායකත්වය



මුළු වත්කම් සඳහා දායකත්වය



ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය අංශය බැංකුවේ විවිධ වූ ක්‍රියාවලි රැසක් සඳහා තම දායකත්වය සපයමින් විශිෂ්ට සේවාවක් සිදු කරනු ලැබේ. ජාත්‍යන්තර අංශය, විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනු, විදේශීය ප්‍රේෂණ, විදේශ ගමන් කාඩ්පත් (ට්‍රැවල් කාඩ්පත්) නිකුත් කිරීම, විදේශීය මුදල් තැන්පතු පහසුකම් සැපයීම ආදී වූ සේවා රැසක් සපයනු ලැබේ. භාණ්ඩාගාර අංශය මඟින්, බැංකුවේ දේශීය සහ විදේශ මුදල්හි ද්‍රවශීලතාව පාලනය, වත්කම් සහ වගකීම් කළමනාකරණය සහ විදේශ විනිමය සහ පොළී අනුපාත හා සබැඳි අවදානම් කළමනාකරණය සිදු කරනු ලබයි. ආයෝජන අංශය මඟින් ආයෝජන කලඹ කළමනාකරණය, භාරකාර හා පාලිත සේවා සැපයීම සහ ණයකර සහ සුරුකුම්පත්‍ර සැලසුම් කිරීම ආදී වූ සේවා සැපයීම සිදු කරනු ලබයි.

මෙහෙයුම් පරිසරය

අංශයේ කාර්යසාධනය සඳහා 2018 වසර තුළ හේතු වූ ප්‍රධාන නියාමනයන් පහත දැක්වේ,

- මුදල් ප්‍රතිපත්තින්හි දිශානතිය: නිත්‍ය පොළී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව පහත හෙළීමත් ඒ සමඟම 2018 නොවැම්බර් මසදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද ඒකක 150 කින් පහත හෙළීම.
- පොළී අනුපාත: වසරේ අවසාන භාගයේදී තැන්පතු සහ ණය ලබා දීමේ පොළී අනුපාත වල ඉහළ යාමක් පෙන්වන ලදී.
- විදේශ විනිමය: ශ්‍රී ලංකා රුපියල්, ඇමරිකා ඩොලර්ට සාපේක්ෂව 20% කින් පමණ විශාල ලෙස පහත වැටීම.

(වැඩිදුර විස්තර සඳහා පිටු අංක 120 සිට 125 දක්වා බලන්න).

උපායමාර්ග සහ කාර්යසාධනය

වසර තුළ මෙහෙයුම් ආදායමේ 26% ක වර්ධනයක් වාර්තා කරමින් මෙම අංශය ඉහළ කර්යසාධනයක් වාර්තා කරන ලදී. විදේශ විනිමය, ආයෝජන ආදායම් සහ විදේශීය ශාඛා මඟින් ශක්තිමත්ව ලාභ ඉපැයීම ඉහළ යාම ආදී කරුණු හේතු කොට ගෙන වසර තුළ මෙම අංශය මඟින් ඉතා ඉහළ කර්යසාධනයක් වාර්තා කරන ලදී. බැංකුවේ මුළු මෙහෙයුම් ආදායමෙන් 21% ක කොටසක් මෙම අංශය මඟින් උපයනු ලැබේ.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර, ආයෝජන සහ විදේශීය මෙහෙයුම් අංශය



ජාත්‍යන්තර අංශය

විදේශීය ප්‍රේෂණ වෙළඳපොළ තුළ පළමුවන ස්ථානය තවදුරටත් රැක ගනිමින්, ජාත්‍යන්තර අංශය වසර තුළ සන්ධිස්ථානයන් රැසක් පසු කරන ලදී. මෙම තරඟකාරී ප්‍රේෂණ වෙළඳපොළ තුළ 40% කට ඉහළ වෙළඳපොළ කොටසක හිමිකාරිත්වය පවත්වාගැනීම කෙරේ සිය උපායමාර්ග දිශාගත කරන ලද අතර ඒ ඔස්සේ, පවත්නා නියෝජිත ආයතන සහ නියෝජිත බැංකු සමඟ පවතින වෙළඳපොළ සබඳතා ශක්තිමත් කර ගැනීම, කාර්යපටිපාටීන් තවදුරටත් සරළ සහ පහසු කිරීම සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂනය කර ගැනීම කෙරේ වඩාත් අවධානය යොමු කරන ලදී. යුරෝපය, ඇමරිකාව, කැනඩාව සහ චික්සත් රාජධානිය ආදී මෙතෙක් අවධානය යොමු නොකරන ලද විහෙත් ශ්‍රී ලාංකිකයන් රැසකගෙන් සමන්විත ප්‍රේෂණ වෙළඳපොළක් සහිත රටවල්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ප්‍රේෂණ මෙරටට ගෙන්වා ගැනීම සඳහා ඩිජිටල් ප්‍රේෂණ හුවමාරු පද්ධතියක් ස්ථාපනය කිරීම මඟින් කොමිස් ආදායම ඉහළ නංවා ගැනීමටද ඉදිරියේදී අපේක්ෂා කෙරේ. කාර්යපටිපාටීන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සේවක අභිප්‍රේරණය හේතු කොට ගෙන මෙම අංශයට තම අංශය සතු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල ශාඛාව මඟින් ගනුදෙනුකරුවන් සඳහා ලබා දෙන සේවාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට හැකි වී ඇත. අංශය නොකඩවා තම සේවා කළඹ ප්‍රසාරණය කරමින් සිටී.

භාණ්ඩාගාර අංශය

විදේශ විනිමය ආදායම ඉහළ නංවා ගැනීම සහ භාණ්ඩාගාර සුරුකුම්පත් වල සිදු කර ඇති ආයෝජනයන් උපරිම ලෙස කළමනාකරණය කිරීම ඔස්සේ වී මඟින් ලැබෙන ආදායම උපරිම අගයකට ලගා කර ගැනීමත් මඟින් භාණ්ඩාගාර අංශය, මෙම අංශයේ ලාභය සඳහා ඉහළ දායකත්වයක් සපයනු ලැබේ. මෙම අංශය නියෝජිත ආයතන හා පවතින වෙළඳ සම්බන්ධතාවන් ශක්තිමත් කර ගනිමින්, ප්‍රාපනික මෙහෙයුම් ඔස්සේ විදේශ ආදායම ඉහළ නංවා ගනිමින් සිටී. ආර්ථික හා වෙළඳපොළ තත්ත්වයන් පදනම් කරගනිමින් බැංකුව අරමුදල් සපයා ගන්නා මූල්‍යන්හි සංයුතිය හා ණය පොළී අනුපාතයන් නිවැරදිවම සහ සියුම්ව කළමනාකරණය කරමින්, බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය ප්‍රශස්ත අගයකට ගෙන වීම සඳහා මෙම අංශය ඉහළ දායකත්වයක් සපයනු ලැබේ. උපායමාර්ග සැලැස්මේ එකඟ වී ඇති වර්ධන වේගය අත්පත් කරගන්නා අතරම, ද්‍රවශීලතා අනුපාතය ප්‍රමාණවත් අගයක පවත්වා ගැනීම සඳහා විස්තරාත්මක ද්‍රවශීලතා කළමනාකරණ රාමුවක් භාණ්ඩාගාර අංශය සතු වේ. එමෙන්ම වත්කම් සහ වගකීම් කල්පිරීමේ නොගැලපීම් මෙම අංශය මඟින් නොනවත්වා අවධානය යොමු කරන අතර, සෑම අවස්ථාවකම ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ. කාලානුරූපීව රජයේ සුරුකුම්පත් වල ආයෝජනය කිරීමේ තීරණ ගැනීම සහ එමඟින් රජයේ සුරුකුම්පත් මඟින් ලැබෙන පොළී ආදායම් සහ ප්‍රාග්ධන ලාභ ඉපැයීම ඉහළ නංවා ගැනීමට වසර තුළ උපායමාර්ගික ප්‍රවේශයන් සිදු කරන ලදී. ඇ. ඩො. මිලියන 500 ක දෙවන අන්තර්ජාතික බැඳුම්කරයද සාර්ථකව පියවීමට හැකිවීම භාණ්ඩාගාර අංශය වසර තුළ අත්පත් කරගත් සුවිශේෂී සංධිස්ථානයකි.

ආයෝජන බැංකු අංශය

තම ආයෝජන සේවා කලඹ ප්‍රසාරණය කිරීම, මූල්‍ය අංශයේ අතරමැදියන් සමඟ පවතින ව්‍යාපාරික සම්බන්ධතා ශක්තිමත් කරගැනීම සහ සංස්ථාපිත ණය සුරුකුම්පත් සහ කොටස් නිකුත් කිරීම පිළියෙළ කිරීමේ වෙළඳපොළ තුළ තම ස්ථාවරත්වය පුළුල් කර ගැනීම මඟින් මෙම අංශය තම ස්ථානය ශක්තිමත් ලෙස රඳවා ගැනීමට උත්සහ කරයි. එමෙන්ම මෙම අංශය මඟින් ඉහළම ගනුදෙනුකාර භවතුන්, ආයතනික ආයෝජකයින් සහ අරමුදල් සඳහා අභිමතානුසාරී කලඹ කළමනාකරණ සේවාවන් ලබා දීමද සිදු කරනු ලැබේ. පසුගිය වසර තුළ අංශය මඟින් රු. බිලියන 12 ක් වටිනා ලැයිස්තු ගත නොකළ ණයකර නිකුත්කළ අතර එමඟින් එම ව්‍යාපාර අංශය තුළ අපගේ ශක්‍යතාව තවදුරටත් සහතික වන ලදී.

විදේශීය මෙහෙයුම්

නැගී එන සංචාරක ව්‍යාපාරය මඟින් ඇතිවන ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කර ගැනීම වස් වසර තුළ ලංකා බැංකුව විසින් මාලදිවයින තුළ තම දෙවන ශාඛාව විවෘත කිරීම සඳහා සියලු පියවර ගන්නා ලදී. ස්ථාපිත මූල්‍ය ආයතන හා ව්‍යාපාරික හවුල්කාරිත්වයන් ගොඩනගා ගනිමින් කලාපය තුළ නැගී එන වෙළඳපොළවල්හි අපගේ ව්‍යාප්තිය වර්ධනය කිරීමට අප නොනවත්වා ක්‍රියාත්මක වනු ලැබේ. එමඟින් අපගේ සන්නාම නාමය වර්ධනය කිරීමද අපේක්ෂා කෙරේ. විදේශීය ශාඛා වල වර්ධනය සහ ලාභය ඉහළ නංවා ගැනීම වසර තුළ අවධානය යොමු වූ ප්‍රධාන ඉලක්කයකි. වී සඳහා අපගේ සේවාවන් සමාලෝචනය සහ අලුතින් හඳුන්වාදීම, කාර්යසාධන කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පහසුව ඉහළ නැංවීම සඳහා සේවා මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම ආදී පියවරයන් රැසක් වසර තුළ සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ විදේශීය ශාඛා මඟින් ඉපයූ ආදායම රු. බිලියන 2.3 කි. එමෙන්ම විදේශීය ශාඛාවන්හි ණය සහ අත්තිකාරම් පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ ණය අවදානම කළමනාකරණය පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

ඉදිරි දැක්ම

සාර්ව ආර්ථික දර්ශක වඩා හිතකර වනු ඇති බවට විශ්වාසය සහිතව 2019 වර්ෂය සඳහා අංශය විසින් උපායමාර්ග සකසා ඇත. නියෝජිත ආයතන සමඟ ඇති ව්‍යාපාරික සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගනිමින් ජාත්‍යන්තර අංශය තම වෙළඳපොළ නායකත්වය රැක ගැනීමට අපේක්ෂා කරයි. සේවා විවිධාංගිකරණය හා සේවක කුසලතා දියුණු කිරීම මඟින් ආයෝජන අංශයේ වර්ධනය අපේක්ෂා කරන අතර, භාණ්ඩාගාර අංශය බැංකුවේ ද්‍රවශීලතාව, ශුද්ධ පොළී ආන්තිකය සහ වෙළඳපොළ අවදානම කළමනාකරණ කෙරෙහි අවධානය යොමු කර ඇත.

තුළින් වටිනාකම් ජනිත කිරීම

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය

බැංකුවේ තම වෙළඳපොළ ස්ථාවරත්වය රඳවා පවත්වා ගැනීමේදී, බැංකුව සතු මූල්‍ය ප්‍රාග්ධනය ඉමහත් වූ වටිනාකමක් දරයි. ක්ෂේත්‍රයේ ඉතාම වැදගත් මූල්‍ය ආයතනයක් වශයෙන් අප මූල්‍ය ප්‍රාග්ධනය මෙහෙයවනු ලබන්නේ අවදානම් අවම කර ගනිමින් පාර්ශ්වකරුවන්ගේ විවිධ වූ අපේක්ෂිත අරමුණු උදෙසා වටිනාකම් ජනිත කරමින්ය.



රු. බිලියන 1,765.0 ක
තැන්පතු

රු. බිලියන 350.0 ක
ණය ගැනුම්

රු. බිලියන 121.4 ක
කොටස්හිමියන්ගේ අරමුදල

AA+(lka) ස්ථාවර
ෆිච් රේටින්ග්ස් (ලංකා)

AAA ස්ථාවර
ඉක්රා ලංකා සමාගම

B2 ස්ථාවර
මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස්

B ස්ථාවර
ෆිච් රේටින්ග්ස්

2018 වසරේ මූලික ක්‍රමෝපායන්

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනයට මූලිකත්වය දීම

ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ වර්ධන ඉලක්කයන් ගැලපීම

පොළී ආන්තිකය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම

ණය කළඹේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම

2018 මූලාරම්භයන්

- "චන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය ව්‍යාපෘතිය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සපයනු ලබන ණය වැඩි කිරීම
- ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි කිරීමට ණය ආපසු අයකර ගැනීම සහ ණය අධීක්ෂණය ශක්තිමත් කිරීම
- මිලකරණ තීරණ නියමිත වෙලාවට ගැනීම
- SLFRS 09 යටතේ වන රෙගුලාසිද ඇතුලත් කරමින් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම

2018 වසරේ කාර්යසාධනයන්

- වත්කම් වල රු. ට්‍රිලියන 2 ක කඩඉම පසු කිරීම
- 2018 වසර සඳහා වන සියලු ඉලක්ක සපුරා ගැනීම (අක්‍රිය ණය අනුපාතය හැර)
- ශුද්ධ පොළී ආදායමේ වර්ධනය 12%
- මුළු මෙහෙයුම් ආදායමේ වර්ධනය 20%
- ආදායමට වියදම් අනුපාතය 38%
- බදු පෙර ලාභයේ වර්ධනය 5%
- ණය කළඹේ වර්ධනය 24%
- දළ අක්‍රිය ණය අනුපාතය 3.6%
- අළුතින් හඳුන්වා දුන් ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රාග්ධන නියාමනයන්ට අනුගතවීම

2019 වසර සඳහා ප්‍රමුඛතා

- ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සමඟ අනුගත වන අතරම වර්ධන ඉලක්කයන් ලඟාකර ගන්නා බවට තහවුරු කර ගැනීම
- ණය කළඹේ ගුණත්වය පවත්වා ගැනීම
- ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මූල්‍ය ප්‍රාග්ධනය

විවිධ වූ බාහිර අභියෝගයන් මධ්‍යයේ උවද තම ස්ථාවරත්වය රැක ගැනීමේ හැකියාව පෙන්වමින් ලංකා බැංකුව 2018 වසර සඳහා බදු පෙර ලාභයේ 5% ක වර්ධනයක් සහ වත්කම් වල 16% ක වර්ධනයක් වාර්තා කර ඇත. ණය කළඹේ ගුණාත්මකභාවය පහත මට්ටමක ද ණය සහ අත්තිකාරම් වර්ධනය මන්දගාමී තත්ත්වයකද පැවති කාල පරිච්ඡේදයක දී උවද තම පාර්ශ්වකරුවන්ට උපරිම ලෙස සිය වගකීම් ඉටු කරමින් බැංකුව තම ණය කළඹේ ගුණාත්මකභාවය සහ ණය සහ අත්තිකාරම් වල වර්ධනය යහපත් මට්ටමක පවත්වා ගැනීමට සමත් වී ඇත.

මූල්‍ය කාර්යසාධනය

ශුද්ධ පොළී ආදායම

අපේක්ෂිත පරිදි සිදුවූ 24% ක් වන ණය කළඹේ වර්ධනයත්, වසරේ වැඩි කාලයක් පුරා පැවති ඉහළ පොළී අනුපාතයත්, 2018 වසර තුළදී පොළී ආදායම 14% කින් රු. බිලියන 195.4 දක්වා වර්ධනය කර ගැනීමට ඉවහල් විය. ණය සහ අත්තිකාරම් වලින් ඉපැයූ පොළී ආදායම මුළු පොළී ආදායමෙන් 74% කි. මේ අතරම බැංකුවේ පොළී වියදම 15% කින් රු. බිලියන 129.8 දක්වා වර්ධනය වූ අතර කාලීන තැන්පතු සඳහා සාමාන්‍ය ඉතුරුම් තැන්පතු අතර පොළී අනුපාතයේ සැලකිය යුතු මට්ටමේ පරතරය මධ්‍යයේ උවද 4% ක ඉතුරුම් සහ ජංගම ගිණුම් තැන්පතු වල වර්ධනයක් අත් පත් කර ගැනීමට බැංකුවට හැකිවිය. සමස්ථයක් වශයෙන් බැංකුවේ ශුද්ධ පොළී ආදායම රු. බිලියන 65.6 දක්වා 12% කින් 2018 වසර තුළදී වර්ධනය විය. පොළී අනුපාතය ඉහළ යන තත්ත්වයක් පැවතිය ද එය යම්තාක් දුරකට පාලනය කර ගැනීමට බැංකුව වෙර දැරූ අතර ශුද්ධ පොළී ආන්තිකය පෙර වසරේ පැවති 3.2% සිට 3.1% දක්වා මද වශයෙන් පහත අගයකට පැමිණියේය. සමූහය ගැන සැලකීමේ දී ශුද්ධ පොළී ආදායම රු. බිලියන 68.7 ක් වූ අතර එය 12% ක වර්ධනයකි.

පොළී නොවන ආදායම

පොළී නොවන ආදායම මූලික වශයෙන් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම, වෙළඳ ලාභයන් සහ වෙනත් මෙහෙයුම් ආදායම් වලින් සමන්විත වේ. වසර තුළදී, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 11% ක වර්ධනයක් සමඟ රු. බිලියන 8.4 ක් වූ අතර මීට හේතු වූයේ ණය සහ හර කාඩ්පත් ආශ්‍රිත ගාස්තු ආදායම 23% කින්ද ඇපකර ආශ්‍රිත සේවා ආදායම 21% කින්ද වර්ධනය වීමයි. වසර තුළදී පොළී නොවන ආදායමේ මූලික කොටසක් වනුයේ වෙනත් මෙහෙයුම් ආදායම රු. බිලියන 12.1 ක් දක්වා තුන් ගුණයකින් පමණ වර්ධනය වීමයි. බැංකුවේ විදේශ මුදල් ඒකක වලින් සමන්විත ශේෂයන් මඟින් උත්පාදිත විනිමය ලාභයන් මීට හේතුවිය. සමස්තයක් වශයෙන් බැංකුවේ පොළී නොවන ආදායම රු. බිලියන 23.5 දක්වා 47% කින් වර්ධනය විය.

ශුද්ධ පොළී ආදායමේ උපනතීන්



මුළු මෙහෙයුම් ආදායම

ශුද්ධ පොළී ආදායමේ ප්‍රමාණාත්මක වර්ධනයත්, වෙනත් මෙහෙයුම් ආදායමේ පුළුල් වර්ධනයත් නිසා මුළු මෙහෙයුම් ආදායම රු. බිලියන 89.0 ක් ලෙස 20% ක වර්ධනයක් සමඟින් සටහන් කිරීමට බැංකුවට හැකි විය. ණය අත්තිකාරම් සහ ගාස්තු සහ කොමිස් ආදායම 74% ක් සහ 26% ක් ලෙස පිලිවෙලින් මුළු මෙහෙයුම් ආදායමට දායකත්වය දැක්වීය. සමූහයේ මුළු මෙහෙයුම් ආදායම රු. බිලියන 94.0 ක් වූ අතර, එය 19% ක වර්ධනයකි.

මෙහෙයුම් ආදායමේ සංයුතිය



හානිකරණ වෙන්කිරීම්

ආර්ථිකයේ පැවති මන්දගාමී තත්ත්වයන් ණය සඳහා වන හානිකරණ ප්‍රතිපාදන වෙන්කිරීම් කෙරෙහි අහිතකර ලෙස ඉහළ ගියේ සමස්තයක් වශයෙන් මුළු බැංකු ක්ෂේත්‍රයටම බලපාන පරිදිය. බැංකුවේ ණය හානිකරණ ප්‍රතිපාදන 2018 වසර සඳහා 48% කින් වර්ධනය වූයේ රු. බිලියන 14.3 ක් ලෙසය, එය සමස්ථ බැංකු කර්මාන්තයේ අදාල වර්ධනය වන 104% කට වඩා අඩු අගයක් විය. බැංකුව විසින් නිරන්තරයෙන් නොකඩවාම අනුගමනය කරන ලද ණය අධීක්ෂණ කටයුතු සහ අයකර ගැනීම් පිලිවෙත් මීට ඉවහල් විය. ණය හානිකරණ ප්‍රතිපාදන වල ඉහළ යාමට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 09 සඳහා අනුගත වීමද බලපාන ලද අතර එමඟින් අපේක්ෂිත ණය හානි සඳහා ද ප්‍රතිපාදන වෙන්කිරීමට සිදුවිය. (SLFRS) 09 සඳහා අනුගත වීමට බැංකුව පෙර සූදානමක් පැවති අතර ක්‍රමානුකූලව එහි බලපෑම මුල සිටම අධ්‍යයනය

කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට අනුව ගණනය කරන ලද අක්‍රීය ණය අනුපාතය 3.6% ක් දක්වා වර්ධනය වූයේ 2017 වසරේ පැවති 2.8% ක මට්ටමේ සිටය. කර්මාන්තයේ අක්‍රීය ණය අනුපාතය 2018 වසර අවසාන වන විට 3.4% ක් විය.

වියදම් කළමනාකරණය

සේවක විදයම් වල 11% ක් සහ වෙනත් වියදම් වල 35% ක ඉහළ යාම නිසා මෙහෙයුම් වියදම 19% කින් ඉහළ ගියේ රු. බිලියන 32.5 ක් ලෙස වාර්තා කරමින්ය. සේවක වියදම් වල ඉහළයාම, වසර තුළදී 1,622 ක නව සේවක පිරිසක් බඳවා ගැනීම, සාමුහික ගිවිසුම මත සිදුවන වැටුප් හා ප්‍රතිලාභ සංශෝධනය ආදීය මත සිදුවිය. වෙනත් මෙහෙයුම් වියදම් වල ඉහළ යාම මූලික වශයෙන් ස්ථාවර වත්කම් වල නඩත්තු වියදම් සහ පරිපාලන වියදම් මත සිදුවිය. බැංකුවේ ආදායමට වියදම් අනුපාතය 38% ක් ලෙස වාර්තා වූ අතර කර්මාන්තයේ වාර්තා වූ අගය වන 47% සමඟ සැසඳීමේ දී සතුටුදායක මට්ටමකි. බැංකුවේ වියදම් කළමනාකරණය සහ පරිපාලන සහ මෙහෙයුම් කටයුතු වල කාර්යක්ෂමතාවය පිළිබඳව ඉදිරියේදී ද දැඩි අවධානය යොමුවනු ඇත.

බදු වියදම්

බදු වියදම් වශයෙන් බැංකුව විසින් රජයට දක්වන ලද දායකත්වය වටිනාකම් මත බදු, ජාතිය ගෙඩනැගීමේ බදු, ණය ආපසු ගෙවීමේ බදු සහ ආදායම් බදු යන විවිධ වූ බදු මූලාශ්‍ර මත ගෙවන ලද වියදම් වලින් සමන්විත වේ. බැංකුවේ බදු දායකත්වය 19% කින් වසර තුළදී ඉහළ ගියේ රු. බිලියන 19.3 ක අගයක් වාර්තා කරමින් වන අතර වසර තුළදී ගෙවීමට සිදුවූ අළුතින් හඳුන්වා දුන් ණය ආපසු අයකර ගැනීමේ බද්ද රු. බිලියන 1.4 ක දායකත්වය මෙම වර්ධනයට බලපාන ලදී. ආදායම් බදු වියදම රු. බිලියන 9.7 ක් වූ අතර සඵල බදු අනුපාතය 39% ක් වූයේ පෙර වසරේ පැවති 30% ට වඩා ඉහළ ය.

මෙහෙයුම් වියදම්



ලාභදායීත්වය

විවිධ වූ අභියෝග තුළ ක්‍රියාත්මක වූ මෙහෙයුම් පරිසරය මධ්‍යයේ වුවද බැංකුව 2018 සඳහා රු. බිලියන 31.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත්තේ 5% ක වර්ධනයක් සමඟින්ය. මේ අතරම බදු පසු ලාභය 9% කින් පහළ ගොස් රු. බිලියන 19.5 ක අගයක් වාර්තා කළේ වසර තුළදී සිදුවූ ආදායම් බදු වියදමේ ඉහළයාම නිසාය. රටේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සපයන්නා ලෙස තම ස්ථානය තවදුරටත් ශක්තිමත් කර ගනිමින් ලංකා බැංකුව වැඩිම ලාභයක් වාර්තා කරන තනි ආයතනය බවට පත්ව ඇත. සමූහය වශයෙන් සලකන විට බදු පසු ලාභය රු. බිලියන 19.5 ක් වූ අතර එය ද 9% ක පහළ යාමක් පෙන්නුම් කරයි. මේ අතරම වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය පසුගිය වසරේ පැවති 1.7% සිට 1.5% දක්වා පහත වැටුණි.

ලාභදායීත්වය



වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROAA) සහ හිමිකමේ සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROAE)



ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මූල්‍ය ප්‍රාග්ධනය

මූල්‍ය ස්ථාවරත්වය

වත්කම් වර්ධනය

2018 වසරේදී තම ගමන් මඟේ තවත් නොමැකෙන සලකුණක් සටහන් කරමින් වත්කම් පදනම රු. ට්‍රිලියන දෙකක් දක්වා ඉහළ නංවා ගැනීමට බැංකුව සමත් විය. 2018 වසර අවසාන වන විට රු. ට්‍රිලියන 2.3 ක වත්කම් ප්‍රමාණයක් වාර්තා වූයේ 16% ක වර්ධනයක් සමඟ වන අතර ණය සහ අත්තිකාරම් වල සිදුවූ 24% ක සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් මීට හේතු විය. ප්‍රමාණාත්මක ලෙස වර්ධනයක් සනිටුහන් කල මූලික ණය වර්ගය වූයේ අයිරා ණය (64%), යෝජනා ක්‍රම යටතේ ණය (16%) සහ කාලීන ණය (25%). සුළු හා මධ්‍ය පරිමාණ අංශයට සහ සංවර්ධිත ණය සැපයීම කෙරේ බැංකුවේ ඇති දායකත්වය මින් නිරූපණය කෙරේ. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් අංශ පිළිබඳව විමසීමේදී, ශාඛා සහ ආයතනික යන අංශ දෙකම වසර තුළදී වර්ධනයක් පෙන් වූ අතර එය 9% සහ 39% ක් විය. (වැඩිමනත් වූ විස්තර සඳහා ව්‍යාපාර අංශ සමාලෝචනය කෙරෙන පිටු අංක 126 සිට 135 දක්වා පරිශීලනය කරන්න.)

රාජ්‍ය අංශය සඳහා වන ණය සැපයුමද වසර තුළදී 36% කින් ඉහළ ගිය අතර, ඒ මූලික වශයෙන් රජය විසින් ක්‍රියාත්මක මහා මාර්ග පද්ධති ඉදිකිරීම, ජල ව්‍යාපෘති ආදී යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති සඳහාය. වසර තුළ සිදුවූ ණය කළඹේ ප්‍රමාණාත්මක වර්ධනය නිසා බැංකුවේ වත්කම් සංයුතිය ණය වත්කම් වෙත ඇදී ගිය අතර එය පෙර වසරේ පැවති 60% සිට 63% දක්වා ඉහළ ගියේය.

මුළු වත්කම්



වත්කම් සංයුතිය



අරමුදල් සම්පාදන තත්ත්වය

බැංකුවේ අරමුදල් තත්ත්වය වසර තුළදී ශක්තිමත් වූයේ රු. බිලියන 5 ක ප්‍රාග්ධන සැපයුම සහ යහපත් මට්ටමක පැවති තැන්පතු වර්ධනය නිසාවෙනි. වසර තුළදී මුළු වගකීම් 17% කින් වර්ධනය වූ අතර, තැන්පතු වල 14% ක වර්ධනය, ප්‍රති ණය ගැණුම් වල 119% ක සහ විදේශීය මුදල් ණය ගැණුම් වල 7% ක වර්ධනය මීට ප්‍රධාන හේතු වේ. තැන්පතු පදනම වැඩි කර ගැනීමේදී ලංකා බැංකුව ඉදිරියෙන්ම සිටින්නේ එය සතුව පවතින රට පුරා විසිර පවතින ශාඛා ජාලය නිසාවෙනි. තැන්පතු බැංකුවේ මූලිකම අරමුදල් සපයා ගන්නා මාර්ගය වන අතර 2018 දෙසැම්බර් වසර අවසාන වන විට මුළු වත්කම් වලින් 78% ක ප්‍රමාණයක තැන්පතු බැංකුව සතු විය. වෙළඳපොළ පැවති ඉහළ පොළී අනුපාත මත තැන්පතු සඳහා වන පිරිවැය ඉහළ ගියේය. බැංකුව සිය ඉහළ ගිය ණය ඉල්ලුම ණයට ගැණුම් මත ද සපුරා ගැනීමට

අරමුදල් කළඹ



කටයුතු කල අතර, ඒ අනුව ණයට ගැණුම් රු. බිලියන 350 ක් දක්වා 32% කින් වර්ධනය විය. ප්‍රති මිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් දෙගුණයකින් පමණ ඉහළ ගිය අතර, වසර තුළදී රු. බිලියන 12.0 ක් වූ ලැයිස්තු ගත නොවන ණයකර නිකුත් කරන ලදී. සමස්තයක් වශයෙන් ශේෂ පත්‍රයෙන් 15% ක් පමණ ණයට ගැණුම් මඟින් සම්පාදනය කර ගනී.

කොටස්කරුවන්ගේ අරමුදල්

බැංකුව සිය ප්‍රාග්ධන තත්ත්වය වසර තුළදී රු. බිලියන 5 ක ප්‍රාග්ධන ලැබීම් මත තවදුරටත් ඉහළ නංවා ගන්නා ලදී. ප්‍රාග්ධනය වැඩිකර ගැනීම උදෙසා බැංකුව සතුව පවතින්නේ ඉතාම සීමාසහිත වූ මාර්ග යන්ය, එබැවින් ලාභාංශ ගෙවීම් ප්‍රතිශතය 25% ක මට්ටමේ පවත්වා ගෙන යාම මඟින් අභ්‍යන්තරව ජනිත වූ ප්‍රාග්ධනය රැක ගැනීමට වසර තුළදී බැංකුවට හැකි විය. 2018 දෙසැම්බර් අවසාන වන විට කොටස්කරුවන්ගේ හිමිකම 9% කින් වර්ධනය වූ අතර එය රු. බිලියන 121.4 ක අගයක් විය. 2018 වසර අවසානයේදී බැංකුවේ පොදු හිමිකම් ස්ථර I ප්‍රාග්ධන අනුපාතය 10.3% (අවම නියාමන අනුපාතය 8.875%) ක් වූ අතර මුළු ප්‍රාග්ධන අනුපාතය 14.6% (අවම නියාමන අනුපාතය 12.875%) ක් විය. බාසල් III රෙගුලාසි සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ (SLFRS) 09 ප්‍රමිත ක්‍රියාත්මක වීමත් සමඟම බැංකුවට තම වර්ධන දිශානතිය ප්‍රාග්ධන නියාමන අවශ්‍යතා සමඟ තුලනය කර ගැනීමට සිදුවූ අතර ප්‍රාග්ධනය වැඩිකර ගත හැකි මාර්ග කෙරෙහි ද දැඩි අවදානය යොමු කිරීමට සිදුවී ඇත.

ද්‍රවශීලතාවය

වසර තුළදී සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් ළඟා කරගන්නවා සමඟම ද්‍රවශීලතා මට්ටම් ද යහපත් තත්ත්වයක පවත්වා ගැනීමට බැංකුවට හැකි විය. ණය කළඹේ ඇති වූ වර්ධනය වර්ෂය තුළදී ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි යම් බලපෑමක් ඇති කලද, නියාමන අවශ්‍යතාවයන්ට ඉහළින් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගැනීමට බැංකුවට හැකිවිය. මේ අනුව, බැංකුවේ තැන්පතු වලට ණය අනුපාතය පෙර වසරේ පැවති 79% තත්ත්වයේ සිට 86% දක්වා ඉහළ ගියේය. මේ අතර ද්‍රවශීලතා වත්කම් අනුපාතය දෙසැම්බර් 2018 අවසාන වන විට 24.47% මට්ටමේ පැවති අතර, එය නියාමන අගය වන 20% මට්ටමට වඩා ඉහළ අගයක පැවතුණි. කර්මාන්තයේ ද්‍රවශීලතා වත්කම් අනුපාතය 24.5% කි.

මූලික ද්‍රවශීලතා අනුපාතයන් පහත දක්වා ඇත.

	2018	2017
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය)	24.47	27.22
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රුපියල්)	143.51	141.46
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්)	114.99	105.04

සමූහයේ කාර්යසාධනය

බැංකුව සතුව පරිපාලිත සමාගම් දහයක් සහ ආශ්‍රිත සමාගම් හතරක් පවතින අතර, ඒවා මූල්‍ය සේවා සැපයීම, දේපල කළමනාකරණය, ජලවිදුලි බලය උත්පාදනය ආදී වූ විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් හි ක්‍රියා කරයි. බැංකුව, සමූහයේ ප්‍රධානතම සහ විශාලතම ආයතනය වන අතර සමූහයේ ඒකාබද්ධ වත්කම් වලින් 98% කට හිමිකම් කියයි.

සමූහයේ සමාගම් වෙතින් සමස්ත සමූහයේ කාර්යසාධනයට දක්වන දායකත්වය ඉහළ අගයක් නොගත්ත ද සියලු පරිපාලිතයන් ක්‍රමානුකූලව ප්‍රතිපත්තියක් මත නියාමනය කිරීමට පාලිත සමාගම වශයෙන් බැංකුව වග බලා ගනී. බැංකුව පරිපාලිතයන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් කාලානුරූපීව නිරීක්ෂණය කරන අතර අවදානම් තක්සේරු දර්ශකයන් මඟින් ප්‍රධාන අවදානම් නිලධාරිතුමා සමූහය මුහුණපෑ හැකි අවදානම් තත්ත්ව නිරතුරුව විමර්ශණයට ලක්කරයි. මේ අතරම බැංකුවේ නියෝජිතයකු නිරතුරුවම සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය අතරට පත්කරමින්, සමූහයේ කටයුතු නිති අධීක්ෂණයට ලක් කෙරේ.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය

මූල්‍ය සේවා වෙත ප්‍රවේශය සපයමින් සහ මූල්‍ය අන්තර්කරණයට පහසුකම් සපයමින් දිවයින පුරා සහ ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ වඩාත්ම පුළුල් ගනුදෙනුකාර සේවා සැපයුම් මධ්‍යස්ථාන බැංකුව ක්‍රියාත්මක කරයි. මෑත වසරවලදී CRM, ස්වයං බැංකුකරණ කුට්, ඩිජි මධ්‍යස්ථාන සහ මාර්ගගත සහ ජංගම යෙදුම් සඳහා වැඩි ආයෝජනයක් සහිතව සිය ඩිජිටල් ස්වයං සේවා චැනල පුළුල් කිරීම කෙරෙහි ලංකා බැංකුව උපායමාර්ගික අවධානය යොමු කර තිබේ.

දීප ව්‍යාප්ත ජාලය
පළාත් **9** පුරා විසිරුණු ශාඛා **577**
සීමිත සේවා ශාඛා **52**
ප්‍රාදේශිය ණය මධ්‍යස්ථාන **14**
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන **15**

284
ස්මාර්ට් කලාප

06
ජංගම ශාඛා

ටෙලර් යන්ත්‍ර **776**
මුදල් තැන්පතු යන්ත්‍ර **163**
මුදල් චක්‍රීය යන්ත්‍ර **118**
බිල්පත් ගෙවීම් කුට් **49**

මාර්ගගත/ ජංගම බැංකුකරණ සේවා සැපයුම

2018 උපායමාර්ගික ප්‍රමුඛතා

සහශ්‍ර වාර්ෂික ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා අපගේ ඩිජිටල් ප්‍රස්තුතය වැඩි දියුණු කිරීම

වඩා ඉහළ කාර්යක්ෂමතාවයක් සහ ඵලදායිත්වයක් ඇති කිරීම පිණිස ක්‍රියාදාම හා පද්ධති සුසංවිධිත කිරීම සහ නවීකරණය කිරීම

විදුලි පරිභෝජනය අඩු කිරීම සහ හරිත ශාඛා ඉදි කිරීම මඟින් බැංකුවේ සෘජු මෙහෙයුම්වලින් සිදු වන කාබන් මුද්‍රා හැරීම අවම කිරීම

2018 මූලාරම්භයන්

- ස්වයංකෘත සහ ස්වයං සේවා සැපයුම් ස්ථාන සහිත ඩිජි මධ්‍යස්ථාන
- NFC පහසුකම් සහිත ටෙලර් යන්ත්‍ර
- NFC කාඩ්පත් MPOS ගෙවීම් පහසුකම් සක්‍රිය කොට ඇත
- නව ඩිජිටල් බැංකුකරණ විසඳුම් හඳුන්වා දී ඇත
  අපගේ ඩිජිටල් නිපැයුම් සමාලෝචනය කර වැඩි පහසුකම් සහිත නව නිපැයුම් සහිතව යළි දියත් කර ඇත
- DMS හරහා අඛණ්ඩව ක්‍රියාත්මක කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් - ජාල යටිතල පහසුකම් උත්ශ්‍රේණි කිරීම

2018 වසරේ කාර්යසාධනයන්

- ශාඛා ඝනත්වය: පුද්ගලයන් 100,000 ක් සඳහා ලංකා බැංකු ශාඛා 2.93
- ටෙලර් යන්ත්‍ර ඝනත්වය: පුද්ගලයන් 100,000 ක් සඳහා ටෙලර් යන්ත්‍ර 4.17
- 65% ක ඩිජිටල් තාක්ෂණ යොදාගැනීම (2017 - 60%)
- ශාඛා විසින් කිලෝ වොට් 885,238 ක පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කරන ලදී
- හරිත සහතිකලත් ශාඛාවක් ලෙස තවත් ශාඛාවක් පිළිගනු ලැබීය
- ස්මාර්ට් මාර්ගගත බැංකුකරණ සේවා නැවත දියත් කර ඇත
- ස්මාර්ට් පාස්පොතේ IOS පිටපතක් එළිදක්වන ලදී

2019 වසර සඳහා ප්‍රමුඛතා

- නව මූල්‍ය තාක්ෂණ නිපැයුම් හඳුන්වා දීම
- බැංකුවේ භෞතික ව්‍යාප්තිය පුළුල් කිරීම - නව ශාඛා 10 ක් ආරම්භ කිරීමට නියමිතය
- ස්මාර්ට් කලාප සහිතව ශාඛා ප්‍රතිසන්නාමකරණය
- සෑම පළාතක් සඳහා ජංගම බැංකු රථයක්
- ඩිජිටල් තාක්ෂණ ගනුදෙනු මුළු ගනුදෙනුවලින් 75% ක් දක්වා වැඩි කිරීම

ඩිජිටල් යටිතල පහසුකම්

මූල්‍ය සේවාවන්හි ඩිජිටල් විප්ලවය මඟින් ගනුදෙනුකරුවන් බැංකු සමඟ ගනුදෙනු කරන ආකාරය සහ සමස්ත ගනුදෙනුකාර අත්දැකීම පරිවර්තනයකට ලක් කරමින් සිටී. ගනුදෙනුකරුවන්ට තමන් කැමති ස්ථානයක සහ වේලාවක ඔවුන්ගේ ගනුදෙනු කිරීමට ඉඩ සලසන මාර්ගගත සහ ජංගම බැංකුකරණ සේවා වැනි සාර්වත්‍රික සේවා ඔවුන් වැඩි වැඩියෙන් ඉල්ලා සිටී. ගනුදෙනුකරුවන්ගේ ඉහළ නැංවුණු විඳගධතාව සමඟින් ශ්‍රී ලංකාවේ පුළුල්වෙමින් පවතින පරිගණක සහ ඩිජිටල් සාක්ෂරතා අනුපාත හේතුවෙන් ඩිජිටල් ස්වයං සේවා පහසුකම් සඳහා ඉල්ලුම ඉහළ නංවා ඇති අතර මෙම වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වන බැංකුවලට ඉදිරි කාලය තුළ තම තරඟකාරී වාසිය අහිමි වනු ඇත.

ලංකා බැංකුවේ, අපගේ උපායමාර්ගයේ එක් වැදගත් අංගයක් ඉලක්ක වී ඇත්තේ පරිණාමනය වෙමින් පවතින ඩිජිටල් තාක්ෂණයේ සහ සමාජ මාධ්‍යයන් තුළ හැදී වැඩුණු සහශ්‍ර වාර්ෂික ගනුදෙනුකරුවන් සමීප කර ගැනීම සහ රඳවා ගැනීම කෙරෙහිය. ඩිජිටල් ගනුදෙනුකරුවන් ග්‍රහණය කොට රඳවා ගැනීම පිණිස ගනුදෙනුකාර අත්දැකීම සහ සන්නාමකරණය අන්තර්ගත වන්නා වූ ඩිජිටල් පරිවර්තන වැඩපිළිවෙලක් ලංකා බැංකුව ආරම්භ කොට තිබේ. නව ක්‍රමවේද ගොඩනැගීම සඳහා තාක්ෂණය යොදා ගැනීම මඟින්, ප්‍රවේශතාව සහ පහසුව වැඩි දියුණු කරමින් පාරිභෝගික අත්දැකීම් ප්‍රවර්ධනය කිරීමට ලංකා බැංකුව උත්සුක වී තිබේ.

ප්‍රාග්ධන සම්බන්ධතා සහ ප්‍රශස්ත සමබරතාවයන්



නිෂ්පාදිත ප්‍රාග්ධනය වර්ධනය සඳහා 2018 දී වෙන් කළ සම්පත්

භෞතික යටිතල පහසුකම් සඳහා ආයෝජනය:
රු. බිලියන 1.5

ඩිජිටල්කරණ යටිතල පහසුකම් සඳහා ආයෝජනය:
රු. බිලියන 2.0

	පරිගණක සාක්ෂරතාව	ඩිජිටල් සාක්ෂරතාව	අන්තර්ජාල භාවිතය
ශ්‍රී ලංකාව			
2017	28.6	40.1	22.7
2016	27.6	33.8	16.4
වයස් කාණ්ඩ අනුව - 2017			
15 to 19	63.0	73.4	38.7
20 to 24	56.9	74.5	55.4
25 to 29	46.7	67.1	49.2
30 to 34	35.2	55.1	37.0
35 to 39	26.6	44.1	28.1
40 to 49	19.8	32.7	18.9
50 to 59	11.0	17.5	9.5

මූලාශ්‍රය : පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන - 2017, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ඩිජිටල් පරිවර්තනය කරා අපගේ ගමනේ සැලකිය යුතු ආයෝජන

නිර්මාණය කරන ලද අගය:
පුළුල් පරාසයක බැංකු සේවා සැපයීම්, ශාඛාවන්ට අවම ලෙස පැමිණීම, 24/7 පුරා මුදල් තැන්පතු සහ ආපසු ගැනීම්, වැඩි පහසුව

නිර්මාණය කරන ලද අගය:
කාලය සහ පිරිවැය ඉතිරිය, ස්වයංක්‍රීයකරණය නිසා මිනිස් වැරදි අඩුවීම, ශාඛාවල අඩු ගනුදෙනුකරුවන් සහ කෙටි පෝලිම්, ශාඛාවලදී ගනුදෙනුකරුවන්ට සේවා සපයන කාලය ඉක්මන් වීම

ගනුදෙනුකරුවන් සඳහා ඉපැයුම්

"B App" යෙදුම සහ **"SMART"** පාස්පොත වැනි ජංගම බැංකුකරණ යෙදුම්

ස්වයංක්‍රීයකෘත සහ ස්වයං සේවා කුට් සහිත **BOC DIGI** මධ්‍යස්ථාන

ATM, CDM සහ **CRM** යන්ත්‍ර සහිත **ස්මාර්ට්** කලාප

ස්මාර්ට් මාර්ගගත බැංකුකරණය

NFC කාඩ්පත් සහ **MPOS** ගෙවීම් පහසුකම්

ක්‍රියාදාම සවිබලගැන්වීම

අභ්‍යන්තර ක්‍රියාදාම

මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය වැනි අබණ්ඩ ක්‍රියාදාම ස්වයංක්‍රීයකරණය (HCM)

නවීන අභ්‍යන්තර නිෂ්කාශන යාන්ත්‍රණයක් ඇතුළුව මධ්‍යම බැංකු කටයුතු කාර්යාලයේ කාර්යයන් ස්වයංක්‍රීයකරණය

ලේඛන කළමනාකරණ පද්ධතිය, විද්‍යුත් විගණනය, BoardPAC ආදිය මඟින් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය හරහා කඩදාසිවලින් තොර පරිසරයකට දිරිමත් කිරීම

නව ගිණුම් ආරම්භ කිරීම සහ මූලික ණය අයදුම්පත් සඳහා මාර්ගගත බැංකුකරණය සහ ස්වයං සේවා කුට් භාවිතා කළ හැකිය

කාර්යසාධන පාලක පුවරුවේ දත්ත විශ්ලේෂණ භාවිතා කිරීම

සාර්ථක ඩිජිටල් පරිවර්තනයක් සඳහා ශක්තිමත් නායකත්වයක් සහ සංවිධානය තුළ සංස්කෘතික විතැන්වීමක් අවශ්‍ය වේ. අපගේ ඩිජිටල්කරණ චාරිකාවේ උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේදී තොරතුරු තාක්ෂණික මෙහෙයුම් කමිටුව පුළුල් අධීක්ෂණයක් සහ මාර්ගෝපදේශනයක් සපයයි. සේවකයන්ගේ තොරතුරු තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම ප්‍රධාන ඉලක්කයක් වූ අතර තොරතුරු පද්ධති, නව තාක්ෂණික ප්‍රගමන සොයා ගැනීම් සහ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ සයිබර් ආරක්ෂාව පිලිබඳ විවිධ පුහුණු වැඩසටහන් වසර පුරා පවත්වන ලදී. අපගේ පර්යේෂණ දෙපාර්තමේන්තුව ද, 2018 ජනවාරි මාසයේ 'B App' යෙදුම දියත් කිරීමෙන් පසුව ලද ප්‍රතිචාර අනුව අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා විසඳුම් ලබා දීමේදී පර්යේෂණ සිදු කිරීම මඟින් සිය දායකත්වය ලබා දෙන ලදී. මෙම ආයෝජනවලට සමාන්තරව අප යොදා ගන්නා තාක්ෂණයේ ශක්තිමත් බව, ආරක්ෂාව සහ ස්ථාවර බව සහතික කිරීම උදෙසා ද අපි සම්පත් යෙදවූයෙමු. බැංකුවේ තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ තවත් විස්තර මෙම වාර්තාවේ 116 සිට 117 දක්වා වූ පිටුවල දක්වා තිබේ.

අපගේ ඩිජිටල් විහිදුමෙන් උපරිම වාසි ලබා ගැනීම

බැංකුව දැනට දිවයින පුරා ATM යන්ත්‍ර 776 ක්ද, CDM යන්ත්‍ර 163 ක්ද, CRM යන්ත්‍ර 118 ක්ද මෙහෙයවන අතර, එය බැංකු කර්මාන්තයේ විශාලතම ඩිජිටල් ජාලය වේ. අපගේ සමස්ත ATM ජාලයෙන් 67% ක් ස්ථාපිත කර ඇත්තේ බස්නාහිර පළාතෙන් පිටතය. ඩිජිටල් ස්වයං සේවා ක්‍රම කරා රැගෙන යාමේ අපගේ උපායමාර්ගික සැකැස්ම 2018 වසරේදී ඵල දැරීම ආරම්භ කළ අතර ඩිජිටල් පහසුකම් භාවිතා කළ පිරිස 65% පමණ වේ.

දිනක සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය

මූලික බැංකුකරණ පද්ධතිය මිලියන 1.6
ATM ගනුදෙනු 168,317
CDM ගනුදෙනු 43,760
හර කාඩිපත් ගනුදෙනු 196,275
ණය කාඩිපත් ගනුදෙනු 8.645
POS ගනුදෙනු 54,469

ඩිජිටල් බැංකු කටයුතු භාවිතය

	2018	2017	2016
ප්‍රතිශතය (%)	65.5	60.5	51.2

භෞතික යටිතල පහසුකම්

දිවයින පුරා පැතිරුණු සෘජු ගනුදෙනුකාර මුළු සේවා මධ්‍යස්ථාන 1,721 ක් සහිත වූ ලංකා බැංකුව දිවයිනේ වඩාත්ම පුළුල් බැංකු ජාලය මෙහෙයවයි. සියලු ශ්‍රී ලාංකිකයන්ට මූල්‍ය සේවා වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සපයමින් 62% ක ප්‍රවේශයක් අත් කර ගැනීමට මෙම භූගෝලීය පැතිරීම මඟින් බැංකුවට හැකියාව ලබා දී තිබේ. වසර තුළදී අප විසි නව ශාඛාවක් විවෘත කළ අතර ශාඛා 80 ක් නවීකරණය කරන ලදී. ඊට අමතරව දිවයින පුරා රජයේ කාර්යාල 111 ක සහ පාසල් 2001 ක බැංකුවේ සේවා සැපයීම් සිදු කරයි.

ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) - 2018 වසරේ කාර්යසාධනය

- පුද්ගල, නිවාස ණය සහ ව්‍යාපාරික ණය පිරිසැකසුම ඇතුළුව කාර්ය ප්‍රවාහ කිහිපයක් ස්වයංක්‍රීයකරණය
- මාර්ගගත ණය අයදුම්පත්‍ර - වෘත්තිකයන් විසින් සැලකිය යුතු ලෙස ප්‍රයෝජනයට ගනී
- ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සහ ලේඛණ හුවමාරුව හසුරුවන ස්වයංක්‍රීයකෘත සහ මධ්‍යගත ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ මොඩියුලය, එසේම බැංකුවේ වෙබ් අඩවියේ අන්තර්ජාලය ඔස්සේ අපව දැනුවත් කිරීමේ පහසුකමද (Tell us online) ඇතුලත් වේ
- බැංකු වෙබ් අඩවියේ වෙනස් කිරීම් සමඟින් CASA ගිණුම් විවෘත කිරීම ස්වයංක්‍රීයකරණය
- අක්‍රීය ණය අධීක්ෂණය - අවදානම් සහගත ණය සඳහා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය
- DMS පද්ධතිය මඟින් A4 ප්‍රමාණයේ කඩදාසි 127,404 ක් ඉතිරි කර ගැනීම

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

නිෂ්පාදිත ප්‍රාග්ධනය

මූල්‍ය අන්තර්කරණ මෙහෙයවීම

රටේ වඩාත්ම ඌන පහසුකම් සහිත කොටස් වෙත ණය ලබාදීම්, ආයෝජන සහ ගනුදෙනුමය නිපැයුම් පිරිනැමීම හරහා රජයේ මූල්‍ය අන්තර්කරණ න්‍යායපත්‍රය සඳහා පහසුකම් සැපයීමේදී බැංකුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මුළු ශාඛා සංඛ්‍යාවෙන් 77% ක් බස්නාහිර පළාතෙන් පිටත පිහිටා ඇති අතර 27% ක් පිහිටා ඇත්තේ ආර්ථික වශයෙන් පසුගාමී තත්ත්වයේ පවතින පළාත්වලය. සම්ප්‍රදායික බැංකු ක්‍රම මඟින් ළඟා වීමට දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන ආන්තික ජන කොටස් වෙත සියලු ප්‍රධාන බැංකු සේවා සපයමින් බැංකුව ජංගම ඒකක 06 ක් ද (ජංගම බැංකු රථ) ක්‍රියාත්මක කරයි.
(වැඩි විස්තර සඳහා 22 වන පිටුව බලන්න.)

ශාඛා ජාලය තුළ හරිතකරණ කටයුතු

2015 සිට, බැංකුව සිය ශාඛාවලින් 27 ක් සූර්ය බලයට හරවා ඇති අතර එමඟින් ජාතික විදුලිබල පද්ධතියට කි. වො. 1,000 ක පුනර්ජනනීය බලශක්තියක් දායක කරමින් සිය මෙහෙයුම්වල සෘජු පාරිසරික බලපෑම අඩු කර තිබේ. ඒ අතර ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි මණ්ඩලය මඟින් ත්‍රිකුණාමලයේ සහ කැකිරාවේ පිහිටි අප ශාඛා දෙක සඳහා පිලිවෙලින් ප්ලැටිනම් සහ ස්වර්ණ සම්මාන පිරිනමා තිබේ.
(වැඩි විස්තර සඳහා 173 වැනි පිටුව බලන්න.)

තිරසර සංවර්ධනය සඳහා දායකත්වය

ඉලක්ක ක්ෂේත්‍ර	2018 ප්‍රගතිය	
ඌන සේවාලාභී ප්‍රජාව සඳහා ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන	වසර තුළ ජංගම බැංකු රථ ඒකක හතරක් අළුතින් ඇති කරන ලදී	10 අඩු අසමානතා
හරිත ගොඩනැගිලි, සූර්යබලයට හරවා ඇති ශාඛා	සූර්ය බලය ස්ථාපිත ශාඛා ගණන 27 සූර්ය බලය සඳහා ආයෝජනය රු. මිලියන 146.0 ජාතික පද්ධතියට එකතු කළ පුනර්ජනනීය බලශක්තිය: කි. වොට් 1000 හරිත ගොඩනැගිලි සහතික කළ ශාඛා ගණන: දෙකයි	13 දේශගුණික ක්‍රියාකාරකම් 7 දැරිය හැකි සහ පිවිතුරු බලශක්ති
ඩිජිටල්කරණය හරහා කඩදාසි ඉතුරු කර ගැනීම	ඊ ප්‍රකාශන භාවිතා කරන ගනුදෙනුකරුවන්: 382,188 ඩිජිටල් මූලාරම්භයන් මඟින් ඉතිරි කළ කඩදාසි: A4 ප්‍රමාණයේ කඩදාසි මිලියන 7	12 වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

මානව ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය

තරඟකාරී බවෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වන සහ බැංකුවේ උපායමාර්ගික අභිලාෂයන් සාක්ෂාත් කර ගැනිමේදී තීරණාත්මක සාධකයක් වන විවිධාංගීකරණයකින් යුත් කැපවීමක් සහිත සේවකයන් 8,724 කින් ලංකා බැංකුවේ මානව ප්‍රාග්ධනය නියෝජනය වේ.

සේවකයන්
8,724

සේවා කාලයේ අත්දැකීම්හි සාමාන්‍යය
අවු. **09**

කාන්තා නියෝජනය
60%

පුහුණු කිරීම් හා සංවර්ධනය සඳහා
රු. මිලියන 338.0 ක
ආයෝජන

නව බඳවා ගැනීම්
1,622

2018 උපායමාර්ගික ප්‍රමුඛතා

වේගයෙන් වෙනස්වන ව්‍යාපාරික පරිසරයක් තුළ පැවැත්ම තහවුරු කර ගැනීමට හා දියුණුව සඳහා අවශ්‍ය කුසලතා හා දැනුම වැඩි දියුණු කිරීම සඳහා හැකියාවන් වර්ධනය

බහුවිධ විෂය ක්ෂේත්‍රයන්ට නිරාවරණය වැඩි කිරීම

ආකල්ප, අනුස්ථාපනය සහ ආයතනික සංස්කෘතිය

විශේෂඥභාවය සහ අඛණ්ඩ වෘත්තියමය සංවර්ධනය

භෞතික යටිතල පහසුකම් ශක්තිමත් කිරීම

පරිපූර්ණ මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය

2018 මූලාරම්භයන්

- සේවක ප්‍රතිඥාව හඳුන්වා දීම
- බැංකුවේ ඩිජිටල් පරිවර්තනය අනුව යමින් තොරතුරු තාක්ෂණ කුසලතා හා නව යුගයේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම පිණිස පුළුල් පුහුණුවක් ලබා දීම
- කාර්ය මණ්ඩලය අතර නායකත්ව ගුණාංග වර්ධනය කිරීම සඳහා විශේෂ නායකත්ව පුහුණු කඳවුරු
- වාර්ෂික පුහුණු වැඩසටහන් කාලසටහනට නව පුහුණු වැඩසටහන් හඳුන්වා දීම

2018 වසරේ කාර්යසාධනයන්

- සේවකයන් වෙනුවෙන් නිර්මිත අගය: රු. බිලියන 18.9
- රඳවාගැනීම් අනුපාතිකය: 98%
- ඇළුතින් බඳවාගත් සේවක සංඛ්‍යාව: 1,622
- 98% දෙනෙකුට කාර්යසාධන ඇගයීම් ලැබිණි
- සේවකයෝ 174 දෙනෙකු උසස්වීම් ලැබූහ
- පුහුණුව සඳහා එක් සේවකයෙකු සඳහා ආයෝජනය: රු. 38,071.0
- කාර්මික ආරවුල් හේතුවෙන් වැඩ නැවැත්වීම් කිසිවක් සිදු නොවීම
- හොඳම ශාඛාව තේරීමේ තරඟයෙන් සේවකයන් 219 කට ත්‍යාග ප්‍රදානය කිරීම
- Century Score Card ක්‍රමය හරහා සේවකයන් 4,689 දෙනෙකුට ත්‍යාග ප්‍රදානය
- ප්‍රශංසාත්මක ලිපි මඟින් සේවකයන් 145 කට පිළිගැනීම ලබා දීම
- සේවය ඇගයීමේ ලිපි මඟින් සේවකයන් 20 කට පිළිගැනීම ලබා දීම
- වසරේ වැඩ කළ දින ගණන : 239

2019 වසර සඳහා ප්‍රමුඛතා

- වාර්ෂික පුහුණුවීම් කාලසටහන් සඳහා නව පාඨමාලා හඳුන්වා දීම
- නිවාඩු නිකේතන පහසුකම් වැඩිදියුණු කිරීම
- අපගේ සේවකයන්ගේ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධනය කෙරෙහි අවධානය
- නෛසර්ගික වටිනාකම් නව සේවක ප්‍රජාව කෙරේ හුවමාරු කිරීම
- මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය හරහා මානව සම්පත් කාර්ය ප්‍රවාහ අඛණ්ඩව ස්වයංක්‍රීය කිරීම

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මානව ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා 2018 වසරේ යෙදවූ සම්පත්

සේවකයන්ට කරන ලද මුළු ගෙවීම් රු. බිලියන 18.9

පුහුණුව හා සංවර්ධනය වෙනුවෙන් කරන ලද ආයෝජනය රු. මිලියන 338.0

මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය සඳහා ආයෝජනය රු. මිලියන 17.2

ප්‍රාග්ධන සම්බන්ධතා සහ ප්‍රශස්ත සමබරතාවයන්

තොරතුරු තාක්ෂණය පදනම් කරගත් දැනුම සහ කුසලතා, පරිසරය හා සමාජ කළමනාකරණ පද්ධතිය පිලිබඳ මාර්ගෝපදේශනයන් ගනුදෙනුකාර සේවා සහ වෙනත් පුහුණු වීම්

මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය සහ අනෙකුත් මානව සම්පත් හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය

සුවිශේෂී වූ ආයතනික ප්‍රාග්ධනයක් ගොඩනැගීම

රුකියා ගිවිසුම අනුව සේවකයන් - ස්ත්‍රී පුරුෂ භාවය අනුව ගෝලීය වාර්තාකරණ මූලාරම්භ 102-8 (අ)

	පුරුෂ		ස්ත්‍රී		එකතුව	
	2018	2017	2018	2017	**2018**	**2017**
ස්ථිර	3,467	3,237	5,257	4,350	**8,724**	**7,587**
වෙනත් ආයතන වෙතින් ලබාගත්	1,356	1,363	42	36	**1,398**	**1,399**
කොන්ත්‍රාත් පදනමින්	152	151	2	7	**154**	**158**
එකතුව	**4,975**	**4,751**	**5,301**	**4,393**	**10,276**	**9,144**

අපගේ කණ්ඩායම

අපගේ ගනුදෙනුකාර අත්දැකීම සඳහා පහසුකම් සලසන, බැංකුවේ ආයතනික වටිනාකම් ජීවිතයට බද්ධ කරගත් හා අපගේ උපායමාර්ගික න්‍යායපත්‍රය මෙහෙයවීමේදී උත්ප්‍රේරකයන් වන විවිධ වූ සේවකයන් 8,724 ක කණ්ඩායමකින් බැංකුවේ ක්‍රියාකාරිත්වයට ජවය සපයනු ලැබේ. සේවක සංවර්ධනය සම්බන්ධයෙන් ශක්තිමත් කීර්තිනාමයක් හා සහෝපකාරී සේවා පරිසරයක් හේතුවෙන් මෙම අංශය තුළ වැඩිම සංඛ්‍යාවක් තෝරා ගන්නා සේවා යෝජකයකු ලෙස ඉස්මතු වීමට බැංකුවට හැකියාව ලැබී ඇත.

සුදර්ශන කැලුම් ගජනායක
ප්‍රධාන කළමනාකරු මහනුවර අධිශ්‍රේණි ශාඛාව

මා 2003 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ලංකා බැංකුවේ සේවයට බැඳුණු අතර මාගේ පළමු පත්වීම ලැබුණේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පේමඩුව ශාඛාවටයි. ලංකා බැංකුව වෙත මාගේ කැපවීමට ප්‍රතිලාභ ලබමින් පසුගිය වසර 15 ක කාලසීමාව තුළ මම ක්‍රම ක්‍රමයෙන් කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු හා ප්‍රධාන කළමනාකාර යන ශ්‍රේණිවලට උසස්වීම් ලැබුවෙමි. බැංකුවේ සේවය

කිරීමට ලැබීම මට මහත් වරප්‍රසාදයක් වන අතර මා හට ලබා දුන් සියලු පුහුණු වීම් හා වෘත්තීය සංවර්ධන අවස්ථා සම්බන්ධයෙන් මම අතිශයින්ම කෘතඥ වෙමි. මගේ පවුලේ මූල්‍ය ස්ථාවර බව තහවුරු කිරීමට අමතරව ලංකා බැංකුවේ මාගේ රැකියාව හේතුවෙන් මාගේ කුසලතා වර්ධනය කර ගනිමින් පුද්ගල සංවර්ධනයට ද සමාජ සම්බන්ධතා පුළුල් කර ගැනීමටත් මා හට අවස්ථාව ලැබී ඇත.

රැකියා ගිවිසුම අනුව සේවකයන් - ප්‍රදේශය අනුව - ගෝලීය වාර්තාකරණ මූලාරම්භ 102-8 (අ)

	ස්ථිර		කොන්ත්‍රාත්	
පළාත	2018	2017	2018	2017
බස්නාහිර	3,902	3,459	71	75
දකුණු	746	631	18	18
සබරගමුව	571	481	11	11
ඌව	480	401	6	6
වයඹ	708	606	6	7
මධ්‍යම	728	583	16	17
උතුරු මැද	588	542	10	9
නැගෙනහිර	470	412	7	7
උතුරු	531	472	9	8
එකතුව	**8,724**	**7,587**	**154**	**158**

ශ්‍රේණිය අනුව සේවකයන් - ස්ත්‍රී පුරුෂ භාවය අනුව - ගෝලීය වාර්තාකරණ මූලාරම්භ 102-8 (ඇ)

	පුරුෂ		ස්ත්‍රී	
	2018	2017	2018	2017
ආයතනික කළමනාකාරිත්වය	12	14	3	2
විධායක කළමනාකාරිත්වය	29	35	17	13
ප්‍රධාන කළමනාකරුවන්	56	65	43	39
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	90	98	86	86
ශාඛා කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්	409	475	658	620
කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ අනෙකුත් නිලධාරී ශ්‍රේණි	929	715	1,853	1,537
බැංකු සහකාර හා සමාන ශ්‍රේණි	1,520	1,312	2,581	2,037
කාර්යාල සහකාර සහ සමාන ශ්‍රේණි	422	523	16	16
එකතුව	**3,467**	**3,237**	**5,257**	**4,350**

ශකිලා නශාත්
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී
වැල්ලවත්ත අධි ශ්‍රේණි ශාඛාව

කනිෂ්ඨ ලිපිකරු/ සහකාර අයකැමි ලෙස මා 1991 දී බැංකුවේ සේවයට බැඳුණු අතර උසස්වීම් ගණනාවකින් පසු දැනට මම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී තනතුර හොබවමි. මාගේ සගයන්ගේ හා ඉහළ නිලධාරීන්ගේ සහායෙන් වෘත්තීමය හා පුද්ගලික යන දෙයාකාරයෙන්ම දියුණුව අත් කර ගැනීමට බැංකුව මට අවස්ථාව සලසා දී ඇත. මා මාගේ වෘත්තීයට අදාල ඉලක්ක සියල්ලම පාහේ සාක්ෂාත් කර ගෙන මගේ පවුලත් සමඟ සාර්ථක හා ප්‍රීතිමත් ජීවිතයක් ගත කරන බැවින් බැංකුවට හා බැංකුවේදී මා හට හමු වූ සියළුම අපූර්ව සඟයන්ටත් මම ස්තුතිවන්ත වෙමි. බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ පීඨ සාමාජිකාවක ලෙස කටයුතු කිරීමට මා අවස්ථාව ලද අතර බැංකුවේ මානව සම්පත සංවර්ධනයට දායක වීමට ලැබීම පිලිබඳ මම සතුටු වෙමි. බැංකුවේ තවත් වසර ගණනක අගනා ප්‍රතිඵලදායක සේවා කාලයක් මම අපේක්ෂා කරමි.

ඊ ප්‍රේමරාජන්
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
යාපනය අධි ශ්‍රේණි ශාඛාව

1982 නොවැම්බර් මසදී සංවර්ධන සහකාරවරයෙකු ලෙස බැංකුවට බැඳීමත් සමඟ ලංකා බැංකුවේ මාගේ වෘත්තීය ජීවිතය ඇරඹිණි. එවක පටන් අවස්ථා ගණනාවකදී මා උසස්වීම් ලද අතර විශේෂයෙන්ම තිරුනෙල්වෙලි, යාපනය, දෙවැනි පේදුරු තුඩුව සහ මානිපායි ඇතුළු ශාඛාවන් ගණනාවක ශාඛා කළමනාකරු ලෙස වන්නි ප්‍රාදේශීය කාර්යාලයේ හා යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු ලෙසත් සේවය කිරීමට අවස්ථාව මා හට ලැබුණි.

2018 නොවැම්බර් මාසයේදී මම යාපනය අධිශ්‍රේණි ශාඛාවේ වැඩ බලන ප්‍රධාන කළමනාකරු ලෙස පත් කරනු ලැබුයෙමි. 37 වසරකට අධික කාලයක් ලංකා බැංකුවට සේවය කිරීමට ලැබීම මා හට මහත් ගෞරවයක් වන අතර බැංකුව මගේ පෞද්ගලික හා වෘත්තිය ජීවිතයේ සෑම අංශයක්ම පෝෂණය කර මා අද සිටින තත්ත්වයට පත් කළ බව මා පවසන්නේ ආඩම්බරයෙනි. මාගේ පවුල මුහුණ දුන් සියලු ආර්ථික දුෂ්කරතා ජය ගනිමින් අද අප අත්විඳිනා ජීවන මට්ටම අත් කර ගැනීමේදී බැංකුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කර ඇත.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මානව ප්‍රාග්ධනය

මානව සම්පත් පාලන හා කළමනාකරණ ප්‍රවේශය

මානව සම්පත් හා සබැඳි සියලු අංශ ආවරණය කරන පරිපූර්ණ ප්‍රතිපත්ති සමූහයකින් කුසලතා කළමනාකරණය කෙරෙහි බැංකුවේ ප්‍රවේශය පැහැදිලිව ප්‍රකාශිතය. මහා කළමනාකාරතුමා සභාපතිත්වය උසුලන විශේෂ මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා නිර්දේශ කිරීමේ වගකීම උසුලයි. මෙම වර්ෂය තුළදී මෙම කමිටුව රැස්වීම් 48 ක් පවත්වා ඇත. බැංකුවේ මානව සම්පත පාලනයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට මානව සම්පත් හා පාරිශ්‍රමික අනු කමිටුවේ සහාය ලැබේ. බැංකුවේ මානව සම්පත් උපායමාර්ගය ආයතනික සැලැස්ම හරහා සකස් කර මානව සම්පත් අංශය විසින් ක්‍රියාත්මක කර මෙහෙයවනු ලැබේ. මානව සම්පත් ප්‍රතිපත්තියෙන් ආවරණය වන්නේ: බඳවා ගැනීම්, සේවය අවසන් කිරීම, නිවාඩු හිමිකම්, වැටුප් හා සේවකයන්ට පිරිනැමෙන අනෙකුත් පාරිශ්‍රමික ආදිය වේ. කම්කරු පරිචය හා රැකියා යෝග්‍යතාව සම්බන්ධයෙන් බැංකුවේ කටයුතු, සාප්පු හා කාර්යාල ආඥා පනතින් පාලනය වේ. විකඟතා හා ගිවිසුම් වලට මානව හිමිකම් ඇතුලත්ව ඇත. එමෙන්ම සමාන අවස්ථා යටතේ සෑම සේවකයෙකුටම කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වාර්ගිකත්වය කුමක් වුවද සමාන සැලකුම් ලැබීමට හිමිකම තිබේ.



ආකර්ෂණය
- බඳවා ගැනීම් ප්‍රතිපත්තිය
- සමාන අවස්ථා ප්‍රතිපත්තිය

රඳවාගැනීම
- පුහුණුව හා සංවර්ධනය
- සේවක ප්‍රතිලාභ (වැටුප් හා වැටුප් නොවන)
- උසස්වීම්

පරිපාලනය
- මානව සම්පත් ප්‍රතිපත්තිය
- නිවාඩු
- චර්යාධර්ම සංග්‍රහය සහ විනය ක්‍රියාපටිපාටිය
- කාර්ය මණ්ඩල සුභසාධනය

කුසලතා ආකර්ශනය හා රඳවාගැනීම

රටේ පෙරමුණ ගත් සන්නාමය හා මූල්‍ය අංශයේ වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස බැංකුව, සේවකයන් ආකර්ෂණය කර ගැනීමට ඉහල හැකියාවක් බැංකුව සතුව පවතී. මාණ්ඩලික සහකාර හා කළමනාකරන අභ්‍යාසලාභී වැනි පිවිසුම් මට්ටමේ තනතුරු සඳහා දහස් ගණනින් අයදුම්පත් ලැබීම ලංකා බැංකුවේ සුලබ අත්දැකීමකි. බැංකුව ව්‍යුහගත හා පැහැදිලි ලෙස නිශ්චය කරන ලද බඳවාගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කරයි.

එක් එක් අංශවල කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා අවශ්‍යතාවය මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරනු ලැබේ. අනුමත කරනු ලැබූ පසු පුරප්පාඩු පිළිබඳ දැන්වීම් මහජනයාගේ දැන ගැනීම පිණිස භාෂා තුනෙන්ම පුවත්පත්වල හා බැංකුවේ වෙබ් අඩවියේ පළ කිරීම සිදු කෙරේ. ලිඛිත පරීක්ෂණයකදී සහ සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් සමඟ සම්මුඛ පරීක්ෂණයකදී ඔවුන්ගේ කාර්යසාධනය මත පදනම්ව අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. සියළුම නව සේවකයන් පරිපූර්ණ හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගි වෙති. 2018/ 2017 දී වසර හතරකට පසු විශාල බඳවාගැනීමේ ක්‍රියාවලියක් සිදු කෙරිණි. රාජ්‍ය ව්‍යවසායක් ලෙස ඉහත සඳහන් කළ ව්‍යුහගත බඳවාගැනීමේ පටිපාටිය අනුගමනය කිරීමට අපට සිදුව ඇති හෙයින් සාමාන්‍යයෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය තරමක් දිගු ක්‍රියාවලියකි. කෙසේ වෙතත්, එය වැඩි විනිවිදභාවයකින් යුක්ත වේ. බඳවාගැනීමේ ක්‍රියාවලිය දීර්ඝ වුවත්, සිය මානව සම්පත කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හා ඉන් ප්‍රශස්ත ප්‍රයෝජන ගැනීම මඟින් බැංකුව සෑම විටම සිය මෙහෙයුම් බාධාවකින් තොරව සිදුවන බවට වග බලා ගනී.

1,622
2018 දී බඳවාගැනීම්

20
කළමනාකරණ අභ්‍යාසලාභීන්

1,590
බැංකු සහයකයින්

12
වෙනත්

2018 දී බඳවා ගැනීම් - ගෝලීය වාර්තාකරණ මූලාරම්භ - 401-1



සේවකයන් රඳවා ගැනීම

වසර ගණනක් තිස්සේ බැංකුවේ සේවය හැරයාමේ අනුපාතය ස්ථාවර ලෙස අඩු අගයක් ගෙන ඇති අතර 2018 දී එය 0.9% ක් (විශ්‍රාම ගැනීම් අත්හැර) විය. සේවකයන් අගය කරන්නා වූ ආයතනික වටිනාකම් සමුහයක් ගොඩනැගීම කෙරෙහි දායක වූ පුහුණුව හා සංවර්ධනය වෙනුවෙන් කැපී පෙනෙන ආයෝජනය, වෘත්තිය ප්‍රගතිය වෙනුවෙන් අවස්ථා, වෘත්තීය සංගම් සමඟ මිත්‍රශීලී සබඳතා, දුක් ගැනවිලි විසඳීමේ ශක්තිමත් යාන්ත්‍රණයක් හා සේවකයන් සඳහා උසස් මට්ටමේ පහසුකම් (නිවාඩු නිකේතන, වැඩ ජීවිතයේ සමතුලිතතාව පිලිබඳව දිවා ආහාර විවේකය තුළ සම්මන්ත්‍රණ ආදී සුභසාධන ක්‍රියාකාරකම් ගණනාවක් ඇතුළුව සියලු සුවිශේෂී ගතිලක්ෂණ සහිත අපගේ සුවිශේෂී සේවක වටිනාකම් ප්‍රස්තුතය මෙයට වගකියනු ලැබේ. මෙම වර්ෂය තුළදී සුලබ සෞඛ්‍ය ගැටළු පිළිබඳව විශේෂ දේශන හා පියයුරු පිළිකා පිළිබඳ වෛද්‍ය කඳවුරක්ද පවත්වන ලදී. වර්ෂය තුළදී මෙම අවස්ථාවන්ට සහභාගි වූ මුළු සේවක සංඛ්‍යාව 500 ක් පමණ විය.

සේවය හැරයෑම 2018 - ගෝලීය වාර්තාකරණ මූලාරම්භ - 401-1



ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මානව ප්‍රාග්ධනය

සේවය හැරයාමට අදාල හේතු

හේතුව	සේවක සංඛ්‍යාව
නව අවස්ථාවක් ලැබීම	25
පෞද්ගලික හේතු	17
වෙනත් රටකට සංක්‍රමණය වීම	14
උසස් අධ්‍යාපනය	5
අසනීප වීම හේතුවෙන්	3
වෙනත්	10
විශ්‍රාම ගැනීම	311
එකතුව	**385**

සම්මාන සහ ඇගයීම්

දළ වැටුප, සේවක අර්ථසාධක සහ භාරකාර අරමුදල් දායකත්වයන්, වෛද්‍ය අධාර යෝජනා ක්‍රම, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල (සුදුසුකම් ලැබීමේ නිර්ණායක අදාළ වේ) අභිමතානුසාර ප්‍රසාද දීමනා හා දිරිගැන්වීමේ දීමනා ඇතුළු ආකර්ෂණීය ප්‍රතිලාභ සැලැස්මක් බැංකුව පිරිනමයි. බැංකුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් 12% කින් හා 3% කින් දායක වේ. නිවාස ණය හා වාහන ණය සඳහාද සේවකයන් සුදුසුකම් ලබන අතර පරිගණක ණය, සූර්ය බලශක්ති ණය, ආයෝජන ණය සහ සහන අනුපාතික යටතේ අනුමත සාමාන්‍ය ණය, අධ්‍යාපන සහාය සහ වෘත්තීයමය දායකත්ව ප්‍රතිපූරණ (සුදුසුකම් ලැබීමේ නිර්ණායක අදාල වේ) ද ඔවුනට ලැබේ. වැටුප් හා වැටුප් නොවන ප්‍රතිලාභ ඇතුළත් හානි පූරණය, රාජ්‍ය අංශ බැංකු කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති අතර සාකච්ඡා කෙරෙන සාමූහික ගිවිසුම මත පදනම්ව සෑම වසර තුනකටම වරක් වැටුප් හා වැටුප් නොවන දීමනා තීරණය වේ.

වැටුප් වර්ධක සහ උසස්වීම් තීරණය කිරීමේදී සියලු සේවකයන්ට සාධාරණ ලෙස සලකනු ලබන බව සහතික කිරීම සඳහා ව්‍යුහගත කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් භාවිත වේ. ප්‍රධාන කාර්යසාධන දර්ශක බැංකුවේ ආයතනික උපායමාර්ගය මත පදනම්ව ඇති අතර බැංකුවේ ස්ථිර සේවකයන්ගෙන් 97% ක් පමණ අවම වශයෙන් වාර්ෂික පදනමින් කාර්යසාධන ඇගයුම් වලට භාජනය වේ.

විනිවිදභාවයෙන් යුතු හා පැහැදිලිව සන්නිවේදනය කරන ලද උසස්වීම් ප්‍රතිපත්තියකින් රැකියාවේ ප්‍රගතිය වෙනුවෙන් මග පෙන්වීම සිදු වේ. තමන් දැනට සිටින තනතුරේ අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු උසස්වීමකට අයදුම් කිරීමට සේවකයන්ට සුදුසුකම ලැබේ. වර්ෂය තුළදී සේවකයන් 174 දෙනෙකු උසස් කරන ලද අතර ප්‍රවේශ මට්ටමේ තනතුරු සඳහා හැර අනෙකුත් සියලු පුරප්පාඩු අභ්‍යන්තර වශයෙන් පුරවන ලදී. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන් (සහකාර මහා කළමනාකාර/ නියෝජ්‍ය මහා කළමනාකාර) වෙනුවෙන් ලිඛිත අනුප්‍රාප්ති සැලසුම් ද ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙහි තනතුරු තුනක් හැරුණු කොට සියලු තනතුරු වලින් 100% ක් අභ්‍යන්තර උසස්වීම් හෝ ස්ථාන මාරු හෝ මඟින් පුරවනු ලැබීමෙන් ලංකා බැංකුව සිය සේවක සංවර්ධනය සිදු කිරීමේ සාර්ථකත්වය ප්‍රදර්ශනය වේ. සංවිධානය තුළ අවශ්‍ය කුසලතා නොපවතින විශේෂඥ භූමිකා වෙනුවෙන් පමණක් බාහිරින් බඳවාගැනීම් සිදු කෙරේ.

සේවකයන්ගේ කැපී පෙනෙන කාර්යසාධනයන් සඳහා පිළිගැනීමක් ලබා දීම සඳහා ලංකා බැංකු සේවක සම්මාන උළෙල (spirit) වාර්ෂිකව පවත්වනු ලැබේ. මුදල් ත්‍යාග හා විදේශ සංචාර, දේශීය චාරිකා, ඇගයීම් ලකුණු ආදී මූල්‍ය නොවන ප්‍රතිලාභ හරහා ඉහළ කාර්යසාධනයක සහිත ශාඛා හා සේවකයන් ඇගයුමට ලක් කෙරේ.

කාර්ය මණ්ඩල සුභසාධනය

- කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවතින නිවාඩු නිකේතන සංඛ්‍යාව 11
- වීම පහසුකම ලබාගත් කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 7,305.
- සුබසාධක වාහන භාවිත කළ කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 6,000
- ව්‍යායාම් ශාලාව, යෝග ව්‍යායාම යනාදිය වෙනුවෙන් සාමාජිකත්වය ලබා ඇති කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව - මසකට 55
- සහන අනුපාතිකයට පිරිනැමෙන කාර්ය මණ්ඩල ණය, රු. මිලියන 29.9

විවිධත්වය

ලංකා බැංකුව සමාන අවස්ථා ලබා දෙන සේවායෝජකයෙකු වන අතර බඳවා ගැනීම්, උසස්වීම් වලදී හෝ වේතන තීරණය කිරීමේදී ස්ත්‍රී පුරුෂ භාවය, වයස හෝ වාර්ගිකත්වය මත පදනම්ව වෙනස් ආකාරයෙන් සැලකීම සිදු නොකරයි. 60% ක් වන බැංකුවේ සමස්ත කාන්තා නියෝජනය කර්මාන්තය තුළ ඉහළම අගයන් අතර පවතිද්දී සේවක මණ්ඩලයේ වයස් සීමාවන් අඩු. 21 සිට 60 දක්වා පරාසයක විහිදී ඇත. බැංකුවේ නැවත සේවයට පැමිණීමේ අනුපාතිකයෙන් පිලිබිඹු වන පරිදි බැංකුව කාන්තාවන් වෙනුවෙන් සහෝපකාරී සේවා පරිසරයක් සපයයි. ඒ අතරම, කාන්තාවන් හා පුරුෂයන් අතර මූලික වැටුප් අනුපාතය 1:1 වේ. අපගේ බඳවා ගැනීම් ප්‍රතිපත්තිය අබාධිත සේවකයන් වෙනුවෙන් 1% දක්වා වූ කෝටාවක් වෙන් කර ඇත.

මාපිය නිවාඩු 2018 - ගෝලීය වාර්තාකරණ මූලාරම්භ - 401 - 3

	ස්ත්‍රී
සේවකයන්:	
මාපිය නිවාඩු වලට හිමිකම සහිත සේවකයන්	5,257
මාපිය නිවාඩු ලබාගත් සේවකයන්	383
නිවාඩුවෙන් පසු නැවත සේවයට පැමිණි සේවකයන්	358
මාපිය නිවාඩු ලබා නැවත සේවයට පැමිණ මාස 12 පසු තවමත් සේවයේ සිටින සේවක සංඛ්‍යාව	242
සේවකයන් මාපිය නිවාඩු ලබා නැවත සේවයට පැමිණීමේ අනුපාතය	93.2%
මාපිය නිවාඩු ලබා ගත් පසු තවදුරටත් සේවයේ රැඳී සිටින සේවක අනුපාතය	99.4%

2018 සේවක විවිධත්වය

	වයස් කාණ්ඩය			
	අවුරුදු 30 ට අඩු	අවුරුදු 30-50	අවුරුදු 50 ට වැඩි	එකතුව
ආයතනික කළමනාකාරීත්වය	-		15	15
විධායක කළමනාකාරීත්වය	-	18	28	46
ප්‍රධාන කළමනාකරුවන්	-	53	46	99
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	-	125	51	176
ශාඛා කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්	-	875	192	1,067
කළමනාකරණ අභ්‍යාසලාභී සහ අනෙකුත් නිලධාරී ශ්‍රේණි	510	2,083	189	2,782
මාණ්ඩලික සහකාර සහ සමාන ශ්‍රේණි	3,027	919	155	4,101
කාර්යාල සහකාර සහ සමාන ශ්‍රේණි	75	288	75	438
එකතුව				**8,724**

බාහිර ආයතන සමඟ එක්ව මෙහෙයවන ලද විශේෂ පුහුණු වැඩසටහන්

පුහුණු වැඩ සටහන	සහභාගි වූවන්
ආසියානු පැසිපික් කලාපීය ග්‍රාමීය ණය වැඩසටහන	10
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ගෝලීය ව්‍යාපාර සමාකරණ පුහුණු පාඨමාලාව (Glo-Bus)	24
ශ්‍රී ලංකා යුධ හමුදාව සමඟ නායකත්ව පුහුණුව	1,847

පුහුණු කිරීම් සහ සංවර්ධනය

පුහුණු කිරීම් සහ සංවර්ධනය සඳහා පවතින අවස්ථා සේවක වටිනාකම් ප්‍රස්තුතය ඉහළ නැංවීම සඳහා වන මූලික සාධකයක් වන අතර, අප කණ්ඩායමේ වෘත්තීය දැනුම සහ කුසලතා ඉහළ නැංවීම සඳහා අප නිරන්තරයෙන් ආයෝජනය කරනු ලැබේ. නවක සේවක සේවිකාවන් සවිස්තරාත්මකව හඳුන්වා දීමේ පුහුණු වැඩමුළුවකට සහභාගී වන අතර මහරගම ප්‍රාදේශීය ස්ථාපිත මධ්‍යම පුහුණු කිරීමේ අංශය මඟින් ආයතනික දැනුම සේවක ප්‍රජාව වෙත බෙදා හරිනු ලැබේ. ටෝස්ට්මාස්ටර් සහ ස්පීච් ක්‍රාෆ්ට් (Toastmaster and speech craft) ආදී වැඩසටහන් හරහා අප සේවකයන්ගේ ක්‍රමික, දීර්ඝකාලීන දැනුම වර්ධනය සඳහා අප නිරන්තරයෙන් අවස්ථා සපයා දෙනු ලැබේ. එමෙන්ම විවිධ වූ කළමනාකරණ ශ්‍රේණි සඳහා විශේෂයෙන් නිමවූ සංවර්ධන වැඩමුළු ද ක්‍රියාත්මක වේ.

පීඨ සාමාජිකයන් හත් දෙනෙකු සහ ආශ්‍රිත පීඨ සාමාජිකයන් 132 කුගෙන් සමන්විත මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයක් බැංකුව සතුව ඇත. සහභාගි වන්නන් 315 දක්වා සංඛ්‍යාවකට නේවාසික පුහුණුවීම් සඳහාද පහසුකම් මෙම ස්ථානයේ පවතී.

පුහුණු මාණ්ඩලික සහකාරවරුන් සඳහා නායකත්ව පුහුණු පාඨමාලා

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

මානව ප්‍රාග්ධනය

පුහුණු කිරීම් වෙනුවෙන් ආයෝජනය



සම්පූර්ණ පුහුණුවීම් පැය ගණන

වැඩසටහන් පැය ගණන

	ආයතනය තුළම	දේශීය පුහුණුවීම්	විදේශ පුහුණුවීම්	එකතුව
2018	6,218	2,134	3,416	11,768
2017	4,087	2,997	4,800	11,884

පුහුණුවීම් පැය ගණන් සාමාන්‍යය

	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකරණය	13	11
විධායක කළමනාකරණය	10	8
ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ප්‍රධාන කළමනාකරුවන්/ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්/ ශාඛා කළමනාකරුවන්)	3	3
විධායක නිලධාරීන් (සහකාර කළමනාකරුවන්/ විධායක නිලධාරීන් / නිලධාරී පුහුණුවන්නන්/ කනිෂ්ඨ පුහුණු නිලධාරීන්)	2	1
බැංකු සහකාරවරුන් සහ වෙනත්	1	1

සේවක සහභාගිත්වය

සේවක අභිප්‍රේරණය බලගැන්වීම හා මිත්‍රශීලී හැඟීම් පෝෂණය කිරීම සඳහා ක්‍රීඩා, සංස්කෘතික හා ආගමික ක්‍රියාකාරකම් වර්ෂය පුරාම ක්‍රියාත්මක කෙරේ. වර්ෂය තුළ ඉටු කරන ලද ඇතැම් ක්‍රියාකාරකම් පහත දැක්වේ.

බැංකුවේ බෞද්ධ සංගමය විසින් සංවිධානය කරන ලද එක් දින ශීල ව්‍යාපාරය

වෙසක් උත්සවය සැමරීමේ වැඩසටහන්

කාර්මික සබඳතා

සිය සේවකයන්ගේ නිදහස සඳහා ඇති අයිතිය බැංකුව පිළිගන්නා අතර සිය සේවකයන් වෘත්තීය සමිතිවලට බැඳීම කවර හෝ ආකාරයකින් සීමා නොකරයි. බැංකුවේ සේවකයන්ගෙන් 92% ක් පමණම වෘත්තීය සමිති හතෙන් කුමක් හෝ වෘත්තීය සමිතියක් නියෝජනය කරන අතර සේවකයන් හත් දෙනෙකු වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් ස්ථිරවම නිදහස් කර ඇත. විවිධ වෘත්තීය සමිතිවල බලයලත් සේවක නියෝජිතයන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරත වීමට අවස්ථාව සලසනු ලබන අතර එබඳු කටයුතු වෙනුවෙන් පහසුකම් හා මූල්‍ය සම්පාදනය මඟින් සහාය ලබා දීම සිදු වේ. සැලකිය යුතු වැදගත් කරුණු පමණක් බැංකුවේ කළමනාකාරිත්වයට ඉදිරිපත් කෙරෙන බවට වගබලා ගැනීම සඳහා අපි වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ මිත්‍රශීලී හා සහයෝගී සබඳතා පවත්වා ගන්නෙමු.

සියළුම වෘත්තීය සමිති සමඟ වන සාමූහික ගිවිසුම් 2018 දී සමාලෝචනය කර අත්සන් තබන ලදී. මුළු ශ්‍රම බලකායෙන් 77% ක් සාමූහික ගිවිසුම් මඟින් ආවරණය වේ. එමෙන්ම කාර්මික ආරවුල් හේතුවෙන් සේවයට බාධාවීම් කිසිවක් මෙම වර්ෂය තුළදී සිදු නොවිණි.

සේවකයන්ට බලපෑ හැකි කවර හෝ සැලකිය යුතු මෙහෙයුම් වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී ඊට මාස 06කට පෙර ඒ බව සේවකයන්ට දැනුම් දීම සිදු කරනු ලැබේ. දැනුම්දීමේ කාලසීමාව හා අදහස් විමසීම හා කතිකාව වෙනුවෙන් විධිවිධාන අදාල සාමූහික ගිවිසුම් තුළ නිශ්චිතව දක්වා ඇත.

නත්තල් උත්සවය සමරමින් කාර්ය මණ්ඩලය විසින් නත්තල් කැරොල් ගී ගායනය

බැංකුවේ 79 වැනි සංවත්සරය වෙනුවෙන් විශේෂ හින්දු පූජා උත්සවය

සෞඛ්‍ය සහ ආරක්ෂාව

බැංකුව තුළ සේවා පරිසරය විශාල සෞඛ්‍ය හා ආරක්ෂක අවධානම් තත්ත්වයන්ට හේතු නොවන නමුත් සේවකයන්ගේ මනා සෞඛ්‍යයට හා ආරක්ෂාවට අප ප්‍රමුඛත්වය දෙන්නෙමු. සාමූහික ගිවිසුම් හරහා ආවරණය කෙරෙන සෞඛ්‍යය හා ආරක්ෂාව මාතෘකා අතරට වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ සේවක හිමිකම් ඇතුළත්ව ඇත. බැංකුවේ සෞඛ්‍ය හා ආරක්ෂා අරමුණු ඉටු කර ගැනීම පිණිස ගන්නා ලද මූලාරම්භයන් පහත දැක්වේ;

- සියළුම ස්ථිර සේවකයන්ට හා ඔවුන්ගේ පවුලේ සමීප ඥාතීන්ට පරිපූර්ණ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම
- කවර හෝ හදිසි වෛද්‍ය අවස්ථා වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය තුළම වෛද්‍යවරයෙකු, හෙදියක හා බෙහෙත් ශාලාවක් තිබීම
- ප්‍රධාන කාර්යාලයේ ව්‍යායාම ශාලාවක්, යෝග හා ඇරොබික් සඳහා පහසුකම් තිබීම
- මුදල් ප්‍රවාහනයේ යෙදෙන සේවකයන්ට විශේෂ පුහුණුව හා ආරක්ෂාව
- ප්‍රධාන කාර්යාලයේදී වාර්ෂිකව ගින්නකට මුහුණදීමේ හා ගිනි නිවීම් පුහුණුව පැවැත්වීම

2018 රාමදාන් උපවාස කාලසීමාව තුළ ඉෆ්තාර් උත්සවය

2018 දී සේවකයන් කෙරේ නිශ්චිත වටිනාකම

අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර	ප්‍රගතිය
සේවකයින් සඳහා වූ මුළු ගෙවීම්	රු. බිලියන 18.9
තොරතුරු තාක්ෂණය හා සබැඳි කුසලතා හා දැනුම ඇතුළුව පුහුණුව වෙනුවෙන් ආයෝජනය	රු. මිලියන 338.0
කාන්තා නියෝජනය:	
කළමනාකාර මට්ටම	58%
සමස්ථ	60%
මාපිය නිවාඩු වලින් පසු නැවත සේවයට පැමිණීම	358
වසර 10 සේවා කාලය සම්පූර්ණ කර විශ්‍රාම ගැනීමේදී විශ්‍රාම වැටුප සැපයීම	රු. බිලියන 6.8 (වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදනය)

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය

සිය තරඟකාරීත්ව වාසි පවත්වා ගැනීමටත්, ගනුදෙනුකරුවන් ප්‍රතිග්‍රහණය කිරීම සඳහාත්, සන්නාම හිමිකාරිත්වය ඉහළ නංවා ගැනීමටත්, සීඝ්‍රයෙන් වෙනස්වන පරිසරයක් තුළ යාවත්කාලීන වෙමින් ක්‍රියාත්මක වීමටත් බැංකුවට හැකියාව ලබා දෙන්නා වූ ලංකා බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය එහි වඩාත්ම වැදගත් උපායමාර්ගික වත්කමක් නියෝජනය කරයි.

සන්නාමය
රු. බිලියන
42.9

වසර
81,627
කාර්ය මණ්ඩලයේ සමුච්චිත සේවා අත්දැකීම් ව්‍යංගික දැනුම

නව්‍යකරණය සඳහා හැකියාව



ආයතනික වටිනාකම්

2018 වසරේ උපායමාර්ගික ප්‍රමුඛතා

සහස්‍ර වාර්ෂික ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම පිණිස ඩිජිටල් ප්‍රස්තුතය ඉහළ නැංවීම

යහපාලනය, ආචාර ධර්ම සහ ශක්තිමත් අවදානම් කළමනාකරණයක් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම

අපගේ දීර්ඝකාලීන ගනුදෙනුකරුවන් රඳවා ගනිමින් ඊළඟ පරම්පරාවේ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරගත් සන්නාමකරණ මූලාරම්භයන්

2018 මූලාරම්භයන්

- නව්‍ය ඩිජිටල් නිපැයුම් සකස් කිරීම
- ආචාර ධර්ම, අවංකභාවය සහ යහපාලනය පිළිබඳ ඉලක්ක ගත පුහුණු වැඩමුළු
- ස්වයංක්‍රීයකරණය සහ සැකසුම් වැඩි දියුණු කිරීම
- ඩිජිටල් පිරිනැමුම් සඳහා සන්නාම ප්‍රවර්ධනය

2018 වසරේ කාර්යසාධනය

- අඛණ්ඩව 10 වන වරටත් ශ්‍රී ලංකාවේ අංක 1 සන්නාම තත්ත්වය පවත්වා ගන්නා ලදී. - බ්‍රෑන්ඩ් ෆිනෑන්ස්
- බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ලංකා විසින් පල කල පරිදි සන්නාම වටිනාකම රු. බිලියන 42.9 දක්වා 6% කින් වර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ ශක්තිමත්ම බැංකුව - ඒෂියන් බැන්කර් සඟරාව
- වික්සත් රාජධානියේ ද බෑංකර් සඟරාව පරිදි ලොව හොඳම බැංකු 1000 අතර සිටීම
- වෙළෙඳපොළ නායකත්වය තවදුරටත් පවත්වා ගැනීම
- 2018 ස්ලිම් - නීල්සන් සම්මාන උළෙලේදී වසරේ ජනතා සේවා සන්නාමය ලෙස පිලිගන්නා ලදී
- වසර තුළදී ජංගම බැංකුකරණ යෙදුම භාවිතාව සඳහා අලුතින් ලියාපදිංචි වූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 272,975 කි

2019 වසර සඳහා ප්‍රමුඛතා

- සන්නාම ප්‍රතිපත්තිය සකස් කිරීම
- සන්නාම සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම
- කාර්යමාත්‍ර බැංකුකරණ සංකල්පය (Virtual Banking) සපුරා ගැනීම
- 'බිග් ඩේටා' විශ්ලේෂණ මඟින් දත්ත විශ්ලේෂණ හැකියාව ඉහළ නැංවීම
- නව්‍යකරණය සඳහා වූ අවකාශ ඉහළ නැංවීම සඳහා නව්‍යකරණ විද්‍යාගාරයක්

ආයතනික වටිනාකම්

බැංකුවේ සංස්කෘතිය හැඩගස්වමින් සහ ආයතනයේ වටිනාකම් කුමක්ද යන්න පිළිබඳව බාහිර සහ අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ට පැහැදිලි කරමින්ද, බැංකුවේ ආයතනික වටිනාකම් එහි අනන්‍යතාවයේ හරය පිළිබිඹු කරයි. ලාභ උත්පාදනය ඉක්මවා ව්‍යාප්ත වන සමාජීය සහ මහජන යහපත පිළිබඳ අරමුණු ඇතුලත් මෙහෙවරක් සහිත බැංකුවක් ලෙස, ලංකා බැංකුවේ ආයතනික වටිනාකම්, ආයතනයේ වටිනාකම් ජනනය කිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය ශක්තිය සපයන්නා දර්ශන, විශ්වාසයන් සහ මූලධර්ම පැහැදිලි කරයි. සේවාහිමිබ වැඩසටහනේදී සියලු සේවකයන් හට ආයතනික වටිනාකම් හඳුන්වාදෙනු ලබන අතර සම්බන්ධවීම සහ සන්නිවේදනය මඟින් නිරන්තරයෙන් යළි යළිත් තහවුරු කරනු ලැබේ. වගකිව යුතු සහ සදාචාරාත්මක අයුරින් සිය කටයුතු ඉටු කිරීමට සේවකයන් මග පෙන්වන අතරම ශක්තිමත් ව්‍යාපාරික සබඳතා පෝෂණය කිරීමට හා සවිබල ගැන්වීමට ලංකා බැංකුවේ ආයතනික වටිනාකම් හේතු වී ඇත.



බුද්ධිමය ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා 2018 දී වෙන් කළ සම්පත්

සන්නාම සංවර්ධන ආයෝජනය
රු. බිලියන 1.2

ඩිජිටල් හඳුන්වාදීම සඳහා ආයෝජනය
රු. බිලියන 2.0

සේවක පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය
රු. මිලියන 338.0



ප්‍රාග්ධන සම්බන්ධතා සහ වෙළඳ ගැලපුම්

ඩිජිටල් නිපැයුම් හරහා ඉහළ නැංවුණු ගනුදෙනුකාර වටිනාකම් ප්‍රස්තූතය

සංවිධානමය ප්‍රාග්ධනය සුපෝෂණය මඟින් මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකබව ශක්තිමත් කරනු ලැබේ.

ඩිජිටල් තාක්ෂණය සඳහා ආයෝජන මූල්‍ය ප්‍රාග්ධනය මත කෙටිකාලීන සහ දිගුකාලීන ගම්‍යමාන ඇති කරනු ඇත.

අපගේ සන්නාමය

ස්වාධීන දේශීය සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන විසින් ලංකා බැංකු සන්නාමය ශ්‍රී ලංකාවේ අංක 1 සන්නාමය ලෙස නිරතුරුවම ශ්‍රේණිගත කර තිබේ. එම සන්නාමය ස්ථාවරභාවය, විශ්වාසය සහ විශ්වසනීයත්වයේ ගුණාංග හා බැඳී පවතින අතර එමඟින් අවම ගනුදෙනුකාර ප්‍රතිග්‍රහණ පිරිවැයක් සහ ඉහළ රඳවාගැනීමක් සඳහා උපස්ථම්භක වී තිබේ. 2018 වසරේදී, 'BoC DIGI', ස්මාට් සෝන්, 'B App' යෙදුම, 'SMART' පාස් පොත සහ ස්මාට් අන්තර්ජාල පහසුකම් වසර තුළ බැංකුව ඩිජිටල් සන්නාම ප්‍රවර්ධනය සඳහා මුලිකත්වය දෙන ලද ඩිජිටල් මූලපිරීම් වේ.

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ

අංක 1 සන්නාමය

අඛණ්ඩව 10 වැනි වරටත් ශ්‍රී ලංකාවේ බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ ශක්තිමත්ම බැංකුව

ද ඒෂියන් බෑන්කර්

2012 සිට ලෝකයේ හොඳම බැංකු 1000 අතර

ද බෑන්කර් සඟරාව, එක්සත් රාජධානිය

ලංකා බැංකුවේ සන්නාම වටිනාකම



ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

බුද්ධිමය ප්‍රාග්ධනය

ව්‍යංගික දැනුම

වෙළඳපොළ අංශ හරහා අසමසම ගනුදෙනුකාර පදනමක් සමඟ කටයුතු කිරීමේ වසර 79 ක උරුමය සහ කර්මාන්තයේ විශාලතම කළඹ කළමනාකරණය කිරීම තුළින් අද්විතීය ආයතනික ප්‍රාග්ධන පදනමක් ගොඩනඟා ගැනීම සඳහා ලංකා බැංකුවට අවස්ථාව ලැබී තිබේ. කාර්යය ප්‍රවාහ වෙත කාවද්දා ඇති නිර්වචිත ඉගෙනුම් ව්‍යුහයන්, සහයෝගී නායකත්ව කණ්ඩායම් සහ ඉගෙනුම් ක්‍රියාවලි හරහා මෙම ව්‍යාංගික දැනුම විවිධ අංශ සහ සේවක පරම්පරාවන් සමඟ බෙදා හදා ගනු ලැබේ. කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ අභ්‍යාසලාභී බැංකු සහායකයන් ලෙස තරුණ නවකයන් බඳවාගැනීමත්, 98% ඉක්මවන සාමාන්‍ය රැඳවුම් අනුපාතයත්, කර්මාන්තයේ වඩාත්ම පුළුල් නියෝජනය සහිත, අත්දැකීම් පූර්ණ කුසලතා සහිත කණ්ඩායම් ගොඩනැගීමට ලංකා බැංකුවට හැකියාව ලබා දී තිබේ.



නව්‍යකරණය සඳහා ඉඩප්‍රස්තා

වර්තමානෙහි සීඝ්‍රයෙන් වෙනස්වන බැංකුකරණ පරිසරය තුළ සුචලව තරඟ කිරීම සඳහා සිය නිපැයුම් අඛණ්ඩව නව්‍යකරණය කිරීමේ අවශ්‍යතාව බැංකුව අවබෝධ කරගෙන තිබේ. සංකීර්ණතාව අඩු කිරීම පිණිස තාක්ෂණය යොදා ගැනීම සහ ගනුදෙනුකරුවන් සහ සේවකයන් යන දෙපිරිසම සඳහා ඉහළ නංවන ලද නම්‍යශීලීත්වය බැංකුවේ ප්‍රධාන ඉලක්කයක් වී ඇති අතර ක්‍රියාදාම සංශෝධනය කිරීම, කාර්යය ප්‍රවාහ සරල කිරීම සහ ස්වයං සේවා ක්‍රමවේද ව්‍යාප්ත කිරීම සඳහා අප සැලකිය යුතු ආයෝජනයන් සිදු කර තිබේ.

අනාගතය සඳහා ප්‍රධාන ඉලක්ක

ගනුදෙනුකරුවන්	අභ්‍යන්තර ක්‍රියාදාම	සේවකයන්
• නව මූල්‍ය තාක්ෂණ නිපැයුම් (Fintec Products) සමඟින් කාර්යමාත්‍ර බැංකුකරණ (Virtual banking) ප්‍රස්තුතය ඉහළ නැංවීම • මුදල් නොට්ටු රහිත බැංකුකරණයට පහසුකම් සැපයීම සඳහා වූ නිපැයුම්	• නව කාර්යමාත්‍ර බැංකුකරණය සඳහා අවශ්‍ය පසු පෙළ කාර්යාලය • Big data විශ්ලේෂණ මෙවලමක් සහිත මධ්‍යගත දත්ත ගබඩාව • කඩදාසි භාවිතයෙන් තොර බැංකුකරණ සංස්කෘතියක් කරා ඉලක්කගත අඛණ්ඩ කාර්ය ප්‍රවාහ සංචක්‍රීයකරණය • බැංකුවේ නවෝත්පාදන සඳහා විද්‍යාගාරයක්	• පූර්ණ ස්වයංක්‍රීය මානව සම්පත් කළමනාකරණ පද්ධතියට ඉඩ සලසන සම්පූර්ණ මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය • BoC 360 : කාර්යසාධන කළමනාකරණ යෙදුම

සම්මාන සහ ප්‍රණාම

ශ්‍රී ලංකාවේ අංක 1 සන්නාමය

- ශ්‍රී ලංකාවේ අංක 1 සන්නාමය - බ්‍රෑන්ඩ් ෆිනෑන්ස්
- වඩාත්ම විටිනා ගනුදෙනුකාර සන්නාමය - බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් (අඛණ්ඩව 10 වැනි වසර සඳහා අංක 1 සන්නාමය)
- වසරේ ජනතා සම්මානය- ස්ට්‍රීම් හිල්සන් ජනතා සම්මාන

කාර්යසාධන විශිෂ්ඨත්වය

- ශ්‍රී ලංකාවේ ශක්තිමත්ම බැංකුව - ද ඒෂියන් බෑන්කර්
- ලෝකයේ හොඳම බැංකු 1000 අතරට - ද බෑන්කර් සඟරාව (එක්සත් රාජධානිය)
- ස්වාභිමානී ගෞරව සම්මාන - සේවා විශිෂ්ඨතා සම්මාන උළෙල (සීෂෙල්ස්)

මානව සම්පත් සම්මාන

- සේවය කිරීම සඳහා වඩාත්ම සුදුසු මානව සම්පත් ආයතනය - ගෝලීය මානව සම්පත් විශිෂ්ඨතා සම්මාන 2018
- ආසියාවේ හොඳම සේවායෝජක සන්නාමය 2018 - සේවායෝජක සන්නාමකරණ ආයතනය, ඉන්දියාව
- ශ්‍රී ලංකාවේ හොඳම සේවා යෝජක සම්මානය 2018 - සේවායෝජක සන්නාමකරණ ආයතනය, ඉන්දියාව

තිරසාරත්වය/ ආයතනික සමාජ වගකීම සඳහා සම්මානය

- හොඳම ආයතනික පුරවැසියන් දහය අතරට - විශිෂ්ඨතම ආයතනික පුරවැසි තිරසර සම්මාන 2018 - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
- හරිත ගොඩනැගිලි ප්ලැටිනම් සම්මානය ත්‍රිකුණාමලය අධි ශ්‍රේණි ශාඛාව - ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි මණ්ඩලය මඟින් පවත්වනු ලැබූ වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන

වාර්ෂික වාර්තා සම්මාන

- රාජ්‍ය බැංකු අංශය සඳහා ස්වර්ණ සම්මානය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තා සම්මාන
- ජයග්‍රාහක - රාජ්‍ය බැංකු අංශය SAFA සම්මාන 2017
- ARC සම්මාන - (ජාත්‍යන්තර බැංකු අංශය)
  - මූල්‍ය දත්ත - ස්වර්ණ සම්මානය
  - ලිඛිත පෙළ - ස්වර්ණ සම්මානය
  - සම්ප්‍රදායික වාර්ෂික වාර්තාව- ස්වර්ණ සම්මානය

තාක්ෂණික සහ ඩිජිටල් මූලාරම්භයන් සඳහා සම්මාන

- මූල්‍ය ක්ෂේත්‍රයේ හොඳම ජංගම දුරකථන භාවිතාව සඳහා SLT ZERO One සම්මානය
- ටෙක්නොවේෂන් සම්මාන
  - අන්තර්බැංකු ගෙවීම් විශිෂ්ඨත්වය පිළිබඳ සමස්ත ජයග්‍රාහක
  - ජයග්‍රාහක - වඩාත්ම ජනප්‍රිය විද්‍යුත් ගෙවීම් නිපැයුම (B App යෙදුම)
  - ජයග්‍රාහක - වසරේ හොඳම පොදු ATM උපයෝජක
  - ජයග්‍රාහක - ඇ. ඩො. මාර්ගගත ගෙවීම් සඳහා හොඳම උපයෝජක
  - ජයග්‍රාහක - මූල්‍ය අන්තර්කරණය සඳහා වසරේ හොඳම බැංකුව
  - දෙවන ස්ථානය - ශාඛා බැංකු ගෙවීම් සඳහා හොඳම බැංකුව

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සම්බන්ධතා පවත්වා ගැනීම අපගේ අඛණ්ඩ වාණිජමය සාර්ථකත්වයයෙහි සහ සමාජමය අදාළත්වයෙහි ප්‍රධානතම සාධක වන බව අපි විශ්වාස කරන්නෙමු. එබැවින්, බැංකුව ක්‍රමෝපායික ක්‍රියාමාර්ග හරහා සිය පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවයන් ක්‍රමානුකූලව හඳුනා ගෙන ඒවාට ආමන්ත්‍රණය කිරීමට කැපවී සිටියි.

මිලියන 13.4
ගනුදෙනුකාර සබඳතා

අපගේ අඟය නිර්මාණය කිරීමට සහාය දෙන **9,722** කට අධික ව්‍යාපාර හවුල්කරුවන් පිරිසක්

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ගනුදෙනුකරුවන් **14,580** ක් ප්‍රතිලාභ ලබා ඇත.

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම සහ හැකියා සංවර්ධනය කිරීම සඳහා **රු. මිලියන 21.9 ක්** වැය කර ඇත.

ආයතනික සමාජ වගකීම සඳහා **රු. මිලියන 108.0 ක්** වැය කර ඇත.

2018 වර්ෂයේ ක්‍රමෝපායික ප්‍රමුඛතා

- බහු මාර්ගික බෙදාහැරීම් හරහා වේගවත් සේවා සැලසීම
- ඩිජිටල්කරණය හරහා මූල්‍ය අන්තර්කරණය
- ලංකා බැංකුවේ ඩිජිටල්කරණ ක්‍රමෝපාය මඟින් තරුණ පරපුරට සේවා සැපයීම
- ගනුදෙනුකාර ප්‍රජාව සමඟ සබඳතා
- සේවා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම

2018 මූලාරම්භයන්

- සේවා සහ සාපේක්ෂ සේවා මට්ටම් පිළිබඳව ගනුදෙනුකරුවන්ගේ අවබෝධය මැන බැලීම සඳහා සියළුම පළාත් ආවරණය කරමින් පාරිභෝගික තෘප්තිමත්භාවය මැන බැලීමේ සමීක්ෂණ පැවැත්වීම
- ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් පහසුකම් සහිත සැළසුම් ශක්තිමත් කිරීම
- මූල්‍ය සාක්ෂරතාවය සහ හැකියා සංවර්ධනය කෙරෙහි අඛණ්ඩව ආයෝජනය කිරීම
- ක්‍රමෝපායික තිරසාර අරමුණු මෙහෙයවීම පිණිස නව්‍යකරණය කරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති

2018 වසරේ කාර්යසාධනයන්

- ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය සාක්ෂරතා සහ හැකියා සංවර්ධන සැසි 113 ක්
- ණය දීමෙහි 24% ක වර්ධනයක්
- තැන්පත්කරුවන් සඳහා ගෙවූ පොළී වියදමේ 21% ක වර්ධනයක්
- ගෝලීය මුදල් මාරු කිරීමේ නියෝජිත ආයතන සමඟ නව සම්බන්ධතා ජාල 2 ක් (වෙස්ටර්න් යුනියන්, ජී එස් කෑෂ්ලයින්)
- සැපයුම්කරුවන් වෙත රු. මිලියන 6,670.3 ක ගෙවීම්
- ආයතනික සමාජ වගකීම් සහ අනුග්‍රහ දැක්වීම් හරහා ප්‍රජාව තුළ රු. මිලියන 30.4 ක ආයෝජන
- ළමා අධ්‍යාපනය වෙනුවෙන් රු. මිලියන 89.2 ක් වැය කිරීම

2019 වසර සඳහා ප්‍රමුඛතා

- කාර්යක්ෂමතාවය, නව්‍යකරණය සහ ඩිජිටල් විසඳුම් පිළිබඳව ගනුදෙනුකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සන්නිවේදන ක්‍රමෝපාය සංශෝධනය කිරීම
- සැපයුම්කරුවන්ගේ විගණන පැවැත්වීම සඳහා සැපයුම්කරුවන් සඳහා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම
- තිරසාර සංවර්ධන ඉලක්කවලට සමගාමී වූ ක්‍රමෝපායික ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිවල නියැලීම
- ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් බැංකු සේවා සහ මුදල් භාවිත නොවන බැංකු සේවා ක්‍රම තවදුරටත් වැඩිදියුණු කිරීම
- වෙනත් රටවල සිටින මෙරට පුරවැසියන් වැඩි දෙනෙකුට සේවා සැපයීම අරමුණු කරමින් අපගේ සේවා ස්ථාන තවත් රටවලට ව්‍යාප්ත කිරීම

ගනුදෙනුකරුවන්

විවිධ ගනුදෙනුකාර කණ්ඩායම්, කර්මාන්ත අංශ සහ ප්‍රදේශ පුරා සාර්ථක වෙමින් බැංකුව මෙරට ජනගහනයෙන් 62% ට සේවය සපයා දෙයි. වෙළඳපොළ පිළිගැනීම පවත්වා ගැනීම පිණිස, ඉස්මතු වෙමින් පවතින පාරිභෝගික රුචිකත්වයන්ට සහ තාක්ෂණය විසින් මෙහෙයවනු ලබන තරඟකාරී තත්ත්වයට හැඩ ගැසෙමින්, විශ්වාසය සහ ස්ථාවරත්වය යන අපගේ මූලික ශක්තීන් මත ගොඩ නැගුණු අද්විතීය පාරිභෝගික වටිනාකමක් පිරිනැමීමේ අවශ්‍යතාවය අපි හඳුනාගෙන සිටිමු. 2018 වර්ෂයේදී අපි විශේෂිත නිෂ්පාදිත සහ ඩිජිටල් විසඳුම් ගණනාවක් සපයා දෙමින් යෞවන ප්‍රජාව අතර ව්‍යාප්ත වීම වර්ධනය කිරීම ද අවධාරණය කළෙමු.

පළාත් අනුව ගනුදෙනුකරුවන්ගේ ව්‍යාප්තිය - 2018



ගනුදෙනුකරුවන් මිලියන 13.4 ක්

80% ක් බස්නාහිර පළාතෙන් පිටත

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ගනුදෙනුකාර ව්‍යාප්තිය - 2018



සිද්ධි අධ්‍යයනය

ශ්‍රී රාහුල විද්‍යාලය - අනුරාධපුර

ශ්‍රී රාහුල විද්‍යාලය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ඉතාම ජනප්‍රිය පෞද්ගලික පාසල් වලින් එකක් වන අතර එය නිරන්තරයෙන් ම සාමාන්‍ය සමත් ප්‍රතිශතයට වඩා ඉහළ සමත් ප්‍රතිශතයක් වාර්තා කරමින් ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රබල කීර්ති නාමයක් ගොඩ නගා ගෙන ඇත. මෙම පාසල එහි යටිතල ව්‍යුහය සහ පහසුකම් පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් සිටි අවස්ථාවේදී පහසු අනුපාතයන් යටතේ පහසුකම් ගණනාවක් සපයා දෙමින් ලංකා බැංකුව එම පාසලේ සාර්ථකත්වයෙහි ඉතා වටිනා හවුල්කරුවෙක් වී තිබේ. මෙම පහසුකම් හරහා ලංකා බැංකුව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා අවස්ථා සපයා දීම කෙරෙහි සෘජුව ම දායකත්වය සපයා දී ඇත.

මෙම පාසල මුලින් ම ආරම්භ කළ, එහි හිමිකරු වන රොෂාන් මහතාට පාසල පුළුල් කිරීමේ අරමුදල් සම්පාදනය කර ගැනීමේ අභියෝගයට මුහුණ දී සිටියදී, බැංකුවෙහි සහාය ලබා දෙන ලදී. මෙම පාසලේ වේගවත් සාර්ථකත්වයත් සමඟ නොමිලයේ පෙළ පොත් ලබා දීමට සහ ගුරුවරුන්ගේ වැටුප් ගෙවීම සඳහා දායක වීමට රජය ඉදිරිපත් විය. මෙම පාසල ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ පෞද්ගලික පාසල් සමඟ සම මට්ටමට වැඩි දියුණු කිරීම සඳහා පාසලේ ප්‍රමිතීන් තව දුරටත් වැඩි දියුණු කිරීමට එහි හිමිකරු වන රොෂාන් මහතා අපේක්ෂා කරයි. ඒ අනුව එහි ගෘහස්ථ පිහිණුම් තටාකයක් සහ ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට නියමිත අතර ලංකා බැංකුව දැනටමත් ඒ සඳහා සහාය දීමට ඉදිරිපත් වී සිටියි. මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයා දීම මඟින් දැරිය හැකි මිලකට ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු සේවා වෙත ප්‍රවේශ වීමට සාමාන්‍යයෙන් අවස්ථාව නොලැබෙන ප්‍රජාවකට එවැනි ස්වභාවයේ ගුණාත්මක අධ්‍යාපනයක් සපයා දීමට සහාය වීම මඟින් බැංකුවට එහි වාණිජ මෙන්ම සමාජමය තිරසාරත්වය ද අත් කර ගැනීමට හැකි වී තිබේ.

සිද්ධි අධ්‍යයනය

වාකරේ ප්‍රජා ව්‍යාපෘතිය

යුද්ධයෙන් බලපෑමට ලක්වූ, මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි වාකරේ ප්‍රදේශයේ තරුණ ගොවි මහතුන් කණ්ඩායමක් සමඟ හවුල් වෙමින් ලංකා බැංකුව එම ගොවි මහතුන්ට කැකිරි වගාව ආරම්භ කිරීම සඳහා අරමුදල් සපයා දුන්නේය. එම ප්‍රදේශයේ ජනතාව මෙයට පෙර ධීවර කර්මාන්තයෙහි නියැළී සිටි නමුත් සුනාමි ව්‍යසනය සහ ඉන් පසුව ඇති වූ වෙනත් ස්වභාවික ආපදා හේතුවෙන් එම ජනතාවගේ ජීවනෝපායන් අවදානමට ලක් විය. මෙම පිපිඤ්ඤා ව්‍යාපෘතිය කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය කරන ප්‍රමුඛ පෙළේ අපනයන සමාගමක් සමඟ හවුල්කාරිත්වයෙන් යුතුව ආරම්භ කරන ලද අතර, එම සමාගම ගොවීන්ට එම වගාව සඳහා අවශ්‍ය බීජ, පොහොර සහ තාක්ෂණික දැනුම සපයා දෙමින් පැහැදිලි, නිෂ්පාදන ආපසු මිලදී ගැනීමේ වැඩපිළිවෙලක් ද සකස් කරන ලදී. ලංකා බැංකුව විසින් මෙම පහසුකම් සපයා දීමත් සමඟ මෙම ව්‍යාපෘතිය මේ වන විට ගොවීන් 150 ට වැඩි සංඛ්‍යාවක් දක්වා ව්‍යාප්ත වී ඇති අතර ඔවුන් අපනයනය සඳහා පිපිඤ්ඤා සපයා දෙමින් සාර්ථක ආදායම් උත්පාදන මාර්ගයක් සුරක්ෂිත කර ගෙන තිබේ. එමෙන්ම, මූල්‍ය සාක්ෂරතා පුහුණුව සපයා දෙමින් සහ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරමින් ලංකා බැංකුව මෙම පුද්ගලයින්ට සහාය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය ප්‍රජාවන්ට ක්‍රමයෙන් දිළිඳු භාවයෙන් මිදීමට ශක්තිය ලබා දෙන අතර ම, රටට විදේශ විනිමය ද උපයා දෙමින් සමාජ-ආර්ථික සවිබල ගැන්වීම වැඩි දියුණු කරන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට අතිශය සාර්ථක උදාහරණයක් වේ.

සිද්ධි අධ්‍යයනය

වේවැල් නිෂ්පාදන ව්‍යාපෘතිය

මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචි ඥාණවතී මහත්මිය ඉතා සාර්ථක වේවැල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නීය. ඥාණවතී මහත්මිය 2000 වර්ෂයේදී, අසල්වැසි කාන්තාවන් 12 දෙනෙකුට පුහුණුව ලබා දී, එම කාන්තාවන් සමඟ වේවැල් ආශ්‍රිත හාණ්ඩ ව්‍යාපාරය ආරම්භ කළාය. ලංකා බැංකුව ඒ මහත්මියගේ ව්‍යාපාරයේ මුල් අවධියේදී ඇයගේ ව්‍යාපාරය පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු. 100,000/- ක මුදලක් ලබා දීමට ඉදිරිපත් විය.

ඉන් අනතුරුව ඒ මහත්මිය ලංකා බැංකුවෙන් තවත් පහසුම් කිහිපයක් ලබා ගත් අතර, එමඟින් ඇයට ඇයගේ නිෂ්පාදන වර්ධනය කර ගැනීමට, වැඩි වැඩියෙන් රැකියා උත්පාදනය කිරීමට සහ ඇයගේ නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ත්‍රිරෝද රථයක් මිලදී ගැනීමට පවා හැකි විය. මෑතකදී එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 1.5 ක මුදලක් ලබා ගැනීමට ඥාණවතී මහත්මියට අවස්ථාව ලැබුණු අතර එමඟින් කාන්තාවන් 60 කට ආසන්න සංඛ්‍යාවකට රැකියා අවස්ථා සපයා දෙමින් ඇයගේ නිෂ්පාදන තව දුරටත් පුළුල් කර ගැනීමට ඇයට හැකි විය. වේවැල් හාණ්ඩ නිෂ්පාදනය කිරීම පිළිබඳ අන්තර්ජාතික පුහුණුවක් ලබා ඇති ඒ මහත්මිය මේ වන විට විවිධ වර්ගයේ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු හාණ්ඩ වර්ග රාශියක් නිෂ්පාදනය කරන්නීය. ඒ මහත්මිය ලංකා බැංකුවේ නිලධාරීන් සමඟ ඵලදායී ව්‍යාපාරික සම්බන්ධතාවයක් පවත්වා ගෙන යන අතර, පසු ගිය කාලය පුරා ඇයගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට හවුල් වීම පිළිබඳව ලංකා බැංකුවට ඇයගේ කෘතඥතාවය පළ කර සිටින්නීය. මෑත කාලයේදී සමාජ තිරසාරත්වය සම්බන්ධ ඉතා වැදගත් සාධකයක් වී ඇති කාන්තා ව්‍යවසායකත්වය සහ සවිබල ගැන්වීම වැඩි දියුණු කිරීම උදෙසා බැංකුවෙහි ඇති කැපවීම බැංකුව මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රදර්ශනය කර තිබේ.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා 2018 වර්ෂයේදී වෙන් කර දෙන ලද සම්පත්

සැපයුම්කරුවන් වෙත කරන ලද මුළු ගෙවීම් රු. බිලියන 6.7

ගනුදෙනුකාර සබඳතා නැංවීම උදෙසා ආයෝජනය: රු. මිලියන 325.5

ආයතනික සමාජ වගකීම්වල ආයෝජනය: රු. මිලියන 107.9

ප්‍රාග්ධන සම්බන්ධතා සහ ප්‍රශස්ත සමබරතාවයන්

ඩිජිටල් වේදිකා ව්‍යාප්ත කිරීම් වර්ධනය කිරීම ශක්තිමත් කිරීමේදී එයට අනුරූපව තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ සංවර්ධනය කෙරෙහි ආයෝජනය කිරීම අවශ්‍ය කරයි.

ප්‍රතිව්‍යුහගත කිරීම්/ ප්‍රතිකතිකා කිරීම් මඟින් ණය පහසුකම් අපි මූල්‍ය අවහිරතා ඇති කාල පරිච්ඡේද තුළදී අපගේ සේවාදායකයින්ට සහාය වන්නෙමු. ආපසු ගෙවීමේ ප්‍රමාදයන් තිබුණ ද, මේ මඟින් වඩා ශක්තිමත් පාරිභෝගික සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට හැකි වන අතර, වියදම් අධික නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය තුරන් කෙරෙයි.

බැංකුව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති පදනම් කර ගෙන ගනුදෙනුකරුවන් සමඟ සිය සම්බන්ධතා ගොඩනඟා ගෙන ඇත. අපගේ සියළුම ක්‍රමෝපායන් පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම අරමුණ කර ඇත.

- විශ්වාසය සහ ස්ථාවරත්වය
- නිෂ්පාදිත සහ සේවා
- ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්
- වගකීමෙන් යුතු බැංකුකරණය
- තිරසර පරිවයන් ව්‍යාප්ත කිරීම



විශ්වාසය සහ ස්ථාවරත්වය

රාජ්‍ය හිමිකාරිත්වය සහ දශක හතකට අධික කාලයක කීර්තිමත් කාර්යසාධනයක් සහිතව වෙළඳපොළ ප්‍රමුඛත්වය හිමි වී තිබීම නිසා බැංකුවට විශ්වාසය සහ ස්ථාවරත්වය මත ගොඩනැගුණු ශක්තිමත් සන්නාමයක් ගොඩ නඟා ගැනීමට හැකි වී තිබේ. මෙය බැංකුවට තරඟකාරී වාසිදායක තත්ත්වයක් ලැබීමට ප්‍රධානතම සාධකය වී ඇති අතර ඒ හේතුවෙන් බැංකුවට සාපේක්ෂ ලෙස අඩු පිරිවැයක් දරමින් ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට හැකි වී තිබේ. අපගේ අලුතින් ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීමේ සාමාන්‍යය, වර්ෂයකට ගනුදෙනුකරුවන් 600,000 ක් පමණ වේ.

නිෂ්පාදිත සහ සේවා

ලංකා බැංකුව සිය පාරිභෝගිකයින්ගේ විවිධ වූ අවශ්‍යතා ඉලක්ක කරමින් පුළුල් පරාසයක තැන්පතු, ආයෝජන සහ ණය නිෂ්පාදිත රාශියක් පිරිනමයි. අපගේ පුළුල්ව පැතිරුණු පාරිභෝගික සම්බන්ධතා තුළින් අප ලබා ගෙන ඇති පාරිභෝගික හැසිරීම පිළිබඳ ගැඹුරු අවබෝධය නිසා පාරිභෝගිකයින්ට ඔවුන්ගේ අභිමතාර්ථ ඉෂ්ඨ කර ගැනීමට උපකාරී වන නිෂ්පාදන, සේවා සහ විසඳුම් සැලසුම් කිරීමට අපිට හැකි වී තිබේ.

අරමුණ	පුද්ගලයින්	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය	ව්‍යාපාර ආයතන සහ මූල්‍ය ආයතන	රාජ්‍ය ආයතන
ආයෝජනය සහ අතිරික්ත අරමුදල් ඉතිරි කිරීම	කාලීන තැන්පතු, වෙනත් ආයෝජන නිෂ්පාදිත සහ ණයකර			
	ඉතිරි කිරීමේ ගිණුම්			
අරමුදල් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම	දෛනික ගනුදෙනු ගෙවීම් සඳහා ජංගම ගිණුම්			
		මුදල් කළමනාකරණ විසඳුම්		
ණය ලබා දීමේ විසඳුම්	පුද්ගල ණය			
	නිවාස ණය			
	අධ්‍යාපන ණය			
	අයිරා සහ කල්බදු පහසුකම්			
	ව්‍යාපෘති ණය ඇතුළු වාණිජ ණය			
			සමූහ අරමුදල් සැපයීම්	
	කාලීන ණය සහ වෙළඳ මූල්‍යනය			
ගෙවීම් විසඳුම්	හර/ ණය/ ට්‍රැවල් කාඩ් පත්			
	ජංගම බැංකුකරණ, අන්තර්ජාල බැංකුකරණ පහසුකම්			
අන්තර්ජාතික සේවා	ආමුඩ සහ ප්‍රතිමුඩ ප්‍රේෂණ			
	නියෝජිත බැංකුකරණය			

ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්

අපගේ වෙළඳපොළ පිළිගැනීම රඳවා තබා ගැනීම සහ ශක්තිමත් කිරීම පිණිස, බැංකුවෙහි ගනුදෙනුකරුවන් සම්බන්ධ සැලසුම් මඟින් ප්‍රවේශ හා අනිකුත් පහසුව සහ පුද්ගලකරණය පිළිබඳ ගනුදෙනුකරුවන් සතු ඉහළ අපේක්ෂාවන්ට ආමන්ත්‍රණය කළ යුතු බව අපි අවබෝධ කර ගෙන සිටින්නෙමු. පාරිභෝගික සම්බන්ධතා ස්ථාන 1,721 ක් සහිත ලංකා බැංකුවේ ශාඛා යටිතල ව්‍යුහය මෙම කර්මාන්තයේ වඩාත්ම පුළුල් ලෙස ව්‍යාප්ත වූ යටිතල ව්‍යුහය වේ. ඩිජිටල් ස්වයං සේවා මාර්ග පුළුල් කිරීම මෑත කාලයෙහි ප්‍රධානම ප්‍රමුඛතාවයක් වී ඇති අතර, 2018 වර්ෂයේදී බැංකුව ස්මාර්ට් කලාප ව්‍යාප්ත කරමින් වර්ෂය අවසානය වන විට ස්මාර්ට් කලාප සංඛ්‍යාව 284 දක්වා වැඩි කළේය. මෙම ස්මාර්ට් කලාප ගනුදෙනුකරුවන්ට ශාඛාවල පෝලිමෙහි නොසිට ක්ෂණිකව ගනුදෙනු පරාසයක් ඉටු කර ගැනීමට ඉඩ සලසන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර, මුදල් චක්‍රීකරණ යන්ත්‍ර සහ බිල් පත් ගෙවීම් කවුළු වලින් සමන්විත වේ. බහුමාර්ගික ප්‍රවේශවලට බැංකුවෙහි ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය අයත් වේ.

අපගේ ජාලය

	2018	2017
ශාඛා	577	578
සීමිත සේවා ශාඛා	52	48
ජංගම ශාඛා	6	2
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	776	764
මුදල් තැන්පතු යන්ත්‍ර	163	168
මුදල් චක්‍රීකරණ යන්ත්‍ර	118	-
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන	15	15
ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන	14	14

අපගේ ගනුදෙනුකරුවන් ඉතා සීඝ්‍රයෙන් ස්වයං සේවා මාර්ග අනුගත කර ගන්නා බව අපි නිරීක්ෂණය කර ඇත්තෙමු. 2018 වර්ෂයේදී බැංකුවෙහි සමස්ත ඩිජිටල් අනුගත කර ගැනීම බැංකුවෙහි අවසර ලබා දිය හැකි මුළු ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාවෙන් 65% ක් වූ අතර එයට පෙර වර්ෂයෙහි එය 60% ක් ව තිබුණි.

බැංකුවෙහි මුළු ගනුදෙනු වටිනාකමෙන් 13% ක් ඩිජිටල් ගනුදෙනු වේ. බිම් මට්ටමෙහි සිටින ප්‍රජාවන් අතර පවා වැඩි වැඩියෙන් තාක්ෂණය භාවිතා කිරීම ප්‍රවර්ධනය කරමින් ඩිජිටල් බැංකුකරණය රටෙහි දුර බැහැර ප්‍රදේශවලට පවා ගෙන යාම උදෙසා ස්මාර්ට් කලාප සංකල්පය දායක වී තිබේ. ලංකා බැංකුවේ ස්මාර්ට් කලාපවලින් 200 (70%) කට ආසන්න ප්‍රමාණයක් බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබේ.

එමෙන්ම, සියළුම ශාඛා මඟින් විශ්වාසනීය වූ සහ පුද්ගලීකරණය වූ අත්දැකීමක් සපයා දීම පිණිස සේවකයින් සවි බල ගැන්වීම හරහා සේවා විශිෂ්ඨතාවය ශක්තිමත් කිරීමට අපි කටයුතු කරමින් සිටින්නෙමු. ක්‍රියාවලි තුළ ඇති අවහිරතා හඳුනා ගැනීම පිණිස ශාඛාවලදී සෘජුවම කවුන්ටරය හරහා සිදු කෙරෙන ගනුදෙනු ඉටු කිරීම සඳහා ගත වන කාලය අධීක්ෂණය කරනු ලබන අතර, අඩු කාලයකින් ගනුදෙනු ඉටුකිරීම වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. මේ අතර, සියළුම ශාඛා එස් පහ ක්‍රමයට හැරවීම මඟින් සම්පත් අපතේ යාම අඩු කිරීමටත්, වැඩ අවකාශ වඩාත් සාර්ථකව කළමනාකරණය කර ගැනීමටත් හැකි වී තිබේ.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

සෘජුවම කවුන්ටරය හරහා සිදු කරන ගනුදෙනු සඳහා ගත වන කාලය



විද්‍යුත් වාර්තා වෙත මාරු වූ ගනුදෙනුකරුවන් ගණන 382,188

ස්මාර්ට් ජෙන් ගිණුම්වලට මාරු වූ ගනුදෙනුකරුවන් ගණන 309,624

ESMS නිර්ණායක සඳහා පරීක්ෂා කරන ලද ණය පහසුකම් 508

DMS හරහා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම

	ස්වයංක්‍රිය නොවන ක්‍රියාවලීන්	ස්වයංක්‍රිය ක්‍රියාවලීන්
ණය ගිණුම් සකස් කිරීම	මිනිත්තු 10	මිනිත්තු 1
ණය ඇගයීම සඳහා ප්‍රධාන බැංකුකරණ පද්ධතියෙන් දත්ත ලබා ගැනීම	මිනිත්තු 1	තත්පර 15
හර කාඩ්පත් නිකුත් කිරීම	මිනිත්තු 1	තත්පර 15
පංගම විමසිලිමත් වීමේ පණිවුඩ සේවාව සඳහා ලියාපදිංචිය	මිනිත්තු 1	තත්පර 15
ගිණුම් සඳහා සටහන් සකස් කිරීම	මිනිත්තු 1	තත්පර 15

වගකීමෙන් යුතු බැංකුකරණය

සාධාරණ බැංකු භාවිතයන් සඳහා පාරිභෝගික බැඳීම් සහ ප්‍රමිතීන් පැහැදිලිව නිර්වචනය කරන ශ්‍රී ලංකා මහා බැංකුවේ පාරිභෝගික ප්‍රඥාප්තිය බැංකුව විසින් අනුගමනය කරනු ලැබේ. පොළී අනුපාත, කල්පිරීමේ කාල පරිච්ඡේද, සහ අනෙකුත් කොන්දේසි සහ නියමයන් වැනි අදාළ තොරතුරු පාරිභෝගිකයන්ගේ කැමැත්ත පරිදි ඔවුන්ට හුරුපුරුදු භාෂාවකින් පැහැදිලිව සන්නිවේදනය කරනු ලැබේ. මෙම වර්ෂය තුළදී අලෙවිකරණය සහ නිෂ්පාදන ලේබල් කිරීම සම්බන්ධ රෙගුලාසි/ ස්වේච්ඡා කේත වලට අනුකූල නොවන අවස්ථා කිසිවක් වාර්තා වී නොමැත.

පාරිභෝගිකයින් පිළිබඳ රහස්‍ය දත්තවල සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා අපි අපගේ තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. තොරතුරු තාක්ෂණ අවදානම් සහගතභාවය නිරන්තරව ඇගයීම, ජාල වැඩි දියුණු කිරීම, තුන් වැනි පාර්ශ්ව විසින් සිදු කරනු ලබන තොරතුරු තාක්ෂණ විගණන, සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂක අංග පිළිබඳව අඛණ්ඩව සේවකයින් පුහුණු කිරීම දැනට ක්‍රියාත්මක පාලකවලට අයත් වේ. 2018 දී පාරිභෝගික දත්ත අහිමි වීම පිළිබඳ පැමිණිලි කිසිවක් නොමැත. තම ගනුදෙනු පිළිබඳව ක්ෂණිකව කෙටි පණිවුඩ ලබා ගැනීමේ සේවාව සඳහා ගනුදෙනුකරුවන් මිලියන 1.2 දෙනෙක් ලියාපදිංචි වී ඇති අතර, බැංකුව ද ආරක්ෂක අංගයක් ලෙස මෙම පහසුකම ගනුදෙනුකරුවන් අතර අඛණ්ඩව ප්‍රවර්ධනය කරමින් සිටියි.

තිරසර පරිවයන් ව්‍යාප්ත කිරීම

තිරසර පරිවයන් දිරිමත් කිරීම සඳහා සහ රටේ ආර්ථික සමෘද්ධිය ළඟා කරන ක්‍රියාකාරකම්වලට පහසුකම් සැලසීම සඳහා අපි අපගේ පාරිභෝගිකයින් සමඟ සමීප සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කරන්නෙමු. නව ව්‍යාපාර ආකෘති සහ තාක්ෂණය අනුගත කර ගැනීම මඟින් ගනුදෙනුකරුවන්ට ඇති වන සෘණාත්මක ආර්ථික, සමාජීය සහ පාරිසරික බලපෑම් අඩු කිරීම සඳහා බැංකුව විසින් ඔවුන්ට සහාය විය හැකි ආකාරය ක්‍රමානුකූලව හඳුනා ගැනීමට සහ එමඟින් තිරසර පරිවයන් ව්‍යාප්ත කිරීමට අපට ඉඩ සලසා දෙන ක්‍රියාවලි අපි හඳුන්වා දී ඇත. මෙම වර්ෂයේ අවධාරණය කළ යුතු කරුණු කිහිපයක් මෙහි ඉදිරිපත් කර ඇත.

මූල්‍ය අන්තර්කරණය සහ හැකියා සංවර්ධනය

රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත බැංකුවක් ලෙස රජයේ ජාතික ආර්ථික න්‍යාය පත්‍රයට හවුල් වීමේ වගකීම අප බැංකුව සතු වේ. මූල්‍ය සම්බන්ධතා තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබා දීම සඳහා රජයට අනුප්‍රාප්තිකයෙකු ලෙස ප්‍රමුඛකත්වය දී ඇති අතර එහි භූගෝලීය ප්‍රවේශය සහ ශක්තිමත් අරමුදල් පැතිකඩක් ලබා දී ඇති අතර, දිවයින පුරා දැරිය හැකි මූල්‍ය පහසුකම් සැලසීමේ දී ලංකා බැංකුව වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. පහත සාරාංශ කර ඇති පරිදි බැංකුව මූල්‍ය අන්තර්කරණය ශක්තිමත් කිරීම සඳහා බහුවිධ වේදිකා සහ නිෂ්පාදිත අනුගත කර ගෙන තිබේ.

ණය යෝජනා ක්‍රම ගණනාවකින් සමන්විත සහභාගීත්ව මූල්‍ය ආයතනය

ලංකා බැංකුව යනු ණය යෝජනා ක්‍රම 50 කට අධික සංඛ්‍යාවක සහභාගීත්ව මූල්‍ය ආයතනයකි. මීට පෙර බැංකුවකින් (SMELoC) ණය ලබා නොගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කාන්තා ප්‍රමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, කෘෂිකාර්මික, ධීවර හා කිරි අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සේවා සපයන යෝජනා ක්‍රම මෙයට ඇතුළත් ය.

සහභාගීත්ව අරමුදල් යෝජනා ක්‍රම හරහා ලබා දුන් ණය මුදල **රු. මිලියන 12,477.6**

මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව **32,460**

ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශවල පාරිභෝගික සම්බන්ධතා ස්ථාන

බැංකුවෙහි පුළුල්ව පැතිරුණු ශාඛා ජාල මඟින් බැංකුවට ණය දීමේ සහ තැන්පතු නිෂ්පාදිත හරහා වෙළඳපොළෙහි බැංකුකරණ සේවා වෙත ප්‍රවේශය නොමැති කණ්ඩායම් වෙත සහාය දීම සඳහා බැංකුවට සුවිශේෂී තත්ත්වයක් හිමි කර දී තිබේ. 'රෝද මත ශාඛාව' යන සංකල්පය මඟින් ග්‍රාමීය ප්‍රදේශවල ගනුදෙනුකරුවන්ට බැංකු ශාඛාවකට නොගොස් බැංකු ගනුදෙනු කටයුතු ඉටු කර ගැනීමට ඉඩ සලසා දෙන ජංගම බැංකුකරණ ඒකකයක් සපයා දී තිබේ.

ආන්තිකකරණය වූ ප්‍රජාවන් සඳහා සේවා සැපයීම පිණිස **ජංගම බැංකු රථ ඒකක 06 ක්**

ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශවල **ශාඛා 99 ක්**

ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශ වල **පාරිභෝගික සම්බන්ධතා ස්ථාන 112 ක්**

ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම්

ණය යෝජනා ක්‍රම හරහා මෙරට ක්ෂුද්‍ර කර්මාන්ත අංශයට අරමුදල් සපයා දීමේදී බැංකුව රාජ්‍ය ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන ගණනාවක් සමඟ හවුල් වී තිබේ. මිතුරු ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන බැංකුව විසින් ම ක්‍රියාත්මක කළ වැඩසටහනක් වන අතර එමඟින් අන්‍යෝන්‍ය වශයෙන් සහතික වූ ණය ලබා ගැනීම සඳහා මිතුරු කණ්ඩායම් සහ සමිති පිහිටුවා ගනු ලැබේ. මූලික වශයෙන් ම ව්‍යවසායකත්ව ව්‍යාපාර සඳහා අරමුදල් ලබා දෙනු ලබන අතර, එමඟින් විධිමත් අරමුදල් සපයා ගැනීමක් සඳහා අන්‍ය ප්‍රවේශයක් නොමැති ප්‍රජාවන් ඉලක්ක කර ඇත. එමෙන්ම බැංකුව 'මිතුරු පොළ' වෙළඳපොළ සංවිධානය කිරීම මඟින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳපොළ සම්බන්ධතා ගොඩ නඟා ගැනීමට පහසුකම් සැලසීම මඟින් මෙම ව්‍යවසායකයින්ට සහාය ලබා දෙයි.

මුළු ක්ෂුද්‍ර මූල්‍ය ආයෝජන කළඹ:
රු. බිලියන 8.7

මිතුරු යෝජනා ක්‍රමය හරහා
කණ්ඩායම් 18,459 ක් සහ සමිති 195 ක්
සඳහා රු. මිලියන 189.0 ක් ලබා දී ඇත

මූල්‍ය සාක්ෂරතාවය සහ හැකියා සංවර්ධනය

කර්මාන්තයෙහි ප්‍රමුඛයෙක් ලෙස සහ වගකීම් සහගත බැංකුකරණයක් සඳහා කැපවී සිටින ආයතනයක් ලෙස අප හට ප්‍රජාව තුළ මූල්‍ය විනය සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමේ දී වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට ඇති බව අපි විශ්වාස කරන්නෙමු. ලංකා බැංකුව මේ වන විට මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරමින් සිටින අතර, 2018 වර්ෂයේදී අත් කර ගෙන ඇති එම වැඩසටහන්වල ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:

- හපනා සම්මන්ත්‍රණ මාලාව යටතේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින සිසුන් 27,662 දෙනෙක් සඳහා සහ දෙමව්පියන් 20,830 දෙනෙක් සඳහා කොළඹින් බැහැර ප්‍රදේශවලදී සම්මන්ත්‍රණ 150 ක් පවත්වන ලදී (සිසුන් සඳහා සම්මන්ත්‍රණ 75 ක් සහ දෙමව්පියන් සඳහා සම්මන්ත්‍රණ 75 ක්).
- විදේශ රැකියා නියුක්තිකයන් (විශේෂයෙන්ම ගෘහ සේවිකාවන්) සඳහා විදේශ මුදල් ඒකක සහ ප්‍රේෂණ එවීම වැනි මාතෘකා පිළිබඳ වැඩමුළු 74 ක් පවත්වන ලදී. - ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,790
- දිවයින පුරා පවත්වන ලද නේවාසික වැඩසටහන් හරහා සිසුන් තුළ නායකත්ව හැකියා සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව නෙත් එෆ්.එම්. නාලිකාව සමඟ එක්ව පාසල් සිසුන් සඳහා 'You are a Leader' නමින් වැඩසටහන් හයක් පවත්වන ලදී.
- ජාලගත වීම සහ දැනුම බෙදා ගැනීම සඳහා පහසුකම් සලසමින් කුඩා හා මධ්‍ය පරිමාණ අංශය සඳහා 'ව්‍යාපාරික හමුව' සැසි තුනක් පවත්වන ලදී- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 600
- කුඩා හා මධ්‍ය පරිමාණ පාරිභෝගිකයින් සඳහා "BoC මිතුරු" මූල්‍ය සාක්ෂරතා අධ්‍යාපන වැඩසටහන් 20 ක් පැවැත්වීම - ප්‍රතිලාභීන් 1,452 ක්
- මෙරට කුඩා හා මධ්‍ය පරිමාණ නඟා සිටුවීම පිණිස ප්‍රාදේශීය වැඩසටහන් 10 ක් පැවැත්වීම - ප්‍රතිලාභීන් 409 ක්

අපගේ පාරිභෝගිකයින්ට සවන් දීම සහ ප්‍රතිචාර දැක්වීම

පාරිභෝගිකයින්ගේ අවබෝධයන් සහ පාරිභෝගික තෘප්තිමත් භාවයෙහි මට්ටම් හඳුනා ගැනීම පිණිස දිවයින පුරා සිටින පාරිභෝගිකයින් 10,000 ට වැඩි සංඛ්‍යාවක් ආවරණය කරමින් බැංකුවෙහි සමීක්ෂණ සඳහා ම වෙන්වූ සමීක්ෂණ ඒකකය විසින් මෙම වර්ෂයේදී විස්තීර්ණ පාරිභෝගික සමීක්ෂණයක් සිදු කරන ලදී. එමෙන්ම අපි බැංකුවෙහි අලෙවිකරණ සන්නිවේදනයන්හි ඵලදායීත්වය ඇගයීම පිණිස වූ සමීක්ෂණ සහ සාපේක්ෂ සේවා මට්ටම් පිළිබඳ තරඟකරු විශ්ලේෂණයක් ද සිදු කළෙමු. මෙම නියැළීම් තුළින් අනාවරණය කර ගත් කරුණු (පහත සාරාංශ කර ඇත) බැංකුවෙහි ආයතනික සැලසුම්කරණ වෑයම සඳහා වැදගත් යෙදවුමක් සපයා දී ඇත.



අපගේ ප්‍රතිචාරය

බැංකුවේ ස්වයං සේවා/ ඩිජිටල් විසඳුම් පිළිබඳ අවධානය යොමු කිරීම පිණිස සන්නිවේදන ක්‍රමෝපාය සංශෝධනය කිරීම. සෑම ශාඛාවකම වෙනම ම පිළිගැනීමේ නිලධාරියෙකු හඳුන්වා දීම අනාවරණය කර ගත් කරුණු ක්‍රමෝපායික තීරණ ගැනීමේදී සලකා බැලීම.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

පාරිභෝගික අගය නිර්මාණය කිරීම 2018

අවධානය යොමු කරන ක්ෂේත්‍ර	2018 වර්ෂයේ ප්‍රගතිය	
ව්‍යවසායකත්ව ව්‍යාපාර ආරම්භ කිරීමට/ පුළුල් කිරීමට ලබා දුන් අරමුදල් ප්‍රමාණය 2018	රු. බිලියන 3.2	
කාන්තා පාරිභෝගිකයින් සඳහා ම වෙන්වූ ඉතිරි කිරීම් නිෂ්පාදිත	කාන්තා රන් ගිණුම් (0.5% ක අමතර පොළියක් සමග)	
නිවාස මිලදී ගැනීමේදී / ඉදිකිරීමේදී ජනතාවට සහාය වීමට ලබා දුන් ණය	රු. බිලියන 66.8	
මෙරට කෘෂිකර්මාන්ත සහ ධීවර කර්මාන්ත අංශ සඳහා සහාය වීම	රු. බිලියන 68.0	
අප ගනුදෙනුකරුවන් වෙනුවෙන් තබා ගෙන සිටින තැන්පතු මඟින් ඉතිරි කිරීම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම	රු. බිලියන 1,627.0	

ව්‍යාපාර හවුල්කරුවන්

බැංකුව සිය ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ගොඩනගා ගෙන ඇති අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන දෙන සම්බන්ධතාවයන් අඟය කරන අතර, ආචාර ධර්ම චර්යාව, විනිවිද භාවයෙන් යුතු මෙහෙයුම් කාර්ය පටිපාටීන්, සහ සාධාරණ සහ කාලීන මිලකරණය හරහා පොදු වටිනාකම් නිර්මාණය කිරීමට ප්‍රයත්න දරයි. මෙම සම්බන්ධතා මනා ලෙස, අඛණ්ඩව මෙහෙයුම් පවත්වා ගෙන යාම සහතික කරන අතර ඒවා අපගේ සැපයුම් දාමයෙහි ඉතා වැදගත් කොටසක් වේ. ලංකා බැංකුවේ ව්‍යාපාර හවුල්කරුවන්ගේ පරිසර පද්ධතිය පහත සඳහන් ලෙස ප්‍රස්තාරිකව නිරූපණය කර ඇත:



ප්‍රසම්පාදන ප්‍රවේශය සහ පාලනය

බැංකුවෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලි ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මඟින් පාලනය වේ. සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අදාළ මාර්ගෝපදේශ අනුගමනය කරනු ලබන බව සහතික කිරීම සඳහා මධ්‍යම ප්‍රසම්පාදන කමිටුවක් (CPC) සහ විධායක ප්‍රසම්පාදන කමිටුවක් (EPC) ස්ථාපනය කර ඇත. (සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය පහත සඳහන් රූපසටහන මඟින් පැහැදිලි කර තිබේ).



සැපයුම්කරුවන් පරීක්ෂා කිරීම

මිල සහ නිෂ්පාදන ගුණාත්මක භාවය සලකා බැලීමට අමතරව, බැංකුවෙහි ඇගයීම් නිර්ණායකවලට සමාජීය සහ පාරිසරික සැලකිලිමත්වීම් ද අයත් වේ. අනෙකුත් කරුණු අතර පාරිසරික සහතිකකරණයන්ට සහ මධ්‍යම පරිසර අධිකාරියෙහි නියමයන්ට අනුකූලවීම, ළමා ශ්‍රමය සැපයීමේ අවදානම සහ බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම මේවාට අයත් වේ. මෙම වර්ෂය තුළදී ළමා ශ්‍රමය ලබා ගැනීම/ බලහත්කාරයෙන් හෝ අනිවාර්ය ශ්‍රමය ලබා ගැනීම සම්බන්ධ සැලකිය යුතු අවදානමක් සහිත කිසිදු සැපයුම්කරුවෙකු/ මෙහෙයුමක් හෝ අපි හඳුනා ගෙන නැත.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

නියෝජිත බැංකු

නියෝජිත බැංකු සම්බන්ධතා 758 කට අධික සංඛ්‍යාවක් සමඟ ලංකා බැංකුව සතුව විශාලතම නියෝජිත බැංකු ජාලය ඇත. මෙම සම්බන්ධතා හරහා බැංකුව විද්‍යුත් මුදල් මාරු කිරීම්, වෙළඳ ගනුදෙනු, සහ ස්වකීය සේවා දායකයින් වෙනුවෙන් තැන්පතු භාර ගැනීම ඇතුළු අන්තර්ජාතික ගනුදෙනු පරාසයක් සඳහා පහසුකම් සලසයි.

කර්මාන්ත සංසඳවලට සහභාගීවීම

මෙරට විශාලතම බැංකුව වන අප බැංකුවෙහි නියෝජිතයින් කර්මාන්ත සංගම් සහ සංසඳවලදී සක්‍රීය කාර්ය භාරයක් ඉටු කරමින්, හිතකර මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කිරීම සහ කර්මාන්තයේ අභියෝග විසඳීම සඳහා දායක වී ඇත.

- ☆ ආසියානු පැසිෆික් ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය (APRACA)
- ☆ බැංකුකරණ අංශයේ අවදානම් වෘත්තීයවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකාව
- ☆ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ☆ අන්තර්ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකාව
- ☆ ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකාව
- ☆ ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපයෙන්) සීමිත
- ☆ ශ්‍රී ලංකා නීති පුස්තකාලය
- ☆ ලංකා වාණිජ මණ්ඩලය
- ☆ බයෝ ඩයිවර්සිටි ශ්‍රී ලංකා
- ☆ ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇපයෙන්) සීමිත
- ☆ බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකාව
- ☆ ශ්‍රී ලංකා නීතිඥ සංගමය

ප්‍රජා නියැළීම්

කළමනාකරණ ප්‍රවේශය

2018 වර්ෂයේදී ශාඛා පුරා පැතිරුණු ආයතනික සමාජ වගකීම් ඇගයීමේ ආකෘතියක් ක්‍රියාත්මක කරමින් බැංකුව ආයතනික සමාජ වගකීම කෙරෙහි එහි ප්‍රවේශය වැඩිදියුණු කළ අතර එමඟින් පුළුල් ලෙස තිරසර සංවර්ධන ඉලක්කවලට සමගාමී වූ ව්‍යාපෘති හඳුන්වා දීම සඳහා පරිපාලන පළාත් දහයටම මග පෙන්වන ලදී. 2019 වර්ෂයෙන් ආරම්භ වී, බැංකුව සිය මෙහෙයුම් සිදු කරන ප්‍රජාවන් තුළ අර්ථාන්විත වෙනසක් ඇති කරන දීර්ඝ කාලීන, උපායමාර්ගික ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිවල නියැළෙනු ඇත. 2018 වර්ෂයේදී ආයතනික සමාජ වගකීම් කෙරෙහි බැංකුවෙහි ප්‍රවේශය පහත සඳහන් පරිදි වේ:



අධ්‍යාපනය

"You're a Leader" වැඩසටහන

මෙය අනාගත නායකයින් දිරිමත් කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරන, දැනට ක්‍රියාත්මකව පවතින වැසටහනක් වේ. ලංකා බැංකුව 'ඔබ නායකයෙක්' යන මාතෘකාව යටතේ පරිපූර්ණ නායකත්ව සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම සඳහා ඇසට් රේඩියෝ බ්‍රෝඩ්කාස්ටින්ග් (පුද්ගලික) සමාගම (නෙත් FM ගුවන් විදුලිය) සමඟ හවුල්කාරිත්වයක් ගොඩනගා ගත්තේය.

මෙම වර්ෂය තුළදී විවිධ පළාත්වල පිහිටි පාසල් හයක දී මෙම වැඩසටහන පවත්වන ලදී. සමස්ත වැඩසටහන වෙන් වෙන් වූ කොටස් හතරකින් සමන්විත වේ:

- තෝරාගත් පාසලේ ළමයින් 300 ක් පමණ දෙනා සඳහා එක් දින සාමාන්‍ය වැඩසටහන.
- එම පාසලේම තෝරා ගත් සිසුන් 100 ක් සඳහා දෙදින විශේෂ නේවාසික වැඩමුළු
- දෙමව්පියන් සඳහා වෙනම ම පුහුණු වැඩසන්
- තෝරා ගත් පාසලෙහි සියළුම ගුරුවරුන් සඳහා විශේෂ ගුරු පුහුණු වැඩසටහන

2018 වර්ෂයේ ප්‍රගතිය | **වැසටහන්** 6 | **ප්‍රතිලාභීන්** 8,421

2018 වර්ෂයේදී ප්‍රතිලාභ ලැබූ පාසල් - උඩවලව මහා විද්‍යාලය - උඩවලව, බස්තියන් සිල්වා මහා විද්‍යාලය - කැකිරාව, අකුරැස්ස මහා විද්‍යාලය - අකුරැස්ස, ශ්‍රී පාද විද්‍යාලය - හැටන්, බදුල්ල මධ්‍ය විද්‍යාලය - බදුල්ල සහ මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම.

නැණප්‍රය ශිෂ්‍යත්ව - 2017

මාසික පරිත්‍යාග මුදලක් ලබා දීම මඟින් ඉහළ දක්ෂතා දක්වන ශ්‍රී ලාංකික සිසුන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාම සඳහා සහාය දීම ලංකා බැංකුවේ නැණප්‍රය ශිෂ්‍යත්ව වැඩසටහනෙහි අරමුණ වේ. 2018 වර්ෂයේදී විද්‍යාව, ගණිතය, වාණිජ, කලා, ඉංජිනේරු තාක්ෂණ, පෙව තාක්ෂණ සහ පොදු යන විෂයයන් සඳහා 2016 සහ 2017 අ.පො.ස. උසස් පෙළ විභාග වලදී ඉහළම ලකුණු ලබා ගත්, 18+ ගිණුම් හිමි ශිෂ්‍යයින්ට එවැනි ශිෂ්‍යත්ව 562 ක් පිරිනමන ලදී. සමස්ත දිවයිනෙන් ඉහළම ශ්‍රේණි ලබා ගත් සිසුන් 150 දෙනෙකුට රු. 48,000/- ක් වටිනා කුසලතා ශිෂ්‍යත්ව පිරිනමන ලද අතර, දිස්ත්‍රික් ශ්‍රේණිය අනුව තෝරාගත් අනෙක් ශිෂ්‍යයින් 412 දෙනාට රු. 36,000 ක් වටිනා ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

2018 වර්ෂයේ ප්‍රගතිය | **ප්‍රතිලාභීන්** 562 | **ලබා දෙන ලද මුළු අරමුදල් ප්‍රමාණය:** රු. මිලියන 22.0

උසස් පෙළ විභාගය සමත් සිසුන්ට උසස් අධ්‍යාපන වියදම් ආවරණය කර ගැනීමට සහාය වෙමින් බැංකුව වසර හතරක කාලයක් දක්වා (කුසලතා ශිෂ්‍යත්ව) සහ වසර තුනක කාලයක් දක්වා (සාමාන්‍ය ශිෂ්‍යත්ව) ශිෂ්‍යත්ව ලබා දෙමින් මහපොළ යෝජනා ක්‍රමය හා සමානව පවත්වනු ලබන මෙම වැඩසහන 2003 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත. මේ වන විට බැංකුව රු. මිලියන 61.8 ක වියදම්න් එවැනි ශිෂ්‍යත්ව 1,894 ක් ලබා දී ඇත.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2018

2002 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහනක් ලෙස බැංකුව, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගත් ශිෂ්‍යයින් සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්ව 2,000 ක් පිරිනමයි. මේ සඳහා සුදුසුකම් ලබන සෑම ශිෂ්‍යයෙකුටම රු. 15,000 ක් වටිනා ශිෂ්‍යත්වයක්, පිළිගැනීමේ සහතිකයක්, රන් පදක්කමක් සහ වටිනා තෑගි පාර්සලයක් පිරිනමනු ලැබේ. මෙයට අමතරව, ජාතික මට්ටමෙන් ප්‍රථම ස්ථාන තුන ලබා ගන්නා සිසුන්ට විශේෂ මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ. තවද, ශිෂ්‍යත්ව විභාගය සමත් වන, සුදුසුකම් සහිත රන් කැකුළු ගිණුම් හිමි සියළුම ශිෂ්‍යයින්ට ද සහතිකයක් සමඟ වටිනා ප්‍රශංසනාත්මක තෑගි පාර්සලයක් පිරිනමනු ලැබේ. එමෙන්ම, බැංකුව වෙනස් හැකියා සහිත ශිෂ්‍යයින්ට සහාය දීම සඳහා ද වැඩසටහනක් ආරම්භ කළ අතර, ඒ හරහා ශිෂ්‍යයින් 25 දෙනෙකුට රු. 15,000 ක ශිෂ්‍යත්වයක් ද, ඔවුන් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින තුරු රු. 1,000 ක මාසික දීමනාවක් ද ඔවුන්ට ලබා දෙනු ලැබේ.

2018 වර්ෂයේ ප්‍රගතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2,000	ලබා දෙන ලද මුළු අරමුදල් ප්‍රමාණය: රු. මිලියන 30.0

ජාතික මට්ටමෙන් ප්‍රථම, දෙවැනි සහ තුන් වැනි ස්ථාන ලබා ගත් සිසුන්ට පිළිවෙලින් රු. 150,000, රු. 100,000 සහ රු. 75,000 බැගින් වූ මුදල් ත්‍යාග ලබා දීම මඟින් විශේෂ පිළිගැනීමක් ලබා දෙන ලදී. බැංකුව 2002 වර්ෂයේ සිට මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

පුංචි පිකාසෝ චිත්‍ර තරගය

ලංකා බැංකුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ හවුල් වී සාර්ථක දෙවැනි වසරටත් පුංචි පිකාසෝ චිත්‍ර තරගය සංවිධානය කළේය. මෙම චිත්‍ර ප්‍රදර්ශනය 2018 ඔක්තෝබර් 12 සහ 13 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. සිසුන් 300,000 ට අධික සංඛ්‍යාවක් මෙම තරගයට සහභාගී වූ අතර, පාසල් 64 ක් සඳහා සමස්ත ලෙස රු. මිලියන 1.3 ක මුදලක් පිරිනමන ලදී. ජයග්‍රාහී සිසුන්ට රු. මිලියන 6.5 ක් වටිනා තෑගි පිරිනමන ලදී.

2018 වර්ෂයේ ප්‍රගතිය	ප්‍රතිලාභ ලබා ගත් පාසල් සංඛ්‍යාව 64	තෑගි ලබා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව 780

පාසල් සිසුන්ගේ සෞන්දර්ය හැකියා සංවර්ධනය කිරීම සහ දක්ෂතා සහිත සිසුන්ට පිළිගැනීමක් දිනා ගැනීමට සහ ඔවුන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට අවස්ථාවක් සලසා දීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ.

ස්වභාවික ප්‍රාග්ධනය

ස්වභාවික ප්‍රාග්ධනය

පරිසරය කෙරේ අපගේ බලපෑම් රඳා පවතිනුයේ බලශක්තිය ලබා ගැනිම, ජල භාවිතය, සම්පත් භාවිතය, කැලිකසල බැහැර කිරීම්, අපිරිසිදු වායු විමෝචනය, සහ අපගේ ණය සහ අත්තිකාරම් ඔස්සේය. ණය සහ අත්තිකාරම් වගකීම් සහගතව ලබාදීම තුලින් තිරසාර ව්‍යාපාරික අවස්ථා ප්‍රචාරණය කිරීමේ හැකියාව පිලිබඳව අප වඩාත් විශ්වාසය තබා ඇත.

02
හරිත ගොඩනැගිලි ලෙස සහතිකලත් ශාඛා

5%
විදුලි පාරිභෝජනයේ පහළයාමක්

මිලියන 7 ක්
ඩිජිටල් බැංකුකරණය මඟින් ඉතිරි කරන ලද A4 කඩදාසි ගණන



මෙගා වොට් 1 ක්
සූර්ය බලශක්තිය මඟින් ජාතික විදුලිබල පද්ධතියට ලබාදුන් විදුලි ධාරිතාව

රු. බිලියන 6.3 ක
හරිත ණය දීම්

2018 වසරේ ප්‍රමුඛ උපායමාර්ග

සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වලට යොමුවීම තුළින් පොසිල ඉන්ධන භාවිතය අවම කිරීම

බැංකුවම ආවරණය වන පරිදි හරිතාගාර වායු විමෝචනය මිනුම් ගත කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම

පරිසර තිරසාරකත්වය පිළිබඳව සේවක ප්‍රජාවගේ මැදිහත්වීම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම

2018 මූලාරම්භයන්

- පරිසර හා සමාජ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය (ESMS) ක්‍රියාවට නැංවීම
- තිරසාරකත්වය සහ ආයතනික සමාජීය වගකීම පිලිබඳව සේවක ප්‍රජාව දැනුවත් කිරීම
- සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීම
- සියලු නව ශාඛා හරිත ගොඩනැගිලි ලෙස සහතික කරන ලද ගොඩනැගිලි ලෙස ඉදිකිරීම

2018 වසරේ කාර්යසාධනයන්

- මුළු හරිතාගාර වායු විමෝචනය කාබන්ඩයොක්සයිඩ් ටොන් 13,255.6
- නිපදවූ පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය කිලෝවොට් පැය: 885,238
- ඩිජිටල් බැංකුකරණය මඟින් ඉතිරිවූ A4 කඩදාසි ගණන මිලියන 7
- ත්‍රිකුණාමල ශාඛාව හරිත ප්ලැටිනම් සම්මානයෙන් පිදුම් ලැබීම
- පරිසර සාධක සඳහා ව්‍යාපෘති ණය ඉල්ලුම්පත් 508 ක් පරීක්ෂා කිරීම
- රු. බිලියන 6.3 ක හරිත ණය
- සේවක දිවුරුම් හඳුන්වාදීම

2019 වසර සඳහා ප්‍රමුඛතා

- තවදුරටත් හරිත ගොඩනැගිලි ව්‍යාප්ත කරමින් බලශක්තිය සහ ජල භාවිතය අවම කිරීම
- සූර්ය බලශක්තිය උත්පාදනය මඟින් ජාතික විදුලි පද්ධතිය සඳහා ලබාදෙන විදුලි ධාරිතාව මෙගා වොට් 2 දක්වා ඉහළ නැංවීම
- ණය හා අත්තිකාරම් වඩා වගකීම් සහගත ලෙස අනුමත කිරීම මඟින් පරිසර තිරසාරකත්වය සඳහා දායක වීම
- ආයතනික සමාජීය වගකීම් වර්ධනය කරමින් පරිසරය සුරැකීම කෙරේ අපගේ කැපවීම ඉහළ නැංවීම

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

ස්වභාවික ප්‍රාග්ධනය

කළමනාකරණ ප්‍රවේශය

එක්සත් ජාතීන්ගේ තිරසාරකත්ව අරමුණු හා අනුකූළ වෙමින් සකසා ඇති ලංකා බැංකුවේ තිරසාරකත්ව ප්‍රතිපත්තිය මඟින් ස්වභාවික පරිසරය සඳහා බැංකුව මඟින් වන බලපෑම් කළමනාකරණය කිරීමේ තම ප්‍රවේශය විස්තර කෙරේ (වැඩිදුර විස්තර සඳහා පිටු අංක 58 සිට 62 දක්වා බලන්න). අපගේ ප්‍රධාන මෙහෙයුම් කළමනාකරණය ඔස්සේ පරිසරයට අපගෙන් සිදුවන බලපෑම් අවම කිරීමත් වඩා වගකීම් සහිත ණය සහ අත්තිකාරම් අනුමත කිරීමේ ක්‍රියාවලියක් ඔස්සේ අපගේ ගනුදෙනුකරුවන් මඟින් පරිසරයට සිදු විය හැකි හානි හා වඩා වගකීම් සහගත සැපයුම්කරුවන් විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියක් ඔස්සේ ඔවුන්ගේ නිමැවුම් හා සේවා මඟින් පරිසරයට සිදු විය හැකි හානි අවම කිරීමත් යන අරමුණු මත මෙම කළමනාකරණ ප්‍රවේශය ස්ථාපනය කර ඇත. අපගේ මෙහෙයුම් ඔස්සේ පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා වන ක්‍රියාවලි සඳහා ඇතුලත් වනුයේ පුනර්ජනනීය බලශක්ති වලට වඩ වඩා යොමුවීම, ජලය සහ කඩදාසි භාවිතය අවම කිරීම සහ වඩා වගකීම් සහගත කැළිකසළ බැහැර කිරීමේ ක්‍රියාවලියකට යොමුවීම ආදිය වේ. හරිතාගාර වායු විමෝචනය කළමනාකරණ කිරීමේ තම උනන්දුව සනාථ කරමින් බැංකුව විසින් (ISO 14064-1) සහතිකයද ලබාගෙන ඇත. මෙම සහතිකය ලත් ප්‍රථම රාජ්‍ය බැංකුව වන්නේද ලංකා බැංකුව වේ. පාරිසරික නීති රෙගුලාසි වලට අවනතවීම උපකාරක සේවා අංශය මඟින් නිරන්තරයෙන් තක්සේරු කරන අතර පසුගිය වසර තුළ එම කරුණ හා අදාලව කිසිදු නීති රෙගුලාසි කඩ කිරීමක් වාර්තා වී නැත.

ලංකා බැංකුවේ හරිතාගාර වායු (කාණ්ඩ I හා කාණ්ඩ II) විමෝචන ප්‍රභවයන්හි සංයුතිය





ස්වභාවික ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා 2018 වසර තුළ යෙදවූ සම්පත

සූර්ය බලශක්තිය සඳහා ආයෝජනය රු. මිලියන 146

හරිත ගොඩනැගිලි සඳහා ආයෝජනය රු. බිලියන 1.5

තිරසාරකත්වය සඳහා වූ අංශයේ සම්පත් පුළුල් කිරීම

ප්‍රාග්ධන සම්බන්ධතා සහ ප්‍රශස්ත සමබරතාවයන්

පරිසර හා සමාජ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය (ESMS) පිළිබඳව වගකිවයුතු සේවකයින් පුහුණු කිරීම් ඔස්සේ මානව ප්‍රාග්ධනය වර්ධනය

සේවක දිවුරුමට එකඟ වීම මඟින් පරිසරය ආරක්ෂා කිරීමට බැඳීම

පරිසරය පිළිබඳව කැපවීමක් සහිත බැංකුවක් ලෙස පාර්ශ්වකරුවන් අතර පිළිගැනීම සහ සම්බන්ධතා ප්‍රාග්ධනය වර්ධනය

හරිත ගොඩනැගිලි සහ සූර්ය බලශක්තිය මත සිදුකරන ආයෝජන මූල්‍ය ප්‍රාග්ධනය සඳහා බලපෑමක් සිදු කිරීම

කාර්යක්ෂම බලශක්ති භාවිතය

ඉතා පුළුල් ශාඛා ජාලයක් හේතුවෙන් බැංකුවේ බලශක්ති භාවිතය සැලකිය යුතු මට්ටමක පවති. මිලදී ගන්නා විදුලිය සහ සූර්ය බලශක්තිය මඟින් නිපදවන විදුලිය අපගේ ප්‍රධාන බලශක්ති ප්‍රභව වේ. හැකිතාක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් නිෂ්පාදනය කරන විදුලි බලය කෙරේ යොමුවීම හා විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සඳහා සේවක ප්‍රජාව යොමු කිරීම පදනම් කර ගනිමින් බලශක්ති උපයෝගිතාව කළමනාකරණය සඳහා අපගේ ප්‍රවේශය නිර්මාණය වී ඇත. භාවිතයට නොගන්නා විටදී විදුලි පහන් සහ පරිගණක අක්‍රිය කිරීම ආදි වූ විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කරන්නා වූ ක්‍රියාවලි සඳහා සේවක ප්‍රජාව යොමු කිරීම සඳහා නිරන්තරයෙන් ඔවුන්ට දැනුවත් වීම් කරනු ලැබේ.

ප්‍රධාන ශාඛාව තුළ සෑම තට්ටුවකම සේවක ප්‍රජාව වෙතින් තෝරාගත් පිරිස් බලශක්ති කළමනාකරුවන් ලෙස නම්කර ඇති අතර අනවශ්‍ය ලෙස විදුලි පරිභෝජනය හා නාස්තිය අවම කිරීම ඔවුන්ට පැවරී ඇත. බැංකු ගොඩනැගිලි පුරා ප්‍රදර්ශණය කර ඇති පුවරු මඟින් විදුලිය හා ජලය අරපිරිමැස්මෙන් භාවිතා කරන ලෙස සේවක ප්‍රජාව දැනුවත් කරනු ලැබේ. බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ ඇති සාමාන්‍ය විදුලි බුබුළු චලනයන්ට සංවේදී ස්වයංක්‍රීය පරිපථ සහිත LED විදුලි බල්බ බවට පරිවර්තනය කරමින් තිබේ. මෙම ව්‍යාපෘතියේ මූලික අදියර ලෙස රැස්වීම් ශාලා සහ වැසිකිලි වල විදුලි බුබුළු පරිවර්තනය කිරීම සිදුවේ.

පසුගිය වසර තුළ බැංකුව හරිත ගොඩනැගිලි සහ සූර්ය බලශක්තිය නිපදවීම කෙරෙහි සිදුකරන ආයෝජන නොකඩවා සිදුකරගෙන යන ලදී. එමඟින් තම ක්‍රියාකාරකම් හරහා පරිසරයට සිදුවන බලපෑම් අවම කිරීම අපේක්ෂා කෙරේ.

සූර්ය බලශක්තිය

සූර්ය බලශක්ති ව්‍යාපෘතිය 2015 වසරේදි බැංකුව විසින් ආරම්භ කරන ලද අතර එතැන් සිට අද දක්වා එම ව්‍යාපෘතිය විශාල ප්‍රගතියක් ලබා ඇති අතර ක්‍රමිකව පොසිල ඉන්ධන මත අපගේ පැවැත්ම අවම කරමින් සිටී. මෙමඟින් පළමුවෙන්ම සූර්ය බලශක්තිය සඳහා යොමු වූ ශාඛා වනුයේ තිස්සමහාරාම ශාඛාව හා කිලිනොච්චි ශාඛාවයි. එතැන් සිට 2018 දෙසැම්බර් මස අවසානය වන විට ශාඛා 27 ක් සූර්ය බලශක්තියට පරිවර්තනය කර ඇත. වසර තුළ සූර්ය බලශක්තිය සඳහා සිදුකරන ලද ආයෝජනය රු. මිලියන 146 කි. මෙමඟින් වසර තුළදී ජාතික විදුලි පද්ධතියට ලබා දී ඇති විදුලි ධාරිතාව මෙගා වොට් 1 කි. එමඟින් ලංකා බැංකුවේ හරිත පියසටහන කාබන්ඩයොක්සයිඩ් ටොන් 756.8 කින් ($756.8tCO_2e$) අඩුවේ.

හරිත ගොඩනැගිලි

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය මඟින් බැංකුවේ ත්‍රිකුණාමල ශාඛාවට හරිත ප්ලැටිනම් සම්මානය 2018 වසරේදි පිරිනමන ලදී. අභ්‍යන්තර උෂ්ණත්වය නියාමනය කරන, වැසි ජලය මත යැපෙන තාප්ප මත ඉදිකර ඇති හරිත උද්‍යාන මෙම ශාඛා පරිශ්‍රයේ විශේෂ අංගයක් වේ. එමෙන්ම බැංකුවේ කැකිරාව ශාඛාව 2017 වසරේදි හරිත රන් සම්මානය හිමි කර ගන්නා ලදි. මෙම ශාඛාව ප්‍රතිසංස්කරණය සඳහා සම්පූර්ණයෙන්ම යොදා ගන්නා ලද්දේ පරිසර හිතකාමී අමුද්‍රව්‍ය වේ. මේ වන විට තවත් ශාඛා දෙකක් මෙම සංකල්පයට අනුව ඉදිකරමින් පවතී.

හරිත ගොඩනැගිලි සංකල්පය මත ඉදිවූ ශාඛා බොහොමයක් හරිත ඉදිකිරීම් භාවිතා කරමින් අභ්‍යන්තර උෂ්ණත්වය පාලනය කර ගනිමින් සිටී. බෙලිඅත්ත ශාඛාවේ සියලු අලෝකකරණ අවශ්‍යතාවන් සූර්ය ටියුබ් මඟින් ලබා ගන්නා අතර එම ශාඛාව කිසිවිටකත් කෘතිම ආලෝකය භාවිතා නොකරයි.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

ස්වභාවික ප්‍රාග්ධනය

ශ්‍රේණිගත කිරීම්

විවෘත හා ඒකමතික ක්‍රියාවලියක් මඟින් හරිත ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය නිර්මාණය කරන ලද අතර හරිත පරිසර ශ්‍රේණිගත කිරීම් සහ ජීව චක්‍ර කම්ටුව මඟින් එය අධීක්ෂණය කරනු ලබයි. මෙම කම්ටුව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ අංශයන් නියෝජනය කරන වෘත්තීයවේදීන් සහ ප්‍රවීණයන්ගේන් සමන්විත වන අතර එම කම්ටුව නිර්මිත පරිසරයන්හි පහත සාධක පිළිබඳ අවදානය යොමු කරනු ලැබේ.

- කළමනාකරණය
- අභ්‍යන්තර පරිසරයේ ගුණාත්මකභාවය
- තිරසාර වටපිටාවන්
- නවෝත්පාදන සහ නිර්මාණාත්මක ක්‍රමවේදයන්
- බලශක්තිය සහ වටපිටාව
- සමාජ සංස්කෘතිය පිළිබඳව අවබෝධය
- අමුද්‍රව්‍ය සහ සම්පත්

බැංකුවේ වාහන රැසකින් සමන්විත ප්‍රවාහන ජාලය උපරිම කාර්යක්ෂමතාවයකින් පාලනය කිරීම සහ කාලානුරූපීව වාහන මිලදී ගැනීම් සහ භාවිතයෙන් ඉවත් කිරීම හේතුවෙන් ඉන්ධන භාවිතය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට හැකිවී ඇත. ලිපිගොනු කළමනාකරණ පද්ධතිය, වීඩියෝ රැස්වීම පහසුකම් සහ විද්‍යුත් ඉගැන්වීම් (e-learning) පද්ධතිය හරහා සිදුකරන පුහුණුවීම් ආදිය හේතුවෙන් සේවක ප්‍රජාව මූලස්ථාන ගොඩනැගිල්ල සහ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය සඳහා පැමිණීමේ අවශ්‍යතා අවම වීම හේතුවෙන් ප්‍රවාහනය සඳහා වැයවන ඉන්ධන ඉතිරිවී ඇත.

වෙනත් පරිසර හිතකාමී ක්‍රියාදාමයන්

කඩදාසි භාවිතය අවම කිරීම

බැංකුවේ ඩිජිටල් දිශානතිය හේතුකොටගෙන ඩිජිටල් බැංකු සේවා ජාලයන් සඳහා ගනුදෙනුකරුවන් වඩ වඩා යොමු වීමත් අභ්‍යන්තර බැංකු කටයුතු රැසක් ඩිජිටල්කරණය වීමත් හේතුවෙන් සැලකිය යුතු කඩදාසි ඉතිරියක් සිදුවී ඇත.



මිලියන 7 ක
A4 කඩදාසි පත්‍ර ඉතිරියක්

අපද්‍රව්‍ය බැහැර කිරීම

බැංකුව ප්‍රධාන වශයෙන් බැහැර කරන අපද්‍රව්‍ය වන්නේ ඉවතලන කඩදාසි සහ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය වේ. කඩදාසි අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සඳහා අප නිරන්තරයෙන් බැංකුවේ කාර්ය මණ්ඩලය දැනුවත් කරනු ලබයි. එමෙන්ම ඉවතලන කඩදාසි එකතුකර ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණ නියෝජිතයන් හරහා ප්‍රතිචක්‍රීයකරණය කරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි නියෝජිතයන් හරහා ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරනු ලබයි. වසර තුළ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ඒකක 447 ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා ලියාපදිංචි නියෝජිතයන්ට භාරදී ඇත. එමෙන්ම ඉවතලන කඩදාසි කිලෝග්‍රෑම් 43,118 ක් ද ප්‍රතිචක්‍රීකරණය කර ඇත.

තිරසාර ණය ප්‍රදානයන්

අපගේ මෙහෙයුම් වපසරිය හා එහි විශාලත්වය සලකා බැලීමේදී අප පරිසරය කෙරේ වඩා වැඩි බලපෑමක් සිදුකරනු අපගේ ණය ප්‍රදානයන් ඔස්සේ සිදුකරනුයේ ව්‍යාපාර හරහා වේ. පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ණය ලබා දීම, පරිසර ඇගයීම සාධක අපගේ ණය ඇගයීම් ක්‍රියාපටිපාටිය සඳහා අන්තර්ග්‍රහණය කිරීම, අපගේ තිරසාර ණය පිරිනැමීමේ ක්‍රියාවලියේ මූලිකම සාධක වේ. පසුගිය වසර තුළ සූර්ය බලශක්ති උත්පාදනය, දිරාපත් වන අමුද්‍රව්‍ය යොදා ගනිමින් පරිසර හිතකාමී දවටන නිෂ්පාදනය සහ හරිත ගොඩනැගිලි ඉදිකිරීම ආදී ව්‍යාපෘති සඳහා මුදල් අමාත්‍යාංශය හා එක්ව බැංකුව විසින් ණය පහසුකම් සපයා ඇත. වසර තුළ ලබාදී ඇති හරිත ණය කළඹ රු. බිලියන 6.3 ක් ලෙස වාර්තා වී ඇත. වසර තුළ කැලි කසළ වලින් විදුලිය නිපදවන මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් සඳහා ද බැංකුව විසින් ණය ප්‍රදානය කර ඇත. එමෙන්ම විදුලිය අරපරිමැස්මෙන් භාවිතය, කැලි කසළ කළමනාකරණය සහ ප්‍රතිචක්‍රීකරණය ආදී වූ තිරසාර භාවිතාවන් කෙරේ අප අපගේ ගනුදෙනුකරුවන් නිරන්තරයෙන් උනන්දු කරමින් සිටී.

පරිසර ශක්‍යතා අධ්‍යයනය

ලංකා බැංකුවේ පරිසර හා සමාජ කළමනාකරණ ක්‍රමවේදය (ESMS) 2018 වසරේ සිට භාවිතයට පැමිණි අතර එතැන් පටන් ආසියානු සංවර්ධන අරමුදල් ප්‍රතිපාදන මඟින් ලබා දෙන සියලු සංවර්ධන ණය සඳහා ඉදිරිපත් වන ව්‍යාපෘති

යෝජනා මෙම පරිසර හා සමාජ කළමනාකරණ ක්‍රමවේදයේ පටිපාටින් අනුව අධ්‍යනය කෙරේ. කෙසේ වෙතත් කළමනාකරුවන් සහ ණය නිලධාරීන් සඳහා පරිසර හා සමාජ කළමනාකරණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වා ඇත. බැංකුව තම සියලු ව්‍යාපෘති ණය යෝජනා මෙහි පටිපාටින් හරහාද ඇගයීමට ලක්කිරීම ඉදිරියේදී සිදු කරනු ඇත.

සැපයුම්කරුවන් සඳහා පාරිසරික ඇගයීම්

බැංකුව සැපයුම්කරුවන් වෙත කොන්ත්‍රත් ලබා දීමේ සැපයුම්කරුවන් ජාතික පරිසර නීති සහ කම්කරු නීතිරීති සඳහා අනුගතව කටයුතු කරන බව ඇගයීමට ලක් කෙරේ. කම්කරු නීතිරීති සඳහා අනුගත බව ඇගයීමට ලක්කර බාහිරින් බඳවා ගන්නා කාර්ය මණ්ඩල වල සේවා ගිවිසුම් වල ද එය ඇතුළත් කෙරේ.

හරිත පරිසරයක් සඳහා වූ ආයතනික සමාජයීය වගකීම

කුඹුක් අරණ ව්‍යාපෘතිය

කුඹුක් අරණ ව්‍යාපෘතිය යනු සබරගමු පළාතේ පහත් බිම්වල නිරත්තරයෙන් සිදුවන ගංවතුර තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා සිදුකරන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ස්ථාන වල කුඹුක් ගස් 10,000 ක් සිටුවීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන රක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, පාසැල් සිසුන්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආදී විශාල පාර්ශ්වකරුවන් පිරිසක් සහභාගී වේ. මේ වන විට හඳුනාගත් ස්ථාන වල සිටුවීම සඳහා අවශ්‍ය කරන පැල 4,000 ක් වන රක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පැල තවාන්වල පැල කරමින් සිටී.

නිවුන් සහෝදර ගස

දරු උපතක් අනුස්මරණය කිරීම සඳහා පැලයක් සිටුවීමේ සංකල්පය මූලික කර ගනිමින් මහජනයා තුළ ගස් සිටුවීමේ සංකල්පය ව්‍යාප්ත කිරීම නිවුන් සහෝදර ගස් ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් හා එක්ව බැංකුව මේ වන විට වයඹ පළාතේ නව දෙමාපියන් අතර ගස් 6,240 බෙදා දී ඇත. කුරුණෑගල සහ පුත්තලම රෝහල් දෙකක් මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ වී ඇත.

හරිත දැල ව්‍යාපෘතිය

හඳුනාගත් ස්ථානවල පැල රෝපනය කිරීම මඟින් මුළු පළාතම හරිත දැලක් හරහා සම්බන්ධ කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර දකුණු පළාත තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පාසැල් සිසුන් සම්බන්ධ කරගනිමින් මේ වන විට ගස් 2,394 ක් පැල කර ඇති අතර පැල තවාන් හතරක් මේ වන විට ක්‍රියාත්මක වේ.

ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාවන්

ස්වභාවික ප්‍රාග්ධනය

පාරිසරික බලපෑම් වාර්තාව

	ඒකක	2018	2017	ගෝලීය වාර්තාකරණ මූලපිරීම් යොමුව
බලශක්තිය				**302**
බැංකුව තුළ බලශක්ති පරිභෝජනය				302-1
පුනර්ජනනීය නොවන ප්‍රභව				
විදුලි පරිභෝජනය	මෙගා වොට් පැය	21,135	22,325	
ඉන්ධන පරිභෝජනය	ලීටර	732,101	444,180	
පුනර්ජනනීය ප්‍රභව	මෙගා වොට් පැය	885	493	
මුළු බලශක්තිය				
ජලය				**303**
ස්ථානීය විස්තාපනය මඟින් ලබා ගන්නා ජලය		නැත	නැත	303-1
නගර සභා ජල සැපයුම මඟින් ලබා ගන්නා ජලය	කියුබික් මීටර	501,229	489,560	
රැස්කර පරිභෝජනය කරන වැසි ජලය		නැත	නැත	
භූගත ජලය		නැත	නැත	
මුළු ජලය	කියුබික් මීටර	501,229	489,560	
වායු විමෝචනය				**305**
සෘජුව සිදුවන හරිතාගාර වායු විමෝජචනය (හරිතාගාර වායු කාණ්ඩ I) - (ගෘස් ලිහිසි තෙල් දහනය)	කාබන්ඩයොක්සයිඩ් ටොන්	2,902	නැත	305-1
වක්‍රාකාරයෙන් සිදුවන හරිතාගාර වායු විමෝජචනය (හරිතාගාර වායු කාණ්ඩ II) - (විදුලිය)	කාබන්ඩයොක්සයිඩ් ටොන්	10,354	නැත	305-2
හරිතාගාර වායු විමෝචනය තිව්‍රතා අනුපාතය	සේවකයකු සඳහා කාබන්ඩයොක්සයිඩ් ටොන්	1.5	නැත	305-4
වලක්වාගත් හරිතාගාර වායු විමෝචනය (හරිතාගාර වායු අවම කිරීමේ සෘජු ප්‍රතිපලයක් ලෙස)	කාබන්ඩයොක්සයිඩ් ටොන්	757	422	305-5
ඉවතලන ආකාරය අනුව කසළ වර්ගීකරණය				**306-2**
ප්‍රතිචක්‍රීකරණය				
කඩදාසි	කිලෝග්‍රෑම්	43,118	-	
ඉලෙක්ට්‍රෝනික උපාංග	ඒකක	447	-	

අවධානයට ලක්කරන කරුණු	2018 වසර ප්‍රගතිය
පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය සඳහා ණය ප්‍රදානය සූර්ය බලශක්ති සඳහා යොමු වූ ශාඛා ගණන	රු. බිලියන 3.6 ශාඛා 27
ජල සහ වාරිමාර්ග ව්‍යාපෘති සඳහා වසර තුළ ණය ප්‍රදානයන්	රු. බිලියන 4.7
බැංකුවේ බලශක්ති හා ජල පියසටහන් අවම කිරීම සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි	බලශක්ති භාවිතය 5% කින් පහළ යාම කිලෝග්‍රෑම් 43,118
පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් සඳහා ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් යොමු කිරීමේ ක්‍රියාවලිය	පරිසර හා සමාජ කළමනාකරණ ක්‍රමවේදය හරහා ණය ඉල්ලුම්පත් 508 ක් පරීක්ෂා කර ඇත.

මූලය වාර්තා

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව
අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව • **179**
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම • **185**
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව • **188**
ස්වාධීන සහතිකවීමේ වාර්තාව • **190**
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම • **191**
විගණකාධිපතිතුමාගේ වාර්තාව • **192**
ලාභ හෝ අලාභ ප්‍රකාශනය • **196**
විස්තීරණ ආදායම් ප්‍රකාශනය • **197**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය • **198**
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය • **200**
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය • **204**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් • **206**

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලදී. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ එය ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් නියාමනයන් සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 19 දින සමාලෝචනය කර අනුමත කරන ලදී.

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද ලංකා බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන අතර, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින සංස්ථාපනය කරන ලදී. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සමඟ ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් අදාළ මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 206 සහ 207 හි ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස්වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සමාලෝචිත වසර තුළදී සැලකිය යුතු තරමේ වෙනසකට භාජන වී නැත.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ දී සමූහයේ සංයුතියේ සිදු වූ වෙනස්කම් වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 30 සහ 31, යටතේ පිටු අංක 287 සිට 294 දක්වා ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත පරිචය

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ප්‍රකාශන සඳහා මෙම වාර්ෂික වාර්තාවෙහි මුල් කවරයෙහි ඇතුළත දක්වා ඇත. බැංකුව උසස්ම ආචාර ධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර, එමඟින් දැක්ම හා මෙහෙවර යටතේ ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් අංක 10 සිට 13 දක්වා වූ පිටුවල අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් අංක 14 සිට 27 දක්වා වූ පිටුවල මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයන්හි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳ විග්‍රහයන් "මූල්‍ය ප්‍රාග්ධනය" තුළ පිටු අංක 137 සිට 141 තෙක් දක්වා ඇත. මෙම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ශාඛා ව්‍යාප්තිය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුව නව දේශීය ශාඛාවක් සහ නව බී ඕ සී ඩිජි ශාඛාවක් විවෘත කරමින් තම සේවා තව දුරටත් ව්‍යාප්ත කර ඇත. පාරිභෝගිකයින්ට වඩාත් පහසු සේවාවක් ලබාදීමේ අදහසින් ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. වර්ෂය තුළ දී බැංකුව විසින් නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 12 ක් ස්ථාපිත කළ අතර, මුදල් තැන්පතු යන්ත්‍ර 9 ක් , මුදල් චක්‍රිකරණ යන්ත්‍ර 104 ක් සහ පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන 150 ක්ද ස්ථාපිත කර ඇති අතර, මේ අනුව වර්ෂය අවසානයේ දී මුළු සේවා මධ්‍යස්ථාන පිළිවෙලින් 776, 163, 118 සහ 1,373 ක් වේ. මෙම සංඛ්‍යාව අනෙකුත් බැංකු ආයතන සතු, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි ස්වයංක්‍රීය ටෙලර් පහසුකම්වලට අතිරේක වශයෙනි.

2.7 ආයතනික පරිත්‍යාග

බැංකුව විසින් 2018 වර්ෂය තුළ පරිත්‍යාග සිදු කර නොමැත. නමුත් තිරසාර පැවැත්ම සහ වගකීම් කටයුතු සඳහා රු. මිලියන 107.9 ක දායකත්වයක් බැංකුව විසින් වාර්තා කරන වර්ෂය තුළ දක්වා ඇත.

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එහි සංශෝධනවලට, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 191 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත්කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 192 සිට 195 තෙක් දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං. ගි. ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං. මූ. වා. ප්‍ර.) අනුව පිළියෙල කරයි.

මූල්‍ය වාර්තා සැකසීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 206 සිට 392 තෙක් දක්වා ඇත. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුව පිළියෙළ කර ඇත. පරිවර්තනය නිසා බැංකුව ඇතිවූ ශුද්ධ බලපෑම රු. මිලියන 7,393.5 (සමූහය රු. මිලියන 8,174.0) වූ අතර මේ පිලිබඳ වැඩිපුර විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 370 සිට 375 හි දක්වා ඇත.

3. සැලසුම් ගත සංවර්ධන කටයුතු

සැලසුම් ගත සංවර්ධන කටයුතු පිළිබඳව බැංකුවේ දර්ශනය හා සැලසුම් මෙම වාර්තාවේ පිටු අංක 10 සිට 13 දක්වා වූ සභාපතිතුමාගේ පණිවිඩයෙහි සහ පිටු අංක 14 සිට 17 දක්වා මහා කළමනාකරුගේ සමාලෝචනයන්හි ඇතුළත් වේ.

4. මුළු ආදායම

පෙර වර්ෂයේ සමූහයේ මුළු ආදායම වූ රු. මිලියන 197,013.0 ට සංසන්දනාත්මකව බැලීමේදී 2018 වර්ෂය සඳහා රු. මිලියන 229,461.6 ක් වශයෙන් මුළු ආදායම වාර්තා විය. බැංකුවේ මුළු ආදායම වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායමෙන් 96.4% ක් (2017 - 96.0%) විය. සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායම වන අතර, එය මුළු ආදායමෙන් 87.9% ක් නියෝජනය කරයි.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

සමාලෝචිත 2018 වර්ෂය තුළ දී බැංකුව රු. මිලියන 31,892.2 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සංසන්දනාත්මකව පෙර වර්ෂයේ රු. මිලියන 30,343.0 ට වඩා 5.1% ක වැඩි වීමක් නිරූපණය කරයි.

රු. මිලියන 12,413.4 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2017 දී රු. මිලියන 9,030.7) 2018 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 19,478.7 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2017 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 21,312.3 ට වඩා 8.6% ක අඩු වීමක් වේ.

මෙම අඩු වීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන වලින් උපයා ඇති පොළී ආදායම 2018 අප්‍රේල් 1 දින එම බලපැවැත්වෙන පරිදි සාමාන්‍ය බදු අනුපාතයට යටත් වීමයි. මේ නිසා බදු පසු ලාභයට වූ සමස්ත බලපෑම රු. මිලියන 1,479 කි.

බැංකුවේ සහ සමූහයේ ලාභය හා සම්බන්ධව දත්තයන් පහත වගුවේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. මිලියන	රු. මිලියන	**රු. මිලියන**	රු. මිලියන
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ක්‍රමක්ෂය, ණය හා අත්තිකාරම් සඳහා හානිකරණයන් හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් බදු පෙර වර්ෂයේ ලාභය	41,480	37,592	42,246	38,195
මූල්‍ය සේවා මත බදු	(9,588)	(7,249)	(9,818)	(7,431)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(අලාභ) කොටස, බදු පසු	-	-	9	52
ආදායම් බදු පෙර ලාභය	31,892	30,343	32,437	30,816
ආදායම් බදු වියදම	(12,413)	(9,031)	(12,922)	(9,329)
වර්ෂය සඳහා ලාභය	19,479	21,312	19,515	21,487
වර්ෂයට අදාළ වෙනත් විස්තීරණ ආදායම, බදු පසු	(1,952)	4,340	(1,669)	4,833
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**17,527**	**25,652**	**17,846**	**26,320**
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(2,463)	(2,431)	(2,463)	(2,431)
ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම - වෙනත්	-	-	-	(22)
ලාභාංශ	(4,846)	(12,346)	(4,846)	(12,346)

සමූහයේ බදු පෙර ලාභය සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 30,815.6 සිට රු. මිලියන 32,437.2 දක්වා ඉහළ යමින් පෙර වර්ෂයට සාපේක්ෂව 5.3% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. රු. මිලියන 12,922.0 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2017 දී රු. මිලියන 9,328.9) 2017 වර්ෂය සඳහා සමූහයේ බදු පසු ලාභය රු. මිලියන 19,515.2 ක් වන අතර, 2017 වර්ෂය සඳහා වාර්තා කළ රු. මිලියන 21,486.6 ට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරයි.

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂය සඳහා බැංකුව විසින් රු. මිලියන 4,846.4 ක මුදලක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත (2017 - රු. මිලියන 12,346.4).

5.3 සංචිත

2018 දෙසැම්බර් 31 දිනට සමූහය සතු මුළු සංචිත වටිනාකම රු. මිලියන 106,445.5 (2017 - රු. මිලියන 101,399.1) වශයෙන් වාර්තා විය. සමූහයේ සංචිත පහත අයිතම වලින් සමන්විත වේ:

දෙසැම්බර් 31 දිනට	2018 රු. මිලියන	2017 රු. මිලියන
ස්ථාවර සංචිත අරමුදල	12,890	10,427
ප්‍රත්‍යාගණන සංචිතය	18,747	18,681
නිදහස් සංචිතය	367	367
විනිමය පරිවර්තන සංචිතය	3,157	1,703
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය	-	4,761
වෙනත් විස්තීරණ ආදායම් සංචිතය	2,474	-
ව්‍යවස්ථාපිත සංචිතය	359	359
රඳවාගත් ඉපැයුම්	68,452	65,101
එකතුව	106,446	101,399

6. දේපල, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දී දේපල, පිරියත හා උපකරණ, කල්බදු වත්කම් හා අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. මිලියන 4,360.3 ක් (2017 දී රු. මිලියන 3,963.8) වූ අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 297 සිට 315 දක්වා ඇති සටහන් අංක 33 සිට 35 දක්වා නිරූපණය කරයි.

7. නිදහස් දේපලවල අගය

2018 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපලවල අගය රු. මිලියන 21,655.1 ක් වශයෙන් (2017 දී රු. මිලියන 21,470.2) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 33 හි දක්වා ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2018 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ සහ සම්පූර්ණයෙන්ම ගෙවා නිමි ප්‍රාග්ධනය රු. මිලියන 20,000 කි. (2017: රු. මිලියන 15,000 කි.)

2018 රාජ්‍ය අයවැය යටතේ බැංකුව වෙත වෙන් කළ රු. මිලියන 10,000 න් දෙවන අදියර වශයෙන් රු. මිලියන 5,000 ක් 2018 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන ලදී. මෙම මුදල 2018 දෙසැම්බර් 31 දිනට විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යන ශීර්ෂයේ දක්වා ඇත. මේ හේතුවෙන් ශ්‍රී ලංකා රජය වෙත රුපියල් 1,000 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන පහක් නිකුත් කිරීමට බැංකුව විසින් කටයුතු කරගෙන යන අතර, 2019 වර්ෂයේ දී විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යටතේ දක්වා ඇති මෙම මුදල කොටස් ප්‍රාග්ධනය වෙත මාරු කරනු ඇත.

8.2 කොටස් හිමිකම

ලංකා බැංකුවේ එකම කොටස්හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර නිකුතුව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමූහය විසින් නිකුත් කළ යටත් කාලීන ලැයිස්තු ගත ණයකරවල අගය රු. මිලියන 12,000 ක් (2017 දී රු. මිලියන 10,000) විය. බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ණය සහ අත්තිකාරම් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා මෙම ණයකර නිකුතුව මඟින් ජනනය වූ අරමුදල් භාවිතා කරන ලදී. මෙම ණයකර නිකුතුව මඟින් බැංකුව විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි:

- දෙවන පෙළ ප්‍රාග්ධනය වැඩි කිරීම මඟින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා තනි පුද්ගල ණය සීමාව වැඩි කිරීම හරහා මුළු ණය සහ අත්තිකාරම් පුළුල් කර ගැනීම.
- බැංකුවේ වත්කම් හා වගකීම් පරතරයේ නිරාවරණය වීම් අඩු කිරීම සහ කළමනාකරණය කිරීම.
- බැංකුවේ ද්‍රවශීලතාව වැඩි කිරීම හා වත්කම් පදනම වැඩි කිරීම.

මෙම ණයකර සම්බන්ධ විස්තර, සටහන් අංක 48 යටතේ පිටු අංක 335 සිට 337 තෙක් දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළ දී සමූහයේ කොටසක ඉපැයුම හා කොටසක් සඳහා වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 1,047.68 ක් සහ රු. 6,574.13 ක් විය.

11. ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳව විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 58 සිට 62 දක්වා වූ පිටුවල "ලංකා බැංකුව තුල තිරසාරභාවය " යන අංශය යටතේ දක්වා ඇත.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2018 වර්ෂය තුල කටයුතු කල අධ්‍යක්ෂවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනය වන විට කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පහත වගුවේ දක්වා ඇත.

රජයේ සිදුවූ වෙනස්කම් නිසා වර්ෂ අවසාන දිනය වන 2018 දෙසැම්බර් 31 දින වන විට බැංකුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොසිටියේය (ප්‍රධාන කොටස් කරුවා ලෙස රජය බැංකුව අධීක්ෂණය කරන අමාත්‍ය මඟින් අධ්‍යක්ෂවරු පත් කරයි). 2019 පෙබරවාරි අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කළ අතර වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනය වනවිට හතර දෙනෙක්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් කටයුතු කරයි.

2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

12.1 අධ්‍යක්ෂක ලැයිස්තුව

ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා

ස්වාධීන විධායක නොවන
අධ්‍යක්ෂ/සභාපති
(2018 නොවැම්බර් 18 දින ධුරයෙන් ඉල්ලා අස් වූ අතර 2019 පෙබරවාරි 12 දින නැවත පත්කළ අතර 2019 පෙබරවාරි 14 දින වැඩ භාර ගන්නා ලදී.)

සජිත් ආර් ආටිගල මහතා
ස්වාධීන නොවන විධායක නොවන නිලබලයෙන් පත්වූ (2018 නොවැම්බර් 25 දින සිට ධුරයේ කටයුතු අවසන් කරන ලදී)

රනෙල් ටී විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන (2018 ජූලි 31 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

එච් පී අජිත් ගුණවර්ධන මහතා
ස්වාධීන විධායක නොවන (2018 ජූලි 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

සමන්ත රාජපක්ෂ මහතා
ස්වාධීන විධායක නොවන
(2018 නොවැම්බර් 25 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

මොහාන් විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන
(2018 ජූලි 2 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

නිල් ඒ උමගිලිය මහතා
ස්වාධීන විධායක නොවන
අධ්‍යක්ෂ/සභාපති
(2018 නොවැම්බර් 19 දින පත් වූ අතර 2018 දෙසැම්බර් 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

එම් ටී අයි වී අමරසේකර මිය
විධායක නොවන නිලබලයෙන් පත්වූ
(2018 නොවැම්බර් 26 දින පත් වූ අතර 2019 පෙබරවාරි 27 දින සිට ධුරයේ කටයුතු අවසන් කරන ලදී)

පී ලලිත් පී විතාන මහතා
ස්වාධීන විධායක නොවන
(2018 නොවැම්බර් 26 දින පත් වූ අතර 2018 දෙසැම්බර් 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

එච් අයි බාලපටබැදි මහතා
ස්වාධීන විධායක නොවන
(2018 නොවැම්බර් 26 දින පත් වූ අතර 2018 දෙසැම්බර් 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

ඒ වී කේ එම් හේරත් මිය
ස්වාධීන විධායක නොවන
(2018 නොවැම්බර් 26 දින පත් වූ අතර 2018 දෙසැම්බර් 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

පී එච් විජේවර්ධන මහතා
ස්වාධීන විධායක නොවන
(2018 නොවැම්බර් 26 දින පත් වූ අතර 2018 දෙසැම්බර් 20 දින සිට ධුරයෙන් ඉල්ලා අස් විය)

මූල්‍ය වර්ෂය අත්සන් කරන දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	විධායක/විධායක නොවන	ස්වාධීනත්වයේ තත්ත්වය
රොනල්ඩ් සී පෙරේරා මහතා	විධායක නොවන	ස්වාධීන
විමලෙන්තිරාජා මහතා	විධායක නොවන නිලබලයෙන් පත්වූ	ස්වාධීන නොවන
ඩී ඩබ්ලිව් කේ මායාදුන්නේ මහතා	විධායක නොවන	ස්වාධීන
ප්‍රකාශ් ආනන්ද් ෂාෆ්ටර් මහතා	විධායක නොවන	ස්වාධීන

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් අනුව අධ්‍යක්ෂවරු, ස්වාධීන/ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටු

ඉහත දැක්වූ 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම්වලට අනුකූල වීම සඳහා සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උප කමිටු පහක් පිහිටුවා ඇත. 2018 වර්ෂය තුල කටයුතු කල අධ්‍යක්ෂවරුන්ගේ සහ මෙම වාර්ෂික වාර්තාව අත්සන් කරන දිනය වන විට කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පහත වගුවේ දක්වා ඇත. උපකමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 89 සිට 101 දක්වා සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 86 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමඟ ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳව දත්තයන් අංක 185 සිට 187 දක්වා වූ පිටුවල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කර ඇත. දී ඇති ගිවිසුම්වලට අමතරව කිසිම අධ්‍යක්ෂවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමඟ ඇතිකරගෙන නොමැති අතර, අනාගතයේ දී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත් කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛනගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද, 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී ඊ ඩී 3/2015 සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 236 හි සටහන 16 යටතේ දක්වා ඇත.

13. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 102 සිට 118 දක්වා ඇතුළත් කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ. විගණන කමිටුව විසින් හාරකාර වගකීම් නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලබයි. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 89 සිට 92 දක්වා ඇතුළත් කර ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාව නිකුත් කළ දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම්වල විධිවිධාන අංක 3 (8) (ii) (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 188 සහ 189 දක්වා ඇතුළත් කර ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශ්වයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත සහතිකවීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 190 හි දක්වා ඇත.

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යෑමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මඟපෙන්වීම් සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 71 සිට 88 දක්වා ඇති ආයතනික යහපාලන පරිචයේ සවිස්තරාත්මකව සඳහන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත්

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයින් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත්වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේ දී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා ඉතා වටිනා මෙම මානව ප්‍රාග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "අපගේ වටිනාම වත්කම මඟින් උපරිම දායකත්වයක්" යටතේ විස්තර කර ඇත. පිටු අංක 147 සිට 155 දක්වා ඇතුළත් කර ඇත.

16. නීති රීති සඳහා වූ අනුකූලතාවය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි බැංකුව නීති රීතිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නියුක්තවී නොමැති බව ප්‍රකාශ කරයි.

මෙම වාර්තාවේ සංකලිත කොටසක් වන "අනුකූලවීමේ ඇමුණුම්" යටතේ පිටු අංක 394 සිට 447 දක්වා නීති හා රෙගුලාසි සමඟ බැංකුවේ අනුකූලතාවය පිළිබඳ විස්තර ඇතුළත් වේ. තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 104 වන පරිච්ඡේදය මඟින් නිරූපනය කරනු ලැබූ පැවරුම් මිල සම්බන්ධ නීති රීති සංග්‍රහයට අනුකූලව බැංකුව කටයුතු කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය සහතික කරනු ලබයි. මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල සහතිකය පිටු අංක 448 යටතේ දක්වා ඇත.

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

17. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින් වෙනුවෙන් රජයට ගෙවිය යුතු ගෙවීම් නියමිත කාලයේ දී සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිඵල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නියුක්ත වී නැත. තවද, පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 171 සිට 176 දක්වා "ස්වාභාවික ප්‍රාග්ධනය" යන මාතෘකාව යටතේ දක්වා ඇත.

20. ශේෂ පත්‍රයෙන් පසු සිදුවූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ප්‍රමාණාත්මක ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළදී සිදුවී නැති බවයි.

21. අඛණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණයේ සම්පත්, බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්,
ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2019 මාර්තු 19 දින
කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 59 හි පිටු අංක 351 සිට 357 තෙක් දක්වා ඇත.

අතිරේක වශයෙන් ව්‍යාපාරමය සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂධූර දරන අනෙකුත් ආයතනයන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් පහත දැක්වේ.

වර්ෂය අවසාන වන 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයක් නොවීය. කෙසේ වෙතත් 2019 පෙබරවාරි මාසයේදී නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වූ අතර වඩා යහපත් හෙළිදරව් කිරීමක් උදෙසා ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පහත පරිදි හෙළිදරව් කර ඇත.

- 2018 වර්ෂය තුල සිටි අධ්‍යක්ෂවරුන් සඳහා, 2018 වර්ෂ අවසාන දිනයට/ ඉවත් වූ දිනයට ගිවිසුම් හා සම්බන්ධ ඇල්ම දක්වා ඇත.
- වර්තමානයේ සිටින අධ්‍යක්ෂවරුන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන දිනට ගිවිසුම් හා සම්බන්ධ ඇල්ම දක්වා ඇත.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම '000**	2017.12.31 දිනට ශේෂය/ගෙවිය යුතු වටිනාකම '000
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම - වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය					
ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා මහතා					
(ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා මහතා 2018 වර්ෂය තුළ දී ඉල්ලා අස් වූ අතර 2019 පෙබරවාරි 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා බැංකුවේ සභාපතිවරයා ලෙස නැවත පත් විය.)					
** (2018 දෙසැම්බර් 31 දිනට පවතින නිරාවරණයන්)					
ලංකා බැංකුව (යු.කේ.) සමාගම	සභාපති	ජංගම ගිණුම්		ඇ.ඩො. 602	ඇ.ඩො. 4,881
		(නොස්ට්‍රෝ ගිණුම්)		*110,015	*746,084
				ම.බ්‍රි.ප. 66	ම.බ්‍රි.ප. 232
				*15,303	*47,684
				යුරෝ 687	යුරෝ 1,017
				*143,578	*185,588
		බැංකුවල ඇති තැන්පතු		ඇ.ඩො. 8,000	ඇ.ඩො. 8,000
				*1,461,999	*1,222,838
				ම.බ්‍රි.ප.127,900	ම.බ්‍රි.ප. 55,300
				*29,665,393	*11,366,152
				යුරෝ 1,000	යුරෝ 1,000
				*208,993	*182,486
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	වැඩබලන	ඉතිරිකිරීමේ ගිණුම්		-	6,046
	සභාපති	ජංගම ගිණුම්		5,338	12,563
		කාලීන තැන්පතු		166,896	152,278
		ණය		-	5,243
		වෙනත් ලැබිය යුතු ශේෂයන්		81,126	47,050
ප්‍රකාෂ් ආනන්ද් ෂාෆ්ටර් මහතා					
(ප්‍රකාෂ් ආනන්ද් ෂාෆ්ටර් මහතා 2019 පෙබරවාරි 26 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් විය.)					
** (2019 මාර්තු 19 දිනට පවතින නිරාවරණයන්)					
ජනශක්ති ඉන්ෂුරන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		12	
ජනශක්ති පී එල් සී	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		4,544	
		ණය		107,604	

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම '000**	2017.12.31 දිනට ශේෂය/ගෙවිය යුතු වටිනාකම '000
ඔරියන්ට් ෆිනෑන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	අයිරා පහසුකම්	50,000	10,941	
		ණය		794,222	
පෑන් හිපොන් ඩිවලප්මන්ට් (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		47	
ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම - හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය					
රනෙල් ටී විජේසිංහ මහතා					
(රනෙල් ටී විජේසිංහ මහතා 2018 ජූලි 31 දින ඉල්ලා අස් විය)					
** (2018 දෙසැම්බර් 31 දිනට පවතින නිරාවරණයන්)					
සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		1,271	2,551
		කාලීන තැන්පතු		221,715	237,165
		ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්		5,020	6,103
එච් පී අජිත් ගුණවර්ධන මහතා					
(එච් පී අජිත් ගුණවර්ධන මහතා 2018 ජූලි 20 දින ඉල්ලා අස් විය)					
** (2018 දෙසැම්බර් 31 දිනට පවතින නිරාවරණයන්)					
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		9,902	10,835
		කාලීන තැන්පතු		233,334	231,400
		අයිරා පහසුකම්	50,000	-	-
		ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්		26,005	77,037
සමන්ත රාජපක්ෂ මහතා					
(සමන්ත රාජපක්ෂ මහතා 2018 නොවැම්බර් 25 දින ඉල්ලා අස් විය)					
සී/ස ඇසෝසියේටඩ් මෝටර්වේස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම්			71,849
(විශ්‍රාම යන දින වන විට සමන්ත රාජපක්ෂ මහතා සී/ස ඇසෝසියේටඩ් මෝටර්වේස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු නොවිය)		ඉතිරිකිරීමේ ගිණුම්			ඇ.ඩො. 3,306
					*505,274
		ජංගම ගිණුම්			119,592
		කාලීන තැන්පතු			ඇ.ඩො. 156
					*23,904
		නැව් ඇපකර	250,000		20,709
		ණයවර ලිපි	1,000,000		822,239
		කැපකර ණය	200,000		-
		ප්‍රතිග්‍රහණ			9,960
		ඇපකාර ලිපි	100,000		36,267
		අපනයන චකතූන්			15,124
		ආනයන බිල්පත්			234
සී/ස ඇසෝසියේටඩ් ඔටෝවේස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්			1,946
(විශ්‍රාම යන දින වන විට සමන්ත රාජපක්ෂ මහතා සී/ස ඇසෝසියේටඩ් ඔටෝවේස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු නොවිය)		ඇපකාර ලිපි	1,000		-
		නැව් ඇපකර	6,000		-
		ණයවර ලිපි	6,000		-

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000	ශේෂය/ ගෙවිය යුතු වටිනාකම '000**	2017.12.31 දිනට ශේෂය/ගෙවිය යුතු වටිනාකම '000
		කැපකර ණය	8,000		-
සී/ස ඇසෝෂියේටඩ් මෝටර් (ලංකා) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්			249
(විශ්‍රාම යන දින වන විට සමන්ත රාජපක්ෂ මහතා සී/ස ඇසෝෂියේටඩ් මෝටර් (ලංකා) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු නොවිය)		ණයවර ලිපි	90,000		-
		නැවී ඇපකර	120,000		-
		කැපකර ණය	19,975		-
		ඇපකාර ලිපි	5,000		-
ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම්			4,700
(විශ්‍රාම යන දින වන විට සමන්ත රාජපක්ෂ මහතා ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී හි අධ්‍යක්ෂවරයෙකු නොවිය)		ජංගම ගිණුම්			15,523
** (2018 නොවැම්බර් 30 දිනට පවතින නිරාවරණයන්) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		9	
මොහාන් විජේසිංහ මහතා					
(මොහාන් විජේසිංහ මහතා 2018 ජූලි 2 දින ඉල්ලා අස් විය)					
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම්			ඇ.ඩො. 235
(විශ්‍රාම යන දින වන විට මොහාන් විජේසිංහ මහතා ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී එල් සී හි අධ්‍යක්ෂවරයෙකු නොවිය)					*35,944
		ජංගම ගිණුම්			53,555
		කාලීන තැන්පතු			ඇ.ඩො. 6,301
					*963,159
** (2018 ජූලි 31 දිනට පවතින නිරාවරණයන්) සී/ස මග නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		2,172	2,864
ජී එච් විජයවර්ධන මහතා					
(ජී එච් විජයවර්ධන මහතා 2018 දෙසැම්බර් 20 දින ඉල්ලා අස් විය)					
** (2018 දෙසැම්බර් 31 දිනට පවතින නිරාවරණයන්)					
එල් කේ ඩොමේන් රෙජිස්ට්‍රි	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		122	
		කාලීන තැන්පතු		70,000	

* ශ්‍රී ලංකා රුපියල් වලට සමාන අගය

සටහන : මුදල් චීකකය විශේෂයෙන් සඳහන් කර නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8) (ii) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතුවලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශකවල විචල්‍යතා ඉස්මතුවන සේ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බව හෝ මූල්‍ය අලාභයන් හෝ වංචාවලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබාදිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණ පෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අබණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මග පෙන්වීම් වල සිදුවන වෙනස්වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මග පෙන්වීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මඟපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරිත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි සැලැස්ම සහ සඵලදායීත්වය නිරීක්ෂණය කිරීමේදී යොදා ගන්නා ලද ක්‍රමවේදය සහ එහි මූලික ලක්ෂණ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකතාවය සහ සම්පූර්ණත්වය නිරීක්ෂණය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙල කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද, යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- නියැදි හා චක්‍රීය ක්‍රම භාවිතයෙන්, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියාදාමයන්ට අනුගත වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යසාධනය පිළිබඳව අබණ්ඩව පරීක්ෂා කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන අතර එමඟින් සොයා ගනු ලබන සැලකිය යුතු අනුගත නොවීම් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් නිකුත් කිරීම උදෙසා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කොට අනුමත කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ නිරන්තර රැස්වීම්හි නිරීක්ෂණය සඳහා යොමු කරයි.

- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීම ද විගණන කමිටුව මඟින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. පිටු අංක 89 සිට 92 දක්වා ඇති විගණන කමිටු වාර්තාවෙහි විගණන කමිටුව විසින් අදාළ වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සවිස්තරව දක්වා ඇත.

- අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේ දී, හඳුනාගත් බැංකු නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙලිදරව් කිරීම් වලට සම්බන්ධ සිය ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් පරීතුලනය කරන ලදී. එහි සැලස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී.

- බැංකුව 2012 වර්ෂයේ දී නව ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත යොදා ගන්නා ලදී. ඉහත ගිණුම්කරණ ප්‍රමිත මූලිකව භාවිතා කිරීමේ දී යොදාගත් ක්‍රමවේදයන් සහ ක්‍රියා පටිපාටීන්, නියාමන අධිකාරීන්, අභ්‍යන්තර හා බාහිර විගණකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මඟින් ලද ප්‍රතිචාර අනුව ඉන් පසු වර්ෂවල දී තවදුරටත් ශක්තිමත් කරන ලදී.

- 2018 ජනවාරි පළමු වැනිදා සිට බල පැවැත්වෙන පරිදි ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතිය බැංකු විසින් ණය හා අත්තිකාරම් හානිකරණය ගණනය කිරීම සඳහා යොදාගන්නා ලදී. පෙරදී යොදාගත් ලං. ගි. ප්‍ර. 39 (මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම) සිට ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට පරිවර්තනය විශේෂයෙන්ම කලින් ලං. ගි. ප්‍ර. 39 යටතේ යොදාගත් සිදුවූ අලාභ ක්‍රමයේ සිට ඉදිරි දැක්මක් ඇති අපේක්ෂිත අලාභ ක්‍රමය යොදාගැනීම ඉතාමත් හොඳින් සුපරීක්ෂණය කරන ලදී.

උපදේශකයින් ලෙස අර්නස්ට් ඇන්ඩ් යං ආයතනය යොදාගත් අතර බාහිර විගණකයින් සුපරීක්ෂණ ආයතන වල සහ අධ්‍යක්ෂ මණ්ඩලීය විගණන කමිටුවෙන් සිදුකල යෝජනාද සැලකිල්ලට භාජනය කරන ලදී.

- ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතිය නිසි ලෙස යොදා ගැනීමට පළමු දිනයේ බලපෑම ගණනය කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය නිවැරදිව අනුගමනය කර ඇත. මේ පරිවර්තන ක්‍රියාවලිය බැංකුවේ විවිධ අංශ වලින් සමන්විත ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් හැසිරවීමේ කමිටුවක් විසින් සුපරීක්ෂණය හා මග පෙන්වීම සිදු කරයි.

- බැංකුව විසින් බැංකුවේ සහ විතෙර ශාඛාවන්හි ණය හා අත්තිකාරම් හානිකරණ හඳුනා ගැනීමේ ක්‍රියාවලිය, මූල්‍ය ප්‍රකාශනවල අවදානම් කළමනාකරණය හා සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ හෙළිදරව් කිරීම් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී. තවද, මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මූල්‍ය උපකරණ කාර්යක්ෂම සහ සඵලව හඳුනාගැනීම, මිණුම් කිරීම හා වර්ගීකරණය කිරීම සඳහා යෝග්‍ය ස්වයංක්‍රීය ගිණුම් වාර්තා ක්‍රියාවලියක අවශ්‍යතාවය බැංකුව හඳුනා ගෙන ඇත. මෙහිදී බැංකුවේ පරිපාලිත සමාගම් විසින් සිදුකරන ලද ක්‍රියා පටිපාටීන් විශ්ලේෂණය කර නැත.

- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළදී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ දී ක්‍රියා කරනු ඇත.

තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සභාපති
විගණන කමිටුව

සභාපති

අධ්‍යක්ෂ

2019 මාර්තු 27 දින
කොළඹ දීය.

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } බීඒඑල්/බී/බීඕසී/අයිසී/2018
ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 09 April 2019

සභාපති

ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන ස්වාධීන සහතිකවීමේ වාර්තාව

හැඳින්වීම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ.

කළමනාකරණයේ වගකීම

2007 අංක 11 දරණ බැංකු පනතේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශය" ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී ලං. ස. කා. ප්‍ර.) 3050 ට අනුකූල වීම

මාගේ පරීක්ෂණ මත පදනම්ව මෙම අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් නිකුත්කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී ලං. ස. කා. ප්‍ර. 3050 ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන මඟින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිළිබිඹු වන්නේ ද යන්න අගය කර බැලීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කල ක්‍රියා මාර්ග සනාථ කර ගැනීම සඳහා නියැඳි ලෙස බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් විමසීම , ලිපි ලේඛන පරීක්ෂාව යන ක්‍රියා පටිපාටි සිදු කරන ලදී.

මෙම ප්‍රකාශය තුළින් සියලු අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං. ස. කා. ප්‍ර. 3050 ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං. ස. කා. ප්‍ර. 3050 ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේ දැයි යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

එච් එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මඟින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ නියාමනයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා සංගතභාවයෙන් යුතුව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විචක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගතය දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වැළැක්වීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේනික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කර ගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ. මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 188 සහ 189 හි අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සාක්ෂිය කිරීම සඳහා කාර්තුමය පදනමක් මත අවදානම් වාර්තාවන් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 89 සිට 95 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 192 සිට 195 දක්වා ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 190 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සිය ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම් යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2019 මාර්තු 19
කොළඹ දීය.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } බීඒඑල්/බී/බීඕසී/එල්බී/2018
මබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 29 March 2019

සභාපති

ලංකා බැංකුව.

ලංකා බැංකුව සහ එහි පරිපාලිතයන්හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, සහ ලාභ අලාභ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරණ මුදල් පනතේ 5(1) වගන්තියෙන් මුදල් අමාත්‍යවරයාට පැවරුණු බලතල ප්‍රකාරව 1992 මැයි 14 දිනැති අංක 715 දරණ රජයේ ගැසට් පත්‍රයේ විවකට මුදල් ඇමතිවරයා විසින් ප්‍රසිද්ධ කරන ලද නියෝගය ප්‍රකාරව බැංකුව මුදල් පනතේ II කොටසේ විධිවිධාන වලින් නිදහස් කර තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තීයමය විනිශ්චය අනුව ප්‍රවර්තන කාලපරිච්ඡේදය සඳහා වඩාත් වැදගත් කරුණු ප්‍රධාන විගණන කරුණු වශයෙන් සැලකේ. බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බලනු ලබන අතර ඒ පිළිබඳ මාගේ විගණන මතය ගොඩනැගීමේදී මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රධාන විගණන කරුණ	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කරන ලද ආකාරය
අ) බැංකුවේ සංකීර්ණ තොරතුරු තාක්ෂණ සම්බන්ධ යෙදවුම්, පාලනයන් සහ මූල්‍ය වාර්තාකරණයේදී ඒවායේ බලපෑම.	මෙම ක්ෂේත්‍රයට අදාල අනෙකුත් විගණන ක්‍රියාපටිපාටි අතර පහත සඳහන් දෑ ද ඇතුලත් විය.
බැංකුවේ මෙහෙයුම් කටයුතු සංකීර්ණ සහ බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධතීන් සහ යෙදුම් භාවිතයෙන් ස්වයංක්‍රීය කර තිබුණි. විවිධ අභ්‍යන්තර හා බාහිර තොරතුරු වාර්තාකරණ අවශ්‍යතා සම්පාදනයේදී ඒවැනි තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තුලින් අවශ්‍ය පසුබිම සලසා තිබුණි. මූල්‍ය වාර්තාකරණයේදී මෙම තොරතුරු තාක්ෂණයේ බලපෑම ඉතා ඉහල බව සැලකේ. එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍ය හෙලිදරව් කිරීම් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම එම තොරතුරු තාක්ෂණ යෙදවුම් වල ප්‍රතිඵල මත විශාල වශයෙන් රදා පවතී.	• මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් බලපෑමක් ඇතිවිය හැකි බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලිය සහ එම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන ප්‍රධාන හස්තමය හා ස්වයංක්‍රීය පාලනයන් මා විසින් හඳුනාගන්නා ලදි. • තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පරිගණක පාලනයන් සම්බන්ධයෙන් පහසුකම් සපයාගනු පිණිස සහ එවැනි අනිකුත් ස්වයංක්‍රීය තොරතුරු තාක්ෂණ භාවිතයන් සම්බන්ධ පාලනයන් නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය අවබෝධ කරගැනීම හා ඇගයීම සඳහා විශේෂඥයින් මා විසින් යොදවා ගන්නා ලදි. වාර්තා සැකසීමේ ක්‍රමවේදයන් පිළිබඳ මඟපෙන්වීම්, පාලන පරීක්ෂා සහ වෙනත් අවශ්‍ය වලංගුභාවය පරීක්ෂා කිරීම් ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් වේ.
එමඟින් විගණන අරමුණු සඳහා පසුබිම සැලසීම සිදුකරනු ලබන බැවින් මෙම යෙදවුම් මඟින් ජනිතවන තොරතුරු වල සම්පූර්ණ හා නිවැරදි භාවය සහතික වීම ඉතා වැදගත් වේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ස්වයංක්‍රීය සහ හස්තමය පාලන පරිසරයන් මාගේ විගණනයේ ඉතා වැදගත් ක්ෂේත්‍රයක් ලෙස මා සලකනු ලබන අතර ඒ අනුව ස්වයංක්‍රීය සහ හස්තමය පාලන පරිසරයන් ප්‍රධාන විගණන කාර්යයක් ලෙස සලකනු ලැබීය.	• ඉහත ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල මත පදනම්ව අප විසින් අවශ්‍ය තැන් හිදී අතිරේක ස්වාධීන පරීක්ෂාවන් සිදු කරන ලදි.
ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත සමූහයේ මාරු වීම ඇතුලුව ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ ගැලපීම්.	හානිකරණ ගැලපීම් වල සාධාරණභාවය තක්සේරුකරනු පිණිස ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා නිර්මාණය කරන ලද මාගේ විගණන ක්‍රියාපටිපාටි අතර පහත සඳහන් දෑ ද ඇතුලත් විය.
ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ ගැලපීම ප්‍රධාන විගණන කරුණක් ලෙස මාගේ විගණනයේදී සලකන ලදි. ණය සහ අත්තිකාරම් ලෙස වාර්තාගත අගයන්ගේ ප්‍රමාණාත්මක භාවය (ඒ සඳහා වූ හානිකරණ ගැලපීම්) කළමණාකරණය විසින් සිදු කරන ලද හානිකරණ ඇස්තමේන්තුවල විෂයගතභාවය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත සංක්‍රමණය වීම, (මූල්‍ය උපකරණ ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9) එය ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකීම සඳහා වූ මාගේ පදනම තහවුරු කරන ලදි. 2018 දෙසැම්බර් 31 දිනට සමූහයේ මුලු වත්කම් වලින් 63% රු. බිලියන 1,460 ක් වූ ණය සහ අත්තිකාරම් වලින් සමන්විත වූ අතර (සටහන 27) ඒ මත වූ හානිකරණ ගැලපීම රු. බිලියන 84ක් විය (සටහන 27.2). ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත සංක්‍රමණය වීමේදී සමූහයේ මූල්‍ය ප්‍රකාශන මත වූ මෙම බලපෑම මූල්‍ය ප්‍රකාශන වල සටහන 62හි ප්‍රමාණනය කර දක්වා තිබේ. ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ ගැලපීම තක්සේරු කිරීම සංකීර්ණ හස්තමය ගණනය කිරීම මඟින් සිදුකර තිබුණි.	• ණය සහ අත්තිකාරම් හානිකරණ ගැලපීම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ වූ පාලනයන් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් ඵලදායිකත්වය, දෝෂයන්ගේ ප්‍රමාණය තක්සේරු කිරීම සමාලෝචනය සහ හානිකරණ ප්‍රතිපත්ති විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කිරීමද ඇතුළත්ව මා විසින් ඇගයීමට ලක් කරන ලදි. • පාදක වූ ගණනය කිරීම් සහ දත්ත සෝදිසි පරීක්ෂාවට භාජනය කරන ලදි. • ඉහත සඳහන් කරුණට අමතරව පහත දැක්වෙන කේන්ද්‍රගත ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කරන ලදි. ණය සහ අත්තිකාරම් සඳහා - හානිකරණ සඳහා වෙන් වෙන්ව ඇගයීම • හානිකරණ ගැලපීම සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟීමට ඇති ඉඩකඩ තීරණය කිරීම සඳහා කලමණාකරණය විසින් ණය අය කරගැනීමේ අධික අවදානමක් ඇති කර්මාන්තයන්හි ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් කළමණාකරණය විසින් සිදුකරන ලද හානිකරණ ඇස්තමේන්තුවද ඇතුලත්ව යොදාගත් ප්‍රධාන නිර්ණායක මා විසින් තක්සේරු කරන ලදි. • හානිකරණ දර්ශක පවත්නා අවස්ථාවන් හිදී අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ද වට්ටම් අනුපාත සහ පවත්නා අතිරේක අගයන්ද ඇතුලත්ව කළමණාකරණය විසින් ඇස්තමේන්තුගත අනාගත අයකිරීම් වල සාධාරණ භාවය මා විසින් තක්සේරු කරන ලදි. අනාගත අය කරගැනීම පිළිබඳව ඉකුත් වර්ෂවල කරන ලද ඇස්තමේන්තු අගයන් සහ සත්‍ය අයකර ගැනීම් මා විසින් සසඳා බලන ලදී.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රධාන විගණන කරුණු

එම ගණනය කිරීම සඳහා කළමනාකරණය විසින් යොදාගත් සැලකිය යුතු ඇස්තමේන්තු සහ උපකල්පන ඒවායේ සංවේදී භාවය සහ හානිකරණ ගැලපීම් සඳහා පදනම සටහන 27 හි දක්වා ඇත.

මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කරන ලද ආකාරය

- ණය අය කරගැනීමේ ඉතා ඉහල අවදානමක් ඇති පාරිභෝගිකයන් හට ණය සහ අත්තිකාරම් ලබා දීමේදී හානිකරණ අවස්ථාවක් පැන නැගීමට ඇති ඉඩකඩ තීරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් භාවිතා කරන ලද ප්‍රධාන නිර්ණායකයන් සහ එවැනි අතිරේක හානිකරණ සම්බන්ධයෙන් කළමනාකරණ ඇස්තමේන්තුවල සාධාරණභාවය මා විසින් තක්සේරු කරන ලදි.

ණය සහ අත්තිකාරම් සඳහා - හානිකරණ සඳහා සමස්තයක් ලෙස තක්සේරු කිරීම

- සමූහයේ මූලාශ්‍ර වාර්තා වලින් එකඟ වන ලද දත්ත සහ තොරතුරු තාක්ෂණ පද්ධතියෙන් ලබා ගන්නා ලද තොරතුරු නැවත ගණනය කිරීම මඟින් හානිකරණ ගණනයන් සඳහා භාවිතා කරන ලද ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් පාදක වූ තොරතුරු වල සම්පූර්ණභාවය, අදාලත්වය සහ නිරවද්‍යතාවය මා විසින් පරීක්ෂා කරන ලදි.
- විවිධ වර්ගයේ ණය සඳහා කළමණාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන්ට අනුව භාවිතා කරන ලද සාර්ව ආර්ථික සහ අනිකුත් සාධක වල සාධාරණභාවය ප්‍රසිද්ධ දත්ත සහ තොරතුරු මූලාශ්‍රයන් සමඟ සසඳමින් මා විසින් සලකා බලන ලදි.
- සටහන 27හි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන හෙලිදරව් කිරීම් වල ප්‍රමාණවත් භාවය මා විසින් තක්සේරු කරන ලදි.
- සටහන 62හි දක්වා ඇති පරිදි ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යොදා ගැනීමේ මූලික බලපෑම සම්බන්ධයෙන් සමූහයේ හෙලිදරව් කිරීම් වල ප්‍රමාණවත් භාවයද මා විසින් තක්සේරු කරන ලදි. ගණුදෙනු වල ප්‍රමාණාත්මක බලපෑම පිළිබඳ පරීක්ෂා මෙයට ඇතුලත් වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්වීමේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්වීමට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණක ගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මගේ මතය ඇතුළත් විගණක ගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවාචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා

ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙලිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සඳහා විශේෂිත ප්‍රතිපාදන සලස්වා ඇත.

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) විධිවිධාන ප්‍රකාරව නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වා ගෙනගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(අඃ)(iii) හි අවශ්‍යතා පරිදි ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුකූල බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(අඃ)(iv) හි අවශ්‍යතා පරිදි මා විසින් ඉකුත් වර්ෂයේ දී කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව.

ක්‍රියාවට නංවන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව ලබාගන්නා ලද විගණන සාක්ෂි ප්‍රමාණාත්මක කරුණු වලට සීමා වේ. මාගේ අවධානයට ලක් නොවූ කරුණු නම්;

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අඃ) වගන්තිය ප්‍රකාරව බැංකුවේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු බැංකුව විසින් එළඹෙන ලද කිසිඳු ගිවිසුමක් සඳහා කිසිදු සෘජු හෝ වක්‍ර බැඳීමකට ඇතුලත් වී ඇති බව

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තිය ප්‍රකාරව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු හෝ විශේෂ විධානයකට අනුකූල නොවන සේ ක්‍රියා කොට ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය ප්‍රකාරව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කොට නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඒ) වගන්තිය ප්‍රකාරව බැංකුව විසින් සිය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම හා ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර නොමැති බව.

එච් එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව			සමූහය		
		2018	2017	වෙනස	2018	2017	වෙනස
		රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
මුළු ආදායම	7	**221,131,178**	**189,211,395**	**16.9**	**229,461,622**	**197,012,961**	**16.5**
පොළී ආදායම		195,393,970	171,343,888	14.0	201,809,401	177,746,357	13.5
අඩු කළා: පොළී වියදම		129,835,996	112,987,696	14.9	133,119,922	116,256,255	14.5
ශුද්ධ පොළී ආදායම	8	**65,557,974**	**58,356,192**	**12.3**	**68,689,479**	**61,490,102**	**11.7**
ගාස්තු සහ කොමිස් ආදායම		10,699,565	9,465,330	13.0	11,088,043	9,723,455	14.0
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		2,280,728	1,883,302	21.1	2,294,839	1,972,374	16.3
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	**8,418,837**	**7,582,028**	**11.0**	**8,793,204**	**7,751,081**	**13.4**
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	3,431,822	2,802,048	22.5	3,468,191	2,822,168	22.9
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	11	(681,365)	-	-	(717,194)	-	-
මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	11.1	-	905,527	(100.0)	-	925,733	(100.0)
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	12	152,029	-	-	153,240	-	-
වෙනත් මෙහෙයුම් ආදායම්	13	12,135,157	4,694,602	158.5	13,659,941	5,795,248	135.7
මූළු මෙහෙයුම් ආදායම		**89,014,454**	**74,340,397**	**19.7**	**94,046,861**	**78,784,332**	**19.4**
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම	14	15,040,961	9,340,658	61.0	15,176,472	9,884,889	53.5
ශුද්ධ මෙහෙයුම් ආදායම		**73,973,493**	**64,999,739**	**13.8**	**78,870,389**	**68,899,443**	**14.5**
අඩු කළා: මෙහෙයුම් වියදම්							
සේවක මණ්ඩල වියදම්	15	18,875,397	16,996,176	11.1	20,600,778	18,723,550	10.0
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්		2,200,294	1,925,002	14.3	2,813,469	2,542,480	10.7
වෙනත් වියදම්	16	11,417,336	8,486,795	34.5	13,210,221	9,438,372	40.0
මුළු මෙහෙයුම් වියදම්		**32,493,027**	**27,407,973**	**18.6**	**36,624,468**	**30,704,402**	**19.3**
මූල්‍ය සේවා මත බදු වලට පෙර ලාභය		**41,480,466**	**37,591,766**	**10.3**	**42,245,921**	**38,195,041**	**10.6**
අඩු කළා: මූල්‍ය සේවා මත බදු	17.1	9,588,312	7,248,786	32.3	9,818,020	7,431,502	32.1
මූල්‍ය සේවා මත බදු වලට පසු ලාභය		**31,892,154**	**30,342,980**	**5.1**	**32,427,901**	**30,763,539**	**5.4**
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	18	-	-	-	9,269	52,024	(82.2)
ආදායම් බද්දට පෙර ලාභය		**31,892,154**	**30,342,980**	**5.1**	**32,437,170**	**30,815,563**	**5.3**
අඩු කළා: ආදායම් බදු වියදම	17.2	12,413,425	9,030,696	37.5	12,922,017	9,328,918	38.5
වර්ෂය සඳහා ලාභය		**19,478,729**	**21,312,284**	**(8.6)**	**19,515,153**	**21,486,645**	**(9.2)**
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස		19,478,729	21,312,284	(8.6)	19,532,862	21,470,163	(9.0)
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	(17,709)	16,482	207.4
වර්ෂය සඳහා ලාභය		**19,478,729**	**21,312,284**	**(8.6)**	**19,515,153**	**21,486,645**	**(9.2)**
කොටසක ඉපැයුම:							
කොටසක මූලික ඉපැයුම (රු.)	19.1	1,044.78	1,856.56	(43.7)	1,047.68	1,870.31	(44.0)
කොටසක තනුක ඉපැයුම (රු.)	19.2	915.02	1,414.36	(35.3)	917.57	1,424.84	(35.6)
කොටසක ලාභාංශ (රු.)	19.3	259.95	1,075.52	(75.8)	259.95	1,075.52	(75.8)

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2018	2017	වෙනස	2018	2017	වෙනස
	රු. '000	රු. '000	%	රු. '000	රු. '000	%
වර්ෂය සඳහා ලාභය	**19,478,729**	**21,312,284**	**(8.6)**	**19,515,153**	**21,486,645**	**(9.2)**
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම, බදු පසු ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය වාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(අලාභ)	1,110,869	361,375	207.4	1,453,215	643,365	125.9
වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන ණය උපකරණවල ආයෝජන මත ශුද්ධ ලාභ/(අලාභ)	(271,351)	-	-	(285,389)	-	-
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(අලාභ)	-	(595,034)	(100.0)	-	(619,591)	(100.0)
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(අලාභ) මත විලම්බිත බදු බලපෑම	-	(177,006)	(100.0)	-	(177,006)	(100.0)
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට/ උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(අලාභ)	(15,232)	3,385	(550.0)	(15,232)	3,385	(550.0)
ආශ්‍රිත සමාගම්හි වෙනත් විස්තීර්ණ ආදායම් කොටස, බදු පසු	-	-	-	3,464	(6,600)	(152.5)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්ගේ එකතුව	**824,286**	**(407,280)**	**(302.4)**	**1,156,058**	**(156,447)**	**(838.9)**
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට නියම කරනු ලබන ප්‍රාග්ධන උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම්	(410,168)	-	-	(823,954)	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට නියම කරනු ලබන ප්‍රාග්ධන උපකරණවල සාධාරණ අගයේ වෙනස්කම් මත විලම්බිත බදු බලපෑම	(6,711)	-	-	(6,711)	-	-
ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) වල වෙනස්කම්	(337,522)	6,059,715	(105.6)	147,397	6,406,248	(97.7)
ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) වල වෙනස්කම් මත විලම්බිත බදු බලපෑම	94,506	(4,094,358)	(102.3)	(41,271)	(4,191,387)	(99.0)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණනක ලාභ/(අලාභ)	(2,119,340)	2,789,929	(176.0)	(2,090,789)	2,766,683	(175.6)
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණනක ලාභ/(අලාභ) මත විලම්බිත බදු බලපෑම	3,050	(8,400)	(136.3)	(9,530)	8,363	(214.0)
ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්ගේ එකතුව	**(2,776,185)**	**4,746,886**	**(158.5)**	**(2,824,858)**	**4,989,907**	**(156.6)**
වර්ෂයට අදාළ වෙනත් විස්තීරණ ආදායම, බදු පසු	**(1,951,899)**	**4,339,606**	**(145.0)**	**(1,668,800)**	**4,833,460**	**(134.5)**
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**17,526,830**	**25,651,890**	**(31.7)**	**17,846,353**	**26,320,105**	**(32.2)**
මුළු විස්තීරණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	17,526,830	25,651,890	(31.7)	17,866,780	26,270,244	(32.0)
පාලනයට යටත් නොවන හිමිකම	-	-	-	(20,427)	49,861	(141.0)
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**17,526,830**	**25,651,890**	**(31.7)**	**17,846,353**	**26,320,105**	**(32.2)**

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව			සමූහය		
		2018	2017	වෙනස	**2018**	2017	වෙනස
		රු. '000	රු. '000	%	**රු. '000**	රු. '000	%
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	21	78,447,577	72,843,108	7.7	78,558,031	78,005,362	0.7
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	22	65,680,371	68,689,012	(4.4)	65,680,371	68,689,012	(4.4)
බැංකුවල ඇති තැන්පතු	23	40,450,089	8,067,490	401.4	41,681,910	5,319,602	683.6
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	24	-	18,455,555	(100.0)	1,436,068	19,872,247	(92.8)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	25	1,205,657	1,618,823	(25.5)	1,205,657	1,618,823	(25.5)
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්/වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	26	9,277,298	8,359,274	11.0	9,583,327	8,596,548	11.5
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
ණය සහ අත්තිකාරම්	27	1,429,107,181	1,163,160,914	22.9	1,460,618,588	1,194,294,394	22.3
ණය සහ වෙනත් උපකරණ	28	551,839,449	-	-	551,956,734	-	-
මූල්‍ය ආයෝජන - ණය සහ ලැබිය යුතු දෑ	28.3	-	213,167,048	(100.0)	-	214,349,624	(100.0)
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	28.4	-	308,256,082	(100.0)	-	308,750,317	(100.0)
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින	29	16,699,582	17,921,170	(6.8)	20,415,199	22,552,292	(9.5)
පරිපාලිත සමාගම්වල ආයෝජන	30	6,513,048	6,513,048	-	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	31	92,988	92,988	-	441,226	446,793	(1.2)
ආයෝජන දේපළ	32	2,765,856	2,882,928	(4.1)	120,182	123,773	(2.9)
දේපළ, පිරියත හා උපකරණ	33	24,178,155	23,046,114	4.9	37,762,509	36,608,919	3.2
කල්බදු දේපළ	34	98,899	101,481	(2.5)	130,500	134,441	(2.9)
අස්පෘශ්‍ය වත්කම්	35	1,238,186	810,730	52.7	1,456,630	1,074,436	35.6
විලම්බිත බදු වත්කම්	36	-	-	-	3,052	8,621	(64.6)
වෙනත් වත්කම්	37	40,560,058	37,818,188	7.3	41,872,891	38,964,979	7.5
මුළු වත්කම්		**2,268,154,394**	**1,951,803,953**	**16.2**	**2,312,922,875**	**1,999,410,183**	**15.7**
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	38	2,402,468	2,203,199	9.0	2,515,998	2,194,266	14.7
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	39	97,399,359	44,487,462	118.9	97,423,302	44,628,686	118.3
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	40	509,018	70,715	619.8	509,018	70,715	619.8
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්							
තැන්පත්කරුවන් වෙත ගෙවිය යුතු	41	1,765,025,970	1,546,832,036	14.1	1,783,975,493	1,566,376,418	13.9
වෙනත් ණය ගැනීම්	42	201,792,174	178,191,089	13.2	207,053,674	184,330,181	12.3
නිකුත් කළ ණය සුරැකුම්පත්	43	-	-	-	4,105,681	5,667,514	(27.6)
ප්‍රවර්තන බදු වගකීම්	44	3,922,189	1,877,342	108.9	4,039,380	2,051,020	96.9
විලම්බිත බදු වගකීම්	36	5,073,526	5,820,329	(12.8)	7,762,214	8,625,219	(10.0)
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	45.1	-	-	-	575,625	547,026	5.2
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	45.2	-	-	-	366,618	430,093	(14.8)
වෙනත් වගකීම්	46	19,760,429	18,596,249	6.3	21,970,739	19,936,478	10.2
යටත් කාලීන ණය	48	50,827,239	42,570,457	19.4	50,484,487	42,226,067	19.6
මුළු වගකීම්		**2,146,712,372**	**1,840,648,878**	**16.6**	**2,180,782,229**	**1,877,083,683**	**16.2**

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව			සමූහය		
		2018	2017	වෙනස	**2018**	2017	වෙනස
		රු. '000	රු. '000	%	**රු. '000**	රු. '000	%
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	49	25,000,000	20,000,000	25.0	25,000,000	20,000,000	25.0
ස්ථාවර සංචිත අරමුදල	50	12,890,000	10,427,000	23.6	12,890,000	10,427,000	23.6
රඳවාගත් ඉපැයුම්	51	67,333,879	63,472,250	6.1	68,451,746	65,100,871	5.1
වෙනත් සංචිත	52	16,218,143	17,255,825	(6.0)	25,103,751	25,871,254	(3.0)
බැංකුවේ කොටස් හිමියාට අයත් මුළු ස්කන්ධය		**121,442,022**	**111,155,075**	**9.3**	**131,445,497**	**121,399,125**	**8.3**
පාලනයට යටත් නොවන හිමිකම	53	-	-	-	695,149	927,375	(25.0)
මුළු ස්කන්ධය		**121,442,022**	**111,155,075**	**9.3**	**132,140,646**	**122,326,500**	**8.0**
මුළු වගකීම් සහ ස්කන්ධය		**2,268,154,394**	**1,951,803,953**	**16.2**	**2,312,922,875**	**1,999,410,183**	**15.7**
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	55	508,306,808	496,477,278	2.4	513,192,419	497,617,834	3.1
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	49	6,072.10	7,410.34	(18.1)	6,574.13	8,093.28	(18.8)

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

ඩබ් පී රසල් ෆොන්සේකා
ප්‍රධාන මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

රොනල්ඩ් සී පෙරේරා
සභාපති

කේ ඒ විමලෙන්තිරාජා
අධ්‍යක්ෂ

සෙනරත් බණ්ඩාර
මහා කළමනාකරු

2019 මාර්තු 19
කොළඹ දීය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

බැංකුව

	සටහන්	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2017 ජනවාරි 1 දිනට ශේෂය		**10,000,000**	**5,000,000**	**7,996,000**	**4,487,181**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		-	-	-	(768,655)
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**-**	**-**	**-**	**(768,655)**
සෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ ගනුදෙනු					
2017 සඳහා ලාභාංශ	19.3	-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම	49.1	5,000,000	(5,000,000)	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	49.1	-	5,000,000	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	50	-	-	2,431,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන ලාභ		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ මූළු ගනුදෙනු		**5,000,000**	**-**	**2,431,000**	**-**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**3,718,526**
2018 ජනවාරි 1 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**3,718,526**
2018 ජනවාරි 1වන දින ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. 9ට අනුගත වීමේ බලපෑම්		-	-	-	(3,718,526)
පරිවර්තන ගැලපුම් මත විලම්බිත බදු		-	-	-	-
2018 ජනවාරි 1 දිනට ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුගත වීමේ බලපෑම් ගැලපූ පසු ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**-**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**-**	**-**	**-**	**-**
සෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමඟ සිදුකළ ගනුදෙනු					
2018 සඳහා ලාභාංශ	19.3	-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම	49.1	5,000,000	(5,000,000)	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	49.1	-	5,000,000	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	50	-	-	2,463,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන ලාභ		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ මූළු ගනුදෙනු		**5,000,000**	**-**	**2,463,000**	**-**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,000**	**5,000,000**	**12,890,000**	**-**

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

අනෙකුත් සංචිත				
වෙනත් විස්තීරණ ආදායම් සංචිත	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	**1,209,435**	**10,002,294**	**54,154,685**	**92,849,595**
-	-	-	21,312,284	21,312,284
-	361,375	1,965,357	2,781,529	4,339,606
-	**361,375**	**1,965,357**	**24,093,813**	**25,651,890**
-	-	-	(12,346,410)	(12,346,410)
-	-	-	-	-
-	-	-	-	5,000,000
-	-	-	(2,431,000)	-
-	-	(1,162)	1,162	-
-	**-**	**(1,162)**	**(14,776,248)**	**(7,346,410)**
-	**1,570,810**	**11,966,489**	**63,472,250**	**111,155,075**
-	**1,570,810**	**11,966,489**	**63,472,250**	**111,155,075**
2,541,656	-	-	(9,562,471)	(10,739,341)
-	-	-	3,345,868	3,345,868
2,541,656	**1,570,810**	**11,966,489**	**57,255,647**	**103,761,602**
-	-	-	19,478,729	19,478,729
(703,462)	1,110,869	(243,016)	(2,116,290)	(1,951,899)
(703,462)	**1,110,869**	**(243,016)**	**17,362,439**	**17,526,830**
-	-	-	(4,846,410)	(4,846,410)
-	-	-	-	-
-	-	-	-	5,000,000
-	-	-	(2,463,000)	-
-	-	(25,203)	25,203	-
-	**-**	**(25,203)**	**(7,284,207)**	**153,590**
1,838,194	**2,681,679**	**11,698,270**	**67,333,879**	**121,442,022**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

	සටහන්	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය
		රු. '000	රු. '000	රු. '000	රු. '000
2017 ජනවාරි 1 දිනට ශේෂය		**10,000,000**	**5,000,000**	**7,996,000**	**5,562,266**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		-	-	-	(801,650)
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**-**	**-**	**-**	**(801,650)**
ඍජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ ගනුදෙනු					
2017 සඳහා ලාභාංශ	19.3	-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම	49.1	5,000,000	(5,000,000)	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	49.1	-	5,000,000	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	50	-	-	2,431,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන ලාභ		-	-	-	-
වෙනත් සංචිත සඳහා මාරු කිරීම්		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ මුළු ගනුදෙනු		**5,000,000**	**-**	**2,431,000**	**-**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**4,760,616**
2018 ජනවාරි 1 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**4,760,616**
2018 ජනවාරි 1වන දින ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුගත වීමේ බලපෑම්		-	-	-	(4,760,616)
පරිවර්තන ගැලපුම් මත විලම්බිත බදු		-	-	-	-
2018 ජනවාරි 1 දිනට ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුගත වීමේ බලපෑම් ගැලපූ පසු ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**	**-**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම					
වර්ෂය සඳහා ලාභය		-	-	-	-
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**-**	**-**	**-**	**-**
ඍජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ ගනුදෙනු					
2018 සඳහා ලාභාංශ	19.3	-	-	-	-
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම	49.1	5,000,000	(5,000,000)	-	-
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	49.1	-	5,000,000	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	50	-	-	2,463,000	-
ඉවත් කරන ලද වත්කම් වල ප්‍රත්‍යාගණන ලාභ		-	-	-	-
ලබා නොගත් ලාභාංශ නැවත මාරු කිරීම		-	-	-	-
හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ මුළු ගනුදෙනු		**5,000,000**	**-**	**2,463,000**	**-**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,000**	**5,000,000**	**12,890,000**	**-**

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස් හිමියාට අදාළ කොටස					
අනෙකුත් සංචිත					
වෙනත් විස්තීරණ ආදායම් සංචිත	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	**1,763,963**	**16,494,059**	**55,659,003**	**879,445**	**103,354,736**
-	-	-	21,470,163	16,482	21,486,645
-	643,365	2,188,368	2,769,998	33,379	4,833,460
-	**643,365**	**2,188,368**	**24,240,161**	**49,861**	**26,320,105**
-	-	-	(12,346,410)	-	(12,346,410)
-	-	-	-	(1,931)	(1,931)
-	-	-	-	-	-
-	-	-	-	-	5,000,000
-	-	-	(2,431,000)	-	-
-	-	(1,162)	1,162	-	-
-	22,045	-	(22,045)	-	-
-	**22,045**	**(1,162)**	**(14,798,293)**	**(1,931)**	**(7,348,341)**
-	**2,429,373**	**18,681,265**	**65,100,871**	**927,375**	**122,326,500**
-	**2,429,373**	**18,681,265**	**65,100,871**	**927,375**	**122,326,500**
3,583,746	-	-	(10,369,633)	(276,422)	(11,822,925)
-	-	-	3,571,637	77,317	3,648,954
3,583,746	**2,429,373**	**18,681,265**	**58,302,875**	**728,270**	**114,152,529**
-	-	-	19,532,862	(17,709)	19,515,153
(1,109,292)	1,453,215	90,647	(2,100,652)	(2,718)	(1,668,800)
(1,109,292)	**1,453,215**	**90,647**	**17,432,210**	**(20,427)**	**17,846,353**
-	-	-	(4,846,410)	-	(4,846,410)
-	-	-	-	(12,694)	(12,694)
-	-	-	-	-	-
-	-	-	-	-	5,000,000
-	-	-	(2,463,000)	-	-
-	-	(25,203)	25,203	-	-
-	-	-	868	-	868
-	**-**	**(25,203)**	**(7,283,339)**	**(12,694)**	**141,764**
2,474,454	**3,882,588**	**18,746,709**	**68,451,746**	**695,149**	**132,140,646**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2018	2017	**2018**	2017
		රු. '000	රු. '000	**රු. '000**	රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ					
ආදායම් බදු පෙර ලාභය		31,892,154	30,342,980	32,437,170	30,815,563
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(65,557,974)	(58,356,192)	(68,689,479)	(61,490,102)
වෙළෙඳ සුරැකුම්පත් වෙනුවෙන් ලැබූ ලාභාංශ ආදායම	10	(101,877)	(111,783)	(113,255)	(120,214)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබූ ලාභාංශ	13	(309,685)	(76,680)	-	-
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	18	-	-	(9,269)	(52,024)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	54.1	(279,608,836)	(176,623,016)	(285,248,074)	(177,474,266)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	54.2	276,164,812	304,162,970	282,302,977	306,329,345
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	54.3	6,773,377	10,872,287	7,494,037	12,102,838
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ ලාභ		529,336	(905,527)	563,954	(925,733)
		(30,218,693)	**109,305,039**	**(31,261,939)**	**109,185,407**
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම්		(7,667,801)	(6,976,625)	(7,715,221)	(6,994,516)
පොළී ලැබීම්		133,563,506	120,744,703	140,171,940	126,994,502
පොළී ගෙවීම්		(116,192,643)	(85,565,050)	(118,562,407)	(88,311,449)
ලාභාංශ ලැබීම්		101,877	111,783	113,255	120,214
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		**(20,413,754)**	**137,619,850**	**(17,254,372)**	**140,994,158**
ආදායම් බදු ගෙවීම්		(5,376,538)	(2,580,454)	(5,703,009)	(2,683,837)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		**(25,790,292)**	**135,039,396**	**(22,957,381)**	**138,310,321**
ආයෝජන කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ					
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම්		(30,883,224)	-	(29,323,684)	-
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		-	(65,055,871)	-	(65,470,538)
වෙනත් විස්තීරණ ආදායම යටතේ සාධාරණ අගයට හඳුනාගත් මූල්‍ය ආයෝජනවල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		(292,866)	-	(4,151,530)	-
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		-	(7,716,838)	-	(6,571,920)
ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම්		-	(21,292,409)	-	(22,365,555)
දේපල පිරියත හා උපකරණ හා කල්බදු දේපළ අත්පත් කර ගැනීම්		(3,399,832)	(3,080,752)	(3,569,916)	(3,199,778)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(783,598)	(528,565)	(790,386)	(764,014)
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලැබීම්		101,050	62,457	216,988	69,101
ලාභාංශ ලැබීම්		598,053	649,270	325,908	592,796
පොළී ලැබීම්		46,327,625	40,578,598	46,696,256	41,088,070
ආයෝජන කටයුතු වලින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්		**11,667,208**	**(56,384,110)**	**9,403,636**	**(56,621,838)**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2018	2017	**2018**	2017
		රු. '000	රු. '000	**රු. '000**	රු. '000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම)		24,715,392	(49,653,199)	21,670,556	(52,901,368)
කොටස් නිකුතුවෙන් ලද මුදල්		5,000,000	5,000,000	5,000,000	5,000,000
ණයකර නිකුතුවෙන් ලද මුදල්		12,000,000	10,000,000	12,000,000	12,000,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(4,090,400)	(9,501,723)	(5,650,894)	(10,867,381)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(4,846,410)	(12,346,410)	(4,846,410)	(12,346,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		-	-	(12,694)	(1,931)
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(12,795,159)	(17,320,884)	(13,920,739)	(18,093,765)
මූල්‍ය කටයුතු වලින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්		**19,983,423**	**(73,822,216)**	**14,239,819**	**(77,210,855)**
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		5,860,338	4,833,070	686,075	4,477,628
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		71,731,508	66,898,438	76,902,695	72,425,067
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		**77,591,846**	**71,731,508**	**77,588,770**	**76,902,695**
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	21	78,447,577	72,843,108	78,558,031	78,005,362
බැංකු අයිරා	38	(855,731)	(1,111,600)	(969,261)	(1,102,667)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		**77,591,846**	**71,731,508**	**77,588,770**	**76,902,695**

පිටු අංක 206 සිට 392 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවත, ලංකා බැංකු චතුරස්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. 2018 දෙසැම්බර් 31 දිනට සේවකයින් 8,724 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ (2017 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 7,587 කි).

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2018 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිවාසිකම් අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම හැර සමූහයේ අනෙකුත් සමාගම්වල ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ අවසාන මට් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ ධනය කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, සංස්ථාපිත හා සිල්ලර ණය, සංස්ථාපිත වෙළඳ මූල්‍ය උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපොළ ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, දේපල ආශ්‍රිත සේවා, උකස් සේවා සහ තැන්පතු බාරගැනීම.
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03 බී ඕ සී මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල නඩත්තුව සහ ඉඩ පහසුකම් කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික)සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස්	සංචාරක සහ ආගන්තුක නිවහන් පහසුකම් පවත්වාගෙන යාම.
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ පොදු රක්ෂණ සේවා සැපයීම.
සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම	ජල විදුලි උත්පාදනය.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, සිල්ලර සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍යන සේවා සැපයීමේ නිරතව සිටී.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ පෞද්ගලික ආයෝජන කළඹයන් කළමනාකරණය
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ ගනුදෙනු, ණය ගනුදෙනු සහ ආන්තික ගනුදෙනුවල යෙදේ
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම	ගොඩනැගිලි සහ වත්කම් කුලියට දීම
සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත

අදාළ වර්ෂය තුළ දී බැංකුවේ, පරිපාලිතයන් හි සහ ආශ්‍රිතයන්හි මූලික ක්‍රියාකාරකම්වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනසක් සිදු වී නැත. සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, 2007 වසරේ සිට සිය මූලික ව්‍යාපාර කටයුතු කර නැති අතර සමාගම ඈවර කිරීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර ඇත. සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පහත ප්‍රකාශනයන්ගෙන් සමන්විත වේ.

- ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- විස්තීරණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 මාර්තු 19 වන දින අනුමත කරන ලදී.

3. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර හා වාර්තා කර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2018 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙල කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2017 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද 2019 අංක 2 දරණ බලපත්‍ර ලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළි දරව් කිරීම් ප්‍රසිද්ධ කිරීමට අදාල චක්‍ර ලේඛනය මඟින් නියම කර ඇති ආකෘතියට අනුගත වෙමින් මූල්‍ය වාර්තා හා අනෙකුත් හෙළිදරව් කිරීම් සඳහා ආකෘති භාවිතා කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට වෛතිහාසික පිරිවැය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පදනම මත පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත:

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම (සටහන් අංක 25 සහ 40)
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණ/වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින (සටහන් අංක 26)
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්/ ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ/ මූල්‍ය ආයෝජන - ණය සහ ලැබිය යුතු දෑ/මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින (සටහන් අංක 27 සහ 28)
- මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින(සටහන් අංක 29)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයේ චිනම් ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කළ අගයට වාර්තා කෙරේ (සටහන් අංක 33)
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් (සටහන් අංක 41, 42,43 සහ 48)
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලින් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කරනු ලැබේ (සටහන් අංක 47)

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතම එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළ ගස්වා ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 ක් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිලිබඳ විස්තරයක් සටහන් අංක 58 , වත්කම් හා වගකීම් පරිනත විශ්ලේෂණය හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමූහයේ ව්‍යවහාර මෙන්ම වාර්තාකරණ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3.3.2 උපචිත පදනම් මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධ පාර්ශ්වයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මඟින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ:

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතර
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට සහ එහි පාර්ශ්වයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මඟින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සඳහන් කර ඇති විටක පමණක් ඒකාබද්ධ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමීව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම් වලට අනුකූලව පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතිය යටතට ගැනෙන මූල්‍ය උපකරණවල 2017 වර්ෂයට අදාල සංසන්දනාත්මක තොරතුරු සමූහය විසින් සංශෝධනය කර ඇත. 2017 වර්ෂයට අදාල සංසන්දනාත්මක තොරතුරු ලං. ගි. ප්‍ර. 39 මූල්‍ය උපකරණ හඳුනා ගැනීම සහ මැනීම ප්‍රමිතියට අනුව වාර්තා කර ඇති අතර 2018 වර්ෂයට අදාලව ඉදිරිපත් කර ඇති තොරතුරු සමග සංසන්දනය කල නොහැක.
ශ්‍රී ලං. ම. වා. ප්‍ර. 9 යොදා ගැනීම නිසා ඇතිවන වෙනස්කම් 2018 ජනවාරි පළමු දිනට අදාලව හිමිකමට ගලපා ඇති අතර සටහන් 62 පරිවර්තන හෙළිදරව් කිරීම් යටතේ ඉදිරිපත් කර ඇත.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුකූලව, සමාන අයිතමයන්හි සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. ප්‍රමාණාත්මක විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක, ලං. ගි. ප්‍ර. 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුව සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන ප්‍රමිතියට අනුව ලාභයට ගැලපීම් කර මෙහෙයුම් මුදල් ප්‍රවාහ ගණනය කිරීම් වක්‍ර ක්‍රමයට සිදු කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ යටතට අතැති මුදල්, ද්‍රවශීලතාවයෙන් ඉහල දින 7 කට අඩු කාලයකදී පරිණත ආයෝජන සහ බැංකු අයිරා අයත්වේ.

3.3.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක. විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත. උපකල්පන ඇස්තමේන්තු සහ තීරණයන් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.3.8.1 අබණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අබණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බව කළමනාකාරිත්වය උපකල්පනය කරයි. තවද සමූහයෙහි අබණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු අවිශ්වාසයක් සහ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇත.

3.3.8.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම හඳුනාගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි වගකීම්ය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණ කිරීමක් කෙරේ.

3.3.8.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

වෙළඳපල ගනුදෙනුකරුවන් අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක් ලෙස වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් පියවීමට ගෙවන මුදල සාධාරණ අගය වේ.

සාධාරණ අගයට වර්ගකරණ වත්කම් වල හෝ වගකීම් වල සාධාරණ අගය ආසන්නව ලබාගත හැක. ක්‍රියාකාරී වෙළඳපොළක ඇති ඉල්ලුම් මිල හෝ ඉදිරිපත් කරන මිල ලෙස තක්සේරු කරනු ලැබේ.

කිසියම් වත්කමකට හෝ වගකීමක අදාලව ක්‍රියාකාරී වෙළඳපොළක් නොමැති අවස්ථාවල එම වත්කම් වල හෝ වගකීම්කීම් වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා ගණිතමය තක්සේරු ක්‍රම ආසන්නව සිදුවූ සාධාරණ ගනුදෙනුවල තීරණය වූ මිල, වට්ටම් කල මුදල් ප්‍රවාහ විශ්ලේෂණය මිල කිරීම් ආදී තක්සේරු ක්‍රම යොදා ගනී.

මෙම අගය කිරීමේ ක්‍රමවලදී අවම වශයෙන් ආයතනයට විශේෂ වූ යෙදවුම් පදනම් වන අතර උපරිම වශයෙන් හඳුනාගත හැකි වෙළඳපොළ යෙදවුම් යොදාගනී.

මූල්‍ය උපකරණයක් මුල් වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගය සඳහා ප්‍රශස්ථ පදනම ගනු දෙනු කරන ලද මිලයි. එසේ නොමැතිනම් එම මූල්‍ය උපකරණ වල හඳුනාගත් වෙලඳපලක වර්තමාන ගනුදෙනු මිල හෝ හඳුනාගත් වෙලඳපලක දත්ත පදනම් වල සිදු කරන අගය කිරීම් යොදාගනු ලැබේ.

සමූහය විසින් සාධාරණ අගය සහ ගනුදෙනු මිල අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හඳුනා ගනී. මූල්‍ය උපකරණ අගය කිරීම සවිස්තරාත්මකව සටහන් 61 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.3.8.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9 සහ ලං. ගි. ප්‍ර. 39 යටතේ ද මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමන වලට එළඹීමට සිදුවේ.

සෑම වාර්තා කරන දිනකට අදාලව සමුහය විසින් කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් ඇගයීමක් සිදු කරන අතර හානිකරණ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කෙරේ. හානිකරණ අලාභය ගණනයේදී මුදල් ප්‍රවාහ හා ඒවායේ කාලය තීරණය කිරීම සඳහා කළමනාකරණයට නිගමනයන්ට එළඹීමට සිදුවේ.

මෙම මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමේදී සමුහය විසින් ණයකරුගේ මූල්‍ය තත්වය උකස්කරයන් විකුණා ලැබිය හැකි මිල ආදී කරුණු සලකා බලයි.

සාධක බොහෝමයක් සඳහා සිදු කරනු ලබන උපකල්පන මත මෙම තක්සේරුව සිදු කරනු ලබන නිසා සත්‍ය ප්‍රතිඵල වෙනස් වීම මත හානිකරණ ප්‍රතිපාදන වලටද අනාගත වෙනස්කම් ඇති විය හැක.

කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක වුවත් හානිකරණය නොවූ ණය සහ අත්තිකාරම් සඳහා සමාන ලක්ෂණ සහිත කාණ්ඩ සඳහා සමූහ හානිකරණ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහ හානිකරණ ඇගයීමේදී ණය කළඹයන්හි ණයවල ගුණාත්වය, හිඟ මට්ටම, ණය භාවිතය ආදිය සහ අවදානමට යොමු වීම, විරැකියාව උද්ධමනය, දළ දේශීය නිෂ්පාදන වර්ධනය ආදී ආර්ථික දත්තයන්ද සැලකිල්ලට ගෙන ඇත.

ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9, අපේක්ෂිත ණය හානි ක්‍රමය පදනම්ව ණය හානි අවශ්‍යතා හඳුන්වා දී ඇති අතර එමඟින් මූල්‍ය උපකරණ වල ණය ගුණාත්මකතාවයේ වර්ධනය හෝ අඩුවීම නිරූපනය වේ.

සමුහය විසින් කේවල වශයෙන් හෝ සමුහ වශයෙන් අපේක්ෂිත අලාභය ගණනය කරනු ලැබේ.

මුලික හඳුනා ගැනීමේදී සිට ණය වල ගුණාත්වය පහළ යාම පදනම්ව ණය හානිකරණය හෝ වෙන් කිරීම් ලෙස අපේක්ෂිත අලාභ ප්‍රමාණය හඳුනා ගන්නා අතර එය පහත පරිදි ගණනය කරනු ලැබේ.

- ඉදිරි මාස 12 තුල අපේක්ෂිත අලාභ (මට්ටම 1) සැලකිය යුතු ලෙස ණය අවදානම් අඩු තත්වයක්
- ආයු කාලය පුරා අපේක්ෂිත ණය අවදානම (මට්ටම 2 සහ මට්ටම 3), තනි තනි වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් ණය අවදානම ඉහල ගොස් ඇති විට මෙම ක්‍රමය යොදා ගනේ.
- සමුහය විසින් අපේක්ෂිත අලාභ ක්‍රමයට අදාලව පහත සඳහන් අමතර නිගමනයන් හා තක්සේරුවක් සිදු කර ඇත.
- මූල්‍ය වත්කම් වල ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්නම් ඒවා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අවදානම් පදනමට අඟය කල යුතුය.
- අපේක්ෂිත ණය අවදානම් ආකෘතින් ගොඩ නැගීමේදී විවිධ සමීකරණ සහ යෙදවුම් වල තෝරා ගැනීම් සිදු කල යුතුය.
- අනාගතය උපකල්පිත සර්ව ආර්ථික තත්වයන් සහ අපේක්ෂිත ණය අවදානම් ආකෘතියට හරිත සම්භාවිත බලපෑම

ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9 අනුව සමාන ලක්ෂණ සහිත ණය සඳහා සමුහ වෙන්කිරීම සංඛ්‍යාත්මක ආකෘතියක් (ශුද්ධ ප්‍රවාහ අනුපාතය වැනි) හෝ අතීත පාඩු අනුපත අත්දැකීම් පදනම් සමීකරණ ප්‍රවේශය හිඟ හිටි දින පිලිබඳ තොරතුරු පදනම්ව අලාභ ප්‍රමාණය තීරණය කිරීම සඳහා සංඛ්‍යාන විශ්ලේෂණය ක්‍රමයද යොදා ගනී.

අලාභ ඇස්තමේන්තුව තහවුරු කර ගැනීම සඳහා වාර්තා කරන දිනයට ගැලපෙන ආකාරයට ආර්ථික තත්වයන් සහ කළඹේ කරුණු ගැලපීම සඳහා අතීත තොරතුරු ගලපනු ලැබේ. අලාභ ප්‍රතිශත සත්‍ය අලාභ සමග නිරතුරුව සසඳා බලනු ලැබේ.

සත්‍ය අලාභ අත්දැකීම් පදනම්ව ආකෘති කාලානුරූප ඇගයීම් සිදු කිරීම හා ගැලපීම් සිදු කිරීම සමුහයේ ප්‍රතිපත්තියයි.

ආකෘතිවල යොදාගන්න උපකල්පන සහ හානිකරණ පරිමිතින්වල නිවැරදිතාවය මත වෙන්කිරීම් වල නිවැරදිතාවය තීරණය වේ.

ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ පිලිබඳ තොරතුරු සටහන් 14 දක්වා ඇත.

3.3.8.5 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං. ගි. ප්‍ර. 36 "වත්කම් සඳහා හානිකරණය" හා ශ්‍රී ලං. ගි. ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" ප්‍රමිතියන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක පොත් අගයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර වම හානිකරණය තීරණය කිරීම හා මැනීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මඟින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. වම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම තීරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර බණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වාභාවය, කර්මාන්ත, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහය සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් උපකාරී වේ. මෙම ගිණුම්කරණ විනිශ්චයන් ඒ ඒ අදාළ සටහන්වල දක්වා ඇත.

3.3.8.6 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත.

වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල කාලපරිච්ඡේදයන්ට සමාන ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර වල පොලී අනුපාතය සලකා බලයි.

උපත් හා මරණ අනුපාතය සඳහා ප්‍රසිද්ධ කර ඇති උපත් හා මරණ අනුපාත වගු යොදා ගෙන ඇත. වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම, අනාගත උද්ධමන අනුපාතය පදනම් වී ඇත.

සෑම උපකල්පනයක්ම සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර වර්ෂය තුලදී යොදාගත් උපකල්පන සටහන් 47 හි දක්වා ඇත.

3.3.8.7 ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි සාධාරණ අගය මත සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13 "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපල වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 33 හි දක්වා ඇත.

3.3.8.8 දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවිත කාලය

දේපල, පිරියත සහ උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රතිශතයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් වම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 33 හි දක්වා ඇත.

3.3.8.9 ආයෝජන දේපල වර්ග කිරීම

ආයෝජන දේපලක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චයක් අවශ්‍ය වේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපල තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් වම දේපල ආයෝජන දේපලක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන වක වල්ලේ මුදල් ප්‍රවාහ ජනනය කරනු නොලබන වත්කම්, දේපල පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.8.10 ආයෝජිතයන් පාලනය තීරණය කිරීම

බැංකුව විසින් වහි ආයෝජිතයන් පාලනය කිරීම තීරණය කිරීම පිළිබඳව කළමනාකරණ විනිශ්චයන්ට එළඹීමට සිදුවන අතර ඒ පිළිබඳ විස්තර සටහන් 30 සහ 31 හි දක්වා ඇත.

3.3.8.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද (DRL) ඇතුළුව අනෙකුත් අදාල බදු ගෙවිය යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා වම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම හා විලම්බිත බදු වගකීමට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 4.9, 17 සහ 36 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම තීරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගනුදෙනු, සාධාරණ මිල තීරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම තීරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී. ප්‍රවර්තන බදු වියදම තුළ මෙම විනිශ්චයන් ඇතුළත් වේ. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරිත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා බදු රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක් වේ. විශේෂයෙන් සඳහන් වන අවස්ථාවක දී හැර අන් සෑම විටකම පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ දී සෑම කාලපරිච්ඡේදයක් සඳහාම අඛණ්ඩව භාවිතා කර ඇත. සමූහය විසින් භාවිතා කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති විස්තරාත්මකව අදාල සටහන් තුළ සඳහන් කර ඇත.

4.1 2018 ජනවාරි 1 වන දින සිට බල පැවැත්වෙන පරිදි පනවා ඇති/ සංශෝධන ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ, ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 7 මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම් (සංශෝධන) සහ ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 15 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මත ආදායම යන ගිණුම්කරණ ප්‍රමිති 2018 ජනවාරි 1 ආරම්භවන වාර්ෂික ගිණුම් කාලපරිච්ඡේදයට අදාලව සමූහය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ වලට පළමු වරට අදාල කරගෙන ඇත.

නිකුත්කර ඇති එහෙත් බලපැවැත් නොවෙන වෙනත් කිසිම ගිණුම්කරණ ප්‍රමිතියක් සමූහය විසින් කලින් අනුගත වී නොමැත.

4.1.1 ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ

2014 දෙසැම්බර් මසදී ලං. ගි. ප්‍ර. 39 ඉවත්කර ඒ වෙනුවට ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ප්‍රමිතිය 2018 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන වාර්ෂික කලපරිච්ඡේද වලට අදාලව නිකුත් කර ඇත. මූල්‍ය උපකරණ වර්ගීකරණය,මැනීම සහ චිම උපකරණ වලට හානිකරණ අලාභ තක්සේරුවට අදාලව ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 මඟින් සැලකිය යුතු වෙනස්කම් රැසක් සිදු කර ඇත. මෙම වෙනස්කම් සටහන් 4.1.1.1 සහ 4.1.1.2 හි විස්තර කර ඇත.

4.1.1.1 වර්ගීකරණය සහ මැනීමට අදාලව සිදු වූ වෙනස්කම්

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුව හිමිකම් උපකරණ හා ව්‍යුත්පන්න හැර මූල්‍ය වත්කම් අදාල කාණ්ඩය තොරා ගැනීම සඳහා චිම උපකරණ කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහවල ස්වභාවය පිලිබඳ සලකා බැලිය යුතුය.

ලං. ගි. ප්‍ර. 39 අනුව පැවති මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මැනීම (ලාභ හෝ අලාභ ප්‍රකාශනය හරහා සාධාරණ අගයට, උපලබ්ධිය සඳහා පවතින, කල්පිරෙන තෙක් දරා සිටින සහ ණය හා ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය පිරිවැයට) ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුව පහත පරිදි වර්ගීකරණය සහ මැනීම සිදු කෙරේ;

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්
- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට අගය කල මූල්‍ය වත්කම්

මූල්‍ය වගකීම් වලට අදාලව ලං. ගි. ප්‍ර. 39 පැවති ගිණුම්කරණ ක්‍රමයන් ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුව සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත. කෙසේ වෙතත් ලං. ගි. ප්‍ර. 39 යටතේ සාධාරණ අගය යටතේ හඳුනාගන්නා වගකීම් වල සාධාරණ අගයේ වෙනස් වීම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වාර්තා කල යුතුයි. ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යටතේ සාධාරණ අගයේ වෙනස්කම් පහත පරිදි ඉදිරිපත් කල යුතුය:

- ණය අවදානමේ වෙනස්කම් නිසා සාධාරණ අගයේ වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ඉදිරිපත් කල යුතුය,
- ඉතිරි සාධාරණ අගයේ වෙනස්වීම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගැලපිය යුතුය.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යටතේ මූල්‍ය වගකීම් වර්ගීකරණය කරන ආකාරය සටහන් 4.5.2.2 යටතේ විස්තර කර ඇත.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යටතේ මූල්‍ය වත්කම සමඟ බැඳී ඇති ව්‍යුත්පන්න වෙනම ව්‍යුත්පන්න ලෙස සැලකීම නතර කර ඇත. සටහන 4.5.5 සහ 4.5.6 දක්වා ඇති පරිදි එවැනි මූල්‍ය උපකරණ ව්‍යාපාර ආකෘති ක්‍රමය හා ඒවායේ බැඳීම් නියමයන් අනුව වර්ග කරනු ලැබේ.

මූල්‍ය වගකීම් වල අන්තර්ගතව ඇති ව්‍යුත්පන්න සහ මූල්‍ය නොවන ගිවිසුම් ගිණුම්කරණය කරන ආකාරයෙත් වෙනසක් සිදු වී නොමැත. සමූහයේ ව්‍යුත්පන්න සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 25 සහ 40 හි දක්වා ඇත.

මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මැනීම සඳහා පදනම් වන සාධක සහ තත්වයන් පහත දක්වා ඇත.

- මූල්‍ය වත්කම් වලට අදාල ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීම.
- මූල්‍ය වත්කම් හඳුනා ගැනීම හෝ කලින් හඳුනා ගත් මූල්‍ය වත්කම් නැවත හඳුනාගත් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට සාධාරණ අගයට ගැනීම.
- වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා නොසිටින ප්‍රාග්ධන උපකරණ සාධාරණ අගයට වෙනත් විස්තීර්ණ ආදායමට හඳුනා ගැනීම.
- සාධාරණ අගයට ලාභ හෝ අලාභ ප්‍රකාශනයට මූල්‍ය වගකීම් වාර්තා කිරීම, මූල්‍ය වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම, වෙනත් විස්තීර්ණ ආදායමට වාර්තා කිරීම ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ගිණුම්කරණයේ නොගැලපීම ඇති කිරීමට හෝ වැඩි කිරීමට හේතුවේ.

සමූහයේ මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය සටහන් 4.5.2.1 හි සහ 4.5.2.2 හි දක්වා ඇත. 2018 ජනවාරි 1 දින ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යොදාගැනීම නිසා ඇතිවන ප්‍රමාණාත්මක බලපෑම සටහන් 62 යටතේ දක්වා ඇත.

4.1.1.2 හානිකරණය ගණනය කිරීමේ ක්‍රමවේදයේ සිදු වූ වෙනස්කම්

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යොදා ගැනීම නිසා සමූහයේ ණය හානිකරන අලාභ වාර්තා කිරීමේ ක්‍රමය ලං. ගි. ප්‍ර. 39 අනුව පැවති ඇතිවූ අලාභ ක්‍රමයේ සිට අපේක්ෂිත අලාභ ක්‍රමයට වෙනස් වී ඇත.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 අනුව සියලුම ණය, ලාභ හෝ අලාභ ප්‍රකාශන හරහා සාධාරණ අගයට වාර්තාකරණ මූල්‍ය උපකරණ හැර වෙනත් ණය, හිමිකම් මත ආයෝජන හැර අනෙක් ණය බැඳීම් සහ මූල්‍ය ඇප ගිවිසුම් ආදිය සඳහා අපේක්ෂිත අලාභ සඳහා වෙන් කිරීම් සිදු කල යුතුය.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 ට අනුව ණය හානිකරණ අලාභය ලං. ගි. ප්‍ර. 39 ට වඩා කලින් හඳුනාගෙන වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

පළමු වාර්තා කළ දිනයේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී නොමැති නම් අපේක්ෂිත අලාභ සඳහා වෙන්කිරීම් ඉදිරි මාස 12 ක කාලය සඳහා පැහැර හැරීමේ සම්භාවිතාව යොදාගෙන අපේක්ෂිත අලාභ සඳහා වෙන් කිරීම සිදු කෙරේ.

පළමු වාර්තා කල දිනයේ සිට සැලකීමේදී ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත්නම් ගිවිසුම්ගත මුළු කාලය සඳහාම අපේක්ෂිත අලාභ සඳහා වෙන් කිරීම් සිදු කරනු ලැබේ. මූල්‍ය වත්කම් ණය හානිකරණයකට ලක්වී ඇත්නම් ඒවා සඳහා ගිවිසුම්ගත මුළු කාලය සඳහාම අපේක්ෂිත අලාභ සඳහා වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

සමූහයේ ණය හානිකරණ ක්‍රමයන් පිළිබඳ විස්තර සටහන් 27 යටතේ හෙළිදරව් කර ඇත.

4.1.2 ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 7 - මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීමේ (සංශෝධිත)

සමූහය විසින් 2018 ජනවාරි 1 දින සිට ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 සමඟ ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 7, ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 හා ලං. ගි. ප්‍ර. 39 අතර වෙනස් වීම් පිළිඹිබු කිරීමට භාවිතයට ගෙන ඇත.

පරිවර්තන හෙළිදරව් කිරීම් සටහන් 62 දක්වා ඇති අතර අපේක්ෂිත අලාභ ගණනය කිරීම සඳහා යොදාගත් උපකල්පන සහ යෙදවුම් තොරතුරු පිලිබඳ, ප්‍රමිතිය අනුව කල යුතු හෙළිදරව් කිරීම් සටහන් 27 යටතේ දක්වා ඇත.

අපේක්ෂිත අලාභ වෙන් කිරීම් වල වර්ෂය තුල වෙනස්වීම් සටහන් 27 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.1.3 ශ්‍රී ලං. මූ. වා. ප්‍ර 15 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මත ආදායම

2018 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේද සඳහා මෙම ප්‍රමිතිය අනුගමනය කල යුතුය.
ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 15 හි ප්‍රධාන මූලධර්මය වන්නේ විකඟ වූ භාණ්ඩ හෝ සේවා ගනුදෙනුකරු වෙත මාරුවූ අවස්ථාවේදී ආදායම හඳුනා ගත හැකිය යන මූලධර්මයි. පහත දක්වා ඇති පරිදි පස් පියවර ආකෘතියකින් මෙම මූලධර්මය ගොඩනඟා ඇත.

- ගනුදෙනුකරු සමග ගිවිසුම/ ගිවිසුම් හඳුනා ගැනීම.
- ගිවිසුම් අනුව සම්පූර්ණ කිරීමට බැඳී සිටින බැඳීම්.
- ගනුදෙනු මිල තීරණය කිරීම.
- ගිවිසුම අනුව සම්පූර්ණ කිරීමට ඇති බැඳීම් වලට ගනුදෙනු මිල අදාල කිරීම.
- ව්‍යාපාරය විසින් සම්පූර්ණ කර ඇති බැඳීම් අනුව ආදායම හඳුනා ගැනීම.

මෙම මඟ පෙන්වීම ගනුදෙනුකරු සමග ඇති ගිවිසුමේ සාධක සහ තත්ත්වය අනුව අනුගමනය කිරීම තීරණය වන අතර විනිශ්චයන්ටද එලඹීමට සිදුවේ. ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 15 යොදා ගැනීම නිසා සමූහයේ 2018 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන වර්ෂයට අදාලව ආදායම සඳහා සැලකිය යුතු බලපෑමක් නොමැත.

4.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 10 - "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 "ඒකාබද්ධ සහ කේවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං. ගි. ප්‍ර. 28 " ආශ්‍රිතයන් සහ ඒකාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 30 හා 31 යටතේ දක්වා ඇත.

4.2.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 3 "ව්‍යාපාර සංයෝජනය" හි නිර්වචනයට අනුකූලව ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාරයක්ද යන වග නිර්නය කරනු ලැබේ. ඒ අනුව ව්‍යාපාර කටයුත්තක් සඳහා දේපල අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම අත්‍යවශ්‍ය වේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත්නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය නීති උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර දෙපාර්තමේන්තු අත්පත් කරගැනීමේ සහ පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරුකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරුකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම් සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරූ විට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරන ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරුකුම්පත් සඳහා ගැණුනු වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගැනේ.

4.2.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම් ඉවත් කරගන්නා අතර ඒ අනුව පාලනයට යටත් නොවන හිමිකම්වල ධාරණ අගය සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් පරිපාලිතයන්ගේ ස්කන්ධයට ගලපනු ලැබේ. තවද වෙනත් විස්තීරණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේනම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශනයට හෝ රඳවාගත් ඉපයුමට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම්

ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන්පසුව සමූහයට අදාළව රඳවාගත් හිමිකම මූල්‍ය ප්‍රකාශනවල සමූහයේ මූල්‍ය උපකරණවලට අදාළ හිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව හෝ ආයෝජිතයන්ගේ ස්කන්ධය මත ගණනය කරනු ලැබේ.

4.3 විදේශ මුදල් පරිවර්තනය

4.3.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල්වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල්වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ වෙනස්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් 13 - "ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම්" යටතේ සටහන් කරනු ලැබේ. විදේශ මුදල්වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය.

විදේශ මුදල්වලින් වෛතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව මුලින්ම සිදු වන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල්වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය වෙනස්කම් ඇතුළු ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපොල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.3.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි.

යම් විදේශ මෙහෙයුමක් ඉවත් කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.4 මූල්‍ය උපකරණ ණය සහ ස්කන්ධ ලෙස වර්ග කිරීම

පහත සඳහන් ලක්ෂණ පදනම්ව මූල්‍ය උපකරණ වර්ග කෙරේ.

- මූල්‍ය උපකරණයට දී ඇති නම
- ස්ථිර පරිනත දිනයක් ඇති හෝ නොමැති බව
- උපකරණයේ ආයු කාලය
- ගෙවීමේ ප්‍රභව
- ගෙවීම් ලබා ගැනීම සඳහා බලපෑම් කිරීමේ අයිතිය
- කළමනාකරණයට සහභාගීවීමේ අයිතිය
- උපකරණ සමඟ බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහ වල විචලනය
- සුරැකුම් ලෙස දී ඇති දෑ

4.5 මූල්‍ය වත්කම් සහ වගකීම්

4.5.1 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා බැහැර කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් ගෙවීම් සිදු කරන දිනයේදී මුලිකව හඳුනා ගනී. එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමුහය පාර්ශ්වකරුවෙකු බවට පත් වන දිනයයි. "ක්‍රමවත් ආකාරයේ වෙළඳාම" මෙයට ඇතුලත් වේ. ක්‍රමවත් ආකාරයේ වෙළඳාම යනු වෙළඳපල තුළ සාමාන්‍යයෙන් පවතින සම්මුතීන් හා නියාමනයන් අනුව ස්ථාපනය කර ඇති කාල රාමුව අනුව වත්කම් ලබාදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීමයි. ණය හිමියන්ට මුදල් අත්තිකාරම් ලබා දුන් විට (හෝ ගෙවූ විට) ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මුලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට හඳුනා ගනී.

වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහ කල් පිරෙන විට හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස හුවමාරු වන ගනුදෙනුවකින් මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය හුවමාරු වේ නම්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සමුහය විසින් මූල්‍ය වත්කම් බැහැර කරයි. නුවමාරු කල මූල්‍ය වත්කමක ඇති වූ හෝ රඳවාගත් අයිතියක් ඇත්නම් සමුහය විසින් එය වෙනමම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

වගකීම සඳහා ඇති බැඳියාව නිදහස් කල විට හෝ අවලංගු වූ විට හෝ කල් පිරි ඇති විට මූල්‍ය වගකීම් බැහැර කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණය දෙන්නාගෙන් ප්‍රමාණවත් ලෙස වෙනත් වගකීමකින් වෙනස් වූ කොන්දේසි වලින් ප්‍රතිෂ්ඨාපනය කරන විට හෝ පවතින වගකීමේ කොන්දේසි ප්‍රමාණවත් ලෙස සංශෝධනය කර ඇත්නම් එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම බැහැර කිරීමක් ලෙස සලකා නව වගකීමක් හඳුනා ගනී. මුල් මූල්‍ය වගකීම පවත්වාගෙන යාමේ වටිනාකම හා ගෙවූ ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.5.2 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 අනුව මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා පවතින සමුහයේ ව්‍යාපාර ආකෘතිය හා මූල්‍ය වත්කම් වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ. බැංකුව මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන ආකාරය පහත රූප සටහන මඟින් නිරූපණය කෙරේ.



4.5.2.1 ආරම්භයේදී මූල්‍ය වත්කම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි.

- ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අඟය කරන මූල්‍ය වත්කම් (සටහන 4.5.7 සහ 26)
- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම්

  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 27)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (සටහන 4.5.8 සහ 28)
- වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ වටිනාකමට අඟය කරන මූල්‍ය වත්කම් (සටහන 4.5.9 සහ 29)

4.5.2.2 ආරම්භයේදී මූල්‍ය වගකීම් පහත වර්ගීකරණයන්ගෙන් එකකට වර්ග කරනු ලබයි.

- ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම්

  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවිය යුතු (සටහන 41)
  - ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් හා යටත්කාලීන උපකරණ (සටහන 42 සහ 48)

4.5.3 මූල්‍ය උපකරණයන් මුලිකව අඟය කිරීම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කර ඇති අවස්ථාවලදී හැර මූල්‍ය වත්කම් හා වගකීම් ඒවායේ සාධාරණ වටිනාකම හා ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට මුලිකව අඟය කරයි. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වලට අදාල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

4.5.4 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනු වන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපොළ දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන් හි දී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.5.5 ව්‍යාපාර ආකෘති ඇගයීම

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 අනුව, 2018 ජනවාරි 1 දින සිට බල පැවැත්වෙන පරිදි, සමූහය විසින් සිය ව්‍යාපාර ආකෘතිය හා එහි අරමුණු පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබයි. එහෙත් එය වත්කම වෙන වෙනම ඇගයීම සිදු නොකරනු ලබන අතර වත්කම් කළඹ වශයෙන් ව්‍යාපාර ආකෘතිය සමඟ සසඳා වර්ගීකරණය කරනු ලබයි. එයට හේතු වන්නේ ව්‍යාපාරය කළමනාකරණය කරන ක්‍රමය සහ කළමනාකරණයට තොරතුරු ගලාගෙන යන ආකාරය මෙය වන බැවිණි.

මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා සලකා බලන තොරතුරු පහත දැක්වේ.

- ආයෝජන කළඹ සඳහා අදාල වන ප්‍රතිපත්ති හා අරමුණු හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය, විශේෂයෙන්ම, ගිවිසුම් ගත පොළී ආදායම උපයා ගැනීම, විශේෂිත පොළී අනුපාතයක් පවත්වා ගැනීම, වත්කම් ආයෝජනය කර ඇති කාලසීමාව හා එම වත්කම් සඳහා අරමුදල් ප්‍රතිග්‍රහණය කරණු ලබන වගකීම් වල කාලසීමාව සංසන්දනය කිරීම හෝ මුදල් ප්‍රමාණය ගණනය කරගැනීම සඳහා වත්කම් විකිණීම වැනි කටයුතු කෙරෙහි කළමනාකාරිත්වයේ උපායමාර්ග අවධානය යොමුකරයි.

- ආයෝජන කළඹේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්නේ කෙසේද යන්න සහ බැංකුවේ කළමනාකාරිත්වයට වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව

- ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරිත්යවට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ පවත්වා ගෙන යන මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න

- ව්‍යාපාර කළමනාකරුවන් හානිපූරණය වන්නේ කෙසේද? එනම් කළමනාකරණය කරන වත්කම් වල සාධාරණ අගය මත පදනම්ව හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම මඟින් හානිපූරණය සිදු වේද යන්න හා

- පෙර වර්ෂ වලදී මූල්‍ය වත්කම් විකුණු වාර ගණන, ප්‍රමාණය සහ කාල සීමා, මෙම විකිණීම් වලට බලපාන ලද හේතු සහ අනාගතයේදී වත්කම් විකිණීමට ඇති අපේක්ෂාවන් . කෙසේ වෙතත්, අලෙවිකරණ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හුදෙකලාව නොසැලකේ. එහෙත් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම තුළින් බැංකුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සමස්ත තක්සේරුවක් කරනු ලැබේ.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරුකර ඇත්තේ 'හානිකර අවස්ථාව' හෝ 'ආතති අවස්ථාව' යන කරුණු සලකා නොගෙන සාධාරණ අපේක්ෂිත සිදුවීම් මතය. මූලික හඳුනාගැනීමකින් පසුව මූල්‍ය වත්කම් වලට අපේක්ෂිත මුදල් ප්‍රවාහයේ මූලික වෙනසක් සිදු වූවත්, බැංකුව විසින් ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණයේ වෙනස් කිරීමක් සිදු නොකරනු ලැබේ. එහෙත් අළුතින් මිලදී ගන්නා මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී ඉහත අපේක්ෂාවන්ගේ වෙනස් වීම සැලකිල්ලට ගනු ලැබේ.

4.5.6 ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන්හි පොළිය හා මූලික මුදල් පමණක් ගෙවීමේ ලක්ෂණයන්ගෙන් යුක්ත දැයි තක්සේරු කිරීම (SPPI පරීක්ෂණය)

වත්කම් වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස, මූල්‍ය වත්කම් SPPI පරීක්ෂණය සමත් වන්නේ දැයි සොයා බැලීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම් ගත නියමයන් ගණනය කරනු ලැබේ.

මෙම තක්සේරුව සිදු කිරීම සඳහා 'මූලික මුදල' ලෙස අදාල මූල්‍ය වත්කම මූලික හඳුනාගැනීමේදී පොත්වල හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම් වල සාධාරණ අගය ලෙස අර්ථ දැකිවිය හැකිය. එමෙන්ම මෙම වටිනාකම මූල්‍ය වත්කමේ ආයු කාලය පුරා වෙනස් විය හැකිය (උදා: අධිමිල හෝ අවමිල ක්‍රමකෂය කිරීම හෝ මූලික මුදල කොටස් වශයෙන් ගෙවීම).

"පොළිය" නිර්වචනයට මුදලේ කාල වටිනාකම සහ ආයෝජනය කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා ණය අවදානම සහ පිරිවැය මෙන්ම ලාභයද ඇතුලත් වේ.

මීට අමතරව, මුදල් ප්‍රමාණය පොළී තුළ අන්තර්ගත ඉහත කරුණු වලට අමතරව යම්කිසි ප්‍රමාණයක මුදල් ප්‍රවාහ වෙන්කිරීමත් ණය අවදානම හෝ වෙනත් විචල්‍යයන් ලෙස අයකර ගනී නම් එවිට එම මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කරන මූල්‍ය වත්කම් ලෙස වර්ගකල යුතුය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුල අන්තර්ගත වන්නේ මූලික මුදල හා පොළිය පමණක්ද යන්න තීරණය කිරීමේදී, සමූහය උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි සලකා බලයි. මූල්‍ය වත්කමෙහි මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වෙලාව හෝ ප්‍රමාණය වෙනස් කල හැකි ගිවිසුම්ගත යෙදුමක් තිබේද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුලත් වේ. තක්සේරුව සිදු කිරීමේදී සමූහය පහත දෑ සලකා බලයි.

- මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම හා කාලය වෙනස් කරන අසම්භාව්‍ය සිද්ධීන්
- තෝලන ලක්ෂණ
- පෙරගෙවුම් හා දීර්ඝ කිරීමේ කොන්දේසි
- නිශ්චිත වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා සමූහයේ හිමිකම් සීමාකරණ නියමයන්
- මුදලේ කාල වටිනාකම සලකා බැලීම වෙනස් කරන ලක්ෂණ

4.5.7 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරන මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති අයිතමයන් ලෙස අඩංගු වන්නේ,

- වෙළඳපල ගනුදෙනු සඳහා පවතින අයිතමයන්
- ආරම්භක හඳුනාගැනීමේදී ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට විශේෂයෙන් නම් කල අයිතමයන් හා
- මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට පවත්වාගෙන යන මූල්‍ය උපකරණ මූලිකව හඳුනාගනු ලබන්නේ ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත් දැරෑ ගනුදෙනු පිරිවැය සමඟ සාධාරණ වටිනාකමටය. පසුව සාධාරණ වටිනාකමට අගය කරන අතර කිසියම් ලාභයක් හෝ අලාභයක් පැහැනගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට අගය කරන විටදී ණය අවධානමේ වෙනස් වීම් වලට අදාලව සාධාරණ අගයේ සංචලනයන් නිරූපනය වන පරිදි ප්‍රතිපාර්ශවයේ ණය ශක්‍යතාවය පිලිබිඹු වන පරිදි ණය තක්සේරුකරණ ගැලපුමක් සිදු කරයි.

4.5.7.1 වෙළඳ ගනුදෙනු සඳහා පවතින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයන් වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ග කරනුයේ විකිණීමේ අරමුණින් මූලිකවම අත්පත් කරගෙන ඇති නම් හෝ දරා ඇත්නම් හෝ නුදුරේදී නැවත මිලදී ගන්නේ නම් හෝ කෙටි කාලීනව ලාභ ලබා ගැනීමේ සාක්ෂි සහිත හා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ වල ආයෝජන කළඹේ කොටසක් වන හෝ සුදුසුකම් ලබන හෙජින් සම්බන්ධතාවයක් නොමැති ව්‍යුත්පන්න උපකරණයන් වන විටදීය.

වෙළඳ ව්‍යුත්පන්න හා වෙළඳ සුරුකුම්පත්, වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින ලෙස වර්ගීකරණය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට හඳුනාගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙළඳපළ ගනුදෙනු වලින් ලද ලාභ/ (අලාභ) (සටහන 10) හා ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය උපකරණ වලින් ලද ශුද්ධ ලාභ/ (අලාභ) (සටහන 11) යටතේ හඳුනා ගනී. වෙළඳපළ ගනුදෙනු සඳහා දරා සිටින මූල්‍ය උපකරණ වලින් ලද පොළී ආදායම ශුද්ධ පොළී ආදායම (සටහන 8) යටතේ හඳුනා ගන්නා අතර ලාභාංශ ආදායම ගෙවීමට ඇති අයිතිය ස්ථාපිත කර ඇති විට වෙළඳපළ ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/ (අලාභ) (සටහන 10) යටතේ හඳුනාගනී.

4.5.7.2 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කල හා නම් කල මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසු මූල්‍ය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කිරීම හා නම් කිරීම සිදු කල හැක. වෙනත් පදනමක් මත මූල්‍ය වත්කම් හා වගකීම් මිනුම් කරන විට ඇති වන මිණුම්කරණ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කරයි නම් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරයි නම් (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරයි) පමණක් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක.

- ධාරක ගිවිසුමේ සංයුක්ත ව්‍යුත්පන්න උපකරණ එකක් හෝ කිහිපයක් අවශ්‍ය වේ නම් හෝ
- ලේඛනගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමවේදය අනුව සාධාරණ වටනාකම පදනම මත මූල්‍ය වත්කම් හා වගකීම් දෙකම කළමනාකරණය හා එහි කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ නම් හෝ

ගිණුම්කරණ නොගැලපීම් සැලකිය යුතු ලෙස අඩු කල හොත් හෝ ඉවත් කල හොත් මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කල හැක.

මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට නම් කර ඇති විට හිරිකෂණය කල හැකි වෙළඳපොළ පොළී අනුපාතිකයන්ට ඉහළ ණය විභිදීම් වල වෙනස්වීම් හිරිකෂණය කිරීමෙන් සමූහයේ ණය ගුණාත්වයේ වෙනස්වීම් වලට ආරෝපිත සාධාරණ අගයේ සංචලනයන් ගණනය කර වෙනත් විස්තීරණ ආදායම් යටතේ වෙනමම ඉදිරිපත් කෙරේ.

4.5.7.3 මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම නිරූපණය නොවන ගිවිසුම් ගත කොන්දේසි සහිත ණය උපකරණයන්

මූලික මුදල හා පොළිය පමණක් ගෙවීම යන පරීක්ෂණයෙන් සමත් නොවන මූල්‍ය ණය උපකරණයන් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට ගිණුම් ගත කෙරේ.

4.5.8 ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම් ණය උපකරණ

පහත අවස්ථා වලදී ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දිනවලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොලිය පමණක් පිළිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමට තබා ගැනීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කරගන්නා විට

මෙම ණය උපකරණයන් මූලිකව හඳුනාගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර ඵලදායී පොලි අනුපාතය භාවිතා කිරීමෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුව හඳුනා ගනී. පහත සටහන 4.5.11 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තර කර ඇති අදියර තුනේ අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරනු ලබයි.

4.5.9 වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

4.5.9.1 ණය උපකරණ

පහත අවස්ථාවන්හිදී ණය උපකරණයන්හි ආයෝජන වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ වටිනාකමට අගය කරයි.

- ගිවිසුම් කොන්දේසි අනුව නිශ්චිත දින වලදී හිඟ හිටි මුදල මත මූලික මුදල හා පොලිය පමණක් පිළිබිඹු වන මුදල් ප්‍රවාහයන් ඇති විට හා
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමෙන් ව්‍යාපාර ආකෘතියේ අරමුණ ලඟා කර ගන්නා විට

මෙම ණය උපකරණ මූලිකව හඳුනා ගනු ලබන්නේ සාධාරණ වටිනාකම හා සෘජුව අදාල වන ගනුදෙනු පිරිවැය යන දෙකේ එකතුවට වන අතර පසුකාලීනව සාධාරණ වටිනාකමට හඳුනා ගනී. සාධාරණ වටිනාකමේ වෙනස්වීම මත ඇති වන ලාභ හා අලාභයන් ස්කන්ධයේ වෙනම කොටසක් යටතේ වෙනත් විස්තීරණ ආදායම යටතේ දක්වයි. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්ත්‍ය කිරීම්, පොලි ආදායම හා විදේශ විනිමය ලාභ හෝ අලාභයන් ලාභ හෝ අලාභ යටතේ හඳුනා ගනී. විකුණන අවස්ථාවේදී කලින් වෙනත් විස්තීරණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභයන් වෙනත් විස්තීරණ ආදායමේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.

ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් වලට භාවිතා කරන අදියර තුනේ අපේක්ෂිත ණය හානි ආකෘතිය මත පදනම්ව ණය හානිකරණය ගණනය කරයි. අපේක්ෂිත ණය හානි ආකෘතිය පහත සටහන 4.5.11 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තර කර ඇත.

4.5.9.2 ස්කන්ධ උපකරණ

වෙළඳපොළ ගනුදෙනු සඳහා පවතින හා ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 3 - "ව්‍යාපාර සංයෝජනය" යටතේ ව්‍යාපාර සංයෝජනය සඳහා සමුහය විසින් හඳුනාගන්නා අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාව සඳහා වන ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන හැර කළමනාකරණය විසින් වෙනස්කල නොහැකි විකල්පය තෝරාගෙන ඇතිවිට එම ස්කන්ධ උපකරණයන්ගේ ආයෝජන, වෙනත් විස්තීරණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරයි. වෙනත් විස්තීරණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට යන වෙනස් කල නොහැකි විකල්පය ආයෝජන කලඹයන් සඳහා කළමනාකරණය සලකා නොබලයි නම් එම ආයෝජන නිරායාසයෙන් ලාභ හෝ අලාභ තුලින් සාධාරණ වටිනාකමට අගය කල යුතුයි.

විකිණීමේදී වෙනත් විස්තීරණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභයට මාරු නොකරයි. කෙසේ වෙතත් සම්පූර්ණ විකිණීමකදී හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ වෙනත් විස්තීරණ ආදායම් සංචිතයේ සිට ස්කන්ධය තුල රඳවාගත් ඉපයීම් වලට මාරු කරයි. මෙම ආයෝජන වල ලාභාංශ ලාභ හෝ අලාභ යටතේ "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" (සටහන 13) යටතේ හඳුනා ගනී.

4.5.10 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපාර ආකෘතිය සමුහය විසින් වෙනස් කරන විටදී පමණක් සමුහය විසින් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරයි. ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සමුහය විසින් නැවත වර්ගීකරණය කරනු ලැබයි නම් නැවත වර්ගීකරණය කරන දිනයේ සිට අනාගතයට බලපාන පරිදි නැවත වර්ගීකරණය ගලපනු ලබයි. සමූහය කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ අලාභයන්ද ඇතුලත්ව) හෝ පොලිය නැවත සංශෝධනය සිදු නොකෙරේ.

නැවත වර්ගීකරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ සඳහා වන ගිණුම්කරණ පිළියම් පහත වගුව මඟින් සාරාංශ ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මුලික මිනුම් කිරීම	නැවත වර්ගීකරණය කිරීමෙන් පසු මිනුම් කිරීම	නැවත වර්ගීකරණය සඳහා වූ ප්‍රතිකර්මය
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම එහි නව දළ පවත්වාගෙන යාමේ වටිනාකම බවට පත් වේ. එම වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතය ගණනය කරයි. හානිකරණ අවශ්‍යතා සඳහා ආරම්භක අයදුම් දිනය ලෙස නැවත වර්ගීකරණය කල දිනය භාවිතා කරයි.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ අගය නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයට ඇති වත්කම් වල සාධාරණ වටිනාකම මත පදනම්ව ඵලදායී පොළී අනුපාතිකය තීරණය කරයි.
වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැයට	කලින් වෙනත් විස්තීරණ ආදායම යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ඉවත් කර මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන දිනයේ සාධාරණ වටිනාකමට ගලපනු ලැබේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිපලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානියට ගැලපීමක් සිදු කර නොමැත.
වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම නව පවත්වාගෙන යාමේ පිරිවැය බවට පත් වේ. නැවත වර්ගීකරණය කරන දිනයේ නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස කලින් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය ස්කන්ධයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරයි.
ක්‍රමක්ෂය පිරිවැයට	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට	නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම හා කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසින් ඇතිවන ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභය යටතේ හඳුනාගනී.
ක්‍රමක්ෂය පිරිවැයට	වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට	මූල්‍ය වත්කමක කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය හා නැවත වර්ගීකරණය කරන දිනයේ ඇති සාධාරණ වටිනාකම අතර වෙනසින් ඇතිවන ලාභය හෝ අලාභය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනී. නැවත වර්ගීකරණයේ ප්‍රතිපලයක් ලෙස සඵල පොළී අනුපාතිකයට හා අපේක්ෂිත ණය හානිය මැනීමට කිසිදු ගැලපීමක් සිදු කරනු නොලැබේ.

4.5.11 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මිනුම් නොකරන පහත සඳහන් වර්ගයේ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සඳහා සමූහය අදියර තුනක ප්‍රවේශයක් භාවිතා කරයි.

- වෙනත් විස්තීරණ ආදායම යටතේ සාධාරණ අගයට මනිනු ලබන හා ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන ණය උපකරණ;
- ණය බැඳීම්; සහ
- මූල්‍ය ඇප ගිවිසුම්

ස්කන්ධ ආයෝජන සඳහා කිසිදු අපේක්ෂිත ණය හානියක් හඳුනා නොගනී.

මූල්‍ය උපකරණයේ ඉතිරි ආයු කාලය පුරාවට සිදු වූ පැහැර හැරීමේ අවදානමෙහි සිදුවන වෙනස සැලකිල්ලට ගනිමින් මූල්‍ය උපකරණයන්ගේ ණය අවදානම ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදීම සමූහය විසින් තක්සේරු කරයි. මෙම ක්‍රියාවලිය මත පදනම්ව ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි වෙනස්වීම මත මූල්‍ය වත්කම් පහත සඳහන් අදියර තුන තුල සංක්‍රමණය වේ.

4.5.11.1 අදියර 1 - මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී නොමැති හා ආරම්භයේ සිට ණය හානිකරණය වී නොමැති නිරාවරණයන් සඳහා ඉදිරි මාස 12 තුල සිදුවිය හැකි පැහැර හැරීම් අවස්ථා වල සම්භාවිතාවය සඳහා වූ ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානියේ කොටස හඳුනා ගනී. සැලකිය යුතු ලෙස ණය පිරිහීමට ලක් නොවූ ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 සඳහා වූ අපේක්ෂිත ණය හානිය බැංකුව විසින් තීරණය කරයි.

4.5.11.2 අදියර 2 - ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

ආරම්භක හඳුනාගැනීමේ සිට ණය හානියේ සැලකිය යුතු වැඩි වීමක් සිදු වූ නමුත් ණය හානිකරණය නොවූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය හඳුනාගනී (එනම් මූල්‍ය වත්කම් වල ඉතිරි ආයුකාලය පිළිඹිබු වන පරිදි).

4.5.11.3 ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය

වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට අහිතකර බලපෑමක් ඇතිකරන සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් සිදු වූ විට, එම නිරාවරණයන් ණය හානිකරණය වූ නිරාවරණයන් ලෙස තක්සේරු කරනු ලැබේ. ණය හානිකරණය වූ නිරාවරණයන් සඳහා ජීවිත කාලය සඳහා වූ අපේක්ෂිත ණය හානිය හඳුනා ගනී. පොලී ආදායම ගණනය කිරීමේදී ක්‍රමක්ෂය පිරිවැයට (ප්‍රතිපාදනයන්ට පසු) ඵලදායී පොලී අනුපාතය භාවිත කිරීමෙන් ගණනය කරයි.

4.5.11.4 අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත මුදල් හිඟය ගණනය කිරීම සඳහා සම්භාවිතාවය මත බර තැබූ අවස්ථා තුනක් මත පදනම්ව අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ ඵලදායී පොලී අනුපාතිකයකට ආසන්න අනුපාතයකින් වට්ටම් කිරීමෙනි. මුදල් හිඟය යනු ගිවිසුමට අනුව ආයතනය සඳහා ලැබිය යුතු මුදල් ප්‍රවාහයන් සහ ආයතනය අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස වේ.

සමූහයේ අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම් පිළිබඳ යාන්ත්‍රණය පහත දැක්වෙන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ:

- පැහැර හැරීමේ සම්භාවිතාවය (PD):

  පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. ණය පහසුකම පෙර කාලච්ඡේදයකදී පොත්වල හඳුනාගෙන නොමැති නම් හා තවමත් එම වත්කම ආයෝජන කළඹ තුළ ඇත්නම් යම් නිශ්චිත කාලච්ඡේදයක් පුරාවට පැහැර හැරීම සිදුවේ. පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳ සංකල්පය සටහන 27 යටතේ තවදුරටත් විස්තර කර ඇත.

- ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD):

  ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරන දිනට පසුව සිදුවන ණය ගෙවීම්, මග හැරුණු ගෙවීම් වලට අදාළ උපචිත පොලිය යනාදිය ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ. සටහන 27 යටතේ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

- පැහැර හැරීමේ අලාභය (LGD):

  පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් ලැබේතැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ. මෙය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගයෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් දක්වයි. සටහන 27 යටතේ පැහැර හැරීමේ අලාභය පිළිබඳ තවදුරටත් විස්තර කර ඇත.

4.5.11.5 හානිකරණය සඳහා අදියර නිර්ණය කිරීම

සෑම වාර්තාකරණ දිනයකදීම ආරම්භක හඳුනාගැනීමේ සිට නිරාවරණයන්ගේ ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. මෙය තක්සේරු කරනු ලබන්නේ ආරම්භක හඳුනාගැනීමේ දිනය හා අපේක්ෂිත ජීවිත කාලය අතර පැහැර හැරීමේ අවදානමක් තිබේද යන්න සැසඳීමෙනි. මෙම කාර්යය අනිසි වියදමක් හෝ වැයමක් නොමැතිව ලබාගන්නා සාධාරණ හා විශ්වාසදායක තොරතුරු පිළිබඳව සමූහය සලකා බලයි. මෙය ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු මෙන්ම ඉදිරි දැක්මක් සහිත විශ්ලේෂණයකින්ද යුක්ත වේ.

වත්කම් වල ගුණාත්මකභාවය පිරිහීයාමේදී නිරාවරනයන් අපේක්ෂිත ණය හානියේ අදියර තුල සංක්‍රමණය වේ. පසුකාලීනව වත්කම් වල ගුණාත්මකභාවය වර්ධනය වුවහොත් හා කලින් තක්සේරු කරන ලද ආරම්භයේ සිට ඇති ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් ප්‍රතිවර්ත්‍ය කළහොත් අවිනිශ්චිත ණය සඳහා කරන වෙන් කිරීම් පිවිත කාලය සඳහා වන අපේක්ෂිත ණය හානියේ සිට මාස 12 සඳහා වූ ණය හානිය දක්වා ප්‍රතිවර්තනය වේ. ආරම්භයේ සිට සැලකිය යුතු ලෙස පිරිහී ගොස් නොමැති හෝ පිරිහිම සමූහයේ ආයෝජන ශ්‍රේණිගත නිර්නායකයන් තුල පවතින හෝ හිඟ හිටි දින ගණන සිට දින 30 කට වඩා අඩු නිරාවරණයන් පහල ණය අවදානමක් ඇති නිරාවරණයන් ලෙස සැලකේ. මෙම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම මාස 12 ක් සඳහා වූ අපේක්ෂිත ණය හානිය මත පදනම්ව සිදු කරයි.

කේවල හා සාමූහික පදනම මත නිරාවරණයන් සඳහා වන ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න පිළිබඳ සමූහය තක්සේරු කරයි. උපකරණයේ වර්ගය, ණය අවදානම් ඇගයුම්, ඇප වර්ගය, ආරම්භක හඳුනාගැනීමේ දිනය, කල් පිරීමට ඇති කාලය, කර්මාන්තය, ණය ගැතියාගේ භූගෝලීය ව්‍යාප්තිය හා අනෙකුත් අදාල සාධක යනාදිය සැලකිල්ලට භාජනය කර සාමූහික හානිකරණ ඇගයීම සඳහා ණය අවදානම් ලක්ෂණ පදනම් කරගෙන මූල්‍ය උපකරණ කාණ්ඩගත කෙරේ.

4.5.11.6 අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත අලාභ පිළිබඳ අපක්ෂපාති හා සම්භාවිතාවයෙන් හරිත ඇස්තමේන්තු මඟින් අපේක්ෂිත ණය හානිය ව්‍යුත්පන්න කර ඇති අතර එය පහත පරිදි ගණනය කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- වාර්තා කරන දිනයේදී ණය හානිකරණය නොවූ මූල්‍ය වත්කම්: මූල්‍ය වත්කමෙහි අපේක්ෂිත ආයුකාලය පුරාවට ඇති සියලු හිඟ මුදල් හිමිකම් වල වර්තමාන වටිනාකම ඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කිරීමෙන් ගණනය කරයි. මුදල් හිඟය යනු ගිවිසුම් ප්‍රකාරව සමුහය වෙත ලැබිය යුතු මුදල් ප්‍රවාහ හා සමුහය ලැබීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.
- වාර්තා කරන දිනයේදී ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්: දළ වටිනාකම හා අනාගත මුදල් ප්‍රවාහයන් ඵලදායී පොලී අනුපාතිකය මඟින් වට්ටම් කර ලබා ගන්නා වර්තමාන අගය යන දෙකෙහි වෙනස තුලින් ගණනය කරයි.
- ලබා නොගත් ණය බැඳීම් : බැඳියාව ලබා ගත හොත් සමූහය වෙත ලැබිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හා සමුහය ලැබීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර වෙනසෙහි වර්තමාන අගය තුලින් ගණනය කරයි.
- මූල්‍ය ඇප ගිවිසුම් : දරන්නාට ප්‍රතිපූර්ණය කිරීම සඳහා අපේක්ෂිත ගෙවීම් වලින් සමූහය නැවත අයකරගැනීමට බලාපොරොත්තු වන අගයන් අඩු කිරීම තුලින් ගණනය කරයි.

අපේක්ෂිත ණය හානිය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. ණය උපකරණ වෙනත් විස්තීරණ ආදායම තුලින් සාධාරණ අගයට අගය කරනු ලබන අවස්ථාවකදී, අපේක්ෂිත ණය හානිය ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් වලට අදාල වන අදියර තුනේ පිවිසුම භාවිතා කිරීමෙනි.

4.6 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කමේ භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය හෝ මුදල් ජනනය කරන ඒකකවල අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම්වල ගලපනු ලැබේ.

භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපොළ තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, පොදු වශයෙන් විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.7 භාරකාර සේවා

පාරිභෝගිකයින් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහයේ වත්කම් නොවන නිසා මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් නොකෙරේ.

4.8 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ.

ප්‍රතිපාදන වටිනාකම තීරණය කිරීමේදී වාර්තාකරන දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු කරන අතර එහිදී අදාළ සිද්ධිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන තීරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව දරා සිටින අගය තීරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි අඩු වටිනාකමෙන් වර්තමාන අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.9 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

4.9.1 ආදායම් බදු වියදම

ආදයම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. සටහන 17 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

4.9.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT)

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි.

2002 අංක 14 දරණ චකතු කළ අගය මත බදු පනත හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය සඳහා බැංකුවේ මුළු චකතු කළ අගය මත 15% (2017: 15%) ක බද්දකට යටත් විය. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත චකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

4.9.3 ලාභාංශ මත රඳවා ගත් බදු (WHT)

- බැංකුව බෙදාහල ලාභාංශ මත රඳවා ගත් බදු

  බැංකුව විසි චකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා හැර ඇති බැවින් බැංකුව විසින් කිසිදු ලාභාංශයක් මත බද්දක් ගෙවා නොමැත.

- පරිපාලිතයන් හා ආශ්‍රිතයන් බෙදා හල ලාභාංශ මත රඳවාගත් බදු

  2018 අප්‍රේල් 1 දින සිට බදු අය කළ හැකි ලාභායෙන් බෙදා හරින ලද ලාභාංශ සඳහා 14% ක් විහි මූලාශ්‍රයේදී අඩු කරයි (2018 මාර්තු 31 දක්වා 10% ක් වේ).

4.9.4 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ සහ ඇමුණුම් වගන්ති අනුව, ආර්ථික සේවා ගාස්තු, බැංකුවේ බද්දට යටත් ආදායමෙන් 0.5% ගෙවිය යුතු වන අතර එය ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකර ගත හැකි වේ.

4.9.5 බෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනතේ 15 වැනි වගන්තිය යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.9.6 මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)

ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරනු ලබන්නේ, 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත සහ විහි සංශෝධන අනුව 2014 ජනවාරි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වේ. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද, මූල්‍ය සේවා මත චකතු කළ අගය මත බද්ද ගණනය කිරීමේ දී භාවිතා කරන ලද චකතු කළ අගයෙන් 2% ලෙස ගණනය කෙරේ.

4.9.7. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු වියදම

2018 අංක 35 දරණ මූල්‍ය පනත අනුව 2018 ඔක්තෝබර් 1 වන දින සිට සෑම මූල්‍ය ආයතනයකින්ම ණය ආපසු ගෙවීමේ බදු අය කරයි. මූල්‍ය සේවාවන්ට අදාල චකතු කල අගයෙන් 7% ක ප්‍රමාණයක් ණය ආපසු ගෙවීමේ බදු ලෙස ගණනය කරයි.

5. රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමඟින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සහ බැඳී රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳී හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂයානුබද්ධ සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සටහන් තැබේ.

ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම් වලට අදාල වාරික ලැබීම් හා හිමිකම් දළ පදනම මත වාර්තා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශ්වයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණයන්

ලැබිය යුතු රක්ෂණයන් ඒවා උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බිත කළ අත්පත් කර ගැනීමේ පිරිවැය

නව රක්ෂණ ඔප්පුවක් හා සම්බන්ධවන හෝ අභිමතානුසාර් සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.) ඇති ආයෝජන ගිවිසුමක් හෝ සම්බන්ධ වන කොමිස්, ප්‍රතිරක්ෂණ ගාස්තු, අලෙවිකරණ වියදම්, ගිවිසුම් නිකුත් කිරීමේ වියදම් ආදී පිරිවැය අනාගත වාරික මඟින් පියවාගත හැකි ප්‍රමාණයට විලම්බනය කරනු ලැබේ. අනෙකුත් සියලු ආරම්භක අත්පත් කර ගැනීමේ පිරිවැය ඒවා දැරූ විට වියදමක් ලෙස හඳුනා ගනී. මූලික

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

හඳුනාගැනීමෙන් පසුව, උපයා නොගත් වාරිකයන් ක්‍රමක්ෂය කිරීමේ පදනමෙන් කාලපරිච්ඡේදය හා සමගාමීව විලම්බනය කළ අත්පත් කර ගැනීමේ පිරිවැය ද ක්‍රමක්ෂය කරනු ලැබේ.

අපේක්ෂිත ඵලදායී ආයුකාලයේ හෝ වත්කම සහ බැඳුනු අනාගත ප්‍රතිලාභයන් පරිභෝජන රටාවේ අපේක්ෂිත වෙනස්කම් වීම වත්කමේ ක්‍රමක්ෂය කාලපරිච්ඡේදයෙහි සිදු කරනු ලබන වෙනස් කිරීම මඟින් ගිණුම් ගත කරනු ඇත. එය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සිදුවන වෙනසක් ලෙස සැලකේ. අදාළ ගිවිසුම් අවසන් වූ පසු හෝ අවලංගු වූ පසු විලම්බනය කළ අත්පත් කරගැනීමේ පිරිවැය බැහැර කිරීම සිදු වේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් විලම්බනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ සහිත හා රහිත ගිවිසුම් අතර වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන වම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති ඒකක මුදලින් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳා පවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි. ඒකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල නිරීක්ෂණය කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියා විසින් අවලංගු කරනු ලබන ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වටිනාකම් කලඹයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සංරචක සඳහා වන වාරික ගණනය රක්ෂණය හා වන පදනම් හා සමාන වේ.

5.6 අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පු හිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැලකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත, කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වටිනාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවයි.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6. නිකුත් කළ නමුදු වාර්තාකරණ දිනයේ දී බල නොපැවැත්වෙන නව ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් ඒවා 2018 දෙසැම්බර් 31 වෙනි දිනට බල නොපැවැත්වේ. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙම ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර නැත.

සමූහය සඳහා බලපාන අප විසින් හඳුනාගත් ප්‍රමිත සහ ඒවා පිළිබඳ වැඩිදුර තොරතුරු පහත දක්වා ඇත.

6.1 ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 16 - කල්බදු

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 16 මඟින් කල්බදු සඳහා වන වර්තමාන ද්විත්ව ගිණුම්කරණ ආකෘති වන ශේෂ පත්‍ර දින ඇති මූල්‍ය කල්බදු සහ ශේෂ පත්‍රයෙන් බැහැර මෙහෙයුම් කල්බදු සඳහා වන වෙනස බැහැර කරනු ලැබේ. ඒ වෙනුවට දැනට පවතින මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන ශේෂපත්‍රය මත ගිණුම් තබන්නාවූ ගිණුම්කරණ ක්‍රමයක් මෙහෙයුම් කල්බදු සඳහාද අනුගමය කෙරේ. මෙම ප්‍රමිතය මඟින් ලං. ගි. ප්‍ර. 17 "කල්බදු", ජා. මූ. වා. අ. ක. (I F R I C)- 4- "ගිවිසුමේ කල්බදු ඇත්දැයි තීරණය කිරීම", ප්‍ර. අ. ක. (SIC) 15- "මෙහෙයුම් කල්බදු - දිරි දීමනා" සහ ප්‍ර. අ. ක. (SIC) 27- "ගනුදෙනුවල හරය කල්බදු හා සම්බන්ද නිත්‍යනුකූල ආකෘතිය සමග ඇගයීම" යන ගිණුම්කරණ ප්‍රමිත සහ සම්බන්ධිත නිර්වචනයන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 16, 2019 ජනවාරි 1 දින හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය වර්ෂ සඳහා බල පැවැත් වේ. සමූහය විසින් ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 16 භාවිතා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ සමූහය විසින් තක්සේරු කරමින් සිටී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

7 මුළු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට/සමූහයට ගලා ආ බවට විශ්වාසනීය ලෙස මැනිය හැකිතාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
පොළී ආදායම (සටහන 8.1)	195,393,970	171,343,888	201,809,401	177,746,357
ගාස්තු සහ කොමිස් ආදායම (සටහන 9.1)	10,699,565	9,465,330	11,088,043	9,723,455
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10)	3,431,822	2,802,048	3,468,191	2,822,168
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)(සටහන 11)	(681,365)	-	(717,194)	-
මූල්‍ය ආයෝජනවලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11.1)	-	905,527	-	925,733
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 12)	152,029	-	153,240	-
වෙනත් මෙහෙයුම් ශුද්ධ ආදායම් (සටහන 13)	12,135,157	4,694,602	13,659,941	5,795,248
මුළු ආදායම	**221,131,178**	**189,211,395**	**229,461,622**	**197,012,961**

8 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොළී ආදායම හා වියදම සඵල පොළී අනුපාත ක්‍රමය පදනම් කර ගනිමින් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබයි.

ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සඳහන් කර ඇති පොළී ආදායම හා වියදම යටතේ පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම් වලින් ජනිත වන්නා වූ පොළී ආදායම හා වියදම.
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

සඵල පොළී අනුපාතය (EIR)

සඵල පොළී අනුපාතය යනු මූල්‍ය වත්කමට හෝ වගකීමට අදාළව ජනනය වන්නා වූ හෝ ගෙවනු ලබන මුදල් ප්‍රවාහය අදාළ වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට සමාන වීමට වට්ටම් කළ යුතු අනුපාතය වේ. මෙම සඵල පොළී අනුපාතය ගණනය කරන විට මූල්‍ය උපකරණ තුළ සියළුම ගිවිසුම්ගත කොන්දේසි සලකා බලා මුදල් ප්‍රවාහය තක්සේරු කරයි.

මූල්‍ය උපකරණ නුවමාරු කිරීමේදී අදාළ වන වට්ටම් හෝ අධිභාරයන් ගනුදෙනු පිරිවැය සඵල පොළී අනුපාතය ගණනය කිරීමේ දී එහි ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැය තුළ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සම්බන්ධ සෘජුවම ගතහැකි වර්ධන වියදම් ඇතුළත් වේ.

ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු ඇසුරෙන් හානිකරණය ගැලපූ සඵල පොළී අනුපාතය ගණනය කරනු ලබයි.

8.1 පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	637,183	716,983	729,559	794,400
බැංකුවල ඇති තැන්පතු	735,748	623,881	910,847	688,805
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,277,297	1,082,293	1,275,316	1,059,185
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණ/වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	575,655	585,342	575,809	586,073
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්	190,735,241	167,580,587	196,834,925	173,620,948
ණය හා අත්තිකාරම්	145,549,687	124,890,681	151,330,837	130,663,714
ණය සහ වෙනත් උපකරණ	45,185,554	-	45,504,088	-
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	11,540,713	-	11,661,827
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	-	31,149,193	-	31,295,407
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ වටිනාකමට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතිඳුදුරිදුඟර්ලුථිථිඳුන මූල්‍ය වත්කම්	1,432,846	754,802	1,482,945	996,946
මුළු පොළී ආදායම	**195,393,970**	**171,343,888**	**201,809,401**	**177,746,357**

ණය සහ අත්තිකාරම් ආදායම තුළ 2018 වර්ෂය සඳහා රු. මිලියන 1,052.6 (2017 : රු. මිලියන 1,258.7) ක හානිකරණ වූ ණය මත පොළිය ඇතුළත් වේ.

8.2 පොළී වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	113,325	30,262	115,735	33,853
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්	5,379,122	5,464,801	5,414,844	5,495,603
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම්				
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	112,056,160	92,229,110	114,352,230	94,518,371
වෙනත් ණය ගැනීම්	7,132,964	10,249,478	7,673,665	10,510,630
නිකුත් කළ ණය සුරැකුම්පත්	-	399,087	531,478	1,147,939
යටත් කාලීන වගකීම්	5,154,425	4,614,958	5,031,970	4,549,859
මුළු පොළී වියදම	**129,835,996**	**112,987,696**	**133,119,922**	**116,256,255**
ශුද්ධ පොළී ආදායම	**65,557,974**	**58,356,192**	**68,689,479**	**61,490,102**

8.3 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
පොළී ආදායම	35,393,676	32,623,129	35,544,149	32,823,130
අඩු කළා : පොළී වියදම	5,379,122	5,464,801	5,414,844	5,495,603
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම	**30,014,554**	**27,158,328**	**30,129,305**	**27,327,527**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

8.4 ද්විතීයික වෙළඳපොලේ ගනුදෙනු වෙනුවෙන් රජයේ සුරුකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද සඳහා නාමික බදු බැර

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන්ගේ 137 වන වගන්තියේ විධිවිධාන වලට අනුව රජයේ සුරුකුම්පත් මත ද්විතීයික වෙළඳපොලේ ගනුදෙනුවලින් ලබන පොළී ආදායම මත බැංකුවට නාමික බදු බැර සඳහා හිමිකම් (ශුද්ධ පොළී ආදායමෙන් නමයෙන් එකක් (1/9)) ඇත. ඒ සඳහා එකී පොළී ආදායම එම තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් විය යුතුය. ඒ අනුව, රජයේ සුරුකුම්පත් මත ද්විතීයික වෙළඳපොලෙන් බැංකුව සහ සමූහය විසින් උපයන ලද තෙමසක ශුද්ධ ආදායම මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත කොට දක්වා ඇති අතර, එමඟින් ඇතිවන නාමික බදු බැර බැංකුව සඳහා රු. මිලියන 793.5 (2017 - රු. මිලියන 2,165.0) සහ සමූහය සඳහා රු. මිලියන 804.6 (2017 - රු. මිලියන 2,206.4) වේ. 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුව මෙම වගන්තිය ඉවත් කර ඇති බැවින් 2018 මාර්තු 31 වන දින සිට බැංකුව විසින් මෙම ක්‍රමය නවතා ඇත. 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුව රජයේ සුරුකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද 2018 අප්‍රේල් 1 වන දින සිට ඉවත් කර ඇති බැවින් බැංකුව විසින් නාමික බදු බැර ගණනය නවතා දමන ලදී.

9 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් පුළුල් පරාසයක සේවා සැපයීම මඟින් ලබා ගන්නා ලද ආදායම, ගාස්තු සහ කොමිස් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම තුළ අන්තර්ගත වේ. එම ආදායම පහත පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

(i) යම් නිශ්චිත කාලයක් පුරා ලබා දී ඇති සේවා වෙනුවෙන් උපයාගන්නා ලද කොමිස්.
යම් නිශ්චිත කාලයක් පුරා සේවා සැපයීම වෙනුවෙන් ලබාගන්නා ලද ගාස්තු හා කොමිස් එම කාලය පුරාම උපචිත පදනම යටතේ හඳුනාගනු ලබයි. මෙහි කොමිස් ආදායම් සහ පුද්ගලික ධනය හා වත්කම් කළමනාකරණ ගාස්තු, භාරකාරත්ව සේවා, වෙනත් කළමනාකරණ සේවා හා උපදේශන ගාස්තු අන්තර්ගත වේ.

(ii) සැලකිය යුතු ගනුදෙනුකාර සේවාවන් ඉටුකිරීම සම්බන්ධයෙන් උපයන ගාස්තු හා කොමිස් ආදායම.
ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, කොටස් මිල දී ගැනීමේ ගනුදෙනු වලට සහභාගී වීම, ව්‍යාපාර මිල දී ගැනීමේ හෝ විකිණීමේ ගිවිසුම් වැනි ක්‍රියාවන් වලට අදාළ කාර්යය සම්පූර්ණ කළ පසු අදාළ ගාස්තු හා කොමිස් ආදායම හඳුනාගනු ලබයි.

සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට හඳුනා ගනු ලබයි.

9.1 ගාස්තු සහ කොමිස් ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
වෙළඳ සේවා	1,958,791	2,017,427	2,117,990	2,157,147
හර හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	3,244,546	2,646,648	3,244,546	2,646,648
සංචාරක හා ප්‍රේෂණ	1,337,082	1,182,437	1,337,082	1,182,437
භාරකාරත්ව සේවා	118,866	65,514	118,866	65,514
සිල්ලර බැංකු සේවා	2,290,705	2,128,212	2,299,838	2,137,580
ඇපකර සම්බන්ධිත සේවා	1,477,438	1,220,235	1,478,440	1,221,301
වෙනත් මූල්‍ය සේවා	272,137	204,857	491,281	312,828
මුළු ගාස්තු සහ කොමිස් ආදායම	**10,699,565**	**9,465,330**	**11,088,043**	**9,723,455**

9.2 ගාස්තු සහ කොමිස් වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
වෙළඳ සේවා	94,307	95,306	94,307	95,306
හර හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	1,817,643	1,448,287	1,817,643	1,448,287
සංචාරක හා ප්‍රේෂණ සේවා	97,898	105,762	97,898	105,762
සිල්ලර බැංකු සේවා	247,327	216,860	248,858	227,999
ඇපකර සම්බන්ධිත සේවා	10,275	8,562	10,275	8,562
වෙනත් මූල්‍ය සේවා	13,278	8,525	25,858	86,458
මුළු ගාස්තු සහ කොමිස් වියදම	**2,280,728**	**1,883,302**	**2,294,839**	**1,972,374**
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	**8,418,837**	**7,582,028**	**8,793,204**	**7,751,081**

10 වෙළඳපොල ගනුදෙනු වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳපොල ගනුදෙනු වලින් ලැබූ විදේශ විනිමය ලාභ හෝ පාඩු සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙළඳපොල අගයට තක්සේරු කිරීමෙන් ලැබූ ලාභ හෝ පාඩු මේ යටතේ දක්වා ඇත.

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
විදේශ විනිමය				
බැංකුවලින්	4,291	1,479	19,168	20,403
වෙනත් ගනුදෙනුකරුවන්ගෙන්	3,325,654	2,709,355	3,335,768	2,721,536
රාජ්‍ය සුරැකුම්පත්				
වෙළඳපොළ අගය මත සුරැකුම් අගය කිරීමේ ලාභ/(පාඩු)	-	75,448	-	75,448
සුරැකුම් විකිණීමේ ලාභ/(පාඩු)	-	48,276	-	48,276
ස්කන්ධයන්				
වෙළඳපොළ අගය මත ස්කන්ධයන් අගය කිරීමේ ලාභ/(පාඩු)	-	(174,510)	-	(170,717)
ස්කන්ධ විකිණීමේ ලාභ/(පාඩු)	-	30,217	-	7,008
ලාභාංශ ආදායම	101,877	111,783	113,255	120,214
වෙළඳපොළ ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	**3,431,822**	**2,802,048**	**3,468,191**	**2,822,168**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

11 ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු) වල අන්තර්ගත වන්නේ ස්කන්ධයන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු සඳහා ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කළ ණය උපකරණ වල සාධාරණ අගයේ වෙනස්වීම්ය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
වෙළඳපොළ අගයට වාර්තා කල ලාභ හෝ පාඩු				
ස්ථාවර ආදායම් ලැබෙන සුරැකුම්	(10,268)	-	(10,268)	-
ස්කන්ධයන්	(226,795)	-	(259,736)	-
වීකක භාරවලින් ලද ආදායම්	(444,302)	-	(447,190)	-
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)	**(681,365)**	**-**	**(717,194)**	**-**

11.1 මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු සහ වීම මූල්‍ය ආයෝජන මඟින් ලැබූ ලාභාංශ ආදායම, මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/ (පාඩු) යටතේ දැක්වේ. ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින				
රජයේ සුරැකුම්පත් විකිණීමෙන් ලද ලාභ/(පාඩු)	-	332,937	-	332,937
ලාභාංශ ආදායම	-	572,590	-	592,796
මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(පාඩු)	**-**	**905,527**	**-**	**925,733**

12 මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කල, ක්‍රමක්ෂය පිරිවැයට සහ වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට නම් කල ණය උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) යටතේ දැක්වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
හඳුනාගැනීම:				
ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට	56,612	-	57,823	-
ක්‍රමක්ෂය පිරිවැයට	-	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට	95,417	-	95,417	-
මූල්‍ය වත්කම් බැහැර කිරීම් වලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	**152,029**	**-**	**153,240**	**-**

13 ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ලාභාංශ ආදායම

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභ

දේපල, පිරියත හා උපකරණ සහ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමට අදාළ ලාභ හෝ පාඩු මෙහි අන්තර්ගත වේ.

විදේශ විනිමය ආදායම

විදේශ විනිමය වත්කම් හා වගකීම් සෑම වාර්තා කරන දිනයකම නැවත අගය කරනු ලබයි. මෙම වත්කම් හා වගකීම් වල සාධාරණ අගයන් වෙනස් වීම ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනා ගනු ලබයි.

කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගනී. බැංකු පරිශ්‍රය කුලියට දීමෙන් ලැබූ ආදායම, නිල නිවාස කුලියට දීමෙන් ලැබූ ආදායම, සුරක්ෂිතාගාර වලින් ලද ආදායම හා බැංකු පරිශ්‍රයට අදාළ කල්බදු කුලිය අයකර ගැනීම තුළින් ලද කුලී ආදායම මෙහි අන්තර්ගත වේ.

සේවා ආදායම

ණය දීම්, බදු දීම් වලින් අයකර ගත් ලේඛන ආදායම්, ණය හා තොරතුරු කාර්යාංශ සොයා බැලීම්, නීති සේවා සැපයීම් හා නියෝජිත බැංකු වලට සේවා සැපයීම් තුළින් ලබා ගත් ආදායම් මෙහි දැක් වේ. සේවා ආදායම උපචිත පදනමට හඳුනා ගනී.

දළ රක්ෂණ වාරික

අභිමතානුසාරී සහභාගිත්ව ලක්ෂණ (DPF) සමඟ ඇති ජීවිත සහ ආයෝජන ගිවිසුම්වල නැවත ගෙවිය යුතු දළ වාරික ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු විට ඒවා ආදායම් ලෙස හඳුනා ගනී. එක් වාරිකයක් පමණක් ලැබෙන විට ආදායම හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දින දීය.

සාමාන්‍ය දළ රක්ෂණ වාරික මුදල් ලෙස සමන්විත වන්නේ ගිණුම්කරණ කාලය තුළ දී ඇතුළු වන විට ලැබිය යුතු මුළු ගිවිසුම් කාලය සඳහාම අදාළ වාරික මුදල්ය. එය ගිවිසුම ආරම්භ වන දිනයේ දීම හඳුනා ගනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ලද ලාභාංශ ආදායම්	284,383	-	321,923	-
පරිපාලිත හා ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම්	309,685	76,680	-	-
ඒකක භාරවලින් ලද ලාභාංශ ආදායම්	3,985	-	3,985	-
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)	7,622,372	701,621	7,622,372	701,621
දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/(පාඩු)	31,014	55,105	121,350	59,399
අත්පත් කරගත් දේපල විකිණීමෙන් ලද ලාභ/(පාඩු)	73,605	70,866	73,605	70,866
කුලී ආදායම	284,632	250,454	352,529	329,905
සේවා ආදායම	1,864,650	1,627,798	2,098,355	1,987,792
රත්රන් විකිණීමෙන් ලද ලාභය	8,951	15,342	8,951	15,342
විවිධ ආදායම්	1,427,447	1,683,766	2,735,465	1,785,250
දළ රක්ෂණ වාරික	-	-	96,973	632,103
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම [සටහන 13.1]	224,433	212,970	224,433	212,970
මුළු වෙනත් මෙහෙයුම් ආදායම්	**12,135,157**	**4,694,602**	**13,659,941**	**5,795,248**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

13.1 ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව/සමූහය	
	2018	2017
	රු. '000	රු. '000
ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම්වලින් ලද ආදායම	393,762	364,126
අඩුකළා : ආයෝජකයන්ට ගෙවූ ලාභ	169,329	151,156
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	**224,433**	**212,970**

14 ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තය) කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය හා අත්තිකාරම් සඳහා වූ හානිකරණයට අදාළ වෙන් කිරීම් වල වෙනස්වීම බැංකුව හා සමූහය විසින් ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" වලට අදාළව හඳුනා ගනී. මෙයට අදාළ විස්තරාත්මක සටහන ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම් (සටහන 27) යටතේ දක්වා ඇත. තවද බැංකුව හා සමූහය විසින් මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණයන් වෙතොත් එයද හඳුනා ගනී. එම හානිකරණය හඳුනා ගනු ලබන්නේ ලං. ගි. ප්‍ර. 36 ට අනුව ධාරණ අගය වත්කමේ නැවත අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් පමණි.

මූල්‍ය උපකරණ වලට අදාළව ලාභ හෝ පාඩු ප්‍රකාශයේ හඳුනාගත් අපේක්ෂිත ණය හානිය පහත වගුවේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව				සමූහය			
	2018				2018			
	මට්ටම 1	**මට්ටම 2**	**මට්ටම 3**	**එකතුව**	**මට්ටම 1**	**මට්ටම 2**	**මට්ටම 3**	**එකතුව**
	රු. '000	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**	**රු. '000**
මුදල් සහ මුදල් හා සමාන දෑ	(3,793)	-	-	(3,793)	(3,795)	-	-	(3,795)
බැංකුවල ඇති තැන්පතු	22,720	-	-	22,720	22,452	-	-	22,452
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	2,010,203	(2,123,633)	14,377,860	14,264,430	2,038,648	(2,116,443)	14,476,548	14,398,753
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ණය උපකරණ	731,392	-	26,212	757,604	732,850	-	26,212	759,062
වෙනත් ආයෝජන	-	-	-	-	-	-	-	-
මුළු එකතුව	**2,760,522**	**(2,123,633)**	**14,404,072**	**15,040,961**	**2,790,155**	**(2,116,443)**	**14,502,760**	**15,176,472**

2017 වර්ෂයට අදාලව ලං. ගි. ප්‍ර. 39 'මූල්‍ය වත්කම්: හඳුනා ගැනීම හා මැනීම' යටතේ ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ වාර්තා කල හානිකරණයට අදාළ වෙන් කිරීම් පහත වගුවෙන් දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2017			2017		
	කේවල හානිකරණය සහ වෙනත් ප්‍රතිපාදන	සමූහ හානිකරණය	එකතුව	කේවල හානිකරණය සහ වෙනත් ප්‍රතිපාදන	සමූහ හානිකරණය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය	9,631,746	-	9,631,746	9,676,575	-	9,676,575
සිල්ලර ණය	-	8,912	8,912	-	208,314	208,314
වෙනත් ආයෝජන	(300,000)	-	(300,000)	-	-	-
ශේෂ පත්‍රයේ සඳහන් අයිතම	9,331,746	8,912	9,340,658	9,676,575	208,314	9,884,889
ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම	-	-	-	-	-	-
එකතුව	**9,331,746**	**8,912**	**9,340,658**	**9,676,575**	**208,314**	**9,884,889**

15 සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක පාරිශ්‍රමික, නිශ්චිත දායකත්ව හා ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය හා සේවක මණ්ඩලය සඳහා දරනු ලබන වෙනත් වියදම් සේවක මණ්ඩල වියදම් යටතේ ඇතුළත් වේ. කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වට්ටම් කිරීමෙන් තොරව එම සේවාව ලැබූ කාලච්ඡේදයට අදාළව හඳුනා ගනු ලබයි. සේවකයින්ට ලබා දෙන ඉදිරියේ දී ගෙවීමට අපේක්ෂා කරන කෙටිකාලීන ප්‍රසාද දීමනා වගකීමක් ලෙස හඳුනා ගනු ලබන්නේ අතීතයේ සැපයූ සේවාවන් වෙනුවෙන් සේවකයාට එම මුදල ගෙවීමට නීතිමය හෝ සාධනීය වගකීමක් ඇත්නම් හා එම වගකීම විශ්වාසවන්තභාවයකින් ඇස්තමේන්තු කළ හැකි නම් පමණි.

අභ්‍යන්තර හා බාහිර නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවකයා විසින් නිශ්චිත ප්‍රතිලාභ හා දායකත්ව සැලසුම් සඳහා අරමුදල් දායකත්වය සැපයීමට බැඳී සිටී.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිවාඩු මුදල් කිරීම සඳහා කරන ලද වෙන් කිරීම්වලට අදාළ වියදම් හා ආදායම් ආයුගණක තක්සේරුවක් මඟින් ලං.ගි.ප්‍ර. 19 ට අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**බැංකුව**		**සමූහය**	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
සේවක පාරිශ්‍රමික	15,153,102	13,142,117	16,593,168	14,335,669
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය [සටහන 15.1]	1,293,232	1,032,383	1,432,572	1,167,164
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය [සටහන 15.2]	(132,434)	495,125	(24,931)	562,159
වෙනත් සේවක පිරිවැය	2,561,497	2,326,551	2,599,969	2,658,558
මුළු සේවක මණ්ඩල වියදම්	**18,875,397**	**16,996,176**	**20,600,778**	**18,723,550**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

15.1 නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් පාර්ශ්වයකට දක්වන ස්ථාවර දායකත්වයයි. මෙම ස්ථාවර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ අනුමිත වගකීමක් නොමැත. වාර්තා කරන දින අවසානයට පෙර කරන ලද සේවය උදෙසා වන නිශ්චිත දායකත්ව සැලසුම් වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත දායකත්වය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කරන දිනට අදාළව වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරි ගෙවීම්වල අඩුවීමක් ලෙස සලකයි නම් එය වත්කමක් ලෙස හඳුනා ගැනේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන දායකත්වය සේවකයන් වෙත ගෙවීම සිදුවන්නේ වාර්තා කරන දින සිට මාස 12 කට පසු කාල පරාසයකින් නම් එය වාර්තා කරන දිනට වන වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියලුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකුව විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියලුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයන් වෙනුවෙන්, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී ඵල් සී 15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර, සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී ඵල් සී 10%) ක දායකත්වයක් දරයි.

සේවක භාරකාර අරමුදල

1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියලුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය, දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
සේවය දායකත්වය:				
ලංකා බැංකු/ සේවක අර්ථසාධක අරමුදල	1,036,063	827,212	1,148,216	938,876
සේවක භාරකාර අරමුදල	257,169	205,171	284,356	228,288
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා මුළු දායකත්වය	**1,293,232**	**1,032,383**	**1,432,572**	**1,167,164**

15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැඳීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කරවල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් "පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් විස්තරාත්මකව සටහන් අංක 47" සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
ලාභ හෝ අලාභයේ හඳුනාගත් ශුද්ධ වියදම්				
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල [සටහන 47.1.1]	539,185	936,596	539,185	936,596
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම අරමුදල [සටහන 47.2.1]	(955,403)	(830,309)	(955,403)	(830,309)
විශ්‍රාම පාරිතෝෂික [සටහන 47.3]	47,536	41,964	107,503	101,498
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල 2014 [සටහන 47.4.1]	188,251	137,767	188,251	137,767
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	47,997	209,107	47,997	209,107
විශ්‍රාම අරමුදල - ලංකා බැංකුව (යූ කේ) සමාගම	-	-	47,536	7,500
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා මුළු දායකත්වය	**(132,434)**	**495,125**	**(24,931)**	**562,159**

16 වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාළව වෙනත් වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනී. ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සඳහා සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉවහල් වන ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළු වියදම් සමූහයේ ලාභය ගණනය කිරීම සඳහා ආදායමෙන් අඩුකර පෙන්වනු ලබයි. අතීත සිදුවීමක් සම්බන්ධයෙන් වර්තමාන වගකීමක් බැංකුවට හෝ සමූහයට ඇති විට දී සහ එම වගකීම් පියවීමට ආර්ථික ප්‍රතිලාභ බැංකුවෙන්/සමූහයෙන් ගලා යා හැකි බවට විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් එය වියදම් ලෙස වෙන් කිරීමක් සිදුකෙරේ.

තැන්පතු සඳහා රක්ෂණ ගාස්තු

2010 ඔක්තෝබර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2010 අංක 5 දරණ විධිවිධානයන්ට යටත්ව ආසන්න විගණිත මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) මත පදනම්ව සුදුසුකම්ලත් තැන්පතු වගකීම් වලින් 0.1% ක හෝ 0.125% ක ගෙවීමක් කාර්තුමය පදනමින් බැංකුව විසින් තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමයට සිදු කළ යුතුය.

ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රතිලාභ හිමිකමේ සහ වියදමේ හඳුනා ගැනීම

ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා අ.ස.ල. සමඟ ඇති ආයෝජන ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල ඇතුළත් වර්ෂය තුළ ජනිත වූ හිමිකම් පිරිවැයයි. මෙම පිරිවැයෙහි සැකසුම් කිරීම සහ බේරුම් කිරීම සඳහා සෘජුවම සම්බන්ධවන බාහිර සහ අභ්‍යන්තර පරිහරණය කිරීමේ පිරිවැය සහ අ.ස.ල. ගිවිසුම් සඳහා ප්‍රකාශිත ප්‍රසාද දීමනා ද, එමෙන්ම රක්ෂණයේ දළ තක්සේරුවේ සහ අ.ස.ල සමඟ ඇති අයෝජන ගිවිසුම් හිමිකම්වල සිදුවන වෙනස්වීම් ද ඇතුළත්ය. මරණ හිමිකම් සහ අයිතිය අත් හැරීම වාර්තාවන්නේ දැනුම්දීම ලැබුණු පසුයි. කල් පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තා වන්නේ යථාවත් විටය. අතුරු ගෙවීම් සහ අයිතිය අත්හැරීම් ගිණුම්ගත වන්නේ ඒවා බේරුම් කරන විටය.

වර්ෂ අවසාන දිනය දක්වා සිදුව ඇති සිදුවීම් මත හිමිකම් සහ ඒ හා සම්බන්ධ සැකසීමේ සහ බේරුම් කිරීමේ වියදම්, තවමත් දැනුම් දී නැති සිදුවීම් සඳහා හිමිකම්, සුන්බුන් විකිණීමෙන් ලැබෙන ලැබීම් සහ වෙනත් ආවරණය කර ගැනීම්වලින් ලැබිය හැකි ප්‍රමාණය අඩුකළ පසු සහ පසුගිය වසරවල සිට පවතින හිඟ හිමිකම්වලට කරන ගැලපීම් කළ පසු අගය හිමිකම් ලෙස හඳුනා ගැනේ.

සෘජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ලෙස නොපිය වූ හිමිකම් වන හිමිකම් වියදම් සහ වගකීම් හඳුනා ගෙන ඇත. වගකීම් ලෙස ආවරණය වනුයේ වාර්තා කළ නමුදු තවම ගෙවා නොමැති හිමිකම්, සිදු වූ නමුදු වාර්තාකර නොමැති හිමිකම්ය. මෙම හිමිකම් පියවීමේ සෘජු සහ වක්‍ර පිරිවැය කලින් අපේක්ෂා කෙරේ. නොපිය වූ හිමිකම් එක් එක් හිමිකම් පාදකව තක්සේරු කර ඇති අතර, මෙහි දී හිමිකම් නිරවුල් කිරීමේ දී ගෙවිය යුතු අවසාන පිරිවැය මත එය ඇස්තමේන්තු කර ඇත. මෙතෙක් සිදුවී ඇති එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් සඳහා වඩාත් තාත්වික ඇස්තමේන්තු කිරීමක් වෙනුවෙන් අතීත පළපුරුදු සහ ප්‍රවනතා මත ගණනය කරන ලද අනාගත බැරකම් පිළිබඳව ආයුගණකවරයෙකුගේ තක්සේරුව ලබා ගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

චිකී තක්සේරු හිමිකම් නිරවුල් කිරීම සඳහා වන සම්පූර්ණ වගකීම පසුව ලැබෙන තොරතුරු හා සිදුවන සිද්ධීන් මත තීරණය වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි වර්තමානයේ පවතින තොරතුරු අනුව හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය නිසා ප්‍රතිපාදනය කරන ලද අගයක් වෙනුවෙන් සිදු කරන ගැලපීම් අදාළ කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. හිමිකම් වෙනුවෙන් භාවිතා කරන ලද ක්‍රම හා ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ප්‍රතිරක්ෂණ හිමිකම හඳුනාගනු ලබන්නේ චියට අදාළ දළ රක්ෂණ වගකීම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හඳුනාගත් විට දීය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2018	2017	**2018**	2017
සුරැකුම් හා බැඳුම්කරවල ආයෝජන	1,863,397	1,002,447
මහ බැංකුව සමඟ ඇති නොස්ට්‍රෝ ශේෂය	208,065	184,439
සුරැකුම් හා බැඳුම්කරවල ආයෝජනයෙන් ලද ආදායම	122,142	211,097

ඉහත සඳහන් ගනුදෙනු හැරුණු විට, සමූහය, ඒ හා සම්බන්ධිත නොවන ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු කරන ආකාරයෙන් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජය හා රජය හා සම්බන්ධිත ආයතන සමග, සමූහය විසින් පවත්වාගෙන ගිය ගනුදෙනු ලෙස සේවා සැපයුම්, වෙළඳම අරමුණු කර ගත් කොටස්වල ආයෝජනය සහ අන්තර් බැංකු ණයදීම් ආදී වෙනත් මූල්‍ය සේවා සැපයීම් දැක්විය හැකිය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

60 බණ්ඩ පදනම මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය

සමූහයේ ව්‍යාපාර කටයුතු එකිනෙකට වෙනස් විවිධ ව්‍යාපාර ක්‍රියාවලියන් නිරූපනය කරන පරිදි ඒ ඒ ආර්ථික වාතාවරණයන් තුළ ඇතිවන අවදානම් සහ ප්‍රතිලාභයන් මත කටයුතු කරන ව්‍යාපාර බණ්ඩ හෝ මෙහෙයුම් සංරචකයන් නියෝජනය කරමින් බණ්ඩ තොරතුරු වාර්තාකරණය කර ඇත.

60.1 මූලික බණ්ඩ තොරතුරු - මෙහෙයුම් බණ්ඩ - සමූහය

මෙහෙයුම් බණ්ඩ යනු ආදායම් උපයමින් හා වියදම් දරමින් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල නිරත වන සමූහය අංගයන්ය. මෙයට සමූහයේ කවර හෝ අංගයකට සම්බන්ධ ආදායම් හා වියදම් වලට අදාල ගනුදෙනු ඇතුලත් වේ. මෙහි මෙහෙයුම් ප්‍රතිඵල කළමණාකාරීත්වය විසින් සමාලෝචනය කර එක එක බණ්ඩ අතර සම්පත් බෙදා දීම හා කාර්යඵල ඇගයීම පිලිබඳ තීරණ ගනු ලබයි.

සමූහය පහත ප්‍රධාන ව්‍යාපාර මණ්ඩල වලින් සමන්විත වේ.
ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය, ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන, අනෙකුත් බැංකු නොවන කටයුතු සහ සමූහයේ කටයුතු යනාදියෙන් සමන්විත වේ.

සම්පත් බෙදාහැරීම සහ කාර්යඵල තක්සේරුකරණය ආශ්‍රිතව තීරණ ගැනීමේ අරමුණින් කළමනාකාරීත්වය විසින් ව්‍යාපාර බණ්ඩයන්හි මෙහෙයුම් ප්‍රතිඵල වෙන වෙනම අධීක්ෂණය කරනු ලබයි. බණ්ඩයන්හි ප්‍රතිඵල ඒවායෙහි මෙහෙයුම් ලාභ හෝ අලාභ මත තක්සේරු කරනු ලබයි. එකතු කිරීමේ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ආදායම් බද්ද, සාමූහික පදනමක් මත කළමනාකරණය කරනු ලබන බැවින් මෙහෙයුම් බණ්ඩ අතර බෙදා හරිනු නොලබයි.

	ශාඛා බැංකුකරණය		ආයතනික බැංකුකරණය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2018**	2017	**2018**	2017
	රු. '000	රු. '000	**රු. '000**	රු. '000
බාහිර ගනුදෙනුකරුවන්ගෙන් ලද ආදායම:				
ශුද්ධ පොළී ආදායම	37,158,489	28,650,109	17,326,817	19,819,345
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	4,150,452	3,620,346	2,704,421	2,535,209
වෙනත් ආදායම්	3,162,668	3,804,986	5,394,397	516,404
මුළු මෙහෙයුම් ආදායම	**44,471,609**	**36,075,441**	**25,425,635**	**22,870,958**
ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/ (ප්‍රත්‍යවර්ත්‍ය) කිරීම	(6,134,067)	(1,830,794)	(8,231,449)	(7,780,736)
මුළු වෙනත් මෙහෙයුම් වියදම්	(21,851,590)	(18,829,578)	(5,218,986)	(4,109,781)
මුළු වියදම්	**(27,985,657)**	**(20,660,372)**	**(13,450,435)**	**(11,890,517)**
මූල්‍ය සේවා මත බදු පෙර මෙහෙයුම් ලාභය	**16,485,952**	**15,415,069**	**11,975,200**	**10,980,441**
මූල්‍ය සේවා මත බදු	-	-	-	-
මූල්‍ය සේවා මත බදු පසු මෙහෙයුම් ලාභය	-	-	-	-
ආශ්‍රිත සමාගම්වල ලාභයේ/(පාඩුවේ) කොටස, බදු පසු	-	-	-	-
ආදායම් බදු පෙර ලාභය/(අලාභය)	**16,485,952**	**15,415,069**	**11,975,200**	**10,980,441**
ආදායම් බදු වියදම	-	-	-	-
වර්ෂය සඳහා ලාභය	**-**	**-**	**-**	**-**
මුළු වත්කම්	**690,006,676**	**632,145,758**	**833,652,006**	**601,742,151**
මුළු වගකීම්	**653,062,187**	**596,145,109**	**789,016,428**	**567,472,984**
මෙහෙයුම් ක්‍රියාවලියෙන් ලද/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහයන්	(12,419,101)	64,442,987	(5,790,965)	44,579,858
ආයෝජන ක්‍රියාවලියෙන් ලද/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහයන්	5,087,022	(26,381,837)	2,372,053	(18,250,218)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද / (භාවිතා කළ) මුදල් ප්‍රවාහයන්	4,264,290	(24,521,481)	5,152,028	(23,342,099)
ජංගම නොවන වත්කම් මත ප්‍රාග්ධන වියදම	-	-	-	-
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	669,363	623,465	808,710	593,479

රජය හා රජයට අයත් ආයතන බැංකුවේ ප්‍රධාන ගනුදෙනුකරුවන් වන අතර, රජයේ අනුබද්ධ ආයතනවලින් ලද ආදායම බැංකුවේ ආදායමෙන් 17% ක් (2017:16%) නියෝජනය කරන අතර එම ආදායම ශාඛා බැංකුකරණය හා ආයතනික බැංකුකරණය යන බණ්ඩයන්හි ඇතුළත් වේ. වැඩි විස්තර සටහන් 59 - "සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය" හි දක්වා ඇත.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන කටයුතු		සමූහයේ කටයුතු		නොබෙදූ		එකතුව	
2018	2017	**2018**	2017	**2018**	2017	**2018**	2017
රු. '000	රු. '000	**රු. '000**	රු. '000	**රු. '000**	රු. '000	**රු. '000**	රු. '000
10,914,352	9,657,261	3,131,505	3,132,158	158,316	231,229	68,689,479	61,490,102
997,846	810,323	374,367	169,053	566,118	616,150	8,793,204	7,751,081
6,164,808	3,872,203	2,949,301	2,344,850	(1,106,996)	(995,294)	16,564,178	9,543,149
18,077,006	**14,339,787**	**6,455,173**	**5,646,061**	**(382,562)**	**(147,915)**	**94,046,861**	**78,784,332**
(387,174)	300,000	(156,644)	(294,420)	(267,138)	(278,939)	(15,176,472)	(9,884,889)
(4,952,962)	(4,215,509)	(4,831,923)	(4,046,207)	230,993	496,673	(36,624,468)	(30,704,402)
(5,340,136)	**(3,915,509)**	**(4,988,567)**	**(4,340,627)**	**(36,145)**	**217,734**	**(51,800,940)**	**(40,589,291)**
12,736,870	**10,424,278**	**1,466,606**	**1,305,434**	**(418,707)**	**69,819**	**42,245,921**	**38,195,041**
-	-	-	-	-	-	(9,818,020)	(7,431,502)
-	-	-	-	-	-	32,427,901	30,763,539
-	-	9,269	52,024	-	-	9,269	52,024
12,736,870	**10,424,278**	**1,475,875**	**1,357,458**	**(418,707)**	**69,819**	**32,437,170**	**30,815,563**
-	-	-	-	-	-	(12,922,017)	(9,328,918)
-	**-**	**-**	**-**	**-**	**-**	**19,515,153**	**21,486,645**
643,023,673	**621,865,981**	**80,509,176**	**64,420,266**	**65,731,344**	**79,236,027**	**2,312,922,875**	**1,999,410,183**
608,594,758	**586,450,764**	**69,357,319**	**52,417,323**	**60,751,537**	**74,597,503**	**2,180,782,229**	**1,877,083,683**
(3,647,792)	21,722,177	(1,046,611)	7,045,195	(52,912)	520,104	(22,957,381)	138,310,321
1,494,182	(8,892,681)	428,705	(2,884,180)	21,674	(212,922)	9,403,636	(56,621,838)
3,973,932	(24,122,720)	452,881	(2,156,103)	396,688	(3,068,452)	14,239,819	(77,210,855)
-	-	-	-	-	-	4,360,302	3,963,792
623,785	613,327	269,497	275,335	442,114	436,874	2,813,469	2,542,480

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

60.2 ද්විතීයික බාණ්ඩ තොරතුරු - භූගෝලීය බාණ්ඩ

භූගෝලීය බාණ්ඩයන් විසින් සපයන නිෂ්පාදන සහ සේවා නිශ්චිත ආර්ථික පරිසරයක් තුළ බැඳුණු අවදානම් සහ ප්‍රතිලාභයන් වෙනත් ආර්ථික පරිසරයක් තුළ දැකිය හැකි තත්ත්වයට වඩා ස්වභාවයෙන් වෙනස් වේ.

මෙම බාණ්ඩයන් මඟින් දේශීය මෙහෙයුම්, අක්වෙරළ බැංකු අංශය හා විදේශීය බැංකු කටයුතු ඒකක නියෝජනය කෙරෙයි.

	බැංකුව				සමූහය			
	2018		2017		**2018**		2017	
	රු. '000	%	රු. '000	%	**රු. '000**	%	රු. '000	%
වත්කම්								
දේශීය බැංකු කටයුතු ඒකකය	1,958,935,723	86.4	1,664,741,312	85.3	1,966,996,477	85.1	1,691,932,690	84.6
අක්වෙරළ බැංකු කටයුතු අංශය	259,302,812	11.4	247,929,200	12.7	259,302,812	11.2	247,929,200	12.4
විදේශීය බැංකු කටයුතු ඒකකය	49,915,859	2.2	39,133,441	2.0	86,623,586	3.7	59,548,293	3.0
මුළු වත්කම්	**2,268,154,394**	**100.0**	**1,951,803,953**	**100.0**	**2,312,922,875**	**100.0**	**1,999,410,183**	**100.0**
ආදායම								
දේශීය බැංකු කටයුතු ඒකකය	194,208,778	87.8	167,072,299	88.3	201,940,015	88.1	174,410,229	88.6
අක්වෙරළ බැංකු කටයුතු අංශය	21,218,379	9.6	17,029,578	9.0	21,218,379	9.2	17,029,578	8.6
විදේශීය බැංකු කටයුතු ඒකකය	5,704,021	2.6	5,109,518	2.7	6,303,228	2.7	5,573,154	2.8
මුළු ආදායම	**221,131,178**	**100.0**	**189,211,395**	**100.0**	**229,461,622**	**100.0**	**197,012,961**	**100.0**
බදු පෙර ලාභය								
දේශීය බැංකු කටයුතු ඒකකය	22,234,212	69.7	23,545,936	77.6	22,760,796	70.2	24,014,865	78.0
අක්වෙරළ බැංකු කටයුතු අංශය	7,110,700	22.3	4,328,111	14.3	7,110,700	21.9	4,328,111	14.0
විදේශීය බැංකු කටයුතු ඒකකය	2,547,242	8.0	2,468,933	8.1	2,565,674	7.9	2,472,587	8.0
මුළු බදු පෙර ලාභය	**31,892,154**	**100.0**	**30,342,980**	**100.0**	**32,437,170**	**100.0**	**30,815,563**	**100.0**
බදු පසු ලාභය								
දේශීය බැංකු කටයුතු ඒකකය	12,133,428	62.3	16,562,681	77.7	12,151,420	62.3	16,733,388	77.9
අක්වෙරළ බැංකු කටයුතු අංශය	5,119,704	26.3	3,116,240	14.6	5,119,704	26.2	3,116,240	14.5
විදේශීය බැංකු කටයුතු ඒකකය	2,225,597	11.4	1,633,363	7.7	2,244,029	11.5	1,637,017	7.6
මුළු බදු පසු ලාභය	**19,478,729**	**100.0**	**21,312,284**	**100.0**	**19,515,153**	**100.0**	**21,486,645**	**100.0**

61 වත්කම් හා වගකීම්වල සාධාරණ අගය

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සාධාරණ අගය යනු යම් නිශ්චිත දිනක දී වෙළඳපොල සහභාගී පාර්ශ්ව අතර ක්‍රමවත් ගනුදෙනු මත දී වත්කම් විකිණීමෙන් ලැබී ඇති හෝ වගකීම් මාරු කිරීමට ගෙවා ඇති මිල (පිට වීමේ මිල) හෝ එසේ නොමැති අවස්ථාවක දී වඩාත් වාසිදායක මිල වේ. වගකීමක සාධාරණ අගය කාර්යසාධන නොවන අවදානම මඟින් පිළිබිඹු වේ.

සාධාරණ අගය මැනීම සඳහා වත්කම විකිණීම හෝ වගකීම මාරු කිරීමේ ගනුදෙනුව සිදුවන වෙළඳපොළ පහත උපකල්පන මත පදනම් වේ.

- වත්කම් හා වගකීම් සඳහා වන ප්‍රධාන වෙළඳපොල තුළ
- ප්‍රධාන වෙළඳපොලක් නොමැති විට වඩාත් වාසිදායක වත්කම් හා වගකීම් සඳහා වන වෙළඳපොල තුළ

සියලුම වත්කම් හා වගකීම් වල සාධාරණ අගය නිර්ණය කිරීමේදී හෝ මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමේදී, සාධාරණ අගයන් මැනීම සඳහා සමස්තයක් ලෙස සැලකිය යුතු බලපෑමක් කරන අවම මට්ටමේ යෙදවුම් පහත දක්වා ඇති පරිදි සාධාරණ අගයන්හි ධූරාවලියේ දී වර්ග කරනු ලැබේ.

පළවන මට්ටම - ප්‍රකාශිත වෙළඳපොළ මිල භාවිතයෙන් තක්සේරු ශිල්ප ක්‍රම
ක්‍රියාකාරී වෙළඳපොළ තුළ මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ

දෙවන මට්ටම - නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතයෙන් තක්සේරු ශිල්ප ක්‍රම
ක්‍රියාකාරී වෙළඳපොළ තුළ ඇති සමාන උපකරණ සඳහා මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ හෝ ක්‍රියාකාරී නොවන වෙළඳපොළ තුළ ඇති සර්වසම හෝ සමාන මූල්‍ය උපකරණ සඳහා මිල ප්‍රකාශිත මූල්‍ය උපකරණ සහ සියලුම වැදගත් යෙදවුම් නිරීක්ෂණය කළ හැකි මූල්‍ය උපකරණ ආකෘති භාවිතයෙන් තක්සේරු කරනු ලබයි.

තුන්වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම් කරණ කොට ගත් තක්සේරු ශිල්ප ක්‍රම
නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම් එකක් හෝ කිහිපයක් පවතින මූල්‍ය උපකරණ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් අගය කරනු ලබයි.

සියලු මූල්‍ය උපකරණ වල මිල තීරණය කරනු ලබන්නේ බාහිර වෙළඳපොල මිල හෝ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතයෙන් මිල තක්සේරු කිරීමේ ආකෘති, ස්වාධීන මිල නිර්ණය කිරීම හෝ වලංගුතා ලබා ගැනීම මඟින් වේ. අක්‍රීය වෙළඳපොලක් තුලදී, විකුණුම් මිල සෘජු ලෙස නිරීක්ෂණය කල නොහැකි වේ. එවැනි අවස්ථා වලදී මූල්‍ය උපකරණ වල සාධාරණ අගය තහවුරු කිරීම සඳහා බැංකුව විසින් විකල්ප වෙළඳපොළ තොරතුරු භාවිතා කරනු ලැබේ. මේ තත්ත්වයේ දී බැංකුව විසින් මූල්‍ය උපකරණයේ වටිනාකම තහවුරු කිරීම සඳහා වඩා විශ්වාසනීය ලෙස ලබා ගත හැකි විශේෂ වෙළඳපොල තොරතුරු වෙත වැඩි බරක් තබනු ලැබේ.

61.1 සාධාරණ අගයට තක්සේරු කරන වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

සියලුම ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින වර්ගීකරණය යටතේ වර්ග කරන අතර තක්සේරු කිරීම වෙළඳපොල නිරීක්ෂණය කළ හැකි සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සමඟ අගය කිරීමේ ක්‍රියාදාමය මඟින් සිදු කරයි. බහුල වශයෙන් භාවිතා කරන තක්සේරු ක්‍රියාදාමයට තත්කාලීන ඉදිරි විදේශ විනිමය අනුපාතය හා ඉදිරි වාරික ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්

රජයේ සුරුකුම්පත්, ලැයිස්තුගත ණය සුරුකුම්පත්, ඒකක භාර වල ඒකක ස්කන්ධයන් යනාදිය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් වේ. ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා අනුපාතය අනුව රජයේ සුරුකුම්පත් අගය කරනු ලැබේ. ලැයිස්තුගත ස්කන්ධයන් හා ලැයිස්තුගත ණය සුරුකුම්පත් පිළිබඳ තක්සේරු කිරීමට බැංකුව විසින් වාර්තා කරන දිනට පවතින ක්‍රියාකාරී වෙලඳපොළේ ලැයිස්තුගත වෙළඳපොළ මිල ගණන් භාවිතා කරයි. ඒකක භාර වල ඒකක වැනි වත්කම් අගය කිරීම සඳහා වඩාත් අදාළ මිල වන අදාළ වත්කම් කළමනාකරණ ආයතනයන්හි කළමනාකරණ මිලදී ගැනීමේ අගය භාවිතා කරයි.

වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් යටතට රජයේ සුරුකුම්පත්, ප්‍රකාශිත ස්කන්ධයන් සහ මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන් වර්ගීකරණය කරයි.

- රජයේ සුරුකුම්පත්, වාර්තා කරන දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ඵලදා අනුපාතික වක්‍රය පදනම් කර ගනිමින් තක්සේරු කරයි.
- වාර්තා කරන දිනට ක්‍රියාකාරී වෙළඳපොලෙහි ලැයිස්තුගත මිල, මිල ප්‍රකාශිත ස්කන්ධයන් සහ මිල ප්‍රකාශිත ණය සුරුකුම්පත් තක්සේරු කිරීම සඳහා යොදා ගනියි.
- මෑත කාලීනව සිදු කරන ලද තක්සේරු කිරීම් හේතුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කොටස් ආයෝජනය වීම අගය පදනම් ව පෙන්නුම් කරන අතර අනෙකුත් සියළුම මිල ප්‍රකාශ නොකළ ආයෝජනයන් පිරිවැයට පවත්වා ගෙන යයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කොටස් ආයෝජනය සඳහා සාධාරණ අගය ගණනය කිරීම සඳහා අභ්‍යන්තර කළමනාකරණ තක්සේරු තාක්ෂණ ක්‍රමයක් භාවිතා කරන ලද අතර එහි විස්තර සටහන 61.1.3 හි දැක්වේ.

දේපල, පිරියත සහ උපකරණ

ප්‍රත්‍යාගණන අගයෙන් අදාළ සමුච්චිත ක්ෂය වීම් සහ හානිකරණ අලාභයන් අඩු කළ පසු අගයට නිදහස් අයිතිය සහිත ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු දේපලයන්හි ගොඩනැගිලි පවත්වා ගෙන යයි.

61.1.1 සාධාරණ අගයට මනින ලද වත්කම් - සාධාරන අගයන්හි ධූරාවලිය

2018 දෙසැම්බර් 31 දිනට	බැංකුව				සමූහය			
	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	28,897	-	28,897	-	28,897	-	28,897
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	1,176,760	1,176,760	-	-	1,176,760	1,176,760
	-	**28,897**	**1,176,760**	**1,205,657**	**-**	**28,897**	**1,176,760**	**1,205,657**
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්								
භාණ්ඩාගාර බිල්පත්	3,533,195	-	-	3,533,195	3,533,195	-	-	3,533,195
භාණ්ඩාගාර බැඳුම්කර	632,810	-	-	632,810	632,810	-	-	632,810
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	2,507,508	-	-	2,507,508	2,780,491	-	-	2,780,491
අනෙකුත් ණය උපකරණ	-	-	-	-	1,715	-	-	1,715
ඒකක භාරයන්හි ඒකක	-	2,603,785	-	2,603,785	-	2,635,116	-	2,635,116
	6,673,513	**2,603,785**	**-**	**9,277,298**	**6,948,211**	**2,635,116**	**-**	**9,583,327**
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්								
මිල ප්‍රකාශිත ආයෝජන								
රාජ්‍ය සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	4,550,469	-	-	4,550,469	5,718,800	-	-	5,718,800
භාණ්ඩාගාර බැදුම්කර	6,178,278	-	-	6,178,278	6,695,168	-	-	6,695,168
වෙනත් රටවල	1,587,030	-	-	1,587,030	2,663,447	-	-	2,663,447
ස්කන්ධයන්	3,142,087	-	-	3,142,087	4,050,702	-	-	4,050,702
මිල ප්‍රකාශ නොකළ ආයෝජන								
ස්කන්ධයන්	-	1,012,411	229,306	1,241,717	-	1,012,411	274,671	1,287,082
	15,457,864	**1,012,411**	**229,306**	**16,699,581**	**19,128,117**	**1,012,411**	**274,671**	**20,415,199**
මුළු මූල්‍ය වත්කම්	**22,131,377**	**3,645,093**	**1,406,066**	**27,182,536**	**26,076,328**	**3,676,424**	**1,451,431**	**31,204,183**
මූල්‍ය නොවන වත්කම්								
දේපල, පිරියත හා උපකරණ	-	-	18,458,592	18,458,592	-	-	31,291,571	31,291,571
මුළු මූල්‍ය නොවන වත්කම්	**-**	**-**	**18,458,592**	**18,458,592**	**-**	**-**	**31,291,571**	**31,291,571**
එකතුව	**22,131,377**	**3,645,093**	**19,864,658**	**45,641,128**	**26,076,328**	**3,676,424**	**32,743,002**	**62,495,754**
මූල්‍ය වගකීම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	31,736	-	31,736	-	31,736	-	31,736
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	477,282	477,282	-	-	477,282	477,282
මුළු මූල්‍ය වගකීම්	**-**	**31,736**	**477,282**	**509,018**	**-**	**31,736**	**477,282**	**509,018**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2017 දෙසැම්බර් 31 දිනට	බැංකුව				සමූහය			
	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	4,288	-	4,288	-	4,288	-	4,288
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	1,614,535	1,614,535	-	-	1,614,535	1,614,535
	-	**4,288**	**1,614,535**	**1,618,823**	**-**	**4,288**	**1,614,535**	**1,618,823**
මූල්‍ය උපකරණ - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින								
භාණ්ඩාගාර බිල්පත්	4,749,058	-	-	4,749,058	4,749,058	-	-	4,749,058
භාණ්ඩාගාර බැඳුම්කර	680,380	1,789	-	682,169	680,380	1,789	-	682,169
ශ්‍රී ලංකා ස්වෛරී බැඳුම්කර	166,863	-	-	166,863	166,863	-	-	166,863
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	2,761,184	-	-	2,761,184	2,993,845	-	-	2,993,845
අනෙකුත් ණය උපකරණ	-	-	-	-	4,613	-	-	4,613
	8,357,485	**1,789**	**-**	**8,359,274**	**8,594,759**	**1,789**	**-**	**8,596,548**
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින								
මිල ප්‍රකාශිත ආයෝජන								
රාජ්‍ය සුරැකුම්පත්								
භාණ්ඩාගාර බිල්පත්	4,044,815	-	-	4,044,815	4,236,635	-	-	4,236,635
භාණ්ඩාගාර බැඳුම්කර	4,153,858	-	-	4,153,858	4,945,270	-	-	4,945,270
වෙනත් රටවල	1,478,870	-	-	1,478,870	3,718,590	-	-	3,718,590
මිල ප්‍රකාශිත ස්කන්ධයන්	3,687,567	-	-	3,687,567	5,009,964	-	-	5,009,964
මිල ප්‍රකාශ නොකළ ආයෝජන								
ඒකක භාරයන්හි ඒකක	-	3,626,484	-	3,626,484	-	3,660,702	-	3,660,702
මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්	-	701,859	227,717	929,576	-	701,859	279,272	981,131
	13,365,110	**4,328,343**	**227,717**	**17,921,170**	**17,910,459**	**4,362,561**	**279,272**	**22,552,292**
මුළු මූල්‍ය වත්කම්	**21,722,595**	**4,334,420**	**1,842,252**	**27,899,267**	**26,505,218**	**4,368,638**	**1,893,807**	**32,767,663**
මූල්‍ය නොවන වත්කම්								
දේපල, පිරියත හා උපකරණ	-	-	18,030,186	18,030,186	-	-	30,852,915	30,852,915
	-	**-**	**18,030,186**	**18,030,186**	**-**	**-**	**30,852,915**	**30,852,915**
එකතුව	**21,722,595**	**4,334,420**	**19,872,438**	**45,929,453**	**26,505,218**	**4,368,638**	**32,746,722**	**63,620,578**
මූල්‍ය වගකීම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය හිවිසුම්	-	2,584	-	2,584	-	2,584	-	2,584
මුදල් හුවමාරු හිවිසුම් (SWAPs)	-	-	68,131	68,131	-	-	68,131	68,131
එකතුව	**-**	**2,584**	**68,131**	**70,715**	**-**	**2,584**	**68,131**	**70,715**

61.1.2 තෙවන මට්ටමේ වත්කම්වල සාධාරණ අගයන්හි සංචලනයන්

සාධාරණ අගයට වාර්තා කළ තෙවන මට්ටමේ වත්කම් සහ වගකීම්හි ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පහත වගුවෙන් දැක්වේ.

	බැංකුව					සමූහය				
	2018 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2018 දෙසැම්බර් 31 දිනට	2018 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම් (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2018 දෙසැම්බර් 31 දිනට
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්										
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	1,614,535	-	-	(437,775)	1,176,760	1,614,535	-	-	(437,775)	1,176,760
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්										
මිල ප්‍රකාශ නොකළ ආයෝජන										
මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්	227,717	-	-	1,589	229,306	279,272	-	(6,190)	1,589	274,671
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වත්කම්	**1,842,252**	**-**	**-**	**(436,186)**	**1,406,066**	**1,893,807**	**-**	**(6,190)**	**(436,186)**	**1,451,431**
මූල්‍ය නොවන වත්කම්										
දේපල, පිරියත හා උපකරණ	18,030,186	(175,795)	(337,522)	941,723	18,458,592	30,852,915	(721,771)	147,397	1,013,030	31,291,571
තෙවන මට්ටමෙහි මුළු වත්කම්	**19,872,438**	**(175,795)**	**(337,522)**	**505,537**	**19,864,658**	**32,746,722**	**(721,771)**	**141,207**	**576,844**	**32,743,002**
මූල්‍ය වගකීම්										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	68,131	-	-	409,151	477,282	68,131	-	-	409,151	477,282
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වගකීම්	**68,131**	**-**	**-**	**409,151**	**477,282**	**68,131**	**-**	**-**	**409,151**	**477,282**
තෙවන මට්ටමෙහි ශුද්ධ වත්කම්	**1,774,121**	**-**	**-**	**(845,337)**	**928,784**	**1,825,676**	**-**	**(6,190)**	**(845,337)**	**974,149**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සාධාරණ අගයට වාර්තා කළ තෙවන මට්ටමේ වත්කම් සහ වගකීම්හි ආරම්භක සහ අවසාන ශේෂයන්හි සැසඳුමක් පහත වගුවෙන් දැක්වේ.

	බැංකුව					සමූහය				
	2017 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම්/ (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2017 දෙසැම්බර් 31 දිනට	2017 ජනවාරි 1 දිනට	ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මුළු ලාභ/(අලාභ)	මිලදී ගැනීම් (විකිණීම්) සහ අනෙකුත් ගැලපීම්	2017 දෙසැම්බර් 31 දිනට
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්										
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	5,291,781	-	-	(3,677,246)	1,614,535	5,291,781	-	-	(3,677,246)	1,614,535
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින										
මිල ප්‍රකාශ නොකළ ආයෝජන										
මිල ප්‍රකාශ නොකළ ස්කන්ධයන්	227,717	-	-	-	227,717	269,027	10,245	-	-	279,272
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වත්කම්	**5,519,498**	**-**	**-**	**(3,677,246)**	**1,842,252**	**5,560,808**	**10,245**	**-**	**(3,677,246)**	**1,893,807**
මූල්‍ය නොවන වත්කම්										
දේපල, පිරියත හා උපකරණ	11,219,722	(168,343)	6,059,715	919,092	18,030,186	24,164,115	(701,807)	6,406,248	984,359	30,852,915
තෙවන මට්ටමෙහි මුළු වත්කම්	**16,739,220**	(168,343)	6,059,715	**(2,758,154)**	**19,872,438**	**29,724,923**	**(691,562)**	**6,406,248**	**(2,692,887)**	**32,746,722**
මූල්‍ය වගකීම්										
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	163,453	-	-	(95,322)	68,131	163,453	-	-	(95,322)	68,131
තෙවන මට්ටමෙහි මුළු මූල්‍ය වගකීම්	**163,453**	**-**	**-**	**(95,322)**	**68,131**	**163,453**	**-**	**-**	**(95,322)**	**68,131**
තෙවන මට්ටමෙහි ශුද්ධ වත්කම්	**5,356,045**	**-**	**-**	**(3,581,924)**	**1,774,121**	**5,397,355**	**10,245**	**-**	**(3,581,924)**	**1,825,676**

61.1.3 සාධාරණ අගය ගණනය කිරීම සඳහා භාවිතා කළ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

තුන්වන මට්ටමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගණනය කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට භාවිතා කරන ලද නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

මූල්‍ය උපකරණ වර්ගය	2018 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. '000	තක්සේරු ශිල්පීය ක්‍රමය	වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සඳහා ඇස්තමේන්තු පරාසය	නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වලින් සාධාරණ අගය මැනීම සඳහා සංවේදීතාවය
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ					
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	1,176,760	ඉදිරි මිල කිරීම් ක්‍රමය	ඉදිරි විදේශ විනිමය අනුපාතය	පදනම් ඒකක ඍණ 0.01 සිට ධන 0.01 දක්වා	ව්‍යුත්පන්න වත්කම්වල අගයට රු. මිලියන 1.2 ක් වාසිදායකව හෝ අවාසිදායකව බලපායි.
			පිටස්තර ණය අවදානම සඳහා වට්ටම් කළ ක්‍රමය		
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්					
මිල ප්‍රකාශ නොකල ස්කන්ධ කොටස්					
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	162,300	වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය	නොවෙනස් ලාභාංශ ක්‍රමය	පවතින ප්‍රාග්ධන පිරිවැයට 5% අඩුවීම සහ 5% වැඩිවීම.	සාධාරණ අගයට වන බලපෑම ධන රු. මිලියන 8.1 සිට ඍණ රු. මිලියන 8.1 අතර විය හැකිය. ආයෝජන සඳහා සැලකිය යුතු බලපෑමක් නැත.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය	43,131	පිරිවැයට මිල කිරීම*			*සාධාරණ අගය විශ්වාසනීය ලෙස මැනිය නොහැක. මෙම ආයෝජන අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇති ආයතනවල සිදු කර ඇති අතර, චිමඟින් ගනුදෙනු පහසු කිරීම හා මෙහෙයවීම සිදු කරයි. තම පිරිවැය ආවරණය කර ගැනීමට අවශ්‍ය සේවා ගාස්තු පමණක් අය කරමින් සේවා සපයනු ලැබේ.
සී/ස ෆිච් රේටින්ස් ලංකා සමාගම	625	පිරිවැයට මිල කිරීම*			
සී/ස ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගම	21,000	පිරිවැයට මිල කිරීම*			
සී/ස ලංකා ෆයිනෑන්ෂියල් සර්විසස් බියුරෝ සමාගම	2,250	පිරිවැයට මිල කිරීම*			

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

61.2 සාධාරණ අගයට පවත්වා ගෙන නොයන මූල්‍ය වත්කම් සහ වගකීම්හි සාධාරණ අගය

පහත වගුවෙන්, මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ අගයට පවත්වා ගෙන නොයන වත්කම් හා වගකීම් වල සාධාරණ අගය සාරාංශ කර පෙන්වයි.

	බැංකුව					සමූහය				
	සාධාරණ අගය				ධාරණ අගය	සාධාරණ අගය				ධාරණ අගය
2018 දෙසැම්බර් 31 දිනට	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව		1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්										
ණය සහ වෙනත් උපකරණ	335,143,660	7,444,961	213,772,945	556,361,616	551,839,449	335,321,834	7,324,233	213,828,138	556,474,205	551,956,734
ආයෝජන දේපල	-	-	3,000,000	3,000,000	2,765,856	-	-	574,309	574,309	120,182
එකතුව	**335,143,660**	**7,444,961**	**216,772,945**	**559,361,616**	**554,605,305**	**335,321,834**	**7,324,233**	**214,402,447**	**557,048,514**	**552,076,916**
වගකීම්										
වෙනත් ණය ගැනීම්	-	-	201,792,174	201,792,174	201,792,174	-	-	207,053,674	207,053,674	207,053,674
නිකුත් කළ ණය සුරැකුම්	-	-	-	-	-	-	-	4,105,681	4,105,681	4,105,681
යටත් කාලීන ණය	-	38,688,492	11,992,500	50,680,992	50,827,239	-	38,427,596	11,992,500	50,420,096	50,484,487
එකතුව	**-**	**38,688,492**	**213,784,674**	**252,473,166**	**252,619,413**	**-**	**38,427,596**	**223,151,855**	**261,579,451**	**261,643,842**

	බැංකුව					සමූහය				
	සාධාරණ අගය				ධාරණ අගය	සාධාරණ අගය				ධාරණ අගය
2017 දෙසැම්බර් 31 දිනට	1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව		1 මට්ටම	2 මට්ටම	3 මට්ටම	එකතුව	
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්										
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	5,580,979	206,818,389	212,399, 368	213,167,048	-	5,426,481	208,155,463	213,581,944	214,349,624
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	310,076,948	-	-	310,076,948	308,256,082	310,571,183	-	-	310,571,183	308,750,317
ආයෝජන දේපල	-	-	3,000,000	3,000,000	2,882,928	-	-	574,309	574,309	123,773
එකතුව	**310,076,948**	**5,580,979**	**209,818,389**	**525,476,316**	**524,306,058**	**310,571,183**	**5,426,481**	**208,729,772**	**524,727,436**	**523,223,714**
වගකීම්										
වෙනත් ණය ගැනීම්	77,571,805	-	100,937,256	178,509,061	178,191,089	77,571,805	-	107,076,348	184,648,153	184,330,181
නිකුත් කළ ණය සුරැකුම්	-	-	-	-	-	-	-	5,667,514	5,667,514	5,667,514
යටත් කාලීන ණය	-	32,403,624	10,006,517	42,410,141	42,570,457	-	32,219,550	10,006,517	42,226,067	42,226,067
එකතුව	**77,571,805**	**32,403,624**	**110,943,773**	**220,919,202**	**220,761,546**	**77,571,805**	**32,219,550**	**122,750,379**	**232,541,734**	**232,223,762**

දැනටමත් මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ අගයට වාර්තා නොකරන මෙවැනි මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය නිර්ණය කිරීමේදී භාවිතා කල ක්‍රමවේදයන් සහ උපකල්පනයන් පහතින් විස්තර කෙරේ.

ක්‍රමක්ෂ පිරිවැයට මූල්‍ය වත්කම්

මේ යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, රාජ්‍ය සුරැකුම්පත් සහ සංස්ථාපිත ණය සුරැකුම්පත් වාර්තා කරයි.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අර්ධ වාර්ෂිකව මිල නැවත තීරණය වන විචල්‍ය අනුපාත උපකරණ වෙයි. එම නිසා ඒවායේ ධාරණ අගය සාධාරණ අගයට දළ වශයෙන් සමාන බව උපකල්පනය කරනු ලැබේ. මිල ප්‍රකාශිත සංස්ථාපිත ණය සුරැකුම්පත්හි වාර්තා කරන දිනට ලැයිස්තුගත වෙළඳපොල මිල මත තීරණය කරන අතර මිල ප්‍රකාශ නොකළ ණය සුරැකුම්පත්හි සහ රාජ්‍ය සුරැකුම්පත්හි සාධාරණ අගය, එම වර්ගයට සමාන උපකරණයන්හි වාර්තා කරන දිනට පවතින පොළී අනුපාතය යටතේ ලැබිය හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය පදනම්ව තක්සේරු කරනු ලැබේ.

ආයෝජන දේපල

ආයෝජන දේපල අගය කිරීම ස්වාධීන, වෘත්තීය තක්සේරුකරුවන් විසින් සිදු කරයි. මෙයට අදාළ වැඩි විස්තර සටහන් 33 යටතේ දක්වා ඇත.

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් යටතේ දේශීය හා විදේශීය බැංකු හා මූල්‍ය ආයතන වලින් ගත් කාලීන ණය සහ ප්‍රතිමූල්‍ය ණය මේ යටතේ නියෝජනය කරයි.

කාලීන ණය ගැනීම් සහ ප්‍රති මූල්‍ය ණය වල අගය කිරීම ඒ හා සමාන උපකරණයන්හි ඵලදායී පොළී අනුපාතය පදනම්ව අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් සිදු කරයි.

නිකුත් කළ ණය සුරැකුම්පත්

වාර්තා කරන දිනට ඒ හා සමාන උපකරණයන්හි පොළී අනුපාත පදනම්ව ණය සුරැකුම්පත් සඳහා ගෙවීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය පදනම්ව අගය කරනු ලබයි.

යටත් කාලීන ණය

මේවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත අතර ඒවායෙහි වාර්තා කරන දිනට වෙළඳපොළ මිල පදනම්ව අගය කිරීම සිදු කරයි.

61.3 ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන වත්කම්

කෙටි කාලීන කල් පිරීමක් සහිත මූල්‍ය වත්කම්හි සහ වගකීම්හි ධාරණ අගය දළ වශයෙන් සාධාරණ අගයට සමාන බව උපකල්පනය කරන ලදී. වර්ෂයකට වඩා වැඩි කාලයක් සහිත ගිවිසුම්ගත කල් පිරීමක් සහිත සමහර උපකරණයන්හි සාධාරණ අගය සාධාරණ පදනම් භාවිතයෙන් තීරණය කරන ලදී. සමහර මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය ස්ථාපනය කිරීම සඳහා බැංකුව භාවිතා කල පදනම් පහත දක්වා ඇත.

ක්‍රමක්ෂ පිරිවැයට මූල්‍ය වත්කම් - ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම්

මුළු ණය සහ අත්තිකාරම් කළඹින් 40% කට වැඩි ප්‍රමාණයක ඉතිරි ගිවිසුම්ගත කාලය අවුරුද්දකට වඩා අඩු අතර ඉතිරියෙන් 95% ක ණය ශේෂයන් ප්‍රදානය කර ඇත්තේ චල පොළී අනුපාතය මතය. එම නිසා ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම්හි සාධාරණ අගය වාර්තාකරන දිනට දළ වශයෙන් එහි ධාරණ අගය වේ.

ක්‍රමක්ෂ අගයට මූල්‍ය වගකීම් - ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු

පාරිභෝගික තැන්පතු අතරින් 90% කට වැඩි ප්‍රමාණයක් ඉල්ලූ විට ආපසු ගෙවිය යුතු හෝ ගිවිසුම්ගත කල් පිරීම අවුරුද්දට වඩා අඩු ඒවා වේ. අවුරුද්දකට වඩා වැඩි කල්පිරීමක් සහිත තැන්පතු කල් පිරීමට පෙර අවසන් කිරීමේ ප්‍රවණතාවයක් පවතී. කල්පිරීමට පෙර තැන්පතු ලබා ගැනීමේදී ගෙවන මුදල අදාළ දිනට තැන්පතුවෙහි ධාරණ අගයට සැලකිය යුතු වෙනසක් නොපෙන්වයි. එම නිසා ගනුදෙනුකාර තැන්පතුන්හි සාධාරණ අගය වාර්තාකරන දිනට දළ වශයෙන් ඒවායෙහි ධාරණ අගයට සමාන වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	2018		2017	
	ධාරණ අගය	**සාධාරණ අගය**	ධාරණ අගය	සාධාරණ අගය
	රු. '000	**රු. '000**	රු. '000	රු. '000
බැංකුව				
මූල්‍යමය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	78,447,577	78,447,577	72,843,108	72,843,108
මහ බැංකු සමග ඇති ශේෂයන්	65,680,371	65,680,371	68,689,012	68,689,012
බැංකුවල ඇති තැන්පතු	40,450,089	40,450,089	8,067,490	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	18,455,555	18,455,555
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය හා අත්තිකාරම්	1,429,107,181	1,429,107,181	1,163,160,914	1,163,160,914
මුළු මූල්‍ය වත්කම්	**1,613,685,218**	**1,613,685,218**	**1,331,216,079**	**1,331,216,079**
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	2,402,468	2,402,468	2,203,199	2,203,199
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	97,399,359	97,399,359	44,487,462	44,487,462
තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	1,765,025,970	1,765,025,970	1,546,832,036	1,546,832,036
මුළු මූල්‍ය වගකීම්	**1,864,827,797**	**1,864,827,797**	**1,593,522,697**	**1,593,522,697**
සමූහය				
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	78,558,031	78,558,031	78,005,362	78,005,362
මහ බැංකු සමග ඇති ශේෂයන්	65,680,371	65,680,371	68,689,012	68,689,012
බැංකුවල ඇති තැන්පතු	41,681,910	41,681,910	5,319,602	5,319,602
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,436,068	1,436,068	19,872,247	19,872,247
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ණය හා අත්තිකාරම්	1,460,618,588	1,460,618,588	1,194,294,394	1,194,294,394
මුළු මූල්‍ය වත්කම්	**1,647,974,968**	**1,647,974,968**	**1,366,180,617**	**1,366,180,617**
මූල්‍ය වගකීම්				
බැංකු වලට ගෙවිය යුතු	2,515,998	2,515,998	2,194,266	2,194,266
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්	97,423,302	97,423,302	44,628,686	44,628,686
තැන්පතුකරුවන්ට ගෙවිය යුතු	1,783,975,493	1,783,975,493	1,566,376,418	1,566,376,418
මුළු මූල්‍ය වගකීම්	**1,883,914,793**	**1,883,914,793**	**1,613,199,370**	**1,613,199,370**

61.4 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය

2018 වර්ෂය තුළදී නැවත වර්ග කිරීම් සිදු වී නොමැත.

62 පරිවර්තන හෙලිදරව් කිරීම්

බැංකුව විසින් 2018 දෙසැම්බර් 31 දිනට දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" අනුගත කිරීම සඳහා නවීකරණය කරන ලද ක්‍රමයක් භාවිතා කරන ලදී. ඒ අනුව 2017 වර්ෂය සඳහා ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 හි විෂය පථයට අනුකූලව, මූල්‍ය උපකරණ සඳහා සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නැත. 2017 වර්ෂය සඳහා අදාල ශේෂයන්හී සංසන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 අනුකූලව ඉදිරිපත් කර ඇත

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 අනුගත කල දිනයේදී ඇති වූ බලපෑම වනම් 2018 ජනවාරි 01 දින, 2018 වර්ෂයේ ආරම්භක රඳවාගත් ඉපැයුම් සඳහා ගලපා ඇති අතර 2018 ජනවාරි 1 දින මූල්‍ය තත්ත්වයට වූ බලපෑම පහත ඉදිරිපත් කර ඇත.

62.1 2018 ජනවාරි 1 දිනට ලං. ගි. ප්‍ර. 39 යටතේ වාර්තා කරන ලද ධාරණ අගය සහ ශ්‍රී ලං. මු. වා. ප්‍ර. 9 යටතේ වාර්තා කරන ලද අගයන් පිළිබඳ සැසඳුම් වාර්තාව

බැංකුව	සටහන	ලං. ගි. ප්‍ර. 39 - 2017 දෙසැම්බර් 31		නැවත වර්ගීකරණය	නැවත අගය කිරීම		ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 2018 ජනවාරි 1	
		කාණ්ඩය	වටිනාකම		අපේක්ෂිත ණය හානිය	වෙනත්	වටිනාකම	කාණ්ඩය
			රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ		L&R	72,843,108	-	(10,905)	-	72,832,203	AC
මහ බැංකු සමග ඇති ශේෂයන්		L&R	68,689,012	-	-	-	68,689,012	AC
බැංකුවල ඇති තැන්පතු		L&R	8,067,490	-	(588)	-	8,066,902	AC
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්		L&R	18,455,555	-	-	-	18,455,555	AC
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		HFT	1,618,823	-	-	-	1,618,823	FVTPL
ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්		HFT	8,359,274	3,459,621	-	-	11,818,895	FVTPL
උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	අ		-	*3,626,484*	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ආ		-	*(166,863)*	-	-	-	
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට								
- ණය හා අත්තිකාරම්		L&R	1,163,160,914	-	(9,688,976)	-	1,153,471,938	AC
- ණය උපකරණ			-	521,589,993	(1,038,872)	-	520,551,121	AC
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වල සිට	ආ		-	*166,863*	-	-	-	
ණය හා ලැබිය යුතු දෑ සිට	ඇ		-	*213,167,048*	-	-	-	
කල්පිරෙන තෙක් දරා සිටින වත්කම්වල සිට	ඈ		-	*308,256,082*	-	-	-	
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ		L&R	213,167,048	(213,167,048)	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ඇ		-	*(213,167,048)*	-	-	-	
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන		HTM	308,256,082	(308,256,082)	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ඈ		-	*(308,256,082)*	-	-	-	
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින			-	14,294,686	-	-	14,294,686	FVTOCI
උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	ඉ		-	*14,294,686*	-	-	-	
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින		AFS	17,921,170	(17,921,170)	-	-	-	
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වල සිට	අ		-	*(3,626,484)*	-	-	-	
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වලට වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන වත්කම්වලට	ඉ		-	*(14,294,686)*	-	-	-	
මූල්‍ය නොවන වත්කම්								
පරිපාලිත සමාගම්වල ආයෝජන		N/A	6,513,048	-	-	-	6,513,048	N/A
ආශ්‍රිත සමාගම්වල ආයෝජන		N/A	92,988	-	-	-	92,988	N/A
ආයෝජන දේපළ		N/A	2,882,928	-	-	-	2,882,928	N/A
දේපළ, පිරියත හා උපකරණ		N/A	23,046,114	-	-	-	23,046,114	N/A
කල්බදු දේපළ		N/A	101,481	-	-	-	101,481	N/A
අස්පෘශ්‍ය වත්කම්		N/A	810,730	-	-	-	810,730	N/A
වෙනත් වත්කම්		N/A	37,818,188	-	-	-	37,818,188	N/A
මුළු වත්කම්			**1,951,803,953**	**-**	**(10,739,341)**	**-**	**1,941,064,612**	

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

බැංකුව	සටහන	ලං. හි. ප්‍ර. 39 - 2017 දෙසැම්බර් 31		නැවත වර්ගීකරණය	නැවත අගය කිරීම		ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 2018 ජනවාරි 1	
		කාණ්ඩය	වටිනාකම		අපේක්ෂිත ණය හානිය	වෙනත්	වටිනාකම	කාණ්ඩය
			රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	
මූල්‍ය වගකීම්								
බැංකු වලට ගෙවිය යුතු		AC	2,203,199	-	-	-	2,203,199	AC
ප්‍රති මිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්		AC	44,487,462	-	-	-	44,487,462	AC
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		HFT	70,715	-	-	-	70,715	FVTPL
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට								
- තැන්පතුකරුවන්ට ගෙවිය යුතු		AC	1,546,832,036	-	-	-	1,546,832,036	AC
- ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු		AC	-	-	-	-	-	AC
- වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු		AC	178,191,089	-	-	-	178,191,089	AC
යටත් කාලීන ණය		AC	42,570,457	-	-	-	42,570,457	AC
මූල්‍ය නොවන වගකීම්								
ප්‍රවර්තන බදු වගකීම්		N/A	1,877,342	-	-	-	1,877,342	N/A
විලම්බිත බදු වගකීම්		N/A	5,820,329	-	(3,345,868)	-	2,474,461	N/A
වෙනත් වගකීම්		N/A	18,596,249	-	-	-	18,596,249	N/A
මුළු වගකීම්			**1,840,648,878**	**-**	**(3,345,868)**	**-**	**1,837,303,010**	
ස්කන්ධය								
කොටස් ප්‍රාග්ධනය		N/A	20,000,000	-	-	-	20,000,000	N/A
ස්ථාවර සංචිත අරමුදල		N/A	10,427,000	-	-	-	10,427,000	N/A
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත		N/A	-	2,541,656	-	-	2,541,656	N/A
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතයෙන්	ඉ		-	*2,541,656*	-	-	-	
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිත		N/A	3,718,526	(3,718,526)	-	-	-	N/A
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත වෙතට	ඉ		-	*(2,541,656)*	-	-	-	
රඳවා ගත් ඉපැයුම් වෙතට	අ		-	*(1,176,870)*	-	-	-	
රඳවා ගත් ඉපැයුම්		N/A	63,472,250	1,176,870	(7,393,473)	-	57,255,647	N/A
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිත	අ		-	*1,176,870*	-	-	-	
වෙනත් සංචිත		N/A	13,537,299	-	-	-	13,537,299	N/A
මුළු ස්කන්ධය			**111,155,075**	**-**	**(7,393,473)**	**-**	**103,761,602**	
මුළු වගකීම් සහ ස්කන්ධය			**1,951,803,953**	**-**	**(10,739,341)**	**-**	**1,941,064,612**	

L&R - ණය හා ලැබිය යුතු දෑ, HFT - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින, AFS - උපලබ්ධිය සඳහා පවතින වත්කම්,

HTM - කල්පිරෙන තෙක් දරා සිටින, AC - ක්‍රමක්ෂය පිරිවැය, FVTPL - ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්,
FVTOCI - වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට කරනු ලබන වත්කම්, N/A - අදාල නැත.

සමූහය	සටහන	ලං. හි. ප්‍ර. 39 - 2017 දෙසැම්බර් 31		නැවත වර්ගීකරණය	නැවත අගය කිරීම		ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 2018 ජනවාරි 1	
		කාණ්ඩය	වටිනාකම		අපේක්ෂිත ණය හානිය	වෙනත්	වටිනාකම	කාණ්ඩය
			රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ		L&R	78,005,362	-	(10,916)	-	77,994,446	AC
මහ බැංකු සමග ඇති ශේෂයන්		L&R	68,689,012	-	-	-	68,689,012	AC
බැංකුවල ඇති තැන්පතු		L&R	5,319,602	-	(934)	-	5,318,668	AC
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්		L&R	19,872,247	-	-	-	19,872,247	AC
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		HFT	1,618,823	-	-	-	1,618,823	FVTPL
ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්		HFT	8,596,548	3,459,621	-	-	12,056,169	FVTPL
උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	අ		-	*3,626,484*	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ආ		-	*(166,863)*	-	-	-	
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට								
- ණය හා අත්තිකාරම්		L&R	1,194,294,394	-	(10,771,427)	-	1,183,522,967	AC
- ණය උපකරණ			-	523,266,804	(1,039,648)	-	522,227,156	AC
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වල සිට	ආ		-	*166,863*	-	-	-	
ණය හා ලැබිය යුතු දෑ සිට	ඇ		-	*214,349,624*	-	-	-	
කල්පිරෙන තෙක් දරා සිටින වත්කම්වල සිට	ඈ		-	*308,750,317*	-	-	-	
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ		L&R	214,349,624	(214,349,624)	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ඇ		-	*(214,349,624)*	-	-		
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන		HTM	308,750,317	(308,750,317)	-	-	-	
ක්‍රමක්ෂය පිරිවැයට	ඈ		-	*(308,750,317)*	-	-	-	
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින			-	18,925,808	-	-	18,925,808	FVTOCI
උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	ඉ		-	*18,925,808*	-	-	-	
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින		AFS	22,552,292	(22,552,292)	-	-	-	
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වල සිට	අ		-	*(3,626,484)*	-	-	-	
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්වලට වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන වත්කම්වලට	ඉ		-	*(18,925,808)*	-	-	-	
මූල්‍ය නොවන වත්කම්								
පරිපාලිත සමාගම්වල ආයෝජන		N/A	-	-	-	-	-	N/A
ආශ්‍රිත සමාගම්වල ආයෝජන		N/A	446,793	-	-	-	446,793	N/A
ආයෝජන දේපළ		N/A	123,773	-	-	-	123,773	N/A
ආයෝජන දේපළ		N/A	36,608,919	-	-	-	36,608,919	N/A
කල්බදු දේපළ		N/A	134,441	-	-	-	134,441	N/A
අස්පෘශ්‍ය වත්කම්		N/A	1,074,436	-	-	-	1,074,436	N/A
විලම්බිත බදු වත්කම්		N/A	8,621	-	-	-	8,621	N/A
වෙනත් වත්කම්		N/A	38,964,979	-	-	-	38,964,979	N/A
මුළු වත්කම්			**1,999,410,183**	**-**	**(11,822,925)**	**-**	**1,987,587,258**	

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන	ලං. ගි. ප්‍ර. 39 - 2017 දෙසැම්බර් 31		නැවත වර්ගීකරණය	නැවත අගය කිරීම		ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 2018 ජනවාරි 1	
		කාණ්ඩය	වටිනාකම		අපේක්ෂිත ණය හානිය	වෙනත්	වටිනාකම	කාණ්ඩය
සමූහය			රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	
මූල්‍ය වගකීම්								
බැංකු වලට ගෙවිය යුතු		AC	2,194,266	-	-	-	2,194,266	AC
ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් යටතේ අලෙවි කරනු ලැබූ සුරැකුම්පත්		AC	44,628,686	-	-	-	44,628,686	AC
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		HFT	70,715	-	-	-	70,715	FVTPL
මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට								
- තැන්පතුකරුවන්ට ගෙවිය යුතු		AC	1,566,376,418	-	-	-	1,566,376,418	AC
- ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු		AC	-	-	-	-	-	AC
- වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු		AC	184,330,181	-	-	-	184,330,181	AC
නිකුත් කල ණය සුරැකුම්පත්		AC	5,667,514	-	-	-	5,667,514	AC
යටත් කාලීන ණය		AC	42,226,067	-	-	-	42,226,067	AC
මූල්‍ය නොවන වගකීම්								
ප්‍රවර්තන බදු වගකීම්		N/A	2,051,020	-	-	-	2,051,020	N/A
විලම්බිත බදු වගකීම්		N/A	8,625,219	-	(3,648,954)	-	4,976,265	N/A
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත		N/A	547,026	-	-	-	547,026	N/A
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන		N/A	430,093	-	-	-	430,093	N/A
වෙනත් වගකීම්		N/A	19,936,478	-	-	-	19,936,478	N/A
මුළු වගකීම්			**1,877,083,683**	**-**	**(3,648,954)**	**-**	**1,873,434,729**	
ස්කන්ධය								
කොටස් ප්‍රාග්ධනය		N/A	20,000,000	-	-	-	20,000,000	N/A
ස්ථාවර සංචිත අරමුදල		N/A	10,427,000	-	-	-	10,427,000	N/A
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත		N/A	-	3,583,746	-	-	3,583,746	N/A
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතයෙන්	ඉ		-	*3,583,746*	-	-	-	
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිත		N/A	4,760,616	(4,760,616)	-	-	-	N/A
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත වෙතට	ඉ		-	*(3,583,746)*	-	-	-	
රඳවා ගත් ඉපැයුම් වෙතට	අ		-	*(1,176,870)*	-	-	-	
රඳවා ගත් ඉපැයුම්		N/A	65,100,871	1,176,870	(7,974,866)	-	58,302,875	N/A
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිත	අ		-	*1,176,870*	-	-	-	
වෙනත් සංචිත		N/A	21,110,638	-	-	-	21,110,638	N/A
පාලනයට යටත් නොවන හිමිකම		N/A	927,375	-	(199,105)	-	728,270	N/A
මුළු ස්කන්ධය			**122,326,500**	**-**	**(8,173,971)**	**-**	**114,152,529**	
මුළු වගකීම් සහ ස්කන්ධය			**1,999,410,183**	**-**	**(11,822,925)**	**-**	**1,987,587,258**	

L&R - ණය හා ලැබිය යුතු දෑ, HFT - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින, AFS - උපලබ්ධිය සඳහා පවතින වත්කම්,

HTM - කල්පිරෙන තෙක් දරා සිටින, AC - ක්‍රමක්ෂය පිරිවැය, FVTPL - ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ වත්කම්,

FVTOCI - වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ සාධාරණ අගයට කරනු ලබන වත්කම්, N/A - අදාල නැත.

අ. ඒකක භාරවල ආයෝජන පෙර අවස්ථාවලදී උපලබ්ධිය සඳහා පවතින කාණ්ඩය යටතේ වර්ගීකරණය කල අතර "මූලික ආයෝජනය සහ පොලිය පමණක් ඉපයීම පදනම් කරගත් ආයෝජනයක් ද" යන පරීක්ෂණය සම්පූර්ණ නොවීම නිසා, මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට හඳුනාගැනීම යටතේ වර්ගීකරණය කර ඇත. ඒ අනුව ඒකක භාරවල වෙළඳපල අගයට වාර්තා කිරීමෙන් සාධාරණ අගයේ ලැබූ ලාභ මේ දක්වා වාර්තා කර තිබූ උපබ්ධිය සඳහා පවතින සංචිතවල සිට රඳවාගත් ඉපැයුම්වලට මාරු කර ඇත.

ආ. ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරවල සිදුකර ඇති මූල්‍ය ආයෝජන පෙර අවස්ථාවලදී වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින කාණ්ඩය යටතේ වර්ගකර ඇති අතර ශ්‍රී.ල.මු.වා.ප්‍ර. 9 යටතේ ව්‍යාපාර ආකෘතිය අනුව ණය උපකරණ - ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ග කර ඇත. මෙම උපකරණ මූලික ආයෝජනය සහ පොලිය පමණක් ඉපයීම පදනම් කරගත් ආයෝජනයක් ද යන පරීක්ෂණය සමත්වන අතර ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ප්‍රතිලාභ වශයෙන් ලබාගැනීමේ අරමුණින් තබාගෙන සිටියි.

ඇ/ඈ. මූල්‍ය ආයෝජන ණය හා ලැබිය යුතු දෑ සහ මූල්‍ය ආයෝජන කල් පිරෙන තෙක් දරා සිටින ලෙස පෙර වර්ෂවල දී වර්ග කල ණය මූල්‍ය උපකරණ, ක්‍රමක්ෂය පිරිවැය යටතේ පවතින ණය උපකරණ ලෙස නැවත වර්ග කරන ලදී. මෙම උපකරණ දරා සිටින්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය ප්‍රතිලාභය වශයෙන් ලබාගැනීමේ චේතනාවෙන් වන අතර මූලික ආයෝජන මුදල සහ පොලිය පමණක් ඉපයීම පදනම් කරගත් ආයෝජනයක් ද යන පරීක්ෂණයෙන් මෙම මූල්‍ය උපකරණ සමත්වන අතර විකුණුම් ලාභ ඉපයීමේ චේතනාවක් මත දරා නොසිටියි.

ඉ. මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින යටතේ පෙර වර්ෂවලදී වර්ග කල මූල්‍ය උපකරණ, මූල්‍ය වත්කම් - වෙනත් විස්තීරණ ආදායම් මඟින් සාධාරණ අගයට හඳුනාගැනීම ලෙස නැවත වර්ග කරන ලදි. ඒ අනුව උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිත තුළ හඳුනාගන්නා ලද මූල්‍ය උපකරණ වෙළඳපල අගයට ගැළපීමේ ලාභය වෙනත් විස්තීරණ ආදායම් සංචිතයට මාරුකරන ලදී.

63 අවදානම් කළමනාකරණය

63.1 හැඳින්වීම

63.1.1 දළ විශ්ලේෂණය

බැංකුවේ ක්‍රියාකාරකම් වලදී අවදානම ආවේණික තත්ත්වයක් වන අතර මූල්‍යමය ගනුදෙනු වලදී පහත දක්වා ඇති අවදානම් වලට බැංකුව නිරාවරණය වේ.

- ණය අවදානම
- වෙළඳපොළ අවදානම
- මෙහෙයුම් අවදානම
- ද්‍රවශීලතා අවදානම

අවදානම් කළමනාකරණය කිරීම අවදානම් සීමාවන්ට යටත්ව හඳුනාගැනීම හා අධීක්ෂණය කිරීම හරහා සිදුවේ. බැංකුවේ ආයතනික යහපාලනය හා අවදානම් කළමනාකරණ කළමනාකරණ රාමුවේ කොටසක් ලෙස මූල්‍ය අවදානම සමඟ උපායමාර්ගික, කීර්තිනාමය. අනුකූලතා හා නීතිමය අවදානම් මැන බැලීම හා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව මෙම සටහනෙන් ඉදිරිපත් කර ඇත.

63.1.2 සමූහ අවදානම් කළමනාකරණය

ලංකා බැංකු සමූහය මූල්‍ය හා මූල්‍ය නොවන පරිපාලිත සමාගම් දහයකින් හා ආශ්‍රිත සමාගම් හතරකින් සමන්විත වේ. ඒවායේ මූලික ව්‍යාපාරික කටයුතු විවිධ ව්‍යාපාර අංශවලට පැතිරී ඇත. පරිපාලිත හා අශ්‍රිත සමාගම්වල ශේෂ පත්‍ර ප්‍රමාණයන්ට අනුව ඒවායේ කටයුතු අවදානම් කළමනාකරණයට සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

කෙසේ වුවත් බැංකුව උපාය මාර්ගික අවදානම කළමනාකරණය කරනු ලබනුයේ ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ අධීක්ෂණය යටතේ කාර්තු පදනම මත සිය සමූහ ව්‍යාපාර කටයුතු පුළුල් වශයෙන් විමර්ශනය කිරීමෙනි. බැංකුවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන අතර, එම නිලධාරීන් අවදානම් හා විගණන කමිටු හා සම්බන්ධව කටයුතු කරයි. විශේෂ තත්ත්ව වලදී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් පරිපාලිතයන් විගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.1.3 අවදානම් කළමනාකරණ රාමුව

සමස්ත අවදානම් කළමනාකරණ රාමුවෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳව සහතිකයක් දෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහයේ පෙරමුණ ගනී. බැංකුවෙහි අවදානම් අභිරුචිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කරනු ලබන අතර, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් මඟින් උපායමාර්ගික දිශාව ස්ථාපනය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කරනු ලබන ප්‍රධාන අවදානම් නිලධාරිවරයා යටතේ බැංකුවෙහි ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය ස්ථාපිත කර ඇත. බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිතුමා, ණය කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව, තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුව, වංචනික අවදානම් කළමනාකරණ කමිටුව සහ අක්‍රීය ණය අත්තිකාරම් අධීක්ෂණ කමිටුව ආදී විවිධ අවදානම් කළමනාකරණය සඳහා දායක වන විධායක මට්ටමේ කමිටු රාශියක සාමාජිකත්වය දරයි.

බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටි බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය ස්වාධීනව නිරීක්ෂණය කොට ඇගයීමට ලක් කර විගණන කමිටුව වෙත සිය අදහස් ඉදිරිපත් කරයි.

63.1.4 අවදානම් මාපනය, වාර්තාකරණය සහ අවම කිරීම

විවිධ ප්‍රමිතීන් සහ මෙවලම් යොදා ගනිමින් ණය, වෙළඳපල, මෙහෙයුම් හා ද්‍රවශීලතාවයට අදාල අවදානම ගණනය කරනු ලැබේ. මෙම ආකෘතීන් අතීත අත්දැකීම් මඟින් ගොඩනගා ගත් සම්භාවිතාවන් ආර්ථික පරිසරයට ගැලපෙන පරිදි ගලපා යොදා ගනී. සාමාන්‍යයෙන් සිදු විය නොහැකි අන්ත සිදුවීම් සිදුවුවහොත් ඇතිවිය හැකි උපරිම අවදානම් තත්ත්වය පිළිබඳ ඇගයීමක් බැංකුව විසින් සිදු කරනු ලැබේ. බැංකුව විසින් දරාගත නොහැකි හානිදායි තත්ත්වයන් මත ආතතිය පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි.

මීට අමතරව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මක ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධනය සඳහා රාමුවක් ඉදිරිපත් කරන අතර ප්‍රාග්ධන සැලසුම්කරණය සහ ක්‍රියාවලිය මඟින් බැංකුවට ඇති සියලුම අවදානම් වලට සහය වීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ඇති බවට සහතිකයක් සපයයි.

සමස්ත අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස අවදානම අඩුකිරීම සඳහා බැංකුව විසින් අවදානම් අවම කිරීමේ ක්‍රම සහ ක්‍රමෝපායන් කිහිපයක් භාවිතා කරයි.

63.2 ණය අවදානම

ණය ගනුදෙනු වලදී එකඟ වූ කොන්දේසි පැහැර හැරීමෙන් අනිකුත් පාර්ශ්වයට අලාභ ඇතිවීමේ අවදානම ණය අවදානම වේ.

63.2.1 ණය අවදානම කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ගනුදෙනු හා කළඹ මට්ටමේ ණය ප්‍රදානය, පවත්වාගැනීම, අධීක්ෂණය හා කළමනාකරණයට අදාළ කොන්දේසි හා මඟපෙන්වීම් මත ක්‍රියාත්මක වේ. ණය අවදානම් කළමනාකරණ කාර්යයන් ව්‍යාපාර අංශ හා ආයතනික හා ශාඛා බණ්ඩයේ ණය තීරණ ප්‍රමිතීන්, ක්‍රියාවලි හා මූලධර්ම වලින් ස්වාධීන වේ. සංකේන්ද්‍රණ අවදානම ඉවත් කිරීම පිණිස අවදානම්, අභිරුචියට එරෙහිව ණයකරුවන් හා කර්මාන්ත විශේෂිත සංකේන්ද්‍රණයන් තක්සේරු කරමින් හා කළමනාකරණය කරමින් විවිධාංගීකරණය වූ ණය කළඹ පවත්වාගෙන යනු ලබයි. ක්‍රියාකාරී ලෙස අවදානම අවම කිරීම සඳහා බැංකුව විවිධාකාර උපායමාර්ග හා ක්‍රියාවලි භාවිතා කරයි.

බැංකුව විසින් නව ණය අනුමත කිරීම හා පවත්නා ණය අලුත් කිරීම සඳහා මනා ලෙස ස්ථාපනය කළ ක්‍රියාවලියක් අනුගමනය කරයි. ණය යාන්ත්‍රණයේ අවදානම් හිමිකරුවන් වන ගනුදෙනු ප්‍රාරම්භකයින් විසින් පවතින සියලු ණය පහසුකම් ඇගයීම සිදු කරයි. ස්ථාපිත සීමාවන් ඉක්මවා ණය යෝජනා ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් ස්වාධීනව සමාලෝචනය කරනු ලැබේ.

කළඹ සඳහා වන ණය අවදානම කළමනාකරණ තක්සේරුව හා අධීක්ෂණය සඳහා ශ්‍රේණිගත ආකෘතිය මූලික ආදානයකි. බැංකුව විවිධ කර්මාන්ත වල ගනුදෙනුකරුවන් ආවරණය කරමින් ආයතනික හා මධ්‍ය ආයතනික කලඹ තුල පුළුල් පරාසයක ණය අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘති භාවිතා කරයි. ශාඛා ගනුදෙනු ලකුණු පුවරු ගණනාවක් තුලින් කළමනාකරණය කෙරේ.

මුල් අදියරේදී වැඩි වශයෙන් අවදානමක් ඇති වීමේ සහ ණය අවදානමක් ඇති ණය නිරාවරණය කර ගැනීම සඳහා, ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක වේ. විය හැකි ණය පාඩු අවම කිරීම හා ණය ආපසු අයකර ගැනීමේ වගකීම් වැඩි කිරීම තුලින් ණය අවදානම අවමකරණය කරනු ලැබේ. ලේඛන නිසි පරිදි

පවත්වා ගැනීම, පනවන ලද ගිවිසුම් වලට අනුකූල වීම හා ණය පොතේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වරින් වර විශාල ණය ගනුදෙනු සම්බන්ධයෙන් අනුමැතියෙන් පසු සමාලෝචනයන් සිදු කරයි. ඇතිවිය හැකි අවදානම අවම කිරීම හා ඇති වන අලාභ අවම කිරීමේ අරමුණින් සුරැකුම් භාවිතා කරයි. ණයකරුගේ ස්වභාවය, පවතින වත්කම්, ආකෘතිය හා ණය වගකීමේ ඇති කොන්දේසි මත සුරැකුම් ස්වභාවය වෙනස් වේ.

පාලන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් වල දක්වා ඇති ආකාරයට සුරැකුම් නිරන්තර තක්සේරුකරණයට ලක් කරනු ලැබේ. ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 අනුව, ණය අවදානම සැලකීමේදී ඇති වූ අලාභ මෙන්ම අපේක්ෂිත අලාභද සලකා බැලිය යුතුය.

63.2.1.1 අපේක්ෂිත ණය හානිකරණ ගණනය

අපේක්ෂිත ණය හානිකරණ ගණනය මඟින් මූල්‍ය වත්කම් වල අපේක්ෂිත ආයුකාලය පුරාවට අපේක්ෂිත ණය අලාභය ඉදිරිපත් කරයි. අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේදී ප්‍රධාන උපාංග තුනක් භාවිතා කරයි. එනම්, පැහැර හැරීමේ සම්භාවිතාව (PD), පැහැර හැරීමේ අලාභය (LGD) සහ ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD). පොදුවේ මෙම පරාමිතීන් ගොඩනඟා ඇත්තේ අභ්‍යන්තරව සංවර්ධනය කළ සංඛ්‍යානමය ආකෘති සමඟ ගනුදෙනුකරුවන්ගේ හා සාර්ව ආර්ථිකයේ අතීත, වර්තමාන හා අනාගත දත්ත ඒකාබද්ධ කිරීමෙනි.

ශ්‍රී ලං. මූ. වා. ප්‍ර. 9 යටතේ මූල්‍ය වත්කම් ආරම්භයේදී හෝ මිලදී ගැනීමේදී මූල්‍ය වත්කම් හානිකරණය සඳහා අදියර තුනක ආකෘතියක් හඳුන්වා දී ඇත. මෙම හානිකරණය සඳහා වන අදියර තුනේ ආකෘතිය මූලික හඳුනා ගැනීමේ පටන් සිදුවන ණය ගුණාත්මකභාවයේ සිදුවන වෙනස්වීම් මත පදනම් වේ. මූලික හඳුනාගැනීමේදී ණය හානිකරණයට යටත් නොවන මූල්‍ය වත්කම් පළමු අදියරයෙන් පිළිඹිබු වේ. ණය අවදානමේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන්නේ නම් එවැනි මූල්‍ය වත්කම් දෙවන අදියරට මාරු කෙරේ. ණය අවදානමේ සැලකිය යුතු වර්ධනයක්, බැංකුවේ ස්ථාපිත හානිකරන ප්‍රතිපත්තියේ දක්වා ඇති පූර්ව නිර්ණය කර ඇති අවදානම් සංඥා වලට අනුව සිදුවී ඇත්නම් සහ වීම ණය ගෙවීම පැහැර හැරීමේදී වීම මූල්‍ය වත්කම් අදියර තුන යටතේ වර්ගීකරණය කරනු ඇත.

63.2.1.2 අනාගත තොරතුරු සංස්ථාපනය

බැංකුව විසින් අපේක්ෂිත ණය හානිකරන ගණනය කිරීමට සහය ලබා දීම සඳහා කර්මාන්තයේ සාමාන්‍ය අපක්ෂපාතී ගැලපීම් හා අනෙකුත් අදාළ නිශ්චිත කර්මාන්ත වල ගැලපීම් තීරණය කිරීමට, අනාගත සාර්ව ආර්ථික උපකල්පන පිළිබඳ සලකා බැලිය හැකි විශේෂඥ මණ්ඩලයක් පත්කර ඇත.

63.2.2 ණය අවදානම සඳහා උපරිම නිරාවරණය

63.2.2.1 ඇප සුරැකුම් සහ වෙනත් ණය පුළුල් කිරීම්

බැංකුව විසින් ණය අවදානම අවම කිරීම වෙනුවෙන් සිය ණය ගනුදෙනුකරුවන්ගෙන් ඇප සුරැකුම් ලබාගනී. ණය අවදානම් ඇගයීම තුළින් ණය සඳහා අවශ්‍ය සුරැකුම් වර්ගය හා වටිනාකම තීරණය කෙරේ. සෑම වර්ගයකම සුරැකුම් පිළිගැනීම හා අගය කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන් රජයේ නියාමන වලට සහ බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුකූල ව සකස් කර ඇත. බැංකුව විසින් ලබා ගන්නා ප්‍රධාන සුරැකුම් වර්ග පහත පරිදි වේ:

- වාණිජ ණය සඳහා, නිශ්චල සහ චංචල දේපල
- පුද්ගල ණය සඳහා, නිශ්චිත හා චංචල දේපල උකසට තබා ගැනීම, මුදල්, මුදල් සමාන දෑ හා ස්වර්ණාභරණ
- රජය සහ රජයට අයත් ආයතන සඳහා, භාණ්ඩාගාර ඇපවීම්
- ප්‍රති විකුණුම් ගනුදෙනු සඳහා රජයේ සුරැකුම්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

බැංකුව විසින් ලබාගෙන ඇති ඇප සුරුකුම්වල වෙළඳපොල අගය නිරීක්ෂණය කරමින් සිටින අතර, එහි පහළ යාමක් ඇති විට ගිවිසුම් ප්‍රකාරව අමතර ඇප සුරුකුම්පත් ලබා ගනී. අත්පත් කර (පවරාගත්) දේපල කාලානුරූපව ඉවත් කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. මේ හරහා ලැබෙන මුදල් ලැබීමට ඇති ශේෂයන් අඩු කිරීමට හෝ අය කර ගැනීමට යොදවනු ලැබේ. සාමාන්‍යයෙන් පවරාගත් දේපල බැංකුවේ භාවිතයට යොදවා නොගනී. ණය අවදානම් සඳහා උපරිම නිරාවරණය, ඇප සුරුකුම්වල සාධාරණ අගය, අතිරික්ත ඇප සුරුකුම් වටිනාකම සහ ණය අවදානම් සඳහා ශුද්ධ නිරාවරණය පහත වගුව මඟින් පෙන්නුම් කෙරේ:

63.2.2.2 ඇප සුරුකුම් වර්ග හෝ ණය පුළුල්කිරීම්

2018 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම සඳහා උපරිම නිරාවරණය	ඇප සුරුකුම් වර්ග හෝ ණය පුළුල්කිරීමේ සාධාරණ අගය							ශුද්ධ ඇප	ශුද්ධ නිරාවරණය
		මුදල්	රන්	ශ්‍රී ලංකා රාජ්‍ය සුරුකුම්පත්/ ඇපකර	චංචල දේපල	දේපල	වෙනත්	අතිරික්ත ඇප		
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	78,447,577	38,383,013	-	-	-	-	-	-	38,383,013	40,064,564
මහ බැංකු සමඟ ශේෂයන්	65,680,371	65,680,371	-	-	-	-	-	-	65,680,371	-
බැංකුවල ඇති තැන්පතු	40,450,089	-	-	-	-	-	-	-	-	40,450,089
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,205,657	-	-	-	-	-	-	-	-	1,205,657
වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින සාධාරණ අගයට අගය කරනු ලබන ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්	9,277,298	-	-	4,166,005	-	-	-	-	4,166,005	5,111,293
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය හා අත්තිකාරම්	1,510,534,078	82,885,527	61,523,186	348,318,695	149,613,014	287,858,492	80,344,939	(111,864,107)	898,679,746	611,854,332
අඩු කලා - ණය හානිකරණය	(81,426,897)	-	-	-	-	-	-	-	-	(81,426,897)
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය උපකරණ	553,624,323	-	-	545,456,087	-	-	-	-	545,456,087	8,168,236
අඩු කලා - ණය හානිකරණය	(1,784,874)	-	-	-	-	-	-	-	-	(1,784,874)
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	16,699,582	-	-	9,677,543	-	-	-	-	9,677,543	7,022,039
එකතුව	2,192,707,204	186,948,911	61,523,186	907,618,330	149,613,014	287,858,492	80,344,939	(111,864,107)	1,562,042,765	630,664,439

2017 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම සඳහා උපරිම නිරාවරණය	ඇප සුරැකුම් වර්ග හෝ ණය පුළුල්කිරීමේ සාධාරණ අගය							ශුද්ධ ඇප	ශුද්ධ නිරාවරණය
		මුදල්	රන්	ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්/ ඇපකර	චංචල දේපල	දේපල	වෙනත්	අතිරික්ත ඇප		
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	72,843,108	41,774,986	-	-	-	-	-	-	41,774,986	31,068,122
මහ බැංකු සමඟ ශේෂයන්	68,689,012	68,689,012	-	-	-	-	-	-	68,689,012	-
බැංකුවල ඇති තැන්පතු	8,067,490	-	-	-	-	-	-	-	-	8,067,490
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	-	-	-	-	-	-	-	-	1,618,823
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	18,455,555	-	-	18,455,555	-	-	-	-	18,455,555	-
මූල්‍ය උපකරණ - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින	8,359,274	-	-	5,598,090	-	-	-	-	5,598,090	2,761,184
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	213,167,048	-	-	206,756,877	-	-	-	-	206,756,877	6,410,171
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	1,219,914,481	66,872,015	49,660,188	310,703,980	108,434,274	213,153,077	66,655,828	(97,502,880)	717,976,482	501,937,999
අඩු කලා - ණය හානිකරණය	(56,753,567)	-	-	-	-	-	-	-	-	(56,753,567)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	17,921,170	-	-	9,677,543	-	-	-	-	9,677,543	8,243,627
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන	308,256,082	-	-	256,069,541	-	-	-	-	256,069,541	52,186,541
එකතුව	1,880,538,476	177,336,013	49,660,188	807,261,586	108,434,274	213,153,077	66,655,828	(97,502,880)	1,324,998,086	555,540,390

63.2.3 මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය

ණය ගුණාත්මකභාවය මත මූල්‍ය වත්කම් ප්‍රධාන කොටස් තුනකට වර්ගීකරණය කල හැක. එනම් හානිකරණය වීමක් හෝ කල්පසුවීමක් සිදු නොවූ, කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ, කේවල හානිකරණයට ලක් වූ වශයෙනි. පහත වගුව මඟින් ණය අවදානමට නිරාවරණය වූ සියලු මූල්‍ය වත්කම් සඳහා වත්කම් පන්තියේ ණය ගුණාත්මකභාවය පෙන්නුම් කරයි.

බැංකුවේ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයන්ට හා මූල්‍ය වත්කම්වලට ආවේනික අවදානම් පදනම්කර ගෙන, ණය අවදානමකට විවෘත වූ සියලු මූල්‍ය වත්කම්වල ණය ගුණාත්වය පහත වගුව මඟින් නිරූපණය කෙරේ. ශ්‍රී ලංකා රජයට ලබා දුන් ණය හා අත්තිකාරම් ඉහළ ශ්‍රේණිගත කිරීමට AAA, AA හෝ A අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් සහිත ආයතනික ණය ගැනුම්කරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් ඉහළ ශ්‍රේණියට ඇතුළත් කරනු ලබයි. සම්මත ශ්‍රේණියට අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් BBB, BB හෝ B සහිත ආයතනික ණය ගැනුම්කරුවන් ඇතුළත් වේ. ආශ්‍රිත සම්මත ශ්‍රේණියට ශ්‍රේණිගත කිරීම් C හෝ D සහිත ආයතනික ණය ගැනුම්කරුවන් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්වය	හානිකරණවීමක් හෝ කල්පසුවීමක් සිදු නොවූ						
	ඉහළ ශ්‍රේණිය රු. '000			සම්මත ශ්‍රේණිය රු. '000			
	අදියර 1	අදියර 2	අදියර 3	අදියර 1	අදියර 2	අදියර 3	අදියර 1
මුදල් සහ මුදල් හා සමාන දෑ	50,520,582	-	-	-	-	-	-
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-	-	-
මහ බැංකු සමඟ ශේෂයන්	59,405,543	-	-	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	1,108,583	-	-	-	-	-	-
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,205,657	-	-	-	-	-	-
වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින සාධාරණ අගයට අගය කරනු ලබන ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්	4,166,005	-	-	-	-	-	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය හා අත්තිකාරම්	354,752,816	17,556,991	10,473,463	121,895,086	16,809,553	5,562,062	40,292,350
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-	-	-
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට - ණය උපකරණ	545,456,087	-	-	-	-	-	-
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-			-
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/ උපලබ්ධිය සඳහා පවතින උපලබ්ධිය සඳහා පවතින වත්කම්වල සිට	12,315,778	-	-	-	-	-	-
එකතුව	**1,028,931,051**	**17,556,991**	**10,473,463**	**121,895,086**	**16,809,553**	**5,562,062**	**40,292,350**

මූල්‍ය වත්කම් කාණ්ඩ අනුව කල් පසුවීමක් සිදු වූ (එනම් එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම්) නමුත් හානිකරණයක් සිදු නොවූ ණයවල ආයුවිශ්ලේෂණය.

කල්පසුවීමක් සිදු වූ නමුත් හානිකරණය සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය	කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ					
	දින 30 ට අඩු රු. '000	දින 30 සිට 60 දක්වා රු. '000	දින 60 සිට 90 දක්වා රු. '000	දින 90 සිට 180 දක්වා රු. '000	දින 180 සහ ඊට වැඩි රු. '000	එකතුව රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	131,638,901	127,257,253	12,542,122	6,555,227	33,328,884	311,322,387

පළමු ශ්‍රේණියට අයත් වත්කම්, බැංකුවේ මුළු වත්කම් වලින් 91% නියෝජනය කරන අතර, ඉහළ ශ්‍රේණියට අයත් වත්කම්, මුළු වත්කම් වලින් 47% නියෝජනය කරයි.

2018 දෙසැම්බර් 31 දිනට

ආශ්‍රිත සම්මත ශ්‍රේණිය රු. '000		කාණ්ඩ නොබෙදූ/ ශ්‍රේණියක් නොමැත රු. '000			කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ රු. '000			කේවල හානිකරණය රු. '000	එකතුව රු. '000
අදියර 2	අදියර 3	අදියර 1	අදියර 2	අදියර 3	අදියර 1	අදියර 2	අදියර 3	අදියර 3	
-	-	27,934,107	-	-	-	-	-	-	78,454,689
-	-	-	-	-	-	-	-	-	(7,112)
-	-	6,274,828	-	-	-	-	-	-	65,680,371
-	-	39,364,814	-	-	-	-	-	-	40,473,397
-	-	-	-	-	-	-	-	-	(23,308)
-	-	-	-	-	-	-	-	-	1,205,657
-	-	5,111,293	-	-	-	-	-	-	9,277,298
14,288,377	3,627,545	503,223,258	12,578,941	2,947,153	274,627,225	17,294,145	19,401,017	95,204,096	1,510,534,078
-	-	-	-	-	-	-	-	-	(81,426,897)
-	-	8,168,236	-	-	-	-	-	-	553,624,323
	-		-	-	-	-	-	-	(1,784,874)
-	-	4,383,804	-	-	-	-	-	-	16,699,582
14,288,377	**3,627,545**	**594,460,340**	**12,578,941**	**2,947,153**	**274,627,225**	**17,294,145**	**19,401,017**	**95,204,096**	**2,192,707,204**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්මය	2017 දෙසැම්බර් 31 දිනට						
	හානිකරණවීමක් හෝ කල්පසුවීමක් සිදු නොවූ						
	ඉහළ ශ්‍රේණිය	සම්මත ශ්‍රේණිය	ආශ්‍රිත සම්මත ශ්‍රේණිය	කාණ්ඩ නොබෙදූ/ ශ්‍රේණියක්	කල් පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණය නොවූ	කේවල හානිකරණය වූ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	54,204,723	-	-	18,638,385	-	-	72,843,108
මහ බැංකු සමඟ ශේෂයන්	68,689,012	-	-	-	-	-	68,689,012
බැංකුවල ඇති තැන්පතු	8,067,490	-	-	-	-	-	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	18,455,555	-	-	-	-	-	18,455,555
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	-	-	-	-	-	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින	5,598,090	-	-	2,761,184	-	-	8,359,274
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	206,756,877	-	-	6,410,171	-	-	213,167,048
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	314,509,110	104,311,326	34,810,132	463,277,623	239,218,214	63,788,076	1,219,914,481
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-	-	(56,753,567)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	9,677,543	-	-	8,243,627	-	-	17,921,170
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	256,069,541	-	-	52,186,541	-	-	308,256,082
එකතුව	**943,646,764**	**104,311,326**	**34,810,132**	**551,517,531**	**239,218,214**	**63,788,076**	**1,880,538,476**

මූල්‍ය වත්කම් කාණ්ඩ අනුව කල් පසුවීමක් සිදු වූ (එනම් එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම්) නමුත් හානිකරණයක් සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය.

කල්පසුවීමක් සිදු වූ නමුත් හානිකරණය සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය	කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ					
	දින 30 ට අඩු රු. '000	දින 30 සිට 60 දක්වා රු. '000	දින 60 සිට 90 දක්වා රු. '000	දින 90 සිට 180 දක්වා රු. '000	දින 180 සහ ඊට වැඩි රු. '000	එකතුව රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	124,756,928	74,175,997	6,216,779	2,644,976	31,423,534	239,218,214

63.2.4 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය

තනි පුද්ගලයෙකුට, කණ්ඩායමකට, කර්මාන්ත ක්ෂේත්‍රයන්ට හා භූගෝලීය කලාපයන්ට සංකේන්ද්‍රණය වීමේ අවදානම ණය කළඹ මට්ටමේ දී ණය අවදානම යටතට ගැනේ. සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණයේදී බැංකු විසින් මිනුම් උපකරණයක් ලෙස Herfindahl-Harischman දර්ශකය භාවිතා කරයි. පිළිගත හැකි මට්ටමක සංකේන්ද්‍රණ අවදානම පවත්වාගෙන යාම සඳහා බැංකුව විසින් සුදුසු සීමාවන් ස්ථාපිත කර ඇත.

රටවල් අනුව නිරාවරණයන්

ඉන්දියාවේ, මාලදිවයිනේ, සීෂෙල්ස් රාජ්‍යයේ පවතින ශාඛාවන් හා චක්සත් රාජධානියේ පවතින පරිපාලිත සමාගම හේතුවෙන් බැංකුව, ලංකාවෙන් පිටත පැනනගින අවදානම් සඳහා නිරාවරණය වේ. සියලුම විදේශීය ශාඛාවන් කලින් සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සීමාවන්ට (ණය ප්‍රමාණ සීමාවන් මෙන්ම රටවල් සඳහා පනවා ඇති සීමාවන්) යටත්ව මෙහෙයුම් කටයුතු කරනු ලබයි.

මීට අමතරව අනෙකුත් රටවලට දක්වන නිරාවරණයවීම් සඳහා එම රටවල නියෝජිත බැංකුවල පවත්වාගෙන යන ගිණුම් ශේෂයන් හා නොස්ට්‍රෝ ගිණුම් ශේෂයන් ඇතුළත් වන අතර එහි අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කොට ඇති අදාළ බැංකු සීමා හා රටවලට පනවා ඇති සීමා මත පදනම්ව සිදු කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රටවල් අනුව නිරාවරණය

2018 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සීෂෙල්ස්	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	41,535,889	309,411	8,984,693	91,690	8,393,595	34,515	19,097,784	78,447,577
මහ බැංකු සමඟ ශේෂයන්	58,989,444	-	5,626,366	752,166	-	312,395	-	65,680,371
බැංකුවල ඇති තැන්පතු	1,108,583	39,341,506	-	-	-	-	-	40,450,089
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	-	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,205,657	-	-	-	-	-	-	1,205,657
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්,	9,277,298	-	-	-	-	-	-	9,277,298
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	1,394,444,291	-	25,186,543	7,932,346	-	1,544,001	-	1,429,107,181
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	542,982,435	-	8,857,014	-	-	-	-	551,839,449
මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන/	15,112,551			1,587,031				16,699,582
එකතුව	**2,064,656,148**	**39,650,917**	**48,654,616**	**10,363,233**	**8,393,595**	**1,890,911**	**19,097,784**	**2,192,707,204**
මූල්‍ය වගකීම්								
බැංකුවලට ගෙවිය යුතු	1,395,256	-	-	1,007,212	-	-	-	2,402,468
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	97,399,359	-	-	-	-	-	-	97,399,359
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	509,018	-	-	-	-	-	-	509,018
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	1,717,499,151	-	39,167,235	6,028,423	-	2,331,161	-	1,765,025,970
ක්‍රමක්ෂය අගයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැහීම්	201,792,174	-	-	-	-	-	-	201,792,174
නිකුත් කළ ණය සුරැකුම් පත්		-	-	-	-	-	-	-
යටත් කාලීන ණය	50,827,239	-	-	-	-	-	-	50,827,239
මුළු වගකීම්	**2,069,422,197**	**-**	**39,167,235**	**7,035,635**	**-**	**2,331,161**	**-**	**2,117,956,228**

2017 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සීෂෙල්ස්	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූලය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	40,187,549	13,988,645	8,448,677	85,582	6,870,236	77,092	3,185,327	72,843,108
මහ බැංකු සමඟ ශේෂයන්	64,800,808	-	3,239,492	165,035	-	483,677	-	68,689,012
බැංකුවල ඇති තැන්පතු	4,399,061	3,037,776	-	630,653	-	-	-	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	18,455,555	-	-	-	-	-	-	18,455,555
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	-	-	-	-	-	-	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින	8,359,274	-	-	-	-	-	-	8,359,274
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	206,448,353	-	6,718,695	-	-	-	-	213,167,048
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	1,133,450,152	-	21,525,646	6,967,240	-	1,217,876	-	1,163,160,914
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා දරා සිටින	16,442,300	-	-	1,478,870	-	-	-	17,921,170
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	308,256,082	-	-	-	-	-	-	308,256,082
එකතුව	**1,802,417,957**	**17,026,421**	**39,932,510**	**9,327,380**	**6,870,236**	**1,778,645**	**3,185,327**	**1,880,538,476**
මූලය වගකීම්								
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,583,334	-	-	619,865	-	-	-	2,203,199
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	44,487,462	-	-	-	-	-	-	44,487,462
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	70,715	-	-	-	-	-	-	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,510,562,066	-	30,301,978	4,368,004	-	1,599,988	-	1,546,832,036
වෙනත් ණය ගැනීම්	36,176,514	-	-	13,171	-	-	142,001,404	178,191,089
නිකුත් කළ ණය සුරැකුම්පත	-	-	-	-	-	-	-	-
යටත් කාලීන ණය	42,570,457	-	-	-	-	-	-	42,570,457
එකතුව	**1,635,450,548**	**-**	**30,301,978**	**5,001,040**	**-**	**1,599,988**	**142,001,404**	**1,814,354,958**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

බැංකුවේ කළඹ විවිධ අංශ වල මනා ලෙස විවිධාංගීකරණය වී ඇති අතර සියලු අනාවරණය වීම් HHI මඟින් වර්ෂය තුල පවත්වාගෙන යනු ලබයි.

අංශ අනුව නිරාවරණය වීම

2018 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු, මූල්‍ය සහ රක්ෂණ	හෝටල්, ප්‍රවාහන සහ සේවා	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම්	නිෂ්පාදන
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	12,137,568	-	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	-	40,450,089	-	-	-
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	1,205,657	-	-	-
සාධාරණ අගයට අගය කරනු ලබන ලාභ හෝ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්	76,174	2,665,858	280,829	67,996	301,685
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අත්තිකාරම්	97,665,643	49,554,107	80,010,561	338,744,805	74,048,479
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	-	676,557	-	-	-
වෙනත් විස්තීර්ණ ආදායම යටතේ සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්	-	3,142,087	-	-	-
	97,741,817	**109,831,923**	**80,291,390**	**338,812,801**	**74,350,164**

2017 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර	බැංකු, මූල්‍ය සහ රක්ෂණ	හෝටල්, ප්‍රවාහන සහ සේවා	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම්	නිෂ්පාදන
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	-	12,429,737	-	-	-
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	-	-	-	-	-
බැංකුවල ඇති තැන්පතු	-	8,067,490	-	-	-
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	-	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	1,618,823	-	-	-
මූල්‍ය උපකරණ - වෙළඳපොළ ගනුදෙනු සඳහා දරා සිටින	86,206	78,045	333,067	100,104	1,099,754
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	-	5,641,373	-	-	-
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	91,074,381	31,480,730	53,637,678	262,592,679	70,781,133
අඩු කලා - ණය හානිකරණය	-	-	-	-	-
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා දරා සිටින	-	8,243,627	-	-	-
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	-	-	-	-	-
	91,160,587	**67,559,825**	**53,970,745**	**262,692,783**	**71,880,887**

* රජය සතු ව්‍යාපාරයන් සඳහා අනාවරණය ඇතුළත් නොවේ.

වාණිජ වෙළෙඳාම	රජය සහ සෘජු රාජ්‍ය	ප්‍රවාහන සහ සේවා සම්පාදන	වෙනත් වාණිජ සේවා	පරිභෝජනය සහ වෙනත්	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	66,310,009	78,447,577
-	65,680,371	-	-	-	65,680,371
-	-	-	-	-	40,450,089
-	-	-	-	-	-
-	-	-	-	-	1,205,657
142,914	4,088,980	67,662	204,381	1,380,819	9,277,298
193,122,916	219,760,013	140,006,311	48,335,126	269,286,117	1,510,534,078
-	-	-	-	-	(81,426,897)
7,491,679	543,671,213	-	-	-	551,839,449
1,241,718	12,315,777	-	-	-	16,699,582
201,999,227	**845,516,354**	**140,073,973**	**48,539,507**	**336,976,945**	**2,192,707,204**

වාණිජ වෙළෙඳාම	රජය සහ සෘජු රාජ්‍ය	ප්‍රවාහන සහ සේවා සම්පාදන	වෙනත් වාණිජ සේවා	පරිභෝජනය සහ වෙනත්	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
-	-	-	-	60,413,371	72,843,108
-	68,689,012	-	-	-	68,689,012
-	-	-	-	-	8,067,490
-	18,455,555	-	-	-	18,455,555
-	-	-	-	-	1,618,823
889,668	5,598,090	84,911	89,429	-	8,359,274
768,799	206,756,876	-	-	-	213,167,048
209,406,599	108,058,736	89,891,385	31,716,190	271,274,970	1,219,914,481
-	-	-	-	-	(56,753,567)
-	8,198,673	-	-	1,478,870	17,921,170
-	308,256,082	-	-	-	308,256,082
211,065,066	**724,013,024**	**89,976,296**	**31,805,619**	**333,167,211**	**1,880,538,476**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.2.5 බැඳීම් සහ ඇපකරයන්

ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් මුදුන්පත් කරලීම වෙනුවෙන් බැංකුව විසින් නොයෙකුත් කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් භාර ගනියි. එවැනි බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අන්තර්ගත නොවුවද යම්තාක් දුරකට හෝ ණය අවදානමක්/ පැහැර හැරීමේ අවදානමක් තිබේ.

බැඳීම් හා ඇපකරයන් වෙනුවෙන් වන බැංකුවෙහි උපරිම ණය අවදානම් නිරාවරණයවීම් පිළිබඳව පහත වගුවෙහි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	බැංකුව	
	2018	2017
	රු. '000	රු. '000
ප්‍රතිග්‍රහණ සහ ණයවර ලිපි	225,582,120	147,887,385
ඉදිරි විනිමය හිවිසුම්	15,801,742	39,125,183
ඇපකර	100,715,102	83,593,855
	342,098,964	**270,606,423**

63.3 ද්‍රවශීලතා අවදානම සහ අරමුදල් කළමනාකරණය

බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව මඟින් කාලානුරූපව බැංකුවේ වගකීම් පියවීම පිළිබඳ තහවුරු කරයි.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා හා වෙළෙඳපොල අවදානම් තත්ත්වයන් පිළිබඳව තීරණ ගන්නා වූ ප්‍රධානතම කළමනාකරණ කමිටුව වන අතර, එය බැංකුවෙහි අරමුදල් සැලැස්ම නිරන්තරයෙන් විමර්ශනය කරමින් වත්කම් හා වගකීම් පරිණතියේ සැලකිය යුතු නොගැලපීම් නිවැරදි කිරීම සඳහා පිළියම් යෝජනා කරයි.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වගකීම්වල ගිවිසුම්ගත වට්ටම් නොකළ කල්පිරීම් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

2018 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේ දී	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	වසර 5 ට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	-	2,402,468	-	-	-	2,402,468
ප්‍රති මිලට ගැනුම් හිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	-	99,743,183	7,916,047	-	-	107,659,230
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	509,018	-	-	-	509,018
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	602,471,424	351,046,714	406,728,184	19,978,975	333,342,257	1,713,567,554
අනෙකුත් ණය ගැනීම් සහ යටත් කාළීන වගකීම්	-	114,522,099	91,859,927	29,451,146	19,095,666	254,928,838
එකතුව	**602,471,424**	**568,223,482**	**506,504,158**	**49,430,121**	**352,437,923**	**2,079,067,108**

2017 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේ දී	මාස 3 ට අඩු	මාස 3 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	වසර 5 ට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
බැංකුවලට ගෙවිය යුතු	-	2,203,199	-	-	-	2,203,199
ප්‍රති මිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	-	33,391,992	11,095,470	-	-	44,487,462
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	70,715	-	-	-	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	577,306,304	253,262,616	367,570,527	19,513,724	274,445,855	1,492,099,026
අනෙකුත් ණය ගැනීම් සහ යටත් කාළීන වගකීම්	-	91,247,400	81,925,579	18,204,672	29,383,895	220,761,546
එකතුව	**577,306,304**	**380,175,922**	**460,591,576**	**37,718,396**	**303,829,750**	**1,759,621,948**

63.4 වෙළඳපොල අවදානම

පොළී අනුපාතයන්, විදේශ විනිමය හුවමාරු අනුපාතයන්, කොටස් මිල සහ භාණ්ඩ මිල ගනන් ආදී වෙළෙඳපොල විචල්‍යයන්ගේ සිදු වන උච්ඡාවචනයන් හේතුවෙන් මූල්‍ය උපකරණයන් හි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය වෙනස්වීම් කෙරෙහි දක්වන අවදානම වෙළඳපොල අවදානම ලෙස සලකනු ලබයි. වෙළඳාම් කරන හෝ නොකරන කළඹ වශයෙන් බැංකුව වෙළඳපොල අවදානම අනාවරණයවීම් වර්ග කර වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි. විදේශ විනිමය හුවමාරු සහ කොටස් වෙළඳාම් කළඹයන් හි වෙළෙඳපොල අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය කරනු ලබන්නේ අවදානම් විචල්‍යයන්හි අන්තර් බැඳීම් පෙන්නුම් කරනු ලබන 'අවදානමේදී අගය' (Value at Risk –VaR) ක්‍රමවේදය අනුව වේ. පදනම් අගය මත මිල වෙනස්වීම (Price Value of Basis Point – PVBP) සහ කාල විශ්ලේෂණය (Duration Analysis) ඇසුරෙන් වෙළඳ කළඹට බලපාන පොළී අනුපාත අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කරයි. සංවේදීතා අධ්‍යයනයෙන් හා ආතති පරීක්ෂාවන් මඟින් වෙළඳාම් නොකරන කළඹ කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කෙරේ.

63.4.1 මුදල් ඒකක අවදානම

විදේශ විනිමය අනුපාත විචලනය වීම නිසා මූල්‍ය උපකරණවල වටිනාකමට වෙන බලපෑම මුදල් ඒකක අවදානම වේ. බැංකුව විසින් විදේශ මුදල්වලට අඩු ප්‍රමාණයක විවෘත තත්ත්වයන් පවත්වාගෙන යනු ලබයි. වාර්ෂිකව රුපියල 20% පමණ අවප්‍රමාණය වන බැවින් විදේශ විනිමය ගනුදෙනු මත ලබන ලාභය වසර තුල ඉහළ ගොස් ඇත. අවදානම් අගයෙහි සීමාවන් ඇතුළු විස්තරාත්මක සීමා ව්‍යුහයක් මඟින් විදේශ විනිමය අවදානම පාලනය කරනු ලබයි. විදේශ විනිමය අවදානම අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් ඓතිහාසික අවදානමේදී අගය ක්‍රමවේදය භාවිතා කරනු ලබයි. 2018 දෙසැම්බර් 31 දිනට විදේශීය විනිමය අවදානමේ දී අගය (VaR) රු. මිලියන 60.9 ක් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය තත්ත්වය	2018		2017	
	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ධන අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000
මුදල් ඒකකය				
ඇමරිකානු ඩොලර්	524,547	-	877,195	-
බ්‍රිතාන්‍ය පවුම්	1,909	-	-	(3,974)
යූරෝ	21,815	-	1,331	-
ජපන් යෙන්	3,568	-	-	(5,263)
ඔස්ට්‍රේලියන් ඩොලර්	-	(10,620)	-	(582)
කැනේඩියන් ඩොලර්	1,166	-	-	(410)
ස්විස් ෆ්‍රෑන්ක්	1,937	-	-	(386)
සිංගප්පුරු ඩොලර්	967	-	-	(930)
හොංකොං ඩොලර්	-	(1,056)	-	(1,562)
උප එකතුව	**555,909**	**(11,676)**	**878,526**	**(13,107)**
වෙනත් මුදල් ඒකක වර්ග	5,538	(1,786)	12,090	(3,489)
මුළු එකතුව	**561,447**	**(13,462)**	**890,616**	**16,596**
ධන හෝ ඍණ අගයන්හි වැඩි අගය		561,447		16,596

විනිමය අනුපාත කම්පනයන්ගෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශනයට වන බලපෑම

විදේශ විනිමය අනුපාතයේ කම්පන %	2018		2017	
	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු)	**2018 දෙසැම්බර් 31 වන දිනට ලාභ හෝ පාඩු ප්‍රකාශනයට බලපෑම**	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු)	2017 දෙසැම්බර් 31 වන දිනට ලාභ හෝ පාඩු ප්‍රකාශනයට බලපෑම
	රු. '000	**රු. '000**	රු. '000	රු. '000
5%	533,375	(28,072)	(15,766)	830
10%	505,303	(56,145)	(14,936)	1,660
-5%	589,520	28,072	(17,426)	(830)
-10%	617,592	56,145	(18,256)	(1,660)

63.4.2 පොළී අනුපාත අවදානම

පොළී අනුපාතයන්හි වෙනස්වීම අනාගත මුදල් ප්‍රවාහයන්ට හෝ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකමට බලපෑ හැකි සම්භාවිතාව මත පොළී අනුපාත අවදානම පැන නගී.

පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP) සහ කාල විශ්ලේෂණය මඟින් දෛනිකව බැංකුව මඟින් වෙළඳාම් කරනු ලබන පොළී අනුපාත සංවේදී උපකරණ වන භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල පොළී අනුපාත වෙනස්වීම තක්සේරු කරනු ලබයි.

	2018 රු. '000	2017 රු. '000
පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP)		
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	12,779	32,201
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	290,243	58,835
කාල සීමාව		
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	වසර 0.2	වසර 0.5
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	වසර 2.4	වසර 0.9

කලින් නිර්ණය කරන ලද කල්පිරීමේ කාලච්ඡේදයන් භාවිත කරමින් බැංකුවේ පොළී සංවේදී වත්කම් හා වගකීම් ඇගයීමට ලක් කිරීමෙන් බැංකු කටයුතු සඳහා ඇති වත්කම් මත පොළී අවදානම් නිරීක්ෂණය කරනු ලැබේ. මෙහිදී කල්පිරීමට ඇති කාල පරතර සීමා පිහිටුවීම හා අධීක්ෂණය කිරීම, නැවත මිල කිරීමේ පැතිකඩ ආදිය සැලකිල්ලට ගනු ලැබේ.

2018	**මාසයක් දක්වා** %	**මාස 1-3 දක්වා** %	**මාස 3-6 දක්වා** %	**මාස 6-12 දක්වා** %	**අවුරුදු 1-2 දක්වා** %	**අවුරුදු 2-3 දක්වා** %	**අවුරුදු 3-4 දක්වා** %	**අවුරුදු 4-5 දක්වා** %	**අවුරුදු 5 ට වැඩි** %
පොළී අනුපාත සංවේදී වත්කම්	11.9	15.1	12.0	16.3	9.9	9.9	4.9	4.9	15.1
පොළී අනුපාත සංවේදී වගකීම්	13.6	18.0	11.7	18.0	3.6	3.6	3.6	3.6	24.2
පරතරය	(1.7)	(2.9)	0.3	(1.7)	6.3	6.3	1.3	1.3	(9.1)

2017	මාසයක් දක්වා %	මාස 1-3 දක්වා %	මාස 3-6 දක්වා %	මාස 6-12 දක්වා %	අවුරුදු 1-2 දක්වා %	අවුරුදු 2-3 දක්වා %	අවුරුදු 3-4 දක්වා %	අවුරුදු 4-5 දක්වා %	අවුරුදු 5 ට වැඩි %
පොළී අනුපාත සංවේදී වත්කම්	9.1	17.1	6.3	22.2	9.3	9.3	5.0	5.0	16.7
පොළී අනුපාත සංවේදී වගකීම්	8.8	15.1	16.8	18.2	4.5	4.5	4.0	4.0	24.2
පරතරය	0.3	2.0	(10.5)	4.0	4.8	4.8	1.0	1.0	(7.5)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

63.4.3 ස්කන්ධ අවදානම

ස්කන්ධ දර්ශකයන්හි හා වික් වික් කොටස්වල මිල උච්ඡාවචනය හේතුකොට ගෙන ස්කන්ධ කළඹෙහි සාධාරණ අගය අඩුවීම ස්කන්ධ අවදානම ලෙස හැඳින්වේ. සමස්ත ස්කන්ධ ආයෝජන කළඹ සඳහා සීමාවක් පැනවීම සහ අවදානමේ දී අගය (VaR) යන ශිල්පීය ක්‍රම මඟින් මෙම අවදානම අධීක්ෂණය කෙරේ. 2018 වර්ෂය සඳහා ස්කන්ධය සඳහා වන අවදානම් අභිරුචි සීමාව යහපත් මට්ටමක පවතියි.

ස්කන්ධයන්හි අවදානමේ දී අගය	2018 රු. '000	2017 රු. '000
ඉහළම	117,494	263,051
පහළම	81,305	87,841
සාමාන්‍ය	97,540	144,906
දෙසැම්බර් 31 දිනට	115,030	89,852

63.5 මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලිවල, පුද්ගලයින්ගේ හෝ පද්ධතිවල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස නිර්වචනය කෙරේ.

මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach - BIA) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීම බැංකුව විසින් සිදු කරන නමුත්, ප්‍රායෝගිකව සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතින බව ගම්‍ය වේ.

63.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහි මූලික අරමුණ වනුයේ නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුරූපව ප්‍රාග්ධන මට්ටම පවත්වාගෙන යාමයි. බැංකුවෙහි අවදානම් අභිරුචිය සහ උපක්‍රමික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍ය තරම් ප්‍රාග්ධනය වෙන් කර ඇති බව බැංකුව තහවුරු කරයි.

63.6.1ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය (CAR) බැංකුවෙහි ප්‍රාග්ධනය,එනම් බැංකුකරණ ව්‍යාපාරයෙහි ණය, වෙළඳපොළ අංශ සහ මෙහෙයුම් අතර සම්බන්ධතාවය අනුපාතිකයක් ලෙස පෙන්නුම් කරයි. බලාපොරොත්තු නොවන අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමට බැංකුවෙහි මූල්‍ය ස්ථාවරත්වය හා ශක්තිය පෙන්නුම් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය භාවිතා කෙරේ. එය තැන්පතුකරුවන් ආරක්ෂා කිරීමට හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය හා කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීමට භාවිතා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) නිර්වචනය කිරීම සහ නියාමනය කිරීම තුළින් තහවුරු කරනුයේ, බැංකුව විසින් ණය පැහැර හැරීමේ අවදානම ඉහළ යන ආයෝජන දරා සිටීම හෝ සහභාගීවීමෙන් වැළකී සිටීමත්, මෙහෙයුම් අවදානම දරා සිටීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමත්, එයින් බැංකු පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමත්ය.

ප්‍රාග්ධන මිණුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රාග්ධන ප්‍රමිත සංශෝධිත ආකෘතිය අනුව බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) ගණනය කරයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් විය හැකි අයහපත්ම තත්ත්වය සඳහා දැඩිව ආතතියකට පත්කර ක්‍රියාකාරිව හා අබණ්ඩව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව අධීක්ෂණය කෙරේ. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) යටතේ කීර්තිනාම අවදානම, උපායමාර්ග අවදානම, අනුකූලවීමේ අවදානම, සංකෙන්ද්‍රණ අවදානම සහ බැංකු කටයුතු සඳහා ඇති වත්කම් මත අවදානම වැනි සියලුම අවදානම් සලකා බලනු ලැබේ.

අනුකූලතා ඇමුණුම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා • **394**

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා • **401**

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා • **428**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා • **430**

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය • **434**

පැවරුම් මිල සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහතිකය • **448**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.	**අධ්‍යක්ෂවරුන්**
අ.1	**අධ්‍යක්ෂ මණ්ඩලය** ලංකා බැංකු ආඥා පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත වේ. 2018 වසරට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පිටු අංක 79 සිට 85 දක්වා සඳහන් කර ඇති අතර වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ විස්තර පිටු අංක 24 සිට 27 දක්වාද සඳහන් වේ. 2018 වසරේ රට තුළ ඇති වූ දේශපාලනික වෙනස් වීම් හේතු කොටගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතියේ වෙනසක් සිදු විය. අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ බලධාරියා වන මුදල් අමාත්‍යාංශය නවක අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් පවතී. අධ්‍යක්ෂවරුන්ගේ විස්තර වල දැක්වෙන පරිදි සුදුසුකම් හා අත්දැකීම් ඇති අධ්‍යක්ෂවරුන් බැංකුව නිවැරදි දිශානතියට ඵලදායී ලෙස හසුරුවනු ලැබේ.
අ.1.1	**අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්** සෑම දෙසතියකට වරක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වෙන අතර අවශ්‍යතාවයන් පැන නැඟුන විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලැබේ. වසර ආරම්භයේදී රැස්වීම් සඳහා සැලැස්මක් සකස් කරන අතර තීරණ ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 23 වරක් රැස් වූ අතර පැමිණීමේ වාර්තාවල සාරාංශය 86 පිටුවේ දැක්වේ.
අ.1.2	**අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව හා වගකීම** අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥාප්තිය තුළ අධ්‍යක්ෂවරුන්ගේ භූමිකාව හා වගකීම අන්තර්ගතවන අතර එය අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2017 වසරේදීය.
අ.1.3	**රටේ පවත්නා නීතියට අනුකූලව කටයුතු කිරීම** 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්ට අනුව බැංකුව නියාමනය වේ. තවද ශ්‍රී ලංකා මහ බැංකුව, සුරුකුම්පත් හා විනිමය කොමිසම හා කොළඹ කොටස් හුවමාරුව මඟින් නිකුත් කර ඇති නියාමනයන්ට බැංකුව අනුකූල වන අතර බැංකුවට අදාළ වන නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. **ස්වාධීන වෘත්තීය උපදෙස් සඳහා ප්‍රවේශය** අධ්‍යක්ෂවරුන්, හට අවශ්‍ය වූ විට බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අනුමත ප්‍රතිපත්තිය මත ප්‍රවේශ විය හැකි අතර එය මෙම වසර තුළ සමාලෝචනය කර ඇත.
අ.1.4	**සමාගම් ලේකම්ගේ වගකීම් හා සේවාවන්** සියළුම අධ්‍යක්ෂවරුන්ට, නීතිඥවරියක් වන ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමියගෙන් උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ හැකියාව ඇති අතර ලංකා බැංකුවේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වේ. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති හා රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ඉවත් කිරීමේ අවශ්‍යතාවයන් පැන නැඟුන විට එය මුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම සැලකිල්ල යොමු කර ක්‍රියාවට නැංවිය යුතු කාර්යයක් වේ.
අ.1.5	**ස්වාධීන විනිශ්චය** ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැළසුම් කාර්ය ඵල සම්පත් විභාජනය, අවදානම් කළමනාකරණය, අනුකූලතා වීම හා සම්මතයන් පවත්වාගෙන යාමට අදාළ කාර්යයන් හා වගකීම් වලදී ස්වාධීන විනිශ්චයන් දරනු ලැබේ.

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.1.6	**අධ්‍යක්ෂ මණ්ඩලයේ හා බැංකුවේ කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි කාලය වෙන් කිරීම හා කැපවීම** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වන අතර එමඟින් වැඩිදුර තොරතුරු සොයා බැලීමට හා අවශ්‍ය දත්ත ගැන විමසීමට ප්‍රමාණවත් කාලයක් ලැබී ඇත.
අ.1.7	**යෝජනාවන් ඉදිරිපත් කිරීම** බැංකුවේ කටයුතු පිළිබඳව විශේෂයෙන්ම බලපෑමක් ඇති අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් හට තනි තනිව තමන්ගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.
අ.1.8	**අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වීම්** බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පළමු වරට පත් වීමේදී හඳුන්වාදීමේ වැඩසටහනකට සහභාගී වීමට අධ්‍යක්ෂකවරුන්ට අවස්ථාව සැලසෙන අතර එහිදී බැංකුවට අදාළ නියාමන අවශ්‍යතාවන්, බැංකුවේ ඉතිහාසය, සංවිධාන ව්‍යුහය, බැංකුවේ පරිපාලිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳ විස්තර, බැංකුවේ නිෂ්පාදන හා සේවා පිළිබඳ විස්තර ද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ද ඇතුළත් සවිස්තරාත්මක ලිපිගොනුවක් ලබාදෙන අතර දත්ත ලබා ගැනීම සඳහා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයට පිවිසීමට ඉඩ සලස්වනු ලැබේ. පුහුණු සැසි සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂවරුන් උනන්දු කරවන සහ බාහිර පරිසරයේ වර්තමාන සහ නව්‍ය උපායමාර්ගයන්, වැඩ පිළිවෙත් අතර බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය මඟින් හෝ බාහිර සම්පත් දායකයකු මඟින් හෝ විස්තරාත්මකව පැහැදිලි කිරීම් සිදු කෙරේ.
අ.2	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිතුමා අතර වගකීම් විභජනය** ලංකා බැංකුවේ සභාපති තනතුර හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර (ලංකා බැංකුවේ මහා කළමනාකරු) පුද්ගලයන් දෙදෙනෙකු විසින් දරණු ලබයි. සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව විසින් නිකුත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥාප්තියට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ හා මහා කළමනාකාරතුමාගේ වගකීම් ඉතා පැහැදිලිව දක්වා ඇත.
අ.3	**සභාපතිතුමාගේ භූමිකාව** බැංකුවේ සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබේ. අධ්‍යක්ෂවරුන් සහ මහා කළමනාකාරතුමා විසින් විවිධ කරුණු මත පදනම්ව ඉදිරිපත් කළ වාර්තා වලට අනුව ලංකා බැංකුවේ සභාපතිතුමාගේ අවසරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍ර සකස් කිරීම ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමියට බලය පැවරී ඇත. උපාය මාර්ග, කාර්ය සාධනය, සම්පත් බෙදා හැරීම, අවදානම් කළමනාකරණය හා අනුකූලතා වීම යන සියළු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම න්‍යාය පත්‍ර සකස් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. සියළුම අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් හා වගකීම් ද (අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥාප්තියේ දක්වා ඇති පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ව්‍යුහය ද පැහැදිලිව ප්‍රකාශ කිරීම හේතු කොට ගෙන සිය වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් ඔවුන්ගේ හැකියාවන් මත බැංකුවේ සාර්ථකත්වයට උපරිම දායකත්වය ලබා දෙයි. සියළුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම් න්‍යාය පත්‍රයට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හා අවශ්‍ය වැඩිදුර දත්ත ලබා ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇති අතර ආයතනිකමය වශයෙන් වැදගත් යැයි හැඟෙන කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට ඉල්ලා සිටීමට අවස්ථාව සලසා ඇත. සැලකිල්ලට භාජනය කරන ලද ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරනු ලබන අතර, එවැනි සාකච්ඡාවන් පිළිබඳ වාර්තාවක් විස්තරාත්මකව සටහන් කර ඇත.
අ.4	**මූල්‍ය නිපුණතාවය** බැංකුවේ කටයුතු වලට මඟ පෙන්වීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය දැනුමක් හා නිපුණතාවය අධ්‍යක්ෂවරුන් සතුව ඇති අතර ඒ සඳහා ඔවුන්ට තම ව්‍යාපාර/ වෘත්තිය තුළින් ලද පෙරහුරුවන් මහෝපකාරී වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
අ.5	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය** ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම විටම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර විකල්ප අධ්‍යක්ෂකවරුන් පත්වන අවස්ථා වලදී ද ඔවුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම අභිවාර්ය වේ.
අ.6	**කාලීන තොරතුරු සැපයීම** න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අදාල කමිටු රැස්වීම් වලට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වීම මඟින් ඒ සඳහා තොරතුරු සොයා බැලීමට අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබේ. පැහැදිලි කිරීම් කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයන් සුදානම්ව සිටී. රැස්වීමේ සිට දින 10ක් ඇතුළත දී එහි වාර්තාව අධ්‍යක්ෂවරුන්ට ලබා ගැනීමට ඉඩ සලස්වා ඇත.
අ.7	**අධ්‍යක්ෂ මණ්ඩල සඳහා පත්වීම්** ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් රජයේ බැංකු අයත්වන අමාත්‍යවරයා විසින් බැංකු ආඥා පනතට එහි සංශෝධන හා අදාළ නීතිරීති වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් කරනු ලැබේ.
අ.8	**නැවත පත් කිරීම** තම සේවා කාලයට ප්‍රථම අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් කළහොත් හෝ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව ධූරය හෙබවීමෙන් ඉවත් වුවහොත් හැර සෑම අධ්‍යක්ෂවරයෙකුම අවුරුදු තුනක සේවා කාලයක් සඳහා පත් කරනු ලබන අතර මෙම අවස්ථා දෙකෙහිදීම බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් වීමට බාධාවක් ඇති නොවේ. **ධූරයෙන් ඉවත් වීම** පත් වූ අධ්‍යක්ෂවරයෙකු තම අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස්වන විට හා සේවා කාලය අවසන් වනවිට තම ඉල්ලා අස්වීමේ ලිපිය බැංකු කටයුතු විෂය භාර අමාත්‍යවරයාට ලිඛිතව ලබාදිය යුතුවේ. තවද විශේෂ හේතුවක් මත සේවයෙන් ඉවත් වන්නේ නම් එයද තම ලිපියෙහි සඳහන් කළ යුතුවේ.
අ.9	**අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල කාර්යසාධනය ඇගයීම** අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උපකමිටු වල අදාළ ඉලක්ක නිවැරදිව ළඟා කර ගනිමින් අදාළ කමිටු වගකීමෙන් හා තෘප්තිමත් විය හැකි අයුරින් කටයුතු කර ඇති බව තහවුරු කර ගැනීමට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ උප කමිටු නිරත වේ. එම කමිටු සියල්ලේම සාමූහික ප්‍රතිඵලය අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සමාලෝචනය කරනු ලැබේ. 2018 වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩලයේ සිදු වූ වෙනස්කම් හේතු කොටගෙන මෙම ස්වයං ඇගයීම් හා සමාලෝචන ක්‍රියාවලිය සිදු කිරීමට අපොහොසත් විය.
අ.10	**අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් තොරතුරු වාර්ෂික වාර්තාවෙන් අනාවරණය කිරීම** අධ්‍යක්ෂවරු හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. i. නම, සුදුසුකම්, ප්‍රවීණතාවය දක්වන ක්ෂේත්‍ර, විධායක හෝ විධායක නොවන බව ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ට අදාළ විස්තර පිටු 24 සිට 27 දක්වා * ii. සම්බන්ධිත පාර්ශ්ව විස්තර පිටු අංක 351 සිට 352 iii. වෙනත් ආයතන වල අධ්‍යක්ෂධූර පිටු අංක 24 සිට 27* iv. උපකමිටු වල සමාජිකත්වය, වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල හා උපකමිටු රැස්වීම් වල සහභාගීත්වය පිළිබඳ පිටු අංක 86 දක්වා ඇත. *2018 වර්ෂය තුළ කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පිටු අංක 79 සිට 85
අ.11	**ප්‍රධාන විධායක නිලධාරි/ මහා කළමනාකරු ඇගයීම** මහා කළමනාකාරතුමාගේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මඟින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර කාර්යසාධනය මැන බැලීමට ගන්නා නිර්ණායක ලෙස බැංකුව අදාළ වර්ෂය තුළ ළඟා කරගත් ඉලක්ක හා ඊට අනුබද්ධිතව ඇති ආයතනික සැලැස්ම යොදා ගනී. 2018 වර්ෂය අවසානයේදී ඇති වූ දේශපාලනික වෙනස්වීම් සමඟම අධ්‍යක්ෂ මණ්ඩලයෙහිද වෙනස් වීම් සිදු වූ අතර මේ හේතුවෙන් පෙරකී ඇගයීම් කටයුතු නිසියාකාරයෙන්ම සිදු කිරීම අපහසුවිය. කෙසේ වෙතත් අදාළ කාර්යසාධනයන් පසුවසර සඳහා වන ආයතනික සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ දී සාකච්ඡාවට භාජනය කරන ලදී.

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ආ	**අධ්‍යක්ෂ පාරිශ්‍රමික**
ආ.1	සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය (සියළුම විධායක නොවන) සඳහා පාරිශ්‍රමික ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් ඇති අතර එය අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ සහ ව්‍යවස්ථාපිත නීති රීති වලට අනුකූලව ද සිදු කරනු ලබයි.
ආ.2	බැංකුවේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට, අධ්‍යක්ෂවරුන්ගේ දීමනා පිළිබඳ තීරණ ගැනීමට බලයක් නොමැත. (එහෙත් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ පාරිශ්‍රමික සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට බලය ඇත).
ආ.3	**පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම** සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් ප්‍රඥාප්තිය (ප්‍රතිපත්ති) මෙහි පිටු අංක 96 සහ 97 දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවූ මුළු පාරිශ්‍රමික පිළිබඳව පිටු අංක 236 හි දක්වා ඇත. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය පිටු අංක 96 සහ 97 දක්වා ඇත.
ඇ	**කොටස්කරුවන් හා ඇති සම්බන්ධය**
ඇ.1	බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන අතර බැංකුව හා කොටස් හිමියා අතර විවිධ ආකාරයෙන් සන්නිවේදන කටයුතු සිදු වේ. ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් නිලධාරියෙක් (මුදල් අමාත්‍යාංශ නිලධාරියෙකු) බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ඇති අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සිදුවේ. වාර්ෂික වාර්තාව පිළිබඳ විමසීම් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේදී ඉඩ ප්‍රස්ථාව සලසා ඇත.
ඇ.2	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල සන්නිවේදන ප්‍රතිපත්තියක් ඇත. බැංකුවේ කොටස්කරු වශයෙන් රජය සතුව පවතින බැංකුවට අදාළ වන ප්‍රධාන ගැටළු හා විශේෂිත අංශයන් පිළිබඳ සාකච්ජා කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළ සිදු කරන අතර එහිදී රජයේ ප්‍රධාන නියෝජිතයා හා අවශ්‍ය වූ විට අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් සහභාගි වේ.
ඇ.3	තවද 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත, 1988 අංක 30 දරණ බැංකු පනත, සුරැකුම්පත් හා විනිමය කොමිසමේ පනත් හා එහි සංශෝධන, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නීති රීති වලට අදාළව අධ්‍යක්ෂවරු විසින් අදාළ අමාත්‍යාංශයට/ අමාත්‍යවරයාට බැංකුවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශාල ගනුදෙනු පිළිබඳ අවශ්‍ය වූ විට අනාවරණය කරනු ලැබේ. පිටු අංක 351 සහ 352 හි ඇතුළත් මූල්‍ය ගනුදෙනු වලට අමතරව බැංකුවේ කාර්යසාධනය/ ලාභදායිත්වය හෝ ශුද්ධ වත්කම් පදනමට ප්‍රමාණාත්මක ලෙස බලපාන පරිදි කිසිඳු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක් අදාළ වර්ෂය තුළ සිදු වී නැත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඈ	**වගවීම හා විගණනය**
ඈ.1	**මූල්‍ය හා ව්‍යාපාර වර්තාකරණය (වාර්ෂික වාර්තාව)**
	අදාළ මිනුම් දඬු භාවිතා කර බැංකුවේ මූල්‍ය තත්ත්වය, බැංකුවේ කාර්යසාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන හා අභියෝග, අවස්ථාවන් හා අපේක්ෂා පිළිබඳ වාර්තා පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍ර වලට අදාළ නීති නියාමන හා මඟ පෙන්වීම් වලට අනුකූලව මූල්‍ය වාර්තා සකස්කර ඇති අතර සැලකිය යුතු අපගමන අවස්ථා වලදී සාධාරණ පැහැදිලි කිරීම් ද මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතා, වෙනත් නියාමන ආයතන වලට ලබා දෙන වාර්තා, අතුරු සහ වෙනත් මිල සංවේදී ප්‍රසිද්ධ වාර්තා පිළියෙල කිරීමේදී සමතුලිත සහ පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් පිළියෙල කර ඇති බව තහවුරු කරයි. බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තා සත්‍ය හා සාධාරණ බවට ප්‍රධාන මූල්‍ය නිලධාරී හා මහා කළමනාකාරතුමන් විසින් සහතික කරයි. සියළු මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර විගණන කමිටුව මඟින් සමාලෝචනය කර අනුමැතිය සඳහා නිර්දේශ කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය තුළ වෙනස්වීම් වන විට විගණන කමිටුවක් නොමැති බැවින් මූල්‍ය වාර්තා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කරනු ලැබේ. අනුකූලතා අනාවරණ අවශ්‍යතා සපුරාලීම සඳහා, පහත ප්‍රකාශන වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත. i. බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව පිටු අංක 182 සිට 184 දක්වා ii. මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිටු අංක 188 සිට 189 iii. කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණ පිටු අංක 120 සිට 176 iv. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම හා ඔවුන්ට සම්බන්ධිත පාර්ශ්ව මඟින් කළ ගනුදෙනු පිළිබඳ සාරාංශය පිටු අංක 351 සහ 352 v. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් පිටු අංක 191 vi. විගණකාධිපති වාර්තාව පිටු අංක 192 සිට 195
ඈ.2	**පවතින අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන විධි**
	බැංකුවේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීමට යාමේදී ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අධ්‍යක්ෂ කමිටුව මඟින් බැංකුවේ පැවැත්ම, අවදානම් කළමනාකරණ වැඩසටහන් වල මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය, බැංකුවට බලපෑ හැකි විවිධ අවදානම් වළක්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්ති හා භාවිතයන් ද ඊට අදාළ අනුකූලතා පිළිබඳ විස්තරද අධ්‍යක්ෂ මණ්ඩලයට සපයමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලයි. බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ මෙහෙයුම් කටයුතු, මූල්‍ය හා අනුකූලතා කටයුතු නිවැරදිව හැසිරවීම විගණන කමිටුවේ තවත් වගකීමක් වේ. බැංකුවේ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධති සුපරීක්ෂණය සඳහා අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන කමිටුව පත් කර ඇති අතර එම කමිටු වල කාර්යක්ෂමතාව අවුරුදු පතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කෙරේ. බැංකුව සතුව සියළු අංශ වලින් පරිපූර්ණ වූ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් ඇති අතර එමඟින් අභ්‍යන්තර විගණන කටයුතු පරීක්ෂාවට ලක්විය බැංකුවේ බාහිර විගණක ලෙස විගණකාධිපති කටයුතු කරයි.

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඇ.3	**විගණන කමිටුව** සමාලෝචිත වසර තුළ බැංකුවේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත විය. එම වසර තුළ විගණන කමිටුවේ සභාපති ධූරය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් හෙබවීය. විගණන කමිටුවේ සභාපති ඇතුළු සාමාජිකයන් මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය තත්ත්ව පාලනය පිළිබඳ මනා දැනුමකින් හා අත්දැකීම් වලින් පොහොසත් අය වේ. අධීක්ෂණ වගකීම් ඉටුකිරීමේදී මණ්ඩලයේ විගණන කමිටුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයට සහාය වේ. විගණන කමිටුව විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාවයන් පිළිබඳ සමාලෝචන පැවැත්වීම, අභ්‍යන්තර විගණනය හා විගණන වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුවේ කාර්යභාරය හා වගකීම් මෙම වාර්ෂික වාර්තාවේ 90 සිට 92 දක්වා පිටුවල සඳහන් විගණන කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත. විගණන කමිටුව සඳහා ලිඛිත නියමයන් නියම කර ඇති අතර එහි භූමිකාව සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කරයි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන් මෙම වාර්තාවේ පිටු අංක 90 සිට 92 දක්වා සඳහන් කර ඇත.
ඇ.4	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු** සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් තීරණ ගැනීමේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීමට ඇති බැඳියාව වලකාලීමයි. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් හා ඔවුන්ගේ ළඟම ඥාතීන් විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ පිටු අංක 351 සහ 352 තුළ ඇතුළත් වේ.
ඇ.5	**ව්‍යාපාර හැසිරවීම හා ආචාර ධර්ම සංග්‍රහය** අදාළ නියාමනයන් හා ප්‍රතිපත්ති වලට අනුකූල වීම සඳහා බැංකුව විසින් එහි සේවකයන්ට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන වෙනම ආචාර ධර්ම සංග්‍රහයන් පවත්වා ගෙන යන අතර ඒවා පිළිගැනීම සඳහා ප්‍රතිඥා ලබාදේ.
ඇ.6	**ආයතනික යහපාලන අනාවරණය** හොඳ ආයතනික යහපාලන පුරුදු සමඟ අනුගත වීමට අදාළ තොරතුරු මෙම වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවේ පිටු අංක 71 සිට 88 දක්වා අනාවරණය කර ඇත.
ඉ.1 සහ ඉ.2	**කොටස් හිමිකාරිත්වය** බැංකුවේ එකම කොටස් හිමියා ශ්‍රී ලංකා රජයයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන හොඳම පරිචයන් පිළිබඳ 2017 සංග්‍රහයට අනුකූලතා

පරිච්ඡේදය	අනුකූල වීමේ මට්ටම
ඊ	**අන්තර්ජාලය හා සයිබර් අවකාශයේ සුරක්ෂිතතාව** බැංකුවේ ව්‍යාපාර ක්‍රමවේදය පවත්වා ගැනීමට භාවිතා වන තොරතුරු තාක්ෂණික මෙවලම් හරහා බැංකු පරිසරය තුළ හා ඉන් පිටත හුවමාරුවීම හේතු කොටගෙන බැංකුවට බලපෑ හැකි සයිබර් අවකාශ අවදානම හඳුනා ගැනීමේ ක්‍රියාපිලිවෙලක් බැංකුව සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් තොරතුරු සුරක්ෂණ ප්‍රතිපත්තිය, කළමනාකාරිත්වයට බැංකුවේ තොරතුරු සුරක්ෂිතභාවය තහවුරු කරලීමට අවශ්‍ය දිශානතිය සපයයි. අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව 2018 වසරේ පිහිට වූ අතර එය අධ්‍යක්ෂවරුන් හට බැංකුවට අදාළව තොරතුරු තාක්ෂණය සම්බන්ධ කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේදී හා අධීක්ෂණ කටයුතු වලදී මනා පිටුවහලක් වේ. මීට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් බැංකුව, සයිබර් අවකාශ අවදානම් වලින් මිදීමට නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන බවට සහතික වේ. සයිබර් අවකාශ අවදානම් වලින් ආරක්ෂා වීමට හා තත්ත්වය සමනය කිරීමට බැංකුව භාවිතා කරන ක්‍රියා පිලිවෙත් මෙම වාර්ෂික වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු අංක 116 හා 117 ඇතුලත් වේ. සයිබර් අවකාශිය අවදානම් මැඩලීමේ ප්‍රතිපත්තිය උදෙසා බැංකුව විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත.
උ	**පරිසරය, සමාජය සහ පාලනය (ESG)** මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 160 සිට 176 දක්වා පරිසරය, සමාජය සහ පාලනයට අදාල වාර්තාවන් ඇතුලත් වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
3 (1) (i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා අඛණ්ඩතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කර ඇත. (අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික හර පද්ධතීන් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය කිරීම.	අනුකූල වී ඇත. උපායමාර්ගික අරමුණු සහ ක්‍රියාකාරී සැලැස්ම, සමඟ ආයතනික වටිනාකම්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වය ඇතුව බැංකුවෙන් බාහිර ස්ථානයක දී සකස් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2018-2020 කාලපරිච්ඡේදය සඳහා වූ ආයතනික සැලැස්මෙහි 2018 වසර සඳහා පුනරාවර්තනය කළ අරමුණු සහ ක්‍රමෝපාය අන්තර්ගත කර ඇත. ආයතනික සැලැස්ම ඉදිරිපත් කරන ලද බාහිර ස්ථානයේදී මෙම කරුණු පිළිබඳව ශාඛා කළමනාකරුවන් දක්වා වූ සියළු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කරන ලද අතර ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම මඟින් එය තවදුරටත් ශක්තිමත් කරන ලදී. නිතිපතා පවත්වන ලද සාකච්ඡා සැසි සහ රැස්වීම් හරහා අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල මේ පිළිබඳව දැනුවත් කරන ලදී. තවද, ආයතනික වටිනාකම් අභ්‍යන්තර ජාලයට ඇතුළත් කර ඇත. 2019-2021 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ආයතනික සැලැස්ම ද පිළියෙල කර ඇත.
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අදාළ වර්ෂ සඳහා බැංකුවේ උපායමාර්ග පිහිටුවා ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර පවතින ආයතනික සැලැස්මෙහි අන්තර්ගත කර ඇත. උපායමාර්ගික සැලසුම සමඟ යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අනුමත කර ඇත. සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.
	(ඇ) ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම හා විචක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යුහයක් ඇති කිරීම, ප්‍රධාන අවදානම් මැනීම, අධීක්ෂණය හා පාලන සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ආදිය අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් විසින් නව උපාය මාර්ග හා ඒවැනි අවදානම් තවදුරටත් අවම කිරීමේ ක්‍රම හා උපක්‍රම සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ක්‍රියාවලියක් බැංකුව ආරම්භ කර ඇත. අවදානම් සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. පහත වාර්තා මඟින් මේ පිළිබඳ වැඩි දුර තොරතුරු සපයනු ලැබේ: ► අවදානම් කළමනාකරණ වාර්තාව පිටු 102 සිට 118 දක්වා ► ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාව පිටු 94 සහ පිටු 95 දක්වා
	ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම	අනුකූල වී ඇත. උනන්දුවක් දක්වන සෑම පාර්ශ්වයක්ම ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කර ඇති අතර, මෙය වර්ෂය තුළදී විමර්ශනය කරන ලදී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම	අනුකූල වී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමාණාත්මකභාවය හා අබණ්ඩභාවය සමාලෝචනය කිරීම විගණන කමිටුවට පැවරී ඇත. මෙම කටයුතු කිරීමට විගණන කමිටුවට සෘජුව වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තුමේන්තුවෙන් වාර්තා ලබා ගන්නා අතර, බාහිර විගණකයින්ගෙන්ද වාර්තා ලබා ගනී. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිත්වය ඇගයීම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීමක් වන අතර ඔවුන් විසින් තොරතුරු පද්ධති විගණන සිදු කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.
	(ඊ) ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් හඳුනා ගැනීම හා නම් කිරීම	අනුකූල වී ඇත. 2015 දෙසැම්බර් 02 දිනැති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ හා 2010 අංක 03 දරණ බැංකු පනතේ මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරු, සහකාර මහා කළමනාකරුවන් සහ ඊට සමාන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් බැංකුවේ ආයතනික යහපාලන යටතේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ලට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ මඩුල්ලෙහි අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය 2017 වර්ෂයේදී අවසන් වරට විමර්ශනය කරන ලද අතර 2019 වර්ෂය තුළ විමර්ශනය කිරීමට සූදනම් කර ඇත.
	(ඌ)අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ මඩුල්ල විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම	අනුකූල වී ඇත. බැංකුවේ ආයතනික සැලැස්මට එරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.
	(එ) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැන ගැනීම: i. අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ල තෝරා ගැනීම, නම් කිරීම සහ පත්කිරීම; ii. අරමුණු අතර ගැටුම් කළමනාකරණය කිරීම; සහ iii. දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී වෙනස්කම් කිරීම	සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳව ස්වයං ඇගැයීමක් වාර්ෂිකව කරගෙන යනු ලබන අතර ඔවුන්ගේ යහපාලන පුරුදු ද අගයනු ලැබේ. එහෙත්, රට තුළ ඇති වූ දේශපාලනික වෙනස් වීම් හේතු කොට ගෙන 2018 නොවැම්බර් මස නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වූ අතර ඔවුන්ද වර්ෂ අවසානයට පෙර ඉල්ලා අස් වූහ. 2018 වර්ෂ අවසානයේදී බැංකුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොවීය. කාර්ය සාධනයන් නැවත 2019 වසරේ සිට ආරම්භ කිරීමට නියමිතය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් "බැඳියාවන් පිළිබඳ ගැටුම්" පිළිබඳ විස්තරයක් ඇති අතර එහි අනුකූලතාව අධීක්ෂණය කරනු ලැබේ.
	(ඒ) ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව ඇත. නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් මෙය විමර්ශනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2018 වසර තුළදී ඉදිරිපත් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිතිපතා ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සමඟ රැස්වීම් පැවැත්වීම	අනුකූල වී ඇත. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ මඩුල්ලේ සාමාජිකයින් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනමින් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට කැඳවනු ලැබේ. ආයතනික සැලැස්ම සම්බන්ධයෙන් වූ කාර්යසාධනය සමාලෝචනය කිරීම කළමනාකරණයේ සහභාගිත්වයෙන් කරගෙන යනු ලැබේ.
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරයකු පත් වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපිගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමකවරුන් ගෙන් ලද වැදගත් තොරතුරු එසැනින්ම අධ්‍යක්ෂ මණ්ඩල අවධානයට යොමු කරයි. නියාමකවරුනට ලබා දෙන සියළුම ප්‍රතිලාභ ඇතුළත් ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදෙන අනුකූලතා වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඕනෑකමින් අධීක්ෂණය කරනු ලැබේ.
	(ක) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණය නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම	අනුකූල වී ඇත. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
3 (1) (ii)	මෙම නියමයන්ගේ 3 (5) නියමයේ දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත් ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	උපදෙස් අංක 3 (9) (ii) සමඟ කියවන විට අනුකූල වේ. බැංකුව අයත්වන අමාත්‍යාංශය භාරව සිටින අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙසද හඳුන්වන ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත හා එහි සංශෝධනයන්ට අනුව උක්ත අමාත්‍යවරයා විසින් සභාපති පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මඟින් භූමිකා දෙක අතර, බල තුලනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව පැවැත්විය යුතු අතර, ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම්වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට වැලැක්විය යුතුවේ.	අනුකූල වී ඇත. අඛණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නඟින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 23 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මඟින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර, එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2018 වසර තුළ යෝජනා 7 ක් චක්‍රලේඛ මඟින් සම්මත කර ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට විෂයයන් හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුකූල වී ඇත. ක්‍රමානුකූලව පැවැත්වෙන රැස්වීම් සඳහා සකස් කළ න්‍යාය පත්‍රය යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි සෑම වර්ෂයක්ම ආරම්භයේදී රැස්වීම් නියම කර අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනු ලැබේ.
3 (1) (v)	සියළුම අධ්‍යක්ෂවරුන්ට සහභාගි වීමට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින 7 ක පෙර දැනුම්දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මඟින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුකූල වී ඇත. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මඟින් රැස්වීම් පිළිබඳ දැනුම් දීම සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලැබේ.
3 (1) (vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර 3 කට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂ ධූරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මඟින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 86 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියෝගයට අනුකූලව තිබේ.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි. ඇයගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්ට ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර, ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්වරිය විසින් පවත්වාගෙන යන අතර, ආරක්ෂිත මෘදුකාංගය තුළ තැන්පත් කරන අතර ඒවා සෑම අධ්‍යක්ෂවරයකුටම ලැබීමට සලස්වා ඇත. රැස්වීම් වාර්තා ඊට පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කර ඇත. අධ්‍යක්ෂවරුන්ට ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවයක් හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත.
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතුය. ඒම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේසම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව විවෘත වන අවදානම් වලට සම්බන්ධ කරුණු සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා ඇතුළත්ව අවදානම් කළමනාකරණය පිළිබඳ විශ්ලේෂණයන් (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූල වී ඇත. විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.
3 (1) (xi)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස, තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය. යෝග්‍ය අවස්ථාවන්හි දී, සාධාරණ ඉල්ලීම් මත, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ ඇයගෙන්/ ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් අධ්‍යක්ෂවරුන්ට ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල ඇතුළත් කර ඇති අතර ස්වාධීන වෘත්තීමය උපදෙස් පැතීම සඳහා බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා ඇත. අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි. එය 2018 වසර තුළ සමාලෝචනය කරන ලදී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, අරමුණු අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගත යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති, විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම්, එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(iv) නියමය බලන්න) සහභාගි වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නඩය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ගණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුමක් ඇති වන තත්ත්වයක් තුළ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගේ වගකීම් පිළිබඳව අධ්‍යක්ෂවරු දැනුවත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අරමුණු අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුම් වේ නම් ඒ බව සෑම සති දෙකකට වරක්ම පවත්වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී හෙළිදරව් කළ යුතුය. අරමුණු අතර ගැටුමක් පවතිනා අවස්ථාවක අධ්‍යක්ෂවරුන් තීරණ ගැනීමට සහභාගී වීමෙන්, ඡන්දය දීමෙන් හෝ සම්මත කිරීමෙන් වැළකී සිටී.
3 (1) (xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස, තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් කර ඇත.
3 (1) (xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකිවීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම්, වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	අනුකූල වී ඇත. 2018 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත්බව සහතික වනු ඇත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විචක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වන බවට අධ්‍යක්ෂක මණ්ඩලය තහවුරුවක් ලබා දෙයි. ත්‍රෛමාසික පදනම මත ප්‍රාග්ධන ආවර්ධන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත වල තත්ත්වය බැංකුවේ මාසික මූල්‍ය ප්‍රකාශනය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
3 (1) (xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතු ය.	අනුකූල වී ඇත. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවට අඩංගු කොටසක් වේ.
3 (1) (xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර, එවැනි ඇගයීම්වල වාර්තා තබා ගතයුතු වන්නේය.	අනුකූල වී ඇත. ස්වයං ඇගයීමේ යාන්ත්‍රණයක් යොදාගෙන ඇත. ලංකා බැංකුවේ ලේකම්තුමිය/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් ස්වයං ඇගයීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යා යුතුය. එහෙත්, 2018 වසර තුළ දී රට තුළ ඇති වූ දේශපාලනික වෙනස් වීම් හේතු කොට ගෙන 2018 නොවැම්බර් නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වූ අතර මෙම ස්වයං ඇගයීමේ යාන්ත්‍රණය නොපැවැත්විණි. (2018 නොවැම්බර් මස පත්වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂ අවසානයට පෙර ඉල්ලා අස් වූහ.)

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 6 ක් වන අතර නව අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 4 දෙනෙකුගෙන් සමන්විත වේ. 2018 වසර තුළ සිටි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අනුකූලතා වාර්තාවේ නියාමන අංක 3 (2) (vii) යටතේ දක්වා ඇත. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 24 සිට 27 දක්වා ඇත. මෙම විධිවිධානයට අනුකූල වන පරිදි ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීමට බැංකුව විසින් කටයුතු ආරම්භ කර ඇත.
3 (2) (ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතු අතර, එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධූරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර 9 කට වඩා අඩු සේවා කාලයක් එම තනතුරෙහි සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ පිටු අංක 24 සිට 27 දක්වා සඳහන් කර ඇත.
3 (2) (iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්මවන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මීන් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවකු නොමැත.
3 (2) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙකු ලෙස නොසැලකේ; (අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. (ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර 2 ක කාල සීමාවක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/යෙදී සිට තිබීම. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම. (ඈ) කිට්ටු ඥාතීත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යේෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි.	අනුකූල වී ඇත. මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවන අතර, ඔහු විසින් බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. පිටු අංක 24 සිට 27 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ සහ පහත සඳහන් විධිවිධාන අංක 3 (2) (viii) හි ඔවුන්ව දක්වා ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම. (ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම: (i) පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින; හෝ (ii) බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින; හෝ (iii) මෙම විධානයන්ගේ 3 (7) වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින.	
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළ යුතුය.	අනුකූල වී ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරුන් සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කර නොමැත.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ කීර්තිමත් පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් විය යුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතුය.	අනුකූල වී ඇත. පිටු අංක 24 සිට 27 දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තරයෙහි අවශ්‍ය තොරතුරු දක්වා ඇත.
3 (2) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගී වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනු විධානය බල පැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළ යුතුය.	අනුකූල වී ඇත. 2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය: ► **රොනල්ඩ් සී පෙරේරා මහතා, ජනාධිපති නීතීඥ** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ /සභාපති (2018 නොවැම්බර් 18 සිට බල පැවැත්වෙන පරිදි සභාපති/ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූ) ► **සජිත් ආර් ආටිගල මහතා** විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 25 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූ) ► **රනෙල් ටී විජේසිංහ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 ජූලි 31 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූ)

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
		► **එච් පී අජිත් ගුණවර්ධන මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 ජූලි 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **සමන්ත රාජපක්ෂ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 25 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **මොහාන් විජේසිංහ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 ජූලි 02 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **කේ ඒ විමලෙන්තිරාජා මහතා** (සජිත් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස 2017 නොවැම්බර් 09 පත්වූ සහ 2018 නොවැම්බර් 25 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **නිල් ඒ උමගිලිය මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/ සභාපති (2018 නොවැම්බර් 19 දින පත් වූ සහ 2018 දෙසැම්බර් 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **විශාඛා අමරසේකර මිය** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 26 දින පත් වූ සහ 2019 පෙබරවාරි 27 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **ලලිත් විතාන මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 26 දින පත් වූ සහ 2018 දෙසැම්බර් 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **එච් ඉසුරු බාලපටබැඳි මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 26 දින පත් වූ සහ 2018 දෙසැම්බර් 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **ඒ වී කේ මාධවී හේරත් මිය** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 26 දින පත් වූ සහ 2018 දෙසැම්බර් 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ) ► **හර්ෂ විජයවර්ධන මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 26 දින පත් වූ සහ 2018 දෙසැම්බර් 20 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ)
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, සිතාමතා සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් රජයේ බැංකු අයත්වන අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනු ලැබේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2) (x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම් වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	අදාළ ඇමතිවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරන නිසා මෙය පැන නොනගී.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය; සහ	අනුකූල වී ඇත. බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පත්කිරීම් හා ඉවත් කිරීම් සිදුකරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි. ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කොළඹ කොටස් හුවමාරුවට දැනුම් දෙනු ලැබේ.
	(ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් තිබීම හෝ නොතිබීම සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	බැංකුවේ කොටස් හිමියා රජය වන අතර අධ්‍යක්ෂධුරයන්හි සිදු කරන වෙනස්වීම් අදාළ අමාත්‍යවරයා හරහා ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලැබේ.
3 (2) (xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය කළමනාකරුවකු පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු නොකරයි.
3 (3)	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගැයීමේ නිර්ණායක**	
3 (3) (i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මෙවැනි අවස්ථාවලදී පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය: 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ.
3 (3) (ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ඒකකයන්/ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර නොදැරිය යුත්තේය.	අනුකූල වී ඇත. සමාගම්/ආයතන 20 කට වඩා අධ්‍යක්ෂධුර හොබවන අධ්‍යක්ෂවරුන් නොමැත.
3 (4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්**	
3 (4) (i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා දීමේ කටයුතු කාලෝචිතව අධීක්ෂණය හා අනුමත කිරීම කරන අතර, බලය බෙදීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ තබමින් බැංකුවේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ඇද්ද යන්න තහවුරු කර ගනී. මෙම ක්‍රියාවලියේදී දැනට පවතින පාලන ආඥා පනතේ සඳහන් වෙන් කිරීම් සලකා බලනු ලැබේ.
3 (4) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5)	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි**	
3 (5) (i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිගේ කාර්යභාරයන් වෙන් කළයුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත්කළ යුතුය. මෙම ජ්‍යේෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෙයින් ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එයද පළ කළ යුතුයි.	අනුකූල වී ඇත. සභාපති සහ මහා කළමනාකරු කවරෙක්ද යන්න මෙම වාර්ෂික වාර්තාවේ අංක 25 සිට 30 දක්වා පිටුවලින් අනාවරණය කර ඇත. 2018 වසරේ සිටි හා නව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත් ප්‍රකාශනවලට අනුව සභාපති, මහා කළමනාකරු සහ අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර සැලකිය යුතු, මූල්‍යමය, ව්‍යාපාරික හෝ පවුල් සම්බන්ධතාවයන් නැත.
3 (5) (iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුකූල වී ඇත.
3 (5) (v)	අනිකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරනු ලබන කාරණා සැලකිල්ලට ගනිමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීමේ වගකීම සභාපතිතුමා සතුවන අතර, සමාගම් ලේකම්ට අදාළ කාර්යය පැවරිය හැකිය.	අනුකූල වී ඇත. සභාපති විසින් බලය පවරාදීම යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන සංදේශය මත හා කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු මත පදනම්ව රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කරයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5) (vi)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැහැනගින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන කරුණු පිළිබඳව දැනුවත්ය යන්න සභාපති විසින් සොයා බලා තහවුරු කරගත යුතුය. මෙම කටයුත්ත තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාපටිපාටි ඇතිකර ඇත: ► අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. ► පැහැදිලි කිරීම් සඳහා කළමනාකරණයේ අදාළ සාමාජිකයා සුදානම්ව සිටී ► බැංකුවේ කාර්යඵලය හා ස්ථායිතාවය ඇගයීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු එකඟ වූ ආකෘතියකට නියමිත කාලවකවානු අනුව අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. ► අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතාවය පරිදි බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත.
3 (5) (vii)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය.	අනුකූල වී ඇත.
3 (5) (viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (ix)	ප්‍රධාන කළමනාකරණ පිරිස් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතුය.	අනුකූල වී ඇත. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, ප්‍රධාන කළමනාකරණ පිරිස් අධීක්ෂණය කිරීමේ කටයුතු වලට සෘජුවම සම්බන්ධ නොවේ.
3 (5) (x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතුය.	අනුකූල වී ඇත. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාරිත්වය අතර සම්බන්ධිත මඟක් ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් ඉටු කිරීම මහා කළමනාකාරතුමාගේ වගකීමයි. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට විශේෂයෙන් අදාළ වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු**	
3 (6) (i)	මෙම විධානයන්ගේ 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත්කර ගත යුතුය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු 4 ක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර, රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. සෑම අනුකමිටුවක් සඳහා පවතින විෂය ක්ෂේත්‍රය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් සියළුම කමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර, කමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. 2018 වසරේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උප කමිටුව නමින් නව උප කමිටුවක් පිහිටවනු ලැබීය. අනුකමිටු වල වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත. විගණන කමිටුව පිටු 89 සිට 92 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිටු 93 සිට 95 දක්වා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පිටු 96 සිට 97 දක්වා නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව පිටු 98 සිට 99 දක්වා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කමිටුව පිටු 100 සිට 101 දක්වා එකම කොටස්කරුවා රජය වන නිසා, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා බැංකුව අදාළ අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රීති අදාළ වේ: (අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා විය යුතුය.	අනුකූල වී ඇත. 2018 වසර තුළදී විගණන කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, ඔහුට අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් පිළිබඳව පිටු අංක 80 හි ඉදිරිපත් කර ඇත. (මේ වන විට නව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අදාළ සුදුසුකම් හා අත්දැකීම් ඇති අධ්‍යක්ෂවරුන් අදාළ උප කමිටු සඳහා අනුයුක්ත කිරීම් සිදු කරයි. හිටපු ජ්‍යේෂ්ඨ බැංකුකරුවකු වන කමිටු සභාපතිතුමා එතෙක් කමිටුවේ වැඩ කටයුතු හොබවයි.)
	(ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය.	අනුකූල වී ඇත. කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: (i) අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම (ii) මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම (iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම (iv) විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම. මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	අනුකූල වී ඇත. විෂය ක්ෂේත්‍රය අනුව, විගණන කමිටුවේ අනිකුත් කරුණුවලට අමතරව පහත නිර්දේශ කර ඇත: ► විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම ► අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය විගණකාධිපති ජෙනරාල් බැංකුවේ බාහිර විගණක වන නිසා, බාහිර විගණකගේ කටයුතු සම්බන්ධයෙන් කමිටුවට ඉටු කළ හැකි භූමිකාවක් නැත.
	(ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	අනුකූල වී ඇත. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන නිසා, ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගත යුතුය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂය මූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය: (i) විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න (ii) බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න; සහ (iii) විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	විගණකාධිපති, බැංකුවේ විගණක නිසා මෙය පැන නොනඟී. බැංකුවේ විගණන නොවන කටයුතු සඳහා යොදා ගන්නා බාහිර විගණක ආයතනය වලට (විගණකාධිපති විසින් ඔහුගේ සහයට පත් කරන ලද) ගෙවන ගාස්තු හේතු කොට ගෙන එම බාහිර විගණකවරයාගේ විගණන සම්බන්ධයෙන් වන ස්වාධීනත්වයට හෝ විෂය මූලිකභාවයට බලපෑමක් නොකරන බවට කමිටුව සහතික කරයි. 2018 වසරේ බැංකුවේ විගණන කටයුතු සඳහා කිසිදු බාහිර විගණක ආයතනයක් පත් කර නැත.
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය: (i) අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක්. (ii) අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. (iii) එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබයි. 2018 වසර සඳහා විගණන සැලැස්ම ඉදිරිපත් කර තිබෙන අතර, එය කමිටුව විසින් සාකච්ඡා කිරීමෙන් පසු එකඟවන ලදී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළයුතු කරුණු වන්නේ (i) ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සඳහා වූ වෙනස්කම්, (iii) විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්, (iv) අඛණ්ඩ පැවැත්මේ උපකල්පනයන්, සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුකූල වී ඇත. මෙය කමිටුව විසින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදු කරන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
	(ඌ) කමිටුව විසින් අතුරු සහ වාර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළයුතුය.	අනුකූල වී ඇත. කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුව සමඟ සංවෘත සාකච්ඡා වලට ඉදිරිපත් වෙයි. 2018 වසර මුලදී සංවෘත සාකච්ඡාවක් පැවැත්විණි.
	(එ) කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය: (i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම. (ii) අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියා මාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	අනුකූල වී ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලබයි. අනුකූල වී ඇත. කමිටුව මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරයි. වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගෙන තිබෙන බවට එහිදී සහතික කරනු ලැබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය හා අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියා පටිපාටිය හා ප්‍රතිඵල විගණන කමිටුව විසින් අගයන ලදී. ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ඇගයුම් ක්‍රියා පටිපාටිය අනුව යමින්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉටු කරන අතර, එය විගණන කමිටුව හමුවේ සභාගත කෙරේ. 2018 වසර අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස් වීම් හේතු කොටගෙන 2018 වසර මෙම ස්වයං ඇගයීමේ යාන්ත්‍රණය නොපැවැත්විණි.
	(iv) අංශ ප්‍රධානී, ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය හමාර කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	අනුකූල වී ඇත.
	(v) ප්‍රධාන අභ්‍යන්තර විගණකද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවටද ඉල්ලා අස්වන ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැඟුනේ නැත.
	(vi) අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	අනුකූල වී ඇත. බැංකුවේ සංවිධාන ව්‍යුහය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර, ඔහු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ස්වාධීනව කටයුතු කරයි.
	(ඔ) කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	අනුකූල වී ඇත. විගණක කමිටුව, අභ්‍යන්තර විමර්ශනයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගි වනු ඇත. සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට, කමිටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වීමට ඉඩ ඇත. කෙසේ වුවත් කමිටුව යටත් පිරිසෙයින් වසරකට දෙවරක් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, අනුකූලතා නිලධාරී හා විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා කමිටු රැස්වීම් වලට සහභාගි විය. මහා කළමනාකාරතුමාද කමිටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවනු ලබති. 2017 වසරේ කළමනාකරණ ලිපිය නිකුත් කිරීමෙන් පසු කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් තොරව බාහිර විගණකවරුන්ගේ සහභාගිත්වයෙන් සංවෘත සාකච්ඡාවක් පවත් වන ලදි. 2018 වර්ෂයට අදාල විගණන සඳහාද සංවෘත සාකච්ඡාවක් විගණනකාධිපතිගේ නියෝජිතයින්ට ලබා දුනි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ක) කමිටුවට පහත කියැවෙන දෑ සතුව තිබිය යුතුය:	අනුකූල වී ඇත.
	(i) විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය	
	(ii) එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්,	
	(iii) තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය,	
	(iv) අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය.	
	(ග) කමිටුව, සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී ඵලදායී නිගමනයන් වාර්තාගත කළ යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළදී දස වතාවක් කමිටුව රැස්වන ලදී. කමිටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී ඵලදායී නිගමනයන් බැංකුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය විසින් නිසි පරිදි වාර්තා කර ඇත.
	(ජ) අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හෙලිදරව්වක් කළ යුතුය:	අනුකූල වී ඇත.
	(i) විගණන කමිටුවේ කටයුතු පිළිබඳ සවිස්තර තොරතුරු,	කමිටුවේ කටයුතු පිටු අංක 89-92 දක්වා විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.
	(ii) වසර තුළ පැවැත්වූ විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව, හා	කමිටුව 2018 වසර තුළ දස වතාවක් රැස්වූ අතර, සහභාගිවීම් විස්තර පිටු අංක 86 හි දක්වා ඇත.
	(iii) එම රැස්වීම් තුළ ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම.	
	(ඣ) කමිටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්ය ප්‍රධානී විය හැක) කමිටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය.	අනුකූල වී ඇත. කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.
	(ඤ) බැංකු කාර්ය මණ්ඩලයට, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හෝ වෙනත් දෑ පිළිබඳ විය හැකි අයථා ක්‍රියාවන් සම්බන්ධ සිය සැලකිලිමත් වීම්, රහස්‍යභාවයෙන් යුතුව මතු කිරීමට පවත්නා විධිවිධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව කමිටුව මෙකී කරුණු මත සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ස්ථාපිත කර ඇති බවට හා උචිත පසු විපරම් කාර්යයන් පිළිබඳව සහතික විය යුතු අතර, බාහිර විගණනකවරුන් හා බැංකුවේ සම්බන්ධතා සුපරීක්සුම සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙසද කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කරුණු ආවරණය කෙරෙන අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලත් 'විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියක්' ස්ථාපිත කර ඇති අතර, සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරන ලදී. විගණන කමිටුව, බාහිර විගණකවරු සමග බැංකුවේ සම්බන්ධතා නිරීක්ෂණයේ ප්‍රධානතම නියෝජිතයා වන අතර බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති සමඟ සම්බන්ධීකරණ කටයුතු කරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (6) (iii)	පහත දැක්වෙන ඊති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් බල පවත්වනු ඇත: (අ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ/ලිපි හා 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥ පනත හා එහි සංශෝධන වලට අනුරූප වන අතර, තවද බැංකුව ඉහත සඳහන් කළ චක්‍රලේඛ මත පදනම් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සම්මත කොට ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිතය.
	(ආ) කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. සියල්ලන්ම විධායක නොවන අධ්‍යක්ෂවරුන් නිසා අධ්‍යක්ෂවරුන් සඳහා ඉලක්ක පනවා නැත. ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක බැංකුවේ ආයතනික සැලැස්ම පදනම් කොට සැකසූ ක්‍රියාකාරී සැලැස්ම තුළ විස්තරාත්මකව වාර්තා ගතකර ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව කණ්ඩායම තුළින් ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරේ. එසේම ඔවුන්ගේ කාර්යසාධනය සමස්ථ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට සමාලෝචනය කෙරේ. මහා කළමනාකරු උදෙසා කාර්යයන් ඇගැයුමක් වාර්ෂිකව කරගෙන යනු ලබයි.
	(ඇ) කමිටුව ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමඟ කලින් කලට ඇගයීමට ලක් කරණු ලබන අතර, පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. 2018 කමිටු රැස්වීමේදී 2017 වසර සඳහා කාර්යසාධන ඇගයීමට ලක් කළේය. නොවැම්බර් සහ දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වූ වෙනස්කම් හේතු කොටගෙන 2018 වසර සඳහා කාර්යසාධන ඇගයීම් නොපැවැත්විනි. එසේ වූවත් මධ්‍ය වාර්ෂික කාර්යසාධන ඇගයීමක් සිදු කළ අතර 2019 - 2021 ආයතනික සැලැස්ම සකස් කරන විට ස්ථාපිත ඉලක්ක ලඟා කර ගැනීමේ ඇගයීමක් සිදු කරන ලදී. සහකාර මහා කළමනාකරුවන්ගේ කාර්යසාධනය ඒ ඒ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් සිදු කරන ලදී.
	(ඈ) ප්‍රධාන විධායක නිලධාරී පිළිබඳ කරුණු සාකච්ඡා වන අවස්ථාවන් හි හැර සෙසු සියළුම කමිටු රැස්වීම් වලදී ප්‍රධාන විධායක නිලධාරීගේ පෙනී සිටීම අවශ්‍යය.	අනුකූල වී ඇත.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධව පහත දැක්වෙන ඊති බලපානු ඇත:	බැංකුව නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපනය කර ඇත. මෙම නිර්දේශයේ දක්වා ඇති වැඩකටයුතු වලට අමතරව අදාළ ආයතනික යහපාලන මූලධර්ම පවත්වාගෙන යාම හා බැඳුණු අනෙකුත් නිශ්චිත වැඩ කටයුතුද කමිටුවේ විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත කර ඇත.
	(අ) කමිටුව, නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් තෝරා පත් කර ගැනීම සඳහා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහතකී අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහා කළමනාකරු පත් කරයි. ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් පත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොදු පටිපාටියක්/ යෝජනා ක්‍රමයක් පවතී.
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයාගේ කාර්යසාධනය හා දායකත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) සලකා බැලිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අදාළ අමාත්‍යවරයා විසින් බැවින් මෙය පැන නොනගී.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් යන තනතුරු සඳහා උසස් කිරීම/තෝරා පත් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා විශේෂිත ගුණාංග බදු නිර්ණායකයන් කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන තුළින් විශේෂිතව දක්වා ඇති පරිදි බැංකුව පිළිගත් පටිපාටිය මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මහා කළමනාකරු පත් කරණු ලබයි. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය කරණු, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උසස් කිරීමේ යෝජනා ක්‍රම තුළ නියම කොට ඇත.
	(ඈ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අංක 3 (3) නියෝගය හි ආඥා පනත්වල දක්වා ඇති නිර්ණායක පරිදි අදාළ තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. තමන්, අංක 3 (3) නියෝගය හා ආඥා පනත් වල දක්වා ඇති නිර්ණායක තුළින් විශේෂිතව පෙන්වා ඇති පරිදි සිය තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කරමින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශ ලබා ගන්නා අතර, එය ශ්‍රී ලංකා මහා බැංකුව වෙත යොමු කෙරේ. තවද ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් එම තනතුරු වලට පත් කරන හෝ උසස් කෙරෙන අවස්ථාවන්හිදී ඔවුන් එකී තනතුර දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කමිටුව තහවුරු කරයි.
	(ඉ) කමිටුව, අතිරේක/නව නිපුණතාවයන් පිළිබඳව අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කරනු ලැබේ.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් උදෙසා අනුප්‍රාප්තික සැලැස්ම ස්ථාපිත කර ඇත. අවශ්‍ය අතිරේක හෝ නව නිපුණතා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු විසින් හෝ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරේ.
	(ඊ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සභාපතිත්වය සහිත විය යුතු අතර, වඩා යෝග්‍ය ලෙස බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.	අනුකූල වී ඇත. කමිටුවේ සභාපතිත්වය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් හොබවනු ලැබූ අතර කමිටු සාමාජිකයන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය. මෙම වාර්ෂික වාර්තාවේ 98 වැනි පිටුවෙහි මේ පිළිබඳ විස්තර අඩංගු වේ.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන රීති බලපවත්වනු ඇත: (අ) කමිටුව, යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් බඳු පුළුල් අවදානම් කාණ්ඩ සුපරීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගෙන් සමන්විත විය යුතුය. කමිටුව, ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සමීපව කටයුතු කළ යුතු අතර, කමිටුවට අනුයුක්ත වගකීම් හා අධිකාරිත්ව රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	අනුකූල වී ඇත. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, මහා කළමනාකරු සහ ණය, වෙළඳපොළ, මෙහෙයුම්, කීර්තිනාම හා උපායමාර්ගික අවදානම් සුපරීක්ෂණය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් සමන්විතය. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරී හා අනුකූලතා නිලධාරී, කමිටුවේ ආරාධනාව මත සෑම කමිටු රැස්වීමකටම සහභාගි වෙති. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සෙසු කාර්ය මණ්ඩලය කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය අවස්ථා වලදී ආරාධනය කරනු ලැබේ. කමිටුව, එහි අධිකාරිත්ව රාමුව හා ඊට අනුයුක්ත වගකීම් තුළ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සමීපව කටයුතු කරයි.
	(ආ) කමිටුව බැංකුවට ඇති සියළුම අවදානම්, උදාහරණ ලෙස ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම්, සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් මාසිකව තක්සේරු කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකුව පදනම්න් හා සමූහ පදනම්න් යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, බැංකුවේ ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, උපායමාර්ගික හා කීර්තිනාම අවදානම් කමිටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති ලේඛණ මත පදනම්ව, මාසික පදනමකින් තක්සේරු කරන අතර, සාරාංශ ගත වාර්තා කමිටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කොට ඇති අතර කමිටුවට වාර්තා ද සපයයි..

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඇ) කමිටුව, විශේෂිත අවදානම් කෙරේ පියවර ගන්නට හා කමිටුව විසින් පැහැදිලිව පනවා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ හිඳිමින් මෙකී අවදානම් කළමනාකරණය කරන්නට, ණය කමිටුව හා වත්කම් හා වගකීම් කමිටු බඳු කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකතාව හා සඵලතාවයන් සමාලෝචනය කළ යුතුය.	මෙම සමාලෝචනය සඳහා අවශ්‍ය දත්ත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් සකස් කර ඇති අතර නව කමිටුව පත් කළ පසු එයට ඉදිරිපත් කිරීමට කටයුතු කරයි. (2019 පෙබරවාරි මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැති බැවින්).
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමක හා සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විචක්ෂණශීලීතාවයන්ට ඔබ්බෙන් වන මට්ටමේ විශේෂිත අවදානම් පවත්නා අවස්ථාවන් හීදී කමිටුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූල වී ඇත. සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල තීව්‍රතාවය මත කමිටුවට සෘජුවම වාර්තා කෙරේ.
	(ඉ) මෙම කමිටුව, යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකාරිත්වයේ සියළු පැතිකඩ තක්සේරු කිරීම සඳහා යටත් පිරිසෙයින් ත්‍රෛමාසිකව හමුවිය යුතුය.	අනුකූල වී ඇත. වසර තුළදී කමිටුව හය වතාවක් රැස්විය. රැස්වීම් තොරතුරු හා සහභාගිත්වය පිටු අංක 86 හි දැක්වේ.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අසමත් වීමට වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව කමිටුව උචිත ක්‍රියා මාර්ග ගත යුතු අතර, කමිටුව විසින් නිර්දේශ කළ පරිදි හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කළ පරිදි, කඩිනම් ප්‍රතිකර්ම සලකාලිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව තුළ විධිමත්, ලේඛන ගත විනය ක්‍රියාමාර්ග පටිපාටියක් ස්ථාපිතව ඇත.
	(උ) කමිටුව, හැම රැස්වීමක් පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	අනුකූල වී ඇත. හැම රැස්වීමකටම පසු එලඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට, විස්තරාත්මක කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමඟ අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශද යොමු කෙරේ.
	(ඌ) කමිටුව, නීති, රෙගුලාසි, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුණු කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූල වී ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවල අදාළ නීති, නියාමන, නියාමන මඟ පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව විශේෂ අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කර ඇත. මෙම කෘත්‍යය සඳහාම කැපවූ අනුකූලතා නිලධාරියකු විසින් එය මෙහෙයවන අතර, ඔහු ත්‍රෛමාසික අනුකූලතා වාර්තා කමිටුවටද මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයටද ඉදිරිපත් කරයි. අභ්‍යන්තර පාලන විධි හා බැංකුවේ සැම ව්‍යාපාරික අංශයක් තුළම අනුමත ප්‍රතිපත්ති හා සමඟ බැංකුවේ අනුකූලතාවයද තක්සේරු කරයි.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7)	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**	
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු සහ විශේෂයෙන් මෙම නිර්දේශයට අනුව සම්බන්ධිත පාර්ශ්ව සේ සැලකෙන පහත දැක්වෙන පුද්ගල කාණ්ඩ හා බැංකුවේ කිසියම් ගනුදෙනුවකින් මතු විය හැකි අරමුණු අතර, ගැටුම් ඇතිවීම වළකාලන්නට අවශ්‍ය පියවර, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගත යුතුය: (අ) බැංකුවේ පරිපාලිත සමාගම් අතරින් කිසිවක්. (ආ) බැංකුවේ ආශ්‍රිත සමාගම් අතරින් කිසිවක්. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් අතරින් කිසිවෙක්. (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් අතරින් කිසිවෙක්. (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධානතම කළමනාකාරීත්ව පුද්ගලයෙකුගේ සාමාජිකයෙකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයෙක්. (ඊ) බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් සහිත කොටස් හිමියෙක්. (උ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ආසන්න පවුලේ සාමාජිකයෙක් හෝ කිසියම් සැලකිය යුතු කොටස් හිමියෙක් සැලකිය යුතු බැඳියාවක් දරන ව්‍යාපාරයක්.	අනුකූල වී ඇත. සම්බන්ධිත පාර්ශ්ව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අරමුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර අරමුණු සඳහා ගැටුම් ඇතිවීම වළකාලීමය. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහිත අධ්‍යක්ෂවරුන්ගෙන් සිය ගනුදෙනු හෙළිදරව් කරන ලෙස පුද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ. එම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා අධීක්ෂණය කෙරේ.
3 (7) (ii)	මෙම නියෝගය මඟින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු වර්ග තුළ පහත දැක්වෙන දෑ ඇතුළත්විය යුතුය: (අ) උපරිම ණය පහසුකම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝග තුළ නිර්වචනය කර ඇති කිසියම් ආකාරයක ණය පහසුකමක් පිරිනැමීම. (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය. (ඈ) බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබදු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරීත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු හුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැගීම හා පවත්වා ගෙන යාම.	අනුකූල වී ඇත. මේ පිළිබඳ තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ 351 පිටුවේ 59 සටහන යටතේ හෙළිදරව් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (iii)	බැංකුව ඉහත සඳහන් විධාන අංක 3 (7) (i) තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව හා සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් විඛදු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කළ යුතුය. මේ සම්බන්ධයන් වැඩි වාසිදායක සැලකීම යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනය විචක්ෂණශීලි ප්‍රතිශතයකින් ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශ්වයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, (i) 2007 අංක 7 දරණ බැංකු ආඥා පනත අනුව පහසුකම් යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ පහසුකමයි. (ii) සමස්ත ශුද්ධ ණය පහසුකම සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. (ආ) අසම්බන්ධිත සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම. (ඇ) අසම්බන්ධිත පාර්ශ්ව හා සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු කරගෙන යාමේදී පිරිනමන කොන්දේසි ඉක්මවන, වාසිදායක කොන්දේසි, වෙළඳ අලාභ ආවරණය හෝ ගාස්තු/කොමිස් කපා හැරීම වැනි පක්ෂපාති සැලකිල්ල දැක්වීම. (ඈ) ඇගයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශ්වයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම. (ඉ) නිත්‍යානුකූල වැඩකටයුතු හා කාර්යාවලි සාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	අනුකූල වී ඇත. බැංකුව, අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව ඉදිරිපත් කරනු ලබන අනුකූලතා වාර්තාවෙහි අනුකූලතා තත්ත්වය සඳහන් කර ඇත. අනුකූල නොවූ අවස්ථා වලදී එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරනු ලැබේ.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (iv)	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් අතරින් තුනෙන් දෙකක්, එබඳු ණය පහසුකමක් පිරිනැමීම සඳහා කැමැත්තෙන් ඡන්දය පාවිච්චි කොට එකී පහසුකම අනුමත කළ අවස්ථාවේ හැර, බැංකුව කිසිඳු අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතියෙකුට කිසිදු ණය පහසුකමක් පිරි නොනැමිය යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් සුරැකුම්ගත කළ යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (v)	(අ) බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරන කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමනු ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂකවරයකු ලෙස පත්කර ඇත්නම්, බැංකුව විසින් එම පුද්ගලයා අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කළ දිනයේ සිට වසරක් ඇතුලත, මුදල් මණ්ඩලය විසින් මෙබදු කරුණක් සඳහා වරින් වර අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය සුරැකුම් ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනිය යුතුය. (ආ) ඉහත කී 3(7)(v) (අ) විධානය මඟින් සලසා ඇති පරිදි එකී කාලසීමාව තුළ එබඳු සුරැකුමක් සම්පාදනය නොකළ අවස්ථාවකදී බැංකුව එකී පහසුකම සම්බන්ධයෙන් ගෙවීමට නියමිත මුදල පොළිය සමඟ, ණය මුදල පිරිනමන අවස්ථාවේදී නියාමනය කළ කාල සීමාව ඇතුළත හෝ එකී අධ්‍යක්ෂවරයෙකු ලෙසින් පත් කළ දිනයේ සිට මාස දහඅටක් ඉකුත්වූ පසු යන මේ දෙකින් මුලින් එලෙඹෙන දිනයේදී ආපසු අය කරගත යුතුය. (ඇ) මෙකී උප නියෝග අනුව කටයුතු කරන්නට අපොහොසත් වන කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේ නම් ඔහු එකී අධ්‍යක්ෂ ධුරය හැර ගියා සේ සැලකෙන අතර, බැංකුව ඒ බව පොදු මහ ජනතාව වෙත හෙළිදරව් කළ යුතුය. (ඈ) කෙසේ වුවද, පහසුකම පිරිනමන අවස්ථාවේදී එකී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයකුව සිටීමින් හා එකී පහසුකම බැංකුවේ සියළුම සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ලබා දුන් අවස්ථාවකදී මෙම උප විධානය අදාළ නොවිය යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (vi)	බැංකුවක්, බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් මත වන පදනමින් හෝ ඉහත 3(7)(v) විධානය ප්‍රකාර පහසුකම් පිරිනැමීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි සුරැකුමකින් සුරැකුම්ගත කළ අවස්ථාවකදී හැර කිසියම් සේවකයෙකුට හෝ සේවකයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ එකී සේවකයා හෝ ආසන්න පවුලේ සාමාජිකයකු සැලකිය යුතු බැඳියාවක් දරන කිසියම් ව්‍යාපාරයකට හෝ ගාස්තු හෝ කොමිස් කපා හැරීම හා බැඳුණු කිසිඳු පහසුකමක් හෝ වඩා වාසිදායක සැලකීමක් පිරි නොනැමිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව සියළුම සේවකයන්ට අදාළ වන සාමාන්‍ය සේවක ණය යෝජනා ක්‍රම යටතේ හැර බැංකුවේ කිසිම සේවකයෙකුට වඩා වාසිදායක සැලකීමත්/ණය පහසුකම් සපයා නැත. මේ පිළිබඳව චක්‍රලේඛන උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයන්ගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට කිසිදු වාසිදායක සැලකීමක්/පහසුකමක් සපයන්නේද නැත.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (vii)	බැංකුවක් විසින් ඉහත 3(7)(v), 3(7)(vi) විධාන මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොළියක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව ප්‍රේෂණය නොකළ යුතු අතර, කිසියම් ප්‍රේෂණයක් සිදු කරයි නම් එය වලංගු රහිත හා බලනොපාන එකක් විය යුතුය.	අනුකූල වී ඇත. 2018 වසර තුළ මෙබඳු තත්ත්වයක් උද්ගත නොවීය.
3 (8)	**හෙළිදරව් කිරීම**	
3 (8) (i)	(අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දෑ තහවුරු කල යුතුය. වාර්ෂිකව විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛයිමාසික මූල්‍ය ප්‍රකාශ, සුපරීක්ෂණය හා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතිය හා බල පවත්වනා ගිණුම්කරණ ප්‍රමිති හා සමඟ අනුරූපව සකස් කොට ප්‍රකාශයට පත් කර ඇති බවටද, (ආ) එකී ප්‍රකාශයන් හි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් වල ප්‍රසිද්ධ කරන බවටද	අනුකූල වී ඇත.
3 (8) (ii)	පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය: (අ) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ද ඇතුළත්ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවය අනුව යමින් සකස් කොට ඇති බවට ප්‍රකාශයක්.	අනුකූල වී ඇත. වාර්තා පිටු අංක 179 සිට 184 දක්වා බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව යටතේද, පිටු අංක 191 හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් යටතේද හෙළිදරව් කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවටද, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූල වී ඇත. වාර්ෂික වාර්තාවේ පිටු අංක 188 සිට 189 දක්වා මූල්‍ය වාර්තාකරණයේ ‘අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය’ හා පිටු අංක 191 හි ‘මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම’ තුළ හෙළිදරව් කර ඇත.
	(ඇ) ශ්‍රී ලංකා සහතික කිරීමේ කාර්යභාර ප්‍රමිති 3050 යටතේ අභ්‍යන්තර පාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා යටතේ විගණනකරුවන් විසින් නිකුත් කළ සහතික වාර්තා.	අනුකූල වී ඇත. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර, එය මෙම වාර්තාවේ පිටු අංක 190 යටතේ දැක්වේ.
	(ඈ) නාමයන්, යෝග්‍යතාවය, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 24 සිට 27 දක්වා ඇත. ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිටු අංක 185 හා 187 හී දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 236 හි 16 වන සටහන යටතේ දක්වා ඇත.

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) 3, (7) (iii) හි නිර්වචනය කර ඇති පරිදි ඒ ඒ සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩයන්ට ලබා දුන් සමස්ත ශුද්ධ ණය පහසුකම. ඒ ඒ සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩයන්ට ලබා දුන් ශුද්ධ පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙසද හෙළිදරව් කළ යුතුය.	අනුකූල වී ඇත. 2018 වර්ෂය තුළ ඒ ඒ සම්බන්ධිත පාර්ශ්ව කණ්ඩායම් වලට ලබා දුන් ශුද්ධ සමස්ත ණය පහසුකම්, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ:

	රු'000	%
ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්	79,660	0.05
පරිපාලිතයන්	1,928,106	1.25
ආශ්‍රිත සමාගම්	185,012	0.12
රජය හා රජයට සම්බන්ධිත ආයතන (මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 59.4 හි සඳහන් නිර්වචනය බලන්න.)	1,265,475,303	822.75

	(ඊ) බැංකුව ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී වශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	අනුකූල වී ඇත. 2018 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:

	රු'000
කෙටි කාලීන සේවය ප්‍රතිලාභ	429,123
පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ	111,315

මෙයට අමතරව බැංකුව එහි අනුමත ප්‍රතිලාභ සැලසුම යටතේ, ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට වාහන පරිහරණය වැනි මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.

	රු'000
ණය	450,368
බැංකු අයිරා	17,699
ණය කාඩ්පත්	11,049
තැන්පතු	506,964
ණයකර	2,502
භාවිතා නොකළ පහසුකම්	70,587

	(උ) 'ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිච ප්‍රකාශය 4750' යටතේ නිකුත් කළ විගණකවරුන්ගේ 'සත්‍ය සොයා ගැනීම් වාර්තාවන්' හි සියළුම සොයා ගැනීම්, වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළට අන්තර්ගත කර ඇති බවට අධ්‍යක්ෂවරුන් විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ දක්වන සහතිකයක් සහ විගණකවරුන් විසින් ඒ පිළිබඳව බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඒ බව තහවුරු කර ඇත්නම්,	අනුකූල වී ඇත. බැංකුව 2007 අංක 11 දරණ ආයතනික යහපාලන විධානය පිළිබඳව විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාව තුළ අන්තර්ගත කර ඇති බවට ද, කිසියම් නිර්දේශයක් වේ නම් ඒ පිළිබඳව 2019 තුළ කටයුතු කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.
	(ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්	අනුකූල වී ඇත. පිටු අංක 191 දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති හා අභ්‍යන්තර පාලන විධි පිළිබඳ අනුකූලතාවය විස්තරාත්මකව පැහැදිලි කරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2018 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඒ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ ප්‍රමාදදෝෂ හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙකී විධානයන් හා අනුකූල නොවීම් පිළිබඳ නියාමන හා සුපරීක්ෂණ සැලකිලිමත් වීම පිළිබඳ ප්‍රකාශයක් හා එවැන්නක් පොදු මහ ජනතාවට හෙලිදරව් කළ යුතු යැයි මුදල් මණ්ඩලය විසින් නියෝග කළ අවස්ථාවක, එකී සැලකිලිමත් වීම් පිළිබඳව බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධති හෝ මෙම විධාන සමඟ අනුකූල නොවීම් තුළ සුපරීක්ෂණ සැලකිලිමත් වීම් මතු කළ ප්‍රමාද දෝෂ නොවූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂට පෙන්වාදීම් සඳහා තුඩුදුන්නේ නැත. එබැවින් එබඳු දෑ හෙලිදරව් කරන ලෙස මුදල් මණ්ඩලයට, නියෝග පැනවීමට සිදුවූයේ නැත. මෙබඳු ප්‍රමාද දෝෂ හෝ අනුකූලතා සිදු නොවූ හෙයින් මුදල් මණ්ඩලය එබඳු කිසිදු විධානයක් නොකළ බැවින් ද ගන්නා ලද ක්‍රියාමාර්ග පැන නොනගින අතර, මෙහිලා හෙලිදරව් කළ යුතු කිසිවක් නැත.
3 (9) (i)	තාවකාලික හා වෙනත් පොදු ප්‍රතිපාදන මෙම විධානය හා අනුකූලත්වය 2008 ජනවාරි 01 දා සිට ඉදිරියට ආරම්භ කෙරෙන අතර, මෙම විධානය තුළ සපයා ඇති අනුකූලතා දිනයන් විශේෂයෙන් සම්පාදනය කර ඇති විටෙක හැර සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු 2009 ජනවාරි 01 දා හෝ ඊට ප්‍රථම මෙම විධානයේ විධිවිධානයට පූර්ණ ලෙසින් අනුකූල විය යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (ii)	ශ්‍රී ලංකාව තුළ විශේෂිත ව්‍යවස්ථාපිත පනත් මඟින් සංස්ථාපනය කරන ලද බැංකු සම්බන්ධයෙන් එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන සමග පටහැනි නොවන මෙම විධානයේ සියළුම ප්‍රතිපාදන හා අනුකූල වන්නට පියවර ගත යුතු අතර එකී පනත් තුළින් විශේෂිතව දක්වා ඇත ප්‍රතිපාදන අනුව යමින් දිගටම කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුව 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන මඟින් පැන නැඟෙන ප්‍රතිපාදන හා පටහැනි නොවන ලෙස මෙම විධානයේ අදාළ හැම ප්‍රතිපාදනයක්ම හා අනුකූල වන්නට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, එහි පැනවුම බලාත්මක කර ඇත. කිසියම් අනුකූල අවස්ථා හා එකඟ නොවන අවස්ථාවන්හි බැංකුව ඊට අදාළ ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන අනුව යමින් කටයුතු කරගෙන යන අවස්ථාවන්හිදී, ඒ බැව් ඉහත අදාළ පරිච්ඡේදයන්හි විශේෂිතව සඳහන් කර ඇත.
3 (9) (iii)	මෙම විධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ බැංකු ශාඛාවකට අදාළ විය යුත්තේ, එය එකී බැංකුවේ සංස්ථාපිත රට තුළ බලාත්මක නීති හා රෙගුලාසි සමග පටහැනි නොවන වපසරිය තුළය, විදේශීය බැංකු ශාඛාව, එහි වාර්ෂික වාර්තාව හා ගිණුම් හා ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් හා බැඳුණු ගිණුම් සමග මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.
3 (9) (iv)	මෙම විධානයේ ප්‍රතිපාදන සහ කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් මතු වූ කිසියම් අවස්ථාවක මෙම විධානයේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත. කෙසේ වුවත්, එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන, මෙම විධානයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට වඩා දැඩි වේ නම් සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ හැකිය.	අදාළ නොවේ.
3 (9) (v)	යම් හෙයකින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ බැංකු පනතේ විධි විධාන සලසා ඇති පරිදි විධාන අංක 3 (2) (ii) (ආ), 3 (3) (i) (අ) හා 3 (3) (ii) (අ) හා යොමුවෙන මුදා හැරීම් ලබා නොගත යුතු යැයි මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, එකී පදනම මුදල් මණ්ඩලය විසින් එම තැනැත්තාට දැනුම් දිය හැකි අතර, විභාග යකට පසු මුදල් මණ්ඩලයට මුදා හැරීමේ කාලසීමාව සීමා කළ හැකිය.	අදාළ නොවේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුණු ලැයිස්තුගත රීති හා අනුකූලවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4 අ (i)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තු නිමවී දින 45 ක් තුළ දී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තුව අවසන් වූ දින සිට මාස දෙකක් තුළද ඉදිරිපත් කළ යුතුය.	2018 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2018 මැයි 10
		2018 ජුනි 30 න් අවසන් දෙවන කාර්තුව	2018 අගෝස්තු 15
		2018 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2018 නොවැම්බර් 15
		2018 දෙසැම්බර් 31 න් අවසන් සිව්වන කාර්තුව	2019 පෙබරවාරි 28

රීති අංකය	අවශ්‍යතාවය	අනුකූලතාවය
7.4 ආ (i)	ශ්‍රී.ල.ගි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී.
7.4 ආ (ii)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී.
7.4 ආ (iii)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී.
7.4 ආ (iv)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී.
7.5 අ	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කළ යුතුය	2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින ඉදිරිපත් කර ඇත. 2018 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරිශීලනය/අර්ථ කථනය	පිටු අංකය
7.6 (i)	අදාළ මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	182
7.6 (ii)	අදාළ මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	179 206
7.6 (iii)	ජන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් විසිදෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාළ හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	465, 468
7.6 (iv)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ.	
7.6 (v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අදාළ නොවේ.	
7.6 (vi)	ආයතනය මුහුණ දියහැකි යැයි හඳුනාගත් ප්‍රමාණාත්මක අවදානම් සාධකයන් පිළිබඳ කරුණු	අවදානම් කළමණාකරණ වාර්තාව	102 - 118
7.6 (vii)	ආයතනයෙහි සේවක සහ ක්ෂේත්‍ර සබඳතාවයන්ට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සලකා බලනු ලබන වර්ෂය තුළ දී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැඟිණි.	
7.6 (viii)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජිත දේපලවල ප්‍රමාණ, පිහිටීම්, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 32 සහ 33	295 - 312
7.6 (ix)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 49.1	338
7.6 (x)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරැකුම් හිමිකරුවන් ගණන සහ එම හිමිකාරිත්වය සහ එම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	අතිරේක තොරතුරු	465

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරිශීලනය/අර්ථ කථනය	පිටු අංකය
7.6 (xi)	අනුපාතයන් සහ වෙළඳපොළ මිල පිළිබඳ තොරතුරු		
	1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 19 සහ 49.2 අතිරේක තොරතුරු	240, 338 464
	2. ලැයිස්තුගත ණයකර වලට අදාළ වෙළඳපොළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 48 අතිරේක තොරතුරු	335 - 337 465
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	ලංකා බැංකු දළ විශ්ලේෂණය	20 - 21
7.6 (xii)	ආයතනයේ සහ එහි පරිපාලිතයන්ගේ ස්ථාවර වත්කම්වල සහ ඉඩම්වල වෙළඳපොළ වටිනාකම, පොත් අගයත් අතර සැලකිය යුතු වෙනස්වීම්	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 33	297 - 312
7.6 (xiii)	ආයතනය වර්ෂය තුළදී ප්‍රසිද්ධ නිකුතුවකින්, හිමිකම් නිකුතුවකින් හෝ පුද්ගලික නිකුතුවකින් අරමුදල් සම්පාදනය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 43, 48 සහ 49	320 335, 338
7.6 (xiv)	සේවකයින් සතු කොටස් හිමිකාරිත්වය හෝ කොටස් යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු	අදාළ නොවේ	
7.6 (xv)	7 වන කොටසෙහි 7.10.3, 7.10.5 (සී), 7.10.6 (සී) යන රීතීන් වලට අදාළව ආයතනික යහපාලනය පිළිබඳ අනාවරණයන්	ආයතනික යහපාලනය සම්බන්ධයෙන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධාන වලට අනුකූලව බැංකුව කටයුතු කරන බැවින් ලැයිස්තුගත කිරීමේ 7.10 විධානය යටතේ නිදහස් කර ඇත.	
7.6 (xvi)	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති ස්කන්ධයෙන් 10% හෝ මුළු වත්කම්වලින් 5% යන දෙකෙන් අඩු අගය ඉක්මවන සම්බන්ධිත පාර්ශ්වයන් හා සිදුකළ ගනුදෙනු	අතිරේක තොරතුරු	468

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

චක්‍ර ලේඛ අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේද	සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල පලකළ දිනය
02/04/003/0401/001 2005 සැප්තැම්බර් 30	සෑම කාර්තුවකම අවසාන දිනෙන් මාස දෙකක් ඇතුළත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පතක අවම වශයෙන් එක් වරක්වත් පළකළ යුතුය.	2018 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව 2018 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව 2018 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2018 මැයි 25 2018 අගෝස්තු 30 2018 නොවැම්බර් 30
02/04/003/0401/001 2006 පෙබරවාරි 21	මූල්‍ය වර්ෂය අවසාන වී මාස 3 ක් ඇතුළත බැංකුව විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කළ හොත්, 4 වෙනි කාර්තුව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පල කිරීම සම්බන්ධයෙන් 2005 සැප්තැම්බර් 30 දිනැති චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම අනිවාර්ය නොවේ.	2018 දෙසැම්බර් 31 න් අවසන් සිවි වන කාර්තුව (විගණනය කරන ලද)	2019 මාර්තු 30

බලපත්‍රලාභී වාණිජ බැංකු වල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ අනෙකුත් හෙළිදරව් කිරීම් වලට අනුකූල වීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

1.	**මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය සඳහා මූල්‍ය උපකරණ වල වැදගත්කම පිළිබඳ තොරතුරු**	
1.1	**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**	
1.1.1	මූල්‍ය වත්කම් හා වගකීම් වර්ග හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 20
1.1.2	අනෙකුත් හෙලිදරව් කිරීම්	
	(i) ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශේෂ හෙළිදරව් කිරීම්. ණය අවදානම හා වෙළඳපොළ අවදානම, මෙම අවදානම් සඳහා ආරෝපිත සාධාරණ අගයෙහි වෙනස්වීම් සහ ඇගයීම් ක්‍රම යනාදිය ද මෙයට ඇතුළත් වේ.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.1.1, 26 සහ 63
	(ii) මූල්‍ය උපකරණ එකින් එකට නැවත වර්ගීකරණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61.4
	(iii) සුරැකුම් ලෙස ඔඩපණය කළ මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු සහ සුරැකුම් වශයෙන් තබා ඇති මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 56
	(iv) මූල්‍ය වත්කම් වර්ග වල ණය අලාභය සඳහා ප්‍රතිපාදන ගිණුම සංසන්දන	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 27.1 සහ 27.2.2
	(v) බහුවිධ ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත සංයුක්ත මූල්‍ය උපකරණ පිළිබඳ තොරතුරු	නැත
	(vi) ණය ගිවිසුම් කඩකිරීම් පිළිබඳ කොන්දේසි	නැත
1.2	**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**	
1.2.1	ආදායම්, වියදම්, ලාභ හා පාඩු අයිතම අනාවරණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 7-17
1.2.2	අනෙකුත් හෙළිදරව් කිරීම්	
	(i) ලාභ හා පාඩු මඟින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය උපකරණ මත වන මුළු පොළී ආදායම සහ පොළී වියදම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8
	(ii) ගාස්තු ආදායම් සහ වියදම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 9
	(iii) මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව හානිකරණ අලාභ වටිනාකම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 14
	(iv) හානිකරණය වූ මූල්‍ය වත්කම් මත පොළී ආදායම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 8.1
1.3	**අනෙකුත් හෙළිදරව් කිරීම්**	
1.3.1	මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.1.1, 21-29, 38-43 සහ 48
1.3.2	ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම් පිළිබඳ තොරතුරු	නැත
1.3.3	වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන	
	(i) වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල තොරතුරු සහ එලෙස හඳුනා ගැනීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 29
	(ii) ශේෂ පත්‍ර දිනට එක් එක් ආයෝජන වල සාධාරණ අගය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 29.2 සහ 29.3
	(iii) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 29

	(iv) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61
	(v) වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ හඳුනා නොගත් සහ ශේෂ පත්‍ර දිනට දරා සිටින ආයෝජන සඳහා කාලපරිච්ඡේදය තුළ හඳුනා ගත් ලාභාංශ	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 13
	(vi) කාලපරිච්ඡේදය තුළ ස්කන්ධයේ සිදු වූ සමුච්චිත ලාභ හෝ පාඩු මාරු කිරීම් සහ එලෙස මාරු කිරීමට හේතු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 12
	(vii) වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ස්කන්ධ උපකරණ වල ආයෝජන වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ නැවත හඳුනා ගත්තේ නම්, - ආයෝජන ඉවත් කිරීමට හේතු - නැවත හඳුනා ගැනීමේ දිනට ආයෝජන වල සාධාරණ අගය - ඉවත් කිරීමෙන් ලද සමුච්චිත ලාභ හෝ අලාභ	නැත
1.3.4	මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම	
	(i) වාර්තා කරන කාලපරිච්ඡේදය හෝ පෙර කාලපරිච්ඡේදය තුළ සියළුම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම් සඳහා - නැවත වර්ගීකරණය කිරීමේ දිනය - ව්‍යාපාර ආකෘතියේ වෙනස්කම් පිලිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම් සහ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි එහි බලපෑම දැක්වෙන ගුණාත්මක විස්තරයක් - එක් එක් කාණ්ඩයේ නැවත වර්ගීකරණය කිරීමේ වටිනාකම	නැත
	(ii) ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ක්‍රමක්ෂය පිරිවැය නැවත වර්ගීකරණය කිරීම් සඳහා - නැවත වර්ගීකරණය සිදු කරන දිනට තීරණය කළ සඵල පොළී අනුපාතය - හඳුනා ගත් පොළී ආදායම	නැත
	(iii) වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයේ සිට ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ අගයේ සිට වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගයට අගය කරන ලද ක්‍රමක්ෂය පිරිවැයට නැවත වර්ගීකරණය කිරීම් සඳහා - ශේෂ පත්‍ර දිනට මූල්‍ය වත්කම් වල සාධාරණ අගය - මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කර නොමැති නම් වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හෝ වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගත් සාධාරණ අගයේ ලාභ හෝ අලාභ	නැත
1.3.5	හෙජින් ගිණුම් පිළිබඳ තොරතුරු	නැත
1.3.6	සාධාරණ අගයට නම් කළ සියළුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන් පිළිබඳ තොරතුරු පහත කරුණු සමඟ:	
	(i) සැසඳිය හැකි ධාරණ අගයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61
	(ii) සාධාරණ අගය තීරණය කළ ආකාරය පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61
	(iii) සාධාරණ අගය තීරණය කිරීමට භාවිතා කළ යෙදවුම් වල මට්ටම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61
	(iv) අ. සාධාරණ අගය මැනීමේ ධුරාවලි මට්ටම් සංචලනයේ සැසඳුම් ආ. තෙවන මට්ටමේ යෙදවුම් යොදාගෙන සාධාරණ අගයට අගය කළ මූල්‍ය උපකරණ සඳහා වන අමතර හෙළිදරව් කිරීම්	නැත මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 61.1.3
	(v) විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි සාධාරණ අගය පිළිබඳ තොරතුරු	නැත
2.	**මූල්‍ය උපකරණ වල ස්වභාවය හා ඉන් පැන නගින අවදානම් වල ප්‍රමාණය පිළිබඳ තොරතුරු**	
2.1	ගුණාත්මක හෙළිදරව් කිරීම්	
2.1.1	සියළුම වර්ග වල මූල්‍ය උපකරණයන්හි අවදානම් අනාවරණයන්	අවදානම් කළමනාකරණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 63
2.1.2	කළමනාකරණ අරමුණු ප්‍රතිපත්ති සහ ඒම අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලි	අවදානම් කළමනාකරණ වාර්තාව
2.1.3	කලින් වර්ෂ වල වෙනස් වීම්	අවදානම් කළමනාකරණ වාර්තාව
2.2	ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්	
2.2.1	ශේෂ පත්‍ර දිනට එක් එක් අවදානම් පිළිබඳ අනාවරණයන්ගේ ප්‍රමාණාත්මක දත්ත සාරාංශය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
2.2.2	ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, වෙළඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම, පොළී අනුපාත අවදානම පිළිබඳ හෙලිදරව් කිරීම් හා මෙම අවදානම් කළමනාකරණය කරන ආකාරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63
	(i) ණය අවදානම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2
	(අ) අනාවරණය කරන ඉහළම ප්‍රමාණය (සුරැකුම් වල වටිනාකම අඩු කිරීමට පෙර), සුරැකුම් පිළිබඳ විස්තරයක්, හිඟ හෝ හානිකරණය නොවූ මූල්‍ය වත්කම් වල ණය ගුණත්වය පිළිබඳ තොරතුරු සහ මූල්‍ය වත්කම් වල ණය ගුණත්වය පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2.1

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතාවයන්

(ආ) හිඟ හෝ හානිකරණය වූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් එම වත්කම් වල කාලපරිච්ඡේදය, හානිකරණය වූ ලෙස තීරණය කිරීමට සලකා බලන ලද කරුණු, සියළුම වර්ගයේ මූල්‍ය වත්කම් වල සුරැකුම් පිළිබඳ විස්තරයක්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2.1
(ඇ) ලබාගත් හෝ ඇමතූ සුරැකුම් හෝ වෙනත් ණය වැඩි කිරීම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2.1
(ඈ) ණය අවදානම කළමනාකරණ පරිචයන් - ණය අවදානම කළමනාකරණ පරිචයන් සහ අපේක්ෂිත ණය අලාභ මැනීමට භාවිතා කළ ක්‍රම, උපකල්පන, සහ තොරතුරු ඇතුළත්ව ඒවා අපේක්ෂිත ණය අලාභ මැනීමට සහ හඳුනා ගැනීමට අදාළ වන ආකාරය - අපේක්ෂිත ණය අලාභ මඟින් පැන නඟින මූල්‍ය ප්‍රකාශන වටිනාකම් වල වෙනස්කම් සහ වෙනස්කම් වලට බලපෑ හේතු ඇගයීමට ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු - මූල්‍ය උපකරණ වල ණය අවදානම මූලික හඳුනා ගැනීමෙන් පසු සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති ද යන්න බැංකුව තීරණය කරන ආකාරය - විවිධ මූල්‍ය උපකරණ සඳහා බැංකුවේ නිර්වචන සහ එම නිර්වචන තෝරා ගැනීමට හේතු - අපේක්ෂිත ණය අලාභ සාමූහික පදනමක් මත අගය කරන්නේ නම් උපකරණ කාණ්ඩගත කරන ආකාරය - මූල්‍ය වත්කම් ණය හානිකරණය වන්නේද යන්න බැංකුව තීරණය කරන ආකාරය - නැවත අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති බවට ඇති දර්ශකද ඇතුළත්ව බැංකුවේ කපා හැරීමේ ප්‍රතිපත්තිය - සංශෝධන අවශ්‍යතා යොදාගෙන ඇති ආකාරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 27 සහ 63
(ඉ) අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් - අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීමේදී භාවිතා කළ යෙදවුම් වල පදනම, උපකල්පන, සහ ඇස්තමේන්තු කිරීමේ ශිල්පක්‍රම - අපේක්ෂිත ණය අලාභ තීරණය කිරීමේදී සාර්ව ආර්ථික තොරතුරුද ඇතුළත්ව අනාගතයට අදාල තොරතුරු යොදා ගෙන ඇති ආකාරය - ඇස්තමේන්තු කිරීමේ ශිල්පක්‍රම වල සිදු වූ වෙනස්කම් හෝ වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ සිදු කළ සැලකිය යුතු උපකල්පන	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 27
(ඊ) අපේක්ෂිත ණය අලාභ වලින් පැන නඟින වටිනාකම් - එක් එක් මූල්‍ය උපකරණ වල ආරම්භක ශේෂය සහ හානිකරන අලාභ දීමනා වල අවසාන ශේෂය සැසඳීම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 21, 23, 27 සහ 28
(උ) සුරැකුම් - ශේෂපත්‍ර දිනට බැංකුවේ ණය අවදානම සඳහා උපරිම නිරාවරණය - ඇප සුරැකුම් වල විස්තර සහ වෙනත් ණය ප්‍රඵුල් කිරීම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2.1
(ඌ) වත්කම් කපා හැරීම් - වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ කපා හළ මූල්‍ය වත්කම් වල හිඟ හිටි වටිනාකම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 27
(එ) 2016 අංක 01 දරණ බැංකු පනතේ බලපත්‍රලාභී බැංකු සඳහා වූ බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා මත ස්තම්භ III යටතේ හෙළිදරව් කිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
(ii) ද්‍රවශීලතා අවදානම	
(අ) මූල්‍ය වගකීම් පිළිබඳ පරිණති විශ්ලේෂණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 58
(ආ) අවදානම් කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ විස්තරය	අවදානම් කළමනාකරණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.3
(ඇ) 2016 අංක 01 දරණ බැංකු පනතේ බලපත්‍රලාභී බැංකු සඳහා වූ බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා මත ස්තම්භ III යටතේ හෙළිදරව් කිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
(iii) වෙළඳපොළ අවදානම	
(අ) ආයතනය නිරාවරණය වන සියළුම වර්ගයේ වෙළඳපොළ අවදානම් වල සංවේදීතා විශ්ලේෂණය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
(ආ) අමතර තොරතුරු, ආයතනයේ අවදානම් නිරාවරණය සංවේදීතා විශ්ලේෂණයෙන් නිරූපනය නොවේ නම්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4
(ඇ) 2016 අංක 01 දරණ බැංකු පනතේ බලපත්‍රලාභී බැංකු සඳහා වූ බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා මත ස්තම්භ III යටතේ හෙළිදරව් කිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
(iv) මෙහෙයුම් අවදානම	
2016 අංක 01 දරණ බැංකු පනතේ බලපත්‍රලාභී බැංකු සඳහා වූ බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා මත ස්තම්භ III යටතේ හෙළිදරව් කිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

	(v) බැංකුව මුහුණ දෙන ස්කන්ධ අවදානම	
	(අ) ගුණාත්මක හෙළිදරව් කිරීම්	
	- ප්‍රාග්ධන ලාභ බලාපොරොත්තු වන සමාගම් හා සබඳතා හා උපායමාර්ගික හේතු ඇතුළුව වෙනත් අරමුණු වෙනුවෙන් අත්කරගත් සමාගම් යන දෙකෙහි කොටස් හිමිකම වෙන්කොට දැක්වීම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 සහ 29
	- බැංකුව සතු ස්කන්ධ හිමිකම් පිළිබඳව තක්සේරු කිරීම සහ ගිණුම් තැබීම ආවරණය කරන වැදගත් ප්‍රතිපත්ති පිළිබඳ විස්තරය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 සහ 29
	(ආ) ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්	
	- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වූ ආයෝජන පිළිබඳ වටිනාකම හෙළිකිරීම සහ එම ආයෝජන වල සාධාරණ අගය මිල ප්‍රකාශිත සුරුකුම් සඳහා කොටස් මිල සාධාරණ අගයෙන් බොහෝ සෙයින් වෙනස් වන අවස්ථා වලදී පොදු මිල ප්‍රකාශිත කොටස් අගය පිළිබඳ සංසන්දනයක් සිදු කෙරේ.	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26.2, 29.2 සහ 29.3
	- ආයෝජන වල වර්ග සහ ස්වභාවය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 සහ 29
	- වාර්තාකරණ කාල සීමාව තුළ දී විකිණීමෙන් සහ ඈවර කිරීමෙන් ඇතිවන සමුච්චිත ලාභ/(අලාභ)	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 12
	(vi) බැංකුව මුහුණදෙන පොළී අනුපාත අවදානම	
	(අ) ගුණාත්මක හෙලිදරව් කිරීම්	
	- බැංකුව මුහුණදෙන පොළී අනුපාත අවදානමේ (IRRBB) ස්වභාවය සහ මූලික උපකල්පනයන්	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4.2
	(ආ) ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්	
	- (IRRBB) මැනීම සඳහා කළමනාකාරිත්වය භාවිතා කරනු ලබන ක්‍රමයට අනුව අනුපාත වල උච්ඡාවචන කම්පන තුළින් ඉපැයුම් වල හෝ ආර්ථික අගය (හෝ කළමනාකාරිත්වය විසින් භාවිතා කරනු ලබන සුදුසු ක්‍රමයක්) අඩු වැඩි වීම	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.4.1
2.2.3	අවදානම් සංයුතිය පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 63.2.3
3.	**අනෙකුත් හෙළිදරව් කිරීම්**	
3.1	ප්‍රාග්ධනය	
3.1.1	ප්‍රාග්ධන ව්‍යුහය	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 49
3.2	ගුණාත්මක හෙලිදරව් කිරීම්	
	- සියළුම ප්‍රාග්ධන උපකරණ වල, විශේෂයෙන් නව්‍ය, සංකීර්ණ හෝ දෙමුහුන් ප්‍රාග්ධන උපකරණ වල ප්‍රධාන ලක්ෂණ පිළිබඳ නියමයන් හා කොන්දේසි පිළිබඳ සාරාංශගත තොරතුරු	ණය - මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 48, ස්කන්ධය - මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 49
3.3	ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්	
	(අ) ස්ථර 1 ප්‍රාග්ධනයේ අගය, පහත අයිතමයන් වෙන වෙනම අනාවරණය කරමින්:	
	- ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය/පොදු තොගය	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	- සංචිත	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	- පරිපාලිත සමාගම් වල කොටස් වල පාලනයට යටත් නොවන හිමිකම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	- නිර්මාණශීලී උපකරණ	නැත
	- අනෙකුත් ප්‍රාග්ධන උපකරණ	නැත
	- ස්ථර 1 ප්‍රාග්ධනයෙන් අඩුකිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	(ආ) ස්ථර 2 සහ ස්ථර 3 ප්‍රාග්ධනයේ මුළු වටිනාකම	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	(ඇ) ප්‍රාග්ධනයෙන් අනෙකුත් අඩුකිරීම්	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	(ඈ) මුළු යෝග්‍ය ප්‍රාග්ධනය	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
3.4	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය	
	(i) ගුණාත්මක හෙලිදරව් කිරීම්	
	වර්තමාන සහ අනාගත ක්‍රියාකාරකම් වලට සහයෝගය දීමට හෝ ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීමට බැංකුවේ ප්‍රවේශය පිළිබඳ සාරාංශය	අවදානම් කළමනාකරණ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 63.6
	(ii) ප්‍රමාණාත්මක හෙලිදරව් කිරීම්	
	(අ) ණය අවදානම, වෙළඳපොළ අවදානම සහ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය
	(ආ) මුළු හා ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය	අනුකූලතා ඇමුණුම්හි අන්තර්ගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

බාසල් III නියාමන අවශ්‍යතා

වසර 2007 - 09 ආර්ථික අර්බුදයට ප්‍රතිචාරව බැංකු සුපරීක්ෂණය සඳහා බාසල් කමිටුව විසින් ගොඩනගන ලද අන්තර්ජාතිකව පිළිගත් මිනුම් වල එකතුවක් බාසල් III ලෙස හැඳින්විය හැක. බැංකු වල නියාමනයන්, සුපරීක්ෂණය සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම මෙහි අරමුණ වේ.



බාසල් III මඟින් ස්ථාපනය කරන ලද ස්ථම්භ තුන සංශෝධනය කර වඩා ශක්තිමත් කර වර්තමාන අවශ්‍යතා සඳහා ගැලපෙන ලෙස නවතම තීක්ෂණ මුහුණුවරකින් ඉදිරිපත් කර ඇත.

බාසල් III, බාසල් II හි පුළුල් කිරීමක් වන අතර එමඟින් සමස්ථ බැංකු හා මූල්‍ය අංශයන් ආවරණය වන පරිදි නියාමනය, සුපරීක්ෂණය සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා නව ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ප්‍රමිතීන් හඳුන්වාදෙන ලදී.

නව ගෝලීය ප්‍රාග්ධන රාමුන් හා නව ප්‍රාග්ධන ආරක්ෂිත ස්ථරයන් මඟින් බාසල් II නීති වලට පැවතියාට වඩා වැඩි ප්‍රාග්ධනයක් මෙන්ම ගුණාත්මයෙන් වැඩි ප්‍රාග්ධනයන් තබා ගැනීමට මෙමඟින් මූල්‍ය ආයතන පොළඹවා ඇත. නව තෝලන අනුපාත මඟින් අවදානම් පදනම් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් සඳහා පරීක්ෂකයක් ලෙස අවදානම් පදනම් නොවූ මිනුම් හඳුන්වා දී ඇත. නව ද්‍රවශීලතා අනුපාත මඟින් දරුණු බැංකු අර්බුද අවස්ථාවන් සඳහා ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යන බව තහවුරු කරයි.

බාසල් III හි ප්‍රධාන ලක්ෂණ

- ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය - උපයාගැනීම් පිටතට ගෙවීම වළක්වාලමින් අවම පොදු ස්කන්ධ අවශ්‍යතාවයක් ආරක්ෂා කරගැනීමට දායක වන අමතර පොදු ස්කන්ධ ස්ථරයකි.
- ආර්ථික චක්‍රයන් වෙනුවෙන් ප්‍රාග්ධන ස්ථරය - යම් යම් අංශවල කෙටිකාලයක් තුළ ඇතිවන අධික ණය ඉල්ලුම නිසා ඒවාට වැඩිපුර ණය දීම නිසා ඇතිවන ණය ගෙවීමට නොහැකිවන තත්ත්වයන් වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.
- දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රාග්ධන අවශ්‍යතාවයන්, මෙයට පරිපූරක ප්‍රාග්ධනය, වැඩිකල අසම්භාව්‍ය ප්‍රාග්ධනය හා සීමාවලින් ඵහා ගිය සුපරීක්ෂණයත් ආදාළ වේ. ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව අවසාන විගණිත මූල්‍ය ප්‍රකාශන වල රු. බිලියන 500 ට වඩා වැඩි වත්කම් ඇති බැංකු දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු, ලෙස හඳුන්වා ඇත.
- තෝලන අනුපාතය - අවදානමට බර තැබීමක් නොකර බැංකුවේ ශේෂ පත්‍රයෙන් පිට වත්කම්ද අතුළුව මුළු වත්කම් වලට සාපේක්ෂව තබා ගත යුතු අවම අලාභ දරා ගත හැකි ප්‍රාග්ධන ප්‍රමාණයයි. තෝලන අනුපාතය 2019 ජනවාරි 1 වන දා සිට ක්‍රියත්මක වන අතර 2017 පළමු කාර්තුවේ සිට නිරීක්ෂණ කාලය මේ වන විටත් ආරම්භ වී ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙය අධීක්ෂණය කරනු ලබයි. 2019 ජනවාරි 1 වන දා සිට බලපත්‍රලාභී බැංකු සඳහා අවම තෝලන අනුපාතය 3% කි.
- ද්‍රවශීල අවශ්‍යතාවන් - අවම ද්‍රවශීලතා අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපතය මඟින් දින 30 වැනි කෙටි කාලයක ඇතිවන මූල්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමාණාවත් මුදල් සැපයීම අරමුණු වේ. දිගු කාලීන අනුපාතයක් වන ශුද්ධ ස්ථාවර මූල්‍ය අනුපාතය මඟින් මුළු ශේෂ පත්‍රයේම කල්පිරීමේ නොගැළපීම සැලකිල්ලට ගනු ලැබේ.

  2016 මඟ පෙන්වීම් අංක 01 අනුව බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළ 2017 ජුලි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොටස් වශයෙන් ක්‍රියාත්මක වේ.

බාසල් III සංක්‍රාන්ති අදියර - රු. බිලියන 500 හෝ ඊට වැඩි වත්කම් සහිත බැංකු සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය

ප්‍රාග්ධන සංරචක	01.01.2018	01.01.2019
පොදු ස්කන්ධය ස්ථර 1	4.50%	4.50%
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය	1.875%	2.50%
දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රාග්ධනය (D-SIBs)	1.00%	1.50%
අමතර ප්‍රාග්ධනය ස්ථර 1	1.50%	1.50%
මුළු ප්‍රාග්ධනය ස්ථර 1	8.875%	10.00%
අවම මුළු ප්‍රාග්ධන අනුපාතය + ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය + දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රග්ධනය D-SIBs	12.875%	14.00%

ශ්‍රී ලංකා මහ බැංකුව බාසල් III සඳහා ඔවුන්ගේ පළමු උපදේශණ පත්‍රිකාව 2015 අප්‍රේල් මස නිකුත් කිරීමත් සමඟම ලංකා බැංකුව බාසල් III සඳහා 2015 වේ සිට සූදානම් විය. ප්‍රාග්ධන පදනම වැඩි කර ගැනීම සහ මනා අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් යොදා ගැනීම නිසා 2018 දෙසැම්බර් 31 වන විට නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉතා ඉහළ අගයකින් ප්‍රාග්ධන අනුපාත තබාගැනීමට බැංකුවට හැකි විය. අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ බාසල් III අනුගත ණයකර නිකුත් කිරීම මඟින් වර්ෂය තුළ දී බැංකුවේ ප්‍රාග්ධන පදනම වර්ධනය කර ගනිමින් 2019 ජනවාරි පළමු වනදා සිට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බාසල් III ට අදාළ වර්ධනය කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන් සැපිරීම සඳහා ලංකා බැංකුව හොඳින් සූදානම්ව සිටී.

බාසල් III අනාවරණ අවශ්‍යතා

ප්‍රධාන නියාමන අනුපාත - ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව

	31.12.2018	
අයිතමය	බැංකුව	සමූහය
බාසල් III		
නියාමන ප්‍රාග්ධනය (රු. '000)		
පොදු ස්කන්ධය ස්ථර 1	108,830,534	115,250,456
ස්ථර 1 ප්‍රාග්ධනය	108,830,534	115,250,456
මුළු ප්‍රාග්ධනය	153,811,334	162,065,449
නියාමන ප්‍රාග්ධන අනුපාත (%)		
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය - 7.375%)	10.31%	10.41%
ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය - 8.875%)	10.31%	10.41%
මුළු ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය - 12.875%)	14.58%	14.64%

	31.12.2018	
අයිතමය	බැංකුව	සමූහය
නියාමන ද්‍රවශීලතාව		
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් - දේශීය (රු. '000)	478,549,997	477,892,171
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් - අක් වෙරළ බැංකු ශාඛා (ඇ.ඩො. '000)	835,941	878,439
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය - 20%)		
දේශීය බැංකු ඒකකය (%)	24.47	27.22
අක්වෙරළ බැංකු ඒකකය (%)	60.20	21.91
ද්‍රවශීල ආවරණ අනුපාතය (%) - රුපියල් (අවම අවශ්‍යතාවය 2018 - 90%, 2017 - 80%)	143.51	141.46
ද්‍රවශීල ආවරණ අනුපාතය - සියලු මුදල් (අවම අවශ්‍යතාවය 2018 - 90%, 2017 - 80%)	114.99	105.04

බාසල් III නව මාර්ගෝපදේශයන් 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක විය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව

බාසල් III ප්‍රාග්ධන අනුපාත ගණනය කිරීම - 2018.12.31

අයිතමය	බැංකුව රු. '000	සමූහය රු. '000
පොදු ස්කන්ධය ස්ථර I (CET 1) ප්‍රාග්ධනය ගැලපීමෙන් පසු	108,830,534	115,250,456
පොදු ස්කන්ධය ස්ථර I (CET 1) ප්‍රාග්ධනය	114,553,579	117,839,485
ස්කන්ධ ප්‍රාග්ධනය (ප්‍රකාශිත ප්‍රාග්ධනය)/පැවරුම් ප්‍රාග්ධනය	25,000,000	25,000,000
සංචිත අරමුදල	12,890,000	12,890,000
ප්‍රකාශිත රඳවාගත් ඉපයීම්/(සමුච්චිත ගත් පාඩු)	72,878,984	74,582,224
ප්‍රකාශිත සමුච්චිත වෙනත් විස්තීරණ ආදායම් (OCI)	1,102,916	1,484,672
සාමාන්‍ය හා වෙනත් අනාවරණය කළ සංචිත	2,681,679	3,882,588
ප්‍රකාශයට පත් නොකළ වත්මන් වසරේ ලාභය/(පාඩු) සහ වෙනත් විස්තීරණ ආදායමේ පිළිබිඹු වන ලාභය	-	-
තෙවන පාර්ශ්වයන් විසින් දරා සිටින සමූහයේ බැංකු හා මූල්‍ය සමාගම් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස්		-
පොදු ස්කන්ධය ස්ථර I ප්‍රාග්ධනය සඳහා මුළු ගැලපීම්	5,723,046	2,589,029
කීර්ති නාමය (ශුද්ධ)	-	-
අස්පෘශ්‍ය වත්කම් (ශුද්ධ)	1,200,640	1,419,084
දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අලාභ	180,879	180,879
විලම්බිත බදු වත්කම් (ශුද්ධ)	-	168,989
බැංකු හා මූල්‍ය ආයතන වල නිකුත් කල මුළු සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 10% කට වඩා අඩු ප්‍රමාණයක සිදු කර ඇති ආයෝජන	621,112	612,866
මූල්‍ය ආයතන වල නිකුතු සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 10% කට වඩා වැඩි ප්‍රමාණයක සිදුකර ඇති සැලකිය යුතු ආයෝජන	3,513,204	-
මූල්‍ය පරිපාලිතයන්හි ඇති ප්‍රාග්ධන හිඟයන්	207,210	207,210
අමතර ස්ථර 1 (AT 1) ප්‍රාග්ධනය - ගැලපීම් වලින් පසු	-	-
අමතර ස්ථර 1 (AT 1) ප්‍රාග්ධනය	-	-
සුදුසුකම් ලැබූ අමතර ස්ථර 1 ප්‍රාග්ධන උපකරණ	-	-
තෙවන පාර්ශ්වයන් විසින් දරා සිටින සමූහයේ බැංකු හා මූල්‍ය පරිපාලිතයන් විසින් නිකුත් කරන ලද උපකරණ	-	-
අමතර ස්ථර 1 (AT 1) ප්‍රාග්ධනය සඳහා මුළු ගැලපීම්	-	-
ස්ව කොටස් වල ආයෝජනය	-	-
වෙනත් (විශේෂිත)		
ස්ථර 2 ප්‍රාග්ධනය - ගැලපීම් වලින් පසු	**44,980,801**	**46,814,994**
ස්ථර 2 ප්‍රාග්ධනය	**46,976,379**	**48,672,067**
සුදුසුකම් ලැබූ අමතර ස්ථර 2 ප්‍රාග්ධන උපකරණ	33,712,919	35,312,919
ප්‍රත්‍යාගණන ලාභය	6,556,298	6,556,298
පොදු ප්‍රතිපාදන	6,707,162	6,802,850
තෙවන පාර්ශ්වයන් විසින් දරා සිටින සමූහයේ බැංකු හා මූල්‍ය පරිපාලිතයන් විසින් නිකුත් කරන ලද උපකරණ	-	-
ස්ථර 2 ප්‍රාග්ධනය සඳහා මුළු ගැලපීම්	**1,995,578**	**1,857,073**
ස්ව අයිතිය සහිත කොටස් වල ආයෝජනය		-
මූල්‍ය ආයතන වල ජන්ද බලය සහිත නිකුතු කොටස් ප්‍රාග්ධනයෙන් 10% කට වඩා නොවැඩි ප්‍රමාණයක සිදු කර ඇති ආයෝජන	1,882,058	1,857,073
බැංකු හා මූල්‍ය ආයතන වල නිකුතු සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 10% කට වඩා වැඩි ප්‍රමාණයක සිදු කර ඇති සැලකිය යුතු ආයෝජන	113,520	-
පොදු ස්කන්ධය ස්ථර I (CET 1) ප්‍රාග්ධනය	108,830,534	115,250,456
ස්ථර 1 මුළු ප්‍රාග්ධනය	108,830,534	115,250,456
මුළු ප්‍රාග්ධනය	153,811,334	162,065,449

අයිතමය	බැංකුව	සමූහය
	රු. '000	රු. '000
මුළු අවදානම් මත බර තැබූ වත්කම් (RWA)	1,055,206,519	1,107,377,275
ණය අවදානම මත බර තැබූ වත්කම්	960,571,917	1,001,547,130
වෙළෙඳපොළ අවදානම මත බර තැබූ වත්කම්	7,423,060	7,423,060
මෙහෙයුම් අවදානම මත බර තැබූ වත්කම්	87,211,542	98,407,084
පොදු ස්කන්ධය ස්ථර 1 සඳහා ප්‍රාග්ධන අනුපාතය: (ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය, ආර්ථික චක්‍රයන් වෙනුවෙන් ප්‍රාග්ධන ස්ථරය සහ දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රග්ධනය ඇතුළුව) (%)	10.31%	10.41%
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය සඳහා	1.875%	1,875%
ආර්ථික චක්‍රයන් වෙනුවෙන් ප්‍රාග්ධන ස්ථරය	අදාළ නොවේ	අදාළ නොවේ
දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රග්ධනය	1.00%	1.00%
මුළු ස්ථර 1 සඳහා ප්‍රාග්ධන අනුපාතය (%)	10.31%	10.41%
මුළු ප්‍රාග්ධන අනුපාතය: (ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය, ආර්ථික චක්‍රයන් වෙනුවෙන් ප්‍රාග්ධන ස්ථරය සහ දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රග්ධනය ඇතුළුව) (%)	14.58%	14.64%
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය සඳහා	1.875%	1.875%
ආර්ථික චක්‍රයන් වෙනුවෙන් ප්‍රාග්ධන ස්ථරය සඳහා	අදාළ නොවේ	අදාළ නොවේ
දේශීය පද්ධති වශයෙන් වැදගත් බැංකු සඳහා අමතර ප්‍රාග්ධනය සඳහා	1.00%	1.00%

බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය ගණනය කිරීම - සියළු මුදල් (බැංකුව පමණි)

අයිතමය	අගය (රු. '000)			
	31.12.2018		31.12.2017	
	මුළු බර නොතැබූ වටිනාකම්	මුළු බර තැබූ වටිනාකම්	මුළු බර නොතැබූ වටිනාකම්	මුළු බර තැබූ වටිනාකම්
උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් එකතුව (HQLA)	280,443,872	280,443,872	299,081,569	297,359,897
ගලපන ලද පළමු මට්ටමේ වත්කම්	282,611,352	282,611,352	295,987,317	295,987,317
පළමු මට්ටමේ වත්කම්	278,177,780	278,177,780	295,568,225	295,568,225
මුළු ගලපන ලද දෙවන "අ" මට්ටමේ වත්කම්	850,000	722,500	100,000	85,000
දෙවන "අ" මට්ටමේ වත්කම්	850,000	722,500	100,000	85,000
මුළු ගලපන ලද දෙවන "ආ" මට්ටමේ වත්කම්	3,087,184	1,543,592	3,413,344	1,706,672
දෙවන "ආ" මට්ටමේ වත්කම්	3,087,184	1,543,592	3,413,344	1,706,672
මුළු මුදල් ගලායාම්	**2,240,481,512**	**361,439,798**	**1,896,131,889**	**319,951,612**
තැන්පතු	1,243,019,339	124,301,934	1,090,725,752	109,072,575
සුරුකුම් නොකළ තොග අරමුදල්	496,521,921	209,526,807	428,492,592	185,171,536
ආරක්ෂිත අරමුදල් ගනුදෙනු	80,175,016	-	23,782,957	-
එකඟ වූ ණය පහසුකම් වල ලබා නොගත් ප්‍රමාණය (අවලංගු කළ නොහැකි) සහ වෙනත් අසම්භාව්‍ය අරමුදල් වගකීම්	420,347,317	27,193,138	353,086,993	25,663,907
අතිරේක අවශ්‍යතා	417,919	417,919	43,595	43,595
මුළු මුදල් ලැබීම්	**167,479,174**	**117,552,327**	**78,429,645**	**36,858,631**
සුරුකුම් මඟින් ආරක්ෂිත ණය දීම පරිණත වීම	-	-	18,388,000	-
එකඟ වූ පහසුකම්	5,000,000	-	-	-
